
[illegible] Training School,
[illegible]

[illegible]
[illegible]



මාතර කඹුරුපිටියේ කීර්ත්තිමත්
**ප්‍රැන්සිස් විජයසිංහ**
මැතිතුමා.

Francis Wijeyasinghe Esquire,
*Landed Proprietor of Kamburupitiye, Matara.*

අ ට්ඨ ක ථා චා ර්ය

ශ්‍රීමද් අනුබුද්ධ බුද්ධඝොෂ මහාස්ථවිරවරප්‍රණීත

# විශුද්ධිමාර්ගය.

Sidhartha Men's Truining Scho
Balapitiya.

ශීලධුතාඞ්ගනිර්දේශාත්මක

## ප්‍රථම භාගය.

**කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු**

මහරජාණන් විසින් කරනලද

**විස්තර පදාර්ථව්‍යාඛ්‍යානයෙන්**

සමුපලක්ෂිතයි.

---

**පෑලියගොඩ විද්‍යාලඞ්කාර මහාවිද්‍යාලයෙහි**

**උ පා චා ර්ය**

ජේ. ඩී. ගුනසේනගේ
පොත්
වෙළඳ ශාලාව.
වෙල්ලවීදිය කොළඹ.

**කඹුරුපිටියේ ධම්මරතනස්ථවිරපාදයන්වහන්සේ**

වි සි න්

ලේඛක දෝෂාපහරණයෙන් සකස්කරනලදී.

---

කඹුරුපිටියේ අසෝකාගාරයෙහි

**ඩී. සී. ඇස්. වික්‍රමරත්න මහතාණන්**

වි සි න්

**මහාබෝධියන්ත්‍රාලයෙහි මුද්‍රාපිතයි.**

---

බු: ව: 2468.

ශ: ව: 1847.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

10467

10467

# VISUDDHI-MÁRGA

BY

BUDDHAGÓSA MAHÁ THERA,
THE GREAT BUDDHIST COMMENTATOR.

VOLUME I.

COMPRISING SĨLA NIRDÉSA AND DHUTÃNGA NIRDÉSA

With the Sinhalese Paraphrase by His Majesty,
KALIKÁLA SÁHITYA SARWAGÑA PANDITA PARÁKRAMA BAHU.
King of Ceylon,

EDITED BY

KAMBURUPITIYÉ DHARMARATNA STHAVIRA
Member of the Oriental Studies Society
and
Assistant Teacher, Vidyálankára Oriental College,
Peliyagoda, Kelaniya.

PRINTED AND PUBLISHED
BY
D. C. S. WICKRAMARATNE
OF
ASOKÀGÀRA, KAMBURUPITIYA,
AT THE
MAHA-BÓDHI PRESS, COLOMBO

B. E. 2468.
S. E. 1847

10467
RARE

ශ්‍රී සෙඞ්ඛණ්ඩ ශෛලාභිධාන ශ්‍රී වඞ්ඪනපුර ශ්‍රී සුගත දංෂ්ට්‍රාධාතු
සංරක්ෂණාධිකාර ධුරන්ධර පෞෂ්ඨ පුෂ්පාරාම මහාවිහාරද්වයාධිපති
මහාමහෙන්ද්‍ර වංශාලඞ්කාර මහොපාධ්‍යාය අතිගරු

**අඹන්වැල්ලේ ශ්‍රී සිද්ධාර්ථ සුමඞ්ගලාභිධාන**

**ශ්‍යාමොපාලි මහානිකායේ**

**මහානායක මාහිමියන්වහන්සේ**

විසින්

සමාදරයෙන් ප්‍රතිගෘහීතයි.

---

# DEDICATED

(by permission)

TO

Most Ven'ble Mahá Mahindavansálankára Mahópádhyáya

**AMBANWELLÉ SRI SIDDHARTHA SUMANGALA,**

Mahá Náyaka Sthavira of the Siamese Sect,
President of the Paushata Pushpáráma Mahá Vihárás
And Custodian of the Holy Tooth Relic,
Daladá Máligawa, Kandy.

---

පෑලියගොඩ විද්‍යාලඞ්කාර මහාවිද්‍යාලයාධිපති

**රත්මලානේ ධම්මකිත්ති ශ්‍රී ධම්මානන්දාභිධාන**

කොළඹ හලාවත දෙදිශාවේ
ප්‍රධාන සඞ්ඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින්

**ශොධ්‍යපත්‍රාවලොකනයෙන්**

සමර්පිතයි.

---

# COMMENDED

(After perusal of Proof Sheets)

BY

**The Ven'ble Ratmalané Dharma Kirti Sri Dharmánanda,**

Pradhána Sangha Náyaka Sthavira of Colombo & Chilaw Districts
and Principal, Vidyálankára Oriental College,
Peliyagoda, Kelaniya.

J. D. FERNANDO, PRINTER & BOOK-SELLER. COLOMBO.

# විඥප්තිය

---

අට්ඨකථාචාර්ය ශ්‍රීමද් අනුබුද්ධ බුද්ධඝොෂ මහාස්ථවිරපාදයන් වහන්සේ ලක්දිව් වැඩමවීමෙන් ප්‍රාථමිකවැ රචනාකළාවූ මෙම **විශුද්ධිමාර්ග අට්ඨකථාව** පිළිබඳවූද තදීය සත්‍ය කතෘවූ **කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු** මහරජාණන් පිළිබඳවූද දැනගත යුතු වැදගත් කරුණු රාශියක් අන්තර්ගත **ප්‍රස්තාවනාවක්** මෙහි ඇතුළත් වන බැවින් ඒ පිළිබඳ කරුණු දැක්වීමට අපි නොවෙහෙසෙමු.

මෙකල බොහෝදෙන වැදගත් විශාල ග්‍රන්ථයන් මුද්‍රණයකරවීමට පටන්ගෙන ආරම්භයෙහි ඉන් භාගයක් හෝ දෙකක් පළකරවීමෙන් මන්දෝත්සාහී වෙති.

මේ පිළිබඳව අප පළමුවෙන් අදහස්කරගත් පරිදිම **ශීල සමාධි ප්‍රඥා** යන නිර්දේශත්‍රයෙන් බෙදූ කාණ්ඩ තුනක් වශයෙන් මුළු පොතම ඉක්මනින් පළකරවන්නෙමු.

එබැවින් මෙහි ශීලනිර්දේශයට අයත් පෝර්ම විසිහතකින් නිමියාවූ ප්‍රථම භාගය මේ වරට මෙසේ නිකුත්කෙළෙමු.

ඉතිරි භාගයන් පිළිබඳ මුද්‍රණයද සුහුසුලුව කරගෙන යනු ලැබේ.

මෙවගට,

D. C. S. Wickramaratna.

1925 ඔක්තෝම්බර් මස 25 වෙනි දින
කඹුරුපිටියේ අශෝකාගාරයෙහිදීය.

# ප්‍රස්තාවනා.

———+o+———

ශ්‍රීඝනසුගතතථාගතවරධර්මචක්‍රවර්තිස්වාමිවූ අප සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජෝත්තමයන් වහන්සේ විසින් විමුක්තායතනශීර්ෂයෙන් පරිශීලනයකරන්නවුන්හට අනුපාදපරිනිර්වාණය කෙළවරකොට ඇති ලෞකිකලෝකෝත්තරහිතසුඛසාධනයෙහි සමර්ථවූ අර්ථව්‍යඤ්ජන සම්පත්තියෙන් සමුල්ලසිතකොට මූලභාෂායෙන් වදාරනලද සකල නවාඞ්ග ශාස්තෘශාසන පර්‍ය්‍යාප්තාන පර්‍ය්‍යාප්තිසද්ධර්මයාගේ අර්ථ ප්‍රකාශක වාරයෙන් තමන්වහන්සේ විසින්ද අග්‍රශ්‍රාවක මහාශ්‍රාවක තදන්‍ය ශ්‍රාවකාදි ප්‍රතිසම්භිදාප්‍රාප්ත සෙසු ශ්‍රාවකයන්විසින්ද ඒ ඒ තන්හි ප්‍රකාශිත ප්‍රකීර්ණක විනිශ්චය කථා සඞ්ඛ්‍යාතදෙශනා තොමෝ **අර්ථකථා** නම් වන්නීය.

**"අත්ථො කථීයති එතායාති අත්ථකථා"** යනු ටීකාගත නිර්වචන හෙයින් මේ කාරණකොටගෙන ලෞකික ලෝකෝත්තර අර්ථය තෙමෙ පවසනු ලැබේනුයි, අර්ථකථා නම් වේ. මෙහි "දුක්ඛස්ස පීළනට්ඨො" යන ආදීතන්හි සෙයින් ථකාරහට ඨකාරකළකල්හි **අට්ඨකථා** යි සිද්ධයයි දතයුතු.

ඒ මේ සාර්ථකථා ප්‍රවචන ලක්ෂණවූ පර්‍ය්‍යාප්තිතොමෝ "මම පෙළ දහම ධරන්නෙමැයි හෝ; ගුරුප්‍රවේණිය පිහිටුවන්නෙමැයි හෝ; මහාවිහාරවංශය රක්නෙමැයි හෝ" මෙසේ සනිටුහන් කොට නිඃසරණාධ්‍යාශයෙන් ඉගෙණ පුහුණුකරන්නාවූ ශාසනාවචර කුලපුත්‍රයනට තන්ත්‍රිධාරක ප්‍රවේණිපාලක වංශානුරක්ෂකත්වයෙන් පර්‍ය්‍යාප්තිශාසනයාගෙද; තෙලෙස් ධුතඟය තුදුස් කඳුවත්ය දෙයාසූ මහවත්ය යන ආදී ප්‍රතිපද්ශාසනයාගෙද; නවලෝකෝත්තර ධර්මසඞ්ඛ්‍යාත ප්‍රතිවෙධ ශාසනයාගෙද; පැවැත්මට ප්‍රත්‍යය වන්නීය. එහෙයින් පර්‍ය්‍යාප්තිතොමෝ ප්‍රතිපත්තියට ප්‍රත්‍යය වෙයි; ප්‍රතිපද් තොමෝ ප්‍රතිවෙධයට ප්‍රත්‍යය වෙයි; යනුද දතයුතු.

නානානයනිපුණවූ අනෙකාධ්‍යාශය සමුට්ඨානවූ ධර්මාර්ථදෙශනා ප්‍රතිවෙධගම්භීරවූ ත්‍රිපිටකබුද්ධවචනය පිළිබඳ ගුණසංවර්ණනාත්මකවූ මේ අර්ථකථාතොමෝ රත්නත්‍රයෙහි සෘජුවූ ශ්‍රද්ධාප්‍රතිලාභයෙන් අමෘතාධිගමයට හෙතුවූ අලෞකික ප්‍රීතිප්‍රමෝදය ජනවනු සඳහාද; ගැඹුරුවූ නැණැතියන් විසින්ම බැසගතයුතුවූ ත්‍රිපිටක සද්ධර්මමහාර්ණවයාගෙ ප්‍රවෙශොපාය සඳහාද; අත්‍යූපකාර වන්නීය. ජිනවචනයෙහි උද්ග්‍රහණ ධාරණාදීන් ප්‍රඥාපාටවය කැමති සුධීන් විසින් අර්ථකථාතොමෝ වෙසෙසින් පුහුණුකටයුත්තීය. අර්ථකථායෙන් වෙන්වැ

කිසිසේත් පෙළදහම නොදතහැකිහෙයිනි. අට්ඨකථායෙහි දුරව බොධය ඇතිකල්හිදු අට්ඨකථාව වරදවා ගත්කල්හිදු ත්‍රිපිටකධර්ම සඞ්ඛ්‍යාත පෙළදහමද උත්පරිපාටියෙන් ගෘහීතව්‍ය වෙයි. පෙළදහම වරදවා ගත් කල්හි එය සද්ධර්මයාගෙ ප්‍රමොෂය පිණිසද විනාශය පිණිසද අන්තර්ධානය පිණිසද අප්‍රකාශය පිණිසද පවත්නේ වෙයි. එහෙයින් පිටකත්‍රය ධර්මාවබොධය කැමතියවුන් විසින් අට්ඨකථා යෙහි පිළිපැද්දයුතු. පූර්වකාලීනවූ මහාප්‍රාඥවරෙණ්‍යයන් විසිනුදු තදට්ඨකථාතොමො බුද්ධභාෂිතකොට සැලකීමෙන් විනිශ්චිතයෘ; සතතයෙන් ආදෘතද වී.

කියනලදමැයි, **ටීකාචාර්ය්‍යශ්‍රීමද්ශාරිපුත්‍ර** මාහිමියන් විසින්.

**"නහි භගවතා අබ්‍යාකතං නාම තන්තිපදං අත්ථි සබ්බෙසං යෙව අත්ථො කථිතො තස්මා සම්මාසම්බුද්ධෙනෙව තිණ්ණං පිට කානං අත්ථවණ්ණනාක්කමොපි භාසිතො ති දට්ඨබ්බං තත්ථ තත්ථ භගවතා පවත්තිත පකිණ්ණක දෙසනායෙව හි අට්ඨකථා"** යි.

අප බුදුහු විසින් නොවිතරනලද පෙළදහමෙක් නම් නැති. සියලු දහමුන්ගෙ අරුත් තමන්වහන්සේ විසින්ම පවසන ලදහ. එහෙයින් සම්‍යක් සම්බුද්ධයන් විසින්ම පිටකත්‍රය පිළිබඳ අර්ථවර්ණනාක්‍රමයද වදාළේයයි දතයුතු. එහි භාග්‍යවත්හු විසින් වදාරනලද විස්තාර දෙශනා තොමෝම **අටුවා** නම් වෙයි යනු මෙහි භාවයි.

තදට්ඨකථා තොමො පස්වාදහසක් හවුරුදු සද්ධර්මයාගෙ අවිසන සංස්ථිතිය කැමැතිවූ අනුබුද්ධ මහා කාශ්‍යප මහාක්ෂීණාශ්‍රව ප්‍රමුඛ මහ රහතන් වහන්සේලා විසින් ප්‍රථම සඞ්ගීතියෙහි පටන් පඤ්චම් පුස්ත කාරූඪ සඞ්ගීතිය දක්වා ථෙරිය නිකායික අචාර්ය්‍ය පරම්පරායෙහි සුපිරිසුදුව ගෙනඑන ලද්දීයෘ. හේ මෙසේ සැකෙවින් දතයුතු.

## **ප්‍රථම ධර්මසඞ්ගීතිය.**

---

ධර්මචක්‍රප්‍රවර්තනයෙහි පටන් සුභද්‍ර පරිව්‍රාජක විනයනය දක්වා කෘතබුද්ධකෘත්‍ය ඇති අප ලොකනාථවූ සර්වඥයන්වහන්සේ කුසිණාරා නුවර උපවත්තන නම්වූ මල්ලරජුන්ගේ සල්උයනෙහි යුගම ශාලවෘක්ෂාන්තරයෙහි වෙසගමස පුණු පොහෝදින අලුයම්හි නිරුපධිශෙෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවි සත්දිනක් ගතවූ කල්හි සුභද්‍ර නම් බුඩ්ඪපබ්බජිතයක්හු විසින් "අලං ආවුසො මා සොචිත්ථ මා පරිදෙවිත්ථ සුමුත්තාමයං තෙන මහාසමණෙන" යන මේ ආදීන් කියන ලද ශාසනකණ්ටක දූෂිත වචනයන් අසා අනාගතයෙහි ශාසන පරිහාණිය සලකා වදාළ අනුබුද්ධ මහාකාශ්‍යපස්ථවිර ප්‍රමුඛ ශාසනාභිවෘද්ධිකාමී පන්සියයක් මහරහතන්වහසේලා අජාතශත්‍රෘ මහරජතුමන් විසින් බඹවිමනක් මෙන් විසිතුරුකොට කරවනලද සප්තපර්ණී

ගුහාද්වාර මණ්ඩපයෙහි රැස්ව සත්මසෙකින් **ප්‍රථම ධර්මසඞ්ගායනාව** කොට නිමවා වදාළසේක.

මහාකාශ්‍යපස්ථවිරාදි පන්සියයක් භික්ෂූන් රැස්ව කළහෙයින් මෝ තොමෝ **පඤ්චසතිකා** මහාසඞ්ගීති නමැයිද ථෙරියා හෝ ථෙරිකා නමැයිද කියනුලැබේ.

## ද්විතීය ධර්මසඞ්ගීතිය.

---

පරිනිර්වාණයෙන් සියක්වන හවුරුදුයෙහි විශාලාමහනුවර වැසි දහසක් වජ්ජිපුත්‍රක භික්ෂූන් විසින් නොකැපවූ ශෘඞ්ගලවණකල්පාදි දසවස්තූන් ගෙනහැර පෑ කල්හි කාකණ්ඩපුත්‍රවූ යසස්ථවිර ප්‍රමුඛ ථෙරියනිකායික සත්සියයක් මහරහතන්වහන්සේලා කාලාශෝක මහීපාලයන් සමයෙහි වාලුකාරාම නම් විහාරයෙහි රැස්වූවාහු සියලු ශාසනමලයන් දුරුකෙරෙමින් පිටක විසින් නිකාය විසින් අඞ්ග විසින් ධර්මස්කන්ධාදි විසින් අටමසෙකින් **ද්විතීය ධර්මසඞ්ගායනාව** කොට නිමවා වදාළසේක.

සත්සියයක් දෙනා වහන්සේ රැස්ව කළහෙයින් මෝතොමෝ **සත්තසතිකා** නමැයිද දෙවනුව කළහෙයින් ද්විතීය සඞ්ගීති නමැයිද කියනුලැබේ.

## තෘතීය ධර්මසඞ්ගීතිය.

---

තථාගත පරිනිර්වාණයෙන් දෙසිය සවිසිවන හවුරුදුයෙහි දෙවන සඞ්ගායනා සමයෙහි සස්නෙන් බැහැරකරනලද පාපභික්ෂූන්ගෙන් සිදුවූ ශාසනසඞ්කරයන් පැවැති කල්හි දඹදිව ආඥාචක්‍රවර්ති ධර්මාශෝක මහරජාණන් විසින් විහිත ආරක්ෂාසංවිධාන ඇතිව මොග්ගලිපුත්තතිස්ස මහරහතන්වහන්සේ ප්‍රමුඛකොට ඇති දහසක් මහරහතන් වහන්සේලා අශෝකාරාම නම් විහාරයෙහි රැස්වූවාහු අධර්මය ධර්මයකොට අවිනය විනයකොට තීර්ථකයන් විසින් දූක්වූ ශාසනමල විශෝධනය කෙරෙමින් නවමසෙකින් **තෘතීය ධර්මසඞ්ගායනාව** කොට නිමවා වදාළසේක.

දහසක් භික්ෂූන් රැස්ව කළහෙයින් මෝතොමෝ **සාහස්සිකා** නමැයිද තුන්වනු හෙයින් තෘතීය සඞ්ගීති නමැයිද කියනු ලැබී.

මෙසේ අර්ථකථා සහිත ත්‍රිපිටකබුද්ධවචනය දඹදිව ථෙරිය නිකායික ස්ථවිරපරම්පරානුයාත මහරහතන් විසින් බුදුන් හමුයෙහි අසා සිත්හි ලා ධැරූ නියායෙන් නොපිරිහෙලා තෘතීය සඞ්ගීති පර්යාප්ත කොට ගෙන ආ කල්හි ලක්දිව ශාසනප්‍රතිෂ්ඨාපනය සඳහා **"අනාගතෙ මහින්දො නාම භික්ඛු තම්බපණ්ණිදීපං පසාදෙස්සති"** සි

සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසිනුදු අනුදන්නාලද සෞවාපාධ්‍යායවූ මොග්ගලිපුත්තතිස්ස මහරහතන් ප්‍රමුඛකොට ඇති මහා සඞ්ඝයා වහන්සේ විසිනුදු අයදනාලද මහාමහෙන්ද්‍ර ක්ෂීණාශ්‍රවයන් වහන්සේ පරිනිර්වාණයෙන් දෙසියසතිස් වන වර්ෂයෙහි ලඞ්කාපුරවරාධීශ්වරවූ දේවානම්ප්‍රියතිෂ්‍ය නරපතිහු පිළිබඳ ප්‍රථම රාජ්‍යාභිෂේක වර්ෂයෙහි මෙලක්දිවට ගෙනවුත් නිකායාන්තර ලබ්ධීන් හා අසම්මිශ්‍රකොට පිරිසුදු හෙළදිව් බසින් තබා වදාළසේක.

## චතුර්ථ ධර්මසඞ්ගීතිය.

ශ්‍රීමත්මහාමහෙන්ද්‍ර මහාක්ෂීණාශ්‍රවයන් වහන්සේ විසින් ලක්දිව බුදුසසුන් පිහිටුවා වදාළ පසු දෙවනපියතිස් මහරජහුගේ බෑනණුවූ අරිට්ඨාදි ථෙරිය නිකායික භික්ෂූන් විසින් පරිනිර්වාණයෙන් දෙසිය සැත්තෑවන වර්ෂයෙහි ලක්දිව රජ පැමිණි උත්තිය නම් මහරජු දවස එ මිහිපල්හුගේ ආරක්ෂා සංවිධාන ඇතිව අකාල විද්‍යුත්පාතයෙන් අහස ගුගුරුවා මහපොළොව කම්පාකොට දෙවියන්ගේ සාධුනාද සහශ්‍රයෙන් කරනලද සොත්‍ර පූජා ඇතිව චතුර්ථ ධර්මසඞ්ගීති තොමෝ කර වදාරන ලද්දීය.

මේතොමෝ දඹදිව සඞ්ගායනා පිළිවෙළින් සතරවැනිවුවද ලක්දිව්හි සිදුවූ **පළමුවන ධර්මසඞ්ගායනාවයයි** සැලකියයුතු.

මෙසෙයින් ජාම්බුවීපික ප්‍රථම මහාසඞ්ගීතියෙහි පටන් තෘතීය සඞ්ගීති පර්යන්තකොට අනුබුද්ධ මහාකාශ්‍යප මහාක්ෂීණාශ්‍රව ප්‍රමුඛ ථෙරිය නිකායික භික්ෂූන් විසින් මේ සාර්ථකථා ප්‍රවචනපාළිය ශත ධෞත ඝෘතයක් මෙන් අති නිර්මලව ගෙන එන ලද්දීය.

ඉන් පසු ලඞ්කාවීපප්‍රසාදක ථෙරියනිකායික මහාමහෙන්ද්‍ර ක්ෂීණාශ්‍රවයන් විසින් දඹදිවින් මෙලක්දිවට ගෙන එන ලද්දීය. උන්වහන්සේ වෙතින් ඉගෙන අරිට්ඨාදි රහතන් විසිනුදු මොනවට ගෙන එන ලදුව එතැන්පටන් මේ දක්වා තදන්තෙවාසිකයන් විසිනුදු තත් තත් පාරම්පර්ය වාචනා මාර්ගෝපදේශයෙන් ගෙන එනු ලැබේ.

## පඤ්චම (පුස්තකාරූඪ) සඞ්ගීතිය.

තථාගත පරිනිර්වාණයෙන් සාරසිය සතලිස්වන වර්ෂයෙහි ලක්දිව රජ පැමිණි වළගම් අබා මහරජහුගේ ඇමතිවූ එක්තරා ජනපදාධිප යක්හුගේ සහායත්වයෙන් මාතුලජනපදයෙහි ආලොක ලෙණ (මාතලේ අලූලෙන්) විහාරයෙහි රැස්වූ සියුපිළිසිඹියාපත් පන්සියයක් මහරහතන් වහන්සේලා අර්ථකථා සහිතවූ ත්‍රිපිටක බුද්ධවචනය නැවතත් සඞ්ගායනාකොට පුස්තකාරූඪ කළසේක. මේතොමෝ පස්වනුවූ **පුස්තකාරූඪ සඞ්ගීතිය** වේ.

කියනලදමැයි, **නිකායසඞ්ග්‍රහයෙහි**.

“ඉක්බිති ඒ දෙවනපෑතිස්ස රජු පටන් උත්තිය රජය මහාසීවය සූරතිස්සය අසරුවෝය අසේලය එළාලය මහානාගය යටාලතිස්සය ගොළුඅබාය කාවන්තිස්සය දුටුගැමුණුය සැදෑතිස්සය තුලුන රජය ලමැණිතිස්සය කලුනාරජය පඤ්චද්‍රාවිඩය යන මේ සතලොස් රජුන් ඇවෑමෙහි වලගම් අබා නම් මහ රජෙක් බුදුන් පිරිනිවි සාරසිය එකුන් සාලිස් හවුරුදු නවමස් දසදවසක් ගියකලැ සිරිලක රජ පැමිණි පස් වනමස පරදෙසින්බට සෙබළ දෙමළුන් සත්දෙනකු හා යුදකොට බිදී වල්වන.

එකලැ බුදුන් බෝමැඩ විදුරසුන් නැඟී මරසෙන් බිඳ බුදුවූ දවස් එම විගස ප්‍රීතිවෙගයෙන් උදන් අනා වදාළ **“අනෙකජාති සංසාරං”** යනාදි ප්‍රථම බුද්ධවචනය ආදිකොට කෙළවර පරිනිර්වාණ කාලයෙහි වදාළ **“වයධම්මා භික්ඛවෙ සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථ”** යන පශ්චිම බුද්ධවචනය අවසන්කොට මේ දෙඅතුර පන්සාලිස් හවුරුද්ද මුළුල්ලෙහි දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණ මනුෂ්‍ය යක්ෂ රාක්ෂස සිද්ධ විද්‍යාධරාදීන්ට අනුශාසනා පිණිස වදාළ පරිද්දෙන්ම අක්ෂරවශයෙන් පදවශයෙන් ග්‍රන්ථවශයෙන් භාණවාරවශයෙන් පරිච්ඡින්න සඞ්ඛ්‍යා සහිතව අනූනව අනධිකව සර්ජුලීලබධි හා අමිශ්‍රව ත්‍රිවිධ සඞ්ගායනා රූඪව ගගන ගඞ්ගාප්‍රවාහයක් සේ සුපරිශුද්ධව දෑරඟමිණිරුවනක්සේ නිර්මලව අමෘත මහාමෙඝයක් සේ මුළුලෝ සතහමින් ත්‍රිවිධ බොධි සම්පාදනයට සෘජුරාජපථයක්ව සකල ජනකාමිනී සර්වසම්පත්ති ලාභයට එකාන්තකාරණව උපාලිය දාසකය සොණකය සිග්ගවය මොග්ගලිපුත්තතිස්සය මහින්දය ඉට්ඨියය උත්තියය සම්බලය භද්දසාලය අරිට්ඨය තිස්සදත්තය කාළසුමනය දීඝනාමය දීඝසුමනය කාළසුමනය මහානාගය බුද්ධරක්ඛිතය තිස්සය දෙවය සුමනය චූළනාගය ධම්මපාලිතය ඛෙමය උපතිස්සය ඵුස්සදෙවය සුමනය පුප්ඵනාමය මහාසීවය උපාලිය මහානාගය අභයය තිස්සය ඵුස්සනාමය චූළාභයය තිස්සය චූළදෙවය සීවස්ථවිරය යන මේ මහාස්ථවිර පරම්පරායෙන් මුඛපාලි වශයෙන් පැවැත ආවාවූ ත්‍රිපිටකධර්මය එක්තරා ජනපදාධිපයක්හුගේ ආරක්ෂායෙන් පන්සියයක් රහතන්වහන්සේ මාතුල නම් දනව්වෙහි **අළුලෙන** වැඩහිඳ පොත් සඞ්ගායනා කොට ලියවූසේක.” යනුයි.

මෙතැන් පටන් ධර්ම විනය ග්‍රන්ථපරම්පරාව බොහෝසෙයින් ලෙඛන වශයෙන්ද විය. මෙයින් පිටත් නානා දෙශයන්හිද ඒ පාලි ග්‍රන්ථයෝ පතළවූහ. සිංහලාර්ථකථාවූ කලි සිංහල ද්වීපයෙහිම පැවැත්තාහුය. දෙශාන්තරයන්හි නොපැවැත්තාහ. දෙශාන්තරිකවූද යම් යම් ආචාර්‍යවරයන් විසින් ඒ ඒ දෙශයන්ට අනුරූපවූ අර්ථකථාවෝ අන්ධට්ඨකථාදි නාමයන්ගෙන් රචනා කරනලද්දාහුයයි හැඟේ. මේ අතර ලක්දිව්හි ත්‍රිපිටකබුද්ධවචනයද **කුරුන්දී පච්චරී මහා අට්ඨකථා**

සඞ්ඛ්‍යාත ත්‍රිවිධවූ සිංහලාට්ඨකථාවෝද ලිඛිත ග්‍රන්ථවශයෙන්ද බහුශ්‍රුතයන්ගේ ධාරණ වශයෙන්ද පැවැත්තාහුය. මෙහි ප්‍රථම මහා සඞ්ගීතියෙහි මහාකාශ්‍යපස්ථවිරාදි ධර්මසඞ්ගායක මහරහතන්වහන්සේලා විසින් සගයන ලද්දවූද මහාමහෙන්ද්‍රක්ෂීණාශ්‍රවයන්වහන්සේ විසින් ලක්දිවට ගෙනවුත් නිකායාන්තරලබ්ධීන් හා සංකරනොවනු පිණිස සිංහලභාෂායෙන් තබනලද්දවූද ප්‍රාථමික අර්ථවර්ණනා තොමෝ **මහාට්ඨකථා** නම් විය. ලක්දිව්හිදීම පසුරකට රැස්ව කළහෙයින් ද්විතීය අර්ථවර්ණනා තොමෝ **පච්චරියට්ඨකථා** නමැයිද කුරුන්දිවේළුලි නම් විහාරයෙහිදී රැස්ව කළහෙයින් තෘතීය අර්ථවර්ණනා තොමෝ **කුරුන්දට්ඨකථා** නමැයිද සලකනු ලැබෙත්.

## දඹදිව හා ලක්දිව නිකායභේදය.

අප තථාගත සම්මා සම්බුද්ධරජාණන්වහන්සේගේ පරිනිර්වාණයෙන් ශතවර්ෂය වනතෙක් මහාකාශ්‍යපස්ථවිරාභ්‍යාගත එකම ථෙරියනිකාය විනා අන්කිසිම නිකායයෙක් ඇති නොවූයේය. ඉන් මෑතභාගයෙහි ද්විතීය ධර්මසඞ්ගායනා සමයෙහිදී නික්කඩ්ඪිත දසදහසක් වජ්ජිපුත්‍රක පාපභික්ෂූහු ශාසනප්‍රතිෂ්ඨා නොලැබ ප්‍රත්‍යන්තදෙශයනට වැද ධර්මය අධර්මයකොට විනය අවිනයකොට මහාසංඝික නම් ආචාර්ය නිකායයක් ඇතිකළහ. එයින් ගොකුලිකය එකබ්බොහාරිකයයි නිකාය දෙකෙක්ද; ගොකුලික නිකායයෙනුදු ප්‍රඥප්තිවාදීය බාහුලිකයයි අනිකුදු නිකාය දෙකෙක්ද; චෛතියවාද නම් තවත් නිකායයෙක්දැයි මහාසංඝික නිකාය හා සමග මෙසේ නිකාය සයෙක් විය. එසේම මහිංසාසකය වජ්ජිපුත්‍රකයයි ථෙරියනිකායයෙන් භින්නවූ නිකාය දෙකෙක්ද; ධම්මුත්තරිය භද්‍රයානිකය ඡන්නාගාරිකය සම්මිතියයි මෙසේ වජ්ජිපුත්‍රක නිකායයෙන් භින්නවූ අනිකුදු නිකාය සතරෙක්ද; වැලිදු සබ්බත්ථිවාදිය ධම්මගුත්තිකයයි මහිංසාසක නිකායයෙන් භින්නවූ අනිකුදු නිකාය දෙකෙක්ද; කස්සපිකය සඞ්කන්තිකය සූත්‍රවාදීයයි සබ්බත්ථික නිකායයෙන් භින්නවූ නිකායාන්තරයෙක්දැයි මෙකී එකොළොස් නිකායයෝ පළමු කී මහාසංඝිකාදි ෂන්නිකායයන් හා මිලිතවූවාහු සතළොස් නිකාය කෙනෙක් පරිනිර්වාණයෙන් දෙවැනි ශතවර්ෂයෙහි ජම්බුද්වීපයෙහි භින්නව ව්‍යාප්තවූහ. එකම ථෙරියනිකාය පමණෙක් අභින්නව පැවැත්තේය. ඉන් මොබ්බෙහිදු හෙමවත රාජගිරිකාදි අන්‍යවූද නිකාය සයෙක් ඇතිව ත්‍රිපිටක බුද්ධධර්මය පෙරළා බුද්ධධර්මය බඳුකොට වර්ණපිටකාදි නානා මිථ්‍යාධර්මයන් ඇතිකොට ශ්‍රමණනාම ශ්‍රමණලිඞ්ග ශ්‍රමණකල්ප ශ්‍රමණපරිෂ්කාරයන් පව වෙනස්කොට මහත්වූ ශාසනවිලොපයන් කළාහුය.

කියනලදමැයි, **විනය ටීකායෙහි.**

**''නාමලිඞ්ග පරික්ඛාරං ආකප්පකරණානි ච**
**පකතිභාවං විජහිත්වා තං ච අඤ්ඤං අකංසු තෙ'' යි.**

ලක්දිව්හිදු බුදුසසුන් පිහිටුවීමෙන් හවුරුදු දෙසියදහහතක් වන්තුරු කිසිම නිකාය භෙදයෙක් නොමැතිව මහා මහෙන්ද්‍රස්ථවිරාභියාගත එකම ථෙරිය නිකාය පමණක් මහා විහාරයෙහි වොරැදෙන්ට විය. ඉක්බිති පරිනිර්වාණයෙන් හවුරුදු සාරසිය පනස්පහක්වූ කලැ වළගම් අබා මහරජු දවස එ මිහිපල්හු විසින් කරවනලද අභයගිරි විහාරවාසී භික්‍ෂූහු ථෙරිය නිකායයෙන් භින්නාවූවාහු ධම්මරුචිනිකාය නමින් ගණයක්වූහ. නැවත හවුරුදු අටසිය දසනවයකින් පසු මහසෙන් රජු දවස අභයගිරිවාසීවූම සාගල නම් තෙර නමක් ආගමව්‍යාඛ්‍යානයන්ද කොට සවශිෂ්‍යයන් හා ධම්මරුචි නිකායයෙන් භින්නවැ ජෙතවනයෙහි වෙසෙමින් සාගලිය නිකාය නමින් ගණයක් වූයේය.

එහෙයින් කීහ.

**"ධම්මරුචිකා සාගලිකා ලඞ්කාදීපම්හි පකාසිතා"** යි.

මෙසේ වළගම් අබා මහරජුකලැ පටන් මහාවිහාරිය අභයගිරිකය යි නිකායවයක් වශයෙන්ද මහසෙන්රජු කලැ පටන් **මහාවිහාරිය අභයගිරිකය ජෙතවනිකය** යි නිකායත්‍රයක් වශයෙන්ද භික්‍ෂූහු භින්නාවූහයි සැලකියයුතු.

උද්දෙස පරිපුච්ඡාදි සමගිකර්මයන්ට නොඑළඹෙන්නාවූ භින්න නිකායික ඒ භික්‍ෂූන්ගේ අවිනය අසද්ධම්ම පරිදීපනයෝද බොහෝ වූහ. ඔවුනතුරෙන් අභයගිරිකයෝ විනයපිටකයෙහි ඛන්ධක පරිවාර යන් හෙවත් මහාවග්ගය චූළවග්ගය පරිවාරය යන විනයප්‍රකරණයන් අර්ථාන්තර පාඨාන්තර හෙලීමෙන් වෙනස් කළහ. එසේම විනයෙහි සවග භික්‍ෂූන්ගේ වස්තුවෙහි අනුදන්නාලද දළකඩ විජිනිපත් ධැරීමද අඩ්ඪකාසික ගණිකාවගේ වස්තුවෙහි අනුදන්නාලද දූතෙය්‍ය උපසම්පදාව හා කුමාර කාශ්‍යප වස්තුවෙහි අනුදන්නාලද ගැබ විසූ මස් ගණනත් සමග විසිවසක් සම්පූර්ණකොටගෙන උපසම්පදා කිරීම් ආදි විනය කර්මයන්ද අවිනය කම්මකොට දැක්වූහ. ජෙතවනිකයෝ වනාහි විනයපිටකයෙන් උභතොවිභඞ්ග නම්ලද පාරාජිකාය පාචිත්තිය ය යන විනය ප්‍රකරණයන් අර්ථාන්තර පාඨාන්තර ප්‍රක්‍ෂෙපයෙන් වෙනස් කළහ. භින්නනිකායික ඒ භික්‍ෂූන්ගේ ග්‍රන්ථයෝද කිසි තැනෙක්හි පාඨවෛශම්‍යයෙන් භින්නාවූහ. පාඨාන්තර වශයෙන් අර්ථකථාචාර්ය්‍යාදීන් විසින් දක්වනලද "එතපථො,එතාපථො""කායනුත්ථ, කායනොත්ථ,කායඔත්ථ" යනාදීන් පැවැති මතභෙදද, එසේම අර්ථකථාවන්හි "අපරෙ, එකච්චෙ, කෙචි" යන ආදීන් අන්තරිත ථෙරවාදද බොහෝවූහ.

පුස්තකාරූඪ සඞ්ගීතියෙන් හවුරුදු පන්සියයක්වූ කලැ අනුරධපුරයෙහි මහානාම නම් රජු සමයෙහි "අත්‍යන්තයෙන් පිරිසුදු ශ්‍රද්ධා බුද්ධිවීර්‍ය්‍යයෙන් ප්‍රතිමණ්ඩිතවූ; ශීලය ආචාරය ඍජුබවය මෘදුබවය යනාදි ගුණ රැසින් හිවී සිටියාවූ; සවසමයපරසමයගහනයෙහි වද

න්ට සමඤ්ඤවූ; ප්‍රඥාපාටවයෙන් යුක්තවූ; ත්‍රිපිටකපර්‍ය්‍යාප්තිප්‍රභේද ඇති අටුවා සහිත ශාස්ත්‍රශාසනයෙහි උද්ග්‍රහණවශයෙන් පසු නොබස්නා ප්‍රඥාප්‍රභාව ඇත්තාවූ; මහා ව්‍යාකරණ දන්නා බැවින් මහාවෛයාකරණවූ; කරණසම්පත්තීන් උපයනලද සුවෙන් නික්මෙන මධුර උදාර සිත්කලු තෙපුලෙන් යුක්තවූ; යුක්ත මුක්තබව හා පවත්නා තෙපුල් ඇත්තාවූ; වාදීන් කෙරෙහි උතුම්වූ; මහාකවිවූ; ෂඩභිඥ ප්‍රතිසංවිද් ආදි ගුණෙන් සැදුණු උත්තරිමනුෂ්‍යධර්මයෙහි ප්‍රතිවෙධවශයෙන් මනාකොට පිහිටි බුද්ධිඇති ථෙරවංසප්‍රදීපායමාන මහාවිහාරවාසී තෙරවරුන්ගේ ප්‍රවෙණියට ආභරණස්වරූපවූ; මහත් පිරිසුදු බුද්ධිඇත්තාවූ; අප විසින් නම් නොකිවහැකි ගුරු බැවින් තමන්ගෙ ගුරුන් විසින් **බුද්ධඝොෂ** යයි කියනලද නම් ඇති; ස්ථවිරොත්තමයන් විසින්" සර්වාචාර්‍ය්‍ය මහාක්ෂීණාශ්‍රව රෙවත ස්ථවිරයන් වහන්සේගේ මෙහෙයීමෙන් දඹදිවින් මෙහි පැමිණ ආයුෂ්මත් **සඞ්ඝපාල** මහාස්ථවිරොත්තමයන්ගේ සමීපයෙහි සිංහලාට්ඨකථා හා සියලු ථෙරවාදයන් ඉගෙන පිටකත්‍රය ධර්මචාරවූ මේ **විශුද්ධිමාර්ගය** නිපදවන ලද්දේය.

තමන්වහන්සේගේ අතවැසිවූ **බුද්ධමිත්‍ර** නම් තෙරහු මෙසේ උක්තප්‍රකාර ත්‍රයොදශ ගුණ විශෙෂයෙන් සංවර්ණිත විවිධ පදයන්ගෙන් ස්ථවිරයන්වහන්සේට ගුණකථනයකොට විශුද්ධිමාර්ගය තෙරුන් විසින් කළබව කීහු.

ඒ මේ විශුද්ධිමාර්ගය තෙමෙ නිවන් සොයන්නාවූ කුලපුත්‍රයනට ශීලාදි විශුද්ධිය පිණිස නය දක්වන්නේද එහෙයින් . පිරිසුදු සිත් ඇති ඉෂ්ටානිෂ්ට දෙක්හි සදෘශවූ ලොවට දෙටුවූ මහර්ෂිවූ බුදුරජාණන් වහන්සේගේ බුද්ධ යන නාමය යම්තාක් කල් ලොව පවත්නේද එතාක් දක්වා ලොව පවතීවා යි; මෙහි නිගමනානුසාරයෙන් කථිත හෙයින් ශාසනන්තර්ධානය දක්වාම ශාසනාවචර කුලපුත්‍රයන් විසින් ආදෘතවූ මෙම **විශුද්ධිමාර්ගය** තෙමෙ සතතයෙන් සම්භාවිතමයැ.

එයින් කීහ, බුද්ධමිත්‍ර තෙරහු.

**"තාවතිට්ඨතු ලොකස්මිං ලොකනිත්ථරණෙසිනං**
**දස්සෙන්තො කුලපුත්තානං නයං සීලවිසුද්ධියා.**
**යාව බුද්ධොති නාමම්පි සුද්ධචිත්තස්ස තාදිනො**
**ලොකම්හි ලොකජෙට්ඨස්ස පවත්තති මහෙසිනො ති".**

අර්ථකථාචාර්‍ය්‍ය ශ්‍රීමද් අනුබුද්ධ බුද්ධඝොෂ මහාස්ථවිරවර
ප්‍රවෘත්තිය.

---

දඹදිව මහබෝමැඩ සමීපයෙහිවූ නොහොත් මහබෝමැඩින් ක්‍රොශපඤ්චයකින් දක්ෂිණදිශායෙහි එක් ගමෙකැ බ්‍රාහ්මණ මානවකයෙක් උපන. හෙතෙම සියලු විද්‍යාශිල්ප කලාවන් දත්තේය. වෙදතන්ත්‍රයෙහිදු දක්නාලද පරතෙර ඇත්තේය. මොනවට දන්නාලද සමය

ඇත්තේය. සියලු වාදයන්හි නොපැකිලැ පවත්නා ඥානගති ඇත්තේය. වාද හෝ කටැට්වූයේය. හෙතෙමෙ එක්කලෙකැ උත්කෂ්ඨවාද ඇතිව දඹදිව ඇවිදිනේ වෙහෙරකට වැද රාත්‍රිභාගයෙහි අක්ෂරයෙන් පරිපූර්ණකොට දසවිධව්‍යඤ්ජනබුද්ධිය නොපිරිහෙළීමෙන් පිරිමඬුලු කොට පාඨොච්චාරණයෙන් **පාතඤ්ජලමතය** හදරයි. එකලැ එවෙහෙර වැසි මහපැණැති **රේවත** නම් ස්ථවිරොත්තමතෙම සිතනුයේ "මෙතෙම මහපැණැත්තේය. දමනයකරන්ට වටනේයයි" සිතා මේ කවරෙක් කොටලුහඬින් ශබ්දකෙරේදැයි පරිහාස කෙළේය. ඉක්බිති ඒ මානවකතෙමෙ කිමෙක්ද ශුෂමත්හු කොටලුහඬෙහි අර්ථ දන්නාසේක්දැයි තෙරුන් විචාළේය. එසේය බමුණ මම දනිම් යි තමන් විසින් පවසන ලද බමුණුතෙමෙ තමා ගැටමුසු පැනයක් පහළකෙළේය හෙළන හෙළනලද සියලු මතයන් තිහිණිසැතින් මහනිල්මල් කලඹක් කඩ කඩකොට සිඳින්නාක්මෙන් විසඳ විරුද්ධතැන්ද දැක්විය. එසේවීනම් නුඹවහන්සේත් සියමතය ගෙනහැර දක්වනසේක්වයි චොදනාකරනලද ඒ මහාස්ථවිරතෙමෙ යමකප්‍රකරණයෙහි විජම් පෙළක් වදළේය. ඒ මානවකතෙමෙ එහි කිසි අර්ථාවබොධයකට අපොහොසත්වූයේ මේ කවරක්හුගේ මන්ත්‍රයක්දැයි තෙරණුවන් විචාළේය. ස්ථවිරතෙමෙ මේ බුද්ධමන්ත්‍රයයි වදළේය.' එසේවීනම් හේ මට දෙනුමැනවයි කීයෙන් පැවිදිව ගන්වයි වදළේය. ඉක්බිති හෙතෙමෙ මන්ත්‍ර සඳහා පැවිදිව පිටකත්‍රය ධර්මය මනාකොට ඉගෙන එකායනමාර්ගය නම් මෙයමයයි දත්තේය. බුදුන්ගේ සෙයින් ගැඹුරු හඬ ඇතිහෙයින්ද බුදුන්සේ පොළෝතෙලෙහි පතළ යසස් ඇති හෙයින්ද මෙතෙමෙ බුද්ධඝොෂයයි ප්‍රකට විය.

කියනලදමැයි, මහාවංශයෙහි.

"බුද්ධස්ස විය ගම්භීර ඝොසත්තා නං වියාකරුං
බුද්ධඝොසොති ඝොසෙහි බුද්ධො විය මහීතලෙ"යි.

ඉක්බිති මහානුවණැති ඒ බුද්ධඝොෂස්ථවිරතෙම දඹදිව්හිදී **ඤාණොදය** නම් ප්‍රකරණය ද; ධම්මසඞ්ගණියට **අත්ථසාලිනී** නම් අටුවාවද; කොට යළිත් **පිරිත්අටුවාවද** කරන්ට පටන් ගත්තේය. ඒ දැක **රේවත** ස්ථවිරයන්වහන්සේ බුද්ධඝොෂතෙරණුවන්ට වදරණසේක් "මෙහි ත්‍රිපිටකපාලිය පමණක් ආචාර්‍ය්‍යපරම්පරයෙන් ගෙනඑන ලද්දේය. අටුවා නැත්තේය. එසේම නානාආචාර්‍ය්‍යවාදයෝද අවිඥ්‍යමානයහ. එහෙයින් සඞ්ගීතිත්‍රයාරූඪවූ බුද්ධවචනද මහාකාශ්‍යපාදි මහතෙරවරුන් විසින් වදරනලද අර්ථකථාමාර්ගයන්ද මොනවට දැන මහාප්‍රාඥවූ මහාමහෙන්ද්‍ර ස්ථවිරාශ්‍රවයන්වහන්සේ විසින් සිංහලභාෂායෙන් කරනලද ශුද්ධවූ සිංහලාර්ථකථාවන් ලක්දිව සිංහලයන් කෙරෙහි පවත්නා හෙයින් තෙපි එහි ගොස් හෙද අසා දැන මාගධනිරුක්තියට පෙරළා අර්ථකථාකාරව එය සියල්ලන්ට හිත

වැඩ සාහන්නේයයි'' වදාළසේක. එසඳ පහන්සිත් ඇති බුදුගොස් තෙරණුවෝ දඹදිවින් නික්ම බුදුන් පිරිනිවි නවසියපනස්තුන්වන්නෙහි අනුරාධපුරයෙහි **මහානාම** රජු සමයෙහි මහාවිහාරයට පැමිණ එහි මහාපධානඝරවාසී භදන්ත **සඞ්ඝපාල** ස්ථවිරෝත්තමයන් සමීපයෙහි සිංහලාර්ථකථා හා සියලු ථෙරවාදයන්ද අසා ඉගෙන මේ තෙමේම ධර්මරාජන්වූ තථාගතයන්වහන්සේගේ අභිප්‍රාය යි නිශ්චය කොට දැන එහි සඞ්ඝයා රැස්කරවා අටුවා කරනු පිණිස මට සියලුම පොත් දුනමැනවැයි ඉල්වූහ. එකල්හි මහාභික්ෂුසඞ්ඝ තෙමෙ තෙරණුවන් විමසනු සඳහා "තොපගේ සාමර්ථ්‍යය මිහි දක්වව හේ දැක සියලු පොත් දෙම්හ"යි වදරා සංයුක්තනිකායයෙහි **"අන්තො ජටා බහි ජටා"** යනාදි ජටාවිජටන සූත්‍රධර්මය පිළිබඳවූ පෘච්ඡාවිසර්ජන ගාථාවය දුන්සේක. ඉක්බිති ඒ බුද්ධඝොෂස්ථවිරෝත්තම තෙමෙ ශාසනයාගේ ආදිකල්‍යාණාදිභාවය විභාවනයකරන්නාවූ විසර්ජන ගාථාව මඞ්ගල බැවින් පළමුකොට ගෙන අටුවාසහිත තුන්පිටකය සැකෙවින් එහි ඇතුළත් කොට විසුද්ධිමග්ගනම් අත්‍යුත්තමාර්ථකථා මහාග්‍රන්ථය ලක්දිව පළමුකොට නිපදවූයේය. එහෙයින්ම කීහ. **"විපුලවිසුද්ධබුද්ධිනා බුද්ධඝොසෙන ගුරූහි ගහිතනාමධෙය්‍යෙන ථෙරෙන කතො විසුද්ධිමග්ගො"**යි ජිනවචනයෙහි බුහුටිවූ නුවණැති හෙතෙමෙ මහාසංඝයාවහන්සේ මහබෝමළුයෙහි රැස්කරවා එය කියවන්ට පටන්ගත්කල්හි දෙවියෝ උන්වහන්සේගේ ධර්මනෛපුණ්‍යය ලොව පතළකරනු පිණිස මූල්පොත සැඟවූහ. ශ්‍රද්ධාවීර්‍ය්‍යාදිගුණප්‍රතිමණ්ඩිතවූ ශ්‍රීමද් බුද්ධඝොෂස්ථවිරයන් වහන්සේ තුන්වනවර දක්වා නැවැත නැවැතද පොත් කොට පෙරමෙන් මහ සඟමැද කියවන්ට පටන්ගත් කල්හි දෙවියෝ පෙර තමන් සැඟවූ මූල්පොත් දෙකද සඟමැද තැබූයෙන් භික්ෂූහු පොත් තුනම සංසන්දනය කොට කියවන්ට පටන්ගත්හ. එකලැ එහි අර්ථවශයෙන් හෝ ග්‍රන්ථවශයෙන් හෝ පූර්වාපරවශයෙන් හෝ ථෙරවාද වශයෙන් හෝ පෙළින් හෝ පදයෙන් හෝ බ්‍යඤ්ජනයෙන් හෝ රේඛාමාත්‍රයකුදු අඩුවැඩි නොව සමානත්වයෙක්ම වූයේය. ඉක්බිති මේ ආශ්චර්‍ය්‍යය දුටු සඞ්ඝතෙමෙ තුටුපහටු වූයේ ඔදවැඩිසිත්ඇතිවූයේ සාධුනාද පවත්වා **"මෙතෙමෙ ඒකාන්තයෙන් මෙතේබෝසත් තෙමේය"** යි උද්ඝොෂණය කොට සිංහලාර්ථකථා සහිතවූ පිටකත්‍රය පිළිබඳ සියලු ප්‍රකරණයන් පිළිගැන්විය. ඉක්බිති ඒ ස්ථවිරෝත්තමතෙමෙ මහාවිහාරබද්ද දූරසඞ්කරග්‍රන්ථාකරපරිවෙණයන්හි වෙසෙමින් සියලු සිංහලාර්ථකථාවන් සාර්ජනීනමූලභාෂාවූ මාගධියට පෙරළා **සමන්තපාසාදිකා** විනයට්ඨකථාදී අර්ථවර්ණනාවන් නිපදවූයේය. මෙසේ සර්වප්‍රකාරයෙන් පරිනිෂ්ඨිතවූ ශාසනකෘත්‍යඇති අර්ථකථාචාර්‍ය්‍ය ශ්‍රීමද් අනුබුද්ධ බුද්ධඝොෂ මහාස්ථවිරෝත්තම තෙමෙ මහබෝ වඳනා සඳහා සියපෙදෙසවූ දඹදිවටම පෙරළා වැඩියේය. යනු පරම්පරායාත පරිශුද්ධවාර්තා යි.

# විශුද්ධිමාර්ගය.

---

**විසුද්ධීති සබ්බමලවිරහිතං අච්චන්තපරිසුද්ධං නිබ්බානං වෙදිතබ්බං තස්සා විසුද්ධියා මග්ගොති විසුද්ධිමග්ගො**"යි යු බැවින් මෙහි විසුද්ධිනම් රාගාද්‍යශෙෂක්ලේශමලාපගමයෙන් සර්වාකාරයෙන් පිරිසුදුවූ නිර්වාණය වෙදිතව්‍යය. තද්විසුද්ධියට හෙවත් මොක්‍ෂ ප්‍රතිලාභයට උපායතෙමෙ විශුද්ධිමාර්ග නම් වේ. මෙහි වනාහි නිෂ්පර්‍ය්‍යාය වශයෙන් සලකනකලැ ලොකොත්තරවූ ආර්‍ය්‍යමාර්ගය තෙමෙ විශුද්ධිමාර්ග නම් වන්නේය. පර්‍ය්‍යායවශයෙන් සලකත් හොත් තදුපායවූ පූර්වභාග ප්‍රතිපදාමාර්ගයද වර්ණනීයධර්මයක්හුගේ ආදියෙහි දක්වියයුතුවූ නිදානකථා හා තදනන්තර කොට ප්‍රයෝජනය පිණ්ඩාර්ථය පදාර්ථය සම්බන්ධය අභිප්‍රායය චොදනාය ශොධනාය යන මෙ පිළිවෙළින් නිපදවන ලද මේ අර්ථකථාග්‍රන්ථයද **විසුද්ධිමග්ග** නම් වේ යයි දතයුතු.

මෙ වනාහි දීඝනිකායාදීන්ට සුමඞ්ගලවිලාසින්‍යාදිය මෙන් අන්‍ය සංවර්ණනායෙකුදු නොවේ. එසේදවුවත් සමන්තපාසාදිකා සුමඞ්ගල විලාසින්‍යාදියෙන් ශෙෂවූ දීඝනිකායාදි චතුර්විධ නිකායයන්ගේ මධ්‍යයෙහි සිට ශාස්තෘහුගේ අවිපරීතධම්මදෙශනාභාව විභාවනයෙන් අත්‍යුත්කෘෂ්ටවූ ප්‍රධානවූ අර්ථකථා රත්නයෙක්ම වන්නේය.

එහෙයින් කීහ, **සුමඞ්ගලවිලාසිනියෙහි.**

**"මජ්ඣෙ විසුද්ධිමග්ගො එස චතුන්නම්පි ආගමානං හි**
**ඨත්වා පකාසයිස්සති තත්ථ යථාභාසිතං අත්ථං**"යි.

මෙ සස්නෙහි පැවිදිවූ යම් .යොගීකෙනෙක් ඍජුවූ ආර්‍ය්‍යමාර්ගාවබොධය ශීලවිශුද්ධ්‍යාදි ෂඩ්විශුද්ධිපරම්පරායෙන් ප්‍රාප්තව්‍යය; මෙබඳු ස්වරූප ඇත්තේය; මෙබඳු කෘත්‍ය ඇත්තේය; මෙබඳු ප්‍රයෝජන හෝ ඇත්තේය; යි තත්වූ පරිදි නොදත අමෘතාධිගමය සඳහා වීර්‍ය්‍යවඩන්නාහු නමුදු උපායය අනධිගතබැවින්ම අත්‍යන්ත පරිශුද්ධත්වයට නොපැමිණියහැකි වෙත්ද;- ඔවුන්ගේ ප්‍රමොදය සඳහා අනුබුද්ධ බුද්ධඝොෂාචාර්‍ය්‍යවරෙණ්‍යයන් විසින් නිකායාන්තර ලබ්ධීන් හා අසඞ්කරත්වයෙන් මනාපිරිසුදුවිනිශ්චය ඇතිකොට මහ වෙහෙරවැසි තෙරවරුන්ගේ නිරාකුලවූ කථාමාර්ගයන්ද ඇසුරු කෙරෙමින් මෙය නිපදවූයේයයි මෙහි නිගමනානුසාරයෙන්ද; අන්‍ය වූ ප්‍රශස්ත ග්‍රන්ථානුසාරයෙන්ද; ප්‍රතීයමාන වේ.

කථිතමැයි, **විසුද්ධිමග්ගටීකායෙහි.**

**"විසුද්ධචරිතො නාථො යං විසුද්ධිමනුත්තරං**
**පත්වා දෙසෙසි කරුණා සමුස්සාහිතමානසො.**
**තස්සා අධිගමූපායො විසුද්ධිනයමණ්ඩිතො**
**විසුද්ධිමග්ගො යො වුත්තො සුවිසුද්ධපදක්කමො.**

**සුවිසුද්ධං අසංකිණ්ණං නිපුණත්ථවිනිච්ඡයං
මහාවිහාරවාසීනං සමයං අවිලොමයං.
තස්ස නිස්සාය පොරාණං කථාමග්ගං අනාකුලං
තන්තිනයානුගං සුද්ධං කරිස්සාමත්ථවණ්ණනං.''** යි.

මේ විශුද්ධිමාර්ගග්‍රන්ථයතෙමෙ **සීලනිද්දෙසය සමාධිනිද්දෙසය පඤ්ඤානිද්දෙසය** යි මහා නිර්දේශත්‍රයකින් ප්‍රතිමණ්ඩිතය. පරිච්ඡේදදි විසින් වනාහි තෙවිසි පරිච්ඡේදයකින් හා බණවර අටපනසකින්ද පරිපූර්ණවන්නේය.

කියනලදමැයි, බුද්ධඝොෂ මහාස්වාමිපාදයන් විසින්ම.

**''විසුද්ධිමග්ගො එසො ච අනන්තරියං විනා ඉධ
නිට්ඨිතො අට්ඨපඤ්ඤාස භාණවාරාය පාළියා''** යි.

මෙහි අවාන්තරප්‍රභෙද විසින් සලකත් හොත් තෙළෙස් අඟකින් යුත් ධුතඞ්ගනිද්දෙසය, සතරසංවර සීලයන්ගේ වශයෙන් දැක්වූ **සීලනිර්දේශයෙහිම** ඇතුළත් වන්නේය.

කම්මට්ඨානගහණනිද්දෙසය, පඨවිකසිණනිද්දෙසය, සෙසු නව කසිණයන්ගෙන් සමුපලක්ෂිත සෙසකසිණනිද්දෙසය, අසුභකම්මට්ඨාන නිද්දෙසය, ෂඩනුස්මෘතිධර්මොපලක්ෂිතවූ අනුස්සතිනිද්දෙසය, සෙසු සතර අනුස්සතීන්ගෙන් යුත් අනුස්සතිකම්මට්ඨාන නිද්දෙසය, චතුර්විධ බ්‍රහ්මවිහාරභාවනායෙන් ප්‍රතිමණ්ඩිතවූ බ්‍රහ්මවිහාරනිද්දෙසය, චතුර්විධ ආරූප්‍යකර්මස්ථානයන්ගෙන් සමුපලක්ෂිත ආරුප්පනිද්දෙසය, ආහාරයෙහි ප්‍රතික්කූලසංඥාකර්මස්ථානකථා සහිත චතුධාතුවවත්ථාන නිද්දෙසය, ඉද්ධිවිධනිද්දෙසය, හා අභිඤ්ඤානිද්දෙසයදැයි, මෙ කියනලද එකොළොස් නිර්දේශයෝ **සමාධිනිර්දේශයෙහි** ඇතුළත් වෙත්.

පඤ්චස්කන්ධ විභාගාදීන් සමුපලක්ෂිතවූ ඛන්ධනිද්දෙසය, ධාත්වායතනකථායෙන් යුත් ආයතනධාතුනිද්දෙසය, ඉන්ද්‍රිය සත්‍යවිභාගාදීන් යුක්ත ඉන්ද්‍රියසච්චනිද්දෙසය, ප්‍රත්‍යයප්‍රත්‍යයොත්පන්නධර්මවිභාගාදීන් උපයුක්ත පඤ්ඤාභූමිනිද්දෙසය හෝ පටිච්චසමුප්පාද නිද්දෙසය, දිට්ඨිවිසුද්ධිනිද්දෙසය, කඞ්ඛාවිතරණ විසුද්ධිනිද්දෙසය, මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිනිද්දෙසය, නවමහාවිදර්ශනාඥානකථොපලක්ෂිතවූ පටිපදාඤාණදස්සනවිසුද්ධිනිද්දෙසය, සතරමාර්ගඥානයෙන් විස්තාරප්‍රාප්තවූ ඤාණදස්සනවිසුද්ධිනිද්දෙසය, ප්‍රඥාභාවනානෘශංසපරිදීපකවූ පඤ්ඤාභාවනානිසංසනිද්දෙසයදැයි, මෙසේ දශනිර්දේශකෙනෙක් **ප්‍රඥානිර්දේශයෙහි** ඇත්ළත්වන්නාහුය''යි යථොපසිතත්වයෙන් වෙදිතව්‍යයි.

## විශුද්ධිමාර්ග පරිවාර ග්‍රන්ථ.

---

දඹදිව ආඥාචක්‍රවර්ති ධර්මාශොක මහානරෙන්ද්‍රයන් විසින් කාරපිතවූ බදරතීර්ථවිහාරවාසී වීතීය අර්ථකථාචාර්යවූ භදන්ත **ධම්මපාල** මහාස්ථවිරොත්තමයන් විසින් නිපදවනලද **පරමත්ථමඤ්ජූසා**

න්වූ අතිප්‍රශස්ත ටීකාවද, කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත **පරාක්‍රම බාහු** නරේන්ද්‍රයන් විසින් තට්ටීකාව ගුරුකොට විරචිතවූ සෛංහලීය **මහාඅර්ථව්‍යාඛ්‍යානය**ද, යන මේකී ප්‍රශස්තතම පෞරාණික ග්‍රන්ථවරයෝ විශුද්ධිමාර්ග අර්ථකථාව පිළිබඳවූ ප්‍රයෝජනාපේක්ෂක බුද්ධිමත් ජනයා හට සාධ්‍යඵලසාධකත්වයෙන් විද්‍යමානවෙත්.

මෙකල්හි විද්‍යමානවූ **ටීකා සන්‍ය** දෙකටම පුරාතනවූ මාහැඟි සිංහලව්‍යාඛ්‍යානයක් මීට හවුරුදු සත්සියයකිනුත් පෙරපැවැතිනමුත් හේ කාලවිපරිණාමයෙන් අභයගිරි ජේතවනිකාදීන්ගේ මිථ්‍යාමත සඞ්කලනයෙන් දූෂිතව පැවැතිහෙයින් ලුප්තප්‍රායවූයේයයි සැලකිය හැකි බැව් මේ ව්‍යාඛ්‍යානයෙහිම ඇතුලත්ව පවත්නා මතු දක්වනු ලබන පාඨවිශෙෂයන්ගෙන් හැඟෙයි.

**කාපිත මැයි, විශුද්ධිමාර්ග මහා සන්‍යෂයහි.**

ලක්ඛණාදිසු හි, ලක්ෂණරසාදීන් කෙරෙහි; කිච්චමෙව සම්පත්තිවා රසොති වුච්චති, කෘත්‍යයම හෝ සම්පත්තියම හෝ රසයයි කියනු ලැබෙයි; රසායතන රසරසාදීහු කියනු නොලැබෙත් සන්‍යයෙහි "කිච්චමෙව" යන අවධාරණයෙන් කෘත්‍යරසය බලවත්බව කීහයි කීහු. "කිච්චමෙව සම්පත්ති එව වා රසො"යන මේ අර්ථය අභිමත බැවින් හේ ඔවුන්ගේ මතිමාත්‍රයි:—

එකන්තනිබ්බිදාය, එකාන්තනිර්වේදය පිණිසය; ("විරාගාය අභිඤ්ඤාය සම්බොධාය"යනු මාර්ග පිණිසය. "නිරොධාය උපසමාය නිබ්බානාය"යනු නිවන් පිණිසය යනු සන්‍යයි-)යන මේ විසිනි.

"කෙචිපන"යී බොහෝතැනැ පැනෙන ටීකාගත වචනයට"සන්‍ය යෙහි" යනු මෙම ව්‍යාඛ්‍යාගත අර්ථවාචනා ක්‍රමය වේ. එහෙයින්ම එම **සන්‍යය** විශුද්ධිමාර්ගටීකාවටත් පුරාණයෙහි පැවැත්තේයයි නිසැක වම සිතිය හැකිය.—

**පරාක්‍රමබාහු මහා ව්‍යාඛ්‍යා.**

---

"විමලවිපුල බුද්ධීන් ප්‍රසිද්ධවූ බුද්ධඝොෂ මහා ස්වාමිපාදයන් විසින් යොගාවචරකුලපුත්‍රයන්ගේ ප්‍රමොදය පිණිස පිරිසුදු නයින් ප්‍රතිමණ්ඩිතවූ යම් විශුද්ධිමාර්ගයක් කියනලද නම් සකල පෘථිවීශ්වරයන්ට ධවජ යක් බඳුවූ සම්බුද්ධශාසනාභිවෘද්ධිකාමීවූ ශ්‍රී ලඞ්කාවීපාධිපතිවූ **පරාක්‍රම බාහු මහරජාණන්** විසින් මන්දබුද්ධිවූ යොගීන්ට හිතවැඩ පිණිස ඒ විශුද්ධිමාර්ගය පිළිබඳ පදාර්ථ විස්තරාර්ථ සංවර්ණනා තොමෝ සිංහල භාෂායෙන් කියනු ලැබේ"යි තමන් ව්‍යාඛ්‍යාරම්භයෙහිම දැක්වූ හෙයින් මෙහි ව්‍යාඛ්‍යාතෘ **කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු** මහරජතුමන් යයි ප්‍රතීයමාන වේ.

එහෙයින් කීහ, ව්‍යාඛ්‍යාරම්භයෙහිම.

**"පාමොජ්ජත්ථාය යොගීනං බුද්ධඝොසෙන ධීමතා**
**විසුද්ධිමග්ගො යො වුත්තො විසුද්ධිනයමණ්ඩිතො.**

**පරක්කමනරින්දෙන සබ්බභූපාලකෙතුනා**
**ලඞ්කාදීපාධිපතිනා සාසනොදයකාමිනා.**
**තස්ස සංවණ්ණනා එසා සීහලානං නිරුත්තියා**
**යොගීනං මන්දබුද්ධීනං හිතත්ථාය කථීයති"**ති.

තවද අපවිසින් පළමුදක්වූ පරිදි මීටත් පෙරපටන් පැවතආ විශුද්ධිමාර්ගසන්නයෙහි නිකායාන්තර ලබ්ධිමිශ්‍රත්වයෙන් පතිතවූ යම් යම් මතභෙද හෝ වේත් නම් ඔව්හුද ප්‍රතිබාහනය කොට මහාවිහාරීයමතයන් ප්‍රකටකෙරෙමින් නිෂ්පාදිතඅර්ථවාචනායෙන් මේ ව්‍යාඛ්‍යානයාගේ අතිනිර්මලත්වය හා පූජ්‍යතරභාවයත් මොනවට පැහැදිලි වන්නේය. හෙ මෙසේයි.

"යෙසම්පි, යම් (අභයගිරිවැසි) කෙනෙක්නට; ධුතඞ්ගං, ධුතාඞ්ගය තෙමේ; කුසලත්තිකවිනිමුත්තං, කුශලත්‍රික විනිර්මුක්තවේද; (අභයගිරිනිවාසිහු වනාහි ධුතාඞ්ග නම් ප්‍රඥප්ති යි යෙත්.) තෙසං, ඒ අභයගිරි වැස්සනට; අත්ථතො ධුතඞ්ගං නාම නත්ථි, පරමාර්ථයෙන් අවිද්‍යමානබැවින් ධුතාඞ්ගනම් නැත්; අසන්තං, තෙමේ අවිද්‍යමානවූයේ; කස්ස ධුනනතො, කවර කෙලෙසක්හු නසන බැවින්; ධුතඞ්ගං නාම භවිස්සති, ධුතාඞ්ග නම් වේද; *ධුතගුණෙ සමාදාය වත්තතීති, ධුතගුණයන් සමාදන්ව වෙසෙසි යන; වචනවිරොධොපිච, මේ වචනයට විරොධයද; තෙසං ආපජ්ජති, ඒ අභයගිරිවැස්සනට පැමිණේ; (ධර්මවශයෙන් අවිද්‍යමානයා ගුණ නම් නොවන බැවින්ය යනු අභිප්‍රායයි.) යස්මා, යම්හෙයකින් (ප්‍රඥප්තිපක්ෂයෙහි මෙකී දොෂයෝ දුර්නිවාරයෝද එහෙයින්); තං න ගහෙතබ්බං, ඔවුන්ගේ වචනය නොගත යුතුය"-යනුයි.

## ව්‍යාඛ්‍යා පරිශොධනය.

ලෝකයෙහි ධර්මශාස්ත්‍රඥාන වර්ධනයෙහි අත්‍යන්තොපකාරවූ සියලු ව්‍යාඛ්‍යාවන් අතුරෙහි ග්‍රන්ථවිෂයගෞරවයෙන් මූර්ධමාල්‍යස්වරූප කොට විචජ්ජනසම්භාවනීයවූ මේ විශුද්ධිමාර්ගමහාව්‍යාඛ්‍යානය මෙයින් හවුරුදු පන්තිසකින් පූර්වයෙහි කථාශෙෂභාවොපගත බුද්ධශාසන මහාසූරසේනාපති යන රාජදත්තීය උපපද නාමොපලක්ෂිත ආභිධර්මික **ඇම්. ධර්මරතන** ලක්මිණිපහන් කතුතුමන් විසින් පුරාතනවැද ගත් සන්නපොත් ඇසුරුකොට එවකට වැඩවිසූ පණ්ඩිත මහාස්ථවිරයන්ගෙන්ද ලබනලද උපකෘති ඇතිවැ භාවසන්නයකිනිදු යුක්තකොට මහත් පරිශ්‍රමයකින් මුද්‍රණයට පමුණුවනලද්දේය. එසේද වුවත් එය මේ දක්වාම නොනිමියේය. කාලාන්තර ලිපිභ්‍රමාදියෙන් ආකුලව පැවැති මේ ව්‍යාඛ්‍යානය පිළිබඳ තක් පූර්ව පරිශොධනය ප්‍රශස්තවූද බැරෑරුම්වූද කර්තව්‍යයක් බැව් අප විසිනුදු සලකනු ලැබේ. එහි භාවසන්නයද ව්‍යාඛ්‍යායෙහි සුකරුව බොධය ඇතිකරගැනීමට ඉවහල්විය යුතුමය.

මෙබඳු අතිගරු විශාල ග්‍රන්ථයක් එක්වරෙකින් ශොධනයට පමුණුවාලීමද දුෂ්කර කාර්‍ය්‍යයකි. එහෙයින් තදීය පූර්‍වපරිශොධනය විද්වජ්ජනයන්ගේ මනොරථපූරණය හා ව්‍යාඛ්‍යාවගේ අති නිර්මල ශරීරයෂ්ටියත් සර්‍වප්‍රකාරයෙන් නොඑළවන හෙයින් පිරිසුදුමයයි නොසැලකිය හැකිව තිබේ.

මෙසේ මේ බැව් සැලකූ අප විසින් ශාස්ත්‍රාචාර්‍ය්‍ය **ඩී. බී. ජයතිලක** අධිනීතිඥ කොළඹ පල්‍ලාතේ ගරු මන්ත්‍රීශ්වරයන් විසින් කරනලද අධ්‍යෙෂණාවද පිළිගෙන ඉතා වැදගත් ප්‍රශස්ත පුරාණ පුස්කොළ පොත් කීපයක් සපයාගෙන සංශොධනය කිරීමෙන් ප්‍රයොජනගන්න වුන්ගේ පහසුවද සලකා මෙසේ මුද්‍රණයට පැමිණවීමු.

චිරන්තනවූ මෙමැ මාහැඟි සන්නයෙහි කර්‍තෘත්වයෙන් සන්දර්ශිතවූ **කලිකාලසාහිත්‍ය සර්‍වඥ පණ්ඩිත පරාක්‍රමබාහු මහරජාණන්** පිළිබඳව දැනගතයුතු කරුණු රැසක් ඇතුළත්කොට **ශාස්ත්‍රාචාර්‍ය්‍ය ජයතිලක** මැතිතුමන් විසින් ලියනලද වැදගත් ඓතිහාසික ප්‍රවෘත්තියක් මෙහි පළවන බැවින් ඒ පිළිබඳ කිසිවක් අපි නොදැක්වීමු.

තවද මෙහි පූර්‍ව ශොධනය හා අපේ මේ ශුද්ධියෙහි ඇති පරස්පර වෛලක්ෂණ්‍යය හා ග්‍රන්ථගෞරවාවහත්වයත් මෙය කියවන සමාධිමත් සුධීන්ට මනාව වැටහෙනු නොඅනුමානයි.

පෞරාණිකවූද ගැඹුරුවූද මෙම උතුම් සන්නයට **ග්‍රන්ථිපදවර්‍ණනාවක්** ආවශ්‍යක නමුත් මේවර නිකුත්කරන්ට සිදුවූයේ එක් භාගයක් බැවින් එය මේ සමග යොදාලීමට අදහස් නොකෙළෙමු. එම ග්‍රන්ථිපදවර්‍ණනාව මෙම මහාසන්නයෙහි අවසාන් භාගය හා සමග නිකුත්කරන අදහස් ඇත්තෙමු.

සංවර්‍ණිත පදයන්ගේ **අනුක්‍රමණිකාවද** ඒ හා සමගම යෙදුව මනා බැවින් හෙද මෙහි නොයොදාලීමු.

අපේ මේ ශුද්ධිය පිණිස ලැබුණු පෞරාණික පොත් අතුරෙන් ගල්කෙමේ පුරාණ විහාරස්ථානයෙන් ලැබීතිබෙන පොත අතිශය සම්භාවනීය බැව් සතුටින් සඳහන්කරමු. තවද මේවර මෙම විශුද්ධිමාර්‍ගව්‍යාඛ්‍යානය පිළිබඳ ලෙඛකදොෂාපහරණයෙන් කරනලද සංස්කරණයෙහි අප පිළිබඳ ප්‍රයාසය ධර්‍මශාස්ත්‍රාභිලාෂී සාධූන්ගේ උපකෘතිය පිණිසත් ප්‍රෙක්ෂාපූර්‍වකාරී විද්වජ්ජනසම්භාවනය පිණිසත් සාධනවේවායි ආශංසනයකරම්හ.

**K. Dhammaratana.**

**1925 ඔක්තෝම්බ්‍රමස 25 වෙනි දින**

**කඹුරුපිටියේ විලේගොඩ පුරාණ විහාරස්ථානයෙහිදීය.**

# ෂාලහාරිනී.

1. සුගතං සරසීරුහංව බුද්ධං
පවරං තප්පභවං මධුංව ධම්මං
මධුපීතමධුබ්බතෙව සඞ්ඝං
පණමෙ තං රතනත්තයං තිධාහං.

2. පටිවිඹබිලත්ථ සම්පවත්තා
භගවා යෙස විසුද්ධිමග්ගයුත්තං
යමුදීරයි සබ්බතො පසත්ථං
නිඛිලං තං පිටකත්තයං අහොසි.

3. සකලස්ස පි තස්ස බුද්ධඝොස
ත්ථවිරෙ ථෙරවිනිච්ඡයප්පවීණො
අකරීධ විසුද්ධිමග්ග මෙතං
මිතසඞ්ඛෙපනයත්ථවණ්ණනාහං.

4. අථ තස්ස පරක්කමාදිබාහු
ධරණී සොරිසසඞ්ඛරාහුබාහු
චිරභාවිත අත්ථවණ්ණනෙතං
නිජභාසාය විභාවි භාවිතත්තො

5. චිරබද්ධලිපිප්පමාදදොසං
උභයං තං විමලීකතම්පි යෙන
න හි තත්ථ මනීසිනං පසාදෙ
මම තස්මාත්‍ර අයං පුනප්පයාසො.

6. යස්සා භුවි විත්ථතම්හි විජ්ජා-
දිකලඞ්කාර සුසත්ථමන්දිරස්මිං
ගුරුනොපපදාදිකස්ස ධම්ම-
රතනත්ථෙරවරස්ස සඤ්ඤතස්ස.

7. සුමතීහි යතොභියාචිතො හං
පවිතොදිං පචුරප්පතීතදොසං
ලිඛිතෙත්ථ පුරාණගන්ථජාතං
සමුපත්ථම්භමහොසි බුද්ධියා මෙ.

8. ස හි සක්‍යමුනින්දවජ්ජරස්මිං
චිරදඞ්ගණණ්ණවලොචනෙ බ්‍යතීතෙ
ස හි තත්ථ විසුද්ධිමග්ගගන්ථො
පරිසොධිතව පකාසිතො මයෙවං.

## කලිකාලසාහිත්‍ය සර්වඥපණ්ඩිත පරාක්‍රමබාහු මහරජාණෝ.

---

**ශ්‍රීබුද්ධවර්ෂ 1779** වැන්නෙහි සිරිලක රජපැමිණි ජම්බුද්‍රෝණි පුරවරාධීශ **පණ්ඩිත පරාක්‍රමබාහු** මහරජාණන්ගේ කීර්තිකදම්බය සිංහල ඉතිහාස නමැති දර්පණතලයෙහි ප්‍රතිබිම්බිතව අද දක්වාත් භ්‍රාජමානව පවතී මැයි. ශෞර්‍ය්‍යවීර්‍ය්‍යබලපරාක්‍රමයෙන් හා යශෝතේජසින් ද බුද්ධධර්මයෙහි හා නානාභාෂාශාස්ත්‍රවිෂයෙහි ව්‍යාප්තවූ ප්‍රඥාමහිමයෙන් ද අසදෘශවූ කවිත්වයෙන් ද ශ්‍රද්ධාශීලාදි ගුණසම්පත්තීන් ද විශිෂ්ටවූ මේ මහරජතුමන්ගේ පවිත්‍රවීරචරිතය පිළිබඳ බොහෝ කරුණු මහාවංශාදි ඉතිහාස ග්‍රන්ථයෙන් හා අන්‍යවූද සම්භාව්‍ය පොතපතින් සපයාගත හැකිවීම මහත් සතුටට හේතුවකි. එතකුදුවුවත් එසියල්ලක්ම විස්තරවශයෙන් මේ ලිපියෙහි බහාලීම ප්‍රපඤ්චහෙයින් ඒ මහරජාණන් ලඞ්කාද්වීපය පරසතුරු උවදුරින් මුදා සතළිස්හවුරුදු පමණ කාලයක් රජවිපර්‍යාසාදි අනේකවිධවිපත්තීන් පීඩිතවූ සිංහලද්වීපවාසීන් සුවපත් කරවා ත්‍රිසිංහලයම එක්සත්කොට සෙමෙහි තබා පිරිහීමට පත්වතුබූ සම්බුද්ධශාසනයත් ප්‍රකෘතිමත් කරවා ශාස්ත්‍රයද විශේෂ සමෘද්ධියකට පැමිණවූ පරිදි සැකෙවින් මෙහි දක්වා ලම්හ.

ශ්‍රීබුද්ධවර්ෂ 1696 (ක්‍රි: ව: 1153) වන්නෙහි ලඞ්කාරාජ්‍යශ්‍රී පදප්‍රාප්ත පළමුවැනි **පරාක්‍රමබාහු** මහරජාණන් අතුල්‍යවූ ප්‍රතාපමහිමයෙන් ද්වීපචක්‍රවර්තීව සොළී පාණ්ඩි අරමණ ආදි පරදේශයන්හිද ස්වකීය අණසක පතුරුවා අනුපමවූ යශෝතේජසින් විරාජමානව වැජඹෙමින් දීර්ඝකාලයක් මුළුල්ලෙහි භින්නනිකායව පැවැති මහාසඞ්ඝයා සමගකරවා දුශ්ශීල පාපභික්ෂූන් පහකොට සස්නද පිරිසිදුකොට වර්ධනය කෙරෙමින් තුන්තිස්හවුරුද්දක් රාජ්‍යයකොට අපවත්වූ පසු එ මහරජහුගේ බෑනණුවූ **පණ්ඩිත විජයබාහු** නම් පැනවත් ගුණවත් රජතුමා එක්හවුරුද්දක් දැහැමෙන් සෙමෙන් රජකරන කල **කිලිංගකස්ද මිහිඳු** නම් ද්‍රෝහී ඇමැතියා විසින් දුෂ්ටප්‍රයෝගයකින් ජීවිතක්ෂයට පමුණුවන ලදින් **කීර්තිනිශ්ශඞ්කමල්ල** නම් කාලිඞ්ගවංශික කුමාරයෙක් අභිෂේක ලැබ නවවසක් ධර්මයෙන් රාජ්‍යානුශාසනා කෙළේය. ඔහු ඇවෑමෙන් ඔහුගේ පුත්‍රවූ **වීරබාහු** මාපාණන් රජවූ නමුත් එදවසම "මොහු නොසම්මත දරුහ"යි **නාවුරු** නම් සෙනෙවිරත්හු විසින් මැරවූ පසු නිශ්ශඞ්කමල්ල නරපතිහුගේ සහෝදරවූ **වික්‍රමබාහු** කුමාරයා තුන්මසක්* රජකළ ඉක්බිති ඔහුගේ බෑනණුවූ **චොඩගඞ්ග** රජ ඔහු මරු නවමසක් රාජ්‍යය පාලනය කෙළේය. ඉක්බිති **කීර්ති** නම් සෙනෙවි මහඇමතියා එරජු පහකොට පරාක්‍රමබාහු මහරජහු අගබිසෝවූ **ලීලාවතී** මෙහෙසිය ලවා තුන්අවුරුද්දක් †

---

* පූජාවලියෙහි 'තුන්වසක්'යි කියනලදි.

† සාවුරුද්දක්යයි පූජාවලියෙහි පැනේ.

රාජ්‍යය කරවූයේය. **ආශසමන්ත** හෙවත් එළලු ආබෝ නම් සෙනෙවිරත් දෙවසක් යුඩකොට ඒ ලීලාවතී බිසොවුන් නෙරපාදමා නිශ්ශඞ්කමල්ලරජුගේ මලණුවන්වූ **සාහසමල්ල** නම් කුමරුවා ලවා එක් අවුරුද්දක් රජයකරවා ඔහු පහකොට නිශ්ශඞ්කමල්ල මහරජහුගේ අගමෙහෙසියවූ **කල්‍යාණවතී** බිසොවුන් ලවා සාවුරුද්දක් රජය කරවා ඇයද නෙරපා **ධර්මාශොක** නම් බිළිඳු කුමරුවකු අභිෂෙක කොට තමාම හවුරුද්දක් රාජ්‍යය පාලනය කරනකල **අණීකංග** නම් ඈපාණන් බලසෙන් කැටිව සොළීරටින් අවුත් ධර්මාශොක කුමරුවාත් ආබෝනාවනුත් මරා රජවූ නමුත් දසසත්වෙනි දින **චමුනක්ක** නම් ඔහුගේම සෙනෙවියා ඔහු නසා යටකී ලීලාවතී බිසොවුන් නැවතත් සිංහසනාරූඪ කැරවිය. ඒ බිසොවුන් හවුරුද්දක් රජය කරන කල **ලොකෙශ්වර** නම් රජෙක් දඹදිවින් මහත් දෙමළසේනාවක් සමග අවුත් ලක්දිව වසග කොටගෙන නවමසක් සවකීය ආඥාචක්‍රය පැවැත්වූ ඉක්බිති කලුන්නරුවංසයෙහි උපන් **පරාක්‍රම** නම් බලසම්පන්න සෙනෙවියෙක් එරජු පහකොට **ලීලාවතී** බිසොවුන් තුන්වැනිවරට රජයෙහි පිහිටුවූයේය. එමෙහෙසියට සත්මසක් ගියකල **පරාක්‍රම** නම් පඬිරජෙක් මහත් බලසේනා ගෙන ලක්දිවට බැස ලීලාවතී බිසොවුන් හා පරාක්‍රම ඇමතියා පහකොට තුන්හවුරුද්දක් රජය කෙළේය. මෙසේ මහාපරාක්‍රමබාහු මහරජාණන්ගේ කාලයට අනතුරුව ගතවූ තිස්හවුරුද්ද පසළොස්වරක් සිදුවූ රාජවිපර්‍ය්‍යාසයෙන් ව්‍යාකුලවූයේය. ඒ කාලාන්තරයෙහි රජවූවන්ගෙන් නිශ්ශඞ්ක මල්ල රජහු හැර අන්‍ය හැමදෙනාම බලාත්කාරයෙන් සිංහාසනයෙන් පහකරන ලදහ. ඔවුන්ගෙන් වැඩිදෙනෙක් මරනු ලැබූහ. මේ විෂමකාලයෙහි ඇතිවූ සෙනෙවිරත් ආදි ජනප්‍රධානීහුද යම්කිසි රාජවංශිකයකු රූකඩයක් මෙන් ඉදිරියෙහි තබාගෙන ස්වාධිපත්‍යය සඳහාම ඔවුනොවුන් හා සටන් කෙරෙමින් ස්වදෙශය බෙලහීන කළහ. ඒ ඒ පක්ෂයට බැඳී යුදකරනු සඳහා වරින්වර මෙහි පැමිණි පාරදෙශික භටසේනාවෝද නොඑක් සාහසික ක්‍රියාවෙන් වැසියන් පෙළා රටේ සමෘද්ධිය පිරිහෙළූහ. මෙසේ අභ්‍යන්තර භේදයෙන් හා පරසතුරු වියවුලින් ලඞ්කාද්වීපය අත්‍යර්ථයෙන් දුර්වලව පවත්නා කල කාලිඞ්ගවංශයට අයත් **මාඝ** නම් අධාර්මික රජෙක් සූවිසිදහසක් බලසෙනග ගෙන ලක්දිවට බැස මුළුරටම ස්වවශයට ගෙන පරාක්‍රම පඬිරජහු පහකොට **කාලිඞ්ග විජයබාහු** නාමයෙන් පොළොන්නරුවෙහි අභිෂෙකප්‍රාප්තව එක්විසි හවුරුද්දක් රජය කෙළේය.

ලඞ්කාවාසීන් විසින් කරනලද බලවත් පාපකර්මයකට අනුරූපවූ දඬුවම් ඔවුන්ට පැනවීම සඳහා යමපුරයෙන් එවනලද යමපල්ලන් වැනි මාඝ රජුගේ භටසේනාවෝ ලැව්ගින්නක් මෙන් මුළු ලක්දිවම පැතිරෙමින් සිංහල මහාජනයාට කියනොහැකි තරම් දරුණු පීඩා කළහ. සිංහලයන්ගේ අත් පා කපා ඔවුන්ගේ ගෙවල් බිඳ ඔවුන්

අයත් රන් රිදී මුතු මැණික් වස්ත්‍රාභරණාදියද ගවමහිෂාදීන්ද පැහැර
ගත්හ. එසේම ඔවුන්ගේ ගම් කුඹුරු ආදිය උදුරා දෙමළුන්ට දුන්හ.
සිංහල කුලස්ත්‍රීන් දූෂණය කළහ. සිංහල කුලදරුවන් සිවැසිකළහ.
භික්ෂූන්ට පීඩාකොට උපාසක උපාසිකාවන්ට පහර දුන්හ. සිංහල
යන් වාලුන් ගණනට ගෙන බරඉසිලීම් ආදී හීන මෙහෙයෙහි
ඔවුන් යෙදූහ. රුවන්වැලි ආදී මහා චෛත්‍යයන්ද ප්‍රසිද්ධ මහා විහාර
හා ප්‍රතිමාලයන්ද බිඳහෙළා එහි තුබූ ධාතූන් හා ස්වර්ණ ප්‍රතිබිම්බ
යන්ද අප්‍රමාණ වස්තුවද කොල්ල ගෙන සඞ්ඝාරාම හා පිරිවෙන්
තමන්ට වාසස්ථාන කරගත්හ. පුස්තකාලයන් බිඳ එහි රැස්කොට
තුබූ මාහැඟි පොත් ලනුවෙන් මුදා ඒ ඒ තැන විසුරුවාදමා ශාස්ත්‍ර
යද පිරිහීමට පත්කළහ. බොහෝ සිංහල ජනයා බලාත්කාර
යෙන් මිසදිටු ගැන්වූහ. මෙසේ මේ දුෂ්ටවූ පරසතුරන් විසින් ලෝක
යද ශාසනයද ශාස්ත්‍රයද එකහෙළා නසන්ට පටන්ගත් කල්හි
තත්කාලශාසනානුශාසක වාගීශ්වරාදී මහා ස්ථවිරවරයෝ කිසි පිළි
සරණක් නොලදින් දන්තධාතුව හා පාත්‍රධාතුව පමණක් දෙමළුන්
අත්පත්විය නොදී ඒ ධාතු යුගළය රැගෙන පොළොන්නරුවෙන්
පලාඅවුත් කොත්මලයෙහි ක්ෂෙමස්ථානයෙක්හි එය නිධන් කොට
තබා ලඞ්කාරක්ෂාව සොයමින් මහ මුහුදින් එතෙර සොළී පාඬි ආදී
පරදෙශවලට ගියෝය.

මෙසේ ලක්දිව ගිනිගත් ගෙයක් මෙන් පවත්නා කල්හි යාපව්
වෙහි සුභ නම් සෙනාපතියා ද, ගොවින්ද පර්වතයෙහි භුවනෛකබාහු
නම් ඈපාණන් ද, ගංදෙණියෙහි සංඛ නම් සෙනෙවියාද, ආදීකොට
ඇති ඇතැම් සිංහල වීරපුරුෂයෝ තන්හි තන්හි කඳවුරු බැඳගෙන
අවට ප්‍රදෙශයන් දෙමළුන්ගෙන් ආරක්ෂාකරගත්හ. එසේද වුවත්
සිංහල රාජ්‍යය මාඝරජහුගේ දැඩිග්‍රාහයෙන් ගළවා ගන්නට ඔව්හු
අසමර්ථ වූහ. මීට ප්‍රථම යම්කලෙක ලඞ්කාවීපය පරසතුරන්ට
අත්පත් වී නම් ඒ සියලු වාරවලදීම පාහේ ස්වදෙශය මුදවාගන්ට
පොහොසත් රාජවංශික වීරපුරුෂයකු රුහුණු රට පහළවූ නමුත්
මහා පරාක්‍රමබාහු මහරජාණන්ගේ කාලයේදී පැවැතුණු අභ්‍යන්තර
යුද්ධයෙන් රොහණ ජනපදයෙහි මුල්බැස තුබූ සිංහල රාජවංශය විනාශවූ
හෙයින්. මේ වතාවේදී ඒ පිහිට දකුණු දෙසින් නොලැබුණේය. තවද
පණ්ඩිත විජයබාහු රජහුගෙන් පසු ගතවූ පන්සාලිස් හවුරුදු පමණ
කාලයතුළ සිංහල කුමරුවෙකුට රාජබලය අත්නොවිය. එසේද
වුවත් සිංහල රාජවංශය මේ කාලයෙහි පැවැති දරුණු විපත්ති
පරම්පරායෙනුත් මුලුසුන් නොවූයෙන් ඒ රජ පෙළපතට අයත් කිසි
කෙනෙක් දෙමළුන්ට හයින් මායාරට පිටිසරබද ගම්වල අප්‍රසිද්ධව
විසූහ. ඔවුන් අතුරෙන් ශ්‍රී සඞ්ඝබොධි පරම්පරානුයාත **විජයමල්ල** නම්
කුමරුවාට ඖරස පුත්‍රවූ වීරවික්‍රමාන්විත කුමාරයෙක් ස්වදෙශය මේ
පරශත්‍රැ හයින් මුදවනු සඳහා බලවත් උත්සාහ වඩනුයේ තන්හි
තන්හි වෙනවෙනම සතුරන් හා සටන් කෙරෙමින් සිටි ප්‍රධානීන්

තමා නතුකොට ගෙන මුළු සිංහලසේනාබලය සංග්‍රාමයෙහි යොදවමින් කාලයක් යුද්ධකොට ගමක් ගෙයක් පාසා හිතුමතයේ වාසය කළ දෙමළ භටයන් පලවා හැර මායාරට නිදහස්කොට ගෙන දඹදෙණිනුවර ඉදිකරවා **වත්හිමි විජයබාහු** නාමයෙන් රාජශ්‍රීයට පත්වූයේය. මායාරට දෙමළුන් විසින් නසනලද කැලණිය, අත්තනගල්ල ආදී මහාවිහාර හා දාගැබ් ප්‍රතිමාලයන් ප්‍රතිසංස්කරණය කිරීමද, කොත්මලේ සඟවාතුබූ දළදා පාත්‍රධාතූන්වහන්සේ ගෙන අවුත් බෙලිගල අමුතුවෙන් නංවනලද ශක්තිමත් ප්‍රාකාර ගොපුරාදීන් සුරක්ෂිතවූ මහාමන්දිරයෙක්හි තැබීමද, පරදෙශගත මහතෙරුන් වහන්සේලා නැවත ලක්දිවට වැඩමවා ශාසනශුද්ධියක් කරවා බොහෝ භික්ෂූන් උපසම්පදා කරවීමද, පිරිහීමට පත්ව තුබූ ශාස්ත්‍රඥානය ප්‍රකෘතිමත් කරවීම පිණිස රාජභාණ්ඩාගාරයෙන් බරපැන් දෙවමින් පොත්පත් ලියවා සුලභකරවීම හා ඉගැන්වීම දියුණුකිරීමද යන ආදී ලෝකශාසනෝපකාරී විවිධ කර්තව්‍යයෝ මේ ශ්‍රද්ධා බුද්ධි සම්පන්න රජතුමන් විසින් ආරම්භකරන ලදහ. එසේද වුවත් වෘද්ධ වයසෙහි රාජ්‍යයට පැමිණි හෙයින් මුළු රටම පරසතුරන්ගෙන් මුදවා ගෙන ලෝකශාසනය වර්ධනය කරන්ට තමන්ට කල් නොලැබෙන බැව් දත් ඒ රාජෝත්තමයා **පරාක්‍රමබාහුය භුවනෛකබාහුය** යන ස්වකීය පුත්‍ර කුමාරයන් දෙදෙනා රාජ්‍යභාරය ඉසිලීමට යෝග්‍යවන පරිද්දෙන් බුද්ධධර්මයෙහි හා නානාභාෂාශාස්ත්‍රයෙහි හික්මවා නිපුණකරවා ඔවුන් වැඩිවිය පැමිණි පසු පරාක්‍රමබාහු කුමාරයා චීප චක්‍රවර්තිවීමට තරම් ධන්‍ය පුණ්‍ය ලක්ෂණයෙන් යුක්ත බැව් දැක නියමකාලයෙහි මහසඟ මැදදී ඒ කුමරුවා සඞ්ඝරක්ෂිත මහාස්වාමිපාදයන් ප්‍රමුඛ මහා සඞ්ඝයාටද මහා සඞ්ඝයා හා දළදා පාත්‍රධාතූන්වහන්සේත් සියලු ලඞ්කාවාසී ජනයාත් කුමාරයාටද පාවාදී සිවුවසක් රජයකොට ජන්මාන්තරගත විය.

පියරජහු ඇවෑමෙන් රාජ්‍යශ්‍රීයට පත්වූ **පරාක්‍රමබාහු** කුමාරයා අභිෂේක මඞ්ගල්‍යය දඹදෙණිනුවර මහෝත්සවයෙන් පවත්වා ස්වකීය පාණ්ඩිත්‍යයට අනුරූපවූ **කලිකාලසාහිත්‍ය සර්වඥ පණ්ඩිත** යන විරුද නාමයෙන් ප්‍රසිද්ධවූයේ මල්වූ භුවනෛකබාහු කුමාරයා යුවරජ පදවියට පත්කොට මුළු ලක්දිවම දෙමළුන්ගෙන් මුදවා ගනු පිණිස යුද්ධාරම්භකොට ඊට පෙරතුව දළදාවහන්සේ ගෙන අවුත් දඹදෙණිනුවර රජමාළිගය සමීපයෙහි නංවනලද විචිත්‍ර මන්දිරයෙහි දහස් ගණන් වටිනා කරඬු තුනක් තුළ වඩාහිඳුවා සත්දවසක් මුළුල්ලෙහි පවත්වනලද අසදෘශ මහෝත්සවයට අනතුරුව ස්වකීය ශ්‍රද්ධාතිශයට අනුරූපව කරනලද සත්‍යක්‍රියාවෙන් අරුඪිතවූ දළදා වහන්සේ

"ලඞ්කාධිනාථකරපඞ්කජරාජහංසී
තිම්මාය සා දසනධාතු මුනින්දරූපං
නෙකෙහි රංසි විසරෙහි සමුජ්ජලන්තී
සබ්බා දිසාව විදිසා සමලඞ්කරිත්ථ"

යනුයෙන් සමකාලීන කිවිවරයන් විසින් වර්ණිත ආශ්චර්යමත් ප්‍රාතිහාර්යයක් දැක්වූ කල්හි චක්‍රරත්නය ලද සක්විතිරජක්හු මෙන් ප්‍රීතියෙන් පිනාගොස් හිසපලන් මිණිවොටුන්න ඇතුළුවූ සිවුසැටක් රාජාභරණාදි උතුම් වස්තුයෙන් ධාතූන්වහන්සේ පුදා ඒ උත්සවය නිමාවට පැමිණවූයේය.

ඉක්බිති ඒ පුණ්‍යබල මහිමයෙන් විස්මිතවූ සිංහල මහාජනයා විසින් දක්වනලද මහත්වූ ගෞරවාදර ඇති රජතුමා මුළුරටම දෙමළුන්ගෙන් නිදහස්කරනු සඳහා උත්සාහවඩනුයේ පළමුවෙන් සිංහල වන්නිරජුන් වශගකොටගෙන එතැන් පටන් පොළොන්නරු, කොටසර, ගංතලා, මාතොට, මණ්ඩලිමන්නාරම් ආදිවූ නොයෙක් තැන්හි කඳවුරු බැඳගෙන සතළිස් හවුරුදු පමණ කාලයක් රට පෙළමින් සිටි මාඝ ජයබාහුය යන ද්‍රාවිඩ අධිපතීන්ගේ සතළිස් දහසක් තරම් බලසේනාවට ක්‍රමයෙන් පහරදී ඔවුන් පරදවා අවසානයේදී පොළොන්නරුපුරය වටලාගත් කල්හි එහි රැස්වහුන් දහස් ගණන් දෙමළු එක්ව 'මින්මතු ලක්දිව විසුම්නැත, සිය රටට යම්'හයි සම්මතකරගෙන දීර්ඝකාලයක් මුළුල්ලෙහි කොල්ලගෙන රැස්කොට තුබූ රාජවොටුනු මුතුමැණික් පටසළු ආදී සිංහලයට අයත් කෙළ ගණන් වටනා වස්තූන් ගෙන රාත්‍රිකාලයෙහි නුවරින් රහසින් බැහැරව පලායන්නාහු මංවැරදී ගොස් කලාවැව සමීපයෙහි කඳවුරු බැඳසිටි පරාක්‍රමබාහු රජතුමාගේ සේනාවට මුණගැසී ස්වකීය ජීවිතය හා සමඟ ඒ සියලුම සම්පත්තිය සිංහල හමුදාවට පරිත්‍යාග කළහ. ඒ වස්තු සම්භාරය අත්කරගත් සිංහලයෝ පෙරකාලයෙහි මෙන් නැවතත් ධනසම්පත්තියෙන් ආඪ්‍යවූහ.

මෙසේ ලක්දිව වශගකරගෙන සිටි දෙමළ සතුරන් නිරවශේෂයෙන් පහකොට පරාක්‍රමබාහු රජතුමා රටේ සමෘද්ධිය සඳහා කටයුතු ආරම්භකළ නොබෝකලකින් බලවත් පරශත්‍රුඋපද්‍රවයෙක් නැවතත් ඇතිවිය. රජහුගේ එකොළොස්වන වර්ෂයෙහි **චන්ද්‍රභානු** නම් රජෙක් දෙමළ ජාවකාදීන්ගෙන් යුක්ත මහත් සෙනඟක් ගෙන මෙහි අවුත් සජීසේනාවක් මෙන් පැතිරෙමින් රට නසන්ට පටන්ගත්කල්හි ස්වකීය බෑනණුවන්වූ වීරබාහු නම් වීරවික්‍රමාන්විත සෙනෙවි කුමරුවා ප්‍රමුඛ සිංහලසේනාවන් යුද්ධයෙහි යොදවා ඒ සතුරනුදු විනාශකොට ස්වදේශය මුදවාගත්තේය.

ඉක්බිති පරසතුරන් විසින් නසනලද ලක්දිව වර්ධනය කරන්නට පටන්ගත් රජතෙමේ දෙමළුන් විසින් පැහැරගත් කෙත්වත් ගෙවල් ආදිය හිමියන්ට පෙරපරිද්දෙන් දෙවා විහාරාරාම පිරිවෙන් සනාථකාවූ ගම්ද එසේම නිරවුල් කරවා ඒ ඒ කටයුතුවල නියුක්තවූවන් පිළිබඳ ව්‍යවස්ථා පනවා මුළුරටම බතින් බුලතින් සමෘද්ධකරවා ලඞ්කාවාසීන් නැවතත් ධනසම්පත්තියෙන් ආඪ්‍යවූවන් කොට සුවපත් කරවූයේය.

පරාක්‍රමබාහු මහරජාණෝ මෙසේ රට සුභික්ෂකරවා ඉක්බිති ශාසනසඞ්ග්‍රහයෙහි යෙදෙනුවෝ ද්‍රාවිඩ ආධිපත්‍යය පැවතුණු කාලයෙහි පටන් ඒ ඒ තැන්හි විසූ දුශ්ශීල ශ්‍රමණ ප්‍රතිරූපකයන් තෝරා බැහැරකොට විශෙෂ ශාසන ශුද්ධියක් කළහ. තවද සොළීරටට පඬුරු පාක්කුඩම් යවා ධර්මකීර්ති මහා ස්ථවිරයන්වහන්සේ ඇතුළුවූ ශීලාචාරසම්පන්න ත්‍රිපිටකධාරී මහතෙරුන් වහන්සේලා ගෙන්වා ලඞ්කාවීපයෙහි උභය ශාසනය සමඟ කරවූහ. එසේම අෂ්ටායතන වාසීවූ මහතෙරුන්වහන්සේලාගේ ද අන්‍යවූ ග්‍රාමාරණ්‍යවාසී භික්ෂූන්ගේ ද ප්‍රයෝජනය සඳහා රාජධානිය අවට බොහෝ සඞ්ඝාරාමයන් කරවා එහි සුපෙශල ශික්ෂාකාමී භික්ෂූන් වස්වා පසුව ධූතාඞ්ගාදී රූක්ෂ ප්‍රතිපත්තිපූරණයෙහි ආත්මක්ෂමවූ ප්‍රතිපත්තිසාර භික්ෂූන් සඳහා පලාබත් ගල වනවාස විහාරය කරවා පූජාකළහ ඉක්බිති ලක්දිව ආගමධර ස්ථවිරයන් විරලහෙයිනුත් පොත්පත් දුර්ලභහෙයිනුත් දඹදිවින් පොත් ගෙන්වා බොහෝ භික්ෂූන් ධර්මයෙහි ද තර්කව්‍යාකරණාදී නානාවිධ ශාස්ත්‍රයෙහි ද විචක්ෂණකරවූහ තවද ස්වකීය මලණුවන්වූ විනයධර භුවනෙකබාහු නම් යුවරජහු ලවා සියගණන් භික්ෂූන්ට ධර්මවිනය උගන්වා ස්ථවිරසම්මුති දෙවූහ. අටවාරයෙක්හි උපසම්පදා මඞ්ගල්‍යය පවත්වා සියගණන් භික්ෂූන් තමන් නමින් මහණ මහලු පැවිදිකරවූහ. මෙසේ ශාසනය පිරිසුදුකොට ධර්මවිනයධර සිල්වත් පැනවත් භික්ෂූන් ඇතිකරවා මාහිමි, මහතෙර, අයතැන්, පිරිවෙන් ආදී ශාසනික ධුරද විධිලෙස පිහිටුවා මතුකාලයෙහි ද ප්‍රමාද විහාරීන්ට අවකාශ නොලබනු සඳහා තත්කාලශාසනානුශාසක ආරණ්‍යක මෙධඞ්කර මහාස්වාමීන් ප්‍රමුඛ උභයවාසයේ කාරකමහාසඞ්ඝයා වහන්සේ ලවා මෙකල "දඹදෙණිකතිකාවත" යන නාමයෙන් ප්‍රසිද්ධවූ ධර්මවිනයානුකූල මාහැඟි ව්‍යවස්ථා පඞ්ක්තිය ද කරවා සම්බුද්ධශාසනයාගේ චිරස්ථිතිය සම්පාදනය කළහ.

තවද පුණ්‍යක්‍රියාවෙහි තත්පරවූ මහරජතුමා, මහසෙනඟ පිරිවරා ගෙන කැලණිය, අත්තනගල්ල, බෙන්තොට, දෙව්නුවර, සමනොළ ශ්‍රීපාදය ආදී සිද්ධස්ථානවලට පැමිණ වැඳපුදා ඒ ඒ තන්හි නටබුන්ව තුබූ විහාරාරාම ප්‍රකෘතිමත් කරවා ඉක්බිති දඹදෙණිනුවරට පෙරළා අවුත් රාජ්‍යානුශාසනයෙහි නියුක්තවූහෙයින් තමන්ම ලක්දිව ඒ ඒ තැන්හි හැසිර පුණ්‍යසම්පාදනය හා ලොකොපකාරය සැලැස්වීම නුපුළුවන් බැව් සලකා ස්වකීය මන්ත්‍රීමණ්ඩලයට අයත් රත්නත්‍රයාභි ප්‍රසන්නවූ බුදුබව පතන දෙවප්‍රතිරාජ නම් මහ ඇමතියාණන් කැඳවා දක්ෂිණ ලඞ්කාවට අයත් නොඑක්තන්හි නටබුන්ව තුබූ විහාර දාගැබ් ප්‍රකෘතිමත් කරවීම හා මංමාවත් තැනීම ආදී ලොක ශාසනොපකාරී ක්‍රියාවෙහි ඔහු නියුක්ත කරවූයේය. ඒ මහ ඇමතිතෙමේද පළමු කොට ගංපළ පටන් සමන්තකූට පර්වත මස්තකය දක්වා මහා මාර්ගය තනවා මාවැලිගඟ කාඡේහොය ආදී ගඞ්ගා සරස හස්ත්‍යශ්වගවමහිෂා

දීන් යා හැකි ශක්තිමත් පාලම් බඳවා ශ්‍රීපාදස්ථානයෙහි මහා මණ්ඩපයක්ද කරවා තුන්දිනක් පූජෝත්සව පවත්වා ඒ සියලුම ප්‍රවෘත්ති අන්තර්ගත ශිලාලේඛනයක් එහි පිහිටුවූයේය. ඉක්බිති අත්තනගල්ලට පැමිණ ඒ මහාවිහාරයෙහි පළමු උපතිස්ස නම් මහරජහු කරවන ලදුව නටබුන්ව තුබූ පස්මහල් ප්‍රාසාදය මහත් ධනවියදමින් තෙමහල්කොට තනවා අනවමදර්ශී මහා ස්වාමිපාදයන්ට ප්‍රදානයකොට එහිද රජහුගේ නමින් ශිලාලිපියක් පිහිටුවූයේය. ඉන්පසු බෙන්තොට පටුනට ගොස් ඒ ප්‍රදේශයෙහිද මංමාවත් තනවා කළුගං මුවදොර, කොසෙල් සේනාව, සල්ගමුගඟ, හල්පාතොට ආදී නොඑක් තැන්හි සතළිස් රියන පටන් එක්සියපනස් රියන දක්වා දීර්ඝප්‍රමාණවූ මහාසෙතු බඳවා ප්‍රතිරාජ පිරිවෙන ආදී පිරිවෙන්ද බොහෝ ආරාම හා ධර්මශාලාදිය කරවා විවිධ ලෝකශාසන සංග්‍රහ කෙළේය.

මෙසේ මුළු ලක්දිවම පරසතුරු වියවුලින් මුදවා රට සුභික්ෂ කරවා ශාස්ත්‍රාගමාභිවෘද්ධිය ද සැලැස්වූ පරාක්‍රමබාහු මහරජාණන් දෙවිසි වසක් දැහැමින් සෙමෙන් රාජ්‍යයකළපසු ලංකාවාසීන්ගේ යම්කිසි අභාග්‍යයකින් මෙන් රජතුමාට බලවත් කායික ආබාධයක් හටගැනී බස වික්කල්විය. ඊට කරනලද ප්‍රතිකර්මයෙන් රෝගය සන්නොසිඳුණු හෙයින් මන්ත්‍රීමණ්ඩලය රැස්ව සාකච්ඡාකොට අගමෙහෙසුන් තැන්පත් **ගිරිවංශ සුනෙත්‍රා** මහාදේවීන්ගේ අනුමතයත් ඇතිව උපුල්වන් දෙවියන්ගේ අනුග්‍රහය ලබාගැනීම පිණිස අග්‍රාමාත්‍යවූ දේවප්‍රතිරාජයන් මාහැඟි පූජාවස්තූන් සමග දෙවුනුවරට පිටත්කර යැවූයේය. ඒ මහා මන්ත්‍රීශ්වරයාණන් දෙවුනුවරට පැමිණ ඒ වර්ෂයෙහි ඇසළ පූජාව අත්‍යලංකාරයෙන් පවත්වා ගෙනගිය පුදපඬුරු ඔප්පුකොට එක් නානුමුර දිනයෙක්හි ඉස්සෝධා නා අටසිල්සමාදන්ව දෙවියන්ට ආරාධනාකොට සැතපුණු කල්හි මධ්‍යම රාත්‍රියෙහි උපුල්වන් දෙවියන් බ්‍රාහ්මණවේෂයකින් ඉස්දොර පෙනීසිට "කොකාටිය මලේ වකා හැරුණත් තොපගේ රජ්ජුරුවන්ගේ බසෙහි වික්කලුව නොහැරේ"යි කියා කවියක් බැඳ ස්වප්නයෙන් පෙන්වා කීබවත් ඒ ප්‍රවෘත්තිය මහ ඇමතියන් දඹදෙණිනුවරට පෙරළා අවුත් පරාක්‍රමබාහු මහරජාණන්ට සැලකළ තැන "අපගේ පූර්වජාතියේදී ශේෂව සිටි අකුශලය දැන් කොයිපතනේ උත්සාහයකළත් ශාන්තනොවන රඟ දෙවිමහරජ්ජුරුවන් වහන්සේ පෙන්නුවා මහත් උපකාරයකැ"යි ප්‍රකාශකළ බවත් අලුත්නුවර දේවාලය සම්බන්ධ පැරණි ලිපියකින් පෙනේ. තමන්ට වැළඳුණු රෝගය අසාධ්‍ය බැව් දැනගත් මහරජතුමා ස්වකීය පුත්‍රයන් පස්දෙනා හා වීරබාහු නම් බෑනණුවන් කැඳවා සමඟිව සතුරන්ට සිදුරු නොදක්වා රාජ්‍යය පරිපාලනය කරන්නට සුදුසු මාහැඟි අවවාද ඔවුන්ට දී පසුව මහාසංඝයා හා මහාජනයා රැස්කරවා ඒ කුමරුවන් අතුරෙන් රාජ්‍යභාරය පැවරීමට යොග්‍යවූයේ කවරේදැයි විචාළකල ඒ කුමාරයන් සදෙනාම ධීරවීර බහුශ්‍රැත සංග්‍රාමාවචර ගුණයෙන් යුක්තවුවත් ජ්‍යෙෂ්ඨ පුත්‍රවූ බෝධිසත්වගුණෝපෙත **විජයබාහු** කුමාරයා රාජ්‍ය

පරිපාලනයට විශේෂයෙන් යොග්‍යබැව් එකහෙළා ප්‍රකාශකළ කල්හි පරාක්‍රමබාහු නරේන්ද්‍රයා ඒ බෝසත් විජයබාහු කුමරයා යුවරජ පදවියට පත්කොට තමන් විසින් කොට නිමවාගත නුහුණු ලෝකශාසනොපකාරී කෘත්‍යයන් වෙන්වෙන් වශයෙන් දක්වා ඒ සියල්ලම අනලසව සම්පාදනයකරවයි නියෝගකොට ඉතිරි රජකුමරුවන් පස්දෙන ද දළදා පාත්‍රධාතූන්වහන්සේ ද මහාසඞ්ඝයා ද අමාත්‍යමණ්ඩලය සහිත ලඞ්කාවාසී ජනයා ද ඒ කුමාරයාට පැවරූයේය. එතැන්පටන් පිය මහරජාණන්ගේ ජීවිතාවසානය දක්වා දොළොස් හවුරුදු පමණ කාලයක් ඒ විජයබාහු යුවරජහු විසින් රාජ්‍යය පාලනය කරන ලදි. රාජ්‍යය හා රාජධානිය පරසතුරන්ගෙන් ආරක්ෂාකරනු සඳහා දඹදෙණිපුරය පටන් මුහුද දක්වා උතුරුදෙස රැකබලාගැනීමෙහි නියුක්ත සිංහල මහහමුදුවේ සේනාධිපති ධුරයට භුවනෙකබාහු නම් මල් කුමරුවා පත්කොට යාපවුනුවර නැවතීමට ඔහුට නියොග කෙළේය. එසේම දක්ෂිණ දිශාරක්ෂණයෙහි නියුක්ත සේනාව තිලොකමල්ල කුමාරයාට භාරදී ඔහු මහවත්තල රැඳවීය. පරාක්‍රමබාහුය, ජයබාහුය යන ඉතිරි මල්කුමරුවන් දෙදෙන පියරජ්ජුරුවන්ට උපස්ථාන කරනු සඳහා දඹදෙණිනුවරම නවත්වා තමන්ට දැඩමිත්‍රවූ වීරබාහු කුමාරයනුත් කැටිව ලක්දිව ඒ ඒ තැන්හි සඤ්චාරයකොට දුර්ජනබලය මැඩ පවත්වා ත්‍රිසිංහලයම සෙමෙහි තැබවීය. ඉක්බිති ඒ යුවරජතෙමේ මහසෙනඟ පිරිවරා වාගිරිගලට ගොස් එපර්වත මූදුනෙහි රජමාළිගයක් තනවා එහි පියරජහු විසින් දෙනලද ධනසාරය සුරැකිකොට තබා එහිම මහා විහාරයක්කොට එය මහනෙත්පාමූළ සුමඞ්ගල මහා ස්ථවිරපාදයන්ට පූජාකොට එතැනින් සමනතකූට පර්වතයට ගොස් ශ්‍රීපාදය වැඳපුදාගෙන ගංපළට පැමිණ තියම්ගම්පාය කටුකොහොල් කරවා වල්ගම්පාය නම් මහා විහාරය ද කරවා එහි අභයරාජ නම් පිරිවෙන පිහිටුවා එතැනින් කුරුණෑගල්පුරයට ගොස් ඒ නුවර කථාශේෂවූ ස්වකීය සුළුපියාණන්වූ භුවනෙකබාහු ඈපාණන් විසින් කරවනලද විහාරයෙහි තුන්මහල් පායක් නංවා එහි මහත්වූ සර්වඥ ප්‍රතිමාවක් ද ඒ භුවනෙකබාහු යුවරජහුගේ ප්‍රතිරූපයක් ද පිහිටුවා ඒ නගරය ශක්තිමත් පවුරුපදනමින් හා දිය අගලින් පරික්ෂිප්ත කොට නිමවාලූකල දොළොස්හවුරුද්දකට පෙර ලක්දිව අත්පත් කරගන්නට පැමිණ යුද්ධයෙන් පැරදූ පලාගිය චන්ද්‍රභානුරජ නැවතත් බලසෙන් ගෙන මාවටුතොටින් ගොඩබැස එහි සිටි සිංහල භටසේනා පසුබස්වා පදීරට හා කුරුනීරට ශීඝ්‍රව ස්වවශයට ගෙන ක්‍රමයෙන් අවුත් භුවනෙකබාහු කුමාරයන් සටනින් පරදවා යාපව්නුවරත් ගෙන එහි කඳවුරු බැඳගෙන සාභිමානව 'දළදා පාත්‍රධාතූන්වහන්සේ සමඟ ත්‍රිසිංහලය මට දෙව, නැතහොත් යුදකරව'යි සිංහල නරේන්ද්‍රයා කරා හසුන් යැවීය. මේ ප්‍රවෘත්තිය ඇසූ විජයබාහු යුවරජතුමා යුද්ධොපායෙහි දක්ෂවූ වීරබාහු කුමාරයා හා මන්ත්‍රණයකොට සිංහල මහා සේනාව සටනෙහි යොදවා නොබෝ දවසක් තුළ යාපවුනුවර අසළ

කරනලද රෞද්‍ර සඞ්ග්‍රාමයකදී ජාවක රජහුගේ බලසෙනග නිරවශෙෂයෙන්ම විනාශකෙළේය. චන්‍ද්‍රභානුරජ යන්තම් දිවි පමණක් රැකගෙන යුඬභූමියෙන් පලාගියේය. සතුරන් සන්තක අප්‍රමාණ වස්තුව සිංහල හමුදාවට අත්විය. යුඬාවසානයෙහි විජයබාහු යුවරජාණෝ යාපව්නුවර ශක්තිමත් ප්‍රාකාරාදියෙන් සුරක්ෂිතකොට භුවනෙකබාහු කුමාරයා යළිත් එහි තබවා ස්වකීය සේනාව සමග අනුරාධපුරයට ගොස් ඒ පුරාණ රාජධානියෙහි වල්බිහිව ජරාවාසව තුබූ ථූපාරාමය රුවන්වැලිසෑය ආදි සිඞස්ථාන අලුත්වැඩියා කරවා ඒ නගරාරක්ෂාව සලස්වා එයින් නික්ම පොළොන්නරුපුරයට ගොස් වීරබාහු කුමාරයන් හා මන්ත්‍රණයකොට ඒ මූලරාජධානිය ප්‍රකෘතිමත් කරවන්නට පියමහරජහුගෙන් ලබනලද අනුමතිය ඇත්තාහු ලක්දිව නානා දිශායෙන් රැස්කරනලද දහස් ගණන් ශිල්පීන් ඒ කෘත්‍යයෙහි යොදවා ඒ නගරයෙහි නටබුන්ව තුබූ විහාරාරාම චෛත්‍ය ප්‍රතිමාගෘහ පරිවෙණ දෙවාලයන් හා ප්‍රාසාදයන් ද ප්‍රතිසංස්කරණය කොට බිඳීගිය වැව් පොකුණු ආදිය නැවත තනවා කෙත්වත් ඇති කොට හාත්පස ප්‍රදෙශය අතිශයින් සමෘඬකරවා ඒ පුලස්තිපුරය පෙරපරිද්දෙන්ම සකල නගරාඞගයෙන් හා ශ්‍රීසෞභාග්‍යයෙන් සමන්විත කරවූහ. ඉන්පසු පරාක්‍රමබාහුමහරජාණන් දඹදෙණිනුවර සිට මහපෙරහරින් පොළොන්නරුවට වැඩමවා අභිෂෙක මහොත්සවය සත්දිනක් පවත්වා ඉක්බිති පියරජහු හා සමග දඹදෙණි නුවරට අවුත් දළදා පාත්‍රධාතූන්වහන්සේ සිවුරඟ සෙනඟින් හා දහස්ගණන් උපාසක උපාසිකාදී ජනසමූහාගෙන් ද යුක්තවූ අනුපමවූ පූද පෙරහරින් පුලස්තිපුරයට වඩාගෙනඅවුත් එහි පුරාණ ධාතුමන්දිරයෙහි මහරුවන්පළඟෙක්හි ඒ ධාතුයුගලය පිහිටුවා තුන්මසක් මුළුල්ලෙහි ධාතුපූජොත්සවයක් පැවැත්වූහ. ඉක්බිති විශිෂ්ටවූ උපසම්පදා මඞගල්‍යයක් පවත්වනු කැමතිවූ ඒ යුවරජාණෝ මහාවාලුක නදීතීරයෙහි දහස්කොට නම් ස්ථානයෙහි වීරබාහු කුමාරයන් ලවා දහස්ගණන් සඞඝාරාමයන් ද අලඞකාර මහාමන්දිරයක් ද කරවා ලක්දිව හැම පළාත්වලටම සිය නමින් යවනලද දූතයන් විසින් කරනලද ආරාධනාවෙන් රැස්වූ දසදහස්ගණන් භික්ෂූන්වහන්සේට අඩමසක් මුළුල්ලෙහි මහදන් පවත්වමින් ඒ කාලයතුළ දහස් ගණන් යතීන්ට උපසම්පදා දානයකරවා පසුව ඒ මහාසඞඝ සන්නිපාතයෙහි මාහිමිපදවිය, මහාථෙරපදවිය, මූලපදවිය, ථෙරපදවිය, පරිවෙණපදවි ආදීවූ ශාසනික තනතුරු ඒ ඒ පදවිය දැරීමට සුදුසුවූ ස්ථවිර උතුමන්ට පමුණුවමින් ලඞකාශාසනය බැබළවූහ.

මෙසේ දෙවිසිහවුරුද්දක් මුළුල්ලෙහි තමාගේම උත්සාහයෙන් ද ඉන්පසුව රාජ්‍යභාරයෙහි පිහිටුවූ පුත්‍රකුමාරයාගේ මාගීයෙන්ද ස්වදෙශය පරශත්‍රු උපද්‍රවයෙන් මුදා දීර්ඝකාලයක් තුළ පිරිහීමට පත්ව අතිශයින් බෙලහීනව සිටි සිංහල මහජනයා නැවතත් ධනධාන්‍ය

සම්පත්තියෙන් ආඪ්‍යවූ බලසම්පන්න ජාතියක් කරවා මුළුරමෙහිම ශාස්ත්‍රාලෝකය යළිත් පතුරුවා ශාසනාභිවෘද්ධිය සැලැස්වූ පින්වත් පැනවත් පරාක්‍රමබාහු මහරජාණෝ රාජ්‍යාදයෙන් පන්තිස්වන වස පරලොකප්‍රාප්තවූහ.

පනස්හවුරුද්දක් පමණ පරශත්‍රු උපද්‍රවයෙන් පීඩිතව හැම අතින් හීනභාවයට පත්ව තුබූ ලඞ්කාවීපයෙහි සිංහල බෞද්ධ ශිෂ්ටාචාරය යට කියනලද පරිද්දෙන් නැවතත් ප්‍රාණවත් කොට බැබළවූ පරාක්‍රමබාහු මහරජාණන් තුළ පිහිටි උතුම් ගුණාඞ්ගයන් අතුරෙන් ඒ මහරජතුමන්ගේ පාණ්ඩිත්‍යය මෙහිදී විශෙෂයෙන්ම සඳහන් කටයුතුයි. ලඞ්කාධිපති සිංහල රජුන් හැම දෙනාම පාහේ නානා ශාස්ත්‍රයෙහි හසළ බුද්ධිමතුන් බව ඉතිහාසාගත නොයෙක් කරුණු වලින් පෙනේ. ඔවුන්ගෙන් සමහරෙක් ග්‍රන්ථකතෘත්වයෙන් ප්‍රසිද්ධියට ද පැමිණියාහුය. ඒ මේ පණ්ඩිත සඞ්ඛ්‍යාවට ඇතුළත් සිංහල නරෙන්ද්‍රයන් අතුරෙහි පරාක්‍රමබාහු මහරජාණන්ගේ නාමය අනූනවූ කීර්ත්තිරශ්මීන් විරාජමානව පවතී. මේ මහරජතුමන්ගේ කාලයෙහි සඞ්ඝරක්ෂිත මහාස්වාමිපාදය, අනවමදර්ශී මහාස්වාමිපාදය, වනරතන ආනන්දමහාස්ථවිරපාදය, වෛදෙහ මහාස්ථවිරපාදය, පච මූලපරිවෙණාධිපති ස්ථවිරපාදය යනාදී ග්‍රන්ථකාරක මහාපණ්ඩිත රත්නයන්ගෙන් ලක්දිව ශොභාමත්විය. ඒ ශ්‍රෙෂ්ඨ පඬිවරයන් මධ්‍යයෙහි උච්චස්ථානයක් භජනය කළ පරාක්‍රමබාහු මහරජාණන් විසින් ධර්මවිනයෙහි ද භාෂාශාස්ත්‍රාදියෙහි ද ව්‍යාප්තවූ ස්වකීය ප්‍රඥාමහිමයට අනුරූපවූ ග්‍රන්ථත්‍රයක් සම්පාදනය කිරීමෙන් පශ්චිමජනතාවට අනුග්‍රහ කරනලදී. එයින් නිස්සන්දෙහ නම් වනවිනිසසන්නය මෙකල සොයාගත නොහැකි තරම් දුලීභව තිබේ. මහාකාව්‍ය සඞ්ඛ්‍යාවට ඇතුළත් කව්සිළුමිණ කාව්‍යරසාස්වාදයෙහි හා සිංහලභාෂා තත්ත්වාවබොධයෙහි තත්පරවූවන්ගේ මනදෙළ පුරමින් මෙකල පවත්නා සිංහල කාව්‍යයන් අතුරෙහි ප්‍රමුඛස්ථානය භජනය කෙරේ. මේ මහරජතුමන්ගේ අනික් කෘතිය නම් විශුද්ධිමාර්ගයට කරනලද මාහැඟි සන්නයයි. බුද්ධධර්මයත් සිංහලභාෂාවත් දැනගැන්මට අතිශයොපකාරීවූ මේ ග්‍රන්ථරත්නය මනා ශුද්ධියකින් යුක්තකොට ප්‍රකාශකිරීම ශාසනයටත් ශාස්ත්‍රයටත් කරනලද අනල්ප සඞ්ග්‍රහයක්බව සතුටින් කියම්හ.

D. B. J.

1926 අප්‍රේල්මස 8 වෙනිදිනදීය.

# ශුද්ධිපත්‍රය.

## ERRATA.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 9 | 29 | ආයුෂ්මමහාබ්‍ය | ආයුෂ්මාගාබ්‍ය |
| 12 | 11 | සාක්ෂත් | සාක්ෂාත් |
| ,, | 27 | චිත්තසීසෙනනිද්දිට්ඨො | චිත්තසීසෙනහෙත්ථ සමාධි නිද්දිට්ඨො |
| 22 | 6 | කුසලාඞ්ගයන්ගේ | අකුශලාඞ්ගයන්ගේ |
| ,, | 17 | සංක්ලෙශ ධර්මයන්ගෙ | සංක්ලෙශ ධර්මයන්ගෙ හෝ |
| 25 | 8 | කිම්යදයත් | කිම්දයත් |
| 28 | 10 | නයෙනෙවෙත්ථ | නයෙනෙත්ථ |
| ,, | 33 | ශෞචශීල්‍ය | සෞචශීල්‍ය |
| ,, | 35 | අවිප්‍රකීණි | අවිප්‍රකීර්ණ |
| ,, | 36 | නොවිසිර | නොවිසරම |
| 29 | 3 | ශිලය | ශීලනය |
| ,, | 4 | අවික්ෂෙපබවට | අවික්ෂෙපයට |
| ,, | 26 | එවමාදිනා | එවමාදිනාපි |
| 36 | 29 | අපාණකොටික | ආපාණකොටික |
| 47 | 12 | කුසලත්‍රික | කුශලත්‍රික |
| 52 | 24 | විනයපර්‍යාපන්න ශීලය | ඒ විනයපර්‍යාපන්න ශීලය |
| ,, | 25 | රක්ඛති, | පාති, යීසේයි; රක්ඛති, |
| 58 | 7 | පාසාරිතෙන | පසාරිතෙන |
| 62 | 19 | පොරෙණා | පොරාණා |
| ,, | 36 | යස්‍යතු | යස්‍යහෙතු |
| 64 | 26 | පහසින් | පහයින් |
| 65 | 13 | පියවින්ම | පියොවින්ම |
| 67 | 2 | කොසජ්ජං | කොසජ්ජං |
| 69 | 20 | උපක්කිට්ඨං | උපක්කිලිට්ඨං |
| 70 | 11 | පාටිදෙනීයස්ස | පාටිදෙසනීයස්ස |
| 72 | 30 | නිපෙපසිකා | නිප්පෙසිකතා |
| 78 | 37 | ඨාතං | ඨානං |
| 79 | 2 | සණ්පඨානා | සණ්ඨපනා |
| 81 | 15 | වත | වතද |
| 85 | 18 | පැණවීමයි | පැමිණවීමයි |
| 87 | 9 | වෙදිතබෙබා | වෙදිතබ්බං |

| පිට. | පෙළ. | අශුඬ. | ශුඬ. |
|---|---|---|---|
| 89 | 2 | වෙදිතබබා | වෙදිතබ්බා |
| 105 | 11 | වුත්තම්පි චෙතං | වුත්තම්පි හෙතං |
| 106 | 21 | වුත්තම්පිච | වුත්තම්පිහි |
| 114 | 8 | ගුණයෙව | ගුණෙයෙව |
| 125 | 20 | දවසී | දවයි |
| 126 | 27 | පය්‍ර්‍යන්තපරිසුද්ධි | පය්‍ර්‍යන්ත පාරිශුද්ධි |
| 127 | 11 | කායෙහිදු | කායයෙහිදු |
| ,, | 26 | අරහන්තානං | අරහන්තානං සම්මා සම්බුද්ධානං |
| 128 | 4 | ලාභසක්කඤ්ඤති | ලාභයසක්කති |
| ,, | 32 | අඞ්ග, කරචණාදිඅඟද; | අඞ්ගං, කරචරණාදී අඞ්ගද; |
| ,, | 35 | චජෙ | චජෙ ඉති |
| 129 | 15 | කීයේ | කීයේ මැනු |
| 133 | 35 | පාංසුවෙහි | පාංශුවෙහි |
| 135 | 16 | ප්‍රහාණාදී | ප්‍රහාණ |
| 136 | 25 | පටිප්පස්සද්ධවන්‍යෙන්ද | පටිප්පස්සම්භන ද්වීවසයෙන්ද |
| 152 | 17 | සත්තිප්පහාරදුක්ඛා | සත්තිප්පහාරදුක්ඛ |
| 157 | 33 | ඔහුකවරහ; | ඔහු කවරහ; පංසුකූලිකඞ්ග, පාංශුකූලිකාඞ්ගය..පෙ.. නෙසජ්ජිකඞ්ගං, නෛෂද්‍යකාඞ්ගය (යන මොහුයි); |
| 60 | 2 | සීලඞ්ගා | සීලඞ්ගන්ති |
| ,, | 9 | පස්සාති | මස්සාතී |
| ,, | 10 | මටිසෙධනෝ | පටිසෙධනෝ |
| ,, | 33 | පත්තපිණ්ඩං | පත්තපිණ්ඩං |
| 163 | 1 | සබ්බානෙව | ලක්ඛණාදීහිති:- සබ්බානෙව |
| ,, | 31 | ධර්මයන් | ආර්‍ය්‍යධර්මයන් |
| 167 | 4 | පණිකන්ති | පණීකන්ති |
| 168 | 11 | මුදූති, | මුදුකොති, |
| 172 | 25 | මෙ | මෙසේ |
| 175 | 16 | එදවස්හි | එදවසේ හිඳ |
| 205 | 6 | සමනුයුඤ්ජෙය්‍ය | සමනුයුඤ්ජෙය්‍ය |

# විශුද්ධිමාර්ගය.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො, චිත්තං පඤ්ඤඤ්ච භාවයං
ආතාපී නිපකො භික්ඛු සො ඉමං විජටයෙ ජටන්ති."

## කලිකාලසාහිත්‍ය සර්වඥපණ්ඩිතපරාක්‍රමබාහු
## මහා ව්‍යාඛ්‍යානය.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

පාමොජ්ජත්ථාය යොගීනං බුද්ධඝොසෙන ධීමතා
විසුද්ධිමග්ගො යො වුත්තො විසුද්ධිනයමණ්ඩිතො[1].

පරක්කමනරින්දෙන සබ්බභූපාලකෙතුනා
ලඞ්කාදීපාධිපතිනා සාසනොදයකාමිනා.

තස්ස සංවණ්ණනා එසා සීහළානං නිරුත්තියා
යොගීනං මන්දබුද්ධීනං හිතත්ථාය කරීයති.

"සංඥං නිමිත්තං කර්තාරං පරිමාණං ප්‍රයොජනම්
ප්‍රගුක්ත්වාසජීතන්ත්‍රාණාමත්‍යම්බ්‍රෑයාවිචක්ෂණඃ."

යනු බැවින් පළමුකොට සංඥාදිපඤ්චකය දක්වනු ලැබේ.

ඉහි **සංඥා** නම් ප්‍රස්තුතග්‍රන්ථයෙහි නම්; **නිමිත්ත** නම් එ ගත් කිරීමට හේතු යි; **කර්තෘ** නම් එ ගත්කළ ආචාර්‍ය්‍යයෝ යි; **පරිමාණ** නම් එගත්හි ග්‍රන්ථප්‍රමාණ යි; **ප්‍රයොජන** නම් එ ගතින් සාධ්‍ය ඵලයි; මෙහි සංඥතාව වක්තෘශ්‍රොතෘලොකයාගෙ ව්‍යවහාර සෞකර්‍ය්‍යය සඳහා කර්තව්‍ය යි.

ප්‍රෙක්ෂාපූර්වකාරිවිවජ්ජනසම්භාවනාව ග්‍රන්ථොත්පත්තිනිමිත්තපරිඥානමූලක වැ වන්නෙන් තදුත්පාද සඳහා නිමිත්තකථා කර්තව්‍යයි; පුද්ගලප්‍රමාණලොකයහට ග්‍රන්ථවිෂයගෞරවයැ පුද්ගලචාරක වැ

1. විසුද්ධනයමණ්ඩිතො—මු. ස.

වන්නෙන් තදුත්පාද[1] සඳහා ගුණාඛ්‍යානාභිරාමකොට කර්තෘකථා කථිතව්‍යයි; ප්‍රස්තුතග්‍රන්ථයෙහි අධ්‍යයනශ්‍රවණාදි වශයෙන් පවත්නා ශිෂ්‍යලොකයහට ප්‍රොත්සාහොත්පාදන සඳහා පරිමාණකථා කථිතව්‍යයි.

“සර්වස්‍යෛව හි ශාස්ත්‍රස්‍ය කර්මණො වා'පි කස්‍යචිත්
යාවත් ප්‍රයොජනං නොක්තං තාවත්තත්කෙන ගෘහ්‍යතෙ”යි.
කීබැවින්,

ප්‍රයොජනාපෙක්ෂව පවත්නා ජනයන් පවත්වනු සඳහා ප්‍රයොජන කථා කථිතව්‍යයි; මෙසේ සමාස විසින් සංඥකථා සංව්‍යවහාරාර්ථ වෙයි; නිමිත්තකර්තෘකථාවය ග්‍රන්ථගෞරවොත්පාදනාර්ථ වෙයි.

පරිමාණ ප්‍රයොජන කථාවය ශිෂ්‍යලොකප්‍රවෘත්ත්‍යර්ථ වෙයි ද්‍රෂ්ටව්‍යයි. මෙසේ යථොක්තප්‍රකාරයෙන් සප්‍රයොජනවූ මේ සංඥාර්ථපඤ්චකයෙහි ව්‍යාඛ්‍යෙයස්වභාවයෙන් ප්‍රස්තුතවූ මේ ග්‍රන්ථප්‍රබන්ධයට **විශුද්ධිමාර්ගය** යනු අවයවාර්ථාව්‍යූතගුණනිමිත්තකවූ සිද්ධවන බැවින් නෛමිත්තිකනාම වෙයි; මේ විශුද්ධිමාර්ග කරණයට නිමිත්තද්විප්‍රකාරවෙයි අන්තර්බාහ්‍යභෙදයෙන්; එදෙක්හි ප්‍රතිපද්‍යොගීජනයන් අඥාන දුර්ඥානමූලක අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති හෙතුක සංසාරදුඃඛයෙන් මුදනුසඳහා මේ විශුද්ධිමාර්ගය කළබැවින් යථොක්ත ප්‍රතිපද්‍යජනයන් කෙරෙහි සමුත්පන්න අනුකම්පාව අන්තර්නිමිත්තය.

“විභජ්ජවාදිසෙට්ඨානං ථෙරියානං යසස්සිනං
මහාවිහාරවාසීනං වංසජස්ස විභාවිනො.

**භදන්තසඞ්ඝපාලස්ස** සුචිසල්ලෙඛවුත්තිනො
විනයාචාරයුත්තස්ස යුත්තස්ස පටිපත්තියං.

ඛන්තිසොරච්චමෙත්තාදි ගුණභූසිතචෙතසො
අජ්ඣෙසනං ගහෙත්වාන කරෙන්තෙන ඉමං මයා”යි.

ආචාර්යපාදයන් තමන්විසින්ම පර්යන්තයෙහි වක්ෂ්‍යමාණබැවින් මේ විශුද්ධිමාර්ගකරණයෙහි බද්ධාදරපරමවිශුද්ධාධ්‍යාශය **සඞ්ඝපාල ස්ථවිරපාදයෝ** බාහ්‍යනිමිත්ත වෙත්; **බුද්ධඝොෂාචාර්යපාදයෝ** මේ විශුද්ධිමාර්ගයට කර්තෘත්වයෙන් වෙදිතව්‍යයෝයි; එහෙයින්ම කීහ. **“විපුල විසුද්ධ බුද්ධිනා බුද්ධඝොසොති ගරූහි ගහිතනාමධෙය්‍යෙන ථෙරෙන කතො විසුද්ධිමග්ගො”**යි. මේ ආචාර්යයෝ ජම්බුද්වීපවාසකව මහාස්ථවිරවර්යයන් විසින් සමාරාධිතව හෙළඅටුවා පෙරළා සර්වජනීන මූලභාෂායෙන් තෙවළාවට අටුවා ලියනු සඳහා මේ ලඞ්කාද්වීපයට වැඩ මහාවිහාරයෙහි සඞ්ඝපාල මහාස්ථවිරයන් කෙරෙහි හෙළඅටුවා අසා සියලු ස්ථවිරවාද ඉගෙන මහාසඞ්ඝයා රැස්කොට අටුවාලියන්නට පොත් දෙන්නේයයි ඉල්වූහ. සඞ්ඝයාද අර්ථකථාකරනුවට ශක්ති පරීක්ෂා සඳහා තොපගේ සාමර්ථ්‍යය මිහි දක්වව ඒ දැක පොත්දෙම්හයි

1. සඞ්ඛ්‍යොපලබ්ධ්‍යර්ථ—බෝසෝ.

මේ ගාථාදෙක දුන්හ; එසඳ තදර්ථවර්ණනාචාරයෙන් එහි අටුවා සහිත පිටකත්‍රය සඞ්ග්‍රහ කොට මේ විශුද්ධිමාර්ගය කළහ. යනු පරම්පරායාත වාර්තා යි. මෙහි ග්‍රන්ථප්‍රමාණ **තුදුස්දහස්සදබණවරෙකි.** මෙහෙයින්ම කීහ:—

> විසුද්ධිමග්ගො එසො ච අනන්තරායං විනා ඉධ
> නිට්ඨිතො **අට්ඨපඤ්ඤාස භාණවාරාය** පාළියා"යි.

ප්‍රයොජන ද්විවිධ වෙ:-මුඛ්‍යානුෂඞ්ගිකවශයෙන්; එහි ප්‍රියශීල ප්‍රතිපත්තිවත්සලසුශික්ෂිතමුමුක්ෂුයොගීජනයහට ප්‍රීත්‍යුත්පාදනය මුඛ්‍ය ප්‍රයොජනය; චතුෂ්පාරිශුද්ධිශීලයෙහි සුප්‍රතිෂ්ඨිත වැ අධිශීලශික්ෂා සිද්ධ කොට සවචරිතානුකූලකර්මස්ථානපරිග්‍රහාදික්‍රමයෙන් පැවැත භාවනාප්‍රකර්ෂප්‍රාප්තජනමනාලොකොත්තරඥානසිද්ධින් අධිප්‍රඥාශික්ෂායෙහි මස්තකප්‍රාප්තවැ පරමදක්ෂිණීයක්ෂීණාශ්‍රවභාවයට සම්ප්‍රාප්තවැ සමාපත්තිසුඛානුභවයෙන් දවස් යවා නිරුපධිශෙෂ නිර්වාණධාතු අමෘත පදප්‍රාප්තවනු මෙහි ආනුෂඞ්ගික ප්‍රයොජනයයි දතයුතුයි; මෙතෙකින් සංඥ්‍යාර්ථපඤ්චකය සංක්ෂෙපයෙන් ව්‍යාඛ්‍යාතය. විස්තරාර්ථීන් විසින් වනවිතිසයට ලී **නිස්සන්දෙහ නම් සන්නය** බලා දතයුතු.

මේ "විශුද්ධිමාර්ගය" තෙමෙ යම් සූත්‍රපදයක් නිසා පටන්ගන්නා ලැබේද ඒ සූත්‍රපදය පළමුකොට නික්ෂෙප කොට එයට නිදානාදි නිර්ධාරණමුඛයෙන් නානාප්‍රකාරයෙන් අර්ථසංවර්ණනා කරනු පිණිස **සීලෙ පතිට්ඨාය** යනාදි ආරම්භකරනලදී.

ධර්මසංවර්ණනා කරනුවන් විසින් ආදිකොට වර්ණනීයධර්මයට නිදාන කියයුතුය; ඉක්බිති ප්‍රයොජනය පිණ්ඩාර්ථය පදාර්ථය සම්බන්ධය අභිප්‍රායය චොදනාය ශොධනාය යනමෙ කියයුතුයි;ආචාර්යයන් විසිනුදු එසෙයින්ම කියනලදී. මෙහි **භගවන්තං කිර** යනාදි දෙසනාවට නිදානප්‍රයොජන නිර්ධාරණය; **විසුද්ධිමග්ගං භාසිස්සං** යනාදි පිණ්ඩාර්ථ නිර්ධාරණය; **සීලෙපතිට්ඨාය** යනාදි පදාර්ථසම්බන්ධාභිප්‍රාය විභාවනය; **කිං සීලං** යනාදි චොදනාය; එයින්මතු ශොධනායි:-සමාධි ප්‍රඥාකථායෙහිද මෙම නයයි; විසර්ජනය පෘච්ඡාපූර්වඞ්ගමනුයි පෘච්ඡාගාථාව පළමුකොට කියයුත්තෙහි පළමුකොට විසර්ජනගාථාව කුමක්හෙයින් කියනලදයත්? තදර්ථය මඞ්ගලබැවින; ශාසනයාගෙ ආදිකල්‍යාණාදිභාවය විභාවනය කරනහෙයින;භයාද්‍යුපද්‍රව නිවාරණයෙන් අන්තරාය විධමනය කරනහෙයින්; මතුයෙහි සංවර්ණනීය ධර්මසඞ්ග්‍රහ බැවිනැයි දතයුතුයි:-ශාස්ත්‍රස්තුති පූර්වඞ්ගම කොට ආරම්භනොකොට වස්තුනිර්දේශ පූර්වඞ්ගමකොට කුමක්හෙයින් කියනලදයත්? **දීඝනිකායාදීන්ට සුමඞ්ගලවිලාසින්‍යාදීන්** මෙන් වෙන සංවර්ණනාවක් නොවන බැවිනුදු **අභිධර්මාවතාර සුමනාවතාරාදීන්** මෙන් ප්‍රකරණාන්තරයක් නොවන බැවිනුදු ස්තුතිපූර්වඞ්ගම කොට නොදක්වනලදි; මේ වනාහි **සුමඞ්ගලවිලාසින්‍යාදීන්ගේම**

ශෙෂයයි දතයුතුයි; එසෙයින්ම කීහ **මජ්ඣෙ විසුද්ධිමග්ගො** යනාදී:- නොහොත්: මේ ස්තුතිපූර්වඞ්ගමය වස්තුපූර්වඞ්ගම නොවෙයි දතයුතුයි; කුමක්හෙයිනයත්? ශාස්ත්‍රයෙහි වස්තුකීර්තනය ලොකයෙහි මෙන් කෙවලනොව ශාස්ත්‍රගුණසම්පත්තිවිභාවනවශයෙන් පවත්නා හෙයිනි:-එහෙයින්ම වක්ෂ්‍යමාණය **තිස්සො සික්ඛා** යනාදී:-**සොතාපන්නාදිභාවස්ස කාරණං** යනුයෙහි ආදිශබ්දයෙන් සකෘදාගාමි අනාගාමීන් මෙන් අවිභාගයෙන් සියලු රහතුන්ම ගැනෙන බැවින් ත්‍රිවිධබොධිසත්ත්වයන්ගෙ නිර්වෙදභාගශීලාදීහු **සීලෙ පතිට්ඨාය** යනාදීන් සඞ්ග්‍රහ වෙති; පශ්චිමභවයෙහි විශෙෂයෙන් සංසාරභයෙක්ෂණ යද යථාස්වකශීලයෙහි පිහිටා සමථවිදර්ශනාබලයෙන් තෘෂ්ණාජටා විජටනප්‍රතිපත්තියද සමාන වෙයි; එහෙයින් ශාසනයෙහි වස්තු කීර්තනය ශාස්තෘහුගේ අවිපරීතධර්මදෙශනාභාවවිභාවනයෙන් ගුණ සම්පත්ති හඟවමින්ම පවතීනුයි ස්තුතිපූර්වඞ්ගමයයි දතයුතුයි; නොහොත්: **සො ඉමං විජටයෙ ජටං** යන සාධාරණ වචනයෙන් සාති ශය නිරතිශය තෘෂ්ණාජටාවිජටනය ගෘහීතබැවින් සවාසනප්‍රහාණාඛ්‍ය සාතිශයතෘෂ්ණාජටාවිජටනයෙන් ශාස්තෘහුගේ ප්‍රහාණසම්පත්තියද තන්නිමිත්තඥානසම්පත්තියද තදුභයෙන් නාන්තරීයකබැවින් ආනු භාව සම්පදාදීහුදු දක්වනලදහුනුයි මෙසේද ස්තුතිපූර්වඞ්ගමයයි දතයුතුයි;-නොහොත්: ප්‍රශ්නකළ දිව්‍යපුත්‍රයාගෙ අධ්‍යාශයානුරූප කොට ව්‍යාකරණසමර්ථතාවිභාවනවශයෙනුදු සංවර්ණනීයධර්මානු ගුණකොට සංවර්ණනාරම්භයෙහි ස්තුතිය ආචරිත බැවිනුදු ස්තුති පූර්වඞ්ගමකොටම දක්වනුවෝ කියනුලබනස්තුත්‍යාකාරයට කාරණො ධාරණය කරනුපිණිස පළමුකොට විසර්ජනගාථාව නික්ෂෙපකොට ඒ ගාථාවට නිදානචොදනාමුඛයෙන් පෘච්ඡාගාථාව ස්වරූපයෙන් අර්ථහෙයින් දක්වා ඒ පෘච්ඡාවට අවිපරීතව ව්‍යාකරණ සමර්ථතාව එළවනුවූ **සබ්බධම්මෙසු අප්පටිහතඤාණචාරො** යනාදිස්තුතිය පූර්වඞ්ග මකොට යථාභිප්‍රෙතවර්ණනාව කරනුපිණිස:-

"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං
ආතාපී නිපකො භික්ඛු සො ඉමං විජටයෙ ජටං"යි, කීහු.

මෙයින් මතු සත්‍ය ටීකා තුබූසේ ප්‍රසන්නවචනයෙන් සාභිප්‍රාය පදාර්ථවර්ණනා කරනුලැබේ.

1. සපඤ්ඤො, පිළිසඳනුවණින් නුවණ ඇතිවූ; ආතාපී, වීර්යඇතිවූ; නිපකො, පාරිහාරිකනුවණින් නුවණඇතිවූ; භික්ඛු, සංසාරයෙහි භය දක්නාවූ; යො නරො, යම් සත්ත්වයෙක්ඇද්ද; සො, හෙතෙම; සීලෙ පතිට්ඨාය, සීලයෙහි පිහිටා; චිත්තං, සමාධිය ද; පඤ්ඤං ච, විදර්ශනාව ද; භාවයං, වඩමින්; ඉමං ජටං, මේ තෘෂ්ණානමැති අවුල; විජටයෙ, කපන්නේයි; කපන්නට පොහොසත්වන්නේයි යන අර්ථයි.

(අ) ඉතිහිදං වුත්තං කස්මා පනෙතං වුත්තන්ති:-

(ආ) භගවන්තං කිර සාවත්ථියං විහරන්තං රත්තිභාගෙ අඤ්ඤතරො දෙවපුත්තො උපසඞ්කමිත්වා අත්තනො සංසයසමුග්ඝාතත්ථං.....

2. අන්තො ජටා බහිජටා ජටාය ජටිතා පජා
තං තං ගොතම පුච්ඡාමි කො ඉමං විජටයෙ ජටන්ති.....
ඉමං පඤ්හං පුච්ඡි.

(ඇ) තස්සායං සඞ්ඛෙපත්ථො;-ජටා ති තණ්හාය ජාලිනියා එතං අධිවචනං. සා හි රූපාදීසු ආරම්මණෙසු හෙට්ඨුපරියවසෙන පුනප්පුන උප්පජ්ජනතො සංසිබ්බනට්ඨෙන වෙළුගුම්බාදීනං සාඛජාලසංඛාතා ජටාවියාති ජටා;-

---

(අ) ඉතිහිදං වුත්තං—මිහි ඉතිශයබ්දය නිදර්ශනයෙහි වැටේ; එහෙයින්;—ඉතිහි, මෙසේම; ඉදං, මේ සූත්‍රය; වුත්තං, දෙසනලදැයි අර්ථ ගතයුතු; කස්මා, කුමක්හෙයින්; එතං, මේ සූත්‍රය; වුත්තං, දෙසන ලදද; **පන** යනු වචනාලඞ්කාරයි;-

(යට "ඉදං"යි දක්වා මෙතෙන "එතං"යි කුමක්පිණිස දක්වූදයත්? බුදුන්විසින් දෙසිත ගාථාපදය අනන්තරෙකතබැවින් අත්‍යන්ත සමීප විසින් "ඉදං"යි දක්වූහු; මෙතෙන සමීපවිසින් "එතං"යි දක්වූහු; නොහොත්: තමන්ගේ බුද්ධියෙහි වැටහෙනබව ගෙන "ඉදං"යි දක්වා නැවත භගවත්හු විසින් දෙසිතාකාරසඳහා "එතං"යි දක්වූහු:-)

(ආ) භගවන්තං කිර—යන්තෙහි **කිර** ශබ්දය අනුශ්‍රවණයෙහි නිපාතය; එයින් තමන්විසින් වක්ෂ්‍යමාණ අර්ථයාගේ පරම්පරායෙන් ශ්‍රූයමාණතාව දක්වූහු; භගවන්තං කිර, භගවත්හු; සාවත්ථියං විහරන්තං, සැවැත්නුවර වසන්නහු කිරු; රත්තිභාගෙ, මධ්‍යමරාත්‍රියෙහි; අඤ්ඤතරෙ දෙවපුත්තො, වෛශ්‍රවණාදීන්සේ ප්‍රකටවූ නම් නැති එක්තරු දිව්‍යපුත්‍රයෙක්; "**දෙවො එව දෙවපුත්තො**" යනු වේ:- උපසඞ්කමිත්වා, එළඹැ; අත්තනො සංසයසමුග්ඝාතත්ථං, තමාගේ සංශයනමැති ශල්‍යයාගේ සමුද්ධරණය පිණිස; "**ඉමං පඤ්හං පුච්ඡි**"යොදනු;-

2. අන්තො ජටා, ඇතුළත්හි දූ අවුල්මය; බහිජටා පිටත්හි දූ අවුල්මය; පජා, සත්වාඛ්‍ය ප්‍රජතොමෝ; ජටාය, ඇතුළත්හි දූ පිටත්හි දූ උපන් අවුලෙන්; ජටිතා, වෙළඳනාලදූ; තං, (තස්මා;) එහෙයින්; ගොතම, ගොතමය; තං, තා; පුච්ඡාමි, විචාරමි; ඉමං ජටං, මේ තෘෂ්ණාඅවුල; කො විජටයෙ,? කවරෙක් සපන්නේද; යි. ඉමං පඤ්හං, මේ ප්‍රශ්නය; පුච්ඡි, විචාළේය.....

(ඇ) තස්ස, ඒ ප්‍රශ්නයාගේ; අයං, මේ; සඞ්ඛෙපත්ථො, සංක්ෂෙපාර්ථයි;- **ජටාති, ජටාය යි; ජාලිනියා තණ්හාය, (අෂ්ටශත තෘෂ්ණා විචරිත ප්‍රභෙද නමැති ජාල ඇතිබැවින්)ජාලිනී නම්වූ තෘෂ්ණාවට; එතං**

(අ) **සාපනෙසා සකපරික්ඛාර පරපරික්ඛාරෙසු සකඅත්තභාව පර අත්තභාවෙසු අජ්ඣත්තිකායතන බාහිරායතනෙසු ච උප්පජ්ජනතො අන්තොජටා බහිජටා** ති වුච්චති;-

---

අධිවචනං, මෙ නමෙකි;-"**අට්ඨසතතණ්හාවිචරිතසම්භෙද අත්තනො අවයවභූතො එව ජාලො එතිස්සා අත්ථි ජාලිනී**"යි ගන්නේයි. **සා හි,ඒ තෘෂ්ණාතොමෝ**;රූපාදිසු ආරම්මණෙසු, රූපාදි සඅරමුණෙහි; හෙට්ඨුපරියවසෙන, කිසිකලෙක රූපාලම්බනයෙහි පටන් ධර්මාලම්බනය දක්වාද කිසිකලෙක්හි ධර්මාලම්බනයෙහි පටන් රූපාලම්බනය දක්වාද) උඩු යටිව; පුනප්පුන උප්පජ්ජනතො, නැවැත නැවැත උපදනා හෙයින්; සංසිබ්බනට්ඨෙන, හිවන අර්ථයෙන්; වෙළුගුම්බාදීනං, හුණලැහැප් ආදීන්ගේ; සාඛාජාලසඛ්‍යාතා, ශාඛාජාලයයි කියනලද; ජටාවියාති, අවුලවැතිනු යි; ජටා, අවුල් නම් වේ;-

(යම්සේ වෙණුගුල්මාදියෙහි වෙණුශාඛාතොමෝ තමාගේ අවයවයෙන්ම වළඳනාලද්දී ජටානම් වේද; යම්සේ කෙශාදීහු තමන්ගේ අවයවයෙන් ම වළඳනාලද්දාහු ජටානම්වෙද්ද; එසේම තෘෂ්ණාද ඒ ඒ අරමුණෙහි උඩුයටිව උපන් විසින් තමාම තමා හිවනබැවින් ජටා නම්වෙයි දතයුතුයි. "**සංසිබ්බිතට්ඨෙන**" යන පාඨය වුවහොත් කොෂකාරකෘමියක්හු මෙන් තමාවිසින්ම තමා හිවනලද බැවින් යන අර්ථ වේ.)

(අ) සාපනෙසා [තණ්හා], ඒ මේ තෘෂ්ණාතොමෝ; සකපරික්ඛාර පරපරික්ඛාරෙසු, තමාගේ පිරිකරය අනුන්ගේ පිරිකරය යන මොවුන් කෙරෙහිද; සකඅත්තභාව පරඅත්තභාවෙසු, තමාගේ ආත්මභාවය අනුන්ගේ ආත්මභාවය යන මොවුන් කෙරෙහිද; අජ්ඣත්තිකායතන බාහිරායතනෙසු ච, ආධ්‍යාත්මිකායතනය බාහ්‍යායතනය යන මොවුන් කෙරෙහිද: උප්පජ්ජනතො, උපදනාහෙයින්; අන්තොජටා බහිජටාති වුච්චති, අන්තොජටාය බහිජටාය යි කියනුලැබේ;-

("**සකපරික්ඛාර සකඅත්තභාව අජ්ඣත්තිකායතනෙසු උප්පජ්ජනතො අන්තොජටා; පරපරික්ඛාර පරඅත්තභාව බාහිරායතනෙසු උප්පජ්ජනතො බහිජටා**"යි. යොදනු;මෙහි සකපරක්ඛාරනම්, ප්‍රව්‍රජිතයන්ට පාත්‍රචීවරාදීහුය ගෘහස්ථයන්ට හස්ත්‍යශ්වාදීහුයි;-මෙහි තෘෂ්ණාතොමෝ ස්වකීය පරිෂ්කාරයෙහිදු ලොභවශයෙන් උපදීමය; පරපරිෂ්කාරයෙහි වනාහි තමහට උවමැනවැයි අභිධ්‍යාවශයෙනුදු උපදීමැයි; සකඅත්තභාව නම් තමා පස්කඳය; පරඅත්තභාව නම්, අනුන් පස්කඳයි. මිහිදු තෘෂ්ණාතොමෝ මාගේ ආත්මභාවය සුන්දරයයි ලොභවශයෙන් උපදීමය මාගේ ආත්මභාවය අසවල්හුගේ ආත්මභාවය මෙන් වේවයි ලොභවශයෙන් උපදීමයි. ස්වසන්තතිපර්යාපන්න චක්ෂුරාදීහු අජ්ඣත්තිකායතන නම්වෙති; පරසන්තතිපර්යාපන්න සියලු ආයතනයෝ බාහිරායතනනම් වෙත්; නොහොත් ස්වපරසන්තති පර්යාපන්න චක්ෂුරාදීහු අජ්ඣත්තිකායතන නම් වෙති;එසේම රූපාදීහු

(අ) තාය එවං උප්පජ්ජමානාය ජටාය ජටිතා පජා; යථා නාම වෙළුජටාදීහි වෙළුආදයො එවං තාය තණ්හාජටාය සබ්බාපි අයං සත්තසඞ්ඛාතා පජා ජටිතා විනද්ධා සංසිබ්බිතාති අත්ථො. යස්මා ච එවං ජටිතා–**තං තං ගොතම පුච්ඡාමි** තස්මා තං පුච්ඡාමි. **ගොතමාති** භගවන්තං ගොත්තෙන ආලපති **කො ඉමං විජටයෙ ජටන්ති** ඉමං එවං තෙධාතුකං ජටෙත්වා ඨිතං ජටං කො විජටෙය්‍ය විජටෙතුං කො සමත්ථොති පුච්ඡති.

(ආ) එවං පුට්ඨො පනස්ස සබ්බධම්මෙසු අප්පටිහතඤාණචාරො දෙවදෙවො සක්කානං අතිසක්කො බ්‍රහ්මානං අතිබ්‍රහ්මා චතුවෙසාරජ්ජවිසාරදො දසබලධරො අනාවරණඤාණො සමන්තචක්ඛු භගවා තමත්ථං විස්සජ්ජෙන්තො–

---

බාහිරායතනනම් වේත්; එහිදු තෘෂ්ණා තොමෝ මාගේ චක්ෂුරාදීහු මනාහයි ලොභවශයෙන් උපදීමය. අනුන්ගේ චක්ෂුරාදීහු මනාහයි ලොභවශයෙන් උපදීමැයි.

(අ) තාය, ඒ; එවං උප්පජ්ජමානාය, මෙසේ උපදනාවූ; ජටාය, ජටාවෙන්; ජටිතා පජා, සත්වසඞ්ඛ්‍යාත ප්‍රජාතොමෝ වළුදනාලද; යථා නාම, යම්සේ; වෙළුජටාදීහි, ඒ ශාඛාජාලාදිසඞ්ඛ්‍යාත වෙණුජටාදීන්; වෙළු ආදයො, හුනආදීහු වළුදනාලැබෙද්ද; එවං, එපරිද්දෙන්ම; තාය තණ්හාජටාය, ඒ තෘෂ්ණාජටාවෙන්; සබ්බාපි අයං සත්තසංඛාතා පජා, මේ සියලු සත්වසඞ්ඛ්‍යාත ප්‍රජාතොමෝ; ජටිතා, යි සේයි; විනද්ධා, වළුදනාලද; සංසිබ්බිතාති අත්ථො, සිවනලදයන අර්ථයි; යස්මා ච එවං ජටිතා, යම්හෙයකින් මෙසේ වළුදනාලදද; “තං තං ගොතම පුච්ඡාමි” යි සේයි; තස්මා, එහෙයින්; තං පුච්ඡාමි, තොප විචාරමි; ගොතමාති, ගොතම යි; භගවන්තං, භගවත්හට; ගොත්තෙන, ගොත්‍රයෙන්; ආලපති, ආමන්ත්‍රණය කෙරේ; කො ඉමං විජටයෙ ජටන්ති, ‘කො ඉමං විජටයෙ ජටං’ යන්නෙහි; එවං මෙසේ; තෙධාතුකං ජටෙත්වා ඨිතං, තුන්ලොව වැළඳගෙන සිටියාවූ; ඉමං ජටං, මේ ජටාව; කො විජටෙය්‍ය, කවරෙක් කපන්නේද; විජටෙතුං කො සමත්ථොති, කපන්නට කවරෙක් සමර්ථ වේදැයි; පුච්ඡි, විචාළේ;–

“එවං පුට්ඨො පන අස්ස දෙවපුත්තස්ස ගාථමාහ”යි සම්බන්ධකරනු

(ආ) එවං, මෙසේ “අන්තොජටා” යනාදිගයින්; පුට්ඨො, විචාරනලද; සබ්බධම්මෙසු, අතීතාදිභෙදභින්න සියලුඥෙයධර්මයන් කෙරෙහි; අප්පටිහතඤාණචාරො, නිරවශෙෂඥෙයාවරණප්‍රහාණයෙන් නිස්සඞ්ගචාර අතිබැවින් අවිහතවූ ඥානප්‍රවෘත්ති ඇතිවූ; නොපැකිල පවත්නා නුවණඇතිවූය යන අර්ථයි;–මෙසේ කාලත්‍රයෙහි අප්‍රතිහත ඥානවිභාවනයෙන්ම ආදියෙහි ආවෙනික ධර්මයන් තුන්දෙනාගේ ග්‍රහණයද,

"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං
ආතාපී නිපකො භික්ඛු සො ඉමං විජටයෙ ජටන්ති"

ඉමං ගාථ මාහ.

---

උන්ගේ ග්‍රහණයෙන්ම තදෙකලක්‍ෂණබැවිනුදු තදවිනාභාවී බැවිනු දු භගවත්හුගේ සෙසු ආවෙනිකධර්මයන්ගේ ග්‍රහණය ද වෙදිතව්‍යයි. දෙවදෙවො, (සංවෘත්‍යුත්පත්තිවිශුද්ධිසඞ්ඛ්‍යාතසර්වදෙවයන් විසින් පූජ්‍යතරදෙවබැවිනු දු සර්වඥගුණාභරණයෙන් විභූෂිතවූ විශුද්ධිදෙව භාවයට පැමිණි බැවිනු දු) සෙසු දෙවියන්ට අතිශය දෙවවූ; සක්කානං අතිසක්කො, (අපරිමාණ ලෝකධාතුයෙහි අපරිමාණ ශක්‍රයන්ගේ ගුණාභිභවනය කොට සිටිහෙයින් අධිකවූ ශක්‍රනුයි අතිශක්‍රවූ; බ්‍රහ්මානං අතිබ්‍රහ්මා, (කී නයින්ම) බ්‍රහ්මයන්ට අතිබ්‍රහ්මවූ; චතුවෙසාරජ්ජවිසාරදො, (බුද්ධත්වාදී සතරතන්හි සදෙවකලෝකයෙහි කිසිවක්හු විසින් නොසෙල්විය හැකි කිසිවෙකිනු දු උත්‍රාසයක් නැති බැවින් චතුර්විධවෛශාරද්‍යයෙන් විශාරදවූ; දසබලධරො, (ස්ථානාස්ථාන ඥානාදී දශවිධඥානබලයෙන් සමන්විත බැවින්) දශබලධරවූ; අනාවරණඤාණො, සියලු ඥෙයධර්මයෙහි නොපැකිල පවත්නා ඥාන ඇතිබැවින්ම) අනාවරණඥාන ඇතිවූ; සමන්තචක්ඛු, (සියලු ඥෙයමණ්ඩලය හාත්පසින් සර්වාකාරයෙන් හස්තතලාමලකන්‍යායයෙන් ප්‍රත්‍යක්‍ෂයෙන් දක්නට සමර්ථවූ ඤාණලොචනයෙන් සමන්විතබැවින්) සමන්තචක්ඛුනම්වූ; (සර්වඥවූ යන අර්ථයි;) භගවා, (භාග්‍යවත්ත්වාදී කාරණයෙන්) භගවත්තෙමෙ; අස්ස, මේ දිව්‍යපුත්‍රයානට; තමත්ථං විස්සජ්ජෙන්තො, ඒ අර්ථ විසදන්නේ; සීලෙ පතිට්ඨාය...පෙ...

ඉමං ගාථමාහ, මේ ගාථාව කී.

("සබ්බධම්මෙසු අප්පටිහතඤාණචාරො" යනුයෙන් භගවත්හුගේ අධ්වත්‍රයාරූඪ පෘච්ඡාවන්ගේ ව්‍යාකරණයෙහි සමර්ථබව දැක්වූ කල්හි කිම දෙවියන්ගේ ප්‍රශ්නව්‍යාකරණයෙහිදු සමර්ථද්ද හෝ යන ආශඞ්කා නිවෘත්තිය පිණිස "දෙවදෙවො"යි කී-දෙවාතිදෙවවූ ශක්‍ර දෙවෙන්ද්‍රතෙමෙ දෙවියන්ගේ ප්‍රශ්න විසදයි. ඔහු කෙරෙන් මොවුන්ගේ වෙසෙස් කිම යන චින්තානිවෘත්තිය පිණිස "සක්කානං අතිසක්කො"යි කී-ශක්‍රයාවිසින් විචාළ ප්‍රශ්නද සනත්කුමාරාදී බ්‍රහ්මයෝ විසදති. ඒ බ්‍රහ්මයන් කෙරෙන් මොවුන්ගේ වෙසෙස් කිම යන චින්තානිවෘත්තිය පිණිස "බ්‍රහ්මානං අතිබ්‍රහ්මා" යි කීහු. මේ විශෙෂය ද චතුර්වෛශාරද්‍ය දශබලඥානයෙන් ප්‍රකට වියයි දක්වනුපිණිස "චතුවෙසාරජ්ජ විසාරදො දසබලධරො"යි කී- චතුර්වෛශාරද්‍ය දශබලඥානයෝ ද මේ ඥානයන් දෙදෙනාගේ අධිගමය හා සමඟ සිද්ධවූහයි දක්වනුපිණිස "අනාවරණඤාණො සමන්තචක්ඛු"යි කීහු. මේ දෙනුවණද පුණ්‍ය ඥානසම්භාරයන්ගේ උපචයින් සිද්ධවූ භග්නදොෂතායෙන් සිද්ධවියයි දක්වනපිණිස "භගවා" යි කීහු. අනාවරණඥානය සර්වඥතාඥානය

3　ඉමිස්සාදානි ගාථාය කථිතාය මහෙසිනා
වණ්ණයන්තො යථාභූතං අත්ථං සීලාදිභෙදනං.

4　සුදුල්ලභං ලභිත්වාන පබ්බජ්ජං ජිනසාසනෙ
සීලාදිසඞ්ගහං ඛෙමං උජුං මග්ගං විසුද්ධියා.

5　යථාභූතං අජානන්තා සුද්ධිකාමා පි යෙ ඉධ
විසුද්ධිං නාධිගච්ඡන්ති වායමන්තාපි යොගිනො.

---

යන දෙනුවණ අර්ථහෙයින් අභින්නවුව ද සඞ්ඛතාසඞ්ඛතසම්මුතිභෙද භින්න සියලු ඥෙයධර්මයන් විෂයකරන බැවින් සර්වඥතඥාණ නමුදු විය. එම විෂයෙහි ආවරණයක් නැතිබැවින් නිස්සඞ්ගචාරය ගෙන අනාවරණඥාන නමුදු විය යි විෂයප්‍රවෘත්ති මුඛයෙන් විවිධ කොට කියනලද්දැ යි දතයුතු.)

3 ඉදානි,දැන්;මහෙසිනා,මහර්ෂිහුවිසින්;(**“මහන්තෙන සීලක්ඛන්ධ එසි ගවෙසී ති මහෙසි භගවා”**යි ගන්නේ.) කථිතාය, දෙසනලද; ඉමිස්සා ගාථාය, මේ ගාථාවෙහි; සීලාදිභෙදනං, ශීලසමාධිප්‍රඥාභෙද ඇති; යථාභූතං අත්ථං, අවිපරීතවූ අර්ථය; වණ්ණයන්තො, විස්තර කරන්නෙම්;**“විසුද්ධිමග්ගං භාසිස්සං”**යි සම්බන්ධකරනු.

4. ජිනසාසනෙ, බුද්ධසස්නෙහි; සුදුල්ලභං, අෂ්ට අක්ෂණ[1] වර්ජිත නවවනබුද්ධොත්පාදක්ෂණයෙහිම ලැබියයුතු බැවින් මනාකොටම දුලීභවූ; පබ්බජ්ජං ලභිත්වාන, ප්‍රව්‍රජ්‍යාව ලදින්; සීලාදිසඞ්ගහං, ශීලාදිස්කන්ධත්‍රයින් සඞ්ගෘහීතවූ; (“මග්ගං” යන්නට විශෙෂණයි ආර්‍යමාර්‍ගතෙමෙ සප්‍රදෙශ බැවින් ශීලාදිස්කන්ධත්‍රයින් සඞ්ගෘහීතවෙයි. ස්කන්ධත්‍රය වනාහි නිෂ්ප්‍රදේශබැවින් ආර්‍යමාර්‍ගයෙන් සඞ්ගෘහීත නොවේ. “න ඛො ආවුසො විසාඛ අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන තයො ඛන්ධා සඞ්ගහිතා තීහි ච ඛො ආවුසො විසාඛ ඛන්ධෙහි අරියො අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ගහිතො” යනු පෙළී) ඛෙමං, (කෙලෙස් සොරුන් විසින් නොපැහැරිය යුතුබැවින්) ක්ෂෙමවූ-නිර්භයවූ; විසුද්ධියා, නිර්වාණයට අර්හත්වයට හෝ; උජුං මග්ගං, (අන්තවයවර්ජිතබැවිනු දු මායාසාඨෙය්‍යාදි කායවඞ්කාදීන් පහවනබැවිනු දු) සෘජුවූ ආර්‍යමාර්‍ගාඛ්‍ය ප්‍රතිපත්තිය.

5. යථාභූතං අජානන්තා, (ශීලාදි විශුද්ධිපරම්පරායෙන් ප්‍රාප්තව්‍යය මෙබඳු ස්වරූපඇත්තෙය මෙබඳු කෘත්‍ය ඇත්තෙය මෙබඳු ප්‍රයොජන ඇත්තේයයි) ස්වරූප හෙයින් නොදන්නාවූ; සුද්ධිකාමාපි, සියලු සංක්ලෙශයන් කෙරෙනු දු සංසාරයෙනුදු විමුක්තියකැමතිවූ; (මිහි අපි ශබ්දය සම්භාවනයෙහිය එහෙයින් **“න කෙවලං සීලමත්තෙන සන්තුට්ඨා අථ ඛො විසුද්ධිකාමා පි සමානා”**යි කීවෙත්.)ඉධ, මේ ශාසන

---

1 දුෂ්ටාක්ෂණ- මු. ස.

6 තෙසං පාමොජ්ජකරණං සුවිසුද්ධවිනිච්ඡයං
මහාවිහාරවාසීනං දෙසනානයනිස්සිතං.

7 **විසුද්ධිමග්ගං භාසිස්සං** තමෙමසක්කච්ච භාසතො
විසුද්ධිකාමා සබ්බෙපි නිසාමයථ සාධවො ති.

(අ) තත්‍ථ **විසුද්ධීති** සබ්බමලවිරහිතං අච්චන්තපරිසුද්ධං නිබ්බානං වෙදිතබ්බං. තස්සා විසුද්ධියා මග්ගොති විසුද්ධිමග්ගො. **මග්ගොති** අධිගමූපායො වුච්චති. තං විසුද්ධිමග්ගං භාසිස්සන්ති[1] අත්‍ථො.

---

යෙහි; යෙ යොගිනො, යම් යොගීකෙනෙක්; වායමන්තාපි; විශුද්ධිය **පිණිස** උත්සාහකරන්නාහු දු; විසුද්ධිං නාධිගච්ඡන්ති, (උපාය අනධිගත බැවින්) විශුද්ධියට නොපැමිණෙද්ද.

6. තෙසං පාමොජ්ජකරණං, ඒයොගීන් සතුටුකරවන්නාවූ; සුවිසුද්ධ විනිච්ඡයං, (නිකායාන්තරලබ්ධිහා අසම්මිශ්‍රබැවින්) මනාකොටම පිරිසුදු විනිශ්චයඇති; මහා විහාරවාසීනං, මහාවිහාරවාසී තෙරවරුන්ගේ; දෙසනානයනිස්සිතං, අර්ත්ථකථානය ආශ්‍රයකළ.

7. විසුද්ධිමග්ගං, විශුද්ධිමාර්ගය; භාසිස්සං, කියමි;—සක්කච්චං, සකස්කොට; භාසතො, කියන්නාවූ; මෙ, මාගේ; තං, ඒ විශුද්ධිමාර්ගය; විසුද්ධිකාමා, නිවන්කැමති; සබ්බෙපි සාධවො, සියලුසාධුජනයෙනි; (සක්කච්චං, සකස්කොට;) නිසාමයථ, අසව්.

(මෙහි "ඉමිස්සාදානි ගාථාය" යනුයෙන් විශුද්ධිමාර්ග කරණයට නිශ්‍රයදක්වූහ; "කථිතාය මහෙසිනා" යනුයෙන් එහි නිශ්‍රය පමණබව දක්වූහ; "යථාභූතං අත්‍ථං සීලාදිභෙදනං" යනුයෙන් අවිපරීතවූ පිණ්ඩාර්ථය දක්වූහ; "සුදුල්ලභං....පෙ....යොගිනො" යනුයෙන් නිමිත්ත දක්වූහ; "තෙසං පාමොජ්ජකරණං" යනුයෙන් ප්‍රයොජනය දක්වූහ; "වණ්ණයන්තො අත්‍ථං සුවිසුද්ධ විනිච්ඡයං" යනු යෙන්ද "මහාවිහාර වාසීනං දෙසනානයනිස්සිතං" යනුයෙන්ද "සක්කච්චං" යනුයෙන්ද කරණප්‍රකාර දක්වූහු; "විසුද්ධිකාමා සබ්බෙ පි නිසාමයථ සාධවො" යනුයෙන් සාධුජනයන් සත්කෘත්‍ය ශ්‍රවණයෙහි යෙදූ:-)

(අ) තත්‍ථ, "විසුද්ධිමග්ගං භාසිස්සං" යන මෙහි **විසුද්ධිමග්ගං** යනයම් වචනයෙක් ඇද්ද එහිය යන අර්ථයි; විසුද්ධීති' විසුද්ධියයි; සබ්බමල විරහිතං, සියලු රාගාදි මලයෙන් වෙන්වූ; අච්චන්තපරිසුද්ධං නිබ්බානං වෙදිතබ්බං, සර්වමල විරහිත බැවින් ම හැමකල ම සර්වාකාර යෙන්ම පිරිසුදුවූ නිර්වාණය දතයුතු; තස්සාවිසුද්ධියා, ඒ විශුද්ධියට; මග්ගොති, මාර්ගයනුයි; විසුද්ධිමග්ගො, විශුද්ධිමාර්ගනම්; මග්ගොති, මාර්ගයයි; අධිගමූපායො වුච්චති, නිර්වාණ ප්‍රතිලාභයට උපාය කියනු ලැබේ; (විශුද්ධිමාර්ගයයි නිෂ්පර්‍ය්‍යායෙන් ලොකොත්තර මාර්ගයන් දතයුතුය; තදුපාය හෙයින් චතාභි පූර්වභාග මාර්ගයද තන්නිශ්‍රය කථා ප්‍රබන්ධය ද විශුද්ධිමාර්ගයයි කියනුලැබේ;) තං විසුද්ධිමග්ගං භාසිස්සන්ති අත්‍ථො, ඒ විශුද්ධිප්‍රතිලාභයට උපාය කියමි යන අර්ථයි.

---

1. භාසිස්සාමීති- මූ.

(අ) සො පනායං විසුද්ධිමග්ගො කත්ථචි විපස්සනාමත්තවසෙනෙව දෙසිතො යථාහ:–

8 "සබ්බෙසඞ්ඛාරා අනිච්චාති යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ එසමග්ගො විසුද්ධියා"ති.

කත්ථචි ඣානපඤ්ඤාවසෙන, යථාහ:–

(ආ) "යම්හි ඣානඤ්ච පඤ්ඤා ච ස වෙ නිබ්බානසන්තිකෙ"ති.

කත්ථචි කම්මාදිවසෙන, යථාහ:–

---

(අ) සො පනායං විසුද්ධිමග්ගො, ඒ මේ විශුද්ධිමාර්ගය වනාහි; කත්ථචි, කිසි සූත්‍රයෙක; විපස්සනාමත්තවසෙනෙව දෙසිතො, විදර්ශනා මාත්‍ර වශයෙන් ම දෙසනලදී; (මිහි එව යන අවධාරණයෙන් සමථය වැළකූහු, විශෙෂ නිවෘත්තිය අර්ථකොට ඇති මාත්‍රශබ්දයෙන් විපස්සනායානිකයහට ද ක්‍ෂණික සමාධියක් නැතිව විදර්ශනාව සම්භව නොවන බැවින් උපචාරාර්පණභෙදඇති සවිශෙෂසමාධිය වැළකූහු.) යථාහ, වදාළේමය.[1] ("යථා ආහ තථා උපපාදයිස්සාම"යනු මිහි තාත් පර්‍ය්‍යාර්ථයි; මත්තෙහි දු මෙම නයින්ම අර්ථගතයුතු.)

8. සබ්බෙසඞ්ඛාරා, සියලු ත්‍රෛභූමක සංස්කාරයෝ; (මිහි ලෝකොත්තරයන් සම්මර්ශනයොග්‍යනොවන බැවින් සබ්බෙසඞ්ඛාරා යි කිවද ත්‍රෛභූමක සංස්කාරයෝම ගැනෙත්.) අනිච්චාති, අනිත්‍යයහ– ක්‍ෂණභඞ්ගුරහයි; යදා, යම්කලෙක; පඤ්ඤාය පස්සති, විදර්ශනාප්‍රඥාවෙන් සම්මර්ශනයකෙරේද; අථ, පසුව; – උදයව්‍යයඥානාදීන්ගේ උත්පත්තියට උත්තරකාලයෙහි; දුක්ඛෙ, (එම අනිත්‍යාකාරයෙන් දෘෂ්ටවූ "සබ්බෙසඞ්ඛාරා"යි කියනලද ත්‍රෛභූමක ස්කන්ධපඤ්චක සඞ්ඛ්‍යාත)දුඃඛයෙහි; නිබ්බින්දති, නිර්වේදඥානය පිළිලැබේද; එසමග්ගො විසුද්ධියා, නිර්වේදානුපස්සනා සඞ්ඛ්‍යාත විරාගකාරණවූ මෙ තෙමෙ නිර්වාණයාගේ අධිගමයට කාරණායි.

කත්ථචි, කිසිසූත්‍රයෙක; ඣානපඤ්ඤාවසෙන, සමථවිපස්සනා වශයෙන්; යථාහ, දෙසනලදී; (මෙහි ධ්‍යානයයි විදර්ශනාවට පාදකවූ ධ්‍යානය අභිප්‍රෙතයි.)

(ආ) යම්හි, යම්පුද්ගලයක්හු කෙරෙහි; ඣානඤ්ච, ධ්‍යානය ද පඤ්ඤා ච, ප්‍රඥාව ද (වේද); (යම්පුද්ගලයෙක් ධ්‍යානය පාදකකොට විදර්ශනාරම්භකොට ඒ වඩාද යන අර්ථයි.) සවෙනිබ්බානසන්තිකෙ,– සො, ඒ පුද්ගල තෙමෙ; වෙ; එකාන්තයෙන්; නිබ්බානසන්තිකෙ, නිවන් සමීපයෙහියි; (ඒකාන්තයෙන් නිවනට පැමිණෙන්නේය යන අර්ථයි.)

කත්ථචි, කිසිසූත්‍රයෙක; කම්මාදිවසෙන යථාහ, කර්මාදීන්ගේ වශයෙන්. දෙසනලදී.

---

1. වදාළමය– ඇතැම්.

9 "කම්මං විජ්ජා ච ධම්මො ච සීලං ජීවිත මුත්තමං
එතෙන මච්චා සුජ්ඣන්ති න ගොත්තෙන ධනෙන වා"ති.
කත්ථචි සීලාදිවසෙන, යථාහ:-

10 "සබ්බදා සීලසම්පන්නො පඤ්ඤවා සුසමාහිතො
ආරද්ධවිරියො පහිතත්තො ඔඝං තරති දුත්තරං"ති.
කත්ථචි සතිපට්ඨානාදිවසෙන, යථාහ:-

---

9. කම්මං, මාර්ගචෙතනාව ද; (හෝ වනාහි අපචයගාමී බැවින් සත්‍වයන්ට විශුද්ධි එළවා;) විජ්ජාව, සම්‍යග්දෘෂ්ටියද; සීලං, සම්මා වාචාය සම්මාකම්මන්තය යන මොහුද; ජීවිතමුත්තමං, සම්මාආජීවය ද; ධම්මො ච, සම්මාසඞ්කප්පය සම්මාසතිය සම්මාසමාධිය සම්මා වායාමය යන අවශිෂ්ට සතර ආර්‍ය්‍යමාර්ගධර්මයෝ ද යන; එතෙන, මේ අෂ්ටාඞ්ගමාර්ගයෙන්; (නොහොත්: **කම්මං** යි යනුවෙන් සම්මා කම්මන්තයාගේ ග්‍රහණයවේ. "යා ච ආවුසො විසාඛ සම්මාදිට්ඨි යොච සම්මාසඞ්කප්පො ඉමෙධම්මා පඤ්ඤක්ඛන්ධෙ සඞ්ගහීතා"යි. කී බැවින් **විජ්ජා** යනුවෙන් සම්‍යග්දෘෂ්ටිය සම්‍යක්සඞ්කල්පය යන මොවුන්ගේ ග්‍රහණයවේ. "එවං ධම්මා භගවන්තො අහෙසුං" යනුයෙහි මෙන් **ධම්මො** යි සමාධියගන්නාලැබෙයි. තද්ග්‍රහණයෙන්ම "යොච ආවුසො විසාඛ සම්මාවායාමො යා ච සම්මාසති යොච සම්මාසමාධි ඉමෙ ධම්මා සමාධික්ඛන්ධෙ සඞ්ගහීතා"යි. කී බැවින් සම්මා වායාමය සම්මාසතිය යන මොවුන්ගේ ග්‍රහණයවෙයි. **සීලං** යනුවෙන් සම්මා වාචා සම්මාආජීව යනමොවුන්ගේ ග්‍රහණයවේ.) යං ජීවිතමුත්තමං, යමෙක් මෙකී අෂ්ටාඞ්ගමාර්ගයෙන් සමන්විතද ඔහුගේ ජීවිතය උත්තම ජීවිතනම් වෙයි යන අර්ථයි; එතෙන, මේ ආර්‍ය්‍යමාර්ගයෙන්; මච්චා සුජ්ඣන්ති, සත්‍වයෝ පිරිසුදුවෙති; න ගොත්තෙන ධනෙන වා, ගොත්‍ර යෙන්වත් ධනයෙන්වත් පිරිසුදු නොවෙත්.

කත්ථචි, කිසිසූත්‍රයෙක; සීලාදිවසෙන යථාහ, ශීල සමාධි ප්‍රඥා වීර්‍ය්‍ය වශයෙන් දෙසනලදී.

10. සබ්බදා, සමාදානයෙහි පටන් හැම කලම; සීලසම්පන්නො, චතු පාරිසුද්ධිශීලයෙන් සමන්විතවූයේ; පඤ්ඤවා, ලෞකික ලොකොත්තර ප්‍රඥාවෙන් සමන්විතවූයේ; සුසමාහිතො, ප්‍රඥාසම්ප්‍රයුක්ත සමාධියෙන් මනාකොට ම සමාහිතවූයේ; ආරද්ධවිරියො, අකුසලධර්මයන්ගේ ප්‍රහා ණයපිණිස කුශලධර්මයන්ගේ උත්පාදයපිණිස හුවනලද වීර්‍ය්‍යඇති වූයේ; පහිතත්තො, නිර්වාණයපිණිස මෙහෙයනලද සිත්ඇතිබැවින් කායජීවිතයෙහි නිරපෙක්‍ෂවූ සිත්ඇතිවූයේ; දුත්තරං, අනුන්විසින් එතරවිය නොහැකි; ඔඝං, කාමොඝාදි චතුර්විධ ඔඝය; (සංසාර මහො ඝය;) තරති, එතරවේ.

කත්ථචි, කිසිසූත්‍රයෙක; සතිපට්ඨානාදිවසෙන යථාහ, සතිපට්ඨා නාදීන්ගේ වශයෙන් දෙසනලදී.

(අ) "ඒකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා...පෙ... නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා" සම්මප්පධානාදිසුපි එසෙව නයො.

(ආ) ඉමස්මිං පන පඤ්හබ්‍යාකරණෙ සීලාදිවසෙන දෙසිතො. තත්‍රායං සඞ්ඛෙපවණ්ණනා:– **සීලෙ පතිට්ඨාය** ති සීලෙ ඨත්වා. සීලං පරිපූරයමානො යෙව චෙත්ථ සීලෙ පතිට්ඨිතොති වුච්චති; තස්මා සීලපරිපූරණෙන සීලෙ පතිට්ඨහිත්වාති අයමෙත්ථ අත්ථො. **නරො**ති සත්තො; **සපඤ්ඤො** ති කම්මජතිහෙතුකපටිසන්ධි පඤ්ඤාය පඤ්ඤවා;

---

(අ) භික්ඛවෙ, මහණෙනි; සත්තානං විසුද්ධියා, රාගාදි මලයෙනුදු අභිජ්ඣා විෂමලෝභාදි උපක්ලේශයෙනුදු සත්වයන්ගේ විශුද්ධිය පිණිස; නිබ්බානස්ස සච්ඡිකිරියාය, නිර්වාණය සාක්ෂාත්කරනු පිණිස; ("අයං ඒකායනො මග්ගො" යනුයෙහි "අයන" ශබ්දය මාර්ග පර්‍යායය; එහෙයින් "ඒකමග්ගභූතො අ ම්පි භික්ඛවෙ මග්ගො න ද්වෙධා පථභූතො" යනු අටුවා බැවින් ඒකමාර්ගවූ මාර්ගයවේ විවිධවූ මාර්ගයෙක් නොවේ යන අර්ථයි. නොහොත්: **"ඒකං වා නිබ්බානං අයති ගච්ඡතීති ඒකායනො, ඒකෙන වා ගණසඞ්ගණිකං පහාය විවෙකට්ඨෙන අයිතබ්බො පටිපජ්ජිතබ්බොති ඒකායනො, අයනති එතෙනාති වා අයනො ඒකස්ස සෙට්ඨස්ස භගවතො අයනොති [1] ඒකායනො තෙන උප්පාදිතත්තා; ඒකස්මිං වා ඉමස්මිංයෙව ධම්මවිනයෙ අයනොති ඒකායනො"**සි, ගන්නේ; 'යදිදං' යනු නිපාතය; 'සතිපට්ඨානා' යනු බලා 'යෙ ඉමෙ චත්තාරො සතිපට්ඨානා'සි යොදනු. යම් මේ සතරමහ සිවටන්කෙනෙක් ඇද්ද; "අයං ඒකායනො මග්ගො"සි යොදනු. **"සරණ ලක්ඛණෙන මග්ගට්ඨෙන ච මග්ගො ති වුත්තස්සෙව කායාදි විසය භෙදෙන චතුබ්බිධත්තා චත්තාරො සතිපට්ඨානාති වුත්තන්ති වෙදිතබ්බං"**) සම්මප්පධානාදිසුපි, සම්මප්පධානාදියෙදු; එසෙව නයො, මෙම නයයි; (ආදි ශබ්දයෙන් අප්පමාදාභිරතිආදීන්ගේ සංග්‍රහ දතයුතු. අප්‍රමාදාදි වශයෙනුදු කිසි සූත්‍රයෙක විශුද්ධිමාර්ගය දෙසනලදී:–වදාළේමැනො.

"අප්පමාදරතො භික්ඛු පමාදෙ භයදස්සි වා
අභබ්බො පරිහානාය නිබ්බානස්සෙව සන්තිකෙ"සි.)

(ආ) ඉමස්මිං පන පඤ්හබ්‍යාකරණෙ, මේ ප්‍රශ්නව්‍යාකරණයෙහි; සීලාදිවසෙන දෙසිතො, ශීල සමාධි ප්‍රඥා වශයෙන් දෙසනලදී; තත්‍ර, ඒ ගාථායෙහි; අයං සඞ්ඛෙපවණ්ණනා, මේ සංක්ෂෙප වර්ණනායි; සීලෙ පතිට්ඨායාති, යන්නෙහි; සීලෙ ඨත්වා, ශීලයෙහි සිට; සීලං පරිපූරයමානොයෙව, ශීලය පුරන්නේම–සම්භාගයෙන් සංවරණය කරන්නේම; (ව්‍යතික්‍රම නොකරන්නේය යන අර්ථයි;) එත්ථ, මෙහි; සීලෙ

---

1. ඒකස්ස සෙට්ඨස්ස අයනො–ඇතැම්.

(අ) **චිත්තං පඤ්ඤඤ්ච භාවයන්ති** සමාධිඤ්චෙව විපස්සනඤ්ච භාවයමානො චිත්තසීසෙන හෙත්ථ සමාධි නිද්දිට්ඨො. පඤ්ඤානාමෙන ච විපස්සනාති; **ආතාපීති** විරියවා. විරියං හි කිලෙසානං ආතාපන පරිතාපනට්ඨෙන ආතාපොති වුච්චති. තදස්ස අත්ථීති ආතාපී; **නිපකොති** නෙපක්කං වුච්චති පඤ්ඤා, තාය සමන්නාගතොති අත්ථො. ඉමිනා පන පදෙන පාරිහාරියපඤ්ඤං දස්සෙති. ඉමස්මිං හි පඤ්හාව්‍යාකරණෙ තික්ඛත්තුං පඤ්ඤා ආගතා. තත්ථ පඨමා ජාතිපඤ්ඤා, දුතියා විපස්සනා පඤ්ඤා, තතියා සබ්බකිච්චපරිණායිකා පාරිහාරිය පඤ්ඤා; සංසාරෙ භයං ඉක්ඛතීති භික්ඛු.

---

පතිට්ඨිතොති වුච්චති, ශීලයෙහි පිහිටියේයයි කියනුලැබේ; තස්මා, එහෙයින්; සීලපරිපූරණවසෙන, ශීලපරිපූරණ වශයෙන්; සීලෙ පතිට්ඨහිත්වාති, ශීලයෙහි පිහිටා යන; අයං; මේ; එත්ථ, "සීලෙ පතිට්ඨාය" යනමේ පෙදෙහි; අත්ථො, අර්ථයි; නරොති,සී සේයි; සත්තො, සත්වයි; (නරෙ යනු අවිභාගයෙන් පුද්ගල පර්‍ය්‍යායබැවින් "නරොති සත්තො" යි කීහු;) සපඤ්ඤොති, යන්නෙහි; කම්මජ තිහෙතුකපටිසන්ධිපඤ්ඤාය පඤ්ඤවා, කම්මජවූ ත්‍රිහෙතුක ප්‍රතිසන්ධියෙහි ප්‍රඥාවෙන් ප්‍රඥා ඇති; (ත්‍රිහෙතුක ප්‍රඥාවක් නැතිබැවින් මිහි "කම්මජය තිහෙතුකපටිසන්ධියං පඤ්ඤාය"යි ත්‍රිහෙතුක ශබ්දය ප්‍රතිසන්ධි ශබ්දය හා සම්බන්ධකටයුතු. ප්‍රතිසන්ධියෙහි පටන් ගෙන පවත්නා ප්‍රඥා තොමෝ තන්මූලික බැවින් ප්‍රතිසන්ධිප්‍රඥායයි කියනලදයි දතයුතු.)

(අ) "චිත්තං පඤ්ඤඤ්ච භාවයං" යන්නෙහි; සමාධිඤ්චෙව, සමාධියද; විපස්සනංච, විදර්ශනාවද; භාවයමානො, වඩන්නේ; එත්ථ, මෙහි වනාහි; චිත්තසීසෙන, චිත්තශීර්ෂයෙන්; (චිත්තමුඛයෙන් යන අර්ථයි.) සමාධි නිද්දිට්ඨො, සමාධිය දක්වනලදී; (**චින්තෙතීති ආරම්මණං උපනිජ්ඣායතීති චිත්තං**, සමාධි යී නිර්ව්‍යාජව ම සමාධිහට චිත්තපර්‍ය්‍යාය ලැබෙතුදු චිත්තශබ්දය විඥාණයා කෙරෙහි නිරූඪනුයි අටුවායෙහි, "චිත්තසීසෙන නිද්දිට්ඨො"යි කීහු;) පඤ්ඤානාමෙන ච විපස්සනා, ප්‍රඥානාමයෙනු දු විදර්ශනා දක්වනලදු; "ආතාපී"යන්නෙහි; විරියවා, වීර්‍ය්‍ය ඇත්තේ; විරියං හි, වීර්‍ය්‍ය තෙමේ; කිලෙසානං ආතාපන පරිතාපනට්ඨෙන, කෙලෙසුන් තවන බැවිනු දු මනාකොට තවන බැවිනු දු; ආතාපොති වුච්චති, ආතාපය යි කියනුලැබේ; තං, ඒ වීර්‍ය්‍යය; අස්ස අත්ථීති, මොහට ඇත්තුයි; ආතාපී, ආතාපී නම්; (මෙහි ආතාපන ග්‍රහණයෙන් ආරම්භධාතුව දක්වනලද, පරිතාපන ග්‍රහණයෙන් නික්කමධාතු පරක්කමධාතුහු දක්වනලදහු.) "නිපකො" යන්නෙහි; නෙපක්කං වුච්චති පඤ්ඤා, නෙපක්කයයි ප්‍රඥා කියනු ලැබේ; තාය සමන්නාගතොති අත්ථො, ඒ ප්‍රඥාවෙන් සමන්විතය යන අර්ථයි; **නිපච්චයන්ති විසොසෙන්ති**[1] **පටිපක්ඛං තෙනොවා අත්තානං නිපාති රක්ඛතීති නිපකො සම්පජානො**;යි ගන්නේ.) ඉමිනා

---

1. නිපච්ච විසොසෙති-මූ. ස.

(අ) **සො ඉමං විජටයෙ ජටන්ති** සො ඉමිනා ච සීලෙන ඉමිනා ච චිත්තසීසෙන නිද්දිට්ඨසමාධිනා ඉමාය ච තිවිධාය පඤ්ඤාය ඉමිනා ච ආතාපෙනාති ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු:–සෙය්‍යථාපි නාම පුරිසො පඨවියා පතිට්ඨාය සුනිසිතං සත්ථං උක්ඛිපිත්වා මහන්තං වෙළුගුම්බං විජටෙය්‍ය, **එවමෙවං** සීලෙ පතිට්ඨාය සමාධිසිලාය නිසිතං විපස්සනාපඤ්ඤාසත්ථං විරියබලපග්ගහිතෙන පාරිහාරියපඤ්ඤා හත්ථෙන උක්ඛිපිත්වා සබ්බමපි තං අත්තනො සන්තානපතිතං තණ්හාජටං විජටෙය්‍ය සඤ්ඡින්දෙය්‍ය සම්පදාලෙය්‍ය, මග්ගක්ඛණෙ පනෙස තං ජටං විජටෙති නාම ඵලක්ඛණෙ විජටිතජටො සදෙවකස්ස ලොකස්ස අග්ගදක්ඛිණෙය්‍යො හොති.

---

පදෙන, නිපකො යන මේ පෙදෙන්; පාරිහාරියපඤ්ඤං දස්සෙති, කම්මස්ථාන පරිහරණයෙහි නියුක්ත ප්‍රඥාව දක්වා; (“**කම්මට්ඨානස්ස පරිහරණෙ නියුත්තා පාරිහාරිකා** යි ගන්නේ.) ඉමස්මිංහි පඤ්හ ව්‍යාකරණෙ, මේ ප්‍රශ්නව්‍යාකරණයෙහි; තික්ඛත්තුං තුන්වරෙක; පඤ්ඤා ආගතා, ප්‍රඥතොමො අවු; තත්‍ර, ඒ තුන්ප්‍රඥවන් කෙරෙහි; පඨමා, ප්‍රථම ප්‍රඥතොමෝ; ජාතිපඤ්ඤා, පිළිසඳ නුවණබැවින් ජාතිප්‍රඥය; දුතියා, දෙවන ප්‍රඥතොමෝ; විපස්සනාපඤ්ඤා, විදර්ශනා ප්‍රඥය; තතියා, තුන්වනප්‍රඥ තොමෝ; සබ්බකිච්චපරිණායිකා, අභික්කමාදි සර්‍වකෘත්‍ය යන් සාත්‍ථක සම්ප්‍රජන්‍යාදි වශයෙන් පිරිසිඳ පවත්නාවූ; පාරිහාරිය පඤ්ඤා, පාරිහාරික ප්‍රඥයි. (“**සබ්බකිච්චානි පරිචජෙජ්ජන්ති පරිච්ඡිජ්ජ නයති සබ්බකිච්චපරිණායිකා**” යි ගන්නේ.) සංසාරෙ, සසරෙහි; භයං ඉක්ඛතීති භික්ඛු, භය දක්නුයි භික්ෂු නම්වේ; (“**සංසාරෙභයං ඉක්ඛතීති භික්ඛු**” යන සාධාරණ භික්ෂු ලක්ෂණ කථනයෙන් ප්‍රතිපත්ති වශයෙන් ම භික්ෂුභාවය දර්ශිතය යි දෘෂ්ටව්‍යයි. භික්ඛක භින්නපටධරාදිභාවයෙන් භික්ෂුභාවය ගතහොත් පිඬුසිඟීම්ආදි ක්‍රියානැති ගෘහස්ථයන් නොගෙනෙන බැවිනි:– නොහොත්: “**භින්දන් පාපකෙ අකුසලෙ ධම්මෙති භික්ඛු**” යනුවේ.

(අ) “සො ඉමං විජටයෙ ජටං” යන්නෙහි “සො භික්ඛු” යි යොදනු. ඉමිනාච සීලෙන, මේ ගාථායෙහි කී ශීලයෙන්ද; ඉමිනා ච චිත්තසීසෙන නිද්දිට්ඨසමාධිනා, මේ චිත්තමුඛයෙන් දක්වනලද සමාධියෙන් ද; ඉමාය ච තිවිධාය පඤ්ඤාය; මේ ත්‍රිවිධ ප්‍රඥයෙන්ද; ඉමිනා ච ආතාපෙනාති, මේ වීර්‍ය්‍යයෙන්දයි; ඡහි ධම්මෙහි සමන්නාගතො, මේ ෂඩ්ධර්මයෙන් සමන්විතවූ; සොභික්ඛු, ඒ භික්ෂු තෙමෙ; සෙය්‍යථාපිනාම, යම්සේ; පුරිසො, පුරුෂයෙක්; පඨවියා පතිට්ඨාය, පෘථිවියෙහි පිහිටා; සුනිසිතං සත්ථං, මනාකොට මුවහත් තබනලද ශස්ත්‍රය; උක්ඛිපිත්වා, නගාගෙන; මහන්තං වෙළුගුම්බං, මහත්වූ වෙණුගුම්බයක්; විජටෙය්‍ය, කපාද; එවමෙවං, එපරිද්දෙන්ම; සීලෙපතිට්ඨාය, ශීලයෙහි පිහිටා; සමාධිසිලාය නිසිතං,

තේනාහ භගවා:—

"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං
ආතාපී නිපකො භික්ඛු සො ඉමං විජටයෙ ජටං"ති ....

(අ) තත්‍රායං යාය පඤ්ඤාය සපඤ්ඤොති වුත්තො තත්‍රස්ස කරණීයං නත්ථි. පුරිමකම්මානුභාවෙනෙව හිස්ස සා සිද්ධා. **ආතාපීනිපකොති** එත්ථ වුත්ත විරියවසෙන පන තෙන සාතච්චකාරිනා පඤ්ඤාවසෙන ච සම්පජානකාරිනා හුත්වා සීලෙ පතිට්ඨාය චිත්තපඤ්ඤාවසෙන වුත්තා සමථවිපස්සනා භාවෙතබ්බාති. ඉමමත්‍ර භගවා සීලසමාධි පඤ්ඤාමුඛෙන විසුද්ධිමග්ගං දස්සෙති.

---

සමාධිනමැති සිලායෙහි මුවහත්තබනලද; විපස්සනා පඤ්ඤා සත්ථං, විදර්ශනාප්‍රඥානමැති ශස්ත්‍රය; විරියබලපග්ගහිතෙන, වීර්‍ය්‍ය බලයෙන් හුවනලද; පාරිහාරියපඤ්ඤාහත්ථෙන උක්ඛිපිත්වා, පාරිහාරික ප්‍රඥානමැති හස්තයෙන් නඟාගෙන; අත්තනො සන්තානෙ පතිතං, අනුසය විසින් තමා සතන්හි හුණු; සබ්බම්පි තං තණ්හාජටං, ඒ සියලු තෘෂ්ණාඅවුල, විජටෙය්‍ය, සී සේයි; සඤ්ඡින්දෙය්‍ය, කපන්නේයි; සම්පදාලෙය්‍ය, සමුච්ඡෙදවශයෙන් ප්‍රහාණය කරන්නේය යන අර්ථයි; (උපමාවෙහි "සුනිසිතංසත්ථං" යන තැන "සිලාය" යනුද; "උක්ඛිපිත්වා" යනතැන "බාහුබලෙන" යනුද්; අර්ථපර්‍ය්‍යාපන්නකොට කීහෙයින් උපමෙයයෙහි "සමාධිසිලාය නිසිතං" යනුද; විරියබල පග්ගහිතෙන පඤ්ඤාහත්ථෙන උක්ඛිපිත්වා" යනු ද කීහයි දතයුතු.) එසො, මෙතෙමෙ; මග්ගක්ඛණෙ, මාර්ගක්ෂණයෙහි; තංජටං, ඒ ජටාව; විජටෙති නාම, කපන්නේනම් වේ; ඵලක්ඛණෙ, ඵලක්ෂණයෙහි; විජටිතජටො, කපනලදජටාඇත්තේ; සදෙවකස්ස ලොකස්ස සදෙවක ලොකයාගේ; අග්ගදක්ඛිණෙය්‍යො හොති, අග්‍රදක්ෂිණාවට අර්හ වේ:–

තේනාහ භගවා, එහෙයින් වදාළහබුදුහු; සීලෙ .... පෙ .... ජටන්ති;

(අ) තත්‍ර, (තස්සං ගාථායං,) ඒ ගාථායෙහි; අයං, නරොයි භික්ඛුයි කියනලද මේ යොගාවචරතෙමෙ; යාය පඤ්ඤාය සපඤ්ඤොති වුත්තො, යම් ප්‍රඥාවකින් සපඤ්ඤයි කියන ලදද; තත්‍ර, (තස්සං පඤ්ඤායං,) ඒ ප්‍රඥායෙහි; අස්ස, මොහුවිසින්; කරණීයං නත්ථි, කටයුතුනැති; ("අස්ස" යනු, කර්තෘකාරකයෙහි ෂෂ්ඨියි. අනෙන යනු අර්ථයි.) සා, ඒ ප්‍රතිසන්ධිප්‍රඥාතොමෝ; පුබ්බකම්මානුභාවෙන, පූර්වජන්මයෙහිසිඬ කුශලකර්මානුභාවයෙන්; අස්ස, ඒයොගීහට; සිද්ධා, සිඬයි; ආතාපී නිපකො ති එත්ථ, ආතාපී නිපකො යන මෙහි; වුත්තවිරියවසෙන පන, කියනලද වීර්‍ය්‍යවශයෙන් වනාහි; තෙන, ඒ යොගීහුවිසින්; සාතච්චකාරිනා හුත්වා, සතතප්‍රවෘත්ත වීර්‍ය්‍ය ඇත්තහුවිසින්; පඤ්ඤාවසෙන පන; යථොක්ත නෛපක්කසඞ්ඛ්‍යාතප්‍රඥා වශයෙන්; සම්පජානකාරිනාහුත්වා, සියලු කර්තව්‍යයන් ඥානයෙන් කරන්නහුවිසින්;

(අ) එත්තාවතා හි තිස්සො සික්ඛා, තිවිධකල්‍යාණං සාසනං, තෙවිජ්ජතාදීනං උපනිස්සයො, අන්තද්වයවජ්ජනමජ්ඣිමපටිපත්තිසෙවනානි, අපායාදිසමතික්කමනූපායො, තීහාකාරෙහි කිලෙසප්පහාණං, වීතික්කමාදීනං පටිපක්ඛො, සංකිලෙසත්තයවිසොධනං, සොතාපන්නාදිභාවස්ස ච කාරණං, පකාසිතං හොති කථං? එත්ථ හි සීලෙන අධිසීලසික්ඛා පකාසිතා හොති, සමාධිනා අධිචිත්තසික්ඛා, පඤ්ඤාය අධිපඤ්ඤාසික්ඛා, සීලෙන ච සාසනස්ස ආදිකල්‍යාණතා පකාසිතා හොති:–

---

නොහොත්: ඒ ඒ කර්තව්‍යයෙහි ඥානය කරන්නහු විසින්; නොහොත්: ඤාණය උපදවන්නහු විසින්; "**සංඛිඤ්චි කත්තබ්බං තස්ස සබ්බස්ස සම්පජානවසෙනෙව කරණ සීලො, තත්ථ වා සම්පජානකාරෙ එතස්ස අත්ථි සම්පජානස්ස වා අසම්මොහස්ස කාරකො උප්පාදකොති සම්පජානකාරී**" යනු මෙතැන ටීකායි.) සීලෙ පතිට්ඨාය, ශීලයෙහි පිහිටා; චිත්තපඤ්ඤාවසෙන වුත්තා සමථවිපස්සනා, චිත්තප්‍රඥාවශයෙන් උක්තවූ සමථවිදර්ශනාවෝ; භාවෙතබ්බාති, වැඩියයුත්තාහ යි; "ඉමං විසුද්ධිමග්ගං"යි සම්බන්ධකරනු. අත්‍ර, මේ ගාථාවෙහි; භගවා, භගවත් තෙමෙ; සීලසමාධිපඤ්ඤාවසෙන, ශීල සමාධි ප්‍රඥාවශයෙන්; ඉමං විසුද්ධිමග්ගං දසෙසති, මේ විශුද්ධිමාර්ගය දක්වී; (වියදී ශිලාදීන්ගේ සම්පාදනයට අඞ්ගවනබැවින් වෙන නොගෙන "සීලසමාධිපඤ්ඤාමුඛෙන"යුහු.)

(අ) එත්තාවතා, මෙපමණ දෙශනාවෙන්; තිස්සො සික්ඛා, තුන් ශික්ෂාවෝද; තිවිධකල්‍යාණං සාසනං, ත්‍රිවිධවූ කල්‍යාණඇති ප්‍රතිපත්ති ශාසනයද; තෙවිජ්ජතාදීනං උපනිස්සයො, ත්‍රෛවිද්‍යභාවාදීන්ට උපනිශ්‍රයද; අන්තද්වයවජ්ජනමජ්ඣිමපටිපත්ති සෙවනානි, අන්තද්වයට නොපැමිණ මධ්‍යමප්‍රතිපත්ති සෙවනයෝද (භාවනාවෝද යන අර්ථයි); අපායාදිසමතික්කමනූපායො, අපායාදීන්ගේ සමතික්‍රමණයට උපායද; තීහාකාරෙහි කිලෙසප්පහාණං, තුන්ප්‍රකාරයෙකින් කෙලෙසුන්ගේ ප්‍රහාණියද; වීතික්කමාදීනං පටිපක්ඛො, ව්‍යතික්‍රමාදීන්ට ප්‍රතිපක්ෂද; සංකිලෙසත්තයවිසොධනං, සංක්ලෙශයන් තුන්දෙනාගේ විශොධනය ද; සොතාපන්නාදිභාවස්සකාරණං ච, ශ්‍රොතආපන්නාදි භාවයට කාරණාද; පකාසිතං හොති, ප්‍රකාශකරන ලදවේ; කථං, කෙසේදයත්; ? එත්ථ හි, ඒ ගාථාවෙහි; සීලෙන, සීලයෙන්; අධිසීලසික්ඛා පකාසිතා, අධිශීල ශික්ෂා ප්‍රකාශකරනලද්දී; (ගාථායෙහි "සීලෙ"යි සාමාන්‍යයෙන් කිවද තණ්හාජටාවිජටනයට පිහිට ශීලයම අභිමතනුයි "සීලෙන අධිසීලසික්ඛා පකාසිතා"යි කීහු:– භවගාමිශීලය ශීලනම් වෙයි. විභවගාමිශීලය අධිශීලශික්ෂා නම්වෙ. සෙසු ශික්ෂායෙහි දු මෙමනයයි.) සමාධිනා, සමාධින්; ("අධිචිත්තසික්ඛා පකාසිතා" යොදනු.) සමාධිනා අධිචිත්තසික්ඛා, සමාධියෙන් අධිචිත්තශික්ෂා තොමෝ ප්‍රකාශකරනලද්දී; පඤ්ඤාය අධිපඤ්ඤාසික්ඛා,

(අ) **කොචාදි කුසලානං ධම්මානං සීලඤ්ච සුවිසුද්ධ**න්ති හි වචනතො; **සබ්බපාපස්ස අකරණ**න්ති ආදිවචනතො ච සීලං සාසනස්ස ආදි. තඤ්ච කල්‍යාණං අවිප්පටිසාරාදි ගුණාවහත්තා;

**(ආ)** සමාධිනා මජ්ඣෙ කල්‍යාණතා පකාසිතා හොති–"කුසලස්සඋපසම්පදා"ති ආදිවචනතො හි සමාධි සාසනස්ස මජ්ඣෙ. සො ච කල්‍යාණො–ඉද්ධිවිධාදිගුණාවහත්තා; පඤ්ඤාය පරියොසානකල්‍යාණතා පකාසිතා හොති–"සචිත්තපරියොදපනං එතං බුද්ධානසාසනං"ති හි වචනතො, පඤ්ඤුත්තරතොච පඤ්ඤා සාසනස්ස පරියොසානං. සා ච කල්‍යාණා–ඉට්ඨානිට්ඨෙසු තාදිභාවාවහනතො....

---

ප්‍රඥාවෙන් අධිප්‍රඥාශික්ෂාතොමෙ ප්‍රකාශකරනලදු; සිලෙනෙව, අධිශික්ෂාවූ ශීලයෙන්; සාසනස්ස, ශාසනයාගේ; ආදිකල්‍යාණතා පකාසිතා හොති, ආදිකල්‍යාණබවය ප්‍රකාශකරනලදි; කුසලානං ධම්මානං, මාර්ගකුශලධර්මයන්ට; නොහොත්: අනවද්‍ය ධර්මයන්ට; (මෙ අර්ථයෙහි ඵලධර්මයෝද සඞ්ග්‍රහවෙත්.)

**(අ)** කොචාදි, කවරෙක්ආදිද; සීලඤ්ච සුවිසුද්ධන්ති හි වචනතො, සුවිශුද්ධ ශීලයයි වදාළබැවින්ද; සබ්බපාපස්ස අකරණන්ති, සියලු සාවද්‍යයාගේ අක්‍රියාව; (මෙම වචනයෙන් චාරිත්‍ර වාරිත්‍ර භෙදඇති සියලු ශීලයම ගැනේ; "කත්තබ්බාකරණම්පි හි සාවජ්ජමෙව"යි කීබැවින්.) ආදිවචනතො, "සබ්බපාපස්ස අකරණං" යනාදි ගාථාවෙහි කී සමාධිප්‍රඥාවන්ට ආදියෙහි කීබැවින්; ("ආදිමහිවචනතො"යි කීවෙත් – ආදිබවද උත්තරිමනුෂ්‍යධර්මයන් නතමූලක බැවිනි. නොහොත්: **"ආදීනං වචනං ආදිවචනං"** යි ගෙන ආදිග්‍රහණින් "සීලංසමාධි පඤ්ඤා ච විමුත්ති ච අනුත්තරා" යනාදීන්ගේ සඞ්ග්‍රහ දතයුතු.) **සීලං සාසනස්ස** ආදි, ශීලය ශාසනයට ආදියි; තඤ්ච, හෙද; කල්‍යාණං, **කලණයි**; අවිප්පටිසාරාදිගුණාවහත්තා, ශීලයෙන් විප්‍රතිසාර හෙතුන්ගේ දූරීභාවයෙන් අවිප්‍රතිසාරාදිගුණඑළවන හෙයිනි:–

**(ආ)** සමාධිනා, අධිචිත්තශික්ෂාඛ්‍ය සමාධිහු විසින්; මජ්ඣෙකල්‍යාණතා, මධ්‍යයෙහි කලණබව; පකාසිතාහොති, ප්‍රකාශකරනලදි; කුසලස්ස උපසම්පදාති වචනතො, තමා සතන්හි සමාධිහු ඉපදවීමයයි කීබැවින්; (සියලු ශාසනය සඞ්ග්‍රහකොට ගෙන ප්‍රවෘත්ත ගාථායෙහි ආදිපෙදෙන් ආදියෙහි පිළිපැද්දයුතු ශීලය ද තුන්වන පෙදෙන් පර්‍යවසානයෙහි පිළිපැද්දයුතු ප්‍රඥාව ද ගෘහීත බැවින් පාරිශෙෂ්‍යයෙන් මධ්‍යයෙහි පිළිපැද්දයුතු සමාධිහු දෙවන පෙදෙන් ගෘහීතවන බැවින් "කුසලස්සඋපසම්පදාති ආදි වචනතොහි සමාධි සාසනස්ස මජ්ඣෙ"යි කීහ. කුශලශබ්දය සමාධිපර්‍යායහෙයින් නොවෙයි දතයුතු.) සොච, ඒ සමාධියද; කල්‍යාණො, කල්‍යාණය; ඉද්ධිවිධාදි ගුණාවහත්තා, ඍද්ධිවිධදිව්‍යශ්‍රොත්‍රාදි ගුණඑළවන හෙයිනි; (සමාහිතතාදි අෂ්ටාඞ්ගසමන්නාගමනයෙන් සිත්හු අභිනීහාරක්ෂමකළ කල පූර්වොපනිශ්‍රය ඇත්තාහට සමාධිය ඍද්ධිවිධාදිගුණාවහබව වෙ.)

11. "සෙලො යථා එකඝනො වාතෙන න සමීරති
එවං නින්දාපසංසාසු න සමිඤ්ජන්ති පණ්ඩිතා"ති'හි වුත්තං.

(අ) තථා සීලෙන තෙවිජ්ජතාය උපනිස්සයො පකාසිතො හොති. සීලසම්පත්තිං හි නිස්සාය තිස්සො විජ්ජා පාපුණාති, න තතො පරං;-

පඤ්ඤාය, අධිප්‍රඥා ශික්ෂාවූ ප්‍රඥායෙන්; පරියොසානකල්‍යාණතා, පර්‍ය්‍යවසාන කල්‍යාණබව; පකාසිතා හොති, ප්‍රකාශ කරන ලදූ; සචිත්ත පරියොදපනං, තමාසිත හැමපරිද්දෙන් කෙලෙසුන් කෙරෙන් පිරිසුදුකිරීමය යන; එතං, මේ; බුද්ධානසාසනං, බුදුන්ගේ අනුශාසනායයි; වචනතොහි, වදාළබැවින්ද; පඤ්ඤුත්තරතොච,[1] ප්‍රඥාවම කෙළවරකොට ඇතිබැවින්ද; පඤ්ඤා සාසනස්ස පරියොසානං, ප්‍රඥා තොමෝ ශාසනයාගේ පර්‍ය්‍යවසානයි; (අග්‍රමාර්ගප්‍රඥාව අධිගතකල්හි ප්‍රව්‍රජ්‍යාකෘත්‍යපරිනිෂ්ඨිතවේනුයි ප්‍රඥා ශාසනයාගේ පර්‍ය්‍යවසාන නමූ; මෙම වදාළහ. "සික්ඛානිසංසමිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති සතාධිපතෙය්‍යං පඤ්ඤුත්තරං විමුත්තිසාරං"යි ප්‍රඥා කෘත්‍යය මස්තකප්‍රාප්තකල්හි මත්තෙහි කටයුත්තක් නැතිබැවින් ශාසනයාගේ ප්‍රඥොත්තරතාව දතයුතු.) සාච, ඒ ප්‍රඥාද; කල්‍යාණං, කලණයි; ඉට්ඨානිට්ඨෙසු තාදීභාවාවහනතො, ඉෂ්ටානිෂ්ටදෙක්හි තාදිබව (එක්වැනිබව අනුනය ප්‍රතිඝ නැතිබව) එළවනහෙයිනි; (මෙම කීහ. "යාදිසො ඉට්ඨෙසු ලාභාදීසු ච අනුනයාභාවතො තාදිසො අනිට්ඨෙසු අලාභාදීසු ච පටිඝාභාවතො, තතො එව වා යාදිසො අනාපාථගතෙසු ඉට්ඨානිට්ඨෙසු තාදිසො ආපාථගතෙසු ඨිති තාදී, තස්ස භාවො තාදිභාවො, තස්ස ආවහනතො"යි.)

11. යථා, යම්සේ; එකඝනොසෙලො, එකඝනවූ ශෛලය; වාතෙන න සමීරති, වාතයෙන් නොසැලේද; එවං, මෙසේ; නින්දාපසංසාසු, නින්දාප්‍රශංසාවෙහි; පණ්ඩිතා, පණ්ඩිතවරහු; (රහත්හු;) න සමිඤ්ජන්ති, නොසැලෙතියි;-වුත්තංහි, වදාළේමැයි.

(අ)("යථා සීලාදයො අධිසීලසික්ඛාදීනං පකාසකා තථා තෙවිජ්ජතාදීනං උපනිස්සයස්ස පකාසකා"යනු තථාශබ්දයාගේ අර්ථයි.) සීලෙන තෙවිජ්ජතාය උපනිස්සයො පකාසිතො හොති, ශීලයෙන් ත්‍රෛවිද්‍යබවට උපනිශ්‍රය ප්‍රකාශකරනලදි; සීලසම්පත්තිං හි නිස්සාය, ශීලසම්පත්තිය නිසා; තිස්සො විජ්ජා පාපුණාති, ත්‍රිවිද්‍යාබවට පැමිණේ; න තතොපරං, ත්‍රිවිද්‍යාවෙන් මතු අභිඥා පටිසම්භිදාවන්ට උපනිශ්‍රය නොවෙ; (සමාධි ප්‍රඥාවන්ට මෙන් අභිඥාපටිසම්භිදාවන්ට ශීලය සභාගහෙතු නොවන බැවින් ශීලසම්පත්තියෙන් විද්‍යාත්‍රය සම්පත්තිය කෙසේ වෙයි යත්? යම්හෙයකින් ශීලය පරිශුද්ධවන්නේ සතිසම්පජඤ්ඤ බලයෙනුදු කම්මස්සකතාඥානබලයෙනුදු සංක්ලේශ මලයෙන් විශුද්ධවෙයි. පරිපූර්ණබවට ද යෙයි. එහෙයින් ශීල සම්පත්ති සිද්ධවන්නී

1 ඤාණුත්තරතො ච, ඤාණයාම කෙළවරකොටඇති බැවින්ද-ඇතැම්.

(ඇ)සමාධිනා ඡළභිඤ්ඤතාය උපනිස්සයො පකාසිතො හොති–සමාධිසම්පදං හි නිස්සාය ඡ අභිඤ්ඤා පාපුණාති, න තතො පරං; පඤ්ඤාය පටිසම්භිදාප්පභෙදස්ස උපනිස්සයො පකාසිතො හොති, පඤ්ඤාසම්පත්තිං හි නිස්සාය චතස්සො පටිසම්භිදා පාපුණාති, නාඤ්ඤෙන කාරණෙන;

---

උපනිශ්‍රයසම්පත්ති බැවින් සතිබල ඤාණබල දෙදෙන එළවානුයි ශීලසම්පත්තියගේ විද්‍යාත්‍රයට උපනිශ්‍රයබව වෙදිතව්‍යයි. ස්මෘති බලයෙන් වනාහි පූර්වේනිවාසානුස්මෘතිවිද්‍යාසිද්ධිය වෙයි.

සම්පජඤ්ඤයෙන් සියලුකෘත්‍යයෙහි සූදෘෂ්ටකාරිතාපරිචයෙන් චුත්‍යූපපාතඥානානුබද්ධ දිව්‍යචක්‍ෂුර්විද්‍යාසිද්ධිය වෙයි. ව්‍යතික්‍රමාභාව යෙන් සංක්ලෙශ ප්‍රහාණය සම්භව වන හෙයින් විවර්තෝපනිශ්‍රයතා වශයෙන් වන අධ්‍යාශයශුද්ධීන් ආශ්‍රවක්‍ෂයවිද්‍යාසිද්ධියවෙයි–පූර්වේ සිද්ධ සමාධි ප්‍රඥාවන්ගේ පාරිපූරියක් නැතිවම ශීලය ආශ්‍රවක්‍ෂය ඥානයට උපනිශ්‍රය බව ශුෂ්කවිදර්ශක ක්‍ෂීණාශ්‍රවයන් විසින් හැඟවියයුතු:– මෙසේ සභාග හෙතු සම්ප්‍රදානයෙන් ශීලය ත්‍රිවිද්‍යාවට උපනිශ්‍රය වෙයි දත්තේ.)

(ඇ)සමාධිනා, සමාධියෙන්; ඡළභිඤ්ඤතාය උපනිස්සයො පකාසිතො හොති, ෂඩභිඥාවට උපනිශ්‍රය ප්‍රකාශකරනලදි; සමාධිසම්පදං නිස්සාය, සමාධි සම්පත්තිය නිසා; ඡ අභිඤ්ඤා පාපුණාති, ෂට් අභිඥාවන්ට පැමිණේ;("සමාහිතො යථාභූතං පජානාති"යි කීබැවින් සමාධිසම්පදාව ෂඩභිඥාවට උපනිශ්‍රය වෙ.) නතතොපරං; (ප්‍රඥායෙන් පටිසම්භිදාවන්ට සමාධීහු සභාගහෙතු නොවන්නෙන්) අභිඥාවෙන් මතු පටිසම්භිදා නොවෙ; පඤ්ඤාය පටිසම්භිදාප්පභෙදස්ස උපනිස්සයො පකාසිතො හොති, ප්‍රඥාවෙන් ප්‍රතිසංවිත්ප්‍රභෙදයට උපනිශ්‍රය ප්‍රකාශිත වෙ; පඤ්ඤාසම්පත්තිං නිස්සාය, ප්‍රඥාසම්පත්තිය නිසා; චතස්සොපටිසම්භිදා පාපුණාති, සිවුපිළිසිඹියාවට පැමිණේ; න අඤ්ඤෙන කාරණෙන, අනික් කාරණයෙකින් නොවේ.

("යොගා වෙ ජායතී භූරී"යි කී බැවින් පූර්වයොගය ගරුවාසය දෙශභාෂාකෞශල්‍යය උද්ග්‍රහය පරිපෘච්ඡාය යනාදීන් පරිභාවිතවූ ප්‍රඥාසම්පත්ති තොමො පිළිසිඹියා භෙදයට උපනිශ්‍රය වෙයි. ප්‍රත්‍යෙක බොධි සම්‍යක්සම්බොධීහු දු ප්‍රඥාසම්පත්තිය නිසා වන බැවින් ප්‍රඥාවේන් අනධිගන්තව්‍ය විශෙෂයක් නැති බැවින් ද ප්‍රඥාව ද පටිසම්භිදා භෙදයට එකාන්ත කාරණ බැවිනු දු යටමෙන් "න තතොපරං" යි නොකියා "න අඤ්ඤෙන කාරණෙන"යි කීහු. "සීලසම්පත්තිං නිස්සාය"යි කීබැවින් සමාධි විජෘම්භමානවූ බැවින් නිරවශෙෂවූ ෂඩභිඥාවො යමක්හට සිද්ධනොවෙද්ද ඕහට උත්කෘෂ්ට පරිච්ඡෙද වශයෙන් සමාධි සම්පත්තිය නැත්නුයි ත්‍රිවිද්‍යාවන්ගේ අභිඥෙකදෙශ

(අ) සීලෙනච කාමසුඛානුයොගසඞ්ඛාතස්ස අන්තස්ස වජ්ජනං
පකාසිතං හොති, සමාධිනා අත්තකිලමථානුයොගසඞ්ඛාතස්ස,
පඤ්ඤාය මජ්ඣිමාය පටිපත්තියා සෙවනං පකාසිතං හොති; තථා
සීලෙන අපායසමතික්කමනුපායො පකාසිතො හොති, සමාධිනා
කාමධාතුසමතික්කමනුපායො, පඤ්ඤාය සබ්බභවසමතික්කමනුපායො;
(ආ) සීලෙන ච තදඞ්ගප්පහාණවසෙන කිලෙසප්පහාණං පකාසිතං
හොති, සමාධිනා වික්ඛම්භනප්පහාණවසෙන, පඤ්ඤාය සමුච්ඡෙදප්ප

---

හාවයක් ඇතද ශීල සම්පත්තිසමුද්ගතවූ ත්‍රිවිද්‍යාවෝම වෙතියි දතයුත්
තාහුයි-කියේමැයි “පඤ්ඤා සම්පත්ති සමුදාගතා චතස්සොපටිසම්භිදා
උපනිස්සයසම්පන්නස්ස මග්ගෙනෙව ඉජ්ඣන්ති මග්ගක්ඛණෙ එව
තාසං පටිලභිතබ්බතො එවං සීලසම්පත්තිසමුදාගතා තිස්සොවිජ්ජා
සමාධි සම්පත්තිසමුදාගතා ච ඡළභිඤ්ඤා උපනිස්සයසම්පන්නස්ස
මග්ගෙනෙව ඉජ්ඣන්තී ති මග්ගාධිගමෙනෙව තාසං අධිගමො
වෙදිතබ්බො. පච්චෙකබුද්ධානං සම්මාසම්බුද්ධානඤ්ච පච්චෙකබොධි
සම්මාසම්බොධිසමධිගමසදිසා හි ඉමෙසං අරියානං ඉමෙ විසෙසා
ධිගමා”යි විනය සූත්‍රාභිධර්මයෙහි සම්‍යක් ප්‍රතිපත්තීන් ත්‍රෛවිද්‍ය
තාදීන්ට උපනිශ්‍රයතාව ද යථොක්ත විධීන් ම වෙදිතව්‍යයි.)

(අ) සීලෙන ච කාමසුඛානුයොගසඞ්ඛාතස්ස අන්තස්ස වජ්ජනං,
(සම්පන්නශීලයහට කාමසෙවා නැතිබැවින්) ශීලයෙන් කාමසුඛයෙහි
ඇලීමය යන අන්තයාගෙ වර්ජනය පහළකරනලදි; සමාධිනා අත්තකිල
මථානුයොගසඞ්ඛාතස්ස, (ධ්‍යානසුඛලාභීහට ධ්‍යානයෙන් උපන්
ප්‍රණීතරූපයෙන් පැතිරෙනලද කායඇතිබැවින් කායකලමථුසම්භව
යම නැත්නුයි) සමාධියෙන් කායකලමථුයෙහි යෙදීමය යන අන්ත
යාගෙ වර්ජනය පහළකරනලදි; පඤ්ඤාය මජ්ඣිමායපටිපත්තියා
සෙවනං, ප්‍රඥාවෙන් මධ්‍යමප්‍රතිපත්තිසෙවනය පහළකරනලදි;
(උත්කෘෂ්ට නිර්දේශයෙන් එකාන්තයෙන් ආර්‍ය්‍යමාර්ගයම මධ්‍යම
ප්‍රතිපත්ති නමැයි “පඤ්ඤා”ය යි මාර්ගප්‍රඥාවම ගතයුතුය, එතකුදු
වුවත් ලෞකිකප්‍රඥාවශයෙනුදු අන්තවයවර්ජනය පහළ කටයුතු.)
සීලෙන අපායසමතික්කමනුපායො, සිල්වත්හු සුගතියෙහි ම උපදනා
බැවින් ශීලයෙන් අපාය ඉක්මීමට උපාය පහළකරනලදි; (ශීල සමා
ධීන් අතික්‍රාන්තවූ කාමාදිභවයො කාරණය අප්‍රහීණහෙයින් අනති
ක්‍රාන්ත ම නම් වෙති;-ප්‍රඥායෙන් වනාහි සුප්‍රහීණ හෙයින් අතික්‍රාන්ත
නම් වෙත්නුයි “පඤ්ඤාය සබ්බභවසමතික්කමනුපායො”යි කීහු.) සමා
ධිනා කාමධාතුසමතික්කමනුපායො, ධ්‍යානලාභීහු මහද්ගතභූමි
යෙහි ම උපදනා බැවින් සමාධීන් කාමභව සමතික්‍රමයට උපාය
පහළකරනලදි; පඤ්ඤාය සබ්බභවසමතික්කමනුපායො, ප්‍රඥාවෙන්
කාමභවාදි නවභවයන්ගේ සමතික්‍රමණයට උපාය පහළකරනලදී;

(ආ) සීලෙනච, ශීලයෙන් ද; තදඞ්ගප්පහාණවසෙන, දීපාලොකයෙන්
අන්ධකාරයක් මෙන් “පාණාතිපාතා වෙරමණී” ආදී ඒ ඒ කුශලාඞ්ග

හාණවසෙන; තථා සීලෙන කිලෙසානං වීතික්කමපටිපක්ඛො පකාසිතො හොති, සමාධිනා පරියුට්ඨානපටිපක්ඛො, පඤ්ඤාය අනුසය පටිපක්ඛො; සීලෙන ච දුච්චරිතසඞ්කිලෙසවිසොධනං පකාසිතං හොති, සමාධිනා තණ්හාසඞ්කිලෙසවිසොධනං, පඤ්ඤාය දිට්ඨිසඞ්කිලෙසවිසොධනං;

---

යෙන් පාණාතිපාතාදි ඒ ඒ කුසලාඞ්ගයන්ගේ ප්‍රහාණ විසින්; කිලෙසප්පහාණං පකාසිතං හොති, ක්ලෙශයන්ගේ ප්‍රහාණය පහළ කරන ලදී; (**"දීපාලොකෙ නෙව[1] තමස්ස පුඤ්ඤකිරියවත්ථුකෙන තෙන තෙන කුසලඞ්ගෙන තස්ස තස්ස අකුසලඞ්ගස්ස පහාණං තදඞ්ගප්පහාණං"**යි ) සමාධිනා වික්ඛම්භනප්පහාණවසෙන, උපචාරාර්පණභෙද සමාධීහු විසින් (ප්‍රවෘත්තිනිවාරණය කරනබැවින් ඝටප්‍රහාරයෙන් ජලතලයෙහි ශෛවාලයන් මෙන්) ඒ ඒ නීවරණධර්මයන්ගේ විෂ්කම්භණප්‍රහාණවශයෙන් ක්ලෙශප්‍රහාණය ප්‍රකාශිතවෙ; පඤ්ඤාය සමුච්ඡෙදප්පහාණවසෙන, ආර්යමාර්ගප්‍රඥාවෙන් සමුදයපාක්ෂික ක්ලෙශ ගණයාගේ[2] අත්‍යන්ත අප්‍රවෘත්ති සඞ්ඛ්‍යාත සමුච්ඡෙදප්‍රහාණ වශයෙන් ක්ලෙශප්‍රහාණය ප්‍රකාශිතවෙ; තථා; එසේම; කිලෙසානං වීතික්කමපටිපක්ඛො, සංක්ලෙශධර්මයන්ගෙ කර්මක්ලෙශයන්ගෙ හෝ කායවාග්ද්වාරයෙහි ව්‍යතික්‍රම සඞ්ඛ්‍යාත අධ්‍යාචාරයට ප්‍රතිපක්ෂයා; සීලෙන පකාසිතො හොති, ශීලය අව්‍යතික්‍රමස්වභාව බැවින් ශීලයෙන් ප්‍රකාශිතවෙ; සමාධිනා පරියුට්ඨාන පටිපක්ඛො, (කුසලොත්පත්තියට අවකාශ නොදී සිත්හි වැළඳගෙන කෙලෙසුන්ගෙ සිටීම පර්‍යුත්ථාන නම් වෙයි.) ඒ පර්‍යුත්ථානයට ප්‍රතිපක්ෂයා සමාධීහු පර්‍යුත්ථානප්‍රහායක බැවින් සමාධීන් ප්‍රකාශිතවෙ; පඤ්ඤාය අනුසයපටිපක්ඛො, (අප්‍රහීනභාවයෙන් සන්තානානුගතවූ අනුරූපකාරණලාභයෙහි උත්පත්තියට අභිමුඛ ස්ථාමගතකාමරාගාදි) සප්තානුශය ක්ලෙශයන්ට ප්‍රතිපක්ෂයා ප්‍රඥාවෙන් ප්‍රකාශවෙ; (ආර්යමාර්ගඥානය අනුශය ප්‍රහායක බැවින්.) දුච්චරිතසංකිලෙස විසොධනං, කායදුශ්චරිතාදි දුශ්චරිත සංක්ලෙශයාගේ තදඞ්ගප්‍රහාණ සඞ්ඛ්‍යාත විශොධනය; සීලෙන පකාසිතං හොති, ශීලයෙන් ප්‍රකාශිතවෙ; ශීලයා ව්‍යතික්‍රම ප්‍රතිපක්ෂබැවිනි. **දුච්චරිතමෙව සත්තානං සංකිලෙසති විබාධයති[3] උපතාපෙති වාති සංකිලෙසො** යනුවෙ.) සමධිනා තණ්හා සඞ්කිලෙස විසොධනං, තෘෂ්ණාසංක්ලෙශයන්ගේ විෂ්කම්භණප්‍රහාණසඞ්ඛ්‍යාත විශොධනය සමාධීන් ප්‍රකාශිතවෙ; (සමාධිහු පර්‍යුත්ථාන ප්‍රතිපක්ෂ බැවින්; තෘෂ්ණාවට ද සමාධීහු සෘජු ප්‍රතිපක්ෂ බැවින්;) පඤ්ඤාය දිට්ඨිසඞ්කිලෙසවිසොධනං, දෘෂ්ටිසංක්ලශයාගෙ සමුච්ඡෙද ප්‍රහාණ සඞ්ඛ්‍යාත විශොධනය ප්‍රඥාවෙන් ප්‍රකාශිත වේ; (ප්‍රඥාව අනුශය ප්‍රතිපක්ෂ බැවින්; අයාථාවද්ග්‍රාහිදෘෂ්ටිගතයනට යාථාවද්ග්‍රාහිණීප්‍රඥාවද සෘජු ප්‍රතිපක්ෂබැවින්.)

---

1 ආලොකෙනෙව-මු. ස. 2. ගහණයාගේ-ඇතැම්. 3 කිලෙසති බාධති-ඇතැම්.

(අ) තථා සීලෙන සොතාපන්නසකදාගාමිභාවස්ස කාරණං පකාසිතං හොති, සමාධිනා අනාගාමිභාවස්ස, පඤ්ඤාය අරහත්තස්ස–සොතාපන්නො හි සීලෙසු පරිපූරකාරී ති වුත්තො, තථා සකදාගාමී–අනාගාමී පන සමාධිස්මිං පරිපූරකාරී, අරහා පන පඤ්ඤාය පරිපූරකාරීති.

(ආ) එවං එත්තාවතා තිස්සො සික්ඛා, තිවිධකල්‍යාණං සාසනං, තෙවිජ්ජාදීනං උපනිස්සයො, අන්තද්වයවජ්ජනමජ්ඣිමපටිපත්තිසෙවනානි, අපායාදි සමතික්කමනුපායො, තීහාකාරෙහි කිලෙසප්පහාණං, වීතික්කමාදීනං පටිපක්ඛො, සංකිලෙසත්තයවිසොධනං, සොතාපන්නාදිභාවස්ස ච කාරණන්ති ඉමෙ නව, අඤ්ඤෙ ච එවරූපා ගුණත්තිකා පකාසිතා හොන්ති.

---

(අ) සීලෙන, සීලයෙන්; සොතාපන්නසකදාගාමිභාවස්ස කාරණං, සෝවාන්සෙදගැමිබවට උපනිශ්‍රය ප්‍රත්‍යයාඛ්‍ය කාරණය ප්‍රකාශිතවෙ; සමාධිනා, සමාධියෙන්; අනාගාමිභාවස්ස, අනාගාමිබවට කාරණය ප්‍රකාශිතවෙ; සොතාපන්නොහි, සෝවාන් තෙමෙ; සීලෙසු පරිපූරකාරී, (මාර්ගබ්‍රහ්මචය්‍ර්‍යාවට ආදිහෙයින් ආදිබ්‍රහ්මචරියකනම්වූ පාරාජිකා සංඝාදිසෙසසඞ්ඛ්‍යාත මහාශීලශික්‍ෂාපදයන්ගෙ අව්‍යතික්‍රමයෙන්ද ක්‍ෂුද්‍රානුක්‍ෂුද්‍රශික්‍ෂාපදයන් ඉක්මීමෙන් අවන් ආපත්තීන් වහා නැගීමෙන්ද) ශීලයෙහි සමාප්තකාරීවෙ; තථා සකදාගාමී, සකෘදාගාමී ද එසේම ශීලයෙහි සමාප්තකාරීවේ:– (මේ ආය්‍ර්‍යයෝ දෙදෙන වනාහි සමාධි ප්‍රතිපක්‍ෂවූ කාමරාග ව්‍යාපාදයන් ද ප්‍රඥාප්‍රතිපක්‍ෂවූ සත්‍යච්ඡාදක මොහය ද සර්‍වාකාරයෙන් නොපැහූබැවින් සමාධි ප්‍රඥා දෙදෙන වඩන්නාහු ද සමාධිප්‍රඥාවෙහි කර්‍තව්‍යය පමණින් ප්‍රදෙශමාත්‍රයක්ම කරනබැවින් සමාධියෙහි ප්‍රඥාවෙහි මාත්‍රකාරීහ සීලයෙහි පරිපූර කාරීහයි කියනලැබෙත්.) අනාගාමීපන, අනාගාමීවනාහි; සමාධිස්මිං පරිපූරකාරී, කාමරාගව්‍යාපාදයන් සමුච්ඡින්නබැවින් සමාධියෙහි සමාප්තකාරීවෙ; (සත්‍යයෙහි ශුෂ්ක විදර්ශකයාද මරණසමයෙහි දු ක්‍ෂණිකධ්‍යාන ප්‍රතිලාභයට සමර්ථඇතිබැවින් අනාගාමි සමාධියෙහි පරිපූරකාරී නම්යි කීහු.) අරහා පඤ්ඤාය පරිපූරකාරී, රහත්තෙමෙ සර්වාකාරයෙන් සම්මොහය සමුච්ඡෙදය කළබැවින් ප්‍රඥාවෙහි පරිපූරකාරීවේ;

(ආ) (එවං යනාදි නිගමනයෙහි අර්ථ යට කී නයින්ම දතයුතු) ඉමෙනව, මේ ත්‍රිකයෝ නව දෙනද; අඤ්ඤෙ ච එවරූපා ගුණත්තිකා, සෙසු මෙබඳුවූ (**තයො විවෙකා, තීණි කුසලමූලානි, තීණි විමොක්ඛමුඛානි තීණින්ද්‍රියානි,** යනාදි) ගුණත්‍රිකයෝ; පකාසිතා හොන්ති, ප්‍රකාශිතවෙත්; (එත්තාවතා පකාසිතාහොන්ති"යි යොදනු. "සීලෙන කායවිවෙකො පකාසිතො හොති, සමාධිනා චිත්තවිවෙකො, පඤ්ඤාය උපධිවිවෙකො" යනාදි ත්‍රිකයන් යොජනාකරනු.

—)✦(—

(අ) එවං අනෙකගුණසඞ්ගාහකෙන සීලසමාධිපඤ්ඤාමුඛෙන දෙසිතො පි පනෙස විසුද්ධිමග්ගො අතිසඞ්ඛෙපදෙසිතොයෙව හොති. තස්මා නාලං සබ්බෙසං උපකාරායාති විත්ථාරමස්ස දස්සෙතුං සීලං තාව ආරබ්භ ඉදං පඤ්හකම්මං හොති.

(ආ) කිං සීලං? කෙනට්ඨෙන සීලං? කානස්ස ලක්ඛණරසපච්චුපට්ඨාන පදට්ඨානානි? කිමානිසංසං සීලං? කතිවිධඤ්චෙතං සීලං? කො චස්ස සඞ්කිලෙසො? කිං වොදානන්ති? තත්‍රිදං විස්සජ්ජනං-

(ඉ) **කිං සීලන්ති** පාණාතිපාතාදීහි වා විරමන්තස්ස වත්තපටිවත්තං වා පූරෙන්තස්ස චෙතනාදයො ධම්මා. වුත්තං හෙතං පටිසම්භිදායං "කිං සීලන්ති චෙතනා සීලං චෙතසිකං සීලං සංවරො සීලං අවීතික්කමො සීලන්ති" තත්‍ර **චෙතනාසීලං** නාම පාණාතිපාතාදීහි වා විරමන්තස්ස වත්තපටිවත්තං වා පූරෙන්තස්ස චෙතනා; **චෙතසිකං සීලං** නාම, පාණාතිපාතාදීහි විරමන්තස්ස විරති:-

---

(අ) එවං, මේ උක්තප්‍රකාරයෙන්; අනෙකගුණසඞ්ගාහකෙන; අධිශීල ශික්ෂා ආදිවූද සෙසුද අනෙකගුණයෙන් සඞ්ග්‍රහකොට සිටි; සීල සමාධි පඤ්ඤාමුඛෙන, ("සබ්බෙ සඞ්ඛාරා අනිච්චා" යනාදියෙහි මෙන් විදර්ශනාමාත්‍රාදිමුඛයෙන් සඞ්ක්ෂෙපයෙන් නොදෙසා) ශීලසමාධි ප්‍රඥාමුඛයෙන්; දෙසිතොපි පනෙස විසුද්ධිමග්ගො, දෙසිතවූ මේ විශුද්ධි මාර්ගය; අතිසඞ්ඛෙපදෙසිතො යෙව, ස්වභාව විභාග විසින් නොදෙසූ බැවින් අතිසංක්ෂෙප දෙසිතම වේනුයි; සබ්බෙසං උපකාරාය නාලම්ති, සඞ්ක්ෂිප්තරුචි උද්ඝටිතඥයන් විනා නාතිසංක්ෂිප්ත විස්තර රුචීන් වද විපඤ්චිතඥයන්ට ද උපකාරයට අසමර්ථනුයි; අස්ස විත්ථාරං දස්සෙතුං, මේ විශුද්ධිමාර්ගයාගේ විස්තරය දක්වනුපිණිස; සීලංතාව ආරබ්භ, (සමාධි ප්‍රඥාවන්තබා) පළමුකොට ශීලය අරභයා; ඉදංපඤ්හ කම්මං හොති, මේ ප්‍රශ්නකර්මය වේ;-

(ආ) කිං සීලං, ස්වරූප විසින් සිල්නම් කිම; කෙනට්ඨෙන සීලං, කවර නම් අර්ථයෙන් සිල් නම් ද; අස්ස, මෙ ශීලයාගේ; ලක්ඛණ රසපච්චු පට්ඨානපදට්ඨානානි කානි, ස්වභාවය කෘත්‍යය වැටහෙනආකාරය ආසන්නකාරණය යන මොහු කවරහ; සීලං, ශීලය; කිමානිසංසං, කුමක් අනුසස්කොට ඇත්තේද; එතං සීලං, මේ ශීලය; කතිවිධඤ්ච, කතිප්‍රකාරවේ ද; කො චස්ස සංකිලෙසො; මේ ශීලයට කිලුටුකිම; කිං වොදානං, පිරිසුදු කිම යත්;? තත්‍ර, ඒ ප්‍රශ්නකර්මයෙහි; ඉදං, මෙ; විස්සජ්ජනං, විවරණයි; (නොහොත්: තත්‍ර, සී සේයි. "තස්ස පඤ්හස්ස, යන අර්ථයි.)

(ඉ) පාණාතිපාතාදීහි වා විරමන්තස්ස, ප්‍රාණවධාදි දෞශ්ශීල්‍ය කර්මයෙන් හෝ සමාදානවිරති සම්ප්‍රාප්තවිරතිවශයෙන් වළක්නහු ගේද; වත්තපටිවත්තං වා පූරෙන්තස්ස, උපාධ්‍යායවත් ආදි වතැයි කියනලද පිළිවෙත් පුරන්නහුගේ හෝ; චෙතනාදයොධම්මා,

(අ) අපිච චෙතනාසීලං නාම, පාණාතිපාතාදීනි පජහන්තස්ස සත්තකම්මපථචෙතනා; චෙතසිකංසීලං නාම, "අභිජ්ඣං පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරතී"ති ආදිනා නයෙන වුත්තා අනභිජ්ඣා අව්‍යාපාදසම්මාදිට්ඨි ධම්මා; **සංවරො සීල**න්ති එත්ථ

---

චෙතනාදි ධර්මයෝසී;-("චෙතනාදයොධම්මා"සී සඞ්ක්ෂෙපයෙන් කියනලද අර්ථය පාළි විසින් විභාගකොට දක්වන පිණිස "වුත්තං හෙතං" යනාදි කියනලදි.) පටිසම්භිදායං, පිළිසිඹියායෙහි; එතං, මෙ; වුත්තං, කියනලදි; කිංසීලන්ති, සීල නම් කිම්යදයත්;? චෙතනා සීලං, චෙතනා ශීලය; චෙතසිකං සීලං, චෛතසිකශීලය; සංවරොසීලං, සංවරශීලය; අවීතික්කමොසීලන්ති, අව්‍යතික්‍රමශීලයයි; (මිහි චෙතනාවට චෛතසිකත්වය ඇතද "චෙතනාසීලං"සී වෙනගත් හෙයින් ගොබලිවද්දන්‍යායයෙන් විරති අනභිධ්‍යාදි ශීලයම චෙතනා ශීල නම්වෙසි දතයුතු.) තත්‍ර, ඒ චතුර්විධශීලයෙහි; චෙතනාසීලං නාම, චෙතනාශීල නම්; "පාණාතිපාතාදීහිවා විරමන්තස්ස චෙතනා"සි, විරතියුක්ත ප්‍රධාන චෙතනාවකීහ; "වත්තපටිවත්තංවා පූරෙන්තස්ස චෙතනා"සි, වත් පිළිවෙත් කරන් චෙතනාවකීහු;-"චෙතසිකං සීලං" නාම පාණාතිපාතාදීහි විරමන්තස්ස විරති"සි, විරතියගේ ප්‍රධාන බව ගෙන කීහු; (විරති නොළපයා සමාදන්වන්නහු විසිනුදු කුඩා දරුවන් මෙන් කිසිවක් නොදන සිල්ගන්නහුවිසිනුදු අකුශලචෙතනාවට කුසලචෙතනාවම ප්‍රතිපක්ෂබැවින් චෙතනාවම කීහ;-විරති ඇති හෙතුචෙතනා චෙනම කර්මපථබැවීන් චෙතනාවම කීහ යනු සන්‍යයි; යම්කලෙක "තිවිධා භික්ඛවෙ කායසඤ්චෙතනා කුසලං කායකම්මං" යනාදි වදළ බැවින් ප්‍රාණාතිපාතාදීන්ට ප්‍රතිපක්ෂවූ තවිරතිවිශිෂ්ටචෙතනා ම ප්‍රධානභාවයෙන් ප්‍රාණාතිපාතාදීන් කෙරෙන් විරතිය සාධාද එකල තත්සම්ප්‍රයුක්ත විරති අනභිධ්‍යාදීහු චෙතනාපාක්ෂික හෝ අව්‍යවහාරික හෝ වෙතියි; මෙ අර්ථය හඟවනු සඳහා "චෙතනාසීලං"සි කීහ:-යම්කලෙක වනාහි ප්‍රාණාති පාතාදීන් කෙරෙන් සඞ්කාචයට පැමිණෙන්නාහට එසින් විරමණාකාරයෙන් පවත්වන්නාවූ චෙතනා විශිෂ්ට විරතිද, අන භිධ්‍යාදි ධර්මයෝද ඒ ඒ තැන්හි ප්‍රධාන බැවින් කෘත්‍යසාධකයෝ වෙද්ද එකල්හි චෙතනාතොමෝ විරති ආදි පාක්ෂික හෝ වෙති. අව්‍යවහාරික හෝ වෙතියි යන මෙ අර්ථය සඳහා "චෙතසිකංසීලං" යනු කීහ; ටීකානයයි.—දූන් සූත්‍රයෙහි ආනායින් දශකුශල කර්මපථ වශයෙන් චෙතනාචෙතසිකශීලයන් විභාගකොට දක්වන පිණිස "අපි ච" යනාදි කීහු.)

(අ) අපිච, අනිකෙකුදු ඇති; පාණාතිපාතාදීනි පජහන්තස්ස, (සමාදාන වශයෙනුදු සම්ප්‍රාප්තවස්තුව අනධ්‍යාචරණ වශයෙනුදු) ප්‍රාණවධාදීන් දුරුකරන්නහුගේ; සත්තකම්මපථචෙතනා, පිළිවෙළින් සපත

පඤ්චවිධෙන සංවරො වෙදිතබ්බො. පාතිමොක්ඛසංවරො සතිසංවරො ඤාණසංවරො ඛන්තිසංවරො විරියසංවරොති, තත්‍ථ "ඉමිනා පාතිමොක්ඛසංවරෙන උපෙතො හොති සමුපෙතොති" අයං පාතිමොක්ඛසංවරො; "රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජතී"ති අයං සතිසංවරො…

12 "යානි සොතානි ලොකස්මිං (අජිතාති භගවා සතිතෙසං නිවාරණං
සොතානං සංවරං බ්‍රූමි පඤ්ඤායෙතෙ පිථිය්‍යරෙ"ති…

---

විධ කුශලකර්මපථචේතනාවෝ; "චේතනාසීලංනාම"යි; යොදනු; අභිජ්ඣං පහාය, අභිධ්‍යාව දුරුකොට; විගතාභිජ්ඣේන චේතසා, පහවූ අභිධ්‍යාඇති චිත්තයෙන්; විහරතීති ආදිනා නයෙන, වෙසෙසි යනාදි නයින්; වුත්තා, කියනලද; අනභිජ්ඣා අව්‍යාපාද සම්මාදිට්ඨි ධම්මා, අනභිධ්‍යා අව්‍යාපාද සම්‍යග්දෘෂ්ටි ධර්මයෝයි; (මේ අනභිධ්‍යාදීහු අභිධ්‍යාදීනට ප්‍රතිෂේධක බැවින් හෝ මිථ්‍යාචාරාදීනට ප්‍රතිෂේධක බැවින් හෝ ශීලනම්වෙ;- කිසේය යත්? අභිධ්‍යායෙන් මිථ්‍යාචාරවෙයි ප්‍රාණිතවස්තුයෙහි ව්‍යතික්‍රමවන බැවින්; ව්‍යාපාදයෙන් ප්‍රාණාතිපාත වෙයි මියෙත්වයි පැවති සිත් ඇත්තහු අනුන් මරණ බැවින්;- මිථ්‍යාදෘෂ්ටියෙන් මිථ්‍යාචාර වෙයි පුත්‍රයා මුඛය දක ස්වර්ගයට යෙමියි දෘෂ්ටීන් මිථ්‍යාචාරචරණයට කාරණ ඇති බැවින්;-මෙසේම සෙසු කර්මපථයෙහි යෙදෙන යෙදෙනසේ යොදනු:-මෙමකීහ, "යථාහි අභිජ්ඣාව්‍යාපාදවසෙන මිච්ඡාචාරපාණාතිපාතාදයො කරීයන්ති එවං මිච්ඡාදිට්ඨිවසෙනාපි තෙ පුත්තමුඛදස්සනාදි අත්‍ථං කරීයන්ති තෙසඤ්ච පජහනකා අනභිජ්ඣාදයො"යි.) "සංවරො සීලං" යනුයෙහි; පඤ්චවිධෙන සංවරො වෙදිතබ්බො, පඤ්චප්‍රකාරයෙකින් සංවරය දතයුතු; පාතිමොක්ඛ සංවරො, චාරිත්‍ර වාරිත්‍ර විභාගඇති විනය පර්‍ය්‍යාපන්න ශික්ෂාපද ශීල නමැති ප්‍රාතිමොක්ෂයම ප්‍රාතිමොක්ෂ සංවරශීල නම; සතිසංවරො, මනස සවනුවූ ඉන්ද්‍රියයන්ගේ ආරක්ෂායයි කියනලද ඉන්ද්‍රියසංවරපරනාමධෙය ඇති ස්මෘතියම සතිසංවර නම; ඤාණසංවරො, තණ්හාදිට්ඨි ආදීන් සමුච්ඡේද කරවන ඤාණයම ඤාණසංවර නම; ඛන්තිසංවරො, අධිවාසනාවශයෙන් පවත්නා අද්වේෂප්‍රධානස්කන්ධාඛ්‍යවූ අද්වේෂාඛ්‍යමවූ හෝ ක්ෂාන්තියම ක්ෂාන්ති සංවරනම; විරියසංවරො, කාමවිතර්කාදීන් දුරීකරණවශයෙන් පවත්නා වීර්‍ය්‍යයම විරියසංවර නම්; තත්‍ථ, ඒ පඤ්චවිධ සංවරයෙහි; ඉමිනා පාතිමොක්ඛසංවරෙන, මේ ප්‍රාතිමොක්ෂ සංවරයෙන්; උපෙතො හොති, යුක්තවේද; ("සමුපෙතො හොති" යනු එයට පර්‍ය්‍යායයි.) රක්ඛති චක්ඛුන්ද්‍රියං; චක්ඛුන්ද්‍රිය රක්නේයි; චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජතීති, චක්ඛුන්ද්‍රියයෙහි සංවරයට පැමිණේය යනු සති සංවර නමි…

12. ("අජිත" යනු ආමන්ත්‍රණය "භගවා" යනු ප්‍රතිවචනයි.) ලොකස්මිං, ලොකයෙහි; යානි සොතානි, තෘෂ්ණාදෘෂ්ට්‍යාදි යම් ශ්‍රොතස් කෙනෙක් ඇද්ද; සති තෙසංනිවාරණං, විදර්ශනාසම්ප්‍රයුක්තවූ

(අ)අයං ඤාණසංවරො–පච්චය පටිසෙවනම්පි එත්ථෙව සමොධානං ගච්ඡති; "යො පනා යං ඛමො හොති සීතස්ස උණ්හස්සා"ති ආදිනා නයෙන ආගතො අයං ඛන්තිසංවරොනාම; "යො චා යං උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙතී"ති ආදිනා නයෙන ආගතො අයං විරිය සංවරො නාම–ආජීවපාරිසුද්ධි පි එත්ථෙව සමොධානං ගච්ඡති.

---

ස්මෘති තොමෝ තෘෂ්ණාදෘෂ්ට්‍යාදි ඒ ශ්‍රොතසුන්ට ආවරණයි;(රක්ෂාය යන අර්ථයි.) සොතානං සංවරං බ්‍රෑමි, ශ්‍රොතසුන්ට එම ස්මෘතිය සංවරයයි කියමි; පඤ්ඤායෙතෙ පිධීයරෙ, රූපාදීන් කෙරෙහි අනිත්‍යතාප්‍රතිවෙධසාධකවූ මාර්ගප්‍රඥාවෙන් ඒ ශ්‍රොතස්හු සර්වාකාර යෙන් පියනු ලැබෙත්.

(අ) (මෙම කීහ අටුවායෙහිදු "සතිතෙසං නිවාරණන්ති විපස්සනා යුත්තා කුසලා කුසලානංධම්මානංගතියො සමණෙන සමානා සති තෙසං සොතානං නිවාරණං, සොතානං සංවරං බ්‍රෑමීති තමෙවාහං සතිං සොතානං සංවරං බ්‍රෑමී'ති අධිප්පායො පඤ්ඤායෙතෙ පිධීයරෙති රූපාදිසු පන අනිච්චතාදි පටිවෙධසාධිකාය මග්ගපඤ්ඤාය එතෙ සොතා සබ්බසො පිධීයන්ති"යි. සන්නයෙහිදු "සොතානංසංවරං බ්‍රෑමි"යි; යට සතිසංවර කීහ. "පඤ්ඤායෙතෙ පිධීයරෙ"යි; සමුච්ඡෙද කෙලෙසුන් පහණ ප්‍රඥාවෙන් කෙලෙස්හු පියන ලැබෙතියි උතුම් ඤාණසංවර කියති යි. ටීකාවෙහි වනාහි "සොතානං සංවරං බ්‍රෑමීති වත්වා පඤ්ඤායෙතෙ පිධීයරෙති වදන්තෙන සොතානං සංවරො පිදහනං සමුච්ඡෙදනං ඤාණන්ති විඤ්ඤායති"යි කීහු, මේ ඤාණ සංවරයි.) පච්චය පටිසෙවනම්පි, ප්‍රත්‍යය සෙවුනා ශීලයද; එත්ථෙව සමොධානං ගච්ඡති, (ප්‍රයොජනය සලකා නුවණින් ප්‍රත්‍යය සෙවුනාබැවින්) මේ ඤාණසංවරයෙහිම සඞ්ග්‍රහයට යේ; යො පනායං, යම් මේ සංවරයෙක්; ඛමො හොති සීතස්ස උණ්හස්සාති ආදිනා නයෙනආගතො, හුණු සිහිල් අධිවාසනා කෙරෙයි යනාදි නයින් ආයේ ඛන්තිසංවර නම්; යොචායං, යම් මේ සංවරයෙක්; උප්පන්නං කාමවිතක්කං, ඒ ඒ අරමුණෙහි උපන් කාමප්‍රතිසංයුක්ත විතර්කය; නාධිවාසෙති,නොඉවසා; (සිත්හි නොතබා යන අර්ථයි.) ආදිනා නයෙන ආගතො, මේ ආදි නයින් ආයේ විරියසංවර නම්; ආජීවපාරිසුද්ධිපි, ආජීවපාරිශුද්ධිශීලයද; එත්ථෙව සමොධානං ගච්ඡති, මේ වීර්‍ය්‍යසංවරයෙහිම සඞ්ග්‍රහයට යේ; (ආජීව පාරිශුද්ධිශීලය වීර්‍ය්‍යයෙන් සිද්ධවනබැවින් මෙහි යම්සේ ඥානය තෘෂ්ණාදී ශ්‍රොතසුන්ගේ ප්‍රවෘත්ති නිවාරණයෙන් පිදහනාර්ථයෙන් සංවරනම් වේ ද මතුයෙහි පවත්නාගුණයන්ට ආධාරාදිබැවින් ශීල නාර්ථයෙන් ශීලවේද එසේම ක්ෂාන්තියද අනධිවාසනයෙන් උපදනා කෙලශයන් අධිවාසනයෙන් සංවරණය කරන හෙයින් සංවරයි; ක්ෂාන්ති හෙතුවෙන් උපදනා ගුණයනට ආධාරාදි බැවින් ශීලනාර්ථ යෙන් ශීලයි; වීර්‍ය්‍යය දුරුකටයුතුවූ පාපධර්මයන්ගේ දූරිකරණයෙන්

(අ) ඉති අයං පඤ්චවිධොපි සංවරො යා ච පාපභීරුකානං කුලපුත්තානං සම්පත්තවත්ථුතො විරති, සබ්බමෙපතං සංවරසීලන්ති වෙදිතබ්බං අවීතික්කමො සීලන්ති සමාදින්නසීලස්ස කායිකවාචසිකො අවීතික්කමො ඉදං තාව කිං සීලන්ති පඤ්හස්ස විස්සජ්ජනං.

(ආ) අවසෙසෙසු **කෙනට්ඨෙන සීලන්ති**-සීලනට්ඨෙන සීලං, කිමිදං සීලනං නාම සමාධානං වා කායකම්මාදීනං-සුසීල්‍යවසෙන අවිප්පකිණ්ණතා ති අත්ථො; උපධාරණං වා කුසලානං ධම්මානං-පතිට්ඨාවසෙන ආධාරභාවො ති අත්ථො; එතදෙව හි එත්ථ අත්ථවයංසද්දලක්ඛණවිදූ අනුජානන්ති. අඤ්ඤෙ පන සිරට්ඨො සීතලට්ඨොති එවමාදිනා පි නයෙනෙවෙත්ථ අත්ථං වණ්ණයන්ති.

ඉදානි-"කානස්ස ලක්ඛණරසපච්චුපට්ඨානපදට්ඨානානී"ති එත්ථ:-

---

සංවරණය කරණහෙයින් සංවරය පාපවිනොදන හෙතුවෙන් උපදනාවූ ගුණයන්ට ආධාරදී බැවින් ශීලනාර්ථයෙන් ශීලයයි දතයුතු.)

(අ) **ඉති**, මෙසේ; අයං පඤ්චවිධොපි සංවරො, මේ පඤ්චවිධ සංවරයද; පාපභීරුකානංකුලපුත්තානං, පාපභීරුකවූ කුලපුත්‍රයන්ගේ;සම්පත්තවත්ථුතො යා ච විරති, සම්ප්‍රාප්ත වස්තුයෙන් ශීලසමාදානයක් නැතිවද මෙවැනි කර්ම නුසුදුසුයයි කරන යම් විරතියෙක් ඇද්ද; සබ්බමෙපතං සංවරසීලන්ති වෙදිතබ්බං, මේ සියල්ලම සංවරශීලයයි දතයුතු; අවීතික්කමො සීලන්ති, අව්‍යතික්‍රම ශීලත් මී; සමාදින්නසීලස්ස, සමාදන්වන සිල්ඇත්තහුගේ; කායිකවාචසිකො අවීතික්කමො, කායවාග්ද්වාරයෙහි අව්‍යතික්‍රමයයි;(**"න වීතික්කමති එතෙනාති අවීතික්කමො තථාපවත්තො කුසලචිත්තුප්පාදො"**යි, ගන්නේ;) තාව, පළමුකොට; කිං සීලන්ති පඤ්හස්ස, **"කිං සීලං"** යන ප්‍රශ්නයට; ඉදං විස්සජ්ජනං, මේ විසඳීමයි:—

(ආ)අවසෙසෙසු, සෙසු ප්‍රශ්නයන් කෙරෙහි; "කෙනට්ඨෙන සීලං" යන්නෙහි; සීලනට්ඨෙන සීලං, ශීලනාර්ථයෙන් ශීල නම්; කිමිදං සීලනං නාම, ඒ ශීලනය නම් කිමයත්; සමාධානං වා, මනාකොට තිබීම[1] හෝයි; කායකම්මාදීනං, කායකර්මාදීන්ගේ; සුසීල්‍යවසෙන අවිප්පකිණ්ණතාති අත්ථො, සෞශීල්‍යවශයෙන් අවිප්‍රකීර්ණබවය යන අර්ථයි; (**සීල-සමාධෞ**, යන ධාතුහට රුචි-දෞශශීල්‍යයෙන් පවත්නා කායකර්මාදීහු දුනුදු මතුයෙහිදු අහිත දුඃඛඵලවත හෙයින් සම්මාඨපිත නම් නොවෙත් නුයි විසිර පවත්නා නම් වෙති ශෞශීල්‍ය වශයෙන් වනාහි පවත්නා කායකර්මාදීහු තම්පයර්ථයෙන් "ඔක්ඛිත්ත චක්ඛු න බාහුප්පචාලන්නාදී" විසින් සම්මාඨපිත්යෝ නුයි අවිප්‍රකීර්ණ නම්, නොවිසිර පවත්නා නම් වෙත් "අවිප්පකිණ්ණතා" යන මෙයින්

---

1. සමාහනකොට තිබීම-ඇතැම.

13 සීලතං ලක්ඛණංතස්ස භින්නස්සාපි අනෙකධා
සනිදස්සනත්තං රූපස්ස යථා භින්නස්ස නෙකධා.

---

සමාධිහු කෙරෙන් ශීලය වෙසෙසූහු; සමාධිහුගේ සමාධාන නම් සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ අවික්ෂෙපබවට හෙතු බවයි. මේ කාය කර්මාදීන් නොවිසිරියදී මනාකොට තිබීමයයි දතයුතු.)උපධාරණංවා, අධිෂ්ඨාන බව හෝ ආදිභාවය කිබැවින් මූල්බව හෝ; කුසලානං ධම්මානං පතිට්ඨාවසෙන, (පූර්වභාග මහද්ගත ලොකොත්තර) කුශල ධර්මයන්ට ප්‍රතිෂ්ඨා විසින්; ආධාරභාවො ති අත්ථො, ආධාරබවය යන අර්ථයි; (**ශීල-ප්‍රතිෂ්ඨායාම්,** යන ධාතු රුචි-"පතිට්ඨාවසෙන" යන මෙයින් පෘථිවීධාතු කෘත්‍යයෙන් ශීලය වෙසෙසූහු පෘථිවීධාතු සහ ජාත රූපධර්මයන්ගේ සන්ධාරණ වශයෙන් පවත්නීය. මේ වනාහි අනවද්‍යධර්මයන්ට මූලාධිෂ්ඨානභාවයෙන් පවති.) එතදෙව හි අත්ථවයං, මේ අර්ථදෙකම; සද්දලක්ඛණ විදූ, ශබ්ද ලක්ෂණදන්නාහු; අනුජානන්ති, අනුඥ කෙරෙත්; අඤ්ඤෙ පන, (ශබ්දලක්ෂණඥයන් කෙරෙන් පිටත්) සෙසු ආචාර්‍යයෝ වනාහි; ("වණ්ණයන්ති" යොදනු;) සිරට්ඨො, උත්තමාඞ්ගය යන අර්ථය ශීලශබ්දයාගේ අර්ථයි; (යම්සේ හිස් සුන්කල්හි සියලු ආත්මභාවය නසීද එසේම ශීලය භින්න කල්හි සියලු ගුණශරීරය නස්නේය එහෙයින් ගුණශරීරයාගේ උත්තමාඞ්ගාර්ථය ශීලාර්ථ නම යන අර්ථයි-නොහොත් "සිරො සීසං"යි වක්තව්‍යයෙහි:-

"වණ්ණාගමො වණ්ණවිපර්‍යයශච-චෙව චාපරෙ‍ෙ වණ්ණවිකාරනාශෞ
ධාතොස්තදර්ථාතිශයෙන යොගස්ත-දුච්‍යතෙ පඤ්චවිධං නිරුක්තම්.

යන නෛරුක්තිකවිධීන් සකාරයහට ලකාර කොට "සීලං"යි දක්වූහු:- සීතලට්ඨො, පරිදාහව්‍යුපසමනාර්ථය ශීලාර්ථ නම; (මේ අර්ථ යෙහිද "සීතලං"යි වක්තව්‍යයෙහි නිරුක්තිනයින් ම තකාරය හට ලොප්කොට "සීලං"යි දක්වූහු.)එවමාදිනා නයෙන, මේ ආදිනයෙනුදු; එත්ථ, මේ ශීලශබ්දයෙහි; අත්ථං වණ්ණයන්ති, අර්ථය වර්ණනා කෙරෙත්; (ආදිශබ්දයෙන් "**සයන්ති අකුසලා එතස්මිං සති අපවිධා හොන්තීති සීලං-සුපන්ති වා තෙන විහත්‍යස්සාභානි සබ්බදුච්චරිතා නීති සීලං**" යනාදි ගතයුතු.)

13. අනෙකධා භින්නස්සාපි,(චෙතනාදි විසින්)අනෙකප්‍රකාරයෙන් භින්න ද වූ; තස්ස, ඒ ශීලයට; සීලනං ලක්ඛණං, කායකර්මාදීන්ගේ අවිප්‍රකීර්ණ බව ද කුශලධර්මයන්ට පිහිට බව ද ලක්ෂණයි සවභාවයි; (අනෙක භෙදය සඞ්ග්‍රහබැවින් මේ විශෙෂලක්ෂණ නොවන්නේය-සාමාන්‍ය ලක්ෂණ වන්නේය යන අනුයොගයට "සනිදස්සනත්තං රූපස්ස යථා භින්නස්සනෙකධා"යි. කීහු.) අනෙකධා භින්නස්ස,නීලාදි විසින් අනෙකප්‍රකාරයෙන් භින්නාවූ; රූපස්ස, වර්ණායතනයහට; සනිදස්සනත්තං යථා, සනිදර්ශන බව මෙනි.

(ඇ)යථා හි නීලපීතාදිභෙදෙන අනෙකධා භින්නස්සාපි රූපායතනස්ස සනිදස්සනත්තං ලක්ඛණං–නීලාදිභෙදෙනභින්නස්සා පි සනිදස්සනභාවානතික්කමනතො; තථා සීලස්ස චෙතනාදි භෙදෙන අනෙකධා භින්නස්සාපි යදෙතං කායකම්මාදීනං සමාධානවසෙන කුසලානඤ්ච ධම්මානං පතිට්ඨානවසෙන වුත්තං සීලනං තදෙව ලක්ඛණං–චෙතනාදිභෙදෙන භින්නස්සාපි සමාධානපතිට්ඨානභාවානතික්කමනතො, එවං ලක්ඛණස්ස පනස්ස......

14 දුස්සීල්‍යවිද්ධංසනතා අනවජ්ජගුණා තථා
කිච්චසම්පත්ති අත්ථෙන රසො නාම පවුච්චති.

(ආ)තස්මා ඉදං සීලං නාම කිච්චට්ඨෙන රසෙන දුස්සීල්‍යවිද්ධංසනරසං, සම්පත්තිඅත්ථෙන රසෙන අනවජ්ජරසන්ති වෙදිතබ්බං. ලක්ඛණාදිසු හි කිච්චමෙව සම්පත්ති වා රසොති වුච්චති.

---

(යම්සේ නීලාදිවශයෙන් අනෙක භෙදභින්න ද වූ රූපායතනය හට තදන්‍යධර්මයනට අසාධාරණබැවින් සනිදර්ශනබව විශෙෂ ලක්‍ෂණවීද අනිත්‍යතාව මෙන් රූපපණය මෙන් සාමාන්‍යලක්‍ෂණ නම් නොවීද එසේම ශීලය ද තදන්‍යධර්මයනට අසාධාරණ බැවින් චෙතනාදිභෙදභින්නශීලයට විශෙෂලක්‍ෂණයයි ද්‍රෂ්ටව්‍යයි.)

(ඇ) යථාහි, යම්සේ; නීලපීතාදිභෙදෙන අනෙකධා භින්නස්සාපි,නීල පීතාදි භෙදයෙන් අනෙකප්‍රකාරයෙන් භින්න ද වූ; රූපායතනස්ස, රූපායතනය හට; සනිදස්සනත්තං ලක්ඛණං, සනිදර්ශනබව තදන්‍ය ධර්මයනට අසාධාරණ බැවින් විශෙෂලක්‍ෂණ වීද; කුම්හෙයින යත්? නීලාදි භෙදෙන භින්නස්සාපි, නීලාදි භෙදයෙන් භින්න ද වූ (රූපායතනයාගේ); සනිදස්සනභාවානතික්කමනතො, සනිදර්ශන භාවයාගේ නොඉක්මීම බැවිනි; තථා, එසේම; චෙතනාදිභෙදෙන අනෙකධා භින්නස්සාපි සීලස්ස, චෙතනාදිභෙදයෙන් අනෙකප්‍රකාරයෙන් භින්න ද වූ ශීලයට; කායකම්මාදීනං සමාධාන වසෙන, කායකර්මාදීන් නොවිසිරියදී මනාකොට තිබීම්වශයෙන් ද; කුසලානඤ්ච ධම්මානං පතිට්ඨාවසෙන, කුශලධර්මයනට පිහිට විසින්ද; වුත්තං, කියනලද; යදෙතං සීලනං, යම් මේ ශීලනයෙක් ඇද්ද; තදෙව ලක්ඛණං, හේ ම ලක්‍ෂණයි; චෙතනාදි භෙදෙන භින්නස්සාපි, චෙතනාදි භෙදයෙන් භින්නයාගේද; සමාධානපතිට්ඨානභාවානාතික්කමනතො, කායකර්මාදීන්ගේ නොවිසිරෙනබව කුශලකර්මයනට පිහිටබව නොඉක්මෙන හෙයිනි; එවං ලක්ඛණස්ස පනස්ස, මෙබඳුලක්‍ෂණ ඇති ශීලයාගේ;

14. දුස්සීල්‍යවිද්ධංසනතා,කායිකඅසංවරාදි භෙදඇති දෞශශීල්‍යයාගේ නැසීමද; තථා, එසේම; අනවජ්ජගුණා, නිරවද්‍යකෘත්‍යයෝ ද; කිච්ච සම්පත්ති අත්ථෙන, කෘත්‍යය හා සම්පත්තිය අර්ථකොටඇති රසයෙන්; රසොනාම පවුච්චති, රසනමැයි කියනුලැබේ.

(ආ)("යස්මා රසො නාමපවුච්චති තස්මා"යි, කීවෙත්)ඉදං සීලං නාම, මේ ශීලය නම්; කිච්චට්ඨෙන රසෙන, කෘත්‍යාර්ථ රසයෙන්; දුස්සීල්‍ය

15 සොචෙය්‍ය පච්චුපට්ඨානං තයිදං තස්ස විඤ්ඤූහි
ඔත්තප්පඤ්ච හිරී චෙව පදට්ඨානන්ති වණ්ණිතං.

(අ)තං හිදං සීලං "කායසොචෙය්‍යං වචීසොචෙය්‍යං මනොසොචෙය්‍යං"ති එවං වුත්ත සොචෙය්‍යපච්චුපට්ඨානං–සුචිභාවෙන පච්චුපට්ඨාති ගහණභාවං ගච්ඡති. හිරොත්තප්පඤ්ච පන තස්ස විඤ්ඤූහි පදට්ඨානන්ති වණ්ණිතං ආසන්නකාරණන්ති අත්ථො–හිරොත්තප්පෙ හි සති සීලං උප්පජ්ජති චෙව තිට්ඨති ච, අසති නෙව උප්පජ්ජති න තිට්ඨතීති එවං සීලස්ස ලක්ඛණරසපච්චුපට්ඨානපදට්ඨානානි වෙදිතබ්බානි. **කිමානිසංසං සීල**න්ති අවිප්පටිසාරාදි අනෙකගුණපටිලාභානිසංසං වුත්තං හෙතං–"අවිප්පටිසාරත්ථානි ඛො ආනන්ද කුසලානි සීලානි අවිප්පටිසාරානිසංසානී"ති ......

---

විධංසනරසං, දෞශ්ශීල්‍යයාගේ නැසීම කෘත්‍යයකොට ඇත්තේය; සම්පත්තිඅත්ථෙන රසෙන, සම්පත්ත්‍යර්ථ රසයෙන්; අනවජ්ජරසන්ති, අනවද්‍යබව (අගර්හ්‍යබව) සම්පත්කොට ඇත්තේයයි; වෙදිතබ්බං, දතයුතුයි; ලක්ඛණාදිසු හි, ලක්ෂණරසාදීන් කෙරෙහි; කිච්චමෙව සම්පත්ති වා රසොති වුච්චති, කෘත්‍යය ම හෝ සම්පත්තිය ම හෝ රසය යි කියනු ලැබෙයි.

(රසායතන රසරසාදීහු කියනු නොලැබේත්. සන්නයෙහි "කිච්ච මෙව" යන අවධාරණයෙන් කෘත්‍යරසය බලවත්බව කීහයි කීහු. "කිච්චමෙව සම්පත්ති එව වා රසො" යන මේ අර්ථය අභිමතබැවින් හේ ඔවුන්ගේ මතිමාත්‍රයි.)

15 සොචෙය්‍යපච්චුපට්ඨානං, කායාදීන්ගේ ශුචිබව වැටහීම් කොට ඇත්තේයි; තස්ස, ඒ ශීලයට; විඤ්ඤූහි, නුවණැත්තන් විසින්; ඔත්තප්පඤ්ච, ඔත්තප්පයද; හිරිචෙව, හ්‍රියද; පදට්ඨානන්ති, ආසන්න කාරණයයි; වණ්ණිතං වර්ණනාකරනලදී.

(අ) තං හිදං සීලං, ඒ මේ ශීලය; කායසොචෙය්‍යං, කායද්වාරශුචිබවය; වචීසොචෙය්‍යං, වාග්ද්වාරශුචිබවය; මනොසොචෙය්‍යන්ති, මනොද්වාර ශුචිබවයයි; එවං වුත්තසොචෙය්‍ය පච්චුපට්ඨානං, මෙසේ කියනලද ශුචිබව වැටහීම්කොට ඇත්තේයි; සුචි භාවෙන [1] පච්චුපට්ඨාති, ශුචිබැවින් වැටහේ; ගහණභාවං ගච්ඡති, ගතයුතුබවට පැමිණේ; (මෙයින් උපස්ථානාකාරසඞ්ඛ්‍යාත ප්‍රත්‍යුපස්ථානයයි කියනලද ඵලාර්ථහෙයින් වනාහි "අවිප්පටිසාර පච්චුපට්ඨානං සමාධිපච්චුපට්ඨානං වා" කියයුතු:–ශීලය දනුදු අවිප්‍රතිසාරය ඵලවයි, පරම්පරයෙන් සමාධිය ද ඵලවා. මේ ආනිසංසඵලය ආනිසංස කථායෙහි වක්ෂ්‍යමාණ හෙයින් මෙහි නොකීහු:–සන්නයෙහි ඵලය අනීප්සිත බැවින් මෙහි නොගත්හයි කීහ–හෙ නොමැනවි. ඵලය අනෙකවිධ

---

1 සොචෙය්‍ය භාවෙන-මූ. ස.

(අ)අපරම්පි වුත්තං:–“පඤ්චිමෙ ගහපතයො ආනිසංසා සීලවතො සීලසම්පදාය, කතමෙ පඤ්ච? ඉධ ගහපතයො සීලවා සීලසම්පන්නො අප්පමාදාධිකරණං මහන්තං භොගක්ඛන්ධං අධිගච්ඡති. අයං පඨමො ආනිසංසො සීලවතො සීලසම්පදාය; පුනචපරං ගහපතයො සීලවතො සීලසම්පන්නස්ස කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති.

---

බැවිනු දු ලෞකිකාදි ශීලය විභාග කටයුතු බැව්නුදු.) හිරොත්තප්පඤ්ච පන, හිරි ඔතප් දෙක වනාහි; තස්ස, ඒ ශීලයට; විඤ්ඤූහි, නුවණැත්තන් විසින්; “පදට්ඨානන්ති වණ්ණිතං”යි සේයි; ආසන්නකාරණන්ති අත්ථො, ආසන්නකාරණය යන අර්ථයි; (පෘථිවීධාතුහට යම්සේ කම්මාදි දූරකාරණද, සෙසුභූතත්‍රය ආසන්නකාරණද, යම්සේ වස්ත්‍රයට තන්තවාය තුරිය වෙමසලාකාදි දූරකාරණද, තන්තූහු ආසන්න කාරණද, එසේම ශීලයට ද සද්ධර්මශ්‍රවණාදීහු දූරකාරණය හිරිඔතප් ආසන්න කාරණයයි දක්වනපිණිස “හිරිඔත්තප්පඤ්ච” යනාදි කීහු–“හිරිඔත්තප්පෙ හි සති” යනාදීන් ආසන්න කාරණ බව ම සාධත්) හිරිඔත්තප්පෙහි සති, හිරි ඔතප් දෙදෙනා ඇතිකල්හි; සීලං, ශීලය; උප්පජ්ජති චෙව, සමාදාන වශයෙන් උපදනේද වෙයි; තිට්ඨති ච, අව්‍යතික්‍රමවශයෙන් සිටුනේද්වෙ; අසති, හිරිඔතප්දෙක නැති කල්හි; නෙවඋප්පජ්ජති න තිට්ඨති, නොම උපදනේය නොමසිටුනේයි; කිමානිසංසන්ති, කුමක් අනුසස්කොට ඇත්තේදයත්; අවිප්පටිසාරාදි අනෙකගුණපටිලාභානිසංසං, අවිප්‍රතිසාරාදි අනෙකගුණප්‍රතිලාභය අනුසස්කොට ඇත්තේයි; (මෙහි අවිප්‍රතිසාර නම් විප්‍රතිසාර ප්‍රතිපක්ෂ කුශල චිත්තොත්පාදයයි. හේ වනාහි වෙසෙසින් “ලාභා වත මෙ සුලද්ධං වත මෙ යස්ස මෙ සුපරිසුද්ධං සීලං යනාදීන් තමාගේ ශීලය ප්‍රත්‍යවෙක්ෂාවශයෙන් ප්‍රවෘත්තයයි වෙදිතව්‍යයි–ආදි ශබ්දයෙන් ප්‍රමොද්‍ය භොගසම්පත්ති කීර්ත්තිශබ්දාදීන් ගත්හු.) වුත්තං හෙතං, වදාළේමය; ආනන්ද, ආනන්දය; කුසලානි සීලානි, අනවද්‍ය ශීලයෝ; අවිප්පටිසාරත්ථානි, අවිප්‍රතිසාරය ප්‍රයොජනකොට ඇත්තාහුයි; අවිප්පටිසාරානිසංසානි, අවිප්‍රතිසාරය අනුසස්කොට ඇත්තාහුයි; (මෙයින් අවිප්‍රතිසාරය ශීලයාගෙ උද්‍රය මාත්‍රයි. සංවර්ධිතවෘක්ෂයාගෙ ඡායාපුෂ්පසදෘශය–මෙයින් නිෂ්පාද්‍යවූයේ අන්‍යමවූ සමාධිආදි ගුණයයි දැක්වූහු.)

(අ)අපරම්පි වුත්තං, අනිකෙකුදු කියනලදී; ගහපතයො, ගෘහපතීනි; සීලවතො, පරිපූර්ණවූ සිල්ඇත්තහුට; සීලසම්පදාය, එම ශීලසම්පත්තියෙහි; ඉමෙ පඤ්ච ආනිසංසා, මේ පස්අනුසස්හු වෙත්; කතමෙ පඤ්ච, කවර පස්දෙනදයත්; ඉධ, මෙලෙව්හි; ගහපතයො, ගෘහපතීනි; සීලවා, සිල්වත්වූ; සීලසම්පන්නො, සීලසම්පන්න තෙමෙ; අප්පමාදාධිකරණං, අප්‍රමාදකරණයෙන්; මහන්තං භොගක්ඛන්ධං; මහත් භොගරාශියට; අධිගච්ඡති, පැමිණේ; අයං, මෙතෙම; සීලවතො සීලසම්පදාය, සිල්වත්හුගේ ශීලසම්පත්තියෙහි; පඨමො ආනිසංසො, පළමුවන

අයං දුතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය; පුනචපරං ගහපතයො සීලවා සීලසම්පන්නො යං යදෙව පරිසං උපසඞ්කමති යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං විසාරදො උපසඞ්කමති අමඞ්කුභූතො. අයං තතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය; පුනචපරං ගහපතයො සීලවා සීලසම්පන්නො අසම්මූළ්හො කාලඞ්කරොති. අයං චතුත්ථො ආනිසංසො සීලවතො සීලසම්පදාය; පුනචපරං ගහපතයො සීලවා සීලසම්පන්නො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති අයං පඤ්චමො ආනිසංසො සීලවතො සීලසම්පදායා"ති.

(ඇ) අපරෙපි—"ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො චස්සං මනාපො ගරු භාවනීයො චා"ති "සීලෙස්වෙවස්ස පරිපූරකාරී"ති. ආදිනා නයෙන පියමනාපතාදයො ආසවක්ඛයපරියොසානා අනෙකෙ සීලානිසංසා වුත්තා. එවං අවිප්පටිසාරාදි අනෙකගුණානිසංසං සීලං. අපිච:—

---

අනුසසියි; පුනචපරං, නැවත අනික් අනුසසකුදු කියමි; (මතු සතර වාරයෙහි කී නයින්ම අර්ථ දතහැකිබැවින් නොකී පෙදෙහිම අර්ථ ලියමු.)—කල්‍යාණොකිත්තිසද්දො, අබ්භුග්ගච්ඡති, මෙසේ සිල්වත මෙසේ කල්‍යාණධර්මයයි සුන්දරවූ ස්තුතිඝොෂය නැගෙ; (ලොව පැතිරෙය යන අර්ථයි.) යං යදෙව පරිසං උපසඞ්කමති, යම් යම් පිරිසකට එළැඹේනම්; යදි ඛත්තියපරිසං, ඉදින් රජපිරිසකට වත්; යදි බ්‍රාහ්මණපරිසං, ඉදින් බමුණුපිරිසකට වත්; යදි ගහපතිපරිසං, ඉදින් ගෘහපති පිරිසකටවත්; යදි සමණපරිසං, ඉදින් මහණ පිරිසකටවත් එළැඹේනම්; විසාරදො, තමාකෙරෙහි කිසිවරදක් නොදක්නෙ විසාරදවූයේ—නිර්භීයවූයේ; අමඞ්කුභූතො, මෙලච්ජනුවූයෙ; උපසඞ්කමති, එළැඹේ; අසම්මූළ්හො, මරණසමයෙහි කුශලකර්මාදීන්ම වැටහෙනබැවින් මුළානොව ප්‍රසන්නවූ සිත්ඇතිව; කාලඞ්කරොති, කාලක්‍රියා කෙරේ; කායස්ස භෙදා, උපාදින්නකඛන්ධ සඞ්ඛ්‍යාත කායයාගෙ පරිත්‍යාගයෙන් ජීවිතෙන්ද්‍රියයාගෙ උපච්ඡෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; සුගතිං, සුන්දරගතිඇතිහෙයින් සුගතිනම්වූ; (මනුෂ්‍යගතිය ද සඞ්ග්‍රහවේ.) සග්ගං ලොකං, ෂඩ්දෙවගතිසඞ්ඛ්‍යාත ලොකයෙහි; උපපජ්ජතීති, උපදී යි; (ගතිතොමො "රූපාදීහි විසයෙහි සුට්ඨුඅග්ගොති සග්ගො" යි "ලොකයති එත්ථ උළාරං පුඤ්ඤඵලන්ති ලොකො"යිදු කියනුලැබේ. "අපරෙපි ආනිසංසා වුත්තා"යි යොදනු.)

(ඇ) භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, මහණතෙමෙ; සබ්‍රහ්මචාරීනං, සබ්‍රම්සරනට; පියොචස්සං, ප්‍රියවෙම්වයි; (ප්‍රෙමකටයුතු වෙම්වයි යන අර්ථයි;) මනාපො ච, සබ්‍රම්සරුන් සිත් වඩම්වයි; (මෙත්සිතින් පැතිර විය හෙම්වයි යන අර්ථයි;) ගරු ච, පහණසතක් මෙන් ගුරුවෙම්වයි; භාවනීයො ච, මේ ආවන් දතයුත්ත දන්කි දක්කයුත්ත දක්කී යි

16 සාසනෙ කුලපුත්තානං පතිට්ඨා නත්ථි යං විනා
ආනිසංසපරිච්ඡෙදං තස්ස සීලස්ස කො වදෙ.

17 න ගඞ්ගා යමුනාචාපි සරභූ වා සරස්සතී
නින්නගා වා චිරවතී මහී චාපි මහානදී.

18 සක්කුණන්ති විසොධෙතුං තම්මලං ඉධ පාණිනං
විසොධයති සත්තානං යං වෙ සීලජලං මලං.

19 න තං සජලදා වාතා න චාපි හරිචන්දනං
නෙව හාරා න මණයො න චන්දකිරණඞ්කුරා.

20 සමයන්තීධ සත්තානං පරිළාහං සුරක්ඛිතං
යං සමෙති ඉදං අරියං සීලං අච්චන්තසීතලං.

---

මෙසේ සම්භාව්‍යවෙම්වයි; ආකඞ්ඛෙය්‍ය චෙ, ඉදින් කැමැත්තේ වීනම්; සීලෙසෙවස්ස පරිපූරකාරී, සතරපිරිසුදුසිල්හිම සම්පූර්ණකාරි වන්නේය යන; ආදිනානයෙන, මේ ආදි නයින්; (ආදි ග්‍රහණයෙන් "අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං" යන මේ ආදිවූ ශීලසතුති සූත්‍රාගතවූ සතළොස්සීලානිසංසයො සඞ්ගෘහීත වෙත්.) පියමනාපාදයො, ප්‍රියමනාපාදිවූ; ආසවක්ඛයපරියොසානා, ආශ්‍රවක්ෂය පර්‍ය්‍යවසානවූ; අනෙකෙ සීලානිසංසා වුත්තා, නොඑක් ශීලානෘශංසයො කියනලදහු; එවං, මෙසේ; අවිප්පටිසාරාදි අනෙකගුණානිසංසං සීලං, අවිප්‍රතිසාරාදි අනෙකගුණයන් අනුසස්කොට ඇත්තේයි ශීලය; අපිච, අනිකෙකුදු; (තවද ශීලානෘශංසයො ඇත යන අර්ථයි.)

16. සාසනෝ'ති යනු, ලොවීලොවුතුරු ගුණඑළවන මේ ශාස්තෘශාසනයෙහි; කුලපුත්තානං, ආචාරකුලපුත්‍රයන්ගේ; යං විනා පතිට්ඨා නත්ථි, යම් ශීලයක් විනා පිහිට නැද්ද; තස්ස සීලස්ස, මෙසේ අනුසස් ඇති ශීලයාගෙ; ආනිසංස පරිච්ඡෙදං, අනුසස්හි පමණ; කො වදෙ, කවරෙක් කියන්නට සමර්ථවේද.

17. ගඞ්ගා, ගඞ්ගානම් නදීද; යමුනා චාපි, යමුනා නම් නදීද; සරභූ වා, සරභූනම් නදීද; සරස්සතී, සරසවතී නම් නදීද; අචිරවතීනින්නගා වා, අචිරවතීනම් නදීද; මහීචාපි මහානදී, මහී නම් මහානදීද; (වා ශබ්දයෙන් අනුක්තචන්ද්‍රභාගාදිහුද යන මෙ සියලු නදීහු; "තංමලං විසොධෙතුං න සක්කුණන්ති"යි යොදනු.)

18. 19. 20. ඉධ, මේ ලොකයෙහි; පාණිනං සත්තානං, ප්‍රාණිසඞ්ඛ්‍යාත සත්ත්වයන්ගෙ; යං මලං, යම් රාගද්වේෂාදි මලයෙක්; වෙ, එකාන්තයෙන්; සීලජලං විසොධයති, ශීලනැමැති ජලය විශුද්ධකෙරේද; තංමලං, ඒ මලය; විසොධෙතුං, ශුද්ධකරන්නට; න සක්කුණන්ති, නොපොහොසත්හු; සුරක්ඛිතං, මනාකොට රක්ෂාකරනලද; අරියං, විශුද්ධවූ;

21 සීලගන්ධසමො ගන්ධො කුතො නාම භවිස්සති
යො සමං අනුවාතෙ ච පටිවාතෙ ච වායති.

22 සග්ගාරොහණසොපානං අඤ්ඤං සීලසමං කුතො
ද්වාරං වා පන නිබ්බාන නගරස්ස පවෙසනෙ.

23 සොභන්තෙවං න රාජානො මුත්තාමණිවිභූසිතා
යථා සොභන්ති යතිනො සීලභූසන භූසිතා.

24 අත්තානුවාදාදි භයං විද්ධංසයති සබ්බසො
ජනෙති කිත්තිං හාසඤ්ච සීලං සීලවතං සදා.

---

අච්චන්තසීතලං, අත්‍යන්තයෙන් සිහිල්වූ; ඉදං සීලං, මේ ශීලය තෙමේ; ඉධ, මේ ලොකයෙහි; සත්තානං, ප්‍රාණීසඞ්ඛ්‍යාත සත්වයන්ගේ; යං පරිළාහං සමෙති, යම් පරිදාහයෙක් සන්හිඳුවා ද; තං, ඒ පරිදාහය; සජලදා වාතා, මෙඝ මාරුතයෝ ද; න සමයන්ති, නොසන්හිඳුවත්; හරිචන්දනං, හරිචන්දන ද; න චාපි සමයති, නොම සන්හිඳුවා; හාරා, මුක්තාහාරයෝද; නෙව සමයන්ති, නොම සන්හිඳුවත්; මණයො, වෛඩූර්‍ය්‍ය මණිහු ද; නසමයන්ති, සන්නොසිඳුවත්; චන්දකිරණඞ්කුරා, සඳරැස්හු ද; න සමයන්ති, සන්නොසිඳුවත්.

21. යො, යම් ශීලගන්ධයෙක්; (ශීලසමුත්ථිත කීර්ත්තිශබ්දය මනොහර බැවිනුදු දික්හි පැතිරෙන බැවිනුදු "සීලගන්ධ"යයි කියනලදී.) සමං, සමව; අනුවාතෙ ච, යටසුළඟට ද; පටිවාතෙ ච, උඩුසුළඟට ද; වායති, හමාද; සීලගන්ධසමො ගන්ධො, ඒ ශීලගන්ධය හා සමවූ ගන්ධයෙක්; කුතො නාම භවිස්සති, කොහි නම් වේද.

22. සග්ගාරොහණ, ස්වර්ගයට නැඟෙන්නට; සීල සමං, ශීලය හා සමවූ; අඤ්ඤං සොපානං කුතො, අනික් හිනෙක් කොහිද; නිබ්බාන නගරස්ස, නිර්‍වාණ පුරයට; පවෙසනෙ, වදනා තන්හි නොහොත්: ප්‍රවෙශක්‍රියමාණෙහි; [1] ද්වාරං වා පන අඤ්ඤං සීලසමං කුතො, අනික් ශීලය හා සමාන දොරෙක් කොහි ද.

23. සීලභූසන, ශීලාභරණයෙන්; භූසිතා, අලඞ්කෘතවූ; යතිනො, භික්‍ෂූහු; යථා සොභන්ති, යම්සේ හොබිද්ද; මුත්තාමණිවිභූසිතා, මුතු මැණික් විභූෂිතවූ; රාජානො, රජදරුවෝද; එවං න සොභන්ති; එසේ නොහොබිත්.

24. සීලං, ශීලයතෙමෙ; සීලවතං, සිල්වත්නට; සදා, හැමකල්හිම; අත්තානුවාදාදිභයං, තමාමතමාට [2] නින්දාකිරීමෙහි උපදනා භය; (ආදිශබ්දයෙන් දණ්ඩභය දුර්ගතිභය ගැනේ) සබ්බසො, සර්‍වාකාරයෙන්ම; විද්ධංසයති, නසා; කිත්තිං, කීර්ත්තිද; හාසච, හර්‍ෂද; ජනෙති, උපදවා.

---

1 ප්‍රවෙශක්‍රියමානෙහි ගත්තා-ඈතැම්. 2 තමතමාට-ඈතැම්.

25 ගුණානං මූලභූතස්ස දොසානං බලඝාතිනො
ඉති සීලස්ස විඤ්ඤෙය්‍යං ආනිසංසකථාමුඛන්ති.

(අ) ඉදානි යං වුත්තං කතිවිධඤ්චෙතං සීලන්ති. තත්‍රිදං විස්සජ්ජනං:— සබ්බමෙව තාව ඉදං සීලං අත්තනො සීලනලක්ඛණෙන එකවිධං, චාරිත්ත වාරිත්තවසෙන දුවිධං, තථා ආභිසමාචාරික ආදිබ්‍රහ්මචරියක වසෙන, විරති අවිරතිවසෙන, නිස්සිතානිස්සිතවසෙන, කාලපරියන්ත ආපාණකොටිකවසෙන, සපරියන්තාපරියන්තවසෙන, ලොකිය ලොකුත්තරවසෙන ච.

(ආ) තිවිධං හීන මජ්ඣිම පණීතවසෙන, තථා අත්තාධිපතෙය්‍ය ලොකාධිපතෙය්‍ය ධම්මාධිපතෙය්‍යවසෙන, පරාමට්ඨාපරාමට්ඨ පටිප්පස්සද්ධි වසෙන, විසුද්ධාවිසුද්ධවෙමතිකවසෙන, සෙඛාසෙඛ [1]නෙවසෙඛ නාසෙඛ

---

25. ගුණානං මූලභූතස්ස, ගුණයන්ට මුල්වූ; දොසානං බලඝාතිනො, දොෂයන්ගෙ බලයයි කියනලද ව්‍යතික්‍රම නසන්නාවූ; ("දොසානං බලං නාම වජ්ඣාචාරො; තං තෙසං ඝාතුං අදෙන්තං සීලං දොසානං බලං ඝාතෙතීති වෙදිතබ්බං."

"ක්ලෙශාඞ්කුරං න ප්‍රතනොති ශීලං බීජාඞ්කුරං කාල ඉවාති වෘත්තං
ශුචෞ හි ශීලෙ පුරුෂස්‍ය දොෂා මනස්‍යලජ්ජා ඉව ධර්ෂයන්ති"යි.

කියේමැනො;) සීලස්ස, ශීලයාගේ; ආනිසංස කථාමුඛං, ආනෘශංස කථාවාරය; (අනුසස් කීමට දොරය යන අර්ථයි;) ඉති විඤ්ඤෙය්‍යං, මෙසේ දතයුතු.

(අ) ("කතිවිධඤ්චෙතං සීලන්ති යං වුත්තං තත්‍ර ඉදං විස්සජ්ජනං"යි යොදනු.) තාව, පළමුකොට; සබ්බමෙව ඉදං සීලං, සියලු මේ ශීලයම; අත්තනො සීලන ලක්ඛණෙන, තමාගෙ ශීලන සඞ්ඛ්‍යාත ස්වභාවයෙන්; එකවිධං, එකප්‍රකාර වෙ. චාරිත්ත වාරිත්තවසෙන, චාරිත්‍රශීල වාරිත්‍රශීල වශයෙන්; දුවිධං, ද්විප්‍රකාරවෙ; තථා, එසේම; ආභිසමාචාරික ආදි බ්‍රහ්මචරියකවසෙන, ආභිසමාචාරික ශීල ආදිබ්‍රහ්මචරියක ශීල වශයෙනුදු; විරති අවිරති වසෙන, විරතිශීල අවිරතිශීල වශයෙනුදු; නිස්සිතානිස්සිතවසෙන, නිශ්‍රිතශීල අනිශ්‍රිතශීල වශයෙනුදු; කාලපරියන්තසීල ආපාණකොටිකසීලවසෙන, කාලපරියන්තශීල අපාණකොටිකශීල වශයෙනුදු; සපරියන්තාපරියන්තවසෙන, සපරියන්ත ශීල අපරියන්තශීල වශයෙනුදු; ලොකිය ලොකුත්තර වසෙන ච, ලෞකික ශීල ලොකොත්තරශීලවශයෙනු දු; ද්විප්‍රකාර වේ.

(ආ) තිවිධං හීන මජ්ඣිම පණීත වසෙන, හීනශීල මධ්‍යමශීල ප්‍රණීත ශීල වශයෙන් ත්‍රිප්‍රකාර වේ; තථා, එසේම; අත්තාධිපතෙය්‍ය ලොකාධිපතෙය්‍ය ධම්මාධිපතෙය්‍යවසෙන, ආත්මාධිපතිශීල ලොකාධිපතිශීල ධර්මාධිපතිශීලවශයෙන්ද; පරාමට්ඨාපරාමට්ඨපටිප්පස්සද්ධි

---

1 සෙඛා සෙඛ-වි. ටී.

වසෙන ච෴ චතුබ්බිධං හානභාගිය ඨිතිභාගිය විසෙස භාගිය නිබ්බෙධ භාගියවසෙන, තථා භික්ඛුභික්ඛුනීඅනුපසම්පන්නගහට්ඨ සීලවසෙන, පකතිආචාරධම්මතාපුබ්බහෙතුකසීලවසෙන, පාතිමොක්ඛසංවර ඉන්ද්‍රිය සංවර ආජීවපාරිසුද්ධි පච්චයසන්නිස්සිතසීලවසෙන ච෴

(අ) පඤ්චවිධං පරියන්ත පාරිසුද්ධි සීලාදිවසෙන-වුත්තම්පි චෙ තං පටිසම්භිදායං "පඤ්ච සීලානි පරියන්තපාරිසුද්ධිසීලං, අපරියන්තපාරිසුද්ධි සීලං, පරිපුණ්ණපාරිසුද්ධිසීලං, අපරාමට්ඨපාරිසුද්ධිසීලං, පටිප්පස්සද්ධි පාරිසුද්ධිසීලං"ති තථා පහාණ වෙරමණී චෙතනා සංවර වීතික්කම වසෙන෴

(ආ) තත්‍ථ එකවිධකොට්ඨාසෙ අත්‍ථො වුත්තනයෙනෙව වෙදිතබ්බො. දුවිධකොට්ඨාසෙ:- යං භගවතා "ඉදං කත්තබ්බන්ති" පඤ්ඤත්ත සික්ඛාපදපූරණං තං චාරිත්තං, "ඉදං න කත්තබ්බන්ති" පටික්ඛිත්තස්ස අකරණං තං වාරිත්තං. තත්‍රායං වචනත්‍ථො:- චරන්ති තස්මිං සීලෙ

---

වසෙන, පරාමෘෂ්ටශීල අපරාමෘෂ්ටශීල ප්‍රතිප්‍රශ්‍රබ්ධිශීල වශයෙන් ද; විසුද්ධාවිසුද්ධවෙමතිකවසෙන, විශුද්ධශීල අවිශුද්ධශීල වෛමතිකශීල වශයෙන් ද; සෙඛාසෙඛනෙවසෙඛනාසෙඛවසෙන ච, සෛඛශීල අසෛඛශීල නෛවසෛඛනාසෛඛශීල වශයෙනුදු ත්‍රිප්‍රකාර වෙ. චතුබ්බිධං හානභාගිය ඨිතිභාගිය විසෙසභාගිය නිබ්බෙධභාගියවසෙන, හානභාගියශීල ස්ථිතිභාගියශීල විශෙෂභාගියශීල නිර්වේධභාගියශීල වශයෙන් චතුර්විධ වෙ-තථා, එසේම; භික්ඛු භික්ඛුනී අනුපසම්පන්න ගහට්ඨසීලවසෙන, භික්ෂුශීල භික්ෂුණීශීල අනුපසම්පන්නශීල ගෘහස්ථශීල වශයෙනුදු; පකතිආචාරධම්මතාපුබ්බහෙතුකසීලවසෙන, ප්‍රකෘතිශීල ආචාරශීල ධර්මතාශීල පූර්වහෙතුකශීල වශයෙන් ද; පාතිමොක්ඛසංවර ඉන්ද්‍රියසංවර ආජීවපාරිසුද්ධිපච්චය සන්නිස්සිතසීල වසෙන ච, ප්‍රාතිමොක්ෂසංවරශීල ඉන්ද්‍රියසංවරශීල ආජීවපාරිශුද්ධිශීල ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීල වශයෙන් ද චතුර්විධවේ:—

(අ)පඤ්චවිධංපරියන්තපාරිසුද්ධිසීලාදිවසෙන,පර්‍යන්තපාරිශුද්ධිශීලාදි වශයෙන් පඤ්චවිධ වෙ; වුත්තම්පිචෙතං පටිසම්භිදායං, ප්‍රතිසම්භිදායෙහි ද මෙම කියනලදී; පඤ්චසීලානි,ශීලයො පස්දෙනෙකි;පරියන්තපාරිසුද්ධිසීලං, පර්‍යන්ත පාරිශුද්ධිශීලය; අපරියන්තපාරිසුද්ධිසීලං, අපර්‍යන්ත පාරිශුද්ධිශීලය;පරිපුණ්ණපාරිසුද්ධිසීලං,පරිපූර්ණපාරිශුද්ධිශීලය;අපරාමට්ඨ පාරිසුද්ධි සීලං, අපරාමෘෂ්ටපාරිශුද්ධිශීලය; පටිප්පස්සද්ධිපාරිසුද්ධිසීලන්ති, ප්‍රතිප්‍රශ්‍රබ්ධිපාරිශුද්ධිශීලයයි මෙසේ පඤ්චප්‍රකාර වෙ; තථා පහාණ වෙරමණීචෙතනා සංවරවීතික්කමවසෙන, ප්‍රහාණශීල වෛරමණීශීල චෙතනාශීල සංවරශීල අව්‍යතික්‍රමශීල වශයෙන් එසේමපඤ්චවිධවේ:-

(ආ) තත්‍ථ, එහි; එකවිධකොට්ඨාසෙ අත්‍ථො, ඒකප්‍රකාරකොටසඅර්‍ථ; වුත්තනයෙනෙව, "සීලනට්ඨෙන සීලං" යනාදීන් යටකී නයින්ම; වෙදිතබ්බො, දතයුතු; දුවිධකොට්ඨාසෙ, ද්විප්‍රකාර කොටස; භගවතා,

පරිපූරකාරිතාය පවත්තන්තීති චාරිත්තං, වාරිතං තායන්ති රක්ඛන්ති තෙනාති වාරිත්තං, තත්ථ සද්ධා විරියසාධනං චාරිත්තං, සද්ධාසාධනං වාරිත්තං. එවං චාරිත්ත වාරිත්තවසෙන දුවිධං. දුතියදුකෙ අභිසමාචාරොති උත්තමසමාචාරො අභිසමාචාරො ව ආභිසමාචාරිකං, අභිසමාචාරං වා ආරබ්භ පඤ්ඤත්තං ආභිසමාචාරිකං ආජීවට්ඨමකතො අවසෙසසීලස්සෙතං අධිවචනං. මග්ගබ්‍රහ්මචරියස්ස ආදිභාවභූතන්ති ආදිබ්‍රහ්මචරියකං, ආජීවට්ඨමක සීලස්සෙතං අධිවචනං තංහි මග්ගස්ස ආදිභාවභූතං පුබ්බභාගෙයෙව පරිසොධෙතබ්බතො.

---

භගවත්හු විසින්; ඉදං කත්තබ්බන්ති, මෙ ආභිසමාචාරිකය කටයුතු යයි; යං පඤ්ඤත්තසික්ඛාපදපූරණං, පනවනලද ශික්ෂාපද ශීලයාගෙ යම්පිරීමෙක්ඇද්ද; තං චාරිත්තං, හේ චාරිත්‍රනම; යං, යමෙක්; ඉදං නකත්තබ්බන්ති; මේ දුශ්චරිතය නොකටයුතුයයි; පටික්ඛිත්තං, ප්‍රතික්ෂෙප කරනලදද; තස්ස අකරණං, ඒ දුශ්චරිතයාගෙ නොකිරීම; වාරිත්තං, වාරිත්‍රනම්; තත්‍ර, ඒ චාරිත්‍ර වාරිත්‍ර ශබ්දදෙක්හි; අයං වචනත්ථො, මෙ වචනාර්ථයි; තස්මිං සීලෙ, ඒ ශීලයෙහි; චරන්ති, හැසිරෙත්; පරිපූරකාරිතාය, සම්පූර්ණකාරී බැවින්; පවත්තන්තීති, පවතිත්නුයි; චාරිත්තං, චාරිත්‍රනම්; වාරිතං, මෙ නොකට යුතුයයි වැළකූ ආකල්පය; තෙන, ඒ වාරිත්‍රය කරණකොටගෙන; තායන්ති සීසේයි; රක්ඛන්තීති, රකිත්නුයි; වාරිත්තං, වාරිත්‍රනම්; තත්ථ, එදෙක්හි; චාරිත්තං, චාරිත්‍රය; සද්ධාවිරියසාධනං, ශ්‍රද්ධාරහිතයද කුසීතයද වත්පිළිවෙත් නොපුරනබැවින් ශ්‍රද්ධාවෙන් හා වීර්‍ය්‍යයෙන් සැධියයුත්තේයි; සද්ධා සාධනං වාරිත්තං, වාරිත්‍රශීලය ශ්‍රද්ධාවෙන් [1] සැධියයුතු; අභිසමාචාරොති, අභිසමාචාරනම්; උත්තමසමාචාරො, අධිශීල ශික්ෂාපර්‍ය්‍යාපන්න බැවින් උත්තමසමාචාරයයි; අභිසමාචාරො ච, අභිසමාචාරය ම; ආභිසමාචාරිකං, ආභිසමාචාරික නම්වෙ; (වෛණයිකො, යනුමෙන් ස්වාර්ථයෙහි "ණික" ප්‍රත්‍යය දතයුතු.) අභිසමාචාරංවා ආරබ්භ පඤ්ඤත්තං, උත්කෘෂ්ටනිර්දෙශයෙන් මාර්ගශීල ඵලශීල අභිසමාචාර නම; එ උදෙසා තත්ප්‍රයොජනකොටපනවනලද්දේ; ආභිසමාචාරිකං, ආභිසමාචාරික නම්; ආජීවට්ඨමකතො, සුපරිශුද්ධ ත්‍රිවිධකායකර්මය හා චතුර්විධ වාක්කර්මය හා පරිශුද්ධආජීවය යනමෙ ආජීවාෂ්ටමකශීලයා කෙරෙන්; අවසෙසසීලස්ස, අවශෙෂශීලයට; එතං අධිවචනං, "ආභිසමාචාරිකය" යනු මෙ නමෙකි;-මග්ගබ්‍රහ්මචරියස්ස, (ශ්‍රෙෂ්ඨබැවින් මාර්ගය මාර්ග බ්‍රහ්මචරියා නම ඒ) මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයට; ආදිභාවභූතන්ති, ආදියෙහි ඉපදවියයුතුනුයි; ආදිබ්‍රහ්මචරියකං, ආදිබ්‍රහ්මචරියක නම්; ("මග්ගබ්‍රහ්මචරියස්ස ආදිම්හි භාවෙතබ්බත්තං නිප්ඵාදෙතබ්බත්තං පත්තනන්ති ආදිභාවභූතං" යනුවේ.) ආජීවට්ඨමකසීලස්සෙතං අධිවචනං, ආජීවාෂ්ටමක ශීලයට මෙ නමෙකි; තං හි, හෙතෙම; මග්ගස්ස ආදිභාවභූතං,

---

1 සැදියයුතු-මු. ස.

(අ) තෙනාහ:–"පුබ්බෙව ඛො පනස්ස කායකම්මං වචීකම්මං ආජීවො සුපරිසුද්ධො හොතී"ති යානි වා සික්ඛාපදානි ඛුද්දානුඛුද්දකානීති වුත්තානි ඉදං ආභිසමාචාරිකං සීලං, සෙසං ආදිබ්‍රහ්මචරියකං. උභතොවිභඞ්ගපරියාපන්නං වා ආදිබ්‍රහ්මචරියකං, ඛන්ධකවත්ත පරියාපන්නං වා ආභිසමාචාරිකං, තස්ස සම්පත්තියා ආදිබ්‍රහ්මචරියකං සම්පජ්ජති. තෙනෙවාහ:–"සො වත භික්ඛවෙ භික්ඛු ආභිසමාචාරිකං ධම්මං අපරිපූරෙත්වා ආදිබ්‍රහ්මචරියකං ධම්මං පරිපූරෙස්සතීති නෙතං ඨානං විජ්ජතී"ති එවං ආභිසමාචාරික ආදිබ්‍රහ්මචරියකවසෙන දුවිධං.

(ආ) තතියදුකෙ–පාණාතිපාතාදීහි වෙරමණිමත්තං විරතිසීලං, සෙසං චෙතනාදි අවිරතිසීලන්ති, එවං විරති අවිරතිවසෙන දුවිධං.

---

මාර්ගයට ආදියෙහි ඉපදවිය යුතු වී;–(දෙශනාක්‍රමයෙන් සම්‍යග්දෘෂ්ටිය ආදියයි–ප්‍රතිපත්ති ක්‍රමයෙහි වනාහි ප්‍රාතිමොක්‍ෂ සංවරශීල නැති ගිහි වැස්සනු දු අවශ්‍යයෙන් පිරියයුතු බැවින් ආජීවය අටවනු කොට ඇති ශීලය ආදි බැවින් කීහ. "ආදිභාවභූතං"යි.) ආදිම්හි යෙව පරිසොධෙතබ්බතො, ආදියෙහිම පිරිසුදු කටයුතු හෙයින්;

(අ) තෙනාහ, එහෙයින් මවදළහ; අස්ස, ඔහුගෙ; පුබ්බෙව, පූර්වයෙහිම; කායකම්මං, කායකර්මය ද; වචීකම්මං, වාක්කර්මය ද; ආජීවො, ආජීවය ද; සුපරිසුද්ධො හොතී ති, සුපරිශුද්ධ වෙයි; යානිවා සික්ඛාපදානි, දෙශනාගාමීවූ දුෂ්කෘත දුර්භාෂිතවූහො යම් ශික්‍ෂාපදකෙනෙක්; ඛුද්දානුඛුද්දකානීති වුත්තානි, ක්‍ෂුද්‍රානුක්‍ෂුද්‍රශික්‍ෂාපදයයි කියනලදහුද; ඉදං ආභිසමාචාරිකං සීලං, මෙ ආභිසමාචාර්යිකශීල නම; සෙසං ආදිබ්‍රහ්මචරියකං, සෙස්ස ආදිබ්‍රහ්මචරියක ශීල නම්; උභතොවිභඞ්ග පරියාපන්නං වා, උභතොවිභඞ්ගපරියාපන්නශීලය හෝ; ආදිබ්‍රහ්මචරියකං, ආදිබ්‍රහ්මචරියක නම; ඛන්ධකවත්තපරියාපන්නං, (ආභිසමාචාරික) ස්කන්ධකවෘත්ත පර්‍ය්‍යාපන්න ශීලය; ආභිසමාචාරිකං, ආභිසමාචාරික නම්; තස්ස සම්පත්තියා, ආභිසමාචාරික ඒ ශීලයාගෙ සම්පත්තීන් (පිරීමෙන්); ආදිබ්‍රහ්මචරියකං සම්පජ්ජති, ආදිබ්‍රහ්මචරියකය පිරේ; (යමෙක් ලහුකවූ අල්පසාවද්‍යයන් දුරුකෙරේනම් හෙතෙම ගුරුවූ මහාසාවද්‍යයන් දුරුකෙරෙයි යනුයෙහි කියයුතුම නැත යන මෙ අන්වය ව්‍යතිරෙකවශයෙන් දක්වන්නේ "තෙනෙවාහ" යනාදි කී.) භික්ඛවෙ, මහණෙනි; සො භික්ඛු, ඒ මහණ; ආභිසමාචාරිකං ධම්මං අපරිපූරෙත්වා, ආභිසමාචාරිකශීලය නො පුරා; ආදිබ්‍රහ්මචරියකං ධම්මං පරිපූරෙස්සතීති, ආදිබ්‍රහ්මචරියකශීලය පුරන්නේයයි; නෙතං ඨානං විජ්ජතීති, මෙ කාරණ නැතැයි; (ක්‍ෂුද්‍රාපත්තිමඬන සුළු ඉහි පරිචයෙන් මහත්ආපත්ති දු මඬනාබැවිනු දු ආභිසමාචාරික සිල් පුරතු දු ඒ සිල් සමාධිවිපස්සනාවට පදස්ථානනොවන්නෙනු දු "නෙතං ඨානං විජ්ජති"යුහු)...පෙ...

(ආ) තතියදුකෙ–යන්නෙහි; පාණාතිපාතාදීහි වෙරමණිමත්තං ප්‍රාණාතිපාතාදීන්කෙරෙන් විරමණමාත්‍රය; විරතිසීලං, විරතිශීලනම්;

චතුත්ථදුකෙ-නිස්සයොති ද්වෙ නිස්සයා තණ්හානිස්සයො ච දිට්ඨිනිස්සයො ච. “තත්‍ර යං” ඉමිනාහං සීලෙන දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වා”ති එවං භවසම්පත්තිං ආකඞ්ඛමානෙන පවත්තිතං ඉදං තණ්හානිස්සිතං, යං සීලෙන සුද්ධීති එවං සුද්ධිදිට්ඨියා පවත්තිතං ඉදං දිට්ඨිනිස්සිතං, යම්පන ලොකුත්තරං ලොකියඤ්ච තස්සෙව සම්භාරභූතං ඉදං අනිස්සිතන්ති එවං නිස්සිතානිස්සිතවසෙන දුවිධං෴පඤ්චමදුකෙ-කාලපරිච්ඡෙදං කත්වා සමාදින්නං සීලං කාලපරියන්තං, යාවජීවං සමාදියිත්වා තථෙව පවත්තිතං ආපාණකොටිකන්ති එවං කාලපරියන්ත ආපාණකොටිකවසෙන දුවිධං෴

(අ) ඡට්ඨදුකෙ-ලාභයසඤාතිඅඞ්ගජීවිතවසෙන දිට්ඨපරියන්තං සපරියන්තං නාම, විපරීතං අපරියන්තං, වුත්තම්පි චෙතං පටිසම්භිදායං “කතමන්තං සීලං සපරියන්තං? අත්ථි සීලං ලාභපරියන්තං, අත්ථි සීලං යසපරියන්තං, අත්ථි සීලං ඤාතිපරියන්තං, අත්ථි සීලං අඞ්ගපරියන්තං,

---

සෙසචෙතනාදි අවිරතිසීලන්ති, සෙසු චෙතනාදි අවිරති ශීල නම්; චතුත්ථදුකෙ,-යන්නෙහි; නිස්සයො ති, නිශ්‍රය නම්; ද්වෙ නිස්සයා, නිශ්‍රයයෝ දෙදෙනෙකි; තණ්හානිස්සයො ච දිට්ඨිනිස්සයො ච, තෘෂ්ණානිශ්‍රය ය දෘෂ්ටිනිශ්‍රය යි; තත්‍ර, එදෙක්හි; යං යම් ශීලයෙක්; අහං ඉමිනා සීලෙන, මම මේ ශීලයෙන්; දෙවො වා, ශක්‍රසුයාමාදි දෙවියෝ හෝ වෙමි; දෙවඤ්ඤතරො වා, සෙසු ශක්‍රාදීන්සේනොව එක්තරා දෙවියෝ හෝ වෙමි යි; එවං, මෙසේ; භවසම්පත්තිං ආකඞ්ඛමානෙන, භවසම්පත්ති කැමැත්තහු විසින්; පවත්තිතං, පවත්වන ලද්දේ; ඉදං, මේ; තණ්හානිස්සිතං, තෘෂ්ණානිශ්‍රිත නම; යං, යම් ශීලයෙක්; සීලෙන සුද්ධීති එවං සුද්ධිදිට්ඨියා පවත්තිතං, සිලින් සංසාර ශුද්ධියයි මෙසේ ශුද්ධදෘෂ්ටීන් පවත්වනලද ද; ඉදං, මේ ශීලය; දිට්ඨිනිස්සිතං, දෘෂ්ටිනිශ්‍රිතශීල නම්; යම්පන ලොකුත්තරං, යම් ලොකොත්තර ශීලයෙක් ඇද්ද; තස්සෙව සම්භාරභූතං, ඒ ලොකොත්තර ශීලයට ම කාරණවූ; යඤ්ච ලොකියං, යම් ලෞකික ශීලයෙක් ඇද්ද; ඉදං අනිස්සිතං, මේ අනිශ්‍රිතශීල නම; ෴ පෙ෴ පඤ්චමදුකෙ, යන්නෙහි; කාලපරිච්ඡෙදං කත්වා, “ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං” යනාදීන් කාලවශයෙන් පරිච්ඡෙද කොට; සමාදින්නං සීලං, සමාදන්වනලද ශීලය; කාලපරියන්තං, කාලපර්‍ය්‍යන්ත නම; යාවජීවං සමාදියිත්වා, යාවජීවයෙන් සමාදන්ව; තථෙව පවත්තිතං, එසේම පවත්වනලද්දේ, ආපාණකොටිකං, ආපාණකොටික නම්.

(අ) ඡට්ඨදුකෙ, සවනදුකයෙහි; ලාභයසඤාතිඅඞ්ගජීවිතවසෙන, (කාලපරිච්ඡෙද නොකොට සමාදන්වන ශීලය අනතරයෙහි විවජ්නපා මුළුයෙ ද සම්පත්තවිරති වශයෙන් උපන්නාවුන්ගෙ) රක්ෂණ වර්ජන වශයෙනු දූ ඤාතිඅඞ්ගජීවිතයන්ගෙ අවිනාසවශයෙනු දූ; දිට්ඨපරියන්තං, දෘෂ්ටපර්‍ය්‍යවසාන ඇති ශීලය; සපරියන්තං නාම, සපර්‍ය්‍යන්තශීල

අත්‍ථි සීලං ජීවිතපරියන්තං. කතමන්තං සීලං ලාභපරියන්තං, ඉධෙකච්චො ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා යථාසමාදින්නං සික්ඛාපදං වීතික්කමති, ඉදං තං සීලං ලාභපරියන්තං" ති එතෙනෙව උපායෙන ඉතරානි පි විත්‍ථාරෙතබ්බානි. අපරියන්තවිස්සජ්ජනෙ පි වුත්තං:– "කතමන්තං සීලං න ලාභපරියන්තං? ඉධෙකච්චො ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා යථාසමාදින්නසික්ඛාපදවීතික්කම [1] චිත්තම්පි න උප්පාදෙති, කිං සො වීතික්කමිස්සති, ඉදං තං සීලං න ලාභපරියන්තං"ති එතෙනෙව උපායෙන ඉතරානි පි විත්‍ථාරෙතබ්බානි. එවං සපරියන්තාපරියන්තවසෙන දුවිධං.

(ඇ) සත්තමදුකෙ–සබ්බම්පි සාසවං සීලං ලොකියං, අනාසවං ලොකුත්තරං. තත්‍ථ ලොකියං භවවිසෙසාවහං හොති භවනිස්සරණස්ස ච සම්භාරො.

---

නම්; විපරීතං අපරියන්තං, ලාභාදි විසින් අදෘෂ්ටපර්‍ය්‍යවසාන ඇති ශීලය; අපර්‍ය්‍යන්තශීල නම්; පෙ. කතමන්තං සීලං සපරියන්තං, කවර සේ ශීලයෙක් සපර්‍ය්‍යන්ත නම් ද; "ලාභ පරියන්තං සීලං අත්‍ථි" (යොදනු.) ලාභපර්‍ය්‍යන්ත ශීලයෙකු දු ඇත; (සෙසුපෙදෙහි දු මෙසේම අර්‍ත්‍ථ බණනු.) කතමන්තං සීලං ලාභපරියන්තං, කවර සේ ශීලයෙක් ලාභපර්‍ය්‍යන්තවේද; ඉධ, මෙහි; එකච්චො, එකෙක්; ලාභහෙතු, ලාභහෙතුවෙන්; ලාභපච්චයා, ලාභප්‍රත්‍යයෙන්; ලාභකාරණා, ලාභකාරණයෙන්;(හෙතු ප්‍රත්‍යය දෙදෙනා මෙතැන එකාර්‍ත්‍ථ බව හඟවනු පිණිස "ලාභකාරණා"යි කීහු.) යථා සමාදින්නසික්ඛාපදං වීතික්කමති, (මෙතෙක් දවස් රකිමියි කාලපරිච්ඡෙද කොට හෝ නොකොට හෝ මෙතෙක් ශික්ෂාපද රකිමි යි ශික්ෂාපරිච්ඡෙද කොට හෝ නොකොට හෝ) සමාදන්වනලද ශික්ෂාපදය ඉක්මෙන්නේ වීනම්; ඉදං තං සීලං ලාභ පරියන්තංති, මේ ශීලය ලාභපර්‍ය්‍යන්තයයි; එතෙනෙව උපායෙන, මෙම උපායෙන්; ඉතරානි පි (පදනි) විත්‍ථාරෙතබ්බානි, සෙසු පදයෝද විස්තරකටයුත්තාහුයි;–අපරියන්තවිස්සජ්ජනෙපි, අපර්‍ය්‍යන්තශීල විසර්ජනයෙහි දු; වුත්තං, කියනලදී; කතමන්තං සීලං න ලාභපරියන්තං, කවර ශීලයෙක් ලාභපර්‍ය්‍යන්ත නොවේද; ඉධ, මෙහි; එකච්චො, එකෙක් පෙ. යථා සමාදින්න සික්ඛාපද, කී පරිද්දෙන් සමාදන්වනලද ශික්ෂාපදය; වීතික්කමචිත්තම්පි න උප්පාදෙති, ව්‍යතික්‍රම පිණිස සිත ද නොඋපදවන්නෙය; කිං සො වීතික්කමිස්සති, හේ ව්‍යතික්‍රම කෙරෙයි යනු කිම; (ව්‍යතික්‍රම නොකෙරේමය යන අර්‍ත්‍ථයි;) ඉදන්තං සීලං, මේ ශීලය; න ලාභ පරියන්තංති, ලාභ පර්‍ය්‍යන්ත නොවේ.

(ඇ) සත්තම දුකෙ, සත්වන ද්විකයෙහි; සබ්බම්පි සාසවං සීලං, සියලු සාශ්‍රව ශීලයම; ලොකියං, ලෞකික නම; (කාමා අරමුණුකරන ආශ්‍රවයන්

---

1, වීතික්කමාය-මු.

(අ) යථාහ:- "විනයො සංවරත්ථාය, සංවරො අවිප්පටිසාරත්ථාය, අවිප්පටිසාරො පාමොජ්ජත්ථාය, පාමොජ්ජං පීතත්ථාය, පීතිපස්සද්ධත්ථාය, පස්සද්ධි සුඛත්ථාය, සුඛං සමාධත්ථාය, සමාධි යථාභූතඤාණදස්සනත්ථාය, යථාභූතඤාණදස්සනං නිබ්බිදත්ථාය, නිබ්බිදා විරාගත්ථාය, විරාගො විමුත්තත්ථාය, විමුත්ති විමුත්තිඤාණදස්සනත්ථාය, විමුත්තිඤාණදස්සනං අනුපාදාපරිනිබ්බානත්ථාය, එතදත්ථා කථා එතදත්ථා මන්තනා එතදත්ථා උපනිසා එතදත්ථං සොතාවධානං, යදිදං අනුපාදාචිත්තස්ස විමොක්ඛො"ති ලොකුත්තරං භවනිස්සරණාවහං හොති පච්චවෙක්ඛණඤාණස්ස භූමීති. එවං ලොකියලොකුත්තරවසෙන දුවිධං.

---

හා සමග පවත්නෙන් ත්‍රෛභූමක ධර්මයෝ සාසවනම-තත්පර්‍යාපන්න බැවින් ශීලය ද සාසව නමැයි දන්නේ.) අනාසවං, අනාශ්‍රව ශීලය; ලොකුත්තරං, ලෝකෝත්තර නම; තත්‍ථ, එ දෙක්හි; ලොකියං, ලෞකික ශීලය; භවවිසෙසාවහං, හොති, සුගතියෙහි ම උපදවන බැවින් භවවිශෙෂය එළවන්නෙය; භවනිස්සරණස්ස ච සම්භාරො, නිවන්හි අදහසින් රක්නාහට විදර්ශනාපාදක වන බැවින් භවනිර්ගමනයට ද ප්‍රත්‍යයවේ; (නිර්‍වාණයටද උපනිශ්‍රයවේය යන අර්‍ථයි.)

(අ) යථාහ, වදාළේමය; විනයො, විනයතෙමෙ; සංවරත්ථාය, සංවරය පිණිස වෙයි; (සංවරයට උපනිශ්‍රය වෙයි යන අර්‍ථයි මෙහි විනය පෙළ හෝ ඉහි ආ සිකපද හෝ විනය නමි.) සංවරො; සංවරය තෙමෙ; අවිප්පටිසාරත්ථාය, අවිප්‍රතිසාරය පිණිස වෙ; අවිප්පටිසාරො, අවිප්‍රතිසාරය තෙමෙ; පාමොජ්ජත්ථාය, ප්‍රමොද්‍යය පිණිස වෙ; (තරුණප්‍රීතිය ප්‍රමොද්‍යනම් බලවත් ප්‍රීතිය ප්‍රීති නම්-ශීලයෙහි කලඹකනැති බැවින් ම ශීලය ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නහු සිත පීඩා නොවන්නෙන් "සංවරො පාමොජ්ජත්ථාය" යි කීහු.) පාමොජ්ජං, ප්‍රමොද්‍යය; පීතත්ථාය, ප්‍රීතිය පිණිස වෙ; පීති, ප්‍රීතිතොමො; පස්සද්ධත්ථාය, ප්‍රීතින් පිරුණුබැවින් සන්හිඳීම පිණිස වෙ; පස්සද්ධි, ප්‍රශ්‍රබ්ධිය; සුඛත්ථාය, සුව පිණිස වෙ; සුඛං, සුඛය; සමාධත්ථාය, සමාධිය පිණිස වෙ; (නාමරූප පරිග්‍රහයෙන් පෙරටු ක්‍ෂණිකසමාධිය ද අර්පණාසමාධිය ද පිණිස වේය යන අර්‍ථයි.) සමාධි, සමාධිතෙමෙ; යථාභූතඤාණදස්සනත්ථාය, සප්‍රත්‍යය නාමරූපදර්ශනය පිණිස තදධිෂ්ඨාන තරුණවිදර්ශනාව පිණිස හෝ වෙ; යථාභූතඤාණදස්සනං, යථාභූතඥානදර්ශනය; නිබ්බිදත්ථාය, නිර්වේදඥානය පිණිස වෙ; (මෙයින් බලවත් විදර්ශනා කීහු.) නිබ්බිදා, නිර්වේදඥානය තෙමෙ; විරාගත්ථාය, මාර්ගය පිණිස වෙ; විරාගො, විරාගයතෙමෙ; විමුත්තත්ථාය, අර්හත්ඵලවිමුක්තිය පිණිස වෙ; විමුත්ති, විමුක්තිතොමො; විමුත්තිඤාණදස්සනත්ථාය, ප්‍රත්‍යවෙක්‍ෂාඥානය පිණිස වෙ; විමුත්තිඤාණදස්සනං, විමුක්තිඥානදර්ශනය; අනුපාදාපරිනිබ්බානත්ථාය, අනුපාදා පරිනිර්වාණය පිණිස වෙ; යදිදං, යම් මේ; අනුපාදාචිත්තස්සවිමොක්ඛො, අනුපාදාචිත්තවිමොක්‍ෂයෙක් ඇද්ද;

(අ) තිකෙසු:-පඨමත්තිකෙ හීනෙන ඡන්දෙන චිත්තෙන විරියෙන වීමංසාය වා පවත්තිතං හීනං, මජ්ඣිමෙහි ඡන්දාදීහි පවත්තිතං මජ්ඣිමං, පණීතෙහි පණීතං, යසකාමතාය වා සමාදින්නං හීනං, පුඤ්ඤඵලකාමතාය මජ්ඣිමං, කත්තබ්බමෙවිදන්ති අරියභාවං නිස්සාය සමාදින්නං පණීතං. අහමස්මි සීලසම්පන්නො ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ දුස්සීලා පාපධම්මාති, එවං අත්තුක්කංසනපරවම්භනාහි [1] උපක්කිලිට්ඨං වා හීනං, අනුපක්කිලිට්ඨං ලොකියං සීලං මජ්ඣිමං, ලොකුත්තරං පණීතං. තණ්හාවසෙන වා භවභොගත්ථාය පවත්තිතං හීනං, අත්තනො විමොක්ඛත්ථාය පවත්තිතං මජ්ඣිමං, සබ්බසත්තවිමොක්ඛත්ථාය පවත්තිතං පාරමිතාසීලං පණීතන්ති එවං හීනමජ්ඣිමපණීතවසෙන තිවිධං...

---

එතදත්ථා කථා, විනයකථාතොමෙ මෙ අනුපාද විමොක්ෂයම ප්‍රයොජනකොට ඇත්තීයි; එතදත්ථා මන්තනා, කල්‍යාකල්‍යවශයෙන් විනය විචාරණද මෙම ප්‍රයොජනකොට ඇත්තීයි; එතදත්ථා උපනිසා, "විනයොසංවරත්ථාය" යනාදි යථොක්ත කාරණපරම්පරාසඞ්ඛ්‍යාත උපනිශ්‍රයද මෙම ප්‍රයොජනකොට ඇත්තීයි; එතදත්ථං සොතාවධානං, කන්නතුකිරීම (ශ්‍රවණමය ඥානය යන අර්ථයි) මෙ ප්‍රයොජනකොට ඇත්තේයි; (මෙහි "අනුපාද චිත්තස්ස විමොක්ඛො" යනු මාර්ගය. මාර්ගය සිඛවත්ම විමුක්තිය විමුක්තිඥානදර්ශනය අනුපාද පරිනිර්වාණය යන මොවුන් සිඛවන බැවින් "එතදත්ථා කථා" යනාදි ඒ අනුපාද විමොක්ෂය පිණිසයයි කීහු, එසේ උවහොත් "විරාගත්ථාය" යනුයෙහිම නොසිටුවා "විරාගො විමුත්තත්ථාය" යනාදි කුමට කීහයත්? පරම්පරෙපනිශ්‍රය නිෂ්ඨාවට පැමිණීතැන් දක්වනුපිණිස කීහු.) ලොකුත්තරං, මාර්ගඵල සම්ප්‍රයුක්ත ආජීවාෂ්ටමක ශීලය; භවනිස්සරණාවහං හොති, භවනිස්සරණය එළවයි; පච්චවෙක්ඛනඤාණස්ස ච භූමි හොති, ප්‍රත්‍යවෙක්ෂාඥානයටද භූමිවේ; (මෙහි මාර්ගශීලය භවනිස්සරණයද කෙරෙයි ප්‍රත්‍යවෙක්ෂාවට ද භූමිවෙයි-ඵලශීලය ප්‍රත්‍යවෙක්ෂාවටම භූමිවේ.)

(අ) තිකෙසු, ත්‍රිකයන් කෙරෙහි; පඨමත්තිකෙ, පළමුවන ත්‍රිකයෙහි; හීනෙන, හීනවූ; ඡන්දෙන, ඡන්දයෙන් හෝ; චිත්තෙන, සිතින් හෝ; විරියෙන, වීර්‍යයෙන් හෝ; වීමංසායවා, ප්‍රඥාවෙන් හෝ; පවත්තිතං, පවත්වන ලද්දේ; හීනං, හීන නම; මජ්ඣිමෙහි ඡන්දාදීහි, මධ්‍යම වූ ඡන්දාදීන්; පවත්තිතං, පවත්වනලද්දේ; මජ්ඣිමං, මධ්‍යමනම; පණීතෙහි, ප්‍රණීතවූ ඡන්දාදීන්; (පවත්තිතං,) පවත්වන ලද්දේ; පණීතං, ප්‍රණීතනම්; (මෙහි ඡන්දාදීන්ගෙ හීන මධ්‍යම ප්‍රණීත බව හීනමධ්‍යමප්‍රණීත අධිමුක්ති වශයෙන් වෙයි:-යම්සේ කර්මය ආයූහනවශයෙන් හීනාදිභෙද භින්නවේද එසේම ඡන්දාදීහුදු ප්‍රවෘත්ත්‍යාකාර වශයෙන් හීනාදිභෙදයෙන් භින්නවෙති. ඒ ඒ ප්‍රවෘත්ත්‍යාකාරය ද අධිමුක්තිභෙදයෙනැයි දතයුතු.) යසකාමතාය වා සමාදින්නං හීනං, කීර්ත්තියෙහි (ස්තුතියෙහි)

---

[1] අත්තුක්කංසන පරවම්භකාදීසි-ත්‍රි. මු.

(ඇ) දුතියත්තිකෙ-අත්තනො අනනුරූපං පජහිතුකාමෙන අත්තගරුනා අත්තනි ගාරවෙන පවත්තිතං අත්තාධිපතෙය්‍යං, ලොකාපවාදං පරිහරිතුකාමෙන ලොකගරුනා ලොකෙ ගාරවෙන පවත්තිතං ලොකාධිපතෙය්‍යං, ධම්මමහත්තං පූජෙතුකාමෙන ධම්මගරුනා ධම්මෙ ගාරවෙන පවත්තිතං ධම්මාධිපතෙය්‍යන්ති එවං අත්තාධිපතෙය්‍යාදිවසෙන තිවිධං෴ තතියත්තිකෙ-යං දුකෙසු නිස්සිතන්ති වුත්තං තං තණ්හාදිට්ඨීහි පරාමට්ඨත්තා පරාමට්ඨං, පුථුජ්ජනකල්‍යාණකස්ස මග්ගසම්භාරභූතං සෙඛානඤ්ච මග්ගසම්පයුත්තං අපරාමට්ඨං, සෙඛාසෙඛානං ඵලසම්පයුත්තං පටිප්පස්සද්ධන්ති එවං පරාමට්ඨාදිවසෙන තිවිධං෴

---

අභිරතියෙන් සමාදන්වනලද්දේ හීනනම්; පුඤ්ඤඵලකාමතාය මජ්ඣිමං, පුණ්‍යඵලයෙහි අභිරතියෙන් සමාදන්වනලද්දේ මධ්‍යම නම්; කත්තබ්බමෙවිදන්ති, මෙ කටයුතුමය; (එබඳුවෙක් මෙබඳුවක් කෙසේ නම් නොකෙරේදැයි) අරියභාවං නිස්සාය, මනාබව ආශ්‍රය කොට; සමාදින්නං පණීතං, සමාදන්වනලද ශීලය ප්‍රණීත නම්; අහමස්මි සීලසම්පන්නො, මම සීලසම්පන්නයෙමි; ඉමෙ පන අඤ්ඤෙ භික්ඛූ, මෙ සෙසු භික්ෂූහු; දුස්සීලා, දුස්සීලයහ; පාපධම්මාති, පාපධර්මය හයි; එවං, මෙසේ; අත්තුක්කංසනපරවම්භනාහි, ආත්මොත්කර්ෂණය පරපරිභවය යන මෙයින්; උපක්කිලිට්ඨංවා, කිලුටුවූයේ හෝ; හීනං, හීන නම; අනුපක්කිලිට්ඨං, අත්තුක්කංසන පරවම්භනාවෙනු දූ සෙසු උපක්ලෙශයෙනු දූ නොකිලුටුවූ; ලොකියං සීලං මජ්ඣිමං, ලෞකික ශීලය මධ්‍යම නම; ලොකුත්තරං පණීතං, ලොකොත්තර ශීලය ප්‍රණීත නම්;-තණ්හාවසෙනවා, තෘෂ්ණා වශයෙන් හෝ; භවභොගත්ථාය පවත්තිතං, භවසම්පත්ති පිණිසද භොගසම්පත්ති පිණිසද් පවත්වනලද්දේ; හීනං, හීනනම්; අත්තනොවිමොක්ඛත්ථාය පවත්තිතං මජ්ඣිමං, තමාගෙ විමොක්ෂය පිණිස පවත්වනලද්දේ මධ්‍යම නම; සබ්බසත්තවිමොක්ඛත්ථාය පවත්තිතං, සර්වසත්ත්වයන් සංසාරබන්ධනයෙන් මුදනු පිණිස පවත්වනලද; පාරමිතා සීලං පණීතං, මහාබොධිසත්ත්වයන්ගෙ පාරමිතා ශීලය ප්‍රණීත වේ෴

(ඇ) දුතියත්තිකෙ, විතීය ත්‍රිකයෙහි; අත්තනො අනනුරූපං පජහිතුකාමෙන, තමහට නොසරුප්දෙය දුරුකරනු කැමැත්තහු විසින්; අත්තගරුනා,[1] තමාම ගුරුකොට ඇත්තහු විසින්;(ලජ්ජාධිකයා විසින යන අදහසි.) අත්තනි ගාරවෙන පවත්තිතං, තමාකෙරෙහි ගෞරවයෙන් පවත්වනලද්දේ; අත්තාධිපතෙය්‍යං, ආත්මාධිපතෙය නම් වේ; "**අත්තා එව ගරු අධිපති එතස්සාති අත්තගරු-ලජ්ජාධිකො; අත්තාධිපතිතො ආගතං අත්තාධිපතෙය්‍යං**" යනුවේ.) ලොකාපවාදං පරිහරිතුකාමෙන, ලොකාපවාදය දුරුකරනු

---

1. අත්තගුරුනා-ඇතැම්.

(ඈ) චතුත්ථත්තිකෙ-යං ආපත්තිං අනාපජ්ජනෙතන පූරිතං ආපජ්ජිත්වා වා පන කතපටිකම්මං තං විසුද්ධං ආපත්තිං ආපන්නස්ස අකතපටිකම්මං අවිසුද්ධං, වත්ථුම්හි වා ආපත්තියා වා අජ්ඣාචාරෙ වා වෙමතිකස්ස සීලං වෙමතිකසීලං නාම-තත්‍ර යොගිනා අවිසුද්ධං සීලං විසොධෙතබ්බං, වෙමතිකෙ වත්ථුජ්ඣාචාරං අකත්වා විමති පටිවිනොදෙතබ්බා, ඉච්චස්ස ඵාසු භවිස්සතීති එවං විසුද්ධාදිවසෙන තිවිධං.

---

කැමැත්තහු විසින්; ලොකගරුනා, ලොකය ගරුකොට ඇත්තහු විසින්; ලොකෙ ගාරවෙන පවත්තිතං, ලොකයාකෙරෙහි ගෞරව යෙන් පවත්වන ලද්දේ; ලොකාධිපතෙය්‍යං; ලොකාධිපතෙය නම්; (**"ලොකො අධිපතිගරු[1] එතස්සාති ලොකාධිපති ඔත්තප්පාධිකො"**) ධම්මමහත්තං පූජෙතුකාමෙන, ධම්මමහත්වය පුදනු කැමැත්තහු විසින්; (ධම්මයනම් මහානුභාව ඇත්තෙය එකාන්තනෛර්‍යාණිකය හෙද ප්‍රතිපත්තීන් පිදියයුතුය එහෙයින් ධම්මය ශීලසම්පත්තීන් පුදම්සි මෙසේ ධම්මමහත්වය පුදනු කැමැත්තහු විසින් යන අර්ථයි.) ධම්ම ගරුනා, ධම්මය ගුරුකොට ඇත්තහු විසින්; ධම්මෙ ගාරවෙන පවත්ති තං, ධම්මයෙහි ගෞරවයෙන් පවත්වනලද්දේ; ධම්මාධිපතෙය්‍යං, ධම්මාධිපතෙය නම්; තතියත්තිකෙ, තෘතීයත්‍රිකයෙහි; ද්වීසු, ද්වකයෙහි; 'යං නිස්සිතනන්තිවුත්තං, යම්ශීලයෙක් නිශ්‍රිතයයි කියන ලදද; තං, හේ; තණ්හාදිට්ඨීහි පරාමට්ඨත්තා, "ඉමිනාහං සීලෙන දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වා"යි තෘෂ්ණාවෙනු දු "ඉමිනාමෙ සීලෙන සංසාරසුද්ධි භවිස්සති"යි, දෘෂ්ටියෙනු දු මාර්ගයට අනුපනිශ්‍රයභාවකාරණයෙන් පරාමාශවශයෙන් ආමෘෂ්ටබැවින්; පරා මට්ඨං, පරාමෘෂ්ටශීල නම්; පුථුජ්ජනකල්‍යාණකස්ස, පුහුදුන්කෙරෙහි කල්‍යාණවූ ශීලාදි ගුණයෙන් සමන්විතයාගෙ; මග්ගසම්භාරභූතං, මාර්ගයට සම්භාරවූ ශීලය ද; සෙඛානඤ්ච මග්ගසම්පයුත්තං, ශෛක්ෂ යන්ගෙ මාර්ගසම්ප්‍රයුක්තශීලය ද; අපරාමට්ඨං, පරාමෘෂ්ටක්ලෙශයන්[2] විෂ්කම්භිතබැවිනුදු ඔවුන්විසින් පරාමෘෂ්ටනොවන බැවින් අපරා මෘෂ්ටශීලනම්; සෙඛාසෙඛානං, ශෛක්ෂාශෛක්ෂයන්ගෙ; ඵලසම්ප යුත්තං සීලං, ඵලසම්ප්‍රයුක්තශීලය; පටිප්පස්සද්ධත්ති, ඒ ඒ ක්ලෙශදරථ සන්සිඳුවන බැවින්; ප්‍රතිප්‍රශ්‍රබ්ධි ශීල නම්.

(ඈ) චතුත්ථත්තිකෙ, සතරවන ත්‍රිකයෙහි; යං, යම් ශීලයෙක්; ආපත්තිං අනාපජ්ජනෙතන පූරිතං, ආපත්තියට නොඅවදනහු විසින් පුරන ලදද; ආපජ්ජිත්වා වා පන, ඇවද වනාහි; කතපටිකම්මං, ව්‍යුත්ථාන දෙශනාවෙන් කරනලද පිළියම්ඇත්තෙද; තං, හේ; විසුද්ධං, විශුද්ධශීල නම් වෙ; ආපත්තිං ආපන්නස්ස, ඇවත් අවන්නහුගෙ; අකතපටිකම්මං, යථාධම්මයෙන් නොකළ පිළියම් ඇත්තෙ; අවිසුද්ධං, අවිශුද්ධශීලනම්; වත්ථුම්හි වා, (වලස්මස් දෝ හෝ හූරුමස් දෝ හෝයි) වස්තුවෙහි හෝ;

---

1. ලොකො ගරු අධිපති-මු. ස. 2. පරාමාශක්ලෙශයන්-ඇතැම්.

(ඈ) පඤ්චමත්තිකෙ-චතූසු අරියමග්ගෙසු තීසු ච සාමඤ්ඤඵලෙසු සම්පයුත්තං සීලං සෙඛං අරහත්තඵලසම්පයුත්තං අසෙඛං, සෙසං නෙවසෙඛංනාසෙඛන්ති එවං සෙඛාදිවසෙන තිවිධං. පටිසම්භිදායං පන යස්මා ලොකෙ තෙසං තෙසං සත්තානං පකතිපි සීලන්ති වුච්චති. යං සන්ධාය අයං සුඛසීලො අයං දුක්ඛසීලො අයං කලහසීලො අයං මණ්ඩනසීලොති භණන්ති, තස්මා තෙන පරියායෙන "තීණිසීලානි-කුසලං සීලං [1] අකුසලං සීලං අබ්‍යාකතං සීලන්ති" එවං කුසලාදිවසෙන පි තිවිධන්ති වුත්තං. තත්ථ අකුසලං ඉමස්මිං අත්ථෙ අධිප්පෙත සීලස්ස [2] ලක්ඛණාදිසු එකෙනපි නසමෙතීති ඉධ න උපනීතං. තස්මා වුත්තනයෙනෙවස්ස තිවිධතා වෙදිතබ්බා.

---

ආපත්තියා වා, (පාචිත්ති දෝ හෝ දුකුළට දෝ හෝයි) ආපත්තියෙහි හෝ; අජ්ඣාචාරෙ වා, (ව්‍යතික්‍රම කෙළෙම් දෝ හෝ නොකෙළෙම් දෝ හෝයි) අධ්‍යාචාරයෙහි හෝ; වෙමතිකස්ස, විමති ඇත්තහුගෙ; සීලං, ශීලය; වෙමතිකසීලං නාම, වෙමතික ශීලනම්; තත්ථ, එහි; යොගිනා, යොගීහු විසින්; අවිසුද්ධං සීලං විසොධෙතබ්බං, අවිසුද්ධ ශීලය විශුද්ධකටයුතුය; වෙමතිකෙ, විමතියට පැමිණිකල; වත්ථජ්ඣාචාරං අකත්වා, වස්තුව්‍යතික්‍රම නොකොට; විමති පටිවිනොදෙතබ්බා, (තමා හෝ වස්තුව විචාරා විනයධරයන් කරා එළඹ විචාරා හෝ) විමති දුරුකටයුතුවේ; (මෙසේ දුරුකරනලද සංශය ඇත්තහු විසින් වනාහි නොකැප වීනම් දුරුකටයුතු-එසින්කිහ "ඉච්චස්ස ඵාසු හවිස්සතීති") ඉති, එසේකල්හි; අස්ස, මෙ යොගීහට; ඵාසු හවිස්සති, සුව වේ.

(ඈ) පඤ්චමත්තිකෙ, පස්වන ත්‍රිකයෙහි; චතූසු අරියමග්ගෙසු, සතර ආර්‍ය්‍යමාර්ගයන් හා ද; තීසු ච සාමඤ්ඤඵලෙසු, යට තුන් ශ්‍රාමණ්‍ය ඵලයන් හා ද; සම්පයුත්තසීලං, සම්ප්‍රයුක්ත ශීලය; සෙඛං, සෙඛසීල නම්; අරහත්තඵලසම්පයුත්තං, අර්හත්ඵල සම්ප්‍රයුක්ත ශීලය; අසෙඛං, අසේඛ සීල නම්; සෙසං, සෙසු ලෞකිකශීලය; නෙවසෙඛංනාසෙඛං, නෙවසෙඛනාසෙඛසීලනම්; පටිසම්භිදායම්පන, පිළිසිඹියායෙහි වනාහි; යස්මා, යම් හෙයෙකින්; ලොකෙ, ලෙව්හි; තෙසං තෙසං සත්තානං පකති පි, ඒ ඒ සත්ත්වයන්ගෙ ස්වභාවය ද; සීලන්ති වුච්චති, ශීලයයි කියනුලැබෙද; යං සන්ධාය, යම් ප්‍රකෘතියක් සඳහා; අයං සුඛසීලො, මෙ සුවෙන් වසනසුලුය; අයං දුක්ඛසීලො, මෙ දුකින් වසනසුලුය; අයං කලහසීලො, මේ කලහකරනසුලුය; අයං මණ්ඩනසීලොති, මෙ මණ්ඩනය කරනසුලුයයි; භණන්ති, බෙණෙද්ද; තස්මා, එහෙයින්; තෙන පරියායෙන, ප්‍රකෘතියද ශීලය යන ඒ පර්‍ය්‍යායයෙන්; (ශීලශබ්දයා ප්‍රකෘත්‍යර්ථවාචක බැවින යන අර්ථයි.) කුසලං සීලං, කුශලශීලය; අකුසලං සීලං, අකුශලශීලය; අබ්‍යාකතං සීලන්ති, අව්‍යාකෘත ශීලයයි; එවං, මෙසේ; කුසලාදිවසෙනපි, කුසලාදි

---

1. කුසලසීලං-ත්‍රි. මු. 2. අධිප්පෙතස්ස සීලස්ස-මු.

චතුක්කෙසු-පඨමචතුක්කං-

26 යො ධ සෙවති දුස්සීලෙ සීලවන්තෙ න සෙවති
වත්ථුවීතික්කමෙ දොසං න පස්සති අවිද්දසු.

27 මිච්ඡාසඞ්කප්පබහුලො ඉන්ද්‍රියානි න රක්ඛති
එවරූපස්ස වෙ සීලං ජායතෙ හානභාගියං.

28 යො පනත්තමනො හොති සීලසම්පත්තියා ඉධ
කම්මට්ඨානානුයොගම්හි න උප්පාදෙති මානසං.

---

වශයෙනු දු; තිවිධන්ති වුත්තං, ත්‍රිවිධයයි කියනලදී; තත්ථ, ඒ ත්‍රික යෙහි; අකුසලං, අකුශලශීලය; ඉමස්මිං අත්ථෙ අධිප්පෙතසීලස්ස, මෙ අර්ථයෙහි අභිමතවූ ශීලයාගෙ; ලක්ඛණාදිසු, ලක්ෂණාදීන් කෙරෙහි; එකෙනාපි න සමෙතීති, එකක් හා ද සම නොවේනුයි; ඉධ, මෙහි; න උපනීතං, කුසලත්‍රික නොඑළවනලදී; (මේ ත්‍රිකයෙහි අව්‍යාකෘත ශීලය ශෛක්ෂත්‍රිකයෙන් ගත්බැවින් මෙහි අභිප්‍රෙතශීල යෙන් එකසඞ්ග්‍රහනුයි අකුශලයාගෙම අයොජ්‍යමානතාව දක්වන පිණිස "තත්ථ අකුසලං" යනාදි කීහු.) තස්මා, එහෙයින්; වුත්තනයෙ නෙව, කියනලද නයින්ම; (කුසලත්‍රිකය නොගෙන හීනත්‍රිකාදිවූ පඤ්චත්‍රිකයන්ගෙ වශයෙන්මය යන අර්ථයි;) අස්ස තිවිධතා වෙදි තබ්බා, මෙ ශීලයාගෙ ත්‍රිවිධතාව දතයුතු වේ.

චතුක්කෙසු, චතුෂ්කයන්කෙරෙහි; පඨමචතුක්කං, ප්‍රථම චතුෂ්ක යෙහි;

26. ඉධ, මෙහි; යො අවිද්දසු, යම් අඥනභික්ෂුවෙක්; දුස්සීලෙ සෙවති, දුශ්ශීලයන් සෙවීමද; සීලවන්තෙ න සෙවති, සිල්වතුන් නොසෙවීමද; වත්ථුවීතික්කමෙ, වස්තුව්‍යතික්‍රමයෙහි; දොසං න පස්සති, දොෂ නොදකීද; (දුස්සීලයන් සෙවුනාබැවිනු දු සිල්වතුන් නොසෙවුනා බැවිනු දු ඔවුන්ගෙ දිට්ඨානුගතියට පැමිණීමෙන් අධ්‍යාචාරයෙහි දොෂ නොදක්නේය යන අර්ථයි.)

27. මිච්ඡාසඞ්කප්පබහුලො,කාම සඞ්කප්පාදි නව මහා විතර්කසඞ්ඛ්‍යාත මිථ්‍යාවිතර්ක බහුලවූයෙ; ඉන්ද්‍රියානි න රක්ඛති, මිථ්‍යාසඞ්කල්ප බහුල බැවින් ම මනෂ්ෂෂ්ඨ ඉන්ද්‍රියයන් නොරකීද; එවරූපස්ස සීලං, එබඳු භික්ෂුහුගෙ ශීලය; වෙ, ඒකාන්තයෙන්ම; හානභාගියං ජායතෙ, හාන භාගිය වන්නේයි; (පරිහානිය සෙවුනේය යන අර්ථයි.)

28. ඉධ,මෙහි; යො පන,යම් මහණෙක්;(අත්තනො)සීල සම්පත්තියා, තමාගෙ චතුෂ්පාරිශුද්ධිශීලයෙන්ම; අත්තමනො හොති, සතුටුවේද; කම්මට්ඨානානුයොගම්හි, කර්මස්ථානයෙහි යෙදීමෙහි; මානසං න උප්පාදෙති, සිත් නොඋපදවාද.

29 තුට්ඨස්ස සීලමත්තෙන අඝටන්තස්ස උත්තරිං
තස්ස තං ඨිතිභාගියං සීලං භවති භික්ඛුනො.

30 සම්පන්නසීලො ඝටති සමාධත්ථාය යො පන
විසෙසභාගියං සීලං හොති එතස්ස භික්ඛුනො.

31 අතුට්ඨො සීලමත්තෙන නිබ්බිදං යොනුයුඤ්ජති
හොති නිබ්බෙධභාගීයං සීලමෙතස්ස භික්ඛුනොති.

එවං හානභාගියාදිවසෙන චතුබ්බිධං.

(ඇ) දුතිය චතුක්කෙ–භික්ඛූ ආරබ්භ පඤ්ඤත්තසික්ඛාපදානි, යානිච තෙසං භික්ඛුනීනං පඤ්ඤත්තතො රක්ඛිතබ්බානි, ඉදං භික්ඛුසීලං. භික්ඛුනියො ආරබ්භ පඤ්ඤත්තසික්ඛාපදානි, යානි ච තාසං භික්ඛූනං පඤ්ඤත්තතො රක්ඛිතබ්බානි ඉදං භික්ඛුනීසීලං, සාමණෙරසාමණෙරීනං දසසීලානි ඉදං අනුපසම්පන්නසීලං, උපාසකඋපාසිකානං නිච්චසීලවසෙන පඤ්ච සික්ඛාපදානි සති වා උස්සාහෙ දස උපොසථඞ්ග වසෙන අට්ඨාති ඉදං ගහට්ඨසීලන්ති, එවං භික්ඛුසීලාදිවසෙන චතුබ්බිධං.

---

29. තුට්ඨස්ස සීලමත්තෙන, ශීලමාත්‍රයෙන් තුෂ්ටවූ; උත්තරිං අඝටන්තස්ස, මතුයෙහි ධ්‍යානසඞ්ඛ්‍යාත විශේෂාධිගමයට ව්‍යායාම නොකරන්නාවූ; තස්ස භික්ඛුනො, ඒ භික්‍ෂුහුගෙ; තං සීලං, ඒ ශීලය තෙමෙ; ඨිතිභාගියං භවති, ස්ථිතියම සෙවුනේසි.

30. යො පන, යමෙක් වනාහි; සම්පන්නසීලො, සම්පූර්‍ණවූ සිල් ඇත්තෙ; සමාධත්ථාය, සමාධිය පිණිස; ඝටති, ව්‍යායාම කෙරේද; එතස්ස භික්ඛුනො, ඒ භික්‍ෂුහුගෙ; සීලං, ශීලය තෙමෙ; විසෙසභාගියං හොති, ධ්‍යානවිශෙෂ සෙවුනේසි.

31. යො, යමෙක්; අතුට්ඨො සීලමත්තෙන, ශීලමාත්‍රයෙන් අතුෂ්ට වූයෙ; නිබ්බිදං අනුයුඤ්ජති, විදර්‍ශනාවෙහි යෙදේද; (මෙසින් බලවත් විදර්‍ශනාව කීහු.) එතස්ස භික්ඛුනො සීලං, මෙ භික්‍ෂුහුගේ ශීලය; නිබ්බෙධභාගියං හොති, නිර්වේද සෙවුනේසි; (විදර්‍ශනාවෙහි යෙදුනු පමණෙකිනුදු නිර්වේදභාග්වේ යන අර්‍ථයි.)

(ඇ) දුතියචතුක්කෙ, දෙවන චතුෂ්කයෙහි; භික්ඛූ ආරබ්භ පඤ්ඤත්ත සික්ඛාපදානි, භික්‍ෂූන් අරභයා පණවනලද ශික්‍ෂාපදයෝද; භික්ඛුනීනං පඤ්ඤත්තතො, භික්‍ෂුණීන්ට ප්‍රඥප්ත ශික්‍ෂාපදයෙන්; යානි ච තෙසං රක්ඛිතබ්බානි, යම් ශික්‍ෂාපදකෙනෙක් ඒ භික්‍ෂූන් විසින් රැක්ක යුත්තාහුද; ඉදං භික්ඛුසීලං, මෙ භික්‍ෂුශීල නම් වෙ; භික්ඛුනියො ආරබ්භ පඤ්ඤත්තසික්ඛාපදානි, භික්‍ෂුණීන් අරභයා ප්‍රඥප්ත ශික්‍ෂා පදයෝද; භික්ඛූනං පඤ්ඤත්තතො, භික්‍ෂූන්ට ප්‍රඥප්ත ශික්‍ෂාපදයෙන්; යානි ච තාසං රක්ඛිතබ්බානි, යම් ශික්‍ෂාපදකෙනෙක් ඒ භික්‍ෂුණීන් විසින් රැක්කයුත්තාහුද; ඉදං, මෙ; භික්ඛුනීසීලං, භික්‍ෂුණීශීල නම් වෙ;

(අ) තතියචතුක්කෙ-උත්තරකුරුකානං මනුස්සානං අවීතික්කමො පකතිසීලං, කුලදෙසපාසණ්ඩානං අත්තනො අත්තනො මරියාදාහතං චාරිත්තං ආචාරසීලං, "ධම්මතා එසා ආනන්ද යදා බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති න බොධිසත්තමාතු පුරිසෙසු මානසං උප්පජ්ජති කාමගුණූපසංහිතං"ති එවං වුත්තං බොධිසත්තමාතුසීලං ධම්මතාසීලං, මහාකස්සපාදීනං පන සුද්ධසත්තානං බොධිසත්තස්ස ච තාසු තාසු ජාතීසු සීලං පුබ්බහෙතුකසීලන්ති, එවං පකතිසීලාදිවසෙන චතුබ්බිධං.

---

සාමණෙරසාමණෙරීනං දසසීලානි, සාමණේරසාමණේරින්ගෙ දශ ශීලයෝ; අනුපසම්පන්නසීලං, අනුපසම්පන්නශීලනම්; උපාසකඋපාසිකානං, උපාශකඋපාශිකාවන්ගෙ; නිච්චසීලවසෙන පඤ්චසික්ඛාපදානි, නිත්‍යශීලවශයෙන් පඤ්චශික්ෂාපදයෝද; සති වා උස්සාහෙ දස, මත්තෙහි ද ශීලයන් රක්ෂාකරන්නට උත්සාහයක් ඇතිකල්හි සර්වකාරාදීන්ට මෙන් සාමණේරයන් විසින් රැක්කයුතු එම දශ ශික්ෂාපදයෝද; උපොසථඞ්ගවසෙන අට්ඨාති; උපොසථාඞ්ග විසින් නච්චාදි මාලාදි වෙරමණීන් එක් අඟක් කොට අෂ්ට ශික්ෂාපදයෝද; ඉදං ගහට්ඨසීලං, මෙ ගෘහස්ථශීල නම්.

(අ) තතියචතුක්කෙ, තුන්වනචතුෂ්කයෙහි; උත්තරකුරුකානං මනුස්සානං, උත්තරකුරුද්වීපය වැසි මිනිසුන්ගේ; අවීතික්කමො, පඤ්චශීලයන්ගෙ අව්‍යතික්‍රමය; පකතිසීලං, ස්වභාව ශීලනම්; කුලදෙසපාසණ්ඩානං, ඒ ඒ කුලයන්ගෙ ඒ ඒ දෙශවාසීන්ගෙ ඒ ඒ පාෂණ්ඩයන්ගේ; අත්තනො අත්තනො මරියාදාහතං චාරිත්තං,[1] ඒ ඒ කුලාදියෙහි පූර්වපුරුෂයන් විසින් ඒ ඒ වරද නොකිරීමෙහි හිම්කොට තබනලද චාරිත්‍රය; ආචාරසීලං, ආචාරශීලනම්; (බ්‍රාහ්මණාදීන්ගෙ අමද්‍යපානාදිකුලධර්මය, සමහරජනපදයෙක අහිංසාදි දෙශධර්මය, තීර්ථකයන්ගෙ යමනියමාදි පාෂණ්ඩධර්මයි.) ආනන්ද, ආනන්දය; එසා ධම්මතා, මේ ධර්මතායි (ස්වභාවයෙකි); යදා, යම් කලෙක; බොධිසත්තො, බොධිසත්වතෙමෙ; මාතුකුච්ඡිං ඔක්කන්තො හොති, මවුකුස උපන්නෙවෙ ද; බොධිසත්තමාතු මානසං, බොධිසත්වමාතුචිත්තය; කාමගුණූපසංහිතං, කාමගුණාස්වාදයෙහි ගිජුවූයෙ; පුරිසෙසු න උප්පජ්ජතීති, පුරුෂයන් කෙරෙහි නො උපදනේයයි; එවං වුත්තං, මෙසේ කියනලද; බොධිසත්තමාතුසීලං, බොධිසත්වමාතෘශීලය; ධම්මතාසීලං, ධර්මතාශීලනම; ("පකතියා සීලවතී හොති"යි වදාළබැවින් බොධිසත්වයන් මවුන්ගෙ පඤ්චශික්ෂාපදශීලය පරිපූර්ණම වෙයි; මෙ වනාහි 'කුක්ෂිගතමහාබොධිසත්වයන්ගෙ පියාණන් කෙරෙහි ද චිත්තොත්පත්ති පමණෙකිනු ද අසංක්ලිෂ්ටවූ පරමොත්කර්ෂයට පැමිණි ශීලය ගුණානුභාවයෙන් සිද්ධවන බැවින් කාරණ

---

1. පකතිචාරිත්තං-ඇතැම්.

(ඈ) චතුත්ථචතුක්කෙ-යං භගවතා "ඉධ භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසූ"ති එවං වුත්තං සීලමිදං පාතිමොක්ඛසංවරසීලං නාම, යම්පන "සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා ඝාණෙන ගන්ධං ඝායිත්වා ජිව්හාය රසං සායිත්වා කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහීහොති නානුබ්‍යඤ්ජනග්ගාහී ...පෙ... මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජතී"ති වුත්තං, ඉදං ඉන්ද්‍රිය

---

නියමයෙන් ආගතශීලය ධම්මතාශීලනමැයි දතයුතු.) මහාකස්සපාදීනං පන සුද්ධසත්තානං, චිරකාලයක් සුපරිසුද්ධශීලව ආ බැවින් මහාකාශ්‍යපාදි ශුද්ධසත්වයන්ගෙ ශීලයද; බොධිසත්තස්ස ච, බොධිසත්වයන්ගේ ද; තාසු තාසු ජාතිසු සීලං, "සීලවරාජ මහිංසරාජාදි" ඒ ඒ ජාතියෙහි ශීලය; පුබ්බහෙතුකසීලං, පූර්වජාති සිද්ධ හෙතු ඇතිබැවින් පූර්වහෙතුකශීල නම්...

(ඈ) චතුත්ථ චතුක්කෙ, සතරවන චතුෂ්කයෙහි; ("යං භගවතා එවං වුත්තං"යි යොදනු.) භගවතා, භගවත්හු විසින්; ඉධ, මෙ ශාසනයෙහි; භික්ඛු, මහණතෙමෙ; පාතිමොක්ඛසංවරසංවුතො, ප්‍රාතිමොක්ෂසංවරයෙන් යුක්තවූයෙ; විහරති, වාසයකෙරෙයි; ආචාරගොචර සම්පන්නො, වක්ෂ්‍යමාණ ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයෙ; අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, අණුප්‍රමාණ වරදහිදු භය දක්නේ; සමාදාය, මනාකොට ගෙන; සික්ඛාපදෙසු, සිඛපදයෙහි; සික්ඛතීති, හික්මෙන්නේයයි; එවං වුත්තං, මෙසේ කියනලද; යං සීලං, යම් ශීලයෙක් ඇද්ද; ඉදං, මේ; පාතිමොක්ඛසංවරසීලං නාම, ප්‍රාතිමොක්ෂ සංවර ශීලනම්; ("යං පන වුත්තං"යි යොදනු.) සො, ඒ ප්‍රාතිමොක්ෂ සංවර ශීලයෙහි පිහිටි මහණ; චක්ඛුනා රූපං දිස්වා, චක්ෂුසින් රූපය දැක; න නිමිත්තග්ගාහී හොති, නිමිත්තග්‍රාහී නොවෙයි; නානුබ්‍යඤ්ජනග්ගාහී, අනුව්‍යඤ්ජනග්‍රාහී නොවෙයි; යත්වාධිකරණං, යම් අසංවරයක හෙතුයෙන්; එනං, ඒ පුද්ගල; චක්ඛුන්ද්‍රියං අසංවුතං, අපිහිත චක්ෂුරින්ද්‍රිය ඇතිව; විහරන්තං, වසන්නහු; අභිජ්ඣා, අභිධ්‍යාය; දොමනස්සා, දෞර්මනස්‍යයහ යන; පාපකා, ලාමකවූ; අකුසලාධම්මා, අකුශල ධර්මයෝ; අන්වාස්සවෙය්‍යුං, අනුබන්‍ධනාහුද; තස්ස, ඒ චක්ෂුරින්ද්‍රියයාගෙ; සංවරාය පටිපජ්ජති, සංවරය පිණිස පිළිපදනේය; රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ෂුරින්ද්‍රිය රක්නෙය; චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති, චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙන්නෙය; සොතෙන සද්දං සුත්වා, ශ්‍රොත්‍රයෙන් ශබ්දය අසා; ඝාණෙන ගන්ධං ඝායිත්වා, ඝ්‍රාණයෙන් ගන්ධය ආඝ්‍රාණය කොට; ජිව්හාය රසං සායිත්වා, ජිහ්වායෙන් රසය ආස්වාද කොට;

සංවරසීලං; යා පන ආජීවහෙතුපඤ්ඤත්තානං ඡන්නං සික්ඛාපදානං වීතික්කමස්ස ච කුහනා ලපනා නෙමිත්තිකතා නිප්පෙසිකතා ලාභෙන ලාභං නිජිගිංසනතාති එවමාදීනඤ්ච පාපධම්මානං වසෙන පවත්තා මිච්ඡාජීවා විරති, ඉදං ආජීවපාරිසුද්ධි සීලං.

(අ "පටිසඞ්ඛා යොනිසො චීවරං පටිසෙවති යාවදෙව සීතස්ස පටිඝාතායා"ති ආදිනා පන නයෙන වුත්තො පටිසඞ්ඛාන පරිසුද්ධො චතුපච්චය පරිභොගො පච්චය සන්නිස්සිත සීලං නාම. තත්‍රායං ආදිතො පට්ඨාය අනුපුබ්බපදවණ්ණනාය සද්ධිං විනිච්ඡය කථා.

---

කායෙන, ඵොට්ඨබ්බං ඵුසිත්වා, කයින් ස්ප්‍රෂ්ටව්‍යය ස්පර්ශකොට; මනසා ධම්මං විඤ්ඤාය, මනසින් ධර්මය දැන; න නිමිත්තග්ගාහී හොති, නිමිත්ත ග්‍රහණය නොකෙරෙයි; නානුබ්‍යඤ්ජනග්ගාහී, අනුව්‍යඤ්ජන ග්‍රහණය නොකෙරෙයි; මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති, මනින්ද්‍රිය යෙහි සංවරයට පැමිණේයයි; යං වුත්තං, යම් ශීලයෙක් කියනලදද; ඉදං, මෙ; ඉන්ද්‍රියසංවරසීලං, ඉන්ද්‍රියසංවරශීලනම්; ("යාපනා විරති" යොදනු.) ආජීවහෙතුපඤ්ඤත්තානං, ආජීවහෙතුයෙන් ප්‍රඥප්තවූ; ඡන්නං සික්ඛාපදානං, පාරාජිකාදි ශික්ෂාපදයන් සදෙනාගෙ; වීතික්කමස්ස ච වසෙන පවත්තා, ව්‍යතික්‍රමවශයෙන් ප්‍රවෘත්තවූද; කුහනා, ත්‍රිවිධකුහනවස්තුයෙන් විස්මය කැරවීමය; ලපනා, තමාවත් ප්‍රත්‍යය දායකයාවත් උසස්කොට උහු කිසිවක් දෙන පරිද්දෙන් බිණීමය; නෙමිත්තිකතා, ප්‍රත්‍යයදානයෙහි සංඥ උපදවන කාය වාක්කර්මාඛ්‍ය නිමිත්ත කරන බවය; නිප්පෙසිකතා, ලාභපිණිස අනුන් ආක්‍රොශාදීන් පෙළනබවය; ලාභෙන ලාභං නිජිගිංසනතාති, තමා ලද ලාභයෙන් අනුන්ගෙ ලාභ සෙවීමය යන; එවමාදීනඤ්ච පාපධම්මානං වසෙන, මෙ ආදි පාපධර්මයන්ගෙ වශයෙනු දු; (ආදිග්‍රහණින් "චාටුකම්‍යතා අනුපියභාණිතා"දීහු ගැණෙත්;) පවත්තා, ප්‍රවෘත්තවූ; යා මිච්ඡාජීවා විරති, යම් මිථ්‍යාජීවයෙන් විරතියක් ඇද්ද; ඉදං, මෙ; අජීව පාරිසුද්ධි සීලං, ආජීව පාරිශුද්ධි ශීලනම්:—

(අ) යොනිසො, නුවණින්; පටිසඞ්ඛාය, පරීක්ෂාකොට; චීවරං, සිවුරු; පටිසෙවති, වැළඳගන්නෙය; යාවදෙව, යම්තාක්; සීතස්ස පටිඝාතායාති, ශීත පීඩා නසනපිණිසය යන; ආදිනා පන නයෙන, මෙ ආදි නයින්; වුත්තො, කියනලද; පටිසඞ්ඛානපරිසුද්ධො, ප්‍රත්‍යවෙක්ෂාවෙන් පරිශුද්ධවූ; චතුපච්චයපරිභොගො, චතුෂ්ප්‍රත්‍යයපරිභොගය; (තථා ප්‍රවෘත්ත අනවද්‍යචෙතනාව;) පච්චයසන්නිස්සිතසීලංනාම, ප්‍රත්‍යය සන්නිශ්‍රිතශීලනම්; තත්‍ර, ඒ ප්‍රාතිමොක්ෂසංවරාදියෙහි; අයං, මෙ තෙම; ආදිතො පට්ඨාය, ආදියෙහි පටන්; අනුපුබ්බපදවණ්ණනාය සද්ධිං, අනුපූර්වපදවර්ණනාව හා සමඟ විනිච්ඡයකථා, සංසය දුරුකරන හෙයින් විනිශ්චය එළවන කථායි.

(අ) **ඉධාති** ඉමස්මිං සාසනෙ; **භික්ඛූති** සංසාරෙ භයං ඉක්ඛනතාය වා භින්නපටධරාදිතාය වා එවං ලද්ධවොහාරො තෙන පාතිමොක්ඛසංවරෙන සංවුතො සද්ධාපබ්බජිතො කුලපුත්තො; **පාතිමොක්ඛසංවරසංවුතොති** එත්ථ පාතිමොක්ඛන්ති සික්ඛාපදසීලං, තං හි යො නං පාති රක්ඛති තං මොක්ඛෙති මොචෙති ආපායිකාදීහි දුක්ඛෙහි තස්මා පාතිමොක්ඛන්ති වුච්චති. **සංවරණං සංවරො**-කායිකවාචසිකස්ස අවීතික්කමස්සෙතං නාමං. පාතිමොක්ඛමෙව සංවරො පාතිමොක්ඛසංවරො, තෙන පාතිමොක්ඛසංවරෙන සංවුතො පාතිමොක්ඛසංවරසංවුතො, උපගතො සමන්නාගතොති අත්ථො; **විහරතීති** ඉරියති. "ආචාරගොචරසම්පන්නො"ති ආදීනං අත්ථො පාළියං ආගතනයෙනෙව වෙදිතබ්බො.

---

(අ) ඉධාති, ඉධ යන්නෙහි; **ඉමස්මිං සාසනෙ**, මෙ ශාසනයෙහි; භික්ඛූති, භික්ඛූනම්; සංසාරෙ භයං ඉක්ඛනතාය වා, සසරෙහි භය දක්නාබැවින් හෝ; භින්නපටධරාදිතාය වා, භින්නපටධරාදි බැවින් හෝ; එවං ලද්ධවොහාරො, භික්ඛුයයි ලද ව්‍යවහාරඇති; (පළමු අර්ථය සර්වසාධාරණ හෙයින් ප්‍රව්‍රජිතයන්ටම සාධාරණපර්යායය දක්වනු පිණිස "භින්නපටධරාදිතාය"යි කීහු.) තෙන පාතිමොක්ඛසංවරෙන සංවුතො, ඒ ප්‍රාතිමොක්ෂසංවරයෙන් යුක්තවූ; සද්ධාපබ්බජිතො, සැදැහැයෙන් පැවිදිවූ; කුලපුත්තො, ආචාරකුලපුත්‍ර හෝ ජාතිකුලපුත්‍ර හෝ; පාතිමොක්ඛසංවරසංවුතොති එත්ථ, පාතිමොක්ඛසංවරසංවුතො යන මෙහි; පාතිමොක්ඛන්ති, ප්‍රාතිමොක්ෂනම්: සික්ඛාපද සීලං, චාරිත්‍ර වාරිත්‍ර භෙදඇති ශික්ෂාපද වශයෙන් ප්‍රඥප්ත ශීලයයි; ("තං හි පාතිමොක්ඛන්ති වුච්චති"යි යොදනු-හි ශබ්දය යස්මාදර්ථයි; තස්මා යනු හා යෙදේ.) යො, යම්කිසි පුද්ගලයෙක්; නං, විනයපර්යාපන්නශීලය; රක්ඛති, සහකාරිකාරණභාවයෙන් රකීද; තං, ඒ පුද්ගලයා; මොක්ඛෙති, සීසේයි; ආපායිකාදීහි දුක්ඛෙහි මොචෙති, ආපායිකාදි දුඃඛයෙන් මුදා; තස්මා, එහෙයින්; පාතිමොක්ඛන්ති වුච්චති, ප්‍රාතිමොක්ෂයයි කියනුලැබේ; (**"අපායෙ භවානි ආපායිකානි"**-ආදිග්‍රහණයෙන් තදන්‍යසංසාරදුඃඛ ගැනේ.) සංවරණං, කායවාග්ද්වාරයන්ගෙ පිදහනය; සංවරො, සංවරනම්; (ඒ සංවරයද ව්‍යතික්‍රමප්‍රතිපක්ෂබැවින් සප්තාපත්තිස්කන්ධයන්ගෙ අව්‍යතික්‍රමයෙන්නුයි "කායිකවාචසිකස්ස අවීතික්කමස්සෙතං නාමං" යුහු. කායවාග්ද්වාරයෙහිවූ අව්‍යතික්‍රමයට නමෙක යන අර්ථයි.) පාතිමොක්ඛමෙව සංවරො, ප්‍රාතිමොක්ෂයම සංවරනුයි; පාතිමොක්ඛසංවරො, ප්‍රාතිමොක්ෂසංවරනම්; තෙන පාතිමොක්ඛසංවරෙන, ඒ ප්‍රාතිමොක්ෂසංවරයෙන්; සංවුතො, පිහිත කායවාග්ද්වාරඇත්තේ; පාතිමොක්ඛසංවරසංවුතො, ප්‍රාතිමොක්ෂසංවරසංවෘතනම් වෙ; (යම්හෙයකින් ප්‍රාතිමොක්ෂසංවරයෙන් පිහිතවූ කායවාග්ද්වාර ඇත්තේ එයට පැමිණියෙ එයින් සමන්විතවූයෙ නම් වෙ ද එහෙයින් "උපගතො සමන්නාගතො ති අත්ථො"යි, කීහු.) "විහරති"

(අ) වුත්තං හෙතං:- **ආචාරගොචරසම්පන්නො** ති අත්ථි ආචාරො අත්ථි අනාචාරො, තත්ථ කතමො අනාචාරො? කායිකො වීතික්කමො වාචසිකො වීතික්කමො කායිකවාචසිකො වීතික්කමො අයං වුච්චති අනාචාරො, සබ්බම්පි දුස්සීල්‍යං අනාචාරො෴

(ආ) ඉධෙකච්චො වෙළුදානෙන වා පත්තදානෙන වා පුප්ඵදානෙන වා ඵලසිනානදන්තකට්ඨදානෙන වා චාටුකම්‍යතාය වා මුග්ගසූප්‍යතාය වා පාරිභට්ටතාය වා ජඞ්ඝපෙසනිකෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන බුද්ධපටිකුට්ඨෙන මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙති අයං වුච්චති අනාචාරො. තත්ථ කතමො ආචාරො? කායිකො අවීතික්කමො වාචසිකො අවීතික්කමො කායිකවාචසිකො අවීතික්කමො අයං වුච්චති ආචාරො. සබ්බොපි සීලසංවරො ආචාරො. ඉධෙකච්චො න වෙළුදානෙන-න පත්ත-න පුප්ඵ-න ඵල-න සිනාන-න දන්තකට්ඨදානෙන-න චාටුකම්‍යතාය-න මුග්ගසූප්‍යතාය-න පාරිභට්ටතාය-න ජඞ්ඝපෙසනිකෙන-න අඤ්ඤතරඤ්ඤතරෙන බුද්ධපටිකුට්ඨෙන මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙති, අයං වුච්චති ආචාරො෴

---

යනුයෙහි; ඉරියති, ආත්මභාවය පවත්වන්නේයි; ආචාරගොචර සම්පන්නොති ආදීනං අත්ථො, ආචාරගොචර සම්පන්නො යනාදීන්ගෙ අර්ථය; පාළියං, ධ්‍යානවිභඞ්ගපාළියෙහි; ආගතනයෙනෙව වෙදිතබ්බො, ආ නයින්ම දතයුතු වේ෴

(අ) වුත්තං හෙතං, මෙකියනලදමැයි (ධ්‍යානවිභඞ්ගයෙහි ශ්‍රමණාචාර ශ්‍රමණගොචර දක්වනුපිණිස "ආචාර ගොචරසම්පන්නො"යි කියා යම්සේ මඟ කියනුයෙ "වාමං මුඤ්ච දක්ඛිණං ගණ්හ"යි වර්ජනීය මඟ පළමුකියා පසුව යායුතුමඟ කියාද එසේම "අත්ථි ආචාරො අත්ථි අනාචාරො"යි උදෙසා අනාචාරය පළමුකොට විභාගකරනුවෝ "තත්ථ කතමො අනාචාරො" යනාදි කීහු.) "ආචාර ගොචර සම්පන්නො" යනුයෙහි; අත්ථි ආචාරො, ආචාරද ඇති; අත්ථි අනාචාරො, අනාචාරද ඇති; තත්ථ, එ දෙක්හි; කතමො අනාචාරො, අනාචාරනම් කවරයත්; කායිකො වීතික්කමො, ත්‍රිවිධකායදුශ්චරිත නැමැති කායද්වාරයෙහි ව්‍යතික්‍රමය; වාචසිකො වීතික්කමො, චතුර්විධවාග්දුශ්චරිත නැමැති වාග්ද්වාරයෙහි ව්‍යතික්‍රමය; කායිකවාචසිකො වීතික්කමො, කායද්වාර වාග්ද්වාරයෙහි එම ව්‍යතික්‍රමය; අයං, මෙතෙම; අනාචාරො වුච්චති, අනාචාරයයි කියනුලැබේ; (දැන් මානසික අනාචාරය දක්වනු පිණිස "සබ්බම්පි දුස්සීල්‍යං අනාචාරො"යි කියා ඉන් සමහරක් දක්වනු පිණිස "වෙළුදානෙන වා" යනාදි කීහු.) සබ්බම්පි දුස්සීල්‍යං, සියලු දෞශ්ශීල්‍යයම; අනාචාරො, අනාචාරනම්෴

**(ආ) ඉධ, මෙහි; එකච්චො, එකෙක්; වෙළුදානෙන වා, ප්‍රත්‍යය උපදවනපිණිස මිනිස්නට ප්‍රයොජන එළවන හුණදඬු දීමෙන් හෝ; පත්තදානෙනවා, තල්පත් තලපත් ආදි පත්දීමෙන් හෝ; පුප්ඵදානෙන වා,**

(අ) ගොචරෙ ති-අත්ථි ගොචරො අත්ථි අගොචරො. තත්ථ කතමො අගොචරො? ඉධෙකච්චො වෙසියගොචරො වා හොති විධවථුල්ල කුමාරිකපණ්ඩකභික්ඛුනීපානාගාරගොචරො වා හොති සංසට්ඨො විහරති රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි අනනු ලොමිකෙන සංසග්ගෙන, යානි වා පන තානි කුලානි අස්සද්ධානි අප්ප සන්නානි [1] අක්කොසකපරිභාසකානි අනත්ථකාමානි අහිතකාමානි අඵාසුකාමානි අයොගක්ඛෙමකාමානි භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං, තථාරූපානි කුලානි සෙවති භජති පයිරුපාසති, අයං වුච්චති අගොචරො.

---

සපුමල් කණේරුමල් ආදි මල් දීමෙන් හෝ; ඵල, පණස ඵලාදිඵල; සිනාන, මහරිසුණු ආදි නහනසුණු; දන්තකට්ඨදානෙන වා, දැහැටි දඬු දීමෙන් හෝ; චාටුකම්‍යතාය වා, තමා දසකු මෙන් නීචස්ථානයෙහි තබා ප්‍රියකාමතාවෙන් අනුන් හුවා බණන තෙපුල්ආදි ලාමක වෘත්තින් හෝ; මුග්ගසූප්‍යතාය වා, මුද්ගසූපයක් වැනිවීමෙන් හෝ; (යම්සේ මුද්ගසූපය පිසනකල බොහෝමුන් පැසියතු දු ඇට කීපයෙක් ම නොපැසේද එසේම සත්‍යාලිකදෙකින් ජීවිකා කරන්නහු කෙරෙහි බොහෝ අසත්‍යවෙයි. සත්‍යය මඳෙක් වේ) පාරිභට්ටතාය වා, අනුන් දරුවන් වැඩීමෙන් හෝ; ජඞ්ඝපෙසනිකෙන වා, ගිහීන්ට ග්‍රාමාන්තර දේශාන්තරාදියෙහි ශාසනප්‍රතිශාසනහරණසඞ්ඛ්‍යාත කකුල් මෙහෙවර කිරීමෙන් හෝ; අඤ්ඤතරඤ්ඤතරෙන බුද්ධපටිකුට්ඨෙන, වෙළුදානාදිය වෛද්‍යකර්මභාණ්ඩාගාරිකකර්මපිණ්ඩප්‍රතිපිණ්ඩාදි යම්කිසි බුදුන් විසින් ගරහනලද; මිච්ඡාජීවෙන, මිථ්‍යාජීවයකින්; ජීවිකං කප්පෙති, ජීවිකා කෙරේද; අයං,මෙ තෙම;අනාචාරො වුච්චති, අනාචාරයයි කියනුලැබේ; තත්ථ, එහි; කතමො ආචාරො, ආචාරනම් කවරයත්; (ආචාරනිර්දේශ යෙහි අර්ථ කීනයට ප්‍රතිපක්ෂනයින් දතයුතු-ගොචරනිර්දේශයෙහි දු ප්‍රථමකොට ගොචරකථනයෙහි කාරණා යට කී නයින්ම දතයුතු.

(අ) ("අත්ථි ගොචරො අත්ථි අගොචරො" යනුයෙහි පිණ්ඩපාතාදීන් පිණිස එළැඹෙන්නට සුදුසුතැන් ගොචරනම; නුසුදුසුතැන්ම අගොචරනම්.) ඉධ, මෙහි; එකච්චො, එකෙක් වෙසියගොචරො වා හොති, වෛශ්‍යාවන් ගොචර කොට යායුතුතැන් කොට ඇත්තේද; (වෛශ්‍යාවෝ වනාහි ශ්‍රමණත්වයට අන්තරාය කරනබැවිනු දු පරිශුද්ධාශය ඇත්තාහටද ගර්හාහේතුවන බැවිනු දු මිත්‍රසංස්තව වශයෙනු දු නොඑළැඹිය යුත්තාහුයි.) විධවා, වැන්දඹුවන්; (මළසැමියන් බැහැර ගිය සැමියන් ඇත්තවුන්ය යන අර්ථයි.) ථුල්ලකුමාරි, මැහැලි අභීෂ්ට කුමාරිකාවන්; (ස්වාමි කුලයට නොගොස් ගෙයි හිඳ වැඩි මැහැලි කුමරියන් යන අර්ථයි.) පණ්ඩක, නපුංසකයන්; (උහුදු උත්සන්නවූ අව්‍යුපසාන්තක්ලේශ ඇතිබැවින් ලෝකාමිසනිශ්‍රිත කථා බහුල යෝනුයි නො එළැඹියයුත්තාහුයි.) භික්ඛුනී, භික්ෂුණීන්; (මෙහෙණ

---

1. අනොපානභූතානි-ත්‍රි. මූ.

(අ) තත්ථ කතමො ගොචරො? ඉධෙකච්චො න වෙසියගොචරො හොති…පෙ…න පානාගාරගොචරො, අසංසට්ඨො විහරති රාජූහි…පෙ…තිත්ථියසාවකෙහි අනනුලොමිකෙන සංසග්ගෙන යානි වා පන තානි කුලානි සද්ධානි පසන්නානි ඔපානභූතානි කාසාවපජ්ජොතානි ඉසිවාතපරිවාතානි අත්ථකාමානි…පෙ…යොගක්ඛෙමකාමානි භික්ඛූනං …පෙ…උපාසිකානං, තථාරූපානි කුලානි සෙවති භජති පයිරුපාසති,

---

හුන් උභයනතාබ්‍රහ්මචර්‍ය්‍යා ඇතිබැවින් මහණුදු එසේම බැවින් සංඝයා විසින් එළැඹීමෙහි බ්‍රහ්මචර්‍ය්‍යාන්තරාය ද වේනුයි නො එළැඹියයුතුවේ) පානාගාරගොචරො වා, රාගෙ[1]ගොචරකොට ඇත්තේද; (රාසොඬුන් අවිවික්ත බැවින් බ්‍රහ්මචර්‍ය්‍යාන්තරාය කරනබැවින් රාගගෙය ද නොඑළැඹියයුතුවේ.) රාජූහි, රජදරුවන්හා ද; රාජමහාමත්තෙහි, රජඉසුරුවැනි මහත් ඉසුරෙන් යුක්ත රාජමහාමාත්‍යයන්හා ද; තිත්ථියෙහි, තීර්ත්ථකයන්හා ද; තිත්ථියසාවකෙහි, ඔවුන්කෙරෙහිදෘඪභක්ති ඇති ප්‍රත්‍යයදායකවූ ශ්‍රාවකයන්හා ද; අනනුලොමිකෙන සංසග්ගෙන සංසට්ඨො, ත්‍රිවිධ ශික්ෂාවන්ට ප්‍රතිපක්ෂවූ සංසර්ගයෙන් හැණි; විහරති, වෙසේ; යානි වා පන. තානි කුලානි, යම් ඒ කුලකෙනෙක්; අසද්ධානි, බුද්ධාදීන් කෙරෙහි හැදහිලිනැති; අප්පසන්නානි, එහෙයින්ම අප්‍රසන්නවූ; (නොහොත්: කර්මඵල ශ්‍රද්ධානැතතෙන් අශ්‍රද්ධවූ රත්නත්‍රයට ප්‍රසාද නැතිබැවින් අප්‍රසන්නවූ යන අර්ත්ථයි.) අක්කොසකපරිභාසකානි, දශආක්‍රෝශවස්තුවෙන් ආක්‍රෝශහා භය දක්වීමෙන් සන්තර්ජනයකෙරෙද්ද; අනත්ථකාමානි, අනර්ත්ථ ම කැමතිවෙද්ද; අහිතකාමානි, අහිතම කැමතිවෙද්ද; අඵාසුකාමානි, නොම සුව කැමතිවෙද්ද; අයොගක්ඛෙමකාමානි, භය කැමතිවෙද්ද; භික්ඛූනං, භික්ෂූන්ටද; (සාමණේරයෝද මෙහිම ගණන්නෝ;) භික්ඛුනීනං, භික්ෂුණීන්ටද;(සික්ඛාමානා සාමණේරීහුද මෙහිම ගණන්නෝ.)උපාසකානං, උපාසකයන්ටද; උපාසිකානං, උපාසිකාවන්ටද; ("අනත්ථකාමානි" යනාදීන් හා සම්බන්ධකරනු.) තථාරූපානිකුලානි, එබඳු කුලයන්; සෙවති, සෙවීද; (නිසාජීවත්වේද යන අර්ත්ථයි.) භජති, උන්කරා එළැඹේද; පයිරුපාසති, නැවත නැවත යේද; අයං, මේ වෙශ්‍යාදි රාජාදි අශ්‍රද්ධකුලාදි ත්‍රිප්‍රකාරය; අගොචරො වුච්චති, අගොචරයයි කියනුලැබේ; (මිහි පඤ්චකාමගුණනිශ්‍රය බැවින් ශ්‍රමණධර්ම්මයට අනුපනිශ්‍රයබැවින් වෙශ්‍යාදීද-ලාභසත්කාරසංඝාව නැමැති අසන්පාතයට හෙතුවනබැවින් රජදරුවන් හා මහාමාත්‍යයෝද දෘෂ්ටිවිපත්තියට හෙතුවනබැවින් තීර්ත්ථක ශ්‍රාවකයෝද-ශ්‍රද්ධාහානිය චිත්තභේදය යන මොවුන් එළැඹෙන[2]හෙයින් අශ්‍රද්ධාදිකුලයෝද අගොචරනම් වෙති…

(අ) (ගොචරනිද්දේශයෙහි"න වෙසිය ගොචරො වා"යනාදීන්ගෙ අර්ත්ථ අගොචර නිද්දේශයෙහි කී නියායෙන් දතයුතුවේ.) ඔපානභූතානි, භික්ෂුභික්ෂුණී සඞ්ඝයාහට සතරමංසන්ධියෙහි බුන් උදපානයක්වැනි

---

1. රහගෙ-මු. ස. 2. එළඹන-ඇතැම්.

අයං වුච්චති ගොචරො. ඉති ඉමිනා ච ආචාරෙන ඉමිනා ච ගොචරෙන උපෙතො හොති සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො තෙන වුච්චති ආචාරගොචර සම්පන්නොති.

(අ) අපිචෙත්ථ ඉමිනාපි නයෙන ආචාරගොචරා වෙදිතබ්බා—දුවිධො හි අනාචාරො කායිකො වාචසිකො ච තත්ථ කතමො කායිකො අනාචාරො? ඉධෙකච්චො සඞ්ඝගතොපි අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තො පි තිට්ඨති, ඝට්ටයන්තො පි නිසීදති, පුරතොපි තිට්ඨති, පුරතොපි නිසීදති, උච්චෙපි ආසනෙ නිසීදති, සසීසම්පි පාරුපිත්වා නිසීදති, ඨිතකොපි භණති, බාහාවික්ඛෙපකොපි භණති, ථෙරානං භික්ඛූනං අනුපාහනානං චඞ්කමන්තානං සඋපාහනො චඞ්කමති, නීචෙ චඞ්කමෙ චඞ්කමන්තානං උච්චෙ චඞ්කමෙ චඞ්කමති, ඡමාය චඞ්කමන්තානං චඞ්කමෙ චඞ්කමති, ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජාපි තිට්ඨති, අනුපඛජ්ජාපි නිසීදති, නවෙපි භික්ඛූ ආසනෙන පටිබාහති,

---

වේද්ද; කාසාවපජ්ජොතානි, භික්ෂුභික්ෂුණීන් හන්පෙරෙව්සිවුරෙහි ප්‍රභාවෙන් එකාලොක වේද්ද; ඉසිවාතපරිවාතානි, ගෙට වදන නික්මෙන භික්ෂුභික්ෂුණීන් සඞ්ඛ්‍යාත ඍෂීන්ගෙ චීවරවාතයෙනු ද සම්මිඤ්ජනපසාරණයෙන් ජනිත ශරීරවාතයෙනු ද පරිවාතවූ; (ගමන ලද නොහොත් නිර්ධූතකිල්විෂ ඇති හෝ -පෙ-) ඉති, මෙසේ; ඉමිනා ච ආචාරෙන, මෙ ආචාරයෙන්ද; ඉමිනා ච ගොචරෙන, මෙ ගොචරයෙන්ද; උපෙතො හොති, යුක්තවේද; ("උපෙතො" යනාදි "සම්පන්නො" යන්නට පර්‍යාය්‍යයි:-)

(අ) (දූන් නිදෙස්නයින් ආචාරගොචරයන් දක්වනපිණිස "අපිචෙත්ථ" යනාදි ආරම්භකොළෝ) එත්ථ, මෙ ප්‍රාතිමොක්ෂසංවරසීල නිර්දේශයෙහි; ඉමිනාපිනයෙන, මෙ නයිනු ද; ආචාරගොචරා වෙදිතබ්බා, ආචාරගොචරයෝ දතයුත්තාහුයි; දුවිධො හි අනාචාරො, අනාචාරය ද්විප්‍රකාරවේ; කායිකො වාචසිකො ච, කායික අනාචාරය වාචසික අනාචාරයයි; තත්ථ, එදෙක්හි; කතමො කායිකොඅනාචාරො, කවර කායිකඅනාචාරවේද; ඉධ, මෙහි; එකච්චො, එකෙක්; සඞ්ඝගතොපි, සඞ්ඝ සන්නිපාතයට පැමිණියේද; අචිත්තීකාරකතො, නොකරනලද ගෞරව ඇත්තේ; ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තො, ස්ථවිරභික්ෂූන් සිවුරෙන් හෝ ශරීරයෙන් හෝ ඝටන්නේ; තිට්ඨති, සිටිනේද; නිසීදති, හිඳුනේද; ("පුරතොපි තිට්ඨති අචිත්තීකාරකතො" හි සම්බන්ධනීයයි මතුයෙහි සිටිනක්හු මෙන් සිටිද) උච්චෙ ආසනෙපි, උස්අස්නෙහිදු; සසීසම්පිපාරුපිත්වා නිසීදති, හිස් වසා පොරවා හිඳිද; ඨිතකොපි භණති, ආසනනතැන සිට බෙණේද; බාහාවික්ඛෙපකොපි, අත වනනා; ථෙරානං භික්ඛූනං, ස්ථවිරභික්ෂූන්; අනුපාහනානං චඞ්කමන්තානං, වහන්නැතිව සක්මන් කරද්දී; සඋපාහනො චඞ්කමති,

ජන්තාඝරෙ පි ථෙරෙ භික්ඛූ අනාපුච්ඡා කට්ඨං පක්ඛිපති, ද්වාරං පිදහති, උදකතිත්ථෙ පි ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තො පි ඔතරති, පුරතො පි ඔතරති, ඝට්ටයන්තො පි නහායති, පුරතො පි නහායති, ඝට්ටයන්තො පි උත්තරති, පුරතො පි උත්තරති, අන්තරඝරං පවිසන්තො පි ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තො පි ගච්ඡති, පුරතො පි ගච්ඡති, වොක්කම්ම ච ථෙරානං භික්ඛූනං පුරතො ගච්ඡති, යානි පි තානි හොන්ති කුලානං ඔවරකානි ගුළ්හානි ච පටිච්ඡන්නානි ච යත්ථ කුලිත්ථියො කුලකුමාරියො නිසීදන්ති තත්ථ පි සහසා පවිසති, කුමාරකස්ස පි සීසං පරාමසති. අයං වුච්චති කායිකො අනාචාරො.

(අ) තත්ථ කතමො වාචසිකො අනාචාරො? ඉධෙකච්චො සඞ්ඝගතො පි අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ අනාපුච්ඡා ධම්මං භණති, පඤ්හං විස්සජ්ජෙති, පාතිමොක්ඛං උද්දිසති, ඨිතකො පි භණති, බාහාවික්ඛෙපකො පි භණති, අන්තරඝරං පවිට්ඨො පි ඉත්ථිං වා කුමාරිං වා එවමාහ.

---

විහන්නෑහී සක්මන්කෙරෙද, නීචෙ චඞ්කමෙ චඞ්කමන්තානං, මිටි සක්මන සක්මන් කරද්දී; උච්චෙ චඞ්කමෙ චඞ්කමති, උස් සක්මන සක් මන් කෙරෙද; ඡමාය චඞ්කමන්තානං, බිම සක්මන් කරද්දී; චඞ්කමෙ චඞ්කමති, සක්මන සක්මන්කෙරෙද; ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජා පි, ස්ථවිර භික්ෂූන් සිටිතැනට වැද ආසනාව සිටීද; නවෙ භික්ඛූ, තමහට බාල භික්ෂූන්; ආසනෙන පටිබාහති, පස්අස්නෙන් පිළිබඟාද; ජන්තාඝ රෙ පි, ගිනිහල්ගෙහි ද; ථෙර භික්ඛූ අනාපුච්ඡා, ස්ථවිරභික්ෂූන් නොපිළි විස; කට්ඨං පක්ඛිපති, අග්නිකුණ්ඩයෙහි දර බහාලාද; ද්වාරං පිදහති; ගිනිහල්ගෙහි දොර පියාද; උදකතිත්ථෙ පි, පැන්තොටද; ථෙරෙ භික්ඛූ, ස්ථවිරභික්ෂූන්; ඝට්ටයන්තො පි, ඝටන්නෙ; ඔතරති, බසීද; නහායති, නහාද; පුරතො, පෙර ව; උත්තරති, නැගෙද; අන්තරඝරං පවි සන්තො පි, ගොචරග්‍රාමයට වදනෙ ද; (“**අනන්තරන්තරෙ ඝරානි එත්ථ එතස්සාති වා අන්තරඝරං ගොචරගාමො**” යි ගන්නේ.) පුරතො ගච්ඡති, ස්ථවිරභික්ෂූන් ඉක්ම පළමුව යේද; කුලානං, කුලවැස්සන්ගෙ; යානිපිතානි ඔවරකානි හොන්ති, යම් ඒ ගර්භසඞ්ඛ්‍යාත අවරක කෙනෙක් වෙද්ද; ගුළ්හානි, පියවින්ම මුවහවූ; පටිච්ඡන්නානි; කඩ තුරා ආදියෙන් මුවහවූ; යත්ථ, යම් ගමෙක; කුලිත්ථියො, කුලස්ත්‍රීහු, කුලකුමාරියො, කුලකුමාරීහු; නිසීදන්ති, හිඳිද්ද; තත්ථ පි, එහිදු; සහසා පවිසති, වහා වදනෙ ද; කුමාරකස්ස පි සීසං පරාමසති; කුමරුන් හිස පිරිමදීද:-

(අ) ථෙරෙ භික්ඛූ අනාපුච්ඡා,[1] ස්ථවිරභික්ෂූන් නොපිළිවිස; ධම්මං භණති, බණකියාද; පඤ්හං විස්සජ්ජෙති, පැන විසඳද; පාතිමොක්ඛං උද්දිසති, පාමොක් උදෙසාද; ඨිතකො පි භණති, අවනත නොව සිටිවත සිට බෙණෙද; බාහාවික්ඛෙපකො පි භණති, අත් වත වනා බෙණෙ ද; අන්තරඝරං පවිට්ඨො පි, ඇතුළුගමට වන්නෙ ද; ඉත්ථිං වා; ස්ත්‍රියකට වත්; කුමාරිං වා, කුමරියකට වත්; එවමාහ, මෙසේ කියාද;-

---

1 අනාපුච්ඡිත්වා- ඇතැම්.

(අ) ඉත්ථං නාමෙ ඉත්ථං ගොත්තෙ කිං අත්ථි? යාගු අත්ථි, භත්තං අත්ථි, ඛාදනීයං අත්ථි, කිං පිවිස්සාම, කිං ඛාදිස්සාම, කිං භුඤ්ජිස්සාම, කිං වා මෙ දස්සථාති විප්පලපති. අයං වුච්චති වාචසිකො අනාචාරො. පටිපක්ඛවසෙන පනස්ස ආචාරො වෙදිතබ්බො. අපි ච භික්ඛු සගාරවො සප්පතිස්සො හිරොත්තප්පසම්පන්නො සුනිවත්ථො සුපාරුතො පාසාදිකෙන අභික්කන්තෙන පටික්කන්තෙන ආලොකිතෙන විලොකිතෙන සම්මිඤ්ජිතෙන පසාරිතෙන ඔක්ඛිත්තචක්ඛු ඉරියාපථසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ ජාගරියානුයුත්තො සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො අප්පිච්ඡො සන්තුට්ඨො ආරද්ධවිරියො ආභිසමාචාරිකෙසු සක්කච්චකාරී ගරුචිත්තීකාරබහුලො විහරති, අයං වුච්චති ආචාරො. එවං තාව ආචාරො වෙදිතබ්බො.

---

(අ) ඉත්ථං නාමෙ, මෙනම් තෙනැත්තිය; ඉත්ථං ගොත්තෙ, මෙනම් ගොත්‍රඇත්තිය; කිං අත්ථි, කුමක් ඇද්ද, යාගු අත්ථි, කැඳ ඇද්ද; භත්තං අත්ථි, බත් ඇද්ද; ඛාදනීයං අත්ථි, කැවුම් ඇද්ද; කිං පිවිස්සාම, කුමක් බොමොද; කිං ඛාදිස්සාම, කුමක් කමොද; කිං භුඤ්ජිස්සාම, කුමක් වළඳමොද; කිං වා මෙ දස්සථාති, කුමක් මට දේදැයි; විප්පලපති, දොඩාද; අයං, මෙතෙමෙ; වාචසිකො අනාචාරො වුච්චති, වාචසික අනාචාරයයි කියනලැබේ. අස්ස, මේ අනාචාරයට; පටිපක්ඛවසෙන, ප්‍රතිපක්‍ෂවිසින්; ආචාරො වෙදිතබ්බො, ආචාරය දතයුතු; ("අපි ච භික්ඛු" යන හැම තැන්හිම භික්‍ෂුහට ආචාරදර්ශනවශයෙන් ප්‍රවෘත්ත අට්ඨකථාවචනය නිර්දේශපාළි නොවෙයි දතයුතු.) අපි ච, අනිකෙකුදු; භික්ඛු, මහණතෙමෙ; සගාරවො, ශ්‍රද්ධාශ්‍රුතත්‍යාගාදිගුණහෙතුකොට ඇති ගෞරවයෙන් යුක්තවූයෙ; සප්පතිස්සො, ගුරුස්ථානයෙහි ගෞරව සාරද්ධ්‍යාදිවශයෙන් ප්‍රතිශ්‍රවසහිතවූයෙ; (නීචවෘත්ති ඇත්තේය යන අර්ථයි;) හිරොත්තප්පසම්පන්නො, හිරිඔතප්දෙකින් යුක්තවූයෙ, සුනිවත්ථො, සෙඛියධම්මයපාරිපූරිවශයෙන් මනාකොට හැඳ; සුපාරුතො, මනාකොට පෙරෙවියෙ; පාසාදිකෙන, ප්‍රසාද එළවනුවූ; අභික්කන්තෙන, ගමන්ඇතියෙ; (ඉත්ථම්භූතලක්‍ෂණයෙහි කරණවචනයි සෙසුපෙදෙහි දු මෙම නයයි.) පටික්කන්තෙන, ඒම ඇතියෙ; ආලොකිතෙන, ඉදිරියෙහි බැලුම් ඇතියෙ; විලොකිතෙන, අනුදිග බැලුම්ඇතියෙ; සම්මිඤ්ජිතෙන, හස්තපාදයන්ගෙ හැකිළිම්ඇතියෙ පසාරිතෙන, දික්කිරීම්ඇතියෙ; ඔක්ඛිත්තචක්ඛු, යුගමාත්‍රදර්ශීබැවින් යටහෙළූ ඇස්ඇතියෙ; ඉරියාපථසම්පන්නො, ප්‍රසාදකර ඉරියවු ඇති බැවින්ම සම්පන්නඊර්යාපථ ඇතියෙ; ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො, ෂඩින්ද්‍රියයන්කෙරෙහි සුසංවෘතවූ ආරක්‍ෂා ඇතියෙ; භොජනෙ මත්තඤ්ඤූ, පරිභුඤ්ජිතව්‍යබැවින් භොජනසංඥවූ චතුර්විධප්‍රත්‍යයෙහි පර්යේෂණ ප්‍රතිග්‍රහණ පරිභොගාදිවිසින් සර්වාකාරයෙන් ප්‍රමාණදන්නෙ; ජාගරියානුයුත්තො, භාවනාමනස්කාරසඞ්ඛ්‍යාත ජාගර්‍ය්‍යායෙහි යුක්තප්‍රයුක්ත වූයෙ; ("සතිසම්පජඤ්ඤෙන" යනාදි යථොක්ත ආචාරයට සම්භාර

(අ)ගොචරො පන තිවිධො:–උපනිස්සය ගොචරො ආරක්ඛගොචරො උපනිබන්ධ ගොචරොති. කතමො උපනිස්සයගොචරො? දසකථාවත්ථු ගුණසමන්නාගතො කල්‍යාණමිත්තො යං නිස්සාය අස්සුතං සුණාති සුතං පරියොදපෙති කඞ්ඛං විතරති දිට්ඨිං උජුං කරොති චිත්තං පසාදෙති, යස්ස වා පන අනුසික්ඛමානො සද්ධාය වඩ්ඪති සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය වඩ්ඪති, අයං උපනිස්සයගොචරො. කතමො ආරක්ඛ ගොචරො? ඉධ භික්ඛු අන්තරඝරං පවිට්ඨො වීථිං පටිපන්නො ඔක්ඛිත්ත චක්ඛු යුගමත්තදස්සාවී සංවුතො ගච්ඡති, න හත්ථිං ඔලොකෙන්තො

---

දක්වන පිණිස කීහු.) සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො, සිහිනුවණ දෙකින් යුක්තවූ; අප්පිච්ඡො, ඉච්ඡා නැතියෙ; සන්තුට්ඨො, යථාලාභාදි සන්තොෂයෙන් සන්තුෂ්ටවූයෙ; ආරද්ධවිරියො, වැඩූවීර්‍ය්‍යඇත්තෙ; ආභිසමාචාරිකෙසු, ආභිසමාචාරිකශීලයෙහි; සක්කච්චකාරී, සත්කෘත්‍ය කාරීවූයෙ; (ආදරකරන්නෙය යි යන අර්ථයි.) ගරුචිත්තීකාරබහුලො විහරති, ගරුස්ථානයෙහි ආදරබහුලවූයෙ වෙසෙද; අයං වුච්චති ආචාරො, මෙ සගාරවාදිතෙමෙ ආත්මකාමයන් විසින් ආචරිතව්‍ය බැවින් ආචාරයයි කියනලැබේ.

(අ) ගොචරො පන, ගොචරය වනාහි; තිවිධො, ත්‍රිවිධවේ; උපනිස්සය ගොචරො, ශීලාදිගුණයන්ට උපනිශ්‍රයවූ ගොචරය; ආරක්ඛගොචරො, ස්මෘතිසඞ්ඛ්‍යාතවූ සිතට ආරක්ෂකවූ ගොචරය; උපනිබන්ධගොචරො, කම්මට්ඨානසඞ්ඛ්‍යාතවූ සිත්හු උපනිබන්ධස්ථානවූ ගොචරය; කතමො උපනිස්සයගොචරො, උපනිශ්‍රයගොචරනම් කවරෙක්ද;? දසකථාවත්ථු ගුණසමන්නාගතො, අප්පිච්ඡකථා ආදිවූ දශකථාවන්ට පිහිටවූ ගුණෙන් සමන්විතවූ; කල්‍යාණමිත්තො, කල්‍යාණමිත්‍රයි; යං නිස්සාය, යම් කල්‍යාණමිත්‍රයකු නිසා; අස්සුතං සුණාති, අශ්‍රැතගෙය්‍යාදි අසාද; සුතං, අසනලද්ද; පරියොදපෙති, නැවත නැවත පරිපෘච්ඡාවෙන් විශුද්ධකෙරෙද; කඞ්ඛං විතරති, ශ්‍රැතස්ථානයෙහි සංසය දුරුකෙරෙද; දිට්ඨිං උජුං කරොති, කම්මඵලයෙහි දු රත්නත්‍රයෙහි දු සම්‍යග්දෘෂ්ටියෙ සෘජුකරණවශයෙන් දෘෂ්ටිය සෘජුකෙරෙද; චිත්තං පසාදෙති, එම කම්මඵලයෙහි දු රත්නත්‍රයෙහි දු ශ්‍රද්ධාවෙන් සිත පහදවාද; (නොහොත්: යථාශ්‍රැතධම්මය පරිශුද්ධකොට එහි ආ රූපාරූපධම්මයන් පරිග්‍රහ කොට සප්‍රත්‍යය නාමරූපයන් බලනුයෙ සත්කායදෘෂ්ටිසඞ්ඛ්‍යාත වඞ්කවිධමනයෙන් දෘෂ්ටිය සෘජුකෙරෙද, ධම්මයන්ගෙ ප්‍රත්‍යයප්‍රත්‍යය සමුත්පන්නතාදිමාත්‍රදර්ශනයෙන් අධ්වත්‍රයෙහි ම කාඞ්ක්ෂා දුරුකෙරෙද, එසින් මතුයෙහි දු උදයව්‍යයඥානාදි විසින් විදර්ශනාවඩා ආර්‍ය්‍යභූමි ප්‍රාප්තව අවෙත්‍යප්‍රසාදයෙන් රත්නත්‍රයෙහි සිත පහදවා මෙබඳුවූයෙ ඒ කල්‍යාණමිත්‍රයා අනුව හික්මෙන්නේ ශ්‍රද්ධාදිගුණයෙන් නොපිරිහෙයි, ඒකාන්තයෙන් වැඩීමවෙයි. එහෙයින්ම කීහ "යස්ස වා" යනාදී)යස්සවා පන අනුසික්ඛමානො, යමක්හු අනුව හික්මෙන්නේ; සද්ධායවඩ්ඪති, ශ්‍රද්ධාවෙන් වඩීද; සීලෙන, ශීලයෙන්; සුතෙන, ශ්‍රැතයෙන්; චාගෙන,

න අස්සං න රථං න පත්තිං න ඉත්ථිං න පුරිසං ඔලොකෙන්තො න උද්ධං ඔලොකෙන්තො න අධො ඔලොකෙන්තො න දිසාවිදිසං පෙක්ඛමානො ගච්ඡති, අයං ආරක්ඛගොචරො. කතමො උපනිබන්ධගොචරො? චත්තාරො සතිපට්ඨානා යත්ථ චිත්තං උපනිබන්ධති, වුත්තං හෙතං භගවතා:- "කො ච භික්ඛවෙ භික්ඛුනො ගොචරො. සකො පෙත්තිකො විසයො යදිදං චත්තාරො සතිපට්ඨානා"ති. අයං උපනිබන්ධගොචරො.[1] ඉති ඉමිනා ච ආචාරෙන ඉමිනා ච ගොචරෙන උපෙතො -පෙ- සමන්නාගතො, තෙන වුච්චති ආචාරගොචරසම්පන්නොති-

---

න්‍යායයෙන්; පසන්නය, ප්‍රසන්නවෙන්; වඩ්ඪති, වඩීද; අයං, මෙ; උපනිස්සයගොචරො, උපනිශ්‍රයගොචරනම්; ඉධ, මෙහි; භික්ඛු, භික්ෂු තෙමෙ; අන්තරඝරං පවිට්ඨො, ගොචරග්‍රාමයට වන්නේ; වීථිං පටිපන්නො, ඒ ඒ ගෙහි භික්ෂාපර්‍යෙෂණයපිණිස වීථියට පැමිණියෙ; ඔක්ඛිත්තචක්ඛු, යට හෙළූ ඇස්ඇතියෙ; යුගමත්තදස්සාවී, යුගමාත්‍රයක් බලන්නෙ; (කෙපමණකින් ඔක්ඛිත්තචක්ඛුනම් වෙ ද යන ආශඞ්කාවෙහි "යුගමත්තදස්සාවී" කීහු.) සංවුතො ගච්ඡති, සංයතව යෙයි; (සංයතාකාර දක්වන පිණිස "න හත්ථිං ඔලොකෙන්තො" යනාදි කීහු.) න හත්ථිං ඔලොකෙන්තො, ඇත්හු නොබලන්නේ; අස්සං, අසුන්; රථං, රථ; පත්තිං, පදාතීන්; ඉත්ථිං, ස්ත්‍රීන්; පුරිසං, පුරුෂයන්; න ඔලොකෙන්තො, නො බලනුයෙ; (න යනු වෙන වෙනම යොදනු.) න උද්ධං ඔලොකෙන්තො, උඩ නො බලනුයෙ; න අධො ඔලොකෙන්තො, කඳට බිඳගෙණ යට නො බලන්නෙ; න දිසාවිදිසං පෙක්ඛමානො, දික් අනුදික් නො බලන්නෙ; ගච්ඡති, යේද; අයං ආරක්ඛගොචරො, ඔබ මොබ නො බැලීමෙහි අසංවරය රක්නා මේ ස්මෘති යම ආරක්ඛගොචර නම; කතමො, කවරෙක්; උපනිබන්ධගොචරො, උපනිබන්ධගොචර නම් ද; චත්තාරො සතිපට්ඨානා; සතරමහසී වටන්හුයි; යත්ථ චිත්තං උපනිබන්ධති, යම් සතිපට්ඨානයෙක්හි භාවනා චිත්තය එළවා බඳී ද; (කීයෙමෑ නු.

"යථා ථම්භෙ නිබන්ධෙය්‍ය වච්ඡං දමමං නරො ඉධ
බන්ධෙය්‍යෙවං සකං චිත්තං සතියාරම්මණෙ දළ්හ"න්ති.

ඒ සතරමහසීවටන්හු උපනිබන්ධගොචර නම් වෙති යන අර්ථයි.) වුත්තංහෙතං භගවතා, මෙ භගවත්හු විසින් වදාරනලදී; භික්ඛවෙ, මහණෙනි; භික්ඛුනො, භික්ෂූහුගෙ; ගොචරො, ගොචරය; කො ච, කවරෙක්ද; සකො පෙත්තිකො විසයො, තමාගෙ පිතෘවූ සම්‍යක් සම්බුද්ධයන් සන්තකවූ; (ඔවුන් විසින් දෘෂ්ටවූ විෂය යි.) යදිදං චත්තාරො සතිපට්ඨානා, යම් මේ සතරමහසීවටන් කෙනෙක් ඇද්ද; ("සො සකො පෙත්තිකො විසයො"යි යොදනු.) අයං උපනිබන්ධගොචරො, මේ උපනිබන්ධගොචරනම් -පෙ-

---

1. උපනිබද්ධගොචරො-ඇතැම්.

(අ) "අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී" ති අණුප්පමාණෙසු අසඤ්චිච්ච ආපන්නසෙඛියඅකුසලචිත්තුප්පාදාදිභෙදෙසු වජ්ජෙසු භයදස්සනසීලො. "සමාදාය සික්ඛති සික්ඛාපදෙසූ"ති යං කිඤ්චි සික්ඛාපදෙසු සික්ඛිතබ්බං තං සබ්බං සම්මා ආදාය සික්ඛති. එත්ථ ච පාතිමොක්ඛසංවරසංවුතොති එත්තාවතා ච පුග්ගලාධිට්ඨානාය දෙසනාය පාතිමොක්ඛසංවරසීලං දස්සිතං, ආචාරගොචරසම්පන්නොති ආදි පන සබ්බං යථා පටිපන්නස්ස තං සීලං සම්පජ්ජති තං පටිපත්තිං දස්සෙතුං වුත්තන්ති වෙදිතබ්බං.

---

(අ) "අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී" යන්නෙහි; අණුප්පමාණෙසු, පරමාණුප්‍රමාණවූ; ("අසඤ්චිච්ච ආපන්නසෙඛියෙසු" යි අසඤ්චිච්චග්‍රහණය සෙඛිය විශෙෂණ කොට "අකුසලචිත්තුප්පාදාදි භෙදෙසු"යි යොදනු.) අසඤ්චිච්ච ආපන්නසෙඛිය, නොදැන වැරද අපරිමණ්ඩලකොට හැඳීම් ආදීන් අවන් සෙඛියය අකුසලචිත්තොත්පාදය යනාදි ප්‍රභෙදඇති; වජ්ජෙසු, වරදෙහි; (ආදිග්‍රහණයෙන් ප්‍රාතිමොක්ෂ සංවරශුද්ධිය පිණිස නො ඉක්මියයුතුවූ ආපත්තියට නොපැමිණියයුතු දොෂයන්ගෙ ග්‍රහණය වේ-මිහි සෙඛියග්‍රහණයෙන් වෘත්තස්කන්ධාදියෙහි ආගතවෘත්තාදීන්ගෙ දු ග්‍රහණය වේ. ඔවුහුදු හික්මිය යුතුබැවින් සෙඛිය නම් වන බැවින් මෙසේ කදුවත් ආදිහු දු සෙඛිය යෙහිම සඞ්ග්‍රහවනබැවින්ම මාතෘකාවෙහි පරාජිකාදීන් මෙන් සෙඛිය යන්ගෙ පරිච්ඡෙද නොදක්වනලදී. අසඤ්චිච්චග්‍රහණය ද ඔවුන්ට සෙඛිය බව ඇතිකල්හි ම සමර්ථිත වෙ. මාතෘකාගත පන්සත්තෑ සෙඛියයන් කෙරෙහි නොසඤ්චිච්චමොබවූ කිසි සෙඛියයක් නැති බැවින් අසඤ්චිච්චග්‍රහණයෙන් ම "අසතියා අජානන්තස්ස" යනු දු ගැනේ.) භයදස්සනසීලො, පරමාණුමාත්‍ර වරදෙහි දු මහමෙර වැනි කොට භය දක්නාසුලුවෙ ද; (නොහොත්: සම්ලසුවූ දුර්භාෂිත පමණකු දු පාරාජිකාවක්සේ භයදක්නාසුලු වෙ ද) "සමාදාය සික්ඛති සික්ඛාපදෙසු" යන්නෙහි, යං කිඤ්චි සික්ඛාපදෙසු සික්ඛිතබ්බං, ශික්ෂා පදයෙහි මූලප්‍රඥප්තිය අනු ප්‍රඥප්තිය සර්වත්‍රප්‍රඥප්තිය ප්‍රදෙශප්‍රඥප්තිය යනාදි භෙදඇති යම් කිසිවෙක් හික්මියයුතු ද පිළිපැද්ද යුතු ද පිරිය යුතු ද; තං සබ්බං, එ සියල්ල; සම්මා ආදාය, මනාකොට ගෙන; සික්ඛති, හික්මෙන්නෙ ද; එත්ථ ච, මිහි වනාහි; "පාතිමොක්ඛසංවරසංවුතො" ති එත්තාවතා, "පාතිමොක්ඛසංවරසංවුතො" යන මෙපමණකින්; පුග්ගලාධිට්ඨානාය දෙසනාය, පුද්ගලාධිෂ්ඨානදෙශනාවෙන්; පාතිමොක්ඛසංවරසීලං දස්සිතං, ප්‍රාතිමොක්ෂසංවරසීලය දක්වනලදී; ආචාරගොචරසම්පන්නොති ආදි පන සබ්බං, ආචාරගොචර සම්පන්නො යනාදි සියල්ල වනාහි; යථා පටිපන්නස්ස තං සීලං සම්පජ්ජති, යම්සේ පිළිපන්නහුට ඒ ශීලය සමෘද්ධවෙද; තං පටිපත්තිං දස්සෙතුං වුත්තන්ති වෙදිතබ්බං, ඒ ප්‍රතිපත්තිය දක්වන පිණිස කියනලදැයි දතයුතු.

---

(අ) යං පනෙතං තදනන්තරං "සො චක්ඛුනා රූපං දිස්වා"ති ආදිනා නයෙන දස්සිතං ඉන්ද්‍රියසංවරසීලං. තත්‍ථ **සො** ති සො පාතිමොක්ඛසංවරසීලෙ ඨිතො භික්ඛු; **චක්ඛුනා රූපං දිස්වා** ති කාරණවසෙන චක්ඛූති ලද්ධවොහාරෙන රූපදස්සනසමත්‍ථෙන චක්ඛුවිඤ්ඤාණෙන රූපං දිස්වා; පොරාණා පනාහු:-චක්ඛු රූපං න පස්සති අචිත්තකත්තා, චිත්තං න පස්සති අචක්ඛුකත්තා, ද්වාරාරම්මණසඞ්ඝට්ටෙ පන පසාදවත්‍ථුකෙන [1] චිත්තෙන පස්සති. ඊදිසී පනෙසා ධනුනා විජ්ඣතීති ආදීසු විය සසම්භාරකථා නාම හොති. තස්මා චක්ඛුවිඤ්ඤාණෙන රූපං දිස්වාති අයමෙත්‍ථ අත්‍ථොති.

(අ) තදනන්තරං, ඒ ප්‍රාතිමොක්ෂසංවරසීලයට අනන්තරකොට; සො චක්ඛුනා රූපං දිස්වාති ආදිනා නයෙන, "සො චක්ඛුනා රූපං දිස්වා" යනාදි නයින්; යං පනෙතං ඉන්ද්‍රියසංවරසීලං දස්සිතං, යම් ඒ ඉන්ද්‍රිය සංවරශීලයෙක් දක්වන ලදද; තත්‍ථ, එහි; සොති "සො"යි; සො පාතිමොක්ඛසංවරසීලෙ ඨිතොභික්ඛු, ඒ ප්‍රාතිමොක්ෂසංවරසීලයෙහි සිටි මහණ; "චක්ඛුනා රූපං දිස්වා" යන්නෙහි; කාරණවසෙන, යවාඞ්කුරය හෙරිශබ්දය යනු මෙන් අසාධාරණකාරණවශයෙන්; චක්ඛූතිලද්ධවොහාරෙන, චක්ෂුස යි ලබ්ධව්‍යවහාරඇති; රූපදස්සනසමත්‍ථෙන, රූපදර්ශනයට සමර්‍ථවූ; චක්ඛුවිඤ්ඤාණෙන රූපං දිස්වා, චක්ෂුර්විඥානයෙන් රූපයදැක; පොරාණා පන, පුරාතනයෝ වනාහි; ආහු, මෙසේ කීහු:-චක්ඛු, චක්ෂුසතෙමෙ; රූපං න පස්සති, රූපය නොදකී; අචිත්තකත්තා, තමා සිත් නොවන හෙයින්; (ඉදින් චක්ෂුස රූපය දකී නම් අන්‍යවිඥානසමඞ්ගීනයාගෙ ද චක්ෂුස දක්නෙ යි:-මෙම කීහ. "යදි චක්ඛු රූපං පස්සෙය්‍ය අඤ්ඤවිඤ්ඤාණසමඞ්ගිනො පි පස්සෙය්‍ය න චෙතං අත්‍ථි තස්මා අචෙතනත්තා චක්ඛුස්ස"යි) චිත්තං න පස්සති, චිත්තය ද රූපය නොදකී; අචක්ඛුකත්තා, තමා ඇස් නොවන හෙයින්; (ඉදින් විඥානය රූප දකීනම් කුඩ්‍යාද්‍යන්තරිතරූපය දක්නේයි අප්‍රතිඝ බැවින්-මෙම කීහ:-"අථ විඤ්ඤාණං රූපං පස්සෙය්‍ය තිරොකුඩ්ඩාදිගතම්පි තං පස්සෙය්‍ය අප්පටිඝභාවතො ඉදම්පි නත්‍ථි සබ්බස්ස විඤ්ඤාණස්ස දස්සනාභාවතො"යි) ද්වාරාරම්මණ සඞ්ඝට්ටෙ පන, ද්වාරයාගෙ අරමුණු හා සැපීමක් ඇතිකල්හි; (චක්ෂුසට රූපය හමුවූ කල්හිය යන භාවයි.) පසාදවත්‍ථුකෙන චිත්තෙන, චක්ෂුප්‍රසාදය වස්තු කොට ඇති සිතින්; (චක්ෂුරාශ්‍රිතවිඥානයද ආලොකයට විබන්ධවූ කුඩ්‍යාදීන් ව්‍යවහිතයෙහි නොඋපදී-සඵටිකාභ්‍රපටලාදිවූ යමෙක විබන්ධනැද්ද ඉහි අනන්තරිතයෙහි ද උපදීමැයි:-මෙම කීහ:- "**යස්‍ය චක්ෂුඃ පශ්‍යතීති දර්‍ශිනං තස්‍ය න සර්‍වං චක්ෂුඃ පශ්‍යති කිං තර්හි විඥානාධිෂ්ඨිතං යස්‍ය තු විඥානං පශ්‍යති දර්‍ශිනං තස්‍යා'පි න සර්‍වං විඥානං පශ්‍යති කිං තර්හි චක්ෂුරාශ්‍රිතං නචව්‍යවහිතෙ නොත්පාද්‍යතෙ**

1. චක්ඛුප්පසාද වත්‍ථුකෙන-ත්‍රි. මු
පසාද වත්‍ථුකෙනාති, චක්ඛුප්පසාදවත්‍ථුකෙන;-ටී.

(අ) න නිමිත්තග්ගාහීති ඉත්ථිපුරිසනිමිත්තං වා සුභනිමිත්තාදිකං වා කිලෙසවත්ථුභූතං නිමිත්තං න ගණ්හාති, දිට්ඨමත්තෙ යෙව සණ්ඨාති. නානුබ්‍යඤ්ජනග්ගාහීති කිලෙසානං අනුබ්‍යඤ්ජනතො පාකටභාව කරණතො අනුබ්‍යඤ්ජනන්ති ලද්ධවොහාරං හත්ථපාදසිතහසිතකථිත විලොකිතාදිභෙදං ආකාරං න ගණ්හාති; යං තත්ථ භූතං තදෙව

---

**සත්‍රාලොකස්‍ය කුඩ්‍යාදෞ ප්‍රතිබිම්බං යත්‍රචප්‍රතිබිම්බං ස්ඵටිකාභ්‍ර පටලාදෞ තත්‍ර ව්‍යවහිතො ප්‍යුත්පාද්‍යත එව තස්මාත් තදනුත්පත්ත්‍යා දව්‍යහිතගෙහෙන චක්ෂුර් න පශ්‍යති විවක්ෂිතානනසීඳූකතම් චක්ෂුර්විඥනං පශ්‍යතීති දර්ශනසාධනං හි චක්ෂුර්විඥනමිති"** නොහොත්: ආශ්‍රිතක්‍රියා ආශ්‍රයෙහි එව "චක්ඛුනාරූපං දිස්වා" යි කීහු- මෙද කීහ. **"අථවා ආශ්‍රිතකර්මාශ්‍රයස්‍යොච්‍යතෙ" "යථා මඤ්චාඃක්‍රොශන්තී"ති**[1] පස්සති, දක්නෙයි; (චක්ෂුඃප්‍රසාදසන්නිශ්‍රයවූ විඥනයා තමාගෙ නිශ්‍රය ගුණ ආලොක්‍යයෙන් අනුගෘහීතකරනලද රූපාලම්බනයා පහළකරන කල්හි ඒ විඥන සමන්විතපුද්ගලතෙමෙ රූපය බලන්නෙය යි කියන ලැබේ:-ආලම්බනයාගෙ යථාස්වභාවයෙන් විභාවනය ප්‍රත්‍යක්ෂග්‍රහණය අවභාස නමැයි දතයුතු:-මෙමකීහ."චක්ඛුප්පසාද සන්නිස්සයෙ හි විඤ්ඤණෙ ආලොකානුග්ගහිතං රූපාරම්මණං සන්නිස්සයගුණෙන ඔභාසෙන්තෙ තං සමඞ්ගිපුග්ගලො රූපං පස්සතීති වුච්චති. ඔභාසනඤ්චෙත්ථ ආරම්මණස්ස යථාසභාවතො විභාවනං යං පච්චක්ඛතොගහණන්ති වුච්චතී"යි.) ධනුනා විජ්ඣතීති ආදිසු විය, ශරයෙන් ලක්ෂවේධය සිඳවතු දු ශරයට සම්භාරවූ දුන්නෙන් විඳුනෙය[2] යනාදී මෙන්;ඊදිසීපනෙසා කථා,විඥනයෙන් රූපදර්ශනය සිඳවතුදු"චක්ඛුනා රූපංපස්සති" යනාදි; සසම්භාරකථානාම හොති, සසම්භාරකථා නම් වෙ-(දර්ශනකාරණප්‍රසාදයා හා එක්කොට කී බැවින්.) තස්මා, යම්හෙයකින් කෙවලවස්තුවෙන් හෝ කෙවලවිඥනයෙන් හෝ දර්ශනය නොවෙ ද එහෙයින්; චක්ඛුවිඤ්ඤණෙන රූපං දිස්වාති, චක්ෂුර්විඥනයෙන් රූපය දක යන; අයං, මෙ තෙමෙ; එත්ථ අත්ථො, මෙහි අර්ථයි.

(අ) න නිමිත්තග්ගාහීති, (යන්නෙහි;) ඉත්ථිපුරිස නිමිත්තං වා, ස්ත්‍රී සන්තානනියතවූ ස්තනමාංශවෛශද්‍යාදී ස්ත්‍රීනිමිත්ත හෝ උක්තවිපර්‍ය්‍යායෙන් පුරුෂනිමිත්ත හෝ; සුභනිමිත්තාදිකං වා, සුභනිමිත්තාදිවූ (රාගොත්පත්ති හෙතුවූ ඉෂ්ටාකාරය සුභනිමිත්ත නම ආදිශබ්දයෙන් ද්වෙෂොත්පත්තිකාරණසඞ්ඛ්‍යාත ප්‍රතිඝනිමිත්ත ද අඥනොපෙක්ෂාවට වස්තුවූ අරමුණුනමැති උපෙක්ෂානිමිත්ත ද ගැනේ-පෙළ අභිධ්‍යාදෞර්මනස්‍යයන් ස්වරූපයෙන් අවද "මුට්ඨස්සච්චං වා අඤ්ඤණං වා"යි වක්ෂ්‍යමාණබැවින් අසමප්‍රෙක්ෂණයෙන් උපදනා මොහයද අසංවරම වේනුයි උපෙක්ෂානිමිත්තද සඞ්ග්‍රහ කරනලදී.) කිලෙසවත්ථුභූතං

---

1 උක්කොශන්තීති-මු. ස. 2 විදිනෙය-ඇතැම්.

ගණ්හාති. චෙතියපබ්බතවාසී මහාතිස්සත්ථෙරො විය:- ථෙරං කිර චෙතියපබ්බතා අනුරාධපුරං පිණ්ඩචාරත්ථාය ගච්ඡන්තං අඤ්ඤතරා කුලසුණ්හා සාමිකෙන සද්ධිං භණ්ඩිත්වා සුමණ්ඩිතපසාධිතා දෙවකඤ්ඤා විය කාලස්සෙව අනුරාධපුරතො නික්ඛමිත්වා ඤාතිඝරං ගච්ඡන්තී අන්තරාමග්ගෙ ථෙරං දිස්වා විපල්ලත්ථචිත්තා මහාහසිතං හසි. ථෙරො කිමෙතන්ති ඔලොකෙන්තො තස්සා දන්තට්ඨිකෙ අසුභසඤ්ඤං පටිලභිත්වා අරහත්තං පාපුණි.

---

නිමිත්තං න ගණ්හාති, ලොභ ද්වෙෂ මොහ යන ක්ලෙශයන්ට කාරණවූ නිමිත්තය නොගනීද; දිට්ඨමත්තෙනෙව සණ්ඨාති, වර්ණායතනයෙහි චක්ෂුර්විඥානයා විසිනුදු වීථිචිත්තයන් විසිනුදු ගන්නාලද පමණෙහිම සිටිනෙ ද; (මතුයෙහි ද කිසි ශුභාදි ආකාරයක් කල්පනා නොකෙරේය යන අර්ථයි.) "නානුබ්‍යඤ්ජනග්ගාහී" යන්නෙහි; කිලෙසානං අනුබ්‍යඤ්ජනතො, කෙලෙසුන් මතුමතුයෙහි පහළකරනබැවින්; පාකටභාවකරණතො, පරිව්‍යක්ත[1] කරනබැවින්; අනුබ්‍යඤ්ජනන්ති ලද්ධවොහාරං, අනුබ්‍යඤ්ජනය යන ව්‍යවහාරලද; හත්ථ, හස්තය; පාද, පාදය; සිත, මඳසිනාය; හසිත, මහසිනාය; කථිත, බිණීමය; විලොකිත, බැලීමය යන; ආදි, මෙආදී භෙදඇති; ආකාරං න ගණ්හාති, ආකාරග්‍රහණය නොකෙරේද; යං තත්ථ භූතං, ඒ ශරීරයෙහි විද්‍යමානවූ යම් කෙශ ලොමාදියෙක් භූතොපාදාය පමණෙක් හෝ ඇද්ද; තදෙව ගණ්හාති, ඒම යථාවශයෙන් ගනිති; චෙතියපබ්බතවාසී; චෛත්‍ය පර්වතයෙහි වසන; මහාතිස්සත්ථෙරො විය, මහාතිස්සනම් තෙරුන්මෙන්; ථෙරං කිර, තෙරුන්; (කිර යනු අනුශ්‍රවනයෙහියි.) චෙතියපබ්බතා, සෑගිරියෙන්; අනුරාධපුරං, අනුරාධපුරයට; පිණ්ඩචාරත්ථාය ගච්ඡන්තං, පිඬුසිඟනපිණිස යන්නවුන්; අඤ්ඤතරා කුලසුණ්හා, එක්තරා කුලයෙනෙළියක්; සාමිකෙන සද්ධිං භණ්ඩිත්වා, ස්වාමිහු හා සමග කලහකොට; සුමණ්ඩිතපසාධිතා, මනාකොට සැදී පහසින් ගන්නාලද්දී යි; (ආභරණාදි බාහිරොපකරණයෙන් සැදීම මණ්ඩන නම උවට්ටනාදි විසින් ශරීර පටිසංඛරණය පසාධන නමැයි කියත්-වස්ත්‍රමාල්‍යාදීන් අලඞ්කරණය පසාධන නම උද්ඝස්ථාන පූරණය මණ්ඩන නම) දෙවකඤ්ඤාවිය, දෙවඟනකමෙන්; කාලස්සෙව, උදෑසනම; අනුරාධපුරතො නික්ඛමිත්වා, අනුරාධපුරෙන් නික්ම; ඤාතිඝරං ගච්ඡන්තී, ඤාතිකුලයට යන්නී; අන්තරාමග්ගෙ, අතුරුමඟ; ථෙරං දිස්වා, තෙරුන් දැක; විපල්ලත්ථචිත්තා, රාගවශයෙන් පෙරළිසිත්ඇත්තී; මහාහසිතං හසි, තමාබලවමි යි මහසිනා කළා; ථෙරො, තෙරහු; කිමෙතන්ති ඔලොකෙන්තො, මනසිකාරයුක්තව යන්නාහු සමීපශබ්දානුසාරයෙන් මෙ කිමෙක්දෝහෝයි බලන්නාහු; තස්සා, ඇගෙ; දන්තට්ඨිකෙ, දත්ඇට; අසුභසඤ්ඤං පටිලභිත්වා, අසුභසංඥාව පිළිලැබ; අරහත්තං පාපුණි, රහත්බවට පැමිණියෝ.

---

1. පරිව්‍යක්ත-ඇතැම්.

තෙන වුත්තං.

32 "තස්සා දන්තට්ඨිකං දිස්වා පුබ්බසඤ්ඤං අනුස්සරි
තත්ථෙව සො ඨිතො ථෙරො අරහත්තමපාපුණී"ති.

(අ) සාමිකො පි පනස්සා අනුමග්ගං ගච්ඡන්තො ථෙරං දිස්වා කච්චි භන්තෙ ඉත්ථිං පස්සථාති පුච්ඡි. තං ථෙරො ආහ:-

33 "නාභිජානාමි ඉත්ථී වා පුරිසො වා ඉතො ගතො
අපි ච අට්ඨිසඞ්ඝාටෝ ගච්ඡතෙ ස මහාපථෙ"ති.

(ආ)"**යත්වාධිකරණමෙනං**"න්ති[1] ආදිම්හි යං කාරණා යස්ස චක්ඛුන්ද්‍රියාසංවරස්ස හෙතු එතං පුග්ගලං සතිකවාටෙන චක්ඛුන්ද්‍රියං අසංවුතං අපිහිතචක්ඛුද්වාරං හුත්වා විහරන්තං එතෙ අභිජ්ඣාදයො ධම්මා අන්වාස්සවෙය්‍යුං අනුප්පබන්ධෙය්‍යුං, **තස්ස සංවරාය පටිපජ්ජති** තස්ස චක්ඛුන්ද්‍රියස්ස සතිකවාටෙන පිදහනත්ථාය පටිපජ්ජති.

---

(තෙරහු පියවින්ම අට්ඨිකකම්මට්ඨානය මෙනෙහිකෙරෙමින් යන්නාහු ඒ ස්ත්‍රිය පවත්වන මාගමගේ[2] දන්තාස්ථිකයෙහි පූර්වභාගභාවනා සුභාවිතබැවින් ප්‍රතිභාගනිමිත්ත ද සාක්ෂාත් උපචාරය ද ලදින් එතැනම සිට ප්‍රථමධ්‍යානය ලදින් ඒ පාදකකොට විදර්ශනා වඩා මාර්ගපටිපාටියෙන් අර්හත්වයට පැමිණියෝ.)

තෙන වුත්තං, එහෙයින් කියනලදී.

32. තස්සා දන්තට්ඨිකං දිස්වා, ඒ මා ගමගෙ දත්ඇට දැක; පුබ්බසඤ්ඤං අනුස්සරි, තමන් මූලකර්මස්ථානවූ අස්ථිකසංඥව සිහිකළෝ; තත්ථෙව ඨිතො, එතැන්හිම සිටි; සො ථෙරො, ඒ තෙරහු; අරහත්තං අපාපුණි, අර්හත්වයට පැමිණියෝ.

(අ) අස්සා, ඒ මාගමගෙ; සාමිකො පි පන, ස්වාමී ද; අනුමග්ගං ගච්ඡන්තො, ඈ පසුපස්සෙ යන්නෙ; ථෙරං දිස්වා, තෙරුන් දැක; භන්තෙ, වහන්ස; කච්චි, කිම; ඉත්ථිං පස්සථාති, ස්ත්‍රියක දුටුදැ යි; පුච්ඡි, පිළිවිස්සි, තං, ඔහට; ථෙරො ආහ, තෙරහු මෙසේ කීවූ:-

33. ඉතොගතො, මෙසේ ගියේ; ඉත්ථී වා පුරිසො වා, ස්ත්‍රියෙකැයි හෝ පුරුෂයෙකැයි හෝ; නාභිජානාමි, නොදනිමි; අපි ච, එකෙක්ඇති; මහා පථෙ, මහවත; එස අට්ඨිසඞ්ඝාටො, මෙ ඇට සැකිල්ලෙක්; ගච්ඡති, යන්නේයි; (ඒ ස්ථවිරයන්ට භාවනාව ප්‍රගුණබැවින් දන්තාස්ථිදර්ශනයෙන් සකලශරීරය අස්ථිසඞ්ඝාතභාවයෙන් වැටහිණ. ගැහැණියෙකැයිවත් පුරුෂයෙකැයිවත් නොහැඳින්නේ එහෙයින් කීහ "නාභිජානාමි" යනාදී.)

(ආ) "**යත්වාධිකරණ මෙතං**"යනාදියෙහි; යං කාරණා, යම් කාරණයෙකින්; යස්ස චක්ඛුන්ද්‍රියාසංවරස්ස හෙතු, යම් චක්ෂුරින්ද්‍රියයක්හුගේ අසංවරය හෙතුකොටගෙන; එතං පුග්ගලං, ඒ පුඟුලා; ("යං කාරණා" යනු

---

1. සත්වාධිකරණමෙතන්ති-මු. ස.	2. මහගමගෙ-ඇතැම්.

(අ) එවං පටිපජ්ජන්තො යෙව ච රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජතීති පි වුච්චති. තත්ථ කිඤ්චාපි චක්ඛුන්ද්‍රියෙ සංවරො වා අසංවරො වා නත්ථි, න හි චක්ඛුපසාදං නිස්සාය සති වා මුට්ඨස්සච්චං වා උප්පජ්ජති. අපි ච යදා රූපාරම්මණං චක්ඛුස්ස ආපාථං ආගච්ඡති තදා භවඞ්ගෙ විකඛත්තුං උප්පජ්ජිත්වා නිරුද්ධෙ කිරියමනොධාතු ආවජ්ජනකිච්චං සාධයමානා උප්පජ්ජිත්වා නිරුජ්ඣති, තතො චක්ඛුවිඤ්ඤාණං දස්සනකිච්චං, තතො විපාකමනොධාතු සම්පටිච්ඡනකිච්චං, තතො විපාකාහෙතුකමනොවිඤ්ඤාණධාතු සන්තීරණකිච්චං, තතො කිරියාහෙතුකමනොවිඤ්ඤාණධාතු වොට්ඨපනකිච්චං සාධයමානා උප්පජ්ජිත්වා නිරුජ්ඣති. තදනන්තරං ජවනං ජවති. තත්‍රාපි නෙව භවඞ්ගසමයෙ න ආවජ්ජනාදීනං අඤ්ඤතරසමයෙ

---

'යත්වාධිකරණං' යනුයෙහි අර්ථය. "එතං පුග්ගලං" යනු 'එතං' යනුයෙහි අර්ථයි.) සතිකවාටෙන, සිහිනැමැති දොරින්; චක්ඛුන්ද්‍රියං අසංවුතං, අසංවෘතචක්ෂුරින්ද්‍රිය ඇත්තහු; අපිහිතචක්ඛුද්වාරං හුත්වා විහරන්තං, සිහිකවුළුවෙන් නොපියනලද චක්ඛුද්වාරඇතිව වසන්නහු; එතෙ අභිජ්ඣාදයො ධම්මා, මේ අභිධ්‍යාදි ධර්මයෝ; (අන්වාස්සවෙය්‍යුං, යි සේයි;) අනුප්පබන්ධෙය්‍යුං, අනුබඳනාහුද; (තස්ස සංවරාය පටිපජ්ජති, යි සේයි;) තස්ස චක්ඛුන්ද්‍රියස්ස, ඒ චක්ෂුරින්ද්‍රියයාගෙ; සතිකවාටෙන පිදහනත්ථාය, සිහිනැමැති දොරින් පියනුපිණිස; පටිපජ්ජති, පිළිපදී.

(අ) එවං පටිපජ්ජන්තො යෙව, මෙසේ පිළිපදනේම; රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රිය රක්නේයි; චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජතීති, චක්ෂුරින්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි; වුච්චති, කියනුලැබේ. ("යස්ස චක්ඛුන්ද්‍රියාසංවරස්ස හෙතු"යි කී බැවින් "තස්ස චක්ඛුන්ද්‍රියාසංවරස්ස" යි නොකියා "තස්ස චක්ඛුන්ද්‍රියස්ස සතිකවාටෙන පිදහනත්ථාය"යි කුමක්සඳහා කීහයත්? චක්ෂුරින්ද්‍රියයාගෙ අසංවරයට හෙතුවූ අභිධ්‍යාදීන්ගෙ අන්වාශ්‍රවණය අසංවෘතචක්ෂුරින්ද්‍රියය හෙයිනැයි දක්වනු සඳහා කීහු.) තත්ථ, ඒ ද්වාරයෙහිදු; ("කිඤ්චාපි චක්ඛුන්ද්‍රියෙ සංවරො වා අසංවරො වා නත්ථි ජවනක්ඛණෙ උප්පජ්ජමානො පි වුත්තො"යි සම්බන්ධයි.) කිඤ්චාපි, කිසිසේත්; චක්ඛුන්ද්‍රියෙ, චක්ෂුරින්ද්‍රියෙහි; සංවරො වා, සංවරයෙක් හෝ අසංවරොවා, අසංවරයෙක් හෝ නත්ථි, නැති; චක්ඛුපසාදං නිස්සාය, චක්ෂුඃප්‍රසාදය නිසා; සති වා, ස්මෘතිය හෝ; මුට්ඨස්සච්චං වා, සිහිමුළාව හෝ; න හි උප්පජ්ජති, නොඋපදී;(කියනු ලබන්නා සංවරබැවින් සෙසු සංවරතබා "සති වා මුට්ඨස්සච්චං වා" යනුයෙන් සතිසංවර අසංවරදෙක කීවෙත්. "අපි ච"යි සංවරාසංවර නැති සෙසු තැනුදු දක්වනු පිණිස කීහු.) යදා, යම්කලෙක; රූපාරම්මණං, රූපාලම්බනය; චක්ඛුස්ස, චක්ෂුසට; ආපාථං ආගච්ඡති, හමුබවට ඒද; තදා, එකල්හි; භවඞ්ගෙ, භවාඞ්ගය; විකඛත්තුං උප්පජ්ජිත්වා නිරුද්ධෙ,

සංවරො වා අසංවරො වා අත්‍ථි. ජවනක්ඛණෙ පන සචෙ දුස්සීල්‍යං වා මුට්ඨස්සච්චං වා අඤ්ඤාණං වා අක්ඛන්ති වා කොසජ්ජං වා උප්පජ්ජති අසංවරො හොති. එවං හොන්තො පන සො චක්ඛුන්ද්‍රියෙ අසංවරොති වුච්චති. කස්මා? යස්මා තස්මිං සති ද්වාරම්පි අගුත්තං හොති භවඞ්ගම්පි ආවජ්ජනාදීනි පි වීථිචිත්තානි. යථා කිං? යථා නගරෙ චතුසු ද්වාරෙසු අසංවුතෙසු කිඤ්චාපි අන්තොඝරද්වාර කොට්ඨකගබ්භාදයො සුසංවුතා පි [1] තථා පි අන්තො නගරෙ සබ්බං භණ්ඩං අරක්ඛිතං අගොපිතමෙව හොති. නගරද්වාරෙහි පවිසිත්වා චොරා යදිච්ඡන්ති තං කරෙය්‍යුං.

---

දෙවරෙක ඉපද නිරුඬවූ කල්හි; කිරියමනොධාතු, කිරිය මනොධාතුතොමෙ; ආවජ්ජනකිච්චං සාධයමානා, ආවර්ජනකෘත්‍යය සාධමින්; උප්පජ්ජිත්වා නිරුජ්ඣති, ඉපද නිරුඬවේ; තතො, ඉක්බිත් තෙන්; චක්ඛුවිඤ්ඤාණං, චක්‍ෂුර්විඥානය; දස්සනකිච්චං, දර්‍ශනකෘත්‍යයද; තතො, ඉක්බිත්තෙන්; විපාකමනොධාතු, විපාක මනොධාතුව; සම්ප ටිච්ඡනකිච්චං, සම්ප්‍රත්‍යෙෂණ කෘත්‍යයද; තතො, ඉක්බිත්තෙන්; විපාකා හෙතුකමනොවිඤ්ඤාණධාතු; විපාකවූ අහෙතුකමනොවිඥානධාතුව; සන්තීරණකිච්චං, සන්තීරණකෘත්‍යයද; තතො, ඉක්බිත්තෙන්; කිරියා හෙතුකමනොවිඤ්ඤාණධාතු, ක්‍රියාවූ අහෙතුකමනොවිඥානධාතුව; වොත්ථපනකිච්චං සාධයමානා, ව්‍යවස්ථාපනකෘත්‍යය සාධමින්; උප්පජ්ජිත්වා නිරුජ්ඣති, ඉපද නිරුඬවෙ; තදනන්තරං, එයට අනතුරෙහි; ජවනං, ජවන්; ජවති, දිවෙ; තත්‍රාපි, මොවුන්කෙරෙහි; භවඞ්ගසමයෙ, භවාඞ්ගයෙහිදු; ("නෙව අත්‍ථි" යොදනු.) ආවජ්ජනාදීනං, ආවර්ජනා දීන් අතුරෙන්; අඤ්ඤතරසමයෙ, එක්තරා එකක්හු වන සමයෙහිද; සංවරො වා, සංවරයෙක් හෝ; අසංවරො වා, අසංවරයෙක් හෝ; න හි අත්‍ථි, නොම ඇති; ජවනක්ඛණෙ පන, ජවනක්‍ෂණයෙහි වනාහි; සචෙ, ඉදින්; දුස්සීල්‍යං වා, දෞශ්ශීල්‍යය හෝ; මුට්ඨස්සච්චං වා, මුළාවූ සමෘතිය හෝ; අඤ්ඤාණං වා, අඥානය හෝ; අක්ඛන්ති වා, අක්‍ෂාන්තිය හෝ; කොසජ්ජං වා, කෞශීද්‍යය හෝ; උප්පජ්ජති, උපදී ද; අසංවරො හොති, අසංවරය වේ. (මිහි "දුස්සීල්‍යං වා" යනාදි නැවත නොකියනු පිණිස මෙ දෙරම සියල්ල කීබැවින් ෂඩ්ද්වාරයෙහි යථාසම්භවයෙන් දතයුතු කායවාග්දුශ්චරිත සඞ්ඛ්‍යාත දෞශ්ශීල්‍ය අසංවරය මනොද්වාර වශයෙන් ද සෙසු අසංවරයන් ෂඩ්ද්වාර වශයෙන්ද යෙදියයුතු-මුට්ඨ සච්චාදීන් සමෘතිප්‍රතිපක්‍ෂ අකුශලධම්මයන් බැවින් උන්ගෙ පස්දෙර උපත්වෙ නමුදු පඤ්චද්වාරික ජවනයන් අවිඥප්තිජනක බැවින් කායික වාචසික ව්‍යතික්‍රමවූ දෞශ්ශීල්‍යයාගේ පස්දෙර උපත්නො වෙයි දතයුතු-දෞශ්ශීල්‍යාදිපස් අසංවරයො ශීලසංවරාදි පස්දෙන හට ප්‍රතිපක්‍ෂබැවින් කියනලදනු.) එවං හොන්තො පන සො, මෙසේ

---

1. සුසංවුතා හොන්ති-ත්‍රි. මූ,

(අ) එවමෙව ජවනෙ දුස්සීල්‍යාදිසු උප්පන්නෙසු තස්මිං අසංවරෙ සති ද්වාරම්පි අගුත්තං හොති භවඞ්ගම්පි ආවජ්ජනාදීනි පි වීථිචිත්තානි. තස්මිං පන සීලාදිසු උප්පන්නෙසු ද්වාරම්පි ගුත්තං හොති භවඞ්ගම්පි ආවජ්ජනාදීනි පි වීථිචිත්තානි. යථා කිං? යථා නගරද්වාරෙසු සුසංවුතෙසු කිඤ්චාපි අන්තොඝරාදයො අසංවුතා හොන්ති, තථා පි අන්තොනගරෙ සබ්බං භණ්ඩං සුරක්ඛිතං සුගොපිතමෙව හොති, නගරද්වාරෙසු පිහිතෙසු චොරානං පවෙසො නත්ථි. එවමෙව ජවනෙ සීලාදිසු උප්පන්නෙසු ද්වාරම්පි ගුත්තං හොති භවඞ්ගම්පි ආවජ්ජනාදීනි වීථිචිත්තානි පි, තස්මා ජවනක්ඛණෙ උප්පජ්ජමානො චක්ඛුන්ද්‍රියසංවරොති වුත්තො. සොතෙන සද්දං සුත්වාති ආදිසු පි එසෙව නයො.

---

ජවනක්ෂණයෙහි වන අසංවරය; චක්ඛුන්ද්‍රියෙ අසංවරොති වුච්චති, චක්ෂුරින්ද්‍රියෙහි අසංවරයයි කියනු ලැබේ; කස්මා, කුමක්හෙයිනයත්; යස්මා, යම්හෙයකින්; තස්මිං සති, ඒ අසංවරය ඇතිකල්හි; ද්වාරම්පි අගුත්තං හොති, ද්වාරය ද අගුප්තවෙයි; භවඞ්ගම්පි, භවාඞ්ගය ද; ආවජ්ජනාදීනි පි වීථිචිත්තානි, ආවර්ජනාදී වීථිචිත්තයෝ ද අගුප්තම වෙත්; යථා කිං, කුමක්මෙනයත්; යථා, යම්සේ; නගරෙ, නුවරෙහි; චතූසු ද්වාරෙසු අසංවුතෙසු, සතරදොර අපිහිතකල; කිඤ්චාපි, කිසිසේත්; අන්තො, ඇතුළෙහි; ඝරද්වාරකොට්ඨකගබ්භාදයො; ගෙදොර කොටුගෙ ගබ් ආදීහු; සුසංවුතා පි, සුපිහිතවූනමුදු; තථා පි, එතකුදුවුවත්; අන්තොනගරෙ, ඇතුළුනුවර; සබ්බං භණ්ඩං, සියලු බඩු; අරක්ඛිතං අගොපිත මෙව හොති, අරක්ෂිත අගොපිතම වෙ; නගරද්වාරෙහි පවිසිත්වා, නුවරදොරින් වැද; චොරා, සොරහු, යදිච්ඡන්ති, යමක් කැමැත්තොද; තං කරෙය්‍යුං, ඒ කරන්නාහුයි;

(අ) එවමෙව, එපරිද්දෙන්ම; ජවනෙ, ජවන්හි; දුස්සීල්‍යාදිසු උප්පන්නෙසු, දෞශ්ශීල්‍යාදීන් උපන්කල්හි; තස්මිං අසංවරෙ සති, ඒ ජවන්හි අසංවරය ඇතිකල්හි; ද්වාරම්පි අගුත්තං හොති; දොරද අගුප්ත වෙයි; භවඞ්ගම්පි, භවාඞ්ගයද; ආවජ්ජනාදීනි වීථිචිත්තානිපි, ආවර්ජනාදි වීථිචිත්තයෝද අගුප්තවෙත්; තස්මිං පන, ඒ ජවන්හි; සීලාදිසු උප්පන්නෙසු, ශීලාදීන් උපන්කල්හි; ද්වාරම්පි ගුත්තං හොති, දොර ද ගුප්තවෙයි; භවඞ්ගම්පි, භවාඞ්ගය ද; ආවජ්ජනාදීනි වීථිචිත්තානි පි, ආවර්ජනාදි වීථිචිත්තයෝද ගුප්තවෙත්; යථා කිං, කුමක්හෙයිනයත්; යථා, යම්සේ; නගරද්වාරෙසු සුසංවුතෙසු, නුවරදොර සුපිහිතකල්හි; කිඤ්චාපි, කිසිසේත්; අන්තො, ඇතුළුනුවර; ඝරාදයො, ගෙ ආදීහු; අසංවුතා හොන්ති, අපිහිතවූ නමුදු; තථා පි, එතකුදුවුවත්; අන්තොනගරෙ, ඇතුළුනුවර; සබ්බං භණ්ඩං, සියලු බඩු; සුරක්ඛිතං සුගොපිතමෙවහොති, සුරක්ෂිත සුගොපිතමවෙ; නගරද්වාරෙසු පිහිතෙසු, නුවරදොර පිහිත කල්හි; චොරානං පවෙසො නත්ථි, සොරුන්ගෙ ප්‍රවෙශය නොවෙ; එවමෙව, එසේම; ජවනෙ සීලාදිසු උප්පන්නෙසු, ජවන්හි ශීලසංවර සතිසංවර ඤාණසංවර ඛන්තිසංවර විරියසංවර උපන්

(අ) එවමිදං සඞ්ඛෙපතො රූපාදිසු කිලෙසානුබන්ධ නිමිත්තාදිගාහ පරිවජ්ජනලක්ඛණං ඉන්ද්‍රියසංවරසීලන්ති වෙදිතබ්බං.

---

කල්හි; ද්වාරම්පි ගුත්තං හොති, දොර ද ගුප්තවෙයි; භවඞ්ගම්පි, භවාඞ්ගය ද; ආවජ්ජනාදීනි වීථිචිත්තානි පි, ආවර්ජනාදි වීථිචිත්ත යෝද ගුප්ත ම වෙත්; තස්මා, එහෙයින්; ජවනක්ඛණෙ උප්පජ්ජමානො, ජවනක්‍ෂණයෙහි උපදනේ; චක්ඛුන්ද්‍රියසංවරොති වුච්චති, චක්‍ෂුරින්ද්‍රිය සංවරයයි කියනලදී.

(මෙහි “යථාකිං” යනාදීන් නුවරෙහි දොර අසංවෘතකල්හි තත් සම්බන්ධගෘහාදීන්ගෙ අසංවෘතබවමෙන් ජවනයෙහි අසංවරය ඇති කල්හි තත්සම්බන්ධ ද්වාරාදීන්ගෙ ද අසංවෘතබව වේනුයි මෙසේ අන්‍ය සංවරයෙක්හි අන්‍යසංවෘතත්වසාමාන්‍යයම නිදර්ශිත කළහ. පූර්වාපර සාමාන්‍යය හෝ අන්තර්බහිස්සාමාන්‍යය හෝ. නිදර්ශිත නොකළහ යි දතයුතු. නොහොත්: ද්වාරභවඞ්ගාදීන් ඇතිකල්හි පසුව උපදනාජව නය බාහ්‍යයා මෙන් කොට නුවරදොර හා සමකළහ. සෙසු ද්වාර භවාඞ්ගය ඇතුළුනුවර හා සමකළෝ. ප්‍රත්‍යයබලයෙන් ප්‍රථමොත්පන්නවූ භවඞ්ගාදිතෙමෙ ජවනක්‍ෂණයෙහි අවිද්‍යමානවූයෙද චක්‍ෂුරාදීන්මෙන් ඵලනිෂ්පත්තිය පිණිස විද්‍යමානනම් වෙයි දතයුතු. බාහ්‍යයාමෙන් යනු දූ පරමාර්ථහෙයින් ජවන්හුගේ බාහිරබව හා ද්වාරභවාඞ්ගයන්ගෙ අභ්‍යන්තරබව නැතද “පභස්සරමිදං භික්ඛවෙ චිත්තං තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිට්ඨං”යි වදාළබැවින් ආගන්තුකවූ කිසිකලෙක උපදනාවූ ජවනයට බාහිරබව ද තද් විධුරස්වභාව ද්වාරාදීන්ට අබ්‍යන්තරභාවය ද එක්ලෙසක ලැබේනුයි කියනලදී- මෙහි චක්‍ෂුර්ද්වාරයට රූපය හමුවූකල්හි නියමිතාදිවශයෙන් කුශලාකුශලජවනයන් සත්වරෙක ඉපද භවාඞ්ගපාතවූකල තදනුරූපවූ මනොද්වාරිකජවනය එම අරමුණෙහි සත්වරෙක ඉපද භවාඞ්ගපාතවූ කල නැවත එම දොර එම අරමුණුනිසා ස්ත්‍රිය පුරුෂය යනාදි වශයෙන් නියමකෙරෙමින් ප්‍රසාදරඤ්ජනාදිවශයෙන් සත්වරෙක ජවන් දිවෙයි. මෙසේ පවත්නා ජවනය සඳහා “ජවනෙ දුස්සිල්‍යාදිසු උප්පන්නෙසු තස්මිං අසංවරෙ සති ද්වාරම්පි අගුත්තං”* යනාදි කියනලදී.)

“සොතෙන සද්දං සුත්වා” යනාදියෙහිදු; එසෙවනයො, මෙම නයයි;

(ශබ්දාදියෙහි දු යථායොගයෙන් නිමිත්තානුබ්‍යඤ්ජනයෝ දත යුත්තාහුයි-ශ්‍රොත්‍රයෙන් ශබ්දය අසා ස්ත්‍රීශබ්දය පුරුෂශබ්දයයි හෝ ඉෂ්ටානිෂ්ටාදිවූ හෝ ක්ලේශවස්තුවූ නිමිත්තය නොගන්නෙය ශ්‍රැත මාත්‍රයෙහිම සිටිනේයි-ගීතශබ්දාදියෙහි දු ක්ලේශයන් නැවත නැවත පහළකරණ හෙයින් අනුබ්‍යඤ්ජනයයි ලබ්ධව්‍යවහාරඇති මන්දතාරාදි වශයෙන් ව්‍යවස්ථිත ෂඩ්ජාදි භෙදභින්නආකාරයද නොගන්නෙයි. මෙසේ ගන්ධාදියෙහිදු යථායොගයෙන් යෙදියයුතු. මනොද්වාරයෙහි වනාහි සාවර්ජනභවාඞ්ගය මනොද්වාරනම් වෙයි. එ දොර ධර්මාලම්බනය හමුවූකල හේ ජවනය මනසින්ම දූනය යනාදීන් යෙදියයුතු.

(අ) එවං, මෙසේ; ඉදං, මේ; සඞ්ඛෙපතො, සඞ්ක්‍ෂෙපයෙන්; රූපාදිසු රූපාදිඅරමුණුන්කෙරෙහි; කිලෙසානුබන්ධනිමිත්තාදිගාහපරිවජ්ජන

(අ) ඉදානි ඉන්ද්‍රියසංවරසීලානන්තරං වුත්තෙ ආජීවපාරිසුද්ධිසීලෙ "ආජීවහෙතු පඤ්ඤත්තානං ඡන්නං සික්ඛාපදානන්ති-යානි තානි ආජීවහෙතු ආජීවකාරණා පාපිච්ඡො ඉච්ඡාපකතො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති ආපත්ති පාරාජිකස්ස. ආජීවහෙතු ආජීවකාරණා සඤ්චරිත්තං සමාපජ්ජති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ආජීවහෙතු ආජීවකාරණා 'යො තෙ විහාරෙ වසති සො භික්ඛු අරහා'ති, භණති පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස. ආජීවහෙතු ආජීවකාරණා භික්ඛු පණීතභොජනානි අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. ආජීවහෙතු ආජීවකාරණා භික්ඛුනී පණීතභොජනානි අගිලානා අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාටිදෙසනීයස්ස. ආජීවහෙතු ආජීවකාරණා සූපං වා ඔදනං වා අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති දුක්කටස්සා"ති. එවං පඤ්ඤත්තානි ඡ සික්ඛාපදානි. ඉමෙසං ඡන්නං සික්ඛාපදානං.

---

ලක්ඛණං, කෙලෙසුන්ගෙ අනුබැඳීම් ඇති නිමිත්තානුබ්‍යඤ්ජන ග්‍රාහයන් දුරුකිරීම ලක්‍ෂණකොට ඇත්තේ; ඉන්ද්‍රියසංවර සීලන්ති වෙදිතබ්බං, ඉන්ද්‍රියසංවරශීලයයි දතයුතු.

——+——

(අ) ඉදානි, දැන්; ඉන්ද්‍රියසංවරසීලානන්තරං, ඉන්ද්‍රියසංවරශීලයට අනන්තරකොට; වුත්තෙ, යට උද්දෙසවශයෙන් කියනලද; ආජීවපාරිසුද්ධිසීලෙ, ආජීවපාරිසුද්ධිසීලයෙහි; ("ආජීවහෙතු පඤ්ඤත්තානං ඡන්නං සික්ඛාපදානං" යන්නෙහි; "යානි තානි එවං පඤ්ඤත්තානි ඡ සික්ඛාපදානි" යි සම්බන්ධකරනු.) ආජීවහෙතු, ජීවිකාහෙතුවෙන්; (මෙසේකල ප්‍රත්‍යයෙන් අකලාන්තව ජීවත්වෙමියි. යන අභිප්‍රාවෙනැයි සේයි-ආජීවකාරණා යනු එයටම පර්‍යායයි.) පාපිච්ඡො, අසද්ගුණ සම්භාවනෙච්ඡායෙන් සමන්විතවූයෙ; ඉච්ඡාපකතො, ඉච්ඡාවෙන් මඩනාලද්දෙ; අසන්තං, තමා සතන්හි අවිද්‍යමානවූ; අභූතං, අනුත්පන්නවූ; (අනුත්පන්නහෙයින් අසත් යනු පශ්චිමපදය පූර්වපදයට කාරණවචන වෙ.) උත්තරිමනුස්සධම්මං, උත්කෘෂ්ට පුරුෂවූ ධ්‍යායින් හා ආර්‍ය්‍යයන්ගේ ධර්මය; (නොහොත්: "**මනුස්සධම්මතො උත්තරිං උක්කට්ඨං**" යි ගන්නේ.) උල්ලපති, උද්ගතායුෂ්කව බෙනෙද; (ශීල නම් භික්‍ෂුහට ආයුෂය හෙතෙම තථාලපන සමකාලයෙහිම විගතවේ එසින්මකිහ "ආපත්ති පාරාජිකස්ස"යි "පාරාජිකසඞ්ඛාතා ආපත්ති අස්ස"යි යොදනු. පාරාජිකා නම් ආපත්තිය වෙ; යනු අර්ථයි-නොහොත්: පාරාජිකසංඥව්‍යතික්‍රමයට ඇවැදම වෙ; යන අර්ථයි-පෙ-) සඤ්චරිත්තං සමාපජ්ජති, සඤ්චරණ භාවයට පැමිණේ; (ස්ත්‍රියගෙ මතිය පුරුෂයහට හෝ පුරුෂමතිය ස්ත්‍රියට හෝ කියාද යන භාවයි.) ආපත්ති සඞ්ඝාදිසෙසස්ස, සඞ්ඝාදිශෙෂනම් ආපත්තිය වෙ...පෙ...යො, යමෙක්තෙම; තෙ විහාරෙ වසති තාගෙ

(අ) කුහනාති ආදිසු අයං පාළි:-“තත්ථ කතමා කුහනා? ලාභසක්කාරසිලොකසන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පච්චයපටිසෙධනසඞ්ඛාතෙන වා සාමන්තජප්පිතෙන වා ඉරියාපථස්ස වා යා අට්ඨපනා [1] ඨපනා සණ්ඨපනා භාකුටිතා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං, අයං වුච්චති කුහනා. තත්ථ කතමා ලපනා? ලාභසක්කාරසිලොකසන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පරෙසං ආලපනා ලපනා සල්ලපනා උල්ලපනා සමුල්ලපනා උන්නහනා සමුන්නහනා උක්කාචනා සමුක්කාචනා අනුප්පියභාණිතා චාටුකම්‍යතා මුග්ගසූප්‍යතා පාරිභට්‍යතා, අයං වුච්චති ලපනා. තත්ථ කතමා නෙමිත්තිකතා? ලාභසක්කාරසිලොකසන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යං පරෙසං නිමිත්තං නිමිත්තකම්මං ඔභාසො ඔභාසකම්මං සාමන්තජප්පා පරිකථා, අයං වුච්චති නෙමිත්තිකතා.

---

වෙහෙර වෙසෙ ද; සො(භික්ඛු), හෙ (මහණ) තෙම; අරහාති, රහතැයි; පටිච්ච නනාසස භණති, වචනසමනන්තරයෙහි ම තමාගේ කී වාක්‍ය යෙහි අර්ථ දන්නක්හට කියා නම්; ආපත්ති ථුල්ලච්චයස්ස, ස්ථූලාත්‍යයා පත්ති වෙ; භික්ඛු, මහණ තෙමෙ; පණීතභොජනානි, ප්‍රණීතභොජනයන්; අගිලාතො, නොගිලන්ව; අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා, තමාපිණිස විනවා; භුඤ්ජති, වළඳා ද; ආපත්ති පාචිත්තියස්ස, පාචිත්තියා පත්ති වෙ; ෴පෙ෴ආපත්ති පාටිදෙසනීයස්ස, පාටිදෙසනීයාපත්ති වෙ-සූපං වා, සූපයක් හෝ; ඔදනං වා, බතක් හෝ;෴පෙ෴ආපත්ති දුක්කටස්ස, දුක්කටාපත්ති වෙ; එවං, මෙසේ; පඤ්ඤත්තානි ඡ සික්ඛාපදානි, පනවනලද යම් ඒ ශික්ෂාපදයෝ සදෙනෙක් ඇද්ද; (“ඉමෙසං ඡන්නං සික්ඛාපදානං වීතික්කමස්ස වසෙන”යි සම්බන්ධ කරනු.) මෙ ශික්ෂාපද යන් සදෙනාගෙ ද.

(අ) කුහනාති ආදිසු, කුහනා යනාදියෙහි; අයං පාළි, මෙ විභඞ්ග යෙහි ආ නිද්දේශපාළියි; තත්ථ, එහි; කතමා කුහනා, කුහනා නම් කවරක්ද;? ලාභසක්කාර සිලොකසන්නිස්සිතස්ස, චීවරාදිප්‍රත්‍යයසඞ්ඛ්‍යාත ලාභය සකස්කොට ආදරයෙන් දෙන ලබන එම ප්‍රත්‍යයසඞ්ඛ්‍යාත සත්කාරය පතළයසස්ඇතිබවය යන කීර්ත්තිශබ්දය යන මොවුන් ඇසිරුකළ; පාපිච්ඡස්ස, පවිටු අදහස් ඇති; ඉච්ඡාපකතස්ස, ඉච්ඡාවෙන් මඩනාලද්දහුගේ; පච්චයපටිසෙධනසඞ්ඛාතෙන වා, ප්‍රත්‍යය ප්‍රතිෂෙධනයයි කියනලද කොහොන්වතින් හෝ; සාමන්තජප්පිතෙන වා, සමීපකොට කියන තෙප්ලෙන් හෝ; ඉරියාපථස්ස වා, ඊර්‍ය්‍යාපථයාගෙ හෝ; යා අට්ඨපනා, පළමුකොට ආදරයෙන් යම් තිබීමක්ද; ඨපනා, තබන ආකාරය; සණ්ඨපනා, සෑදීම; භාකුටිතා; මුහුණ හකුළුවනබව; භාකුටියං, මුහුණ හකුළුවන සවභාව ඇතිබව, කුහනා, විෂමයකැරවීම; කුහායනා, විෂමය පැවැත්වීම; කුහිතත්තං,

---

1. ආකාරස්ස ඨපනතො ඨපනා අට්ඨපනාති වුත්තං-ටී.

1. ආඨපනා-ත්‍රී: මු.

(අ) තත්‍ථ කතමා නිප්පෙසිකතා? ලාභසක්කාරසිලොකසන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පරෙසං අක්කොසනා වම්භනා ගරහනා උක්ඛෙපනා සමුක්ඛෙපනා ඛිපනා සංඛිපනා පාපනා සම්පාපනා අවණ්ණහාරිතා පරපිට්ඨිමංසිකතා, අයං වුච්චති නිප්පෙසිකතා. තත්‍ථ කතමා ලාභෙන ලාභං නිජිගිංසනතා? ලාභසක්කාරසිලොකසන්නිස්සිතො පාපිච්ඡො ඉච්ඡාපකතො ඉතො ලද්ධං ආමිසං අමුත්‍ර හරති, අමුත්‍ර වා ලද්ධං ආමිසං ඉධා හරති, යා එවරූපා ආමිසෙන ආමිසස්ස එට්ඨි ගවෙට්ඨි පරියෙට්ඨි එසනා ගවෙසනා පරියෙසනා, අයං වුච්චති ලාභෙන ලාභං නිජිගිංසනතා"ති…

---

කොහොන්බව, අයං වුච්චති කුහනා, මෙ කුහනායයි කියනුලැබේ; …පෙ…පරෙසං, පරහට; ආලපනා, තමා පළමුකොට බිණීම; ලපනා, පසුව බිණීම; සල්ලපනා, මනාකොට බිණීම; උල්ලපනා, උස්කොට බිණීම; සමුල්ලපනා, හැම පසින් උසස්කොට බිණීම; උන්නහනා, මතුමත්තෙහි බැඳීම; සමුන්නහනා, හැමපසින් නැවත නැවත බැඳීම; උක්කාචනා, උස්කොට හැගවීම; සමුක්කාචනා, හැමපසින් නැවත නැවත උස්කොට හැගවීම; අනුප්පියභාණිතා, නැවත නැවත ප්‍රියතෙපුල් බිණීම; චාටුකම්‍යතා, යටත්ව පවත්නා බව; මුග්ගසූප්‍යතා, මුද්ගසූපයක්වැනිබව; පාරිභට්ටතා, දරුවටන බව; අයං වුච්චති ලපනා, මෙ ලපනායයි කියනුලැබේ. …පෙ…නිමිත්තං, නිමිත්තකරණබව; නිමිත්තකම්මං, නිමිති කිරීම; ඔභාසො, පහළ කිරීම; ඔභාසකම්මං, පහළකරනක්‍රියාව; සාමන්තජප්පා, සමීප කොට බිණීම; පරිකථා, පරියායතෙපුල්; අයං, මො තොමො; නෙමිත්තිකතා වුච්චති, නෙමිත්තිකතායයි කියනුලැබේ…පෙ…

(අ) අක්කොසනා, ආක්‍රොශකිරීම; වම්භනා, පරිභවකොට බිණීම; ගරහනා, ගර්හාකොට බිණීම; උක්ඛෙපනා, උස් කිරීම; සමුක්ඛෙපනා, හැමපසින් සහෙතුකකොටනැගීම; ඛිපනා, සිනාකිරීම; සංඛිපනා, හැමපසින් සිනාකිරීම; පාපනා, පැමිණවීම; සම්පාපනා, හැමපසින් පැමිණවීම; අවණ්ණහාරිතා, නොගුණ ගෙනයාම; පරපිට්ඨිමංසිකතා, අනුන් පිටමස් කනසුලුබව; (නොමැදෙහි නුගුණකියනසුලුබවය යන අර්ථයි;) අයං වුච්චති නිප්පෙසිකතා, මේ නිප්පෙසිකා යයි කියනු ලැබෙ…පෙ…ඉතො ලද්ධං ආමිසං, මෙගෙන් ලද ආමිසය; අමුත්‍ර හරති, එගෙට ගෙනෙයේ; අමුත්‍ර වා ලද්ධං ආමිසං, එගෙන් ලද ආමිසය; ඉධා හරති, මෙගෙට ගෙනෙ; එවරූපා, මෙබඳුවූ; ආමිසෙන ආමිසස්ස, ආමිෂයෙන් ආමිෂයාගෙ; එට්ඨි, කැමතිවීම; ගවෙට්ඨි, සෙවීම; පරියෙට්ඨි, නැවත නැවත සෙවීම; ("එසනා" යනාදිහු "එට්ඨි" ආදීන්ට පර්‍ය්‍යාය වචනයෝයි.) අයං, මෙතෙම; ලාභෙන ලාභං නිජිගිංසනතාති වුච්චති, ලාභයෙන් ලාභය සොයනබවයයි කියනු ලැබේ…

(අ) ඉමිස්සා පන පාළියා එවමත්ථො වෙදිතබ්බො:–කුහනාති[1]ද්දෙසෙ තාව **ලාභසක්කාරසිලොකසන්නිස්සිතස්සාති** ලාභඤ්ච සක්කාරඤ්ච කිත්තිසද්දඤ්ච සන්නිස්සිතස්ස, පත්ථයන්තස්සාති අත්ථො. **පාපිච්ඡස්සාති** අසන්තගුණදීපනකාමස්ස. **ඉච්ඡාපකතස්සාති** ඉච්ඡාය අපකතස්ස, උපද්දුතස්සාති අත්ථො. ඉතො පරං යස්මා පච්චයපටිසෙධන සාමන්තජප්පන ඉරියාපථසන්නිස්සිතවසෙන මහානිද්දෙසෙ තිවිධං කුහනවත්ථු ආගතං, තස්මා තිවිධමෙපතං දස්සෙතුං පච්චයපටිසෙධන සඞ්ඛාතෙන වාති එවමාදි ආරද්ධං. තත්ථ චීවරාදීහි නිමන්තිතස්ස තදත්ථිකස්සෙව සතො පාපිච්ඡතං නිස්සාය පටික්ඛිපනෙන තෙ ච ගහපතිකෙ අත්තනි සුප්පතිට්ඨිතසද්ධෙ ඤත්වා පුන තෙසං, අහො අය්‍යො අප්පිච්ඡො

---

(අ) ඉමිස්සා පන පාළියා, මේ පාළියෙහි; එවමත්ථො වෙදිතබ්බො, මෙසේ අර්ථ දතයුත්තේයි; කුහනානිද්දෙසෙ, කුහනානිර්දේශයෙහි; ("තාව" යනු ක්‍රමයෙහියි.) "ලාභසක්කාරසිලොක සන්නිස්සිතස්ස" යන්නෙහි; ලාභඤ්ච, චීවරාදි ප්‍රත්‍යයසඞ්ඛ්‍යාත ලාභයද; සක්කාරඤ්ච, සත්කාරයද; (ගෞරවයෙන් දෙන ලබන එම ප්‍රත්‍යය සත්කාර නම්.) කිත්තිසද්දඤ්ච, කීර්තිශබ්දය ද; (පතළයසස් ඇතිබවය යන අර්ථයි.) සන්නිස්සිතස්ස, තෘෂ්ණා වශයෙන් ආශ්‍රයකළහුගෙ; පත්ථයන්තස්සාති අත්ථො, ප්‍රාර්ථනා කරන්නහුගේය යන අර්ථයි; "පාපිච්ඡස්ස" යන්නෙහි; අසන්තගුණදීපනකාමස්ස, තමාකෙරෙහි අවිද්‍යමානවූ ශ්‍රද්ධාදී ගුණයන් පහළකරනු කැමත්තහුගෙ; "ඉච්ඡාපකතස්ස" යන්නෙහි; ඉච්ඡාය අපකතස්ස, පවිටුඉච්ඡාවවිසින් සම්‍යග්ජීවයාකෙරෙන් පහ කරනලද්දහුගේ; (එබඳුවූයෙආජීවොපද්‍රවයෙන් උපද්‍රැතවේනුයි කීහ. "උපද්දුතස්සාති අත්ථො"යි ආජීවොපද්‍රවයෙන් උපද්‍රැතයාගේය යන අර්ථයි.) ඉතො පරං, මෙයින් මතුයෙහි; යස්මා, යම්හෙයකින්; පච්චය පටිසෙධන, ප්‍රත්‍යයප්‍රතිෂෙධය; සාමන්තජප්පන, සාමන්තජල්පනය; ඉරියාපථසන්නිස්සිතවසෙන, ඊර්‍ය්‍යාපථසන්නිශ්‍රය යන මොවුන්ගේ වශයෙන්; මහානිද්දෙසෙ, මහනිදෙසැ; තිවිධං කුහනවත්ථු ආගතං, ත්‍රිවිධවූ කොහොන්වත ආය; තස්මා, එහෙයින්; තිවිධමෙපතං, ත්‍රිවිධකුහනවස්තුව; දස්සෙතුං, පාළියෙන් දක්වනුපිණිස; පච්චයපටි සෙධනසඞ්ඛාතෙන වාති එවමාදි, "පච්චයපටිසෙධනසඞ්ඛාතෙන වා" යනමේ ආදි; ආරද්ධං, ආරම්භකරනලදී; තත්ථ, ඒ ආරබ්ධත්‍රිවිධ කුහනවස්තූන්කෙරෙහි; චීවරාදීහි නිමන්තිතස්ස, චීවරාදිප්‍රත්‍ය යෙන් නිමන්ත්‍රණයකරනලද; තදත්ථිකස්සෙව සතො, ඒ චීවරාදි ප්‍රත්‍යය කැමැතිසුලුවූහුගෙම; පාපිච්ඡතං නිස්සාය, පාපිච්ඡබවනිසා; ("පටික්ඛිපනෙන පටිග්ගහණෙ ච විම්හාපනං" යි සම්බන්ධයි.) පටික්ඛිප නෙන, ප්‍රතික්ෂෙප හෙතුවෙන්ද; තෙ ච ගහපතිකෙ, ඒ ගෘහපතීහුද; අත්තනි, තමා කෙරෙහි; සුප්පතිට්ඨිතසද්ධෙ, සුප්‍රතිෂ්ඨිත ශ්‍රද්ධාඇත්තවුන්;

---

1. කුහන-මු-ස-ත්‍රි-මූ.

න කිඤ්චි පතිගණ්හිතුං ඉච්ඡති, සුලද්ධං වත නො අස්ස සචෙ අප්පමත්තකම්පි කිඤ්චි පතිගණ්හෙය්‍යාති–නානාවිධෙහි උපායෙහි පණීතානි චීවරාදීනි උපනෙන්තානං තදනුග්ගහකාමතං යෙව ආවිකත්වා පටිග්ගහණෙන ච තතොප්පභුති අපි සකටභාරෙහි උපනාමනහෙතුභූතං විම්හාපනං පච්චයපටිසෙධනසඞ්ඛාතං කුහනවත්ථූ ති වෙදිතබ්බං.—

(අ) වුත්තම්පි චෙ තං මහානිද්දෙසෙ:–"කතමං පච්චයපටිසෙධනසඞ්ඛාතං කුහනවත්ථු? ඉධ ගහපතිකා භික්ඛුං නිමන්තෙන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි, සො පාපිච්ඡො ඉච්ඡාපකතො අත්ථිකො චීවර—පෙ—පරික්ඛාරානං භිය්‍යොකම්‍යතං උපාදාය චීවරං පච්චක්ඛාති, පිණ්ඩපාතං—පෙ—සෙනාසනං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පච්චක්ඛාති. සො එවමාහ:–කිං සමණස්ස මහග්ඝෙන චීවරෙන, එතං සාරුප්පං යං සමණො සුසානා වා සඞ්කාරකූටා වා පාපණිකා වා නන්තකානි උච්චිනිත්වා සඞ්ඝාටිං කත්වා ධාරෙය්‍ය.

---

ඤත්වා, දැන; පුන, නැවත; ("තෙසං උපනෙන්තානං"යි යොදනු.) අහො, විස්මය; අය්‍යො අප්පිච්ඡො, ආර්‍ය්‍යතෙමෙ අල්පෙච්ඡය; න කිඤ්චි පතිගණ්හිතුං ඉච්ඡති, කිසිවක් පිළිගන්නට නොකැමැතිය; සචෙ, ඉදින්; අප්පමත්තකම්පි කිඤ්චි, ස්වල්ප ප්‍රමාණදවූ කිසිවක්; පතිගණ්හෙය්‍ය, පිළිගන්නේනම්; සුලද්ධං වත නො අස්සාති, අපගේ ජීවිතය මිනිසත්බව හෝ මනාකොට ලදවෙයි; නානාවිධෙහි උපායෙහි, නානාප්‍රකාර උපායෙන්; පණීතානි චීවරාදීනි උපනෙන්තානං, ප්‍රණීතවූ චීවරාදීන් එළවන්නාවූ; (තෙසං, ඒ ගෘහපතීන්ට;)තදනුග්ගහකාමතංයෙව ආවිකත්වා, ඔවුන්ට අනුග්‍රහ කැමතිබවම පළකොට; පටිග්ගහණෙන ච, පිළිගැන්මෙන් ද; තතොප්පභුති, එතැන්පටන්; අපි සකටභාරෙහි උපනාමනහෙතුභූතං, සකටභාරයෙනු දු එළවීමට කාරණවූ; විම්හාපනං, විස්මයකැරවීම; පච්චයපටිසෙධනසඞ්ඛාතං, ප්‍රත්‍යයප්‍රතිෂෙධනයයි කියනලද; කුහනවත්ථූති වෙදිතබ්බං, කොහොන්වතැයි දතයුතු.—

(අ) මහානිද්දෙසෙ, මහනිදෙස; එතං, මේ; වුත්තම්පි ච, කියනලදී; කතමං පච්චයපටිසෙධනසඞ්ඛාතං කුහනවත්ථු, ප්‍රත්‍යය ප්‍රතිෂෙධ සඞ්ඛ්‍යාත කොහොන්වත් නම් කිම;? ඉධ, මෙහි; ගහපතිකා, ගෘහපතීහු; භික්ඛුං නිමන්තෙන්ති, භික්ෂුහු නිමන්ත්‍රණය කෙරෙත්; චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි, චීවරය පිණ්ඩපාතය ශයනාසනය ගිලන්පස බෙහෙත් සත්පිරිකරය[1] යන මෙයින්; පාපිච්ඡො, පවිටුවූ අදහස් ඇත්තෙ; ඉච්ඡාපකතො, ඉච්ඡාවෙන් මඩනාලද්දෙ; අත්ථිකො, අර්ථිවූයේ; චීවර, සිවුරු;—පෙ—පරික්ඛාරානං, පරිෂ්කාරයන්ගෙ; භිය්‍යොකම්‍යතං උපාදාය, බොහෝ කැමති වනබව නිසා; චීවරං, චීවරය; පච්චක්ඛාති, ප්‍රතික්ෂෙප කෙරෙයි;

---

1 බෙහෙත් පිරිකරය-මු. ස.

(අ) කිං සමණස්ස මහග්ඝෙන පිණ්ඩපාතෙන, එතං සාරුප්පං යං සම
ණො උඤ්ඡාචරියාය පිණ්ඩියාලොපෙන ජීවිකං කප්පෙය්‍ය. කිං සමණස්ස
මහග්ඝෙන සෙනාසනෙන, එතං සාරුප්පං යං සමණො රුක්ඛමූලිකො
වා අස්ස අබ්භොකාසිකො වා. කිං සමණස්ස මහග්ඝෙන ගිලානපච්චය
භෙසජ්ජපරික්ඛාරෙන, එතං සාරුප්පං යං සමණො පූතිමුත්තෙන වා
හරීතකඛණ්ඩෙන වා ඔසධං කරෙය්‍යාති. තදුපාදාය ලූඛං චීවරං
ධාරෙති, ලූඛං පිණ්ඩපාතං පරිභුඤ්ජති, ලූඛං සෙනාසනං පටිසෙවති,
ලූඛං ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරං පටිසෙවති. තමෙනං ගහ
පතිකා එවං ජානන්ති:-අයං සමණො අප්පිච්ඡො සන්තුට්ඨො පවි
විත්තො අසංසට්ඨො ආරද්ධවිරියො ධුතවාදොති. භිය්‍යො භිය්‍යො
නිමන්තෙන්ති චීවර...පෙ...පරික්ඛාරෙහි. සො එවමාහ:-තිණ්ණං
සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති-සද්ධාය සම්මුඛී
භාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති, දෙය්‍යධම්මස්ස...පෙ...

---

-පෙ-සො, හෙතෙම; එවමාහ, මෙසේ කියා; කිං සමණස්ස මහග්ඝෙන
චීවරෙන, ශ්‍රමණයහට මහඟුසිවුරෙන් කිම; එතං සාරුප්පං, මෙ
සරුපි ("යං"-යනු ක්‍රියා පරාමර්ශීය එහෙයින් "ධාරෙය්‍යාති එහි යදෙ
තං සඞ්ඝාටිං කත්වා ධාරණං එතං සමණස්ස සාරුප්පං"යි යොදනු.)
සුසානා වා, සොහොනින් හෝ; සඞ්කාරකූටා වා, කසළගොඩින් හෝ;
පාපණිකා වා, අවුණුදෙරින් හෝ; නන්තකානි උච්චිනිත්වා, කඩරෙදි
හවුලාගෙන; සඞ්ඝාටිං කත්වා ධාරෙය්‍ය, සඟළකොට ධරාද...පෙ...

(අ) උඤ්ඡාචරියාය, භික්ෂාසිඟීමෙන්; පිණ්ඩියාලොපෙන, පිණ්ඩපාතා
ලොපයෙන්; ජීවිකං කප්පෙය්‍ය, ජීවිකාව කෙරේද; රුක්ඛමූලිකො වා
අස්ස, වෘක්ෂමූලිකා හෝ වේද; අබ්භොකාසිකො වා (හොති), අභ්‍යවකාසික
හෝ වෙද; පූතිමුත්තෙන වා, ගොමූත්‍රයෙන් හෝ; හරීතකඛණ්ඩෙන වා,
අරළුකඩකින් හෝ; ඔසධං කරෙය්‍යාති, බෙහෙත් කරන්නෙ යයි; තදු
පාදාය, එතැන්පටන්; ලූඛං චීවරං ධාරෙති, රූක්ෂසිවුරු දරන්නේයි;
-පෙ-තමෙනං, ඔහු; ගහපතිකා, ගෘහපතීහු; එවං ජානන්ති, මෙසේ
දනිත්; අයං සමණො, මෙ මහණතෙමෙ; අප්පිච්ඡො, අපිස; සන්තුට්ඨො,
සන්තුෂ්ටය; පවිවිත්තො, විවෙකයෙහි වෙසෙයි; අසංසට්ඨො, කුලෙහි
ගෙණෙහි නොඇලුනෙය; ආරද්ධවිරියො, වැඩූවීර්‍ය්‍යී ඇත්තෙය; ධුතවා
දොති, අනුන්ට ද ධූතාඞ්ගයෙහි ගුණ කියන්නේයයි; භිය්‍යො භිය්‍යො
නිමන්තෙන්ති, නැවත නැවතූ නිමන්ත්‍රණය කෙරෙති-පෙ-සො, ඒ
කුහකතෙමේ; එවමාහ, මෙසේ කියන්නේයි; තිණ්ණං සම්මුඛීභාවා,
තුන්දෙනෙකු සම්මුඛ බැවින්; සද්ධො කුලපුත්තො, සැදෑ ඇති කුලපුත්‍ර
තෙමෙ; බහුං පුඤ්ඤං පසවති, බොහෝ පින් උපයයි (පිළිලැබෙ යන
අර්‍ථයි.) සද්ධාය සම්මුඛී භාවා, ශ්‍රද්ධාවගේ සම්මුඛ බැවින්;දෙය්‍යධම්මස්ස
සම්මුඛී භාවා, දෙයවස්තුහුගේ සම්මුඛ බැවින්; දක්ඛිණෙය්‍යානං
සම්මුඛී භාවා, දක්ෂිණාර්හයන්ගෙ සම්මුඛ බැවින්;-පෙ-තුම්හාකඤ්ච,

දක්ඛිණෙය්‍යානං සම්මුඛීභාවා සඞ්ඝො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති, තුම්හාකඤ්චායං සද්ධා අත්ථි, දෙය්‍යධම්මො ච සංවිජ්ජති, අහඤ්ච පටිග්ගාහකො, සචාහං න පටිග්ගහෙස්සාමි එවං තුම්හෙ පුඤ්ඤෙන පරිබාහිරා භවිස්සථ, න මය්හං ඉමිනා අත්ථො, අපි ච තුම්හාකංයෙව අනුකම්පාය පතිගණ්හාමීති. තදුපාදාය බහුම්පි චීවරං පතිගණ්හාති, බහුම්පි පිණ්ඩපාතං-පෙ-භෙසජ්ජපරික්ඛාරං පතිගණ්හාති. යා එවරූපා භාකුටිතා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං ඉදං වුච්චති පච්චය පටිසෙධන සඞ්ඛාතං කුහනවත්ථු”ති-

(ඈ) පාපිච්ඡස්සෙව පන සතො උත්තරිමනුස්සධම්මාධිගමපරිදීපනවාචාය තථා තථා විම්හාපනං සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථූති වෙදිතබ්බං. යථාහ:-“කතමං සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු? ඉධෙකච්චො පාපිච්ඡො ඉච්ඡාපකතො සම්භාවනාධිප්පායො එවං මං ජනො සම්භාවෙස්සතීති අරියධම්මසන්නිස්සිතං වාචං භාසති, යො එවරූපං චීවරං ධාරෙති සො සමණො මහෙසක්ඛොති භණති, යො එවරූපං පත්තං ලොහථාලකං ධම්මකරකං පරිස්සාවනං කුඤ්චිකං කායබන්ධනං උපාහනං ධාරෙති සො සමණො මහෙසක්ඛොති භණති,

---

තොපගෙද; අයං සද්ධා අත්ථි, මේ ශ්‍රද්ධා ඇත; දෙය්‍යධම්මො ච සංවිජ්ජති, දෙයධර්මයද විද්‍යමානය; අහඤ්ච පටිග්ගාහකො, මමද ප්‍රතිග්‍රාහකයෙමි; සචෙ, ඉදින්; අහං න පටිග්ගහෙස්සාමි, මම නොපිළිගනිම් නම්; එවං, එසේකල්හි; තුම්හෙ, තෙපි; පුඤ්ඤෙන පරිබාහිරා භවිස්සථ, කුශලයෙන් පිරිහෙන්නවු; න මය්හං ඉමිනා අත්ථො, මට මින් ප්‍රයොජන නැත; අපි ච, එතකුදුවුවත්; තුම්හාකං යෙව අනුකම්පාය, තොපටම අනුකම්පා පිණිස; පතිගණ්හාමීති, පිළිගණිමියි; තදුපාදාය, එතැන් පටන්; බහුම්පි චීවරං පතිගණ්හාති, බොහෝ ද සිවුරුපිළිගන්නී-පෙ-

(ඈ) උත්තරිමනුස්සධම්මාධිගමපරිදීපනවාචාය, උත්තරිමනුෂ්‍යධර්මාධිගමය හඟවන තෙපුලෙන්; තථා තථා විම්හාපනං, මේ ධ්‍යානලාභීය ඵලලාභීයයි එසේඑසේ විස්මයකැරවීම; සාමන්තජප්පනසඞ්ඛාතං කුහන වත්ථූති වෙදිතබ්බං, තමාඋත්තරිමනුෂ්‍යධර්මයට ආසන්නකොට බණනබැවින් සාමන්තජප්පනයයි කියනලද කොහොන් වතැයි දතයුතු;-සම්භාවනාධිප්පායො, සම්භාවනාවෙහි අභිප්‍රාය ඇත්තේ; එවං, මෙසේ කල්හි; මං, මට; ජනො සම්භාවෙස්සතීති, ජනතෙමෙ සම්භාවනා කරන්නේයයි; අරියධම්මසන්නිස්සිතං, ආර්‍ය්‍යධර්මසන්නිශ්‍රිතවූ; වාචං භාසති, තෙපුල්බෙණෙ; (“යෝ එවරූපං චීවරං ධරෙති” යනාදී තමාම සඳහාකියත්) යො, යමෙක්; එව රූපං චීවරං ධාරෙති, මෙබඳු සිවුරක්ධරද; සො සමණො, ඒ මහණ; මහෙසක්ඛොති, මහත්ආනුභාව ඇත්තෙයයි; (උත්තරිමනුෂ්‍යධර්මාධිගමනයෙන්ය යන අභිප්‍රායයි.) එවරූපං පත්තං, මෙබඳු පාත්‍රයක්; ලොහථාලකං, ලොහො තල්ලක්; ධම්මකරකං, ඩබරුවක්; පරිස්සාවනං, පෙරහනක්; කුඤ්චිකං, කොස්සක්; කායබන්ධනං, කාබාණක්; උපාහනං, වහනක්; ධාරෙති,

**යස්ස එවරූපො උපජ්ඣායො ආචරියො සමානුපජ්ඣායකො සමානාචරියකො මිත්තො සන්දිට්ඨො සම්භත්තො සහායො [1] යො එවරූපෙ විහාරෙ වසති [1] අඩ්ඪයොගෙ පාසාදෙ හම්මියෙ ගුහාය ලෙණෙ කුටියා කූටාගාරෙ අට්ටෙ මාළෙ උද්දණ්ඩෙ උපට්ඨානසාලායං මණ්ඩපෙ රුක්ඛමූලෙ වසති සො සමණො මහෙසක්ඛොති භණති; අථවා කොරඤ්ජිකකොරඤ්ජිකො භාකුටිකභාකුටිකො කුහකකුහො ලපලපො මුඛසම්භාවිතො අයං සමණො ඉමාසං එවරූපානං සන්තානං විහාරසමාපත්තීනං ලාභීති තාදිසං ගම්භීරං ගුළ්හං නිපුණං පටිච්ඡන්නං ලොකුත්තරං සුඤ්ඤතාපටිසංයුත්තං කථං කථෙති. යා එවරූපා භාකුටිකා භාකුටියා කුහනා කුහායනා කුහිතත්තං, ඉදං වුච්චති සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු"ති.**

---

ධරද; සො සමණො, ඒ මහණ; මහෙසක්ඛොති භණති, මහානුභාව ඇත්තෙයයි බෙණෙ; යස්ස, යමක්හුගේ; එවරූපො, මෙබඳුවූ; උපජ්ඣායො, උපාධ්‍යායෙක්; ආචරියො, ආචාර්‍ය්‍යයෙක්; සමානුපජ්ඣායකො, එක උපාධ්‍යායන් ඇත්තෙක්; සමානාචරියකො, එක ආචාර්‍ය්‍යයන් ඇත්තෙක්; මිත්තො, මිත්‍රයෙක්; සන්දිට්ඨො, දෘෂ්ටමාත්‍රමිත්‍රයෙක්; සම්භත්තො, දෘඪභක්ති ඇත්තෙක්; සහායො, සබඳෙක් ඇද්ද; යො, යමෙක්; එවරූපෙ විහාරෙ වසති, මෙබඳු වෙහෙර වෙසෙද; ("එවරූපෙ" යනු අඩ්ඪයොගාදියෙහි දු යොදනු-පාකාර පරිච්ඡන්න සියලු ආවාසය විහාරනම් වෙ.) අඩ්ඪයොගෙ, දීර්ඝප්‍රාසාදයෙහි; (ගරුඩපක්‍ෂසංස්ථාන ප්‍රාසාදයයි ද කියත්.) පාසාදෙ, චතුරශ්‍රප්‍රාසාදයෙහි; හම්මියෙ, සඳලු පන්වා කළ ගෙහි; ගුහාය, දෙරනොලූ පර්‍වතගුහායෙහි; ලෙණෙ, දෙරලූ ගල්ලෙන; කුටියා, කිළිගෙහි; කූටාගාරෙ, කැණිමඬුලුදෙකක් නගා කළගෙහි; අට්ටෙ, (**"පටිරාජූනම්පි පටිබාහණියොග්ගො චතුපඤ්චභූමකො පතිස්සය විසෙසො"**[2]යි) උක්තස්වරූපවූ ගෘහවිශෙෂයෙහි; මාළෙ, (**"එකකූටසඞ්ගහිතො අනෙකකොණවන්තො"**[3]යි) උක්තස්වරූප ඇතිගෙහි; උද්දණ්ඩෙ, ගබ්නැති එකදෙරක් ඇති දීර්ඝශාලාවෙහි; උපට්ඨානසාලායං, හැමදෙනා රැස්වන ගෙහි; මණ්ඩපෙ, මණ්ඩපයෙහි;- වසති, වෙසෙද; සො සමණො, ඒ මහණ; මහෙසක්ඛොති භණති, මහානුභාව ඇත්තෙයයි බෙණේද; අථවා, නොහොත්; කොරඤ්ජිකකොරඤ්ජිකො, ඉතා හැකිලෙන්නේ; (**"කුච්ඡිතරජභූතාය පාපිච්ඡතාය නිරත්ථකං කායවචීවිප්ඵන්දනිග්ගණ්හනං කොරඤ්ජං, තං එතස්ස අත්ථීති කොරඤ්ජිකො කොහඤ්ඤෙන සඤ්ඤතාකාරො, අතිවිය අභිණ්හං වා කොරඤ්ජිකො කොරඤ්ජිකකොරඤ්ජිකො; අතිපරිසඞ්කිතො"** යනු ටීකායි.) භාකුටික භාකුටිකො, ඉතා මුහුණු හකුළුවනසුලුවූයෙ-පරිසඞ්කිත වූයෙ; කුහකකුහො, ඉතා විස්මයකර වන්නෙ; ලපලපො, ඉතාම ප්‍රලාපතෙපුල් බණන්නෙ; මුඛසම්භා

---

1. ත්‍රි මු. පොත්හි වෙනස්ව පැනේ.
2. පාසාද විසෙසො-මූ. ස.
3. අනෙක කොණො-මූ. ස.

(අ) පාපිච්ඡස්සෙව පන සතො සම්භාවනාධිප්පායකතෙන ඉරියාපථෙන විම්හාපනං ඉරියාපථසන්නිස්සිතං කුහනවත්ථූති වෙදිතබ්බං. යථාහ:- "කතමං ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු? ඉධෙකච්චො පාපිච්ඡො ඉච්ඡාපකතො සම්භාවනාධිප්පායො එවං මං ජනො සම්භාවෙස්සතීති ගමනං සණ්ඨපෙති[1] සයනං සණ්ඨපෙති පණිධාය ගච්ඡති පණිධාය තිට්ඨති පණිධාය නිසීදති පණිධාය සෙය්‍යං කප්පෙති සමාහිතො විය ගච්ඡති සමාහිතො විය තිට්ඨති[2] නිසීදති[2] සෙය්‍යං කප්පෙති ආපාථකජ්ඣායී ච හොති. යා එවරූපා ඉරියාපථස්ස අට්ඨපනා ඨපනා සණ්ඨපනා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං, ඉදං වුච්චති ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථූ"ති. තත්ථ **පච්චයපටිසෙධනසඞ්ඛාතෙනාති** පච්චයපටිසෙධනන්ති ඉච්චෙවං සඞ්ඛාතෙන පච්චයපටිසෙධනෙන වා සඞ්ඛාතෙන. **සාමන්තජප්පිතෙනාති** සමීපෙ භණිතෙන. **ඉරියාපථස්ස වාති** චතුඉරියාපථස්ස[3]

---

විතො, (කොරක්ඛජ්ජිකකොරක්ඛජ්ජිකාදී ස්වභාවයෙන් ප්‍රවෘත්තවචන හෙතු වෙන්) තමාගේ මුඛමාත්‍රයෙන්ම අනුන්විසින් සම්භාවනා කරනලද්දේ; ("අයං සමණොති ආදීනි අත්තානං පරං විය කත්වා කථෙති.") අයං සමණො, මේ මහණතෙමේ; ඉමාසං, මේ; එවරූපානං, මෙබඳුවූ; සන්තානං විහාරසමාපත්තීනං ලාභීති, ශාන්තවූ විහාරසමාපත්තිලාභී යයි; තාදිසං, එබඳුවූ; ගම්භීරං, ගැඹුරුවූ; (ප්‍රතිෂ්ඨාසූන්‍යවූ යනුභාවයි.) ගූළ්හං, ගූඪවූ; (දුර්දර්ශීවූයනඅර්ථයි;) නිපුණං, සියුම්වූ; පටිච්ඡන්නං, මුවාකටයුතුවූ; ලොකුත්තරං, ලොකොත්තරවූ; සුඤ්ඤතාපටිසංයුත්තං, නිර්වාණප්‍රතිසංයුක්තවූ; කථං කථෙති, කථාබණේද-

(අ) සම්භාවනාධිප්පායකතෙන, "කථන්නුඛො මං ජනො අරියොති වා විසෙසලාභීති වා ජානෙය්‍ය[4]" යන අභිප්‍රායෙන් කරනලද; ඉරියාපථෙනවිම්හාපනං, ඊර්‍ය්‍යාපථයෙන් විස්මයකැරවීම; ඉරියාපථසන්නිස්සිතං කුහනවත්ථූති වෙදිතබ්බං, ඊර්‍ය්‍යාපථසන්නිශ්‍රිතකුහනවස්තුය යි දතයුතු-පෙ-පණිධාය ගච්ඡති, රහතැයි මාදනික්වයි සිතපිහිටුවා පනාහෝ යේද; (සෙසුපෙදෙහි දු මෙම අර්ථයි.) සමාහිතොවිය ගච්ඡති, ධ්‍යානසමාධීන් සමාහිතයක්හු මෙන්යේද; (සෙසුපෙදෙහි දු මෙම නයයි.) ආපාථකජ්ඣායී ච හොති, හමුයෙහි සිතන්නේ; (පැනෙන තැන සමාපත්තියට සමවන්නහුමෙන් හිඳිනේ ද යන අර්ථයි.)-පෙ- ඉරියාපථසඞ්ඛාතං, "ඉරියාපථසණ්ඨාපන"යයි කියනලද;-පෙ-තත්ථ, ඒ පාළියෙහි; පච්චයපටිසෙධනන්ති, අයොනිසො උත්පාදප්‍රත්‍යයන්ගෙ ප්‍රතිෂේධයයි; ඉච්චෙවං සඞ්ඛාතෙන, මෙසේ කියනලද; ("පච්චයපටිසෙධනෙන වා සඞ්ඛාතෙන තෙන වා පච්චයපටිසෙධනෙන සඞ්ඛාතබ්බෙන කථෙතබ්බෙන" යන අර්ථයි.) සමීපභණිතෙන, තමා-

---

1. ඨානං සණ්ඨපෙති නිසජ්ජං සණ්ඨපෙති-ත්‍රි. මු. 2. සමාහිතො විය-ත්‍රි. මු.
3. චතුරිරියාපථස්ස-ඈතෑම්. 4. සම්භාවෙය්‍ය-වි. ටී.

අට්ඨපනාති ආදිට්ඨපනා ආදරෙන වා ඨපනා. **ඨපනාති** ඨපනාකාරො. **සණ්ඨපනාති** අභිසඞ්ඛරණං පාසාදිකභාවකරණන්ති වුත්තං හොති. **භාකුටිකාති** පධානපරිමථිතභාවදස්සනෙන භාකුටිකරණං මුඛසඞ්කොචොති වුත්තං හොති භාකුටිකරණං සීලමස්සාති භාකුටිකො, භාකුටිකස්ස භාවො භාකුටියං. **කුහනාති** විම්හාපනා. කුහස්ස අයනා කුහායනා. කුහිතස්ස භාවො කුහිතත්තන්ති.

(අ) ලපනානිද්දෙසෙ:-**ආලපනාති** විහාරං ආගතෙ මනුස්සෙ දිස්වා කිමත්ථාය භොන්තො ආගතා? කිං භික්ඛූ නිමන්තෙතුං යදි එවං ගච්ඡථ අහං පච්ඡතො ගහෙත්වා ආගච්ඡාමීති, එවං ආදිතො ලපනා. අථවා අත්තානං උපනෙත්වා අහං තිස්සො, මයි රාජා පසන්නො, මයි අසුකො ච අසුකො ච රාජමහාමත්තා පසන්නාති. එවං අත්තූපනායිකා ලපනා ආලපනා. **ලපනාති** පුට්ඨස්ස සතො වුත්තප්පකාරමෙව

---

අනිකක්හුමෙන් කොට තමහට සමීපකොට බිණීමෙන්; චතුඉරියාපථස්ස, චතුර්විධ ඊර්යාපථයාගෙ; අට්ඨපනාති, අට්ඨපනානම්; ආදිට්ඨපනා, ආදිකොට තිබීම; ආදරෙන වා ඨපනා, ආදරයෙන් හෝ තිබීම; අභිසඞ්ඛරණං, සැදීම; පාසාදිකභාවකරණං, ප්‍රසාද එළවනබවකිරීම-පෙ-පධානපරිමථිතභාවදස්සනෙන, ශ්‍රමණධර්මකරණයෙන් මිරිකුණු බව දැක්වීමෙන්; භාකුටිකරණං, මුහුණු හකුළුවන බවයි; (එමකීහ "මුඛසඞ්කොචොති වුත්තංහොති"යි.) භාකුටිකරණං, මුහුණු හැකිළිවීම; සීලං, ස්වභාවවූයේ; අස්සාති, මොහට නුයි; භාකුටිකො, භාකුටිකනම්; භාකුටිකස්ස භාවො, මුහුණු හකුළුවනසුල්ලහුගේ භාවය භාකුටියනම්; විම්හාපනා, විස්මයකැරවීම; (**"කුහනං කුහො කුහස්ස අයනා කුහායනා"**විස්මයකැරවීම කුහනනම උහුගේ ප්‍රවෘත්තිය කුහායනනම්-**"කුහස්සවා පුග්ගලස්ස අයනා ගති කිරියා කුහායනා-කුහෙති කුහෙන වා ඉතොති කුහිතො කුහකොතස්ස භාවො කුහිතත්තං"**යි ගන්නේ.)

(අ) ආලපනා, ආලපනානම්; විහාරං ආගතෙ මනුස්සෙ දිස්වා, විහාරයටආ මිනිසුන් දැක; කිමත්ථාය භොන්තො ආගතා, භවත්හු කුමක්පිණිස අවු ද; කිං, කිම; භික්ඛූ නිමන්තෙතුං, භික්ෂූන් නිමන්ත්‍රනයන්ටන්ට අවු ද; යදි එවං, ඉදින් එසේවීනම්; ගච්ඡථ, තෙපි යව; අහං, මම; පච්ඡතො ගහෙත්වා ආගච්ඡාමීති, පසුපස්සෙහි භික්ෂූන් ගෙන එමියි; එවං ආදිතො ලපනා, මෙසේ පළමුකොට කීමයි; අථවා, නොහොත්; අත්තානං උපනෙත්වා, තමා එළවා; අහං තිස්සො, මම තිස්සනම්යි; මයි රාජාපසන්නො, මාකෙරෙහි රජු ප්‍රසන්නය; මයි, මාකෙරෙහි; අසුකො ච අසුකො ච රාජමහාමත්තා පසන්නාති, අසුවල් අසුවල්[1] රජමහාමත්‍යයා ප්‍රසන්නයයි; එවං, මෙසේ; අත්තූපනායිකා ලපනා, තමා එළවා කීමයි; ලපනාති, ලපනානම්; පුට්ඨස්ස සතො, "කො තිස්සො කො රාජපූජිතො"යි පිළිසඳන ලද්දහුගේ;

---

1. අසවල් අසවල්-ඈතැම්.

ලපනා. **සල්ලපනා**ති ගහපතිකානං උක්කණ්ඨනෙ භීතස්ස ඔකාසං දත්වා දත්වා සුට්ඨුලපනා. **උල්ලපනා**ති මහාකුටුම්බිකො මහානාවිකො මහා දානපතීති එවං උද්ධං කත්වා ලපනා. **සමුල්ලපනා**ති සබ්බතො භාගෙන උද්ධං කත්වා ලපනා. **උන්නහනා**ති උපාසකා පුබ්බෙ ඊදිසෙ කාලෙ නව දානං දෙථ, ඉදානි කිං න දෙථාති, එවං යාව දස්සාම භන්තෙ ඔකාසං න ලභාමාති ආදීනි වදන්ති තාව උද්ධං උද්ධං නහනා. වෙඨනාති වුත්තං හොති. අථ වා උච්ඡුහත්ථං දිස්වා කුතො ආභතං උපාසකා ති පුච්ඡති, උච්ඡුඛෙත්තතො භන්තෙති. කිං තත්ථ උච්ඡු මධුරන්ති. ඛාදිත්වා භන්තෙ ජානිතබ්බන්ති. න උපාසකා භික්ඛුස්ස උච්ඡුං දෙථාති වත්තුං වට්ටතීති. යා එවරූපා නිබ්බෙඨෙන්තස්සපි විනිබ්බෙඨනකථා සා උන්නහනා. සබ්බභාගෙන පුනප්පුනන්නහනා සමුන්නහනා. **උක්කාචනා**ති එතං කුලං මං එවං ජානාති, සචෙ

---

වුත්තප්පකාරෙමෙව ලපනා, "අහං තිස්සො මයි රාජා පසන්නො" යනාදීන් කීමයි; ගහපතිකානං උක්කණ්ඨනෙ භීතස්ස, ගෘහපතීන්ගෙ එක්වන් බිණීමෙන් උකටලීවීමෙහි භයඇත්තහුගේ; ඔකාසං දත්වා දත්වා, අවකාසදිදී; සුට්ඨුලපනා, මනාකොට බිණීමයි; උල්ලපනාති, උල්ලපනානම්; මහාකුටුම්බිකො, මහාකෙළෙඹිය; මහානාවිකො, මහ නැවිය; මහාදානපතීති, මහාදානපතියයි; එවං, මෙසේ; උද්ධං කත්වා, විභවසම්පත්තිආදීන් උස්කොට; ලපනා, බිණීමයි; සමුල්ලපනාති, සමුල්ලපනානම්; සබ්බතො භාගෙන උද්ධං කත්වා ලපනා, සත් වන පරම්පරාව දක්වා මහකෙළඹියව යනාදීන් හැමපසින් උස්කොට බිණීමයි; උන්නහනාති, උන්නහනානම්; උපාසකා, උපාසකවරිනි; පුබ්බෙ, පෙර; ඊදිසෙ කාලෙ, මෙබඳුකල; නව දානං දෙථ, අග්‍රදාන ද දෙව; ඉදානි කිං න දෙථාති, දැන් කුමක් හෙයින් නොදෙව්දැයි; එවං, මෙසේ; යාව, යම්තාක්; දස්සාම භන්තෙ, වහන්ස දෙමහ; ඔකාසං නලභාමා ති, අවකාස නොලබම්හයි; ආදීනි වදන්ති, මේ ආදිය කියද්ද; තාව, එතාක්; උද්ධං උද්ධං, මතුමතුයෙහි; (නහනා,යි සේයි;) වෙඨනාති වුත්තං හොති, වෙළීමයයි; කී නියායි; උච්ඡුහත්ථං දිස්වා, ඉක්ෂුහස්තපුරුෂයා දැක; කුතො ආභතං උපාසකා ති පුච්ඡති, කොයින් ගෙනායේද උපාසකයයි පිළිවිසී; උච්ඡුඛෙත්තතො භන්තෙති, ඉක්ෂුක්ෂෙත්‍රයෙන වහන්සැයි කී; කිං, කිම; තත්ථ උච්ඡුමධුරන්ති, ඉහි උක්මිහිරිදැයි; ඛාදිත්වා භන්තෙ ජානිතබ්බං, කා බලා වහන්ස දතයුතු; උපාසකා, උපාසකවරිනි; භික්ඛුස්ස, භික්ෂුහට; උච්ඡුං දෙථාති වත්තුං න වට්ටතීති, උක්දඬු දෙවයි කියන්නට නොවටනේ වේදැයි; එවරූපා, මෙබඳුවූ; යා නිබ්බෙඨෙන්තස්සපි විනිබ්බෙඨන කථා, ගැළවෙන්නමුදු නොගැළවියදෙන යම් කථාවක් ඇද්ද; සා උන්නහනා, හෝ උන්නහනා නම්; සබ්බභාගෙන, හැමපසින්ම; පුනප්පුන නහනා, නැවත නැවත බැඳුම; සමුන්නහනා, සමුන්නහනා නම්; එතං කුලං, මේ කුලය; මං එවං ජානාති, මා මෙසේ දනී; එත්ථ, මෙගෙහි; සචෙ දෙය්‍යධම්මො

එත්ථ දෙය්‍යධම්මො උප්පජ්ජති මය්හං එව දෙන්තීති[1] එවං උක්ඛිපිත්වා කාචනා උක්කාචනා–උද්දීපනාති වුත්තං හොති. තෙලකන්දරිකවත්ථු චෙත්ථ වත්තබ්බං. සබ්බභාගෙන පන පුනප්පුන උක්කාචනා **සමුක්කාචනා**.

(අ) **අනුප්පියභාණිතාති** සච්චානුරූපං ධම්මානුරූපං වා අනවලොකෙත්වා පුනප්පුන පියභණනමෙව. **චාටුකම්‍යතාති** නීචවුත්තිතා, අත්තානං හෙට්ඨතො හෙට්ඨතො ඨපෙත්වා පවත්තනං. **මුග්ගසූප්‍යතාති** මුග්ගසූපසදිසතා. යථාහි මුග්ගෙසු පච්චමානෙසු කොචිදෙව න පච්චති අවසෙසා පච්චන්ති එවං යස්ස පුග්ගලස්ස වචනෙ කිඤ්චිදෙව සච්චං හොති සෙසං අලිකං, අයං පුග්ගලො මුග්ගසූප්‍යොති වුච්චති, තස්ස භාවො මුග්ගසූප්‍යතා. **පාරිභට්ටතාති** පාරිභට්ටභාවො–යොහි කුල

---

උප්පජ්ජති, ඉදින් දෙයධර්මයෙක් උපන්නම්; මය්හං එව දෙන්තීති, මටම දෙන්නාහයි; එවං, මෙසේ; උක්ඛිපිත්වා කාචනා, උස්කොට හැඟවීම; උක්කාචනා, උක්කාචනා නම්;(එම කීහ "උද්දීපනාති වුත්තං හොති"යි) තෙලකන්දරිකවත්ථුංච, තෙලකන්දරිකාවගේ වත; එත්ථ වත්තබ්බං, මෙ තැන කියයුතුයි;(භික්ෂූහු දෙදෙනෙක් එක්ගමකට වැද ආසනශාලාවෙහි හිඳ එක කුමාරියක කැඳවූහු. ඈ ආකල එක්භික්ෂුවෙක් අනික් භික්ෂුහට වහන්ස මෑ කවරකාගෙ කුමාරිකාවක්දැයි පිළිවිසස. හෙතෙම මො අප ගේ උපාසිකාවන් තෙලකන්දරිකාවගෙ දූය මැගෙ මව් මා ගෙට එළඹි කල්හි ගිතෙල් දෙනකල කළයෙන්ම දෙන්නීයි මොද මවමෙන් කළ යෙන්ම දෙන්නියයි උස්කොට හැඟවී–මෙ සඳහා කීහ–"තෙලකන්ද රිකවත්ථු චෙත්ථ වත්තබ්බං"යි.)

(අ) සච්චානුරූපං, සත්‍යයට සුදුස්සක්;ධම්මානුරූපං වා, මන්තාවචන යට සුදුස්සක් හෝ;("මන්තා වචනං හි ධම්මොති වුච්චති")යනු ටීකායි– නොහොත්: සත්‍යවචනයෙන් අන්‍යවූ සුභාෂිතවාචාව ධර්මයයි දත යුතු.) අනවලොකෙත්වා, නොබලා; පුනප්පුන පියභණනමෙව, නැවත නැවත ප්‍රියවචනබිණීමම අනුප්පියභාණිතා නම; නීචවුත්තිතා, නීච වෘත්ති ඇතිබවයි; අත්තානං, තමා; හෙට්ඨතො හෙට්ඨතො ඨපෙත්වා පවත්තනං, යටයටකොට තබා පැවැත්මයි; මුග්ගසූපසදිසතා, මුද්ග සූපයක්වැනි බවයි; යථාහි, යම්සේ; මුග්ගෙසු පච්චමානෙසු, මුං පැසෙනකල්හි; කොචිදෙව න පච්චති, කිසිඇටෙක්ම නොපැසේ ද; අවසෙසා පච්චන්ති, සෙස්ස පැසෙත් ද; එවං, එසේම; යස්ස පුග්ගලස්ස වචනෙ, යම් පුද්ගලයක්හුගෙ වචනයෙහි; කිඤ්චිදෙව සච්චං හොති, කිසිවෙක්ම සබාවෙ ද; සෙසං අලිකං, සෙස්ස බොරුවෙ ද; අයං පුග්ගලො, මෙ පුද්ගලතෙමෙ; මුග්ගසූප්‍යොති වුච්චති, මුද්ගසූපසදෘශකර්ම ඇතිබැවින් මුද්ගසූප්‍යයයි කියනුලැබේ; තස්ස භාවො, ඒ මුද්ගසූප්‍යයාගෙ භාවය; මුග්ගසූප්‍යතා, මුද්ගසූප්‍යතා නම් වේ; පාරිභට්ටභාවො, ධරන්න

---

1. දෙතීති–ත්‍රි. මූ.

දාරකෙ ධාති විය. අඞ්කෙන වා ඛන්ධෙන වා පරිහරති ධාරෙතී ති අත්ථො. තස්ස පරිහටස්ස කම්මං පාරිහට්ටං, පාරිහට්ටස්ස භාවො පාරිහට්ටතා ති෴ නෙමිත්තිකතා නිද්දෙසෙ:-**නිමිත්තන්ති** යං කිඤ්චි පරෙසං පච්චයදානසඤ්ඤජනකං කායවචීකම්මං. **නිමිත්තකම්මන්ති** ඛාදනීයං ගහෙත්වා ගච්ඡන්තෙ දිස්වා කිං ඛාදනීයං ලභිත්ථාති ආදිනා නයෙන නිමිත්තකරණං. **ඔභාසොති** පච්චයපටිසංයුත්තකථා. **ඔභාසකම්මන්ති** වච්ඡපාලකෙ දිස්වා කිං ඉමෙ වච්ඡා ඛීරගොවච්ඡා [1] තක්කගොවච්ඡාති පුච්ඡිත්වා ඛීරගොවච්ඡා භන්තෙ ති වුත්තෙ න ඛීරගොවච්ඡා ඛීරගොවච්ඡා සියුං භික්ඛූපි ඛීරං ලභෙය්‍යුන්ති එවමාදිනා නයෙන තෙසං දාරකානං මාතාපිතූනං නිවෙදෙත්වා ඛීරදාපනාදිකං ඔභාස කරණං෴

(ඇ) **සාමන්තජප්පාති** සමීපං කත්වා ජප්පනං. කුලූපග භික්ඛු වත්ථුචෙත්ථ වත්තබ්බං. කුලූපගො කිර භික්ඛු භුඤ්ජිතුකාමො

---

හුගෙ භාවය; (දරුවඩන්නහුගෙ භාවය යන අර්ථයි.) යො හි, යමෙක්; කුලදාරකෙ, කුලදරුවන්; ධාති විය, කිරිමවකමෙන්; අඞ්කෙන වා ඛන්ධෙනවා, ඇකයෙන් හෝ කරින් හෝ; පරිහරති, ධරාද; ධාරෙතීති අත්ථො, ධරයි වඩයි යන අර්ථයි; තස්ස පරිහටස්ස කම්මං, ඒ දරුවඩන්නහුගෙ ක්‍රියාව; පාරිහට්ටං, පාරිහට්ටනම්; (තදෙවපාරිහට්ටතා෴ "නෙමිත්තිකතා"යන්නෙහි; ("**නිමිත්තෙන චරන්තො ජීවන්තොති නිමිත්තකාරකො නෙමිත්තිකො; තස්ස භාවො නෙමිත්තිකතා**"යි ගන්නේ.) යං කිඤ්චි, යම්කිසි; පරෙසං, පරයනට; පච්චයදානසඤ්ඤජනකං, ප්‍රත්‍යයදානසංඥ උපයන; කායවචීකම්මං, කායවාක්කර්මයයි; (බත් දෙනු පිණිස තමා සාබව දක්වමි යි කුස්පිරිමැදීම් ආදි කායකර්ම නම; බතම්ද වැරින යන ආදි වාකකර්මනම;) ඛාදනීයං ගහෙත්වා ගච්ඡන්තෙ දිස්වා, කැවුම් ගෙනයන්නවුන් දැක; කිං, කිම; ඛාදනීයං ලභිත්ථාති, කැවුමක් ලදුද යන; ආදිනා නයෙන, මෙ ආදිනයින්; නිමිත්තකරණං, නිමිත්කිරීමයි "ඔභාසො" යන්නෙහි තමාගෙ ඉච්ඡාව හැඟවීම ඔභාසනම්; පච්චයපටිසංයුත්තකථා, "අජ්ජ භික්ඛූනං පච්චයා දුල්ලභා ජාතා" යනාදි ප්‍රත්‍යයප්‍රතිසංයුක්තකථායි; ඔභාසකර්මනම්; වච්ඡපාලකෙ දිස්වා, වස්සන් රක්නවුන් දැක; කිං, කිම; ඉමෙ වච්ඡා, මේ වස්සො; ඛීරගොවච්ඡා, කිරිදෙනුන් වස්සොද; තක්කගොවච්ඡාති, මොහොරදෙනුන් වස්සොද;-එවමාදිනා නයෙන, මෙ ආදිනයින්; තෙසං දාරකානං, ඒ වස්සන් බලන දරුවන්ගෙ; මාතාපිතූනං නිවෙදෙත්වා, මව්පියන්ට කියා; ඛීරදාපනාදිකං, කිරිදෙවීම් ආදි; ඔභාස කරණං, ඔභාසකිරීමයි෴

(ඇ) ("සාමන්තජප්පා" යනුයෙහි; "ඉච්ඡිතවත්ථුස්ස සමීපෙ කථනං සාමන්තජප්පා"යි ගන්නේ.) සමීපං කත්වා ජප්පනං, සමීපකොට ජල්පනයයි; කුලූපග භික්ඛුවත්ථුං ච, කුලූපග භික්ෂුහුගේ වත ද; එත්ථ, මෙහි;

---

1 උදැඹු-ති මු.

ගෙහං පවිසිත්වා නිසීදි. තං දිස්වා අදාතුකාමා සරණී තණ්ඩුලා නත්ථීති භණන්ති තණ්ඩුලෙ ආහරිතුකාමා විය පටිවිස්සකඝරං ගතා. භික්ඛු අන්තොගබ්භං පවිසිත්වා ඔලොකෙන්තො කවාටකොණෙ උච්ඡුං භාජනෙ ගුළං පිටකෙ ලොණමච්ඡඵාලෙ කුම්භියං තණ්ඩුලෙ ඝටෙ ඝතං දිස්වා නික්ඛමිත්වා නිසීදි- සරණී තණ්ඩුලෙ නාලත්ථන්ති ආගතා. භික්ඛු උපාසිකෙ අජ්ජ භික්ඛා නසම්පජ්ජතීති [1] පටිගච්චෙව නිමිත්තං අද්දසන්ති ආහ…කිං භන්තෙති?, කවාටකොණෙ නික්ඛිත්තඋච්ඡුං විය සප්පං අද්දසං, තං පහරිස්සාමීති ඔලොකෙන්තො භාජනෙ ඨපිතගුළපිණ්ඩකෙ විය පාසාණලෙඩ්ඩුකෙ, පහටෙන සප්පෙන කතං පිටකෙ නික්ඛිත්තලොණමච්ඡඵාලසදිසං ඵණං, තස්ස තං ලෙඩ්ඩුං ඩංසිතුකාමස්ස කුම්භියා තණ්ඩුලසදිසෙ දන්තෙ, අථස්ස කුපිතස්ස ඝටෙ පක්ඛිත්ත ඝතසදිසං මුඛතො නික්ඛන්තං විසමිස්සකං ඛෙළන්ති, සා නසක්කා මුණ්ඩං වඤ්චෙතුන්ති උච්ඡුං දත්වා ඔදනං පචිත්වා ඝතගුළමච්ඡෙහි සද්ධිං අදාසීති. එවං සමීපං කත්වා ජප්පනං සාමන්තජප්පාති වෙදිතබ්බා. **පරිකථා**ති යථා තං ලභති තථා පරිවත්තෙත්වා පරිවත්තෙත්වා කථනන්ති…

---

වත්තබ්බං, කියයුතු; කුලූපගො කිර භික්ඛු, කුලූපග භික්ෂුවෙක්; භුඤ්ජිතුකාමො, වළඳවනු කැමතිව; ගෙහං පවිසිත්වා නිසීදි, ගෙට වැදහුන්නේය; තං දිස්වා, ඒ භික්ෂූහු දැක; අදාතුකාමා, නොදියටිවූ; සරණී, ගෘහිණීතොමෝ; තණ්ඩුලා නත්ථීති භණන්ති, සහල්නැතැයි කියමින්; තණ්ඩුලෙ ආහරිතුකාමා විය, සහල් සොයා ගෙනෙනු කැමැත්තියක් මෙන්; පටිවිස්සකඝරං ගතා, එක්බිති ගෙට ගියා; භික්ඛු, මහණතෙමෙ; අන්තොගබ්භං පවිසිත්වා, ඇතුළු ගබට වැද; ඔලොකෙන්තො, බලන්නේ; කවාටකොණෙ උච්ඡුං, දොරමුල්ලෙහි තුබූ උක්දඬු; භාජනෙ (ඨපිත)ගුළං, බඳුනෙහි තුබූ සකුරු; පිටකෙ ලොණමච්ඡඵාලෙ, පැසතුබූ ලුණුමස් පැලැලි; කුම්භියං තණ්ඩුලෙ, සැළියෙහි සහල්; ඝටෙ ඝතං, කළයෙහි ගිතෙල්; දිස්වා, දැක; නික්ඛමිත්වා, ගෙන් නික්ම; නිසීදි, හුන්න; සරණී, ගෘහණීතොමෝ; තණ්ඩුලෙ නාලත්ථන්ති, සහල් නොලදිමි යි කියා; ආගතා, අවූ; භික්ඛු, මහණතෙමෙ; උපාසිකෙ, උපාසිකාව; අජ්ජ භික්ඛා න සම්පජ්ජතීති, අද භික්ෂාව නොසැපයෙ යි; පටිගච්චෙව, පළමුකොටම; නිමිත්තං අද්දසන්ති, නිමිත්තයක් දිටිමි යි; ආහ, කී…කිං භන්තෙති, වහන්ස කිමෙක්දැයි කිවූ; කවාටකොණෙ නික්ඛිත්ත උච්ඡුං විය, දොරමුල්ලෙහි තුබූ උක්දණ්ඩ වැනි; සප්පං අද්දසං, සර්පයෙකු දිටිමි; තං පහරිස්සාමීති, ඌගසමි යි; ඔලොකෙන්තො, බලන්නෙම්; භාජනෙ ඨපිතගුළපිණ්ඩකෙ විය, බඳුනෙහි තුබූ සකුරුකැට වැනි; පාසාණලෙඩ්ඩුකෙ, පහණකැට දිටිමි; පහටෙන සප්පෙන, ගසනලද සර්පයා විසින්; කතං, කරනලද; පිටකෙ නික්ඛිත්ත

---

1. න සම්පජ්ජිස්සතීති-ඇ.කැ.ම්.

(අ) නිපෙප්සිකතා නිද්දෙසෙ:-**අක්කොසනාති** දසහි අක්කොසවත්ථූහි අක්කොසනා. **වම්භනාති** පරිභවිත්වා කථනං. **ගරහණාති** අස්සද්ධො අප්පසන්නොති ආදිනා නයෙන දොසාරොපනා. **උක්ඛෙපනාති** මා එතං එත්ථ අවචාති[1] වාචාය උක්ඛිපනං. සබ්බතො භාගෙන සවත්ථුකං සහෙතුකං කත්වා උක්ඛෙපනා **සමුක්ඛෙපනා**. අථ වා අදෙන්තං අහො දානපතීති එවං උක්ඛිපනං **උක්ඛෙපනා**. මහාදානපතීති එවං සුට්ඨු උක්ඛෙපනා **සමුක්ඛෙපනා**. **ඛිපනාති** කිං ඉමස්ස ජීවිතං බීජභොජීනො ති එවං උප්පණ්ඩනා. **සඞ්ඛිපනාති** කිං ඉමං අදායකොති භණථ, යො නිච්චකාලං සබ්බෙසම්පි නත්ථීති වචනං දෙතීති එවං සුට්ඨුතරං උප්පණ්ඩනා. **පාපනාති** අදායකත්තස්ස අවණ්ණස්ස වා පාපනා.

ලොණම්බිලසදිසං, පැස තුබූ ලුණුමස් පැලලි වැනි; එණං, එණ යද; තං ලෙඩ්ඩුං, ඒ කැට; ඛසිතුකාමස්ස තස්ස, ඛහනු කැමතිවූ ඒ සජීපයාගෙ; කුම්භියා තණ්ඩුලසදිසෙ; සැළියෙහි සහල් වැනිවූ; දන්තෙ, දත් දිටිමි යි; අථ, ඉක්බිතෙනන්; කුපිතස්ස අස්ස, කිපුනාවූ උහුගෙ; සටෙ පක්ඛිත්තසතසදිසං, කළයෙහි වත්කොට තුබූ ගිතෙල් වැනිවූ; මුඛතො නික්ඛන්තං, මුඛයෙන් නික්මුණු; විසමිස්සකං ඛෙළනති, විෂ මිශ්‍ර කෙළ දිටමි යි කී; සා, හො නොමො; නස්සකා මුණ්ඩං වට්ටෙතුනති, මුඩහු වළහන්නට නොපිළිවනැයි; උච්ඡුං දත්වා, උක්දඬු දී; ඔදනං පචිත්වා, බත් පිස; සප්පිගුළමච්ඡෙහි සද්ධිං, ගිතෙල් සකුරු මස් හා සමග; අද්දසීති, දුටු; එවං, මෙසේ; සමීපං කත්වා ජප්පනං, සමීපකොට බිණීම; සාමන්තජප්පාති වෙදිතබ්බා, සාමන්තජප්පානමැයි දතයුතු. "පරිකථානාම"යථා තං ලභති, යම්සේ ඒ ලැබෙද; තථා, එසේ; පරිවත්තෙත්වා පරිවත්තෙත්වා කථනන්ති, "සාමන්තජප්පා"යයි කී තෙපුල්ම නැවත නැවත කීමයි;

(අ) දසහි අක්කොසවත්ථූහි, දශ ආක්‍රොශ වස්තුවෙන්; අක්කොසනා, ආක්‍රොශභසිනු දු දෙන්නේයයි (සිතා) ආක්‍රොශකිරීමයි; (වම්භනාදීහු දු එසේමැයි.) පරිභවිත්වා කථනං, ලාමකකොට බිණීම; අස්සද්ධො, සැදැහැනැත්තෙය; අප්පසන්නොති, නොපහන්නෙය යන; ආදිනා නයෙන, මෙ ආදිනයින්; දොසාරොපනා, දොෂාරොපණ යයි; එත්ථ, මොහු කෙරෙහි; එතං මා අවචාති ඒ තහමක් කියවයි; –උක්ඛිපනං, දායකාදිභාවයෙන් පහකිරීමයි; සවත්ථුකං, දෙවැනිකම්මයක් කෙලෙහි අතිකක් කියන්නට නොනිස්සෙහි වස්තුසහිතකොට; සහෙතුකං කත්වා, මෙ කාරණයෙනු දු අතිකක් කියන්නට නොනිස් සෙහියි සකාරණකොට; උක්ඛෙපනා, දායකාදිභාවයෙන් දුරුකිරීමයි; අදෙන්තං, නොදෙන්නහුට; අහො දානපතීති, ඉතාදානපතියයි; උක්ඛිපනං, සිනාවශයෙන් දුරුකිරීමයි; 'ඛිපනා' නම් ක්ෂෙපවචනයි; කිංඉමස්ස ජීවිතං, මොහුගෙ ජීවිතය කිමෙක් නම්ද; බීජභොජීනො, බිජුවටකන්නෙය යි; උප්පණ්ඩනා, අපහාසකිරීමයි; (වපුළහොත් නම

1. කථෙථාති-ඇතැම්.

(අ) සබ්බතො භාගෙන පාපනා **සම්පාපනා**. **අවණ්ණහාරිකාති** එවං මෙ අවණ්ණභයා පි දස්සතීති ගෙහතො ගෙහං ගාමතො ගාමං ජනපදතො ජනපදං අවණ්ණහරණං. **පරපිට්ඨිමංසිකතාති** පුරතො මධුරං භණිත්වා පරම්මුඛෙ අවණ්ණභාසිතා. එසා හි අභිමුඛං ඔලොකෙතුං අසක්කොන්තස්ස පරම්මුඛානං පිට්ඨිමංසඛාදනමිව හොති. තස්මා පරපිට්ඨිමංසිකතාති වුත්තා. **අයං වුච්චති නිප්පෙසිකතාති** අයං යස්මා වෙළුපෙසිකා විය අබ්භඞ්ගං පරස්ස ගුණං නිප්පෙසෙති නිපුඤ්ඡති, යස්මා වා ගන්ධජාතං පිංසිත්වා ගන්ධමග්ගනා විය පරගුණෙ නිපිංසිත්වා විචුණ්ණෙත්වා එසා ලාභමග්ගනා හොති තස්මා නිප්පෙසිකතා ති වුච්චතීති.

---

හට වියයුතු හසුලු නොබලා බිජුවට කන්නක්හු මෙන් කුශලමූලයෙන් ලදසම්පත්තියට හේතුනොවනුකොට වළඳනහෙයින් බිජුවට කන්නෝනම් වෙයි දතයුතු.) කිං, කිම; ඉමං, මොහු; අදෘයකොති භණථ, අදෘයකය යි කියාද; යො, යමෙක්; නිච්චකාලං, හැමකලම; සබ්බෙසම්පි, හැමදෙනහටම; නත්ථීති වචනං දෙතීති, නැත යන වචනය දෙන්නෙය යි; එවං, මෙසේ; සුට්ඨුතරං, මනාකොටම; උප්පණ්ඩනා, අපහාශකිරීමයි; අදෘයකත්තස්ස, අදෘයකබවට හෝ; පාපනා, පැණවීමයි;

(අ) සබ්බතො භාගෙන, හැමපසින්ම; පාපනා, පැමිණවීම; සම්පාපනා, සම්පාපනා නම්; එවං, මෙසේකල; මෙ, මට; අවණ්ණභයා පි දස්සතීති, නොගුණෙහි බයිනු දු දෙන්නෙය යි; ගෙහතො ගෙහං, ගෙන් ගෙට; ගාමතො ගාමං, ගමින් ගමට; ජනපදතො ජනපදං, ජනපදයෙන් ජනපදයට; අවණ්ණ හරණං, නොගුණ ගෙනයාමයි; ‘පරපිට්ඨිමංසිකතා’ නම්; පුරතො මධුරං භණිත්වා, මැදයෙහි මධුරවචනබැණ; පරම්මුඛෙ, නොමැදයෙහි; අවණ්ණභාසිතා, නොගුණකියනබවයි. (“පරපිට්ඨිමංසිකතා” යනුයෙහි “**පරෙසං පිට්ඨිමංසඛාදන සීලො පරපිට්ඨිමංසිකො තස්ස භාවො පරපිට්ඨිමංසිකතා**”යි ගන්නේ.) එසා හි, මො වනාහි; අභිමුඛං ඔලොකෙතුං අසක්කොන්තස්ස, අභිමුඛය බලන්නට නො පොහොසත්හුගෙ; පරම්මුඛානං, පරම්මුඛයන්ගේ; පිට්ඨිමංසඛාදනමිව හොති, පිටමස් කෑමක් වැනිවෙ; තස්මා, එහෙයින්; පරපිට්ඨිමංසිකතාති වුත්තා, පරපට්ඨිමංසිකතායයි කියනලද; යස්මා, යම්හෙයකින්; වෙළුපෙසිකා විය අබ්භඞ්ගං, ශරීරයෙහි අභ්‍යඞ්ගකළ දෙයක් පිස්නා හුණපොත් තක් මෙන්; පරස්ස ගුණං, අනුන්ගෙ ගුණ, නිප්පෙසෙති,සි සේයි; නිපුඤ්ඡති, පිස්නෙද; යස්මා වා, යම්හෙයකින් හෝ; ගන්ධජාතං පිංසිත්වා ගන්ධද්‍රව්‍යය අඹරා; ගන්ධමග්ගනාවිය, ගඳ සෙවීමක්මෙන්; පරගුණෙ, අනුන්ගෙ ගුණ; නිපිංසිත්වා,යි සේයි; විචුණ්ණෙත්වා, සුණුකොට; එසා ලාභමග්ගනා හොති, මේ ලාභය සෙවීම වෙ ද; තස්මා, එහෙයින්; නිප්පෙසිකතාති, නිප්පෙසිකතායයි; වුච්චති, කියනුලැබේ. **(අනිපිංසිතෙ අලබ්භමානස්ස ගන්ධස්ස නිපිංසනෙන ලාභො විය පරගුණෙ අනිපිංසිතෙ අලබ්භමානානං පච්චයානං නිපිංසිතෙ ලාභො දට්ඨබ්බො.)**

(අ) ලාභෙන ලාභං නිජිගිංසනතා නිද්දෙසෙ:-**නිජිගිංසනකාති** මග්ගනා. **ඉතො ලද්ධන්ති** ඉමස්මා ගෙහා ලද්ධං. **අමුත්‍රාති** අමුකම්හි ගෙහෙ. **එට්ඨීති** ඉච්ඡනා. **ගවෙට්ඨීති** මග්ගනා. **පරියෙට්ඨීති** පුනප්පුන මග්ගනා. ආදිතො පට්ඨාය ලද්ධං ලද්ධං භික්ඛං තත්‍ර තත්‍ර කුලදාරකානං දත්වා අන්තෙ ඛීරයාගුං ලභිත්වා ගතභික්ඛුවත්ථුචෙත්ථ කථෙතබ්බං. එසනාදීනි එට්ඨිආදීනං වෙවචනානි. තස්මා එට්ඨීති එසනා ගවෙට්ඨීති ගවෙසනා පරියෙට්ඨීති පරියෙසනා ඉච්චෙවමෙත්ථ යොජනා වෙදිතබ්බා. අයං කුහනාදීනං අත්ථො. ඉදානි **එවමාදීනංච පාපධම්මාන**න්ති එත්ථ "යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: අඞ්ගං නිමිත්තං උප්පාතං සුපිනං ලක්ඛණං මූසිකච්ඡින්නං අග්ගිහොමං දබ්බිහොම"න්ති ආදිනා නයෙන බ්‍රහ්මජාලෙ වුත්තානං අනෙකෙසං පාපධම්මානං ගහණං වෙදිතබ්බං. ඉති යවායං ඉමෙසං ආජීවහෙතුපඤ්ඤත්තානං ඡන්නං සික්ඛාපදානං වීතික්කමවසෙන ඉමෙසඤ්ච කුහනා ලපනා නෙමිත්තිකතා

---

(අ)"නිජිගිංසනතා"යන්නෙහි,(**අපෙසන ලාභෙන බහුකං චෙච්චා ගහෙතුං ඉච්ඡනං නිජිගිංසනං තස්ස භාවො නිජිගිංසනතා තස්සෙව ඉච්ඡනස්ස** [1] **පවත්ති ආකාරෙ'තං සහජාතං වා ගවෙසනකම්මං**") මග්ගනා, සෙවීම; ඉමස්මා ගෙහා ලද්ධං, මෙගෙන්ලද්දූය; අමුකම්හි ගෙහෙ, හරගෙහි; ඉච්ඡනා, කැමැතිවීමයි; ආදිතො පට්ඨාය, ආදියෙහි පටන්; ලද්ධං ලද්ධං භික්ඛං, ලද ලද භික්ෂාව, තත්‍ර තත්‍ර කුලදාරකානං දත්වා, ඒ ඒ ගෙහි කුල දරුවන්ටදී; අන්තෙ, කෙළවර; ඛීරයාගුං ලභිත්වා, කිරිහුණු කැඳ ලදින්; ගතභික්ඛුවත්ථු, ගිය භික්ෂුහුගෙ වත; එත්ථ, මෙහි; කථෙතබ්බං, කියයුතු; එසනා ආදීනි, එසනාආදි පදයෝ; එට්ඨිආදීනං, එට්ඨිආදීන්ට; වෙවචනානි, පරියායවචනයෝ යි; අයං, මෙ; කුහනාදීනං අත්ථො, කුහනාදීන්ගෙ අර්ථයි; ඉදානි, දැන්; "එවමාදීනංච පාපධම්මානං" යනුයෙහි; යථා වා පන, යම්සේ; භොන්තො සමණබ්‍රාහ්මණා, භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ; සද්ධාදෙය්‍යානි භොජනානි, කර්මඵලශ්‍රද්ධාවෙන් දෙනලද භොජනයන්; භුඤ්ජිත්වා, වළඳා; එවරූපාය තිරච්ඡානවිජ්ජාය; මෙබඳුවූ තිරශ්චාන විද්‍යාවෙන්; මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, මිථ්‍යාජීවයෙන් ජීවිකාව කෙරෙද්ද; සෙය්‍යථීදං, ඔහු කවරහ; අඞ්ගං, හස්තපාදාදී අඞ්ගයන් නිසා ප්‍රවෘත්ත අඞ්ගවිද්‍යායි; නිමිත්තං, ශකුණිරුවාදි නිමිත්තකියන ශාස්ත්‍රයි; උප්පාතං, උල්කාපාතදිග්දාහ භූමිචාලාදි උත්පාතප්‍රතිබද්ධවිද්‍යායි; සුපිනං, ස්වප්න ශාස්ත්‍රයි; ලක්ඛණං, ස්ත්‍රී පුරුෂ ලක්ෂණදන්නා ශාස්ත්‍රයි; මූසිකච්ඡින්නං, වස්ත්‍රාදියෙහි අසවල්භාගයෙහි මීයන් කැකල්හි මෙනම් ඵලයයි දන්නාශාස්ත්‍රයි; අග්ගිහොමං, ජලාශාදිඅග්නින් කෙරෙහි මෙනම් කින්

---

1. ඉච්ඡනකස්ස-මු. ස.

නිප්පෙසිකතා ලාභෙන ලාභං නිජිගිංසනතාති එවමාදීනං පාපධම්මා නං වසෙන පවත්තා මිච්ඡාජීවො, තස්මා සබ්බප්පකාරා පි මිච්ඡා ජීවා යා විරති ඉදං ආජීවපාරිසුද්ධිසීලං. තත්‍රායං වචනත්‍ථො:-එතං ආගම්ම ජීවන්තීති ආජීවො. කො සො? පච්චයපරියෙසනවායාමො. **පාරිසුද්ධීති** පරිසුද්ධතා, ආජීවස්ස පාරිසුද්ධි ආජීවපාරිසුද්ධි.

(ඇ) යං පනෙ තං තදනන්තරං පච්චය සන්නිස්සිත සීලං වුත්තං, තත්‍ථ **පටිසඞ්ඛායොනිසො** ති උපායෙන පථෙන පටිසඞ්ඛාය ඤත්වා-පච්චවෙක්ඛිත්වා ති අත්‍ථො. එත්‍ථ ච සීතස්ස පටිඝාතායාති අදිනා නයෙන වුත්තපච්චවෙක්ඛන මෙව. යොනිසො පටිසඞ්ඛායාති වෙදිතබ්බං. තත්‍ථ **චීවරන්ති** අන්තරවාසකාදිසු යං කිඤ්චි. **පටිසෙවතීති** පරිභුඤ්ජති

---

නොකින් හවනයකළ කල්හි මෙනම් ඵලවෙයි අග්නි වශයෙන් හොම විධානය; දබ්බිහොමං, මෙනම් දූවියෙකින් හවනයකළ කල්හි මෙනම් ඵලවෙයි දර්වී වශයෙන් හොමවිධානය; අදිනා නයෙන, මේ ආදි නයින්; (ආදි ග්‍රහණයෙන් ඛුසගහිහොමාදීන්ගෙද සෙසු මිථ්‍යාජීවයන් ගෙද සඞ්ග්‍රහ දතයුතු.) බ්‍රහ්මජාලෙ වුත්තානං, බ්‍රහ්මජාලසූත්‍රයෙහි කියන ලද; අනෙකෙසං පාපකානං ධම්මානං, නොයෙක් පාපධර්මයන් ගේ; ගහණං, ග්‍රහණය; වෙදිතබ්බං, දතයුතු; ("යවායං මිච්ඡාජීවො"යි යොදනු.) තස්මා සබ්බප්පකාරා පි මිච්ඡා ජීවා, ඒ සර්වප්‍රකාරමිථ්‍යා ජීවයා කෙරෙණ්; යා විරති, යම් විරතියක් ඇද්ද; ඉදං, මෙ; ආජීව පාරිසුද්ධිසීලං, ආජීවපාරිශුද්ධිශීලනම්; තත්‍ර, එහි; අයං, මේ; වචනත්‍ථො, වචනාර්ථයි; එතං ආගම්ම, මෙයට පැමිණ; ජීවන්ති, ජීවත්වෙත්නුයි; ආජීවො, ආජීවනම්; කො සො, හේ කිමෙක්ද; පච්චයපරියෙසන වායාමො, ප්‍රත්‍යය පර්‍යෙෂණාර්‍ථ කාරණ ව්‍යායාමයි; (අජීවය වීර්‍ය්‍යසාධන බැවින් "පච්චය පරියෙසන වායාමො" යුනු.) පාරිසුද්ධීති, පාරිසුද්ධිනම්; පරිසුද්ධතා, පිරිසුදුබවයි; ආජීවස්ස පාරිසුද්ධි, ආජීවයාගේ පාරිශුද්ධිය; ආජීවපාරිශුද්ධිනම්.

---

(ඇ) තදනන්තරං, ආජීවපාරිශුද්ධි ශීලයට අනන්තරකොට; යං පනෙ තං පච්චයසන්නිස්සිතසීලං වුත්තං, යම් මේ ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීල යෙක් කියනලදද; තත්‍ථ, එහි; පටිසඞ්ඛායොනිසො, නුවණින් පරීක්‍ෂා කොට; ("සයං අභිඤ්ඤා" යනාදියෙහිමෙන් යකාර ලොපයෙන් නිර්දේ ශය දතයුතු.) "උපායෙන"යි සේයි; පථෙන, මාර්ගයෙන්; පටිසඞ්ඛාය,යි සේයි; ඤත්වා, දැන; පච්චවෙක්ඛිත්වා ති අත්‍ථො, ප්‍රත්‍යවෙක්‍ෂාකොට යන අර්ථයි; එත්‍ථ ච, මෙහි වනාහි; සීතස්ස පටිඝාතායාති ආදිනා නයෙන, "සීතස්සපටිඝාතාය" යනාදි නයින්; වුත්තපච්චවෙක්ඛන මෙව, කියනලද ප්‍රත්‍යවෙක්‍ෂණයම; යොනිසො පටිසඞ්ඛායාති වෙදි තබ්බං, "යොනිසො පටිසඞ්ඛාය" යි දතයුතු; තත්‍ථ, එහි; චීවරන්ති, සිවුරුනම්; අන්තරවාසකාදිසු යං කිඤ්චි, හඳනා ආදීන්කෙරෙහි යම්

නිවාසෙති වා පාරුපති වා. **යාවදෙවාති** පයොජනාවධි පරිච්ඡෙද නියමවචනං. එත්තකමෙවහි යොගිනො චීවරපටිසෙවනෙ පයොජනං, යදිදං සීතස්ස පටිඝාතායාති ආදි, න ඉතො භිය්‍යො. **සීතස්සාති** අජ්ඣත්තධාතුක්ඛොභ වසෙන වා බහිද්ධා උතුපරිනාම වසෙන වා උප්පන්නස්ස යස්ස කස්සචි. **පටිඝාතායාති** පටිහනනත්ථං, යථා සරීරෙ ආබාධං න උප්පාදෙති, එවං තස්ස විනොදනත්ථං. සීතබ්භාහතෙහි සරීරෙ වික්ඛිත්තචිත්තො යොනිසො පදහිතුං න සක්කොති, තස්මා සීතස්ස පටිඝාතාය චීවරං පටිසෙවිතබ්බන්ති භගවා අනුඤ්ඤාසි. එසනයො සබ්බත්ථ.

---

කිසිවෙක්; පටිසෙවති, යී සේයි; පරිභුඤ්ජති, වැළඳගනී; නිවාසෙති වා, හඳීහෝයි; පාරුපති වා, පොරෙව්හෝ යි; ("වා" ශබ්දය පරිභොග විභාගද දක්වානුයි සයන නිසීදන චීවර කුටිකරණාදි වශයෙන්ද පරිභොගයාගෙ සඞ්ග්‍රහ දතයුතු.) යාවදෙවාති, යාවදෙවයත්‍රු; පයොජනාවධි පරිච්ඡෙදනියමවචනං, ප්‍රයොජනයන්ගේ අවධි පරිච්ඡෙදවශයෙන් නියමවචනයයි; යොගිනො, යොගීහුගෙ; චීවරපටිසෙවනෙ පයොජනං, චීවරපරිභොගයෙහි ප්‍රයොජන; එත්තකමෙවහි, මෙපමණෙක් මැයි; ("යදිදං සීතස්ස පටිඝාතායාති ආදි එත්තකමෙව"යි යොදනු.) න ඉතො භිය්‍යො, මෙයින් වැඩියෙක් නැති; (මෙහි අවධාරණයෙන් ලීලා විභූෂා විළම්බනාඩම්බරාදිවශයෙන් වස්ත්‍රපරිභොගය නිෂෙධ කෙරෙත් ලීලාවශයෙනු දු සමහරු වස්ත්‍රහඳිති පොරවිත් යෞවන යෙහි සිටි නාගරික පුරුෂයන්මෙන් සමහරු විභූෂාවශයෙන් හඳිත් වෙශ්‍යාස්ත්‍රී ආදීන් මෙන්-විළම්බනවශයෙන් විඩම්බකයො ද ආඩම්බර වශයෙන් භොජකාදීහු ද හඳිත්.) "සීතස්ස" යන්නෙහි, අජ්ඣත්ත ධාතුක්ඛොභවසෙන වා, ශීතජ්වරාදි උත්පාදකවූ අධ්‍යාත්මික ධාතු ක්ෂොභවශයෙන් ද; බහිද්ධා, පිටත; උතුපරිනාමවසෙන වා, ඍතු පරිවර්තන වශයෙන් විෂභාග ශීතොෂ්ණර්තු සමුත්ථාන වශයෙන් හෝ; (වා ශබ්දයෙන් හිමකල්ආදියෙහි හිම පාතාදිවශයෙන් ප්‍රවෘත්ත යාගේ සඞ්ග්‍රහය දතයුතු.) උප්පන්නස්ස යස්ස කස්සචි, උපන් යම්කිසි ශීතයක්හුගෙ; පටිඝාතායාති, යී සේයි; පටිහනනත්ථං, නසන පිණිස; යථා, යම්සේ; සරීරෙ ආබාධං න උප්පාදෙති, ශීතයතෙමේ ශරීර යෙහි පීඩා නො උපදවා ද; එවං, මෙසේ; තස්ස විනොදනත්ථං, ඒ ශීත යාගේ දුරුකිරීම පිණිස; සීතබ්භාහතෙහි සරීරෙ, ශරීරය ශීතයෙන් පහරනාලද කල්හි; වික්ඛිත්තචිත්තො, වික්ෂිප්තවූ සිත්ඇත්තේ; යොනිසො පදහිතුං න සක්කොති, නුවණින් වීර්‍ය්‍යකරනුවට නොපොහොසත්වේ; තස්මා, එහෙයින්; සීතස්ස පටිඝාතාය චීවරං පටිසෙවිතබ්බන්ති, ශීතය නසනපිණිස චීවරය සෙවියයුතුයයි; භගවා අනුඤ්ඤාසි, භගවත් අනුදති; එසනයො සබ්බත්ථ, "උණ්හස්ස පටිඝාතාය" යනාදී සෙසු ප්‍රයොජනයෙහි දු මෙම නයයි.

(අ) කෙවලං පන **උණ්හස්සාති** අග්ගිසන්තාපස්ස. තස්ස පන වනදාහාදීසු සම්භවො වෙදිතබ්බො. ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානන්ති-**එත්ථ** පන **ඩංසාති** ඩංසනමක්ඛිකා අන්ධමක්ඛිකාතිපි වුච්චන්ති, **මකසා** මකසායෙව. **වාතාති** සරජඅරජාදිභෙදා. **ආතපොති** සුරියාතපො. **සිරිංසපාති** යෙ කෙචි සරන්තා ගච්ඡන්ති දීඝජාතිකා සප්පාදයො. තෙසං දට්ඨසම්ඵස්සො ච ඵුට්ඨසම්ඵස්සො චාති දුවිධො සම්ඵස්සො. සො පි චීවරං පාරුපිත්වා නිසින්නං න බාධෙති. තස්මා තාදිසෙසු ඨානෙසු තෙසං පටිඝාතත්ථාය පටිසෙවති. **යාවදෙවාති** පුන එතස්ස වචනං නියතපයොජනාවධිපරිච්ඡෙද දස්සනත්ථං. හිරිකොපීනපටිච්ඡාදනං හි නියතපයොජනං, ඉතරානි කදාචි කදාචි හොන්ති. **තත්ථ හිරිකොපීනන්ති** තං තං සම්බාධට්ඨානං. යස්මිං යස්මිං හි අඞ්ගෙ විවරියමානෙ හිරිකුප්පති විනස්සති තං තං හිරිකොපනතො හිරිකොපීනන්ති වුච්චති, තස්ස ච හිරිකොපීනස්ස පටිච්ඡාදනත්ථන්ති හිරිකොපීනපටිච්ඡාදනත්ථං 'හිරිකොපීනං පටිච්ඡාදනත්ථන්ති පි පාඨො.

---

(අ) කෙවලං, හුදෙක්; (අර්ථමාත්‍රයක්ම කියම්හයි සේයි.) එත්ථ, මෙහි; (සූර්‍ය්‍යසන්තාපය ද උෂ්ණවතු දු උහු ආතපග්‍රහණයෙන් ගත් හෙයින් "උණ්හස්සාති අග්ගිසන්තාපස්ස" යුහු.) තස්ස, ඒ අග්ගිසන්තාපයාගෙ; (සමහරදවාග්ගිසන්තාපයෙක් කය සිවුරෙන් වසා දුරුකරන්නට පිළිවන්නුයි "තස්ස වනදාහාදීසු සම්භවො වෙදිතබ්බො" යුහු-පෙ-) ඩංසාති, දංශයෝ නම්; (පිඟුවන් මැස්සෝ යි, උහුම ඩැහැනහෙයින් "ඩංසනමක්ඛිකා" නම් වූහු.) අන්ධමක්ඛිකාතිපි වුච්චන්ති, අන්ධමැස්සෝ යයි ද කියනු ලැබෙත්; මකසා, මකසයෝ නම්; මකසායෙව, මදුරුවෝ මැයි; වාතාති, වාතයෝ නම්; සරජඅරජාදිභෙදා, රජස් ඇති නැති යනාදි භෙදඇති වාතයෝ යි; ආතපොති, ආතපනම්; සුරියාතපො, සූර්‍ය්‍යසන්තාපයි; "සිරිංසපා" යන්නෙහි; යෙකෙචි සරන්තා ගච්ඡන්ති, යම් කිසි කෙනෙක් සමරණය කෙරෙමින් යෙත් ද; (ඔහුයි.) දීඝජාතිකා, දීර්ඝජාතීහුයි; (ආදිශබ්දයෙන් ශතපදාදීහු ගන්නා ලැබෙත්.) තෙසං, ඔවුන්ගේ ද; දට්ඨසම්ඵස්සො, ඩැහැමෙන් වන ස්පර්ශය; ඵුට්ඨසම්ඵස්සො චාති, වෙරපැහැරමෙන් වන ස්පර්ශයයි; දුවිධො සම්ඵස්සො, ස්පර්ශ ද්විවිධ වෙ; සොපි, හෙද; චීවරං පාරුපිත්වා නිසින්නං, සිවුරු පෙරවගෙන හුන්නහු; නබාධෙති, නොපෙළා; තස්මා, එහෙයින්; තාදිසෙසු ඨානෙසු, එබඳු තන්හි; තෙසං පටිඝාතත්ථාය, ඒ වාතාතපාදීන්ගේ නැසීමපිණිස; පටිසෙවති, වළඳගණී; යාවදෙවාති, "යාවදෙව" යන; එතස්ස, මොහුගේ; පුන වචනං, නැවත කීම; නියතපයොජනාවධිපරිච්ඡෙද දස්සනත්ථං, සර්වකාලික ප්‍රයොජනයාගෙ අවධිවශයෙන් පරිච්ඡෙදය දක්වනපිණිසයි; හිරිකොපීනපටිච්ඡාදනං හි, ලජ්ජාකොපනය කරන අඞ්ගමුවහකිරීම; නියතපයොජනං, නියතප්‍රයොජනයි; ඉතරානි, සෙසු ශීතපටිඝාතාදීහු; කදාචි කදාචි හොන්ති, කිසි කිසි කලෙක වෙත්;

(අ) **පිණ්ඩපාතන්ති** යංකිඤ්චි ආහාරං–යො කොචි ආහාරො භික්ඛුනො පිණ්ඩොල්‍යෙන පත්තෙ පතිතත්තා පිණ්ඩපාතොති වුච්චති. පිණ්ඩානං වා පාතො පිණ්ඩපාතො–තත්ථ තත්ථ ලද්ධානං භික්ඛානං සන්නිපාතො සමූහොති වුත්තං හොති. **නෙව දවායාති** න ගාමදාරකාදයො විය දවත්ථං–කීළානිමිත්තන්ති වුත්තං හොති. **න මදායාති** න මුට්ඨිකමල්ලාදයො විය මදත්ථං–බලමදනිමිත්තං පොරිසමදනිමිත්තං චාති වුත්තං හොති. **න මණ්ඩනායාති** න අන්තෙපුරිකවෙසියාදයො විය මණ්ඩනත්ථං–අඞ්ගපච්චඞ්ගානං පීණභාවනිමිත්තන්ති වුත්තං හොති. **න විභූසනායාති** න නටනච්චකාදයො විය විභූසනත්ථං–පසන්නච්ඡවිවණ්ණතානිමිත්තන්ති වුත්තං හොති.

---

තත්ථ, ඒ පාඨයෙහි; හිරිකොපීනන්ති, හිරිකොපීන නම්; තං තං සම්බාධට්ඨානං, ඒ ඒ සම්බාධප්‍රදෙශයි; යස්මිං යස්මිං අඞ්ගෙ විවරියමානෙ, යම් යම් අඞ්ගයක් විවරකරන ලබනකල්හි; හිරි කුප්පති, ලජ්ජා කිපෙ ද; නස්සති, නසී ද; (නිර්ලජ්ජතාව වෙ ද යන අර්ථයි.) තං තං, ඒ ඒ අඞ්ගය; හිරිකොපනතො, ලජ්ජාව නසනහෙයින්, හිරිකොපීනන්ති වුච්චති, හිරිකොපීනයයි කියනුලැබේ; තස්ස ච හිරිකොපීනස්ස, ඒ හිරිකොපීනයාගෙද; පටිච්ඡාදනත්ථන්ති, මුවහකරනු පිණිස නුයි; හිරිකොපීනපටිච්ඡාදනත්ථං, හිරිකොපීනපටිච්ඡාදනයපිණිස නම් වේ. ("තස්ස ච"යනු යෙහි "ච" ශබ්දය පූර්වොක්තප්‍රයොජනයන් පිඬු කෙරෙ.) හිරිකොපීනං පටිච්ඡාදනත්ථන්තිපි පාඨො, "හිරිකොපීනං පටිච්ඡාදනත්ථං" යනු දු පාඨයි.

(අ) පිණ්ඩපාතන්ති, පිණ්ඩපාත නම්; යංකිඤ්චි ආහාරං, ඛාද්‍යභොජ්‍යාදී වැළඳිය යුතු යම් කිසි අහරෙකි; යො කොචි ආහාරො, යම් කිසි අහරෙක්; භික්ඛුනො, භික්‍ෂුහුගේ; පිණ්ඩොල්‍යෙන, භික්‍ෂාචර්‍ය්‍යාවෙන්; පත්තෙ පතිතත්තා, පාත්‍රයෙහි ප්‍රක්‍ෂිප්තහෙයින්; පිණ්ඩපාතොති වුච්චති, පිණ්ඩපාතයයි දු කියනුලැබේ; (**පිණ්ඩාය භික්ඛාය උලතීති පිණ්ඩොලො තස්ස කම්මං පිණ්ඩොල්‍යං තෙන පිණ්ඩොල්‍යෙන**"යි ගන්නේ.) පිණ්ඩානං වා, ගෙන් ගෙන් ලද භික්‍ෂාවන්ගේ; පාතොති, සන්නිපාතයෙක්නුයි; පිණ්ඩපාතො, පිණ්ඩපාතනම්; (එම කීහ "තත්ථ තත්ථ ලද්ධානං භික්ඛානං සන්නිපාතො සමූහොති වුත්තං හොති"යි) න ගාමදාරකාදයො විය, නොද ගම්දරුආදීන් මෙන්; දවත්ථං, යි සේයි; කීළානිමිත්තං ති වුත්තං හොති, ක්‍රීඩානිමිත්තකොටය යි සේයි; න මුට්ඨිකමල්ලාදයො විය, නොද මුෂ්ටියුද්ධකරන මල්ලවයන් මෙන්; (ආදි ශබ්දයෙන් නිබ්බුද්ධ මල්ලවආදීන්ගේ ග්‍රහණයවේ.) මදත්ථං, මදපිණිස; බලමදනිමිත්තං, බලයනිසා උපදනා මදයපිණිස; පොරිසමදනිමිත්තං වා, මම පුරුෂයෙමි යි උපදනා මානසඞ්ඛ්‍යාත මදයපිණිස හෝ; (අසද්ධර්මසෙවනයෙහි සාමර්ථ්‍යය නිසා ප්‍රවෘත්ත මානරාගය පුරුෂමදය යි සමහරු කියත්.) "නමණ්ඩනාය" යනු න අන්තෙපුරිකවෙසියාද

(අ) එත්ථ ච නෙවදවායාති එතං මොහූපනිස්සයපහානත්ථං වුත්තං; න මදායාති එතං දොසූපනිස්සය පහානත්ථං, න මණ්ඩනාය න විභූසනායාති එතං රාගූපනිස්සය පහානත්ථං, නෙව දවාය න මදායාති චෙතං අත්තනො සංයොජනුප්පත්ති පටිසෙධනත්ථං, න මණ්ඩනාය න විභූසනායාති එතං පරස්සපි සංයොජනුප්පත්ති පටිසෙධනත්ථං, චතූහි පි චෙතෙහි අයොනිසො පටිපත්තියා කාමසුඛල්ලිකානුයොගස්ස ච පහානං වුත්තන්ති වෙදිතබ්බං.

---

යො විය, නොද අන්තඃපුරවධූවෙශ්‍යාස්ත්‍රීන්මෙන්; මණ්ඩනත්ථං, මණ්ඩනය පිණිස; අඞ්ගපච්චඞ්ගානං පීණනභාවනිමිත්තං, අඞ්ගප්‍රත්‍යඞ්ගයන්ගේ ප්‍රීණනයපිණිස; (පරිබෘංහණය පිණිසය යන අර්ථයි.) න නටනච්චකාදයො විය, නොද නටනච්චකයන්මෙන්; (නටයෝ නම් තුමූ නටන්නන. නච්චකයෝ නම් අනුන් නටවන්නෝයි-ටීකාවෙහි "**නටා නාම රඞ්ගනටා නච්චකා ලඞ්ඝකාදයො**"යි කීහු.) භූසනත්ථං, භූෂණයපිණිස; පසන්නච්ඡවිවණ්ණතා නිමිත්තං, ප්‍රසන්නච්ඡවිවර්ණ හෙතුකොට;-

(අ) එත්ථ ච, මෙහි වනාහි; නෙවදවායාති එතං, නෙවදවාය යන මේ; මොහූපනිස්සයපහානත්ථං වුත්තං, මොහයට උපනිශ්‍රය නසන පිණිස කියනලදී; (ක්‍රීඩාවෝ මොහයෙන් වනබැවිනු දු මොහයවඩන බැවිනු දු ක්‍රීඩාව නොකිරීමෙන් මොහයාගේ අනුපනිශ්‍රය බවවේ.) න මදායාති එතං, නමදාය යන මේ; දොසූපනිස්සයපහානත්ථං වුත්තං, ද්වෙෂයට උපනිශ්‍රය නසනපිණිස කියනලදී; (බලමද පුරුෂමද දෙක රොෂ හෙතුබැවින් ඒ දෙමදය නොවඩනහුට ද්වෙෂයාගේ අනුපනිශ්‍රයබව වෙ. රාගමදවශයෙන් වනාහි-"රාගූපනිස්සයපහානත්ථං"යි වක්තව්‍යවේ.) න මණ්ඩනාය න විභූසනායාති එතං, න මණ්ඩනාය න විභූසනාය යනමේ; රාගූපනිස්සයපහානත්ථං, රාගොපනිශ්‍රය ප්‍රහාණය පිණිස කියනලදී; (මණ්ඩනවිභූෂණප්‍රතික්ෂෙප මොහූපනිශ්‍රය ප්‍රහාණය පිණිස වේ. නමුදු රාගොපනිශ්‍රයතාවට වනාහි ඍජු ප්‍රතිපක්ෂනුයි "රාගූපනිස්සයපහානත්ථං"යි කීහු.) නෙවදවාය න මදායාති එතං, නෙවදවාය න මදාය යන් මේ; අත්තනො සංයොජනුප්පත්ති පටිසෙධනත්ථං, තමා සන්තානයෙහි සංයොජනයන්ගෙ උත්පත්ති ප්‍රතිෂෙධය පිණිසයි; න මණ්ඩනාය න විභූසනායාති එතං, න මණ්ඩනාය න විභූසනාය යනමේ; පරස්සපි සංයොජනුප්පත්තිපටිසෙධනත්ථං, අනුන්ට සංයොජනොත්පත්ති ප්‍රතිෂෙධය පිණිසයි; (ඉදින්, එකක්හුගේ දවමද හෙතුවෙන් පරයහට ප්‍රතිඝසංයොජනාදීන්ගේ උත්පත්තිය වේ නමුදු මනොපදොසිකදෙවාදීන්ට මෙන් තමාගේම දවමදයන් නිසා යමක්හට සවිශෙෂයෙන් රාග මොහ මානාදි පාපධම්මයෝ උපදිත්ද ඔවුන් සඳහා "අත්තනො සංයොජනුප්පත්ති පටිසෙධනත්ථං"යි කියා මණ්ඩන විභූෂණයන් පිණිස පරයහට රාග මොහාදීහු ද පවතිත්නුයි "පරස්ස පි සං

(අ) **යාවදෙවාති** වුත්තත්ථමෙව. **ඉමස්ස කායස්සාති** එතස්ස චාතුම්මහාභූතිකස්ස රූපකායස්ස. **ඨිතියාති** පබන්ධට්ඨිතත්ථං. **යාපනායාති** පවත්තියා අවිච්ඡෙදනත්ථං චිරකාලට්ඨිතත්ථං වා. ඝරූපත්ථම්භමිව හි ජිණ්ණඝරසාමිකො, අක්ඛබ්භඤ්ජනමිව ච සාකටිකො, කායස්ස ඨිතත්ථං යාපනත්ථඤ්චෙස පිණ්ඩපාතං පටිසෙවති න දවමදමණ්ඩනවිභූසනත්ථං; අපි ච ඨිතීති ජීවිතින්ද්‍රියස්සෙතං අධිවචනං, තස්මා ඉමස්ස කායස්ස ඨිතියා යාපනායාති එත්තාවතා එතස්ස කායස්ස ජීවිතින්ද්‍රියපවත්තාපනත්ථන්තිපි වුත්තං හොතීති වෙදිතබ්බං. **විහිංසූපරතියාති** විහිංසා නාම ජිඝච්ඡා ආබාධට්ඨෙන, තස්සා උපරමත්ථම්පෙස පිණ්ඩපාතං පටිසෙවති වණාලෙපනමිව උණ්හසීතාදීසු තප්පටිකාරං විය ච.

---

යොජනුප්පත්තිපටිසෙධනත්ථං"යි කීහු.) චතුහිපි වෙතෙහි, මේ සතරින්ම; අයොනිසො පටිපත්තියා, අනුපාය ප්‍රතිපත්තින්ගේ; කාමසුඛල්ලිකානුයොගස්ස ච, කාමසුඛල්ලිකානුයොගයාගෙ ද; පහානං වුත්තං ති වෙදිතබ්බං, ප්‍රහාණය කියනලදැයි දතයුතු; ("අයොනිසො පටිපත්තියා" යනු යෙහි කාමසුඛල්ලිකානුයොගය හැර සියලු මිථ්‍යා ප්‍රතිපත්තිය "අයොනිසො පටිපත්ති"නම. පළමු දෙපදයෙන් අයොනිසො පටිපත්තියගෙ ද පශ්චිම දෙපදයෙන් කාමසුඛල්ලිකානුයොගයාගෙ ද ප්‍රහාණය උක්තයයි කියති "චතුහිපි වෙතෙහි"යි වනාහි කී හෙයින් සියලු පෙදෙන්මැ මෙ දෙදෙනාගේම ප්‍රහාණය උක්තය යි දතයුතු. කාමක්‍රීඩාවද දවානනගීගතම වෙයි. පුරුෂමදය ද කාමසුඛල්ලිකානුයොගයට හෙතුවෙයි.)

(අ) යාවදෙවා ති වුත්තත්ථමෙව, යාවදෙවයනු උක්තාර්ථමැයි; චාතුම්මහාභූතිකස්ස, චාතුර්මහාභූතසන්නිශ්‍රිතවූ; රූපකායස්ස, චතුසන්තති රූපසමූහයාගේ; පබන්ධට්ඨිතත්ථං, ප්‍රබන්ධස්ථිතිය පිණිස; පවත්තියා, ජීවිතෙන්ද්‍රිය ප්‍රවෘත්තිය පිණිස; අවිච්ඡෙදනත්ථං, විච්ඡෙදය නොවනපිණිස;(නොහොත්: කායයාගේ යම්තාක් ආයුඃකල්පය ද ඒ තාක් අවස්ථිතිය "යාපනා"යයි දක්වන පිණිස "චිරකාලට්ඨිතත්ථං වා"යි කීහු.) ජිණ්ණඝරසාමිකො, ජීර්ණඝරස්වාමීහු; ඝරූපත්ථම්භමිව, ගෙ නොහෙන පිණිස ගෙහි දෙනමුඩක් මෙන් ද; සාකටිකො, ගැල්පදනහු; අක්ඛබ්භඤ්ජනම්වච, සකට යහපත්වන පිණිස අකුරක දෙන වදනක්මෙන්ද; කායස්ස ඨිතත්ථං, කායයාගේ ස්ථිතිය පිණිස; යාපනත්ථං ච, යැපෙනපිණිස ද; එසො, මේ යොගීතෙමෙ; පිණ්ඩපාතං පටිසෙවති, අහර වළඳන්නේයි; න දවමදමණ්ඩනවිභූසනත්ථං, දවමදමණ්ඩනවිභූෂණ පිණිස නො වළඳන්නේයි; (මෙයින් "යාවදෙව"යි අවධාරණයෙන් නිවෘත්තිතාර්ථය දැක්වූහු.) අපි ච, අනිකෙකුදු; ඨිතීති, ඨිතිය යි; ජීවිතින්ද්‍රියස්ස, ජීවිතෙන්ද්‍රියට; එතං අධිවචනං, මේ නමෙකි; තස්මා, එහෙයින්; ඉමස්ස කායස්ස, මේ කායප්‍රතිබද්ධවූ; ඨිතියා යාපනායා ති, ජීවිතෙන්ද්‍රියාගෙ ප්‍රවෘත්තිය පිණිසය යන; එත්තාවතා, මෙපමණකින්; එතස්ස කායස්ස, මේ කායයා පිළිබඳවූ;

(අ) **බ්‍රහ්මචරියානුග්ගහායාති** සකලසාසනබ්‍රහ්මචරියස්ස මග්ගබ්‍රහ්මචරියස්ස ච අනුග්ගහත්ථං–අයං හි පිණ්ඩපාතපටිසෙවනපච්චයා කායබලං නිස්සාය සික්ඛාත්තයානුයොගවසෙන භවකන්තාර නිත්ථරණත්ථං පටිපජ්ජන්තො බ්‍රහ්මචරියානුග්ගහාය පටිසෙවති, කන්තාරනිත්ථරණත්ථිකා පුත්තමංසං විය, නදීනිත්ථරණත්ථිකා කුල්ලං විය, සමුද්දනිත්ථරණත්ථිකා නාවමිව ච. **ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමීති** එවං ඉමිනා පිණ්ඩපාත පටිසෙවනෙන පුරාණඤ්ච ජිඝච්ඡා වෙදනං පටිහඞ්ඛාමි නවඤ්ච අපරිමිතභොජනපච්චයං ආහරහත්ථක අලංසාටක තත්‍රවට්ටක[1] කාකමාසක භුත්තවමිතකබ්‍රාහ්මණානං අඤ්ඤතරො විය න උප්පා

---

ජීවිතින්ද්‍රියපවත්තාපනත්ථංහිපි, ජීවිතෙන්ද්‍රිය පවත්වනුපිණිසයි ද; වුත්තං හොතීති, කීවෙති යි; වෙදිතබ්බං, දතයුතු; විහිංසා නාම, විහිංසානම්; ආබාධට්ඨෙන, විබාධනය කරනහෙයින් නොහොත්: රොග කරන හෙයින් ("ජිඝච්ඡා පරමා රොගා"යි කීයේමැනු.) ජිඝච්ඡා, ක්ෂුධාවයි; තස්සා උපරමත්ථම්පි, ඒ විහිංසාවගෙ ව්‍යුපශමය පිණිසද; එසො, මෙ තෙමෙ; පිණ්ඩපාතං පටිසෙවති, අහර වළඳ; වණාලෙපනමිව, වණඇත්තහුගේ වෙණෙහි ලන බෙහෙදක් මෙන්ද; උණ්හසීතාදිසු තප්පතීකාරං විය ච, උෂ්ණශීතාදීන් මඩනාකල්හි තත්ප්‍රතීකාර ශීතොෂ්ණාදීන්මෙන් ද; ("පිණ්ඩපාතං පටිසෙවති"යි සම්බන්ධකරනු.)

(අ) සකලසාසනබ්‍රහ්මචරියස්ස, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යා තබා සෙසු ශික්ෂාත්‍රය සඞ්ගෘහීත ශාසනාවචරිතව්‍ය අනුශාසනා සඞ්ඛ්‍යාත ශාසනබ්‍රහ්මචර්‍ය්‍යයට ද; මග්ගබ්‍රහ්මචරියස්ස, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයට ද; අනුග්ගහත්ථං, අනුග්‍රහපිණිස; (සපයනු පිණිස;) අයං හි, මෙ යොගීතෙමෙ; පිණ්ඩපාතපටිසෙවනපච්චයා, ආහාර පරිභොගය හෙතුකොටගෙන; කායබලං නිස්සාය, යථා සමාරබ්ධගුණවිශෙෂපාරිපූරියට හෙතුවූ කායයෙහි බලමාත්‍රයනිසා; සික්ඛාත්තයානුයොගවසෙන, ශික්ෂාත්‍රයෙහි අනුයොග වශයෙන්; භවකන්තාරනිත්ථරණත්ථං, භවකාන්තාරයාගෙ නිස්තරණය පිණිස; පටිපජ්ජන්තො, පිළිපදනෙ; බ්‍රහ්මචරියානුග්ගහාය පටිසෙවති, බ්‍රහ්මචර්‍ය්‍යයට අනුග්‍රහපිණිස වළඳ; කන්තාරනිත්ථරණත්ථිකා පුත්ත මංසං විය, කාන්තාරයෙන් එතරවනු කැමති අඹුසැමි දෙදෙනා කන පුත්‍රමාංසය මෙන් ද; නදීනිත්ථරණත්ථිකා කුල්ලං විය, නදියෙන් එතර වනු කැමැත්තාහු නැඟෙන පසුරක්මෙන් ද; සමුද්දනිත්ථරණත්ථිකා නාවමිව ච, සමුද්‍රයෙන් එතරවනු කැමැත්තාහු නැඟෙන නැවක් මෙන් ද ("පටිසෙවති"යි යොදනු යම්සේ මොහු අගෘද්ධව අමූර්ච්ඡිතව හුදෙක් ඒ ඒ ප්‍රයොජනය අපෙක්ෂාකොට පුත්‍රමාංසාදි සෙවිත්ද එපරිද්දෙන්ම හුදෙක් භවකාන්තාර නිස්තරණය පිණිස අගෘද්ධව අමූර්ච්ඡිතව පිණ්ඩපාතය සෙවිනේයයි උපමා සංසන්දනය කරනු.)

---

1. තත්‍රවට්ටක-මනොරථ පූරණී.

දෙස්සාමීති පි පටිසෙවති, භෙසජ්ජමිව ගිලානො. අථවා යා අධුනා අසප්පායාපරිමිතභොජනං නිස්සාය පුරාණකම්මපච්චයවසෙන උප්පජ්ජනතො පුරාණවෙදනාති වුච්චති.

(අ) සප්පායපරිමිතභොජනෙන තස්සා පච්චයං විනාසෙන්තො තං පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි. යාචායං අධුනා කතං අයුත්තපරිභොගකම්මූපචයං නිස්සාය ආයතිං උප්පජ්ජනතො නවවෙදනාති වුච්චති, යුත්තපරිභොගවසෙන තස්සා මූලං අනිබ්බත්තෙන්තො තං නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමීති. එවමෙපත්ථ අත්ථො දට්ඨබ්බො. එත්තාවතා ච යුත්තපරිභොගසඞ්ගහො අත්තකිලමථානුයොගපහානං ධම්මිකසුඛාපරිච්චාගො ච දීපිතො හොතීති වෙදිතබ්බො.

---

එවං, මෙසේ; ඉමිනා පිණ්ඩපාතපටිසෙවනෙන, මේ පිණ්ඩපාත පරිභෝගයෙන්; පුරාණඤ්ච ජිඝච්ඡාවෙදනං, භොජනයට පූර්වකාලික බැවින් පුරාතනවූ ක්‍ෂුද්වෙදනාව; පටිහඞ්ඛාමි, නසමි; (නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමී ති පටිසෙවති"යි යොදනු.) නවඤ්ච වෙදනං, නවවෙදනාව ද; (කෙබඳුදයත්?) අපරිමිතභොජනපච්චයං, අග්නිප්‍රමාණයට අධිකකොට වැළඳීම හෙතුකොට ඇති; ආහරහත්ථක, බොහෝකොට කා නැඟීසිටිය නොහී "ආහරහත්ථං"යි කියන ආහරහත්ථක නම් බමුණු දූ; අලංසාටක, බොහෝකොට කා මහත්වගිය බඩ ඇති හෙයින් නැඟීසිට පිළී හැඳගතනොහී "අලංසාටකං"යි කියන අලංසාටකනම් බමුණු දූ; තත්ථවට්ටක, බොහෝකොට කා නැඟීසිටිය නොහී එහිම පෙරළෙන "තත්ථවට්ටක" නම් බමුණු දූ; කාකමාසක, කපුටුවන් හැරගෙන කෑහැකි පරිද්දෙන් මුඛචාරය දක්වා කන කාකමාසකනම් බමුණු දූ;[1] භුත්තවම්තක, බොහෝකොට කා මුඛයෙහි රඳවාගතනොහී[2] එතනම නඟාපියන[3] "භුත්තවම්තක" නම් බමුණු දූ; (ඉමෙසං) බ්‍රාහ්මණානං අඤ්ඤතරො විය, මෙ බමුණන් කෙරෙන් එක්තරා එකකු මෙන්; න උප්පාදෙස්සාමී ති පටිසෙවති, නො උපදවමි වළඳූ; භෙසජ්ජමිව ගිලානො, බෙහෙදක් වළඳන ගිලනක්හුමෙන්; අථවා, නොහොත්; අධුනා, දැන්; අසප්පායාපරිමිතභොජනං නිස්සාය, සැපනොවන පමණනොදැන අහර වැළඳීම් නමැති ප්‍රයොග විපත්තියට පැමිණ, පුරාණකම්මපච්චයවසෙන, පූර්ජාතිසිඬකර්මයාගේ ප්‍රත්‍යය වශයෙන්; උප්පජ්ජනතො, උපදනාහෙයින්; යා පුරාණවෙදනාති වුච්චති, යොදනු. යමක් පුරාණවෙදනායයි කියනුලැබෙ ද;

(අ) සප්පායපරිමිතභොජනෙන, සැපඅහර පමණදැන වැළඳීම් නමැති ප්‍රයොගසම්පත්තියෙන්; තස්සා පච්චයං විනාසෙන්තො, ඒ පුරාණ වෙදනාවට ප්‍රත්‍යය නසන්නෙම්; තං පුරාණඤ්ච වෙදනං පටි

---

1. මුද්‍රිත සන්නෙ මෙහස්ව පැනේ.

2. නොදරියහැකිව-මු. ස. 3. වමනයකරන-මු. ස.

(අ) **යාත්‍රා ච මෙ භවිස්සතීති** හිතමිතපරිභොගෙන[1] ජීවිතින්ද්‍රියුපච්ඡෙදකස්ස ඉරියාපථභඤ්ජකස්ස වා පරිස්සයස්ස අභාවතො චිරකාලාගමනසඞ්ඛාතා යාත්‍රා ච මෙ භවිස්සති ඉමස්ස පච්චයායත්තවුත්තිනො කායස්සාති පි පටිසෙවති, යාප්‍යරොගී විය තප්පච්චයං. **අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති** අයුත්තපරියෙසනපටිග්ගහණපරිභොගපරිවජ්ජනෙන අනවජ්ජතා, පරිමිතපරිභොගෙන ඵාසුවිහාරො. අසප්පායාපරිමිතභොජනපච්චයා අරතිතන්දිවිජම්භිකා විඤ්ඤූගරහාදිදොසාභාවෙන වා අනවජ්ජතා, සප්පායපරිමිතභොජනපච්චයා කායබලසම්භවෙන ඵාසුවිහාරො.

---

හඞ්ඛාමි,හේ පුරාණවේදනාව නසමි;("යාචායං නවවෙදනා ති වුච්චති"යි යොදනු.) යාචායං, යම් මේ වේදනාවක්; අධුනා කතං, දැන් කරනලද; අයුක්තපරිභොග කම්මූපචයං නිස්සාය; "අයුත්තපරිභොගො පච්චයෙ අපච්චවෙක්ඛිත්වා පරිභොගො"යි උක්තස්වරූප අයුක්තපරිභොග නමැති කෘතොපචිත කර්මොපචය නිසා; ආයතිං උප්පජ්ජනතො, මතු උපදනාහෙයින්; නවවේදනාති වුච්චති, නව වේදනායයි කියනුලැබේද; යුත්තපරිභොගවසෙන, ප්‍රත්‍යවෙක්ෂා කොට ප්‍රත්‍යය පරිභොගනමැති යුක්තපරිභොගයෙන්; තස්සා මූලං අනිබ්බත්තෙන්තො, ඒ නවවේදනාවට මුල්වූ අයුක්තපරිභොගකර්ම නො උපදවන්නෙනම්; තං නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමීති, ඒ නව වේදනාව නොඋපදවමි යි; එවම්පි, මෙසේ ද; එත්ථ අත්ථො දට්ඨබ්බො, මෙහි අර්ථ දතයුතු; එත්තාවතා, "ඉතිපුරාණඤ්ච" යනාදි පදවයෙන්; "විහිංසූපරතියා" යනාදි පදචතුෂ්කයෙන් හෝ; යුත්තපරිභොගසඞ්ගහො, ප්‍රව්‍රජිතයන්ට අනුරූපවූ ප්‍රත්‍යයපරිභොගය කී බැවින් යුක්තපරිභොගයෙන් සඞ්ග්‍රහය ද; අත්තකිලමථානුයොගප්පහානං, ක්ෂුද්දුඃඛාදි දුඃඛප්‍රතිඝාතය කී බැවින් අත්තකිලමථානුයොග ප්‍රහාණය ද; ධම්මිකසුඛාපරිච්චාගො ච, ධ්‍යානසුඛාදීන්ට ප්‍රත්‍යයවූ කායසුඛය නොහළ බැවින් ධාර්මිකසුඛයාගේ අපරිත්‍යාගය ද; දීපිතො හොතීති වෙදිතබ්බො, දක්වනුලැබීය යි දතයුතු;

(අ) හිතමිතපරිභොගෙන, සැප අහර පමණින් වැළඳීමෙන්; ජීවිතින්ද්‍රියුපච්ඡෙදකස්ස, ජීවිතෙන්ද්‍රිය පැවැත්ත නොදී සිඳිනාවූ හෝ; ඉරියාපථභඤ්ජකස්ස වා, ඊර්‍යාපථයන් බිඳිනාවූ හෝ; පරිස්සයස්ස අභාවතො, උපද්‍රව නොවන බැවින්; චිරකාලාගමන සඞ්ඛාතා, චිරකාලප්‍රවෘත්තියයි කියනලද; මෙ, මාගේ; ඉමස්ස පච්චයායත්ත වුත්තිනො කායස්ස, ප්‍රත්‍යය ප්‍රතිබද්ධ ප්‍රවෘත්තිඇති මේ ශරීරයාගෙ; යාත්‍රා ච භවිස්සති, යැපීමද වන්නේයයි; පටිසෙවති, වළඳී; යාප්‍යරොගී, සාධ්‍ය ද අසාධ්‍ය ද නොවන යාප්‍යරොගඇත්තහු; තප්පච්චයං විය, දවස දවස වළඳන බෙහෙදක්මෙනි; (යම්සේ යාප්‍යරොගීතෙමේ දවස දවස බෙහෙද වළඳා ශරීරය පවත්වාද මෙද එසේම වෙ-ප්‍රත්‍ය

---

1. හිතපරිමිත පරිභොගෙන-ත්‍රි. මූ.

(ඇ) යාවදත්ථඋදරාවදෙහකභොජනපරිවජ්ජනෙන වා සෙය්‍යසුඛ ඵස්සසුඛ මිද්ධසුඛාදීනං පහානතො අනවජ්ජතා, චතුපඤ්චාලොපමත්ත ඌනභොජනෙන චතුඉරියාපථයොග්‍යභාවපටිපාදනතො ඵාසුවිහා රො ච මෙ භවිස්සතීතිපි පටිසෙවති. වුත්තම්පි චෙතං–

34 චත්තාරෙ පඤ්චආලොපෙ අභුත්වා උදකම්පිවෙ
අලං ඵාසුවිහාරාය පහිතත්තස්ස භික්ඛුනොති.

---

යාපනත්ථ ශරීරයාගේ යාපනයපිණිස වළඳයි යන අර්ථයි–යට 'යාප නාය' යි ජීවිතෙන්ද්‍රිය යාපනාව අභිමතය. මෙතන වනාහි සතර ඉරියාපථයන්ගේ අවිච්ඡෙදසංඛ්‍යාත යාපනාව 'යාත්‍රා' යයි අභිමතයි) අයුත්තපරියෙසනපටිග්ගහණපරිභොගපරිවජ්ජනෙන, බුද්ධනින්දිත මිථ්‍යාජීවයෙන් ප්‍රත්‍යයපර්යේෂණය පමණ නොදැන පිළිගැන්ම විනිපාතනය පිණිස හෝ පිළිගැන්ම අප්‍රත්‍යවෙක්‍ෂා පරිභොගය යන මේ අයුක්තපර්යේෂණ ප්‍රතිග්‍රහණපරිභොගය යන මොවුන් දුරු කිරීමෙන් ධර්මයෙන් පර්යේෂණයකොට ධර්මයෙන් පිළිගෙන ප්‍රත්‍ය වෙක්‍ෂාකොට වැළඳීම; අනවජ්ජතා, නිරවද්‍යබවතම්; පරිමිතපරි භොගෙනෙව,[1] පමණදැන වැළඳීමෙන්ම; ඵාසුවිහාරො, ඵාසුවිහාරවේ; අසප්පායාපරිමිතභොජනපච්චයා, අසත්ප්‍රාය අපරිමිතභොජන ප්‍රත්‍යයෙන්; අරති, ප්‍රාන්තශයනාසනාසනයෙහි ද අධිකුශලධර්ම යෙහි ද අනභිරතිය; තන්දි, මදනිද්‍රාය; විජම්භිකා, ස්ත්‍යානමිද්ධවශ යෙන් හැඹීම; විඤ්ඤූගරහාදි දෙෂාභාවෙනවා, විඥයන් විසින් කරන ගර්හා යනාදි මේ දෙෂයන්ගේ අභාවයෙන් හෝ; අනවජ්ජතා, නිවරද බවය; සප්පායපරිමිතභොජනපච්චයා, සැප අහරපමණදැන වැළඳීමේ හෙතුවෙන්; කායබලසම්භවෙන, කායබල සම්භව වන හෙයින්; ඵාසුවිහාරො, ඵාසුවිහාරයවේ:–

(ඇ) යාවදත්ථ උදරාවදෙහකභොජනපරිවජ්ජනෙන වා, යම් තාක් කුස් පුරාකන අහර දුරුකිරීමෙන් හෝ; සෙය්‍යසුඛං, ශය්‍යාවෙන් වන සුවය; ඵස්සසුඛං, දෙඇළයෙන් පෙරළී පෙරළී හෝනවුට වන සුවය; මිද්ධසුඛාදීනං, නිද්‍රාවශයෙන් උපදනා සුවය යනාදීන්ගෙ; පහානතො, ප්‍රහාණයෙන්; අනවජ්ජතා, නිවරදබව ද; චතුපඤ්චාලො පමත්තඌනභොජනෙන, සතරපස් ආලොපයක් පමණ ඌනකොට වැළඳීමෙන්; චතුඉරියාපථයොග්‍යභාව පටිපාදනතො, සතර ඉරියවු වන්ගේ යොග්‍යබව සපයනබැවින්; ඵාසුවිහාරො ච මෙ භවිස්සතීති, මට ඵාසුවිහාරය ද වන්නේයයි; පටිසෙවති, වළඳා; වුත්තම්පි චෙතං, මෙ කීයේමැනු–

34. චත්තාරො පඤ්ච ආලොපෙ අභුත්වා, සතර පස් ආලොපයක් නොවළඳා; උදකම්පිවෙ, පැන් බොන්නේය; පහිතත්තස්ස භික්ඛුනො, නිවනට මෙහෙයනලද සිත්ඇති භික්‍ෂුහට; ඵාසුවිහාරාය, ඵාසුවිහාර පිණිස; අලං, පමණි.

---

1. පරිමිතපරිභොගෙන-පාළි.

(අ) එත්තාවතා ච පයොජනපරිග්ගහො මජ්ඣිමා ච පටිපදා දීපිතා හොතීති වෙදිතබ්බා. **සෙනාසන**න්ති සයනඤ්ච ආසනඤ්ච - යත්ථ යත්ථ හි සෙති විහාරෙ වා අඩ්ඪයොගාදිම්හි වා තං සෙනං, යත්ථ යත්ථ ආසති නිසීදති තං ආසනං, තං එකතො කත්වා සෙනාසනන්ති වුච්චති. **උතුපරිස්සයවිනොදනං පටිසල්ලානාරාමත්ථ**න්ති පරිසහනට්ඨෙන උතු යෙව උතුපරිස්සයො, උතුපරිස්සයවිනොදනත්ථඤ්ච පටිසල්ලානාරාමත්ථඤ්ච - යො සරීරාබාධචිත්තවික්ඛෙපකරො අසප්පායො උතු සෙනාසනපටිසෙවනෙන විනොදෙතබ්බො හොති, තස්ස විනොදනත්ථඤ්ච

---

(අ) එත්තාවතා ච; "යාත්‍රා" යනාදීන් උක්තපදත්‍රයින්; පයොජනපරිග්ගහො, "යාත්‍රා ච මෙ භවිස්සති" යනුයෙන් ප්‍රයොජනපරිග්‍රහය ද; "මජ්ඣිමා ච පටිපදා අනවජ්ජතා ච ඵාසුවිහාරො" යනුයෙන් ධාර්මික සුඛයාගේ අපරිත්‍යාගය හෙතුකොට ඇති ඵාසුවිහාරසඞ්ඛ්‍යාතමධ්‍යම ප්‍රතිපත්තිය ද; දීපිතා හොතීති වෙදිතබ්බා, දක්වනලදැයි දතයුතු; (මෙහි "යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා" යනු එක් අඟෙක, "යාපනාය" යනු එක් අඟෙක, "විහිංසූපරතියා" යනු එක් අඟේක, "බ්‍රහ්මචරියානුග්ගහාය" යනු එක් අඟෙක, ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි" යනු එක් අඟෙක, "නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි" යනු එක් අඟෙක, යාත්‍රා ච මෙ භවිස්සති" යනු එක් අඟෙක, "අනවජ්ජතා" යනු එක් අඟෙක, "ඵාසුවිහාරො" යනු භොජනානිසංසයි-මෙසේ අෂ්ටාඞ්ගයෙන් යුක්තවූ අහර වළඳන්නේනම් දතයුතු.) "සෙනාසනං" යන්නෙහි; සයනඤ්ච, යහන ද; ආසනඤ්ච, ආසනය ද; ("යත්ථ යත්ථ හි විහාරෙවා අඩ්ඪයොගාදිම්හිවා"යි යොදනු.) යම් යම් විහාරයෙක හෝ අඩ්ඪයොගාදියෙක හෝ; සෙති, හොවීද; තං සෙනං, හෙ සයනනම්;-(ආදිශබ්දයෙන් ප්‍රාසාදදීන් ද මඤ්චාදීන් ද සඞ්ග්‍රහකෙරෙත්, "යත්ථ යත්ථ විහාරෙ වා අඩ්ඪයොගාදිම්හි වා ආසති"යි යොදනු.) නිසීදති, හිඳීද; තං ආසනං, හෙ අසුන් නම්; (මිහි ආදිශබ්දයෙන් පීඨසන්ථතාදීන්ගෙ ග්‍රහණයවේ.) තං එකතො කත්වා, එදෙක එක්කොට; සෙනාසනන්ති වුච්චති, "සෙනාසනං"යි කියනුලැබේ; පරිසහනට්ඨෙන, අභිභවනාර්ථයෙන්; (පෙළනහෙයින යන අර්ථයි.) උතුයෙව, ශීතොෂ්ණාදී ඍතුවම; උතුපරිස්සයො, උතුපරිස්සය නම්; උතුපරිස්සයවිනොදනත්ථඤ්ච ඍතු පීඩාව නසනපිණිස ද; (අනුත්පන්නයාගෙ අනුත්පාදනය ද උත්පන්නයාගෙ ව්‍යුපසමය ද පිණිසය යන අර්ථයි.) පටිසල්ලානාරාමත්ථඤ්ච, එකීභාවයෙන් වන සුවය පිණිස ද; ("**නානාරම්මණතො පටිසංහරිත්වා කම්මට්ඨානභූතෙ එකස්මිං යෙව ආරම්මණෙ චිත්තස්ස සම්මදෙව ලයනං පටිසල්ලානං, තත්ථ ආරාමො අභිරති පටිසල්ලානාරාමො තදත්ථං**"යි ගන්නේ-කී අර්ථයම භගවතපිණිස "යො" යනාදී කිවු.) සරීරාබාධචිත්තවික්ඛෙපකරෙ, ශරීරපීඩා චිත්තවික්ෂෙපය යන මොවුන් කරන්නාවූ; යො අසප්පායො උතු, නොසැපවූ යම් ඍතුවෙක්; සෙනාසනපටිසෙවනෙන විනොදෙතබ්බො හොති, සෙනසුන්

ඒකීභාවසුඛත්ථඤ්චාති වුත්තං හොති෴ කාමඤ්ච සීතස්ස පටිඝාතායාදිනාව උතුපරිස්සයවිනොදනං වුත්තමෙව; යථා පන චීවරපටිසෙවනෙ හිරිකොපීනපටිච්ඡාදනං නියතපයොජනං ඉතරානි කදාචි කදාචි භවන්තීති වුත්තං, එවමිධාපි නියතං උතුපරිස්සයවිනොදනං සන්ධාය ඉදං වුත්තන්ති වෙදිතබ්බං. අථවා අයං වුත්තප්පකාරො උතු උතුයෙව; පරිස්සයො පන දුවිධො පාකටපරිස්සයො ච පටිච්ඡන්නපරිස්සයො ච. තත්ථ පාකටපරිස්සයො සීහබ්‍යග්ඝාදයො, පටිච්ඡන්නපරිස්සයො රාගදොසාදයො, තෙ යත්ථ අපරිගුත්තියා ච අසප්පාය රූපදස්සනාදිනා ච ආබාධං න කරොන්ති, තං තං සෙනාසනං එවං ජානිත්වා පච්චවෙක්ඛිත්වා පටිසෙවන්තො භික්ඛු පටිසඞ්ඛා යොනිසො සෙනාසනං෴ පෙ෴ උතුපරිස්සය විනොදනත්ථං පටිසෙවතීති වෙදිතබ්බො෴

---

වැළඳගැන්මෙන් දුරුකටයුතු වේ ද; තස්ස විනොදනත්ථඤ්ච, ඒ නොසැප සෘතුව දුරුකරන පිණිස ද; ඒකීභාවසුඛත්ථඤ්ච, ඒකීභාව හෙතුමෙන් වන සුවයපිණිසද; වුත්තං හොති, කියනුලැබී෴ කාමඤ්ච, කිසිසේත්; සීතස්සපටිඝාතායාදිනාව,[1] "සීතස්ස පටිඝාතාය" යනාදියෙන්ම; උතුපරිස්සයවිනොදනං, ශීතොෂ්ණව්‍යතිරික්ත සෘතුවක් නැති බැවින් සෘතුපීඩාදුරුකිරීම; වුත්තමෙව, කියනලදමය; යථා පන, යම්සේ වනාහි; චීවරපටිසෙවනෙ, සිවුරු වැළඳගැන්මෙහි; හිරිකොපීන පටිච්ඡාදනං නියතපයොජනං, හිරිකොපීනපටිච්ඡාදනය නියත ප්‍රයොජනය; ඉතරානි කදාචි කදාචි භවන්තීති, සෙසු සීතපටිඝාතාදිහු කිසි කිසි කලෙක වෙති යි; වුත්තං, කියනලද ද; එවං, එපරිද්දෙන්ම; ඉධාපි, මෙහි දු; නියතං උතුපරිස්සයවිනොදනං සන්ධාය, සජීදෘභාවී බැවින් නියත උතුපරිස්සයවිනොදනය සඳහා; ඉදං, වුත්තන්ති, මෙ කියනලදැයි; වෙදිතබ්බං, දතයුතු;-අථවා, නොහොත්; අයං, මේ; වුත්තප්පකාරො උතු, සීතාදීවූද අසප්පායවූදැයි උක්තප්‍රකාර සෘතුව; උතුයෙව, සෘතුවනම්වෙයි; පරිස්සයො පන, පරිස්සය වනාහි; දුවිධො, විප්‍රකාරවෙ;-සීහබ්‍යග්ඝාදයො, සිංහව්‍යාඝ්‍රාදීවූ; පාකටපරිස්සයො [ච], ප්‍රකටඋපද්‍රවද; රාගදොසාදයො, රාගද්වෙෂාදීවූ; පටිච්ඡන්නපරිස්සයො, ප්‍රතිච්ඡන්න උපද්‍රවදැයි; තෙ, ඒ උපද්‍රවයෝ දෙදෙන; යත්ථ, යම් සෙනස්නෙක; අපරිගුත්තියා ච, අසංවුතවාරාදී බැවින්ද; අසප්පාය රූපදස්සනාදිනා ච, අසත්ප්‍රාය රූපදර්ශනාදීන්ද; ආබාධං න කරොන්ති, පීඩා නොකෙරෙද්ද; (විවෘතාඞ්ගන වෘක්ෂමූලාදියෙහි හුන්නහුට සිංහාදි බාහිරොපද්‍රවයෝ ද ස්ත්‍රීරූපදර්ශනාදීන් රාගාදි කෙලශොපද්‍රවයෝ ද පෙළන්නහු සෙනසුන් වැදහුන්නහුට උපද්‍රවයෝ දෙදෙනම නොපෙළන්නාහුයි.) තං තං සේනාසනං, ඒ ඒ සෙනසුන්; එවං ජානිත්වා, ප්‍රකටාප්‍රකට උපද්‍රවදෙක නැත්තෙයයිදැන; පච්චවෙක්ඛිත්වා, පස්විකා; සෙවන්තො භික්ඛු, සෙවුනා මහණ තෙමේ; ("පටිසෙවන්තො භික්ඛු වෙදිතබ්බො"යි සම්බන්ධකරනු෴

---

1. සීතපටිඝාතාදිනාව-බොඉහෝ.

(අ) **ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාර**න්ති එත්ථ රොගස්ස පති අයනට්ඨෙන පච්චයො-පච්චනීකගමනට්ඨෙනාති අත්ථො, යස්ස කස්සචි සප්පායස්සෙතං අධිවචනං භිසක්කස්ස කම්මං තෙන අනුඤ්ඤාතත්තාති භෙසජ්ජං, ගිලානපච්චයොව භෙසජ්ජං ගිලානපච්චයභෙසජ්ජං යං කිඤ්චි ගිලානස්ස සප්පායං භිසක්කකම්මං තෙලමධුඵාණිතාදීනීති වුත්තං හොති. පරික්ඛාරොති පන "සත්තහි නගරපරික්ඛාරෙහි සුපරික්ඛිත්තං හොතී"ති ආදිසු පරිවාරො වුච්චති.‍"රථො සීලපරික්ඛාරො[1] ඣානක්ඛො චක්කවීරියො"ති ආදිසු අලඞ්කාරො. යෙචිමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා"ති ආදිසු සම්භාරො. ඉධපන සම්භාරොපි පරිවාරොපි වට්ටති. තං හි ගිලනපච්චයභෙසජ්ජං ජීවිතස්ස පරිවාරොපි හොති ජීවිතනාසකාබාධුප්පත්තියා අන්තරං අදත්වා

---

(අ) රොගස්ස පති අයනට්ඨෙන, ධාතුක්ෂොභලක්ෂණවූ තද්ධෙතුක දුඃඛවෙදනා ලක්ෂණවූ හෝ රොගයට ප්‍රතිපක්ෂබැවින්; පච්චයො, ප්‍රත්‍යයනම්වෙ;(එමකීහ."පච්චනීකගමනට්ඨෙන"යි "වූපසමනට්ඨෙන" යන අර්ථයි.) යස්ස කස්සචි, සර්පිසාදීන් කෙරෙහි යම් කිසි; සප්පායස්ස, පථ්‍යයකට; එතං අධිවචනං, ප්‍රත්‍යය යන මෙනමෙකි; භිසක්කස්ස කම්මං, භිෂක්හුගේ කර්මය; තෙන අනුඤ්ඤාතත්තාති, උහු විසින් අනුඥත හෙයින්; භෙසජ්ජං, බෙහෙත්නම් වෙ; ගිලානපච්චයොවභෙසජ්ජං, ග්ලානප්‍රත්‍යයම බෙහෙත් වූයේ; ගිලානපච්චයභෙසජ්ජං, ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යනම්; යං කිඤ්චි ගිලානස්ස සප්පායං, යම්කිසි ගිලන්හට සැපවූ; භිසක්කකම්මං, භිෂක්කර්මයයි; තෙලමධුඵාණිතාදීනී ති වුත්තං හොති, තෙල් මීහිපැණි ආදිය යන අර්ථයි; පරික්ඛාරොති පන, පරික්ඛාරනම් වනාහි; සත්තහි නගරපරික්ඛාරෙහි, (**"ඛාවාටපටික්ඛෙපො පරිඛා උද්දාපො පාකාරො එසිකා පලිඝො පාකාරපත්ථණ්ඩිලං"**යි කියනලද) සප්තනගර පරිෂ්කාරයෙන්; (නගරං පරිවාරෙත්වා, රක්ඛනකෙහි යන අර්ථයි.) සුපරික්ඛිත්තං හොතීති ආදිසු, මනාකොට පිරිවරනලද යනාදියෙහි; පරිවාරො වුච්චති; පරිවාරකියනලැබේ.‍-සීලපරික්ඛාරො, සුවිසුද්ධ ශීලාලඞ්කාරඇති; ඣානක්ඛො, ධ්‍යාන නමැති අකුරක්ඇති; චක්කවීරියො, වීර්‍ය්‍ය නමැති සක්ඇති; රථො, අෂ්ටාඞ්ගමාර්ග නැමැති රථය; ආදිසු, මෙආදියෙහි; අලඞ්කාරො, අලඞ්කාරය කියනුලැබෙ;-පබ්බජිතෙන, පැවිදිවූවහු විසින්; යෙචිමෙ ජීවිත පරික්ඛාරා, යම් මේ ජීවිතප්‍රවෘත්තියට කාරණකෙනෙක්; සමුදානෙතබ්බාති, මනාකොට මතු මතුයෙහි එලවියයුක්තාහුද යන; ආදිසු, මෙ ආදියෙහි; සම්භාරො, කාරණය කියනුලැබෙ; ඉධ පන, මෙතන වනාහි; සම්භාරොපි, සම්භාරාර්ථය ද; පරිවාරොපි, පරිවාරාර්ථය ද;

---

1. සෙතපරික්ඛාරො-බොහෝ.

රක්ඛනතො; සම්භාරොපි යථාචිරං පවත්තති එවමස්ස කාරණභාවතො; තස්මා පරික්ඛාරොති වුච්චති. එවං ගිලානපච්චයභෙසජ්ජඤ්ච තං පරික්ඛාරො චාති ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරො, තං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං-ගිලානස්ස යං කිඤ්චි සප්පායං භිසක්කානුඤ්ඤාතං තෙලමධුඵාණිතාදි ජීවිතපරික්ඛාරන්ති වුත්තං හොති. **උප්පන්නානන්ති** ජාතානං භූතානං නිබ්බත්තානං. **වෙය්‍යාබාධිකානන්ති** එත්ථ ව්‍යාබාධොති ධාතුක්ඛොභො, තං සමුට්ඨානා ච කුට්ඨගණ්ඩපිළකාදයො, ව්‍යාබාධතො උප්පන්නත්තා වෙය්‍යාබාධිකා. **වෙදනානන්ති** දුක්ඛාවෙදනා අකුසලවිපාකවෙදනා; තාසං වෙය්‍යාබාධිකානං වෙදනානං. **අබ්‍යාපජ්ඣපරමතායාති** නිද්දුක්ඛපරමතාය යාව තං දුක්ඛං සබ්බං පහීනං හොති තාවාති අත්ථො. එව මිදං සඞ්ඛෙපතො පටිසඞ්ඛා යොනිසො පච්චයපරිභොගලක්ඛණං පච්චයසන්නිස්සිත සීලං වෙදිතබ්බං.

---

වට්ටති, වරී; තං හි ගිලානපච්චයභෙසජ්ජං, ඒ ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යය; ජීවිතස්ස, ජීවිතයට; පරිවාරොපි හොති, පරිවාරදවෙ; ජීවිතනාසකාබාධුප්පත්තියා, ජීවිතනාසකවූ ආබාධොත්පත්තියට; අන්තරං අදත්වා, අතුරු නොදී; රක්ඛනතො, රක්නා හෙයිනි; සම්භාරොපි, සම්භාරද වෙ; යථා චිරං පවත්තති, යම්සේ චිරකාලයක් පවතී ද; එවමස්ස කාරණභාවතො, එසේ ජීවිතයට කාරණාවන හෙයිනි; ("රසායනභූතං හි භෙසජ්ජං සුචිරමපි කාලං ජීවිතං පවත්තෙතී"යි) තස්මා, එහෙයින්; පරික්ඛාරොති වුච්චති, පරිෂ්කාරයයි කියනු ලැබේ. පෙ. (අනුත්පන්නවූ දුඃඛවෙදනාවම බෙහෙත්වැළඳීමෙන් වළක්නීය. උපන්වෙදනා නොවළක්නී යි තමා ස්වරසයෙන්ම බිදෙ[illegible] බැවින්. "සා එව තිත්තිරී නාති යෙව ඔසධානි" යනුයෙහිමෙන් වනාහි තත්සදෘශයෙහි තද්ව්‍යවහාරයෙන් උත්පන්නසදෘශ වෙදනාවෝ "උප්පන්නානං"යි කියනලදහු. එහෙයින්කීහ:-"උප්පන්නානන්ති, ජාතානං භූතානං නිබ්බත්තානං"යි) ව්‍යාබාධොති, ව්‍යාබාධනම්; ධාතුක්ඛොභො, ධාතුක්ෂොභයද; තං සමුට්ඨානාච, දොෂසඞ්ඛ්‍යයෙහි පටන් ඒ ධාතුක්ෂොභය හෙතුකොටඇති" කුට්ඨපිළකාදයො, කුෂ්ඨ පිළකා ආදීහු; ("සඞ්ඛ්‍යයතො පට්ඨාය සො ධාතුක්ඛොභො සමුට්ඨානං එතෙසන්ති තං සමුට්ඨානං" යි ගන්නේ;) ව්‍යාබාධතො උප්පන්නත්තා, ධාතුක්ෂොභලක්ෂණ කුෂ්ඨපිළකාදී ලක්ෂණහෝ ව්‍යාබාධයාකෙරෙන් උත්පන්නහෙයින්; වෙය්‍යාබාධිකා, වෙය්‍යාබාධිකා නම් වේ;- වෙදනා නම්; ("දුක්ඛාවෙදනා"යි කියාද හො තොමො අකුශල ස්වභාව ද වේ නුයි එයින් වෙසෙසනු පිණිස "අකුසලවිපාකවෙදනා"යි කීහු.) තාසං වෙය්‍යාබාධිකානං වෙදනානං, ඒ උක්තලක්ෂණව්‍යාබාධයෙන් උපන් වෙදනාවන්ගේ; (ව්‍යාබාධනට්ඨෙන ව්‍යාබාධොව ව්‍යාපජ්ඣං දුක්ඛන්ති අත්ථො නත්ථි එත්ථ බ්‍යාපජ්ඣන්ති අබ්‍යාපජ්ඣං නිද්දුක්ඛතා තෙනාහ අබ්‍යාපජ්ඣපරමතායාති නිද්දුක්ඛපරමතායාති") යාව,

(අ) වචනත්ථො පනෙත්ථ චීවරාදයො හි යස්මා තෙ පටිච්ච නිස්සාය පරිභුඤ්ජමානා පාණිනො යන්ති ගච්ඡන්ති පවත්තන්ති තස්මා පච්චයාති වුච්චන්ති; තෙ පච්චයෙ සන්නිස්සිතන්ති පච්චයසන්නිස්සිතං෴

(ආ) එවමෙතස්මිං චතුබ්බිධෙ සීලෙ:- සද්ධාය පාතිමොක්ඛසංවරො සම්පාදෙතබ්බො. සද්ධාසාධනො හි සො, සාවකවිසයාතීතත්තා සික්ඛාපදපඤ්ඤත්තියා වචනපටික්ඛෙපො චෙත්ථ නිදස්සනං. තස්මා යථා පඤ්ඤත්තං සික්ඛාපදං අනවසෙසං සද්ධාය සමාදියිත්වා ජීවිතෙපි අපෙක්ඛං අකරොන්තෙන සාධුකං සම්පාදෙතබ්බං෴ වුත්තම්පි හෙතං:

---

යම්තාක්; තං දුක්ඛං, ඒ රෝගනිමිත්ත දුඃඛය; සබ්බං පහීනං හොති සියල්ල ප්‍රහීණවේ ද; තාවාති අත්ථො, ඒතාක්ය යන අර්ථයි; එවං මෙසේ; ("ඉදං සීලං"යි යොදනු.) සඞ්ඛෙපතො, සංක්ෂෙපයෙන්; පටිසඞ්ඛා යොනිසො, නුවණින් ප්‍රත්‍යවෙක්ෂාකොට; පච්චයපරිභොගලක්ඛණං, ප්‍රත්‍යය පරිභොග ලක්ෂණකොටඇති; පච්චයසන්නිස්සිත සීලං, ප්‍රත්‍යයසන්නිශ්‍රිත ශීලය; වෙදිතබ්බං, දතයුතු෴

(අ) වචනත්ථො පනෙත්ථ, මෙහි වචනාර්ථයවනාහි; ("චීවරාදයො හි පච්චයා ති වුච්චන්ති"යි යොදනු.) යස්මා, යම් හෙයකින්; තෙ, ඒ චීවරාදී ප්‍රත්‍යයන්; පටිච්ච, යී සේයි- නිස්සාය, නිසා; පරිභුඤ්ජමානා, වළඳන්නාවූ; පාණිනො, සත්වයෝ; යන්ති, යී සේයි- ගච්ඡන්ති, යෙද්ද, පවත්තන්ති, ජීවත්වෙත් ද; තස්මා, එහෙයින්; පච්චයාති වුච්චන්ති; ප්‍රත්‍යයහයි කියනුලැබෙත්; (ප්‍රත්‍යයසන්නිශ්‍රය කිරීම නම් අර්ථහෙයින් පරිභොගයම යයි දක්වනපිණිස "තෙ පටිච්ච නිස්සාය"යි කියාද "පරිභුඤ්ජමානා"යි කීහු.) තෙ පච්චයෙ සන්නිස්සිතන්ති, ඒ ප්‍රත්‍යය සන්නිශ්‍රිතනුයි; පච්චයසන්නිස්සිතං,. ප්‍රත්‍යයසන්නිශ්‍රිතනම්෴

×

(ආ) එවං, මෙසේ; චතුබ්බිධෙ සීලෙ, චතුර්විධවූ ශීලයෙහි; සද්ධාය, සැදැහැයෙන්; පාතිමොක්ඛසංවරො, ප්‍රාතිමොක්ෂසංවරය; සම්පාදෙතබ්බො, සැපවියයුත්තේයි; සද්ධාසාධනො හි සො, ඒ ප්‍රාතිමොක්ෂ සංවරය ශ්‍රද්ධාව සාධනකොට ඇත්තේයි; ("**සාධියති සම්පාදියති එතෙනාති සාධනං සද්ධාසාධනං එතස්සාති සද්ධාසාධනො**"යි ගන්නේ:- වීර්‍ය්‍යස්මෘතිප්‍රඥාවන් විනාද ප්‍රාතිමොක්ෂසංවරය සිද්ධනොවනු දු ශ්‍රද්ධාවගෙ විශෙෂප්‍රත්‍යය බව සඳහා ශ්‍රද්ධාසාධනබව කියනලදැයි දක්වනුවො "සාවකවිසයාතීතත්තා සික්ඛාපදපඤ්ඤත්තියා"යි කීහු. ශික්ෂාපදප්‍රඥප්තිය ශ්‍රාවක විෂය ඉක්මසිටිහෙයින යන අර්ථයි;) සික්ඛාපදපඤ්ඤත්තියා වචන පටික්ඛෙපො ච, ශික්ෂාපදප්‍රඥප්තියපිණිස සැරියුත්මහ තෙරුන්කළ යාචඤාවට කළ ප්‍රතික්ෂෙපය ද; එත්ථ, ඒ ශ්‍රාවිකවිෂයාතීත භාවයෙහි; නිදස්සනං, නිදර්ශනයි; (කීහු මැනු. "ආගමෙහි ත්වං සාරිපුත්ත තථාගතොව තත්ථ කාලං ජානිස්සති"යි- සමුච්චයාර්ථ චශබ්දයෙන් "අපඤ්ඤත්තං න පඤ්ඤපෙම පඤ්ඤත්තං න සමුච්ඡින්දම යථා පඤ්ඤත්තෙසු

35 කිකීව අණ්ඩං චමරීව වාලධිං පියංව පුත්තං නයනංව එකකං
තථෙව සීලං අනුරක්ඛමානකා සුපෙසලා හොථ සදා සගාරවාති.

(අ) අපරම්පි වුත්තං:–"එවමෙව ඛො මහාරාජ යං මයා සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං තං මම සාවකා ජීවිතහෙතුපි නාතික්කමන්තී"ති ඉමස්මිඤ්ච පනත්ථෙ අටවියං චොරෙහි බද්ධථෙරානං වත්ථූනි වෙදිතබ්බානි. මහාවත්තනි අටවියං කිර ථෙරං චොරා කාළවල්ලීහි බන්ධිත්වා නිපජ්ජාපෙසුං, ථෙරො යථා නිපන්නොව සත්තදිවසානි විපස්සනං වඩ්ඪෙත්වා අනාගාමිඵලං පාපුණිත්වා තත්ථෙව කාලං කත්වා බ්‍රහ්මලොකෙ නිබ්බත්ති.

---

සික්ඛාපදෙසු සමාදාය වත්තාම" යනාදීන්ගේ සඞ්ග්‍රහ දතයුතු.) තස්මා, එහෙයින්; යථා පඤ්ඤත්තං සික්ඛාපදං, පනවනලද සියලු ශික්ෂාපද; අනවසෙසං, නිරවශෙෂකොට; සද්ධාය සමාදියිත්වා, බුදුන් කෙරෙහි ධර්‍මයෙහිදු ශ්‍රද්ධාවෙන් සමාදන්ව; ජීවිතෙපි, ජීවිතයෙහි ද;(අපිශබ්දය සම්භාවනායෙහිය "පගෙව ජීවිතපරික්ඛාරෙ"යි කීවෙත්.) අපෙක්ඛං අකරොන්තෙන, අපෙක්ෂා නොකරන්නහු විසින්; සාධුකං, මනාකොට; සම්පාදෙතබ්බං, සැපවියයුතු; එතං, මේ; වුත්තම්පි හි, කියනලදමැයි:

35. කිකීව අණ්ඩං, තමාදිවි පියාද බිජු රක්නා කිරලක් යම්සේද; චමරීව වාලධිං, දිවිපියා කණ්ටකගුම්බාදියෙහි ලග්නාවූ තමා වාලධිය රක්නා චමරීමෘගී යම්සේද; ("පියං එකකං පුත්තංව"යි යොදනු.) ප්‍රියවූ එකපුතකු රක්නා කෙළෙඹියෙක් යම්සේද; නයනංව එකකං, එකැස් පුරුෂයෙක් තමා ඇස යම්සේද; තථෙව, එසේම; සීලං අනුරක්ඛමානකා, ශීලයරක්ෂාකරන්නාවූ; සදා, හැමකල්හි; (නව මධ්‍යම ස්ථවිරකල්හි;) සගාරවා, බුද්ධාදීන්කෙරෙහි ගෞරව ඇතිව; සුපෙසලා හොථ, මනාකොට ප්‍රියශීලිවව්.

(අ) අපරම්පි වුත්තං, අනිකෙකු දු කියනලදී; එවමෙවඛො, (යම්සේ මහාසාගරය වෙරළ නොඉක්මේද) එපරිද්දෙන්ම; මහාරාජ, මහරජ; මයා, මා විසින්; සාවකානං, සවුවනට; යං සික්ඛාපදං පඤ්ඤත්තං, යම් සිකපදයෙක් පනවනලද ද; තං, හේ; මම සාවකා, මාගෙ සවුවො; ජීවිතහෙතු පි, ජීවිතය හෙතුකොට ද; නාතික්කමන්ති ති, නොයික්මෙති යි; ඉමස්මිඤ්ච පනත්ථෙ, මෙ අර්ථයෙහි; (ජීවිතහෙතු වෙතු දු සිකපද නොයික්මවීමෙහිය යන අර්ථයි.) අටවියං, අරණ්‍යයෙහි; චොරෙහි, සොරුන් විසින්; බද්ධානං, බඳනාලද; ථෙරානං, තෙරවරුන්ගේ; වත්ථූනි, වස්තුහු; වෙදිතබ්බානි, දතයුත්තාහුයි; මහාවත්තනි අටවියං, වින්ධ්‍යාඅටවියෙහි; (හිමවත් සමීපයෙහි අටවියෙක යෙත් ම) ථෙරං, එක් තෙරකෙනෙකුන්; චොරා, සොරහු; කාළවල්ලීහි, කලුවැලින්; බන්ධිත්වා නිපජ්ජාපෙසුං, (ගොසින් කිසිවක් හට නොකියවයි) බැඳ හෙවූහු; ථෙරො, තෙරහු; යථා නිපන්නොව,

(ඇ) අපරම්පි ථෙරං තම්බපණ්ණිදීපෙ පූතිලතාය බන්ධිත්වා නිපජ්ජාපෙසුං; සො දවඩාහෙ ආගච්ඡන්තෙ වල්ලිං අච්ඡින්දිත්වාව විපස්සනං පට්ඨපෙත්වා සමසීසී හුත්වා පරිනිබ්බායි. දීඝභාණක අභයත්ථෙරො පඤ්චහි භික්ඛුසතෙහි සද්ධිං ගච්ඡන්තො දිස්වා ථෙරස්ස සරීරං ඣාපෙත්වා චෙතියං කාරාපෙසි. තස්මා අඤ්ඤොපි සද්ධො කුලපුත්තො:-

36 පාතිමොක්ඛං විසොධෙන්තො අප්පෙව ජීවිතං ජහෙ
පඤ්ඤත්තං ලොකනාථෙන න භින්දෙ සීලසංවරං.

(ඈ) යථා ච පාතිමොක්ඛසංවරො සද්ධාය, එවං සතියා ඉන්ද්‍රියසංවරො සම්පාදෙතබ්බො සතිසාධනො හි සො, සතියා අධිට්ඨිතානං ඉන්ද්‍රියානං අභිජ්ඣාදීහි අනන්වාස්සවනීයතො. තස්මා "වරං භික්ඛවෙ

---

ඔත්වනම හෙව; සත්තදිවසානි, සත්දවසක්; විපස්සනං වඩ්ඪෙත්වා, විදර්ශනාවඩා; අනාගාමිඵලං පාපුණිත්වා, අනාගාමිඵලයට පැමිණ; තත්ථෙව, එතැන්හිම; කාලං කත්වා, කාලක්‍රියා කොට; බ්‍රහ්මලොකෙ නිබ්බත්ති, බඹලොවනිපන්හු.—

(ඇ) අපරම්පි ථෙරං, අනික් තෙරකෙනෙකු ද; තම්බපණ්ණිදීපෙ, මෙ හෙළදිවදී; පූතිලතාය, කිඳිවැලකින්; බන්ධිත්වා නිපජ්ජාපෙසුං, බැඳ හෙවූහු; සො, ඒ තෙරහු; දවඩාහෙ ආගච්ඡන්තෙ, ලැව්ගිනි එනකල්හි; වල්ලිං අච්ඡින්දිත්වාව, (ආපත්තියෙහි භයින්) වැල නොසිඳම; විපස්සනං පට්ඨපෙත්වා, විදර්ශනාව ආරම්භකොට; සමසීසී හුත්වා පරිනිබ්බායි, ජීවිතසමසීසීව පිරිනිවියෝ; (යමක්හට කෙලෙසුන්ට ඉස්වූ අවිද්‍යාව මාර්ගපටිපාටියෙන් ගොස් රහත් මග තෙමේ ක්ෂයකෙරෙ ද එක්බිති එකුන්විසිවන ප්‍රත්‍යවෙක්ෂාඥානයෙහි පිහිටා භවාඞ්ගාවතරණයවූකල ප්‍රවෘත්තියට ඉස්වූ ජීවිතෙන්ද්‍රියයා චුතිචිත්තය තෙමේ ක්ෂය කෙරෙ ද හෙතෙමෙ මේ වාරසමත්වයෙන් ජීවිතසමසීසී නමැයි කියත්ලැබේ.) දීඝභාණකඅභයත්ථෙරො, දීඝභාණක නම් අභයමහතෙරහු; පඤ්චහි භික්ඛුසතෙහි සද්ධිං, පන්සියයක් භික්ෂූන් හා සමග; ගච්ඡන්තො, යන්නාහු; දිස්වා, දැක; ථෙරස්ස සරීරං ඣාපෙත්වා, ස්ථවිරයන්ගේ ශරීරය දවා; චෙතියං කාරාපෙසි, චෛත්‍යයක් කැරවූ; තස්මා, එහෙයින්; අඤ්ඤොපි සද්ධො කුලපුත්තො, අනික් සැදැහැ සපන් කුලපුතෙකු ද.

36. පාතිමොක්ඛං, ප්‍රාතිමොක්ෂසංවරසීලය; විසොධෙන්තො, පිරිසුදු කරන්නේ; ජීවිතං ජහෙ, තමාගේ ජීවිතය හළයේවීනම්; අප්පෙව, යෙහෙක; ලොකනාථෙන, ලොකනාථයා විසින්; පඤ්ඤත්තං, පනවන ලද; සීලසංවරං, සංවරශීලය; න භින්දෙ, නොබිඳින්නේ යි; (නොසික් මෙන්නේ යි.)

(ඈ)යථා ච,යම්සේ; පාතිමොක්ඛසංවරො,ප්‍රාතිමොක්ෂසංවරය;සද්ධාය, ශ්‍රද්ධාවෙන් (සැපවියයුතුද); එවං, එපරිද්දෙන්ම; සතියා, සමෘතියෙන්; ඉන්ද්‍රියසංවරො, ඉන්ද්‍රියසංවරය; සම්පාදෙතබ්බො, සැපවියයුතු; සො,

තත්තාය අයොසලාකාය ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය චක්ඛුන්ද්‍රියං සම්පලිමට්ඨං, නත්වෙව චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු අනුබ්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො"ති ආදිනා නයෙන ආදිත්තපරියායං සමනුස්සරිත්වා රූපාදීසු විසයෙසු චක්ඛුද්වාරාදිපවත්තස්ස විඤ්ඤාණස්ස අභිජ්ඣාදීහි අන්වාස්සවනීයං නිමිත්තාදිග්ගාහං අසම්මුට්ඨාය සතියා නිසෙධෙන්තෙන එස සාධුකං සම්පාදෙතබ්බො—එවං අසම්පාදිතෙ හි එතස්මිං පාතිමොක්ඛසීලම්පි අනද්ධනියං හොති නචිරට්ඨිතිකං, අසංවිහිතසාඛාපරිවාරමිව සස්සං. හඤ්ඤතෙ චායං කිලෙසචොරෙහි, විවටද්වාරො විය ගාමො පරස්සහාරීහි. චිත්තඤ්චස්ස රාගො සමතිවිජ්ඣති, දුච්ඡන්නමගාරං වුට්ඨී විය. වුත්තම්පි හෙතං—

---

ඒ ඉන්ද්‍රියසංවරය; සතිසාධනො හි, ස්මෘතිසාධනකොට ඇත්තේයි; සතියා අධිට්ඨිතානං ඉන්ද්‍රියානං, පළමුකොට එළවනලද ස්මෘතිය විසින් ආරක්ෂා වශයෙන් අධිෂ්ඨිතවූ ඉන්ද්‍රියයන්ගෙ; අභිජ්ඣාදීහි, අභිධ්‍යාදි පාපධර්මයන් විසින්; අනන්වාස්සවනීයතො, අනුනොවියයුතු හෙයින්; (අනුබන්ධනය නොකටයුතුබැවිනි;) තස්මා, එහෙයින්; තත්තාය, හුණුවූ; ආදිත්තාය, ආදියෙහි පටන් හැමතැනම ඇවිලිගිනිඇති; සම්පජ්ජලිතාය, හාත්පසින් දිළියෙන; සජොතිභූතාය, එකජ්ජාලවූ; අයොසලාකාය, යලහුාවෙන්; චක්ඛුන්ද්‍රියං, චක්ෂුරින්ද්‍රියතෙමෙ; සම්පලිමට්ඨං, පිරිමදිනාලද්දේ; වරං, උත්තමය; චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු, ඇසින් දක්කයුතුවූ; රූපෙසු, රූ අරමුණන් කෙරෙහි; අනුබ්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො, කෙලෙසුන් පහළවනසේ සුභාදි නිමිත්තග්‍රහණය; (නොහොත් හස්තපාදාදී අනුබ්‍යඤ්ජන වශයෙන් ස්ත්‍රී පුරුෂාදීන් කෙරෙහි සුභාදි නිමිත්තග්‍රහණය;) නත්වෙව වරනති, නොම උතුමයන; ආදිනා නයෙන, මෙ ආදි නයින් දෙසිතවූ; ආදිත්තපරියායං, ආදිත්තපරියායසූත්‍රය; සමනුස්සරිත්වා, සිහිකොට; රූපාදීසු විසයෙසු, රූපශබ්දාදී විෂයෙහි; චක්ඛුද්වාරාදිප්පවත්තස්ස, චක්ෂුර්ද්වාරාදීන් කෙරෙන් ප්‍රවෘත්තවූ; විඤ්ඤාණස්ස, ජවනවිඥානයාගෙ; අභිජ්ඣාදීහි, අභිධ්‍යාදී පාපධර්මයන් විසින්; අන්වාස්සවනීයං, අනුවියයුතුවූ; නිමිත්තාදිග්ගාහං, නිමිත්තානුබ්‍යඤ්ජනග්‍රහණය; නිසෙධෙන්තෙන, වළක්නහු විසින්; අසම්මුට්ඨාය සතියා, අනෂ්ටස්මෘතියෙන්; එසො, මෙ ඉන්ද්‍රියසංවරය තෙමෙ; සාධුකං, මනාකොට; සම්පාදෙතබ්බො, සැපවිය යුත්තේයි—එවං, මෙසේ; එතස්මිං, මෙ ඉන්ද්‍රියසංවරශීලය; අසම්පාදිතෙ, නොසපයනලදකල්හි; පාතිමොක්ඛසීලම්පි, ප්‍රාතිමොක්ෂසංවරශීලය ද; අනද්ධනියං හොති, අධ්වක්ෂමනොවෙ; නචිරට්ඨිතිකං, චිරස්ථිතිකනොවෙ; (බොහෝ දවසක් නොසිටී කුමක්මෙන්දයත්) අසංවිහිතසාඛාපරිවාරං, නොකරනලද වැඩිඇති; සස්සං ඉව, ගොයමක්මෙනි; අයං, මෙ ප්‍රාතිමොක්ෂසංවරයතෙමෙ; කිලෙසචොරෙහි, කෙලෙස් සොරුන් විසින්; හඤ්ඤතෙ ච, පහරනුලැබෙයි; (කුමක්මෙන්දයත්?) විවටද්වාරො විය ගාමො පරස්සහාරීහි, විවෘතවූ වාරඇති ගමක් සොරුන් විසින් මෙනි;

37 රූපෙසු සද්දෙසු අථො රසෙසු
ගන්ධෙසු ඵස්සෙසු ච රක්ඛ ඉන්ද්‍රියං
එතෙ හි ද්වාරා විවටා අරක්ඛිතා
හනන්ති ගාමංව පරස්සහාරිනො.

38 යථාගාරං දුච්ඡන්නං වුට්ඨී සමතිවිජ්ඣති
එවං අභාවිතං චිත්තං රාගො සමතිවිජ්ඣති.

(අ) සම්පාදිතෙ පන එතස්මිං පාතිමොක්ඛසංවරසීලම්පි අද්ධනියං හොති චිරට්ඨිතිකං, සුසංවිහිතසාඛාපරිවාරමිව සස්සං; න හඤ්ඤතෙවා යං කිලෙසචොරෙහි, සුසංවුතද්වාරො විය ගාමො පරස්සහාරීහි; න චස්ස චිත්තං රාගො සමතිවිජ්ඣති සුච්ඡන්නමගාරං වුට්ඨීවිය. වුත්තම්පිචෙතං.....

---

අස්ස, මොහුගෙ: චිත්තඤ්ච, චිත්තය ද; රාගො, රාගයතෙමෙ; සමතිවිජ්ඣති, [සං අතිවිජ්ඣති,] හාත්පසින් විදී; දුච්ඡන්නමගාරං, නපුරුකොට සෙවූ ගෙයක්; වුට්ඨීවිය, වැස්සක් මෙනි; එතං, මෙ; වුත්තම්පිහි, කියෙමැනු.....

37. රූපෙසු, රූපහෙතුවෙන් ද;(නිමිත්තාර්ථයෙහි සප්තමීසි.) සද්දෙසු, ශබ්දහෙතුවෙන් ද; අථො, නැවත; රසෙසු, රසහෙතුවෙන් ද; ගන්ධෙසු, ගන්ධහෙතුවෙන් ද; ඵස්සෙසු ච, ස්පර්ශහෙතුවෙන් ද; ("උප්පජ්ජනක කිලෙසෙසු"යනු ශෙෂයි-උපදනා කෙලෙසුන් කෙරෙන්;)රක්ඛ ඉන්ද්‍රියං, චක්ෂුරාදී ඉන්ද්‍රියයන් රක්ෂාකර; එතෙ ද්වාරා, මේ ද්වාරයෝ; (චක්ෂුරාදී ද්වාරයෙහි ප්‍රවෘත්තකෙලශයෝ යුතැන කාරණොපචාරයෙන් වනාහි ද්වාරයෙහි ප්‍රවෘත්තකෙලශයෝ ද්වාරශබ්දයෙන් ගෘහීතයෝයි.) විවටා, සිහි කවුළුවෙන් නොපියන ලද්දාහු; අරක්ඛිතා, එහෙයින් ම අරක්ෂිතවූවාහු; ගාමං පරස්සහාරිනො ඉව, ගමක් පහරණ සොරුන් මෙන්; හනන්ති, නසත්; (අපිහිතද්වාරයෙන් යුත් පුහුලා නසති යුතැනි. නොහොත්: ඒ කෙලෙසුන්ට අරමුණුවූ මේ රූපාදීහු) විවටා, විවෘතවූ; අරක්ඛිතා, අරක්ෂිතවූ; ද්වාරා, චක්ෂුරාදිද්වාරයන් හෙතුකොටගෙන; හනන්ති, විවෘතද්වාරයෙන් සමන්විතයා නසත්; ('ද්වාරා' යනු හෙත්වර්ථයෙහි පචමී යි-මෙ පක්ෂයෙහි දු කෙලෙසුන් කළමනා හනනය රූපාදීන් කෙරෙහි එළවා කීබැවින් කාරණොපචාරමැයි.)

38. යථා, යම්සේ; දුච්ඡන්නං, මනාකොට නොසොයනලද; අගාරං, ගෙය; වුට්ඨී, වෘෂ්ටිය; සමතිවිජ්ඣති, [සං අතිවිජ්ඣති,] හැමසෙයින් විදීද; (හැමපරිද්දෙන් තෙමාද යන අර්ථයි;) එවං, එපරිද්දෙන්ම; අභාවිතං චිත්තං, ලොකොත්තරභාවනාරහිතචිත්තය; රාගො, රාගය; සමතිවිජ්ඣති, මනාකොටම විදී.

(අ) එතස්මිං, මේ ඉන්ද්‍රියසංවරසීලය; සම්පාදිතෙ,-සැපයූකල්හි; පාතිමොක්ඛසංවරසීලම්පි,ප්‍රාතිමොක්ෂසංවරශීලය ද; අද්ධනියං හොති, අධ්වක්ෂමවේ; චිරට්ඨිතිකං [හොති], චිරස්ථිතික වෙ;(බොහෝකලක්

39 රූපෙසු සද්දෙසු අථො රසෙසු
ගන්ධෙසු ඵස්සෙසු ච රක්ඛ ඉන්ද්‍රියං
එතෙ හි ද්වාරා පිහිතා සුසංවුතා
න හනන්ති ගාමංව පරස්සහාරිනො.

40 යථාගාරං සුච්ඡන්නං වුට්ඨී න සමතිවිජ්ඣති
එවං සුභාවිතං චිත්තං රාගො න සමතිවිජ්ඣතීති

(අ) අයම්පන අති උක්කට්ඨදෙසනා චිත්තං නාමෙතං ලහුපරිවත්ති තස්මා උප්පන්නං රාගං අසුභමනසිකාරෙන විනොදෙත්වා ඉන්ද්‍රියසංවරෙ සම්පාදෙතබ්බො. අධුනා පබ්බජිතෙන වඞ්ගීසත්ථෙරෙන විය- ථෙරස්ස කිර අධුනා පබ්බජිතස්ස පිණ්ඩාය චරතො එකං ඉත්ථිං දිස්වා රාගො උප්පජ්ජි, තතො ආනන්දත්ථෙරං ආහ:-

41 කාමරාගෙන ඩය්හාමි චිත්තම්මෙ පරිඩය්හති
සාධු නිබ්බාපනං බ්‍රූහි අනුකම්පාය ගොතමාති.

---

පවතී;) සුසංවිහිත, මනාකොට කරනලද; සාඛාපරිවාරං, වැටඇති; සස්සං ඉව, ගොයමක් මෙනි; කිලෙසචොරෙහි, කෙලෙස්සොරුන් විසින්; අයං, මේ ප්‍රාතිමොක්ෂසංවරසීලය; න හඤ්ඤතෙ ච, නොපහරණ ලැබේමැයි; පරස්සහාරීහි, සොරුන් විසින්; සුසංවුතද්වාරො විය ගාමො, පියනලද දොරඇති ගමක් මෙනි; අස්ස, මොහුගෙ; චිත්තං, චිත්තය; රාගො, රාගයතෙමෙ; න සමතිවිජ්ඣති, හැමසෙයින්ම නොවිදුනෙ යි; සුච්ඡන්නමගාරං, මනාකොට සොයනලද ගෙයක්; වුට්ඨී විය, වැස්සක් මෙනි; එතං, මෙ; වුත්තම්පිච, කියනලදමැයි.

39-40. ("රූපෙසු" යනාදී දෙගයෙහි අර්ථකීනයට ප්‍රතිපක්ෂනයින් ගතයුතු.)

(අ) අයම්පන, සර්වාකාරයෙන් කෙලශයන්ගේ මේ අනුත්පාදය; අති උක්කට්ඨදෙසනා, ඉතා උත්කෘෂ්ටදෙශනාය; චිත්තං නාමෙතං, මෙ සිත නම්; ලහුපරිවත්ති; ලඝුපරිවෘත්ති ඇත්තේයි; තස්මා, එහෙයින්; උප්පන්නං රාගං, උපන්රාගය; අසුභමනසිකාරෙන, අසුභ මනසකාරවශයෙන්; විනොදෙත්වා, දුරුකොට; ඉන්ද්‍රියසංවරෙ, ඉන්ද්‍රිය සංවරය; සම්පාදෙතබ්බො, සැපවියයුතු; අධුනා පබ්බජිතෙන, අලුත මහණවූ; වඞ්ගීසත්ථෙරෙන විය, වඞ්ගීසතෙරුන් මෙනි; අධුනා පබ්බජිතස්ස, අලුත මහණවූ; පිණ්ඩාය චරතො, පිඬුසිඟන්නාවූ; ථෙරස්ස, තෙරුන්ට; එකං ඉත්ථිං දිස්වා, එක් මාගමක දැක; රාගො උප්පජ්ජි, රාගය උපනී; තතො, ඉක්බිත්තෙන්; ආනන්දත්ථෙරං, ආනන්දස්ථවිර යන්ට; ආහ, මෙසේ කී;

41. කාමරාගෙන, කාමරාගසඞ්ඛ්‍යාතගින්නෙන්; ඩය්හාමි, දැවෙමි; මෙ, මාගේ; චිත්තං, චිත්තය තෙමේ; පරිඩය්හති, හාත්පසින් දනලැබෙ; සාධු, ආරාධනා කෙරෙමි; ගොතම, ගොතමය; අනු

ථෙරෝ ආහ:—

42 සඤ්ඤාය විපරියෙසා චිත්තං තෙ පරිඩය්හති
නිමිත්තං පරිවජ්ජෙහි සුභං රාගූපසංහිතං.

43 අසුභාය චිත්තං භාවෙහි එකග්ගං සුසමාහිතං
සඞ්ඛාරෙ පරතො පස්ස දුක්ඛතො නො ච අත්තතො
නිබ්බාපෙහි මහාරාගං මා ඩය්හිත්ථො පුනප්පුනන්ති.

ථෙරෝ රාගං විනොදෙත්වාව පිණ්ඩාය චරි.

(ඇ) අපි ච ඉන්ද්‍රියසංවරපූරකෙන භික්ඛුනා කුරණ්ඩකමහාලෙණවාසී චිත්තගුත්තත්ථෙරෙන විය, චොරකමහාවිහාරවාසී මහාමිත්තත්ථෙරෙන විය ච භවිතබ්බං. කුරණ්ඩකලෙණෙ කිර සත්තන්නං බුද්ධානං අභිනික්ඛමණචිත්තකම්මං මනොරමං අහොසි. සම්බහුලා භික්ඛූ සෙනාසනචාරිකං ආහිණ්ඩන්තා චිත්තකම්මං දිස්වා මනොරමං භන්තෙ චිත්තකම්මන්ති ආහංසු.

---

කාම්පාය, අනුකම්පා පිණිස (ඒ රාගාග්නි); නිබ්බාපනං, නිවීාපනයට උපායක්; බෘහි, කියා;

ථෙරෝ, අනඳමහතෙරහු; ආහ, මෙසේ කීවු;

42. සඤ්ඤාය විපරියෙසා, අශුභයෙහි ශුභයයි ප්‍රවෘත්තසංඥා විපය්‍යාසහෙතුවෙන්; තෙ චිත්තං, තා සිත; පරිඩය්හති, දැයි; රාගූප සංහිතං, රාගොත්පත්තියට හෙතුවූ; සුභං නිමිත්තං, ශුභනිමිත්තය; පරිවජ්ජෙහි, දුරුකර; (මෙනෙහි නොකර;)

43. අසුභාය, අශුභ භාවනායෙහි; (අසුභාලම්බනයෙහිය යන අර්‍ථයි;) එකග්ගං, වික්ෂෙපාභාවයෙන් එකාග්‍රකොට; සුසමාහිතං, මනාකොට අර්පිතභාවයෙන් සුසමාහිතකොට; චිත්තං, තාගෙ සිත; භාවෙහි, වඩ; සඞ්ඛාරෙ, සියලු සංස්කාරයන්; පරතොපස්ස, අවිධෙය හෙයින් (පරහෙයින්) බල; දුක්ඛතො, (අනිත්‍ය බැවිනු ද උදයව්‍යයදෙකින් පෙළෙනබැවිනු ද) දුක්හෙයින් බල; නො ච අත්තතො, (අනාත්ම ස්වභාවහෙයින් ද ආත්මවිරහිත හෙයින් ද). අනාත්මහෙයින් බල; මහාරාගං, තුන්ලොව මැඩපවත්නා හෙයින් මහාවිෂය ඇති බැවින් මහාරාගය; නිබ්බාපෙහි, මගපිළිවෙළින් ගොස් රහත් මඟින් නිවාපිය; පුනප්පුන, දුන්මෙන් නැවත නැවත; මා ඩය්හිත්ථො, නගමක් දනලැබේ.

ථෙරෝ, වඞ්ගීස තෙරහු; රාගං විනොදෙත්වා, රාගය දුරුකොට; පිණ්ඩාය චරි, පිඬුපිණිස ගියෝ.

(ඇ) අපි ච, අනිකෙකු ද; ඉන්ද්‍රියසංවරපරිපූරකෙන භික්ඛුනා, ඉන්ද්‍රිය සංවර පූරණ මහණහුවිසින්; කුරණ්ඩකමහාලෙණවාසී, කරඬුමහලෙණ වසන; චිත්තගුත්තත්ථෙරෙන විය, චිත්තගුත්ත නම් තෙරුන් මෙන්; චොරකමහාවිහාරවාසී, චොරකනම් මහ වෙහෙර වසන; මහාමිත්තත්ථෙරෙන විය ච, මහාමිත්තනම් තෙරුන් මෙන් ද; භවිතබ්බං,

(අ) ථෙරො ආහ:- අතිරෙකසට්ඨිමෙ ආවුසො වස්සානි ලෙණෙ වසන්තස්ස චිත්තකම්මං අත්ථීති පි න ජානාමි, අජ්ජ දානි චක්ඛුමන්තෙ නිස්සාය ඤාතන්ති. ථෙරෙන කිර එත්තකං අද්ධානං වසන්තෙන චක්ඛුං උම්මීලෙත්වා ලෙණං න උල්ලොකිතපුබ්බං. ලෙණද්වාරෙ චස්ස මහානාගරුක්ඛො පි අහොසි. සොපි ථෙරෙන උද්ධං න උල්ලොකිතපුබ්බො, අනුසංවච්ඡරං භූමියං කෙසරනිපාතං දිස්වා වෙතස්ස පුප්ඵිතභාවං ජානාති. රාජා ථෙරස්ස ගුණසම්පත්තිං සුත්වා වන්දිතුකාමො තික්ඛත්තුං පෙසෙත්වා අනාගච්ඡන්තෙ ථෙරෙ තස්මිං ගාමෙ තරුණපුත්තානං ඉත්ථීනං ථනෙ බන්ධාපෙත්වා ලඤ්ඡා පෙසි:- තාව දාරකා ථඤ්ඤං මා ලභිංසු යාව ථෙරො ආගච්ඡතීති ථෙරො දාරකානං අනුකම්පාය මහාගාමං අගමාසි. රාජා සුත්වා ගච්ඡථ භණෙ ථෙරං පවෙසෙථ සීලානි ගණ්හිස්සාමීති අන්තෙපුරං අභිහරාපෙත්වා වන්දිත්වා භොජෙත්වා අජ්ජ භන්තෙ ඔකාසො නත්ථි සෙව සීලානි ගණ්හිස්සාමීති ථෙරස්ස පත්තං ගහෙත්වා ථොකං අනුගන්ත්වා

---

වියපුතු; කුරණ්ඩකලෙණෙ කිර, කරඬුලෙණ; සත්තන්නං බුද්ධානං, විපස්සිය සිඛිය වෙස්සභූය කකුසන්ධය කොණාගමනය කස්සපය ගොතමය යන සප්තබුද්ධයන්ගේ; අභිනික්ඛමණචිත්තකම්මං, මහබිනික්මන් සිතියම්; මනොහරං[1] අහොසි, මනහර වී; සම්බහුලා භික්ඛූ, බොහෝ භික්ෂූහු; සෙනාසනචාරිකං ආහිණ්ඩන්තා, සයනාසන චාරිකාව කරන්නාහු; (සෙනස්නෙන් සෙනස්නට නොයෙක් විසිතුරු බලා ඇවිදිනාහු;) චිත්තකම්මං දිස්වා, සිතියම් දැක; භන්තෙ, වහන්ස; චිත්තකම්මං, සිතියම්; මනොහරන්ති[1] ආහංසු, මනහරයයි කිවූ;

(අ) ථෙරො, තෙරහු; ආහ, මෙසේකිවූ; ආවුසො, ඇවැත්නි; ලෙණෙ, මේ ලෙණ; වසන්තස්ස මෙ, වසන්නාවූ මට; අතිරෙකසට්ඨිවස්සානි, සැට අවුරුද්දකට වැඩියෙක; චිත්තකම්මං අත්ථීතිපි න ජානාමි, විසිතුරු සිතියම් ඇතැයි ද නොදනිමි; අජ්ජ දානි, දැන් අද; චක්ඛුමන්තෙ නිස්සාය, ඇස් ඇත්තවුන් නිසා; ඤාතන්ති, දන්නාලදැයි; ථෙරෙන කිර, තෙරුන් විසින්; එත්තකං අද්ධානං වසන්තෙන, මෙතෙක් කල් වසනුවන් විසින්; චක්ඛුං උම්මීලෙත්වා න උල්ලොකිතපුබ්බං, හැමතැනම යුගමාත්‍රදර්ශීබැවින් ඇස දල්වා උඩ නොබලනලද විරී; අස්ස, ඒ තෙරුන්ගේ; ලෙණද්වාරෙ, ලෙණදොර; මහානාගරුක්ඛොපි අහොසි, මහ නාරුකෙක්ද වී; සොපි, ඒ නාරුක ද; ථෙරෙන, තෙරුන්විසින්; උද්ධං, උඩ; න උල්ලොකිතපුබ්බං, ඇසදල්වා නොබලනලද විරී; අනුසංවච්ඡරං, හවුරුදුපතා; භූමියං, බිම; කෙසරනිපාතං දිස්වාව, වගුළ කෙසරු දැකම; එතස්ස, ඒ රුක; පුප්ඵිතභාවං, පිපුණුබව; ජානාති, දනිත්; රාජා, මාගම වසන රජතෙමෙ; ථෙරස්ස, තෙරුන්ගේ; ගුණසම්පත්තිං සුත්වා, ගුණසම්පත්ති අසා; වන්දිතුකාමො, වඳිනු කැමති

---

1. මනොරමං-පෙළ.

දෙවියා සද්ධිං වන්දිත්වා තිට්ඨන්ති. ථෙරො රාජා වා වන්දතු දෙවී වා සුඛී හොතු මහාරාජාති වදති. එවං සත්තදිවසා ගතා, භික්ඛූ ආහංසු:- කිං භන්තෙ තුම්හෙ රඤ්ඤොපි වන්දමානෙ දෙවියාපි වන්දමානාය "සුඛීහොතු මහාරාජා"ඉච්චෙව[1] වදථාති ථෙරො නාහං ආවුසො රාජා ති වා දෙවී ති වා වවත්ථානං කරොමී ති වත්වා සත්තාහාතික්කමෙ ථෙරස්ස ඉධ වාසො දුක්ඛොති රඤ්ඤා විස්සජ්ජිතො කුරණ්ඩකමහාලෙණං ගන්ත්වා රත්තිභාගෙ චඞ්කමං අභිරුහි. නාගරුක්ඛෙ අධිවත්ථා දෙවතා දණ්ඩදීපිකං ගහෙත්වා අට්ඨාසි, අථස්ස කම්මට්ඨානං අතිපරිසුද්ධං පාකටං අහොසි. ථෙරො කින්නුඛො මෙ අජ්ජ කම්මට්ඨානං අතිවිය පකාසතීති අත්තමනො මජ්ඣිමයාමසමනන්තරං සකලපබ්බතං උන්නාදයන්තො අරහත්තං පාපුණි. තස්මා අඤ්ඤොපි අත්තකාමො කුලපුත්තො.

---

වූයේ; තික්ඛත්තුං පෙසෙත්වා, තුන්වරෙක යවා; අනාගච්ඡන්තෙ ථෙරෙ, තෙරුන් නොඑන කල්හි; තස්මිං ගාමෙ, එම මහගම; තරුණපුත්තානං, කිරිබොන දරුවන්ඇති; ඉත්ථීනං, ගෑනුන්ගේ; ථනෙ බන්ධාපෙත්වා, තන පටින් බඳවා; ලඤ්ජාපෙසි, රාජමුද්‍රිකා වෙන් ගස් එබවී; (කුම්පිණිසයත්?) යාව ථෙරො ආගච්ඡති, යම්තාක් තෙරහු එත්ද; තාව, ඒතාක්; දාරකා, දරුවෝ; ථඤ්ඤං මාලභිංසු ඉති, කිරි නොලබත්වයි කියායි; ථෙරො, තෙරහු; දාරකානං අනුකම්පාය, දරුවන්ට අනුකම්පාපිණිස; මහාගාමං අගමාසි, මහගමට ගියෝ; රාජා, රජතෙම; (තං) සුත්වා, තෙරුන් වැඩිබව අසා; භණෙ, කොල; ගච්ඡථ, යව; ථෙරං, තෙරුන්; පවෙසථ, වඩා එව; සීලානි ගණ්හිස්සාමීති, තෙරුන් කෙරෙහි සිල් ගණිමි යි; අන්තෙපුරං, රජගෙට; අභිහරාපෙත්වා, වඩාගෙන්වා; වන්දිත්වා, වැඳ; භොජෙත්වා, වළඳවා; අජ්ජ, අද; භන්තෙ, වහන්ස; ඔකාසො නත්ථි, අවකාශ නැත; සෙව සීලානි ගණ්හිස්සාමීති, (නැවත දක්නැවිච) සෙට සිල් ගණිමි යි; ථෙරස්ස, තෙරුන්ගේ; පත්තං ගහෙත්වා, පාත්‍රය ගෙන; ථොකං, මදක්; අනුගන්ත්වා, පසුගමන් කොට; දෙවියා සද්ධිං වන්දිත්වා, දෙවීන් හා සමග වැඳ; තිට්ඨන්ති, වළකී; ථෙරො, තෙරහු; රාජා වන්දතු, රජ වඳිවයි; දෙවීවා වන්දතු, දෙවී වඳිවයි; මහාරාජ, මහරජ; සුඛීහොතු, සුවපත් වේවයි; වදති, කියත්. එවං, මෙසේ; සත්තදිවසා, සත්දවස්හු; ගතා, ඉක්මුණාහ; භික්ඛූ, භික්ෂූහු; ආහංසු, (තෙරුන්ට මෙසේ) කිවූ; භන්තෙ, වහන්ස; තුම්හෙ, තෙපි; රඤ්ඤොපි වන්දමානෙ, රජහු වඳනාකල්හි දු; දෙවියා පි වන්දමානාය, දෙවීන් වඳනාකල්හි දු; සුඛීහොතු මහාරාජාතිච්චෙව, මහරජ සුවපත්වේවයිම; කිං වදථාති, කුමක්හෙයින්ම කියාදැයි; ථෙරො, තෙරහු; ආවුසො, ඇවැත්නි; අහං, මම; රාජාතිවා, රජයයි දු; දෙවීතිවා, දෙවීයයි දු; වවත්ථානං නකරොමීති, නියම නොකරමි යි; වත්වා, කියා; සත්තාහාතික්කමෙ,

---

1. මහාරාජාති එවං-ත්‍රි. මු.

44 මක්කටො ච අරඤ්ඤම්හි වනෙ භන්තමිගො විය
බාලො විය ච උත්‍රස්තො න භවෙ ලොලලොචනො.

45 අධො ඛිපෙය්‍ය චක්ඛූනි යුගමත්තදසො සියා
වනමක්කටලොලස්ස න චිත්තස්ස වසං වජෙ.

(අ) මහාමිත්තත්ථෙරස්සාපි මාතු විසගණ්ඩරොගො උප්පජ්ජි, ධීතාපිස්සා භික්ඛුනීසු පබ්බජිතා හොති. සා තං ආහ “ආගච්ඡ[1] අය්‍යෙ භාතු සන්තිකං ගන්ත්වා මම අඵාසුභාවං ආරොචෙත්වා භෙසජ්ජං ආහරා”ති. සා ගන්ත්වා ආරොචෙසි ථෙරො නාහං මූලභෙසජ්ජාදීනි සංහරිත්වා භෙසජ්ජං පචිතුං ජානාමි, අපි ච තෙ භෙසජ්ජං ආචික්ඛිස්සං

සත්දවසක් ඉක්මුණුකල්හි; ථෙරස්ස, තෙරුන්ට; ඉධ වාසො දුක්ඛොති, මිහිවිසීම දුකැයි; රක්ඛ විස්සජ්ජිතො, රජහු විසින් හරණ ලද්දේ; කුරණ්ඩකමහාලෙණං ගන්ත්වා, කරඬුමහලෙණට ගොස්; රත්තිභාගෙ, රාත්‍රිභාගයෙහි; චඞ්කමං අභිරුහි, සක්මණට නැග; නාගරුක්ඛෙ අධිවත්ථා දෙවතා, නාරුක වසන දෙවතාතොමෝ; දණ්ඩදීපිකං ගහෙත්වා, තෙරුන්ගේ සීලය සුපරිසුද්ධසේ දැක දඬුවැටපහණක් ගෙන අට්ඨාසි, සිටියා; අථ, ඉක්බිත්තෙන්; අස්ස, ඒ තෙරුන්ට; කම්මට්ඨානං, කමටහන්; අතිපරිසුද්ධං, ඉතා පිරිසුදුව; පාකටං අහොසි, ප්‍රකට වී; ථෙරො, තෙරහු; අජ්ජ, අද; මෙ, මට; කම්මට්ඨානං, කමට හන; අතිවිය, අතිශයින්ම; පකාසති, ප්‍රකාශවෙයි; කින්නු ඉති, කිම හෝයි; අත්තමනො, සතුටුව; මජ්ඣිමයාමසමනන්තරං, මධ්‍යමයාමාව සානයෙහි; සකලපබ්බතං, සියලු පර්වතය; උන්නාදයන්තො, පෘථිවිකම්පායෙන් නාදකරවමින්; (එහි වසන දෙවියන්ගේ සාධුකාරශබ්දයෙන්ම;) අරහත්තං පාපුණි, රහත්ඵලයට පැමිණිය; තස්මා, එහෙයින්; අත්තකාමො, තමහට වැඩකැමැති; අඤ්ඤොපි කුලපුත්තො, අනික් කුලපුතෙකු ද (“ලොලලොචනො න භවෙ”යි යොදනු.)

44. අරඤ්ඤෙ, වල්හි; මක්කටොව, වානරයෙකුමෙන්ද; වනෙ, වනයෙහි; භන්තමිගො විය, භ්‍රාන්තමෘගයක්හු මෙන් ද; බාලො විය ච උත්‍රස්තො, ඥාතිවියොගයෙන් සන්ත්‍රස්තවූ තරුණ දරකයෙකුමෙන්ද; ලොලලොචනො, ලොල්වූ නෙත්‍ර ඇත්තේ; න භවෙ, නොවන්නේයි.

45. චක්ඛූනි, නෙත්‍රයන්; අධො, යට; ඛිපෙය්‍ය, හෙලන්නේය; යුගමත්තදසො සියා, වියදඬු පමණක්ම බලන්නේයි; වනමක්කටලොලස්ස, වනමක්කටයෙකුමෙන් ලොල්වූ; චිත්තස්ස, චිත්තයාගේ; වසං, වසඟයට; න වජෙ, නොපැමිණෙන්නේයි.

(අ) මහාමිත්තත්ථෙරස්සාපි, මහාමිත්ත නම් ස්ථවිරයන්ගේ ද; මාතු [උපාසිකාය], මවු උපාසිකාවන්ට; විසගණ්ඩරොගො උප්පජ්ජි, තනාල් රොගයෙක්වී;[2] අස්සා, ඒ උපාසිකාවන්ගේ; ධීතාපි, දුවණියෝ ද; භික්ඛුනීසු, මෙහෙනින්නන්කෙරෙහි; පබ්බජිතා හොති, මහණවූ;

1. ගච්ඡ-ත්‍රි. මූ. 2. නාළිරොගයෙක්-මූ. ස.

අහං යතො පබ්බජිතො න මයා ලොභසහගතෙන චිත්තෙන ඉන්ද්‍රියානි භින්දිත්වා විසභාගරූපං ඔලොකිතපුබ්බං, ඉමිනා සච්චවචනෙන මාතුයා මෙ ඵාසු හොතු, ගච්ඡ ඉදං වත්වා උපාසිකාය සරීරං පරිමජ්ජාහීති. සා ගන්ත්වා ඉමමත්ථං ආරොචෙත්වා තථා අකාසි, උපාසිකාය තං ඛණංයෙව ගණ්ඩො ඵෙණපිණ්ඩො විය විලීයිත්වා අන්තරධායි. සා උට්ඨහිත්වා සචෙ සම්මාසම්බුද්ධො ධරෙය්‍ය කස්මා මම පුත්තසදිසස්ස භික්ඛුනො ජාලවිච්ඡිත්තෙන හත්ථෙන සීසං න පරාමසෙය්‍යාති අත්තමනවාචං නිච්ඡාරෙසි. තස්මා:-

46 කුලපුත්තමානී අඤ්ඤොපි පබ්බජිත්වාන සාසනෙ
මිත්තත්ථෙරො ව තිට්ඨෙය්‍ය වරෙ ඉන්ද්‍රියසංවරෙ.

---

සා, ඒ උපාසිකාතොමෝ; තං, ඒ මෙහෙණට; ආහ, මෙසෙ කීවු; අය්‍යෙ, ආය්‍යාව; ආගච්ඡ, මෙසේ එව; භාතු සන්තිකං ගන්ත්වා, තොප බෑණන් සමීපයට ගොස්; මම අඵාසුභාවං, මා රොගිබව; ආරොචෙත්වා, කියා; භෙසජ්ජං ආහරාති, බෙහෙත් ගෙනෙවයි; සා, ඒ මෙහෙණ; ගන්ත්වා, ගොසින්; ආරොචෙසි, බෑණන්ට කීවු; ථෙරො, තෙරහු; අහං, මම; මූලභෙසජ්ජාදීනි, මුල්බෙහෙත් ආදීන්; සංහරිත්වා, රැස්කොට; භෙසජ්ජං පචිතුං, බෙහෙත් පිසනසේ; න ජානාමි, නොදනිමි; අපි ච, එතකුදුවුවත්; තෙ, නිට; භෙසජ්ජං, බෙහෙදක්; ආචික්ඛිස්සං, කියමි; අහං, මම; යතො පට්ඨාය පබ්බජිතො, ("තතොපට්ඨාය" සි යොදනු.) යම් තැනෙක පටන් පැවිදිවීම් ද එතැන්පටන්; මයා, මාවිසින්; ලොභසහගතෙන චිත්තෙන, ලොභසහගියාවූ සිතින්; ඉන්ද්‍රියානි භින්දිත්වා, ඉන්ද්‍රියසංවරශීලය බිඳ; (ඉන්ද්‍රියසංවරශීලය බුන්කල්හි ඉන්ද්‍රියයෝත් ආරක්‍ෂාභාවයෙන් භින්නනම් වෙත්. නොහොත්: නිමිත්තානුබ්‍යඤ්ජන ග්‍රාහයටවාරවූ ඉන්ද්‍රියයෝම භින්නවෙත්.) න ඔලොකිතපුබ්බං, නොබලනලදවිරී; ඉමිනා සච්චවචනෙන, මේ සත්‍යවචනයෙන්; මෙ, මාගේ; මාතුයා, මවු උපාසිකාවන්ට; ඵාසු හොතු, ඵාසුවේවා; ගච්ඡ, යා; ඉදං වත්වා, මෙ කියා; උපාසිකාය සරීරං, උපාසිකාවන් සිරුරු; පරිමජ්ජාහීති, පිරිමද යි කී; සා, ඒ මෙහෙණ; ගන්ත්වා, ගොස්; ඉමමත්ථං ආරොචෙත්වා, මෙ පවත් කියා; තථා අකාසි, එසේම කළා; උපාසිකාය, උපාසිකාවන්ගේ; තං ඛණං යෙව, එකෙණෙහිම; ගණ්ඩො, ගඬ; ඵෙණපිණ්ඩො විය, පෙණපිඬක්මෙන්; විලීයිත්වා, වීරී; අන්තරධායි, අතුරුධන්වී; සා [උපාසිකා] උට්ඨහිත්වා, ඒ උපාසිකාව නැගීසිට; සචෙ, ඉදින්; සම්මාසම්බුද්ධො, සම්‍යක්සම්බුද්ධතෙමෙ; ධරෙය්‍ය, ජීවත්වේනම්; කස්මා, කුමක්හෙයින්; මම පුත්තසදිසස්ස භික්ඛුනො, මපුතුන්වැනි භික්‍ෂූන්ගේ; සීසං, හිස; ජාලවිච්ඡිත්තෙන හත්ථෙන, ජාලලක්‍ෂණයෙන් විචිත්‍රහස්තයෙන්; න පරාමසෙය්‍යාති, නොපිරිමදනේදැයි; අත්තමනවාචං, සතුටුතෙපුල්; නිච්ඡාරෙසි, නික්මවූ; තස්මා, එහෙයින්;-

46. කුලපුත්තමානී, කුලපුත්‍රයෙමි යන මන්ඇති; අඤ්ඤොපි, අනිකෙකු ද; සාසනෙ, සස්නෙහි; පබ්බජිත්වාන, පැවිදිව; මිත්තත්ථෙරොව, මිත්තනම් තෙරුන්මෙන්; වරෙ, උතුම්වූ; ඉන්ද්‍රියසංවරෙ, ඉන්ද්‍රියසංවරයෙහි; තිට්ඨෙය්‍ය, සිටුනේයි.

(ඇ) යථා පන ඉන්ද්‍රියසංවරො සතියා, තථා විරියෙන ආජීවපාරිසුද්ධි සම්පාදෙතබ්බා. විරියසාධනා හි සා, සම්මා ආරද්ධවිරියස්ස මිච්ඡාජීවප්පහාණසම්භවතො. තස්මා අනෙසනං අප්පතිරූපං පහාය විරියෙන පිණ්ඩපාතචරියාදීහි සම්මා එසනාහි එසා සම්පාදෙතබ්බා, පරිසුද්ධුප්පාදෙ යෙව පච්චයෙ පටිසෙවමානෙන අපරිසුද්ධුප්පාදෙ ආසීවිසෙ විය පරිවජ්ජයතා. තත්ථ අපරිග්ගහිත ධුතඞ්ගස්ස සඞ්ඝතො ගණතො ධම්මදෙසනාදීහි චස්ස ගුණෙහි පසන්නානං ගිහීනං සන්තිකා උප්පන්නපච්චයා පරිසුද්ධුප්පාදා නාම. පිණ්ඩපාතචරියාදීහි පන අතිපරිසුද්ධුප්පාදා යෙව. පරිග්ගහිතධුතඞ්ගස්ස පිණ්ඩපාතචරියාදීහි ධුතඞ්ගගුණෙ චස්ස පසන්නානං සන්තිකා ධුතඞ්ගනියමානුලොමෙන උප්පන්නා පරිසුද්ධුප්පාදා නාම. එකබ්‍යාධිවූපසමත්ථඤ්චස්ස පූතිහරීටක චතුමධුරෙසු උප්පන්නෙසු චතුමධුරං අඤ්ඤෙපි සබ්‍රහ්මචාරිනො

---

(ඇ) යථා, යම්සේ; ඉන්ද්‍රියසංවරො, ඉන්ද්‍රියසංවරය තෙමේ; සතියා, ස්මෘතියෙන් සැධියයුතුවේ ද; තථා, එසේම; ආජීවපාරිසුද්ධි, ආජීව පාරිශුද්ධි තොමෝ; විරියෙන සම්පාදෙතබ්බා, වීර්‍යයෙන් සැපවිය යුතුයි; සා, හෙ තොමෝ; විරියසාධනා හි, වීර්‍යසාධන කොට ඇත් තීයි; සම්මා ආරද්ධවිරියස්ස, මනාකොට ආරබ්ධවූ වීර්‍ය ඇත්තහුට; මිච්ඡාජීවප්පහානසම්භවතො, මිථ්‍යාජීවප්‍රහාණසම්භව වන හෙයිනි; තස්මා, එහෙයින්; අප්පතිරූපං, ශාස්තෘශාසනයට නොසුදුසුවූ; අනෙසනං, අයුක්තානෙවෂණය; පහාය, දුරුකොට; නොහොත්: අනෙසනං, අයුක්තානෙවෂණය ද; අප්පතිරූපං, සල්ලෙඛවිකොපනය කරන ප්‍රතිපත්ති ද; පහාය, දුරුකොට; ("අනෙසනඤ්ච අප්පතිරූපඤ්ච පහාය" යන අර්ථයි.) විරියෙන, වීර්‍යයෙන්; පිණ්ඩපාතචරියාදීහි, පිඬු සිඟීම් ආදිවූ; සම්මා එසනාහි, සම්‍යක් පර්‍යෙෂණයෙන්; එසා, මේ ආජීවපාරිසුද්ධි තොමෝ; සම්පාදෙතබ්බා, සැපවියයුතුයි; (ආදිග්‍රහණින් මිත්‍රසුහෘත්පාංශුකූලචරියාදීන්ගේ සඞ්ග්‍රහය දතයුතු.) පරිසුද්ධුප්පාදෙ යෙවපච්චයෙ, පරිසුද්ධොත්පත්තිඇති ප්‍රත්‍යයන්; පටිසෙවමානෙන, සෙවුනහුවිසින්; අපරිසුද්ධුප්පාදෙ, අපරිසුද්ධොත්පත්තිඇති ප්‍රත්‍යයන්; ආසීවිසෙ විය, ආශීවිෂයන් මෙන්; පරිවජ්ජයතා, දුරුකරන්නහු විසින්; ("එසා සම්පාදෙතබ්බා"යි ඇර යොදනු.) තත්ථ, එහි; අපරිග්ගහිත ධුතඞ්ගස්ස; ධුතාඞ්ගසමාදන් නොවූ මහණහට; සඞ්ඝතො, සඞ්ඝයා කෙරෙන්; ගණතො, සෞත්‍රාන්තිකාදී ගණයා කෙරෙන් ද; අස්ස, මොහුගේ; ධම්මදෙසනාදීහි ගුණෙහි ච, ධර්මදෙශනාදිවූ ගුණෙන්; පසන්නානං ගිහීනං, ප්‍රසන්නවූ ගෘහීන්ගෙ; සන්තිකා උප්පන්න පච්චයා, සමීපයෙන් උපන් ප්‍රත්‍යයෝ; පරිසුද්ධුප්පාදා නාම, පිරිසුදුවූ උපැත් ඇත්තා නම් වෙත්; පිණ්ඩපාතචරියාදීහි පන, පිණ්ඩපාතචර්‍යා දීන්ගෙන් වනාහි; අතිපරිසුද්ධුප්පාදා යෙව, අතිපරිසුද්ධ උපැත් ඇත්තාහු මැයි; පරිග්ගහිතධුතඞ්ගස්ස; සමාදන්වනලද ධුතාඞ්ග ඇත්තාහට; පිණ්ඩපාතචරියාදීහි, පිණ්ඩපාතචර්‍යාදියෙන් ද; අස්ස, මොහුගෙ;

පරිභුඤ්ජිස්සන්තීති චින්තෙන්තා හරීටකඛණ්ඩමෙව පරිභුඤ්ජමානස්ස ධුතඞ්ගසමාදානං පතිරූපං හොතීති එසහි උත්තමඅරියවංසිකො භික්ඛූති වුච්චති. යෙ පනෙතෙ චීවරාදයො පච්චයා තෙසු යස්ස කස්සචි භික්ඛුනො ආජීවං පරිසොධෙන්තස්ස චීවරෙ ච පිණ්ඩපාතෙ ච නිමිත්තොභාසපරිකථා විඤ්ඤත්තියො නවට්ටන්ති. සෙනාසනෙ පන අපරිග්ගහිතධුතඞ්ගස්ස නිමිත්තොභාසපරිකථා වට්ටන්ති.

(අ)තත්ථ නිමිත්තං නාම:-සෙනාසනත්ථං භූමිපරිකම්මාදීනි කරොන්තස්ස කිං භන්තෙ කයිරති කො කාරාපෙතීති ගිහීහි වුත්තෙ න කොචීති පටිවචනං, යං වා පනඤ්ඤම්පි එවරූපං නිමිත්තකම්මං. ඔභාසො නාම:- උපාසකා තුම්හෙ කුහිං වසථාති. පාසාදෙ භන්තෙති. භික්ඛූනං පන උපාසකා පාසාදො නවට්ටතීති වචනං, යං වා පනඤ්ඤම්පි එවරූපං

ධුතගුණෙ පසන්නානං, ධුතගුණෙහි ප්‍රසන්නයන්ගේ; සන්තිකා, සමීපයෙන්; ධුතඞ්ගනියමානුලොමෙන, ධුතඞ්ගනියමයට අනුලොම වශයෙන්; උප්පන්නා, උපන්පසයෝ; පරිසුද්ධුප්පාදා, පිරිසුදුවූ උපැත් ඇත්තානම්වෙත්; එකබ්‍යාධිවූපසමත්ථං, එක්ව්‍යාධියක් සංසිඳුවන පිණිස; අස්ස, මොහට; පූතිහරීටක, පූතිමූත්‍රපරිභාවිතවූ නොහොත් පූතිභාවයෙන් හරණලද අරළුහා; චතුමධුරෙසු උප්පන්නෙසු, චතුමධුර උපන්කල්හි; චතුමධුරං, චතුමධුරය; අඤ්ඤෙපි සබ්‍රහ්මචාරිනො, සෙසු සබ්‍රම්සරහු දු; පරිභුඤ්ජිස්සන්තීති, අනුභවකෙරෙති යි; චින්තෙන්තා, සිතා; හරීටකඛණ්ඩමෙව පරිභුඤ්ජමානස්ස, අරළුකඩම වළඳන්නහුට; ධුතඞ්ගසමාදානං, ධුතාඞ්ගසමාදන්වීම; පතිරූපං හොති, සුදුසු වෙ; එසහි, මෙතෙම; උත්තම අරියවංසිකො භික්ඛූති, උතුම් ආයසීවංශඇති මහණයයි; වුච්චති, කියනුලැබේ; යෙ පනෙතෙ, යම් මේ; චීවරාදයො පච්චයා, චීවරාදි ප්‍රත්‍යයකෙනෙක් ඇද්ද; තෙසු, ඔවුන්කෙරෙහි; ආජීවං පරිසොධෙන්තස්ස, ආජීව පිරිසුදු කරන්නාවූ; යස්ස කස්සචි භික්ඛුනො, ධුතාඞ්ග ඇතිනැති යම් කවර මහණෙක්හට; චීවරෙ ච, සිවුරෙහි ද; පිණ්ඩපාතෙ ච, පිණ්ඩපාතයෙහි ද; නිමිත්තොභාසපරිකථාවිඤ්ඤත්තියො, නිමිත්තය අවභාසය පරිකථාය විඥප්තිය යන මොහු; නවට්ටන්ති, නොවටිත්; [[1]සෙනාසනෙ පන, සෙනස්නෙහි වනාහි; අපරිග්ගහිතධුතඞ්ගස්ස, ධුතාඞ්ගනොගත් මහණහට; නිමිත්තොභාසපරිකථා වට්ටන්ති, නිමිත්තය ඔභාසය පරිකථාය යන මොහු වටිත්]

(අ) තත්ථ, එහි; නිමිත්තං නාම, නිමිත්තනම්; සෙනාසනත්ථං, සෙනසුන්පිණිස; භූමිපරිකම්මාදීනි කරොන්තස්ස, භූමිපරිකර්මාදීන් කරන්නහුට; කිං භන්තෙ කයිරති, වහන්ස කුමක්කරනු ලැබෙ ද; කො කාරාපෙතීති, කවරෙක් කරවාදැයි; ගිහීහි වුත්තෙ, ගෘහීන්විසින් කීකල; න කොචීතිපටිවචනං, කිසිවෙක් නොවෙයි කීමයි; යං වා පනඤ්ඤම්පි එවරූපං නිමිත්තකම්මං, යම් අනික් මෙබඳු නිමිත්තකර්මයෙක් ඇද්ද;

1. රේඛාඞ්කිත කොටස අත්පොතක හිබී මෙහි යෙදීමු.

ඔභාසකම්මං. පරිකථා නාම:- භික්ඛුසඞ්ඝස්ස සෙනාසනං සම්බාධන්ති වචනං, යා වා පනඤ්ඤාපි [1] එවරූපා පරියායකථා. භෙසජ්ජෙ සබ්බම්පි වට්ටති. තථා උප්පන්නං පන භෙසජ්ජං රොගෙ වූපසන්තෙ පරිභුඤ්ජිතුං න වට්ටති [2] තත්‍ථ විනයධරා භගවතා ද්වාරං දින්නං, තස්මා වට්ටතීති වදන්ති; සුත්තන්තිකා පන කිඤ්චාපි ආපත්ති න හොති ආජීවම්පන කොපෙති, තස්මා න වට්ටතියෙවාති වදන්ති.

(අ) යො පන භගවතා අනුඤ්ඤාතාපි නිමිත්තොභාසපරිකථාවිඤ්ඤත්තියො අකරොන්තො අප්පිච්ඡතාදිගුණෙයෙව නිස්සාය ජීවිතක්ඛයෙපි පච්චුපට්ඨිතෙ අඤ්ඤත්‍රෙව ඔභාසාදීහි උප්පන්නෙ පච්චයෙ පටිසෙවති, එස පරමසල්ලෙඛවුත්තීති වුච්චති. සෙය්‍යථාපි ථෙරො

---

(හේ නිමිත්තකම්ම නම;) ඔභාසො නාම, අවභාස නම්; උපාසකා, උපාසක වරිනි; තුම්හෙ කුහිං වසථාති, තොපි කොයි වසාද; පාසාදෙ භන්තෙති, වහන්ස ප්‍රාසාදයෙහි වසමු; භික්ඛූනං පන උපාසකා පාසාදො න වට්ටතීති; උපාසකවරිනි භික්ෂූන්ට පහා නොවටීදැයි;-යං වා පනඤ්ඤම්පි එවරූපං ඔභාසකම්මං, යම් අනික් මෙබඳුවූ අවභාෂකම්මයෙක් ඇද්ද; (හේ ඔභාස නම;) පරිකථා නාම, පරිකථා නම්; භික්ඛුසඞ්ඝස්ස සෙනාසනං සම්බාධන්ති වචනං, භික්ෂුසඞ්ඝයහට සෙනසුන් ගහටයයි කීමයි; යා වා පනඤ්ඤාපි එවරූපා පරියායකථා, යම් අනික් මෙබඳු පර්‍ය්‍යාය කථාවක් ඇද්ද; (හෝ පරියායකථා නම;) භෙසජ්ජෙ, බෙහෙත් පසයෙහි; සබ්බම්පි වට්ටති, සියල්ලමවටී; තථා උප්පන්නම්පන භෙසජ්ජං, මෙසේ නිමිත්ත ඔභාසාදීන් උපන් බෙහෙත් වනාහි; රොගෙ වූපසන්තෙ, රෝගය සන්හුන්කල්හි; පරිභුඤ්ජිතුං නවට්ටති, වළඳන්නට නොවටී; තත්‍ථ, එහි; විනයධරා, විනයධරයෝ; භගවතා, භගවත්හුවිසින්; ද්වාරං දින්නං, රෝගශීඝ්‍රියෙන් වළඳන්නට දොර දෙනලද; තස්මා, එහෙයින්; වට්ටතීති වදන්ති, (රෝගනැතිකල්හිදු වළඳන්නට) වටිති යි යෙත්; සුත්තන්තිකා පන, සෞත්‍රාන්තිකයෝ වනාහි; කිඤ්චාපි, කිසිසේත්; ආපත්ති නහොති, ඇවැත්නොවෙයි; ආජීවම්පන කොපෙති, ආජීවවනාහි කොපවා; (සලේපිළිවෙත්හි සිටිය හට සලේපැවතුම් කොපවයි යන අභිප්‍රායි.) තස්මා, එහෙයින්; නවට්ටතියෙවාති වදන්ති, නොවටී සීම යෙත්; (ආජීවම්පන කොපෙති යනු යෙන්ම-සෙනසුන්පිළිබැඳි ධුතාඞ්ගධරයහට නිමිත්තාදීහු නොවටිතියි යෙත්. සමහර සෙසු ධුතාඞ්ගධරය හටද නොවටිතියිම යෙත්.)

(අ) යො පන, යමෙක් වනාහි; භගවතා අනුඤ්ඤාතාපි, භගවත්හු විසින් අනුඥාතවූද; නිමිත්තොභාසපරිකථාවිඤ්ඤත්තියො, නිමිත්ත ඔභාසපරිකථාවිඥප්තීන්; අකරොන්තො, තමහට අනුඥාතවිෂයෙහි දු නොකරන්නේ; අප්පිච්ඡතාදිගුණෙයෙව නිස්සාය, අපිස්ආදි ගුණයන්ම

---

1. යං වා පනඤ්ඤම්පි-ඇතැම්. 2. වට්ටති න වට්ටති-ත්‍රි.මූ.

**සාරිපුත්තො:**-සො කිරායස්මා එකස්මිං සමයෙ පවිවෙකං බ්‍රෑහයමානො මහාමොග්ගල්ලානත්ථෙරෙන සද්ධිං අඤ්ඤතරස්මිං අරඤ්ඤෙ විහරති. අථස්ස එකස්මිං දිවසෙ උදරවාතාබාධො උප්පජ්ජිත්වා අතිදුක්ඛං ජනෙසි. මහාමොග්ගල්ලානත්ථෙරො සායණ්හසමයෙ තස්සායස්මතො උපට්ඨානං ගතො. ථෙරං නිපන්නං දිස්වා තං පවත්තිං පුච්ඡිත්වා පුබ්බෙ තෙ ආවුසො කෙන ඵාසු හොතීති පුච්ඡි. ථෙරො ආහ ගිහිකාලෙ මෙ ආවුසො මාතා සප්පිමධුසක්කරාදීහි යොජෙත්වා අසම්භින්නඛීරපායාසං අදාසි, තෙන ඵාසුකං අහොසීති. සොපි ආයස්මා:-හොතු ආවුසො සචෙ මය්හං වා තුය්හං වා පුඤ්ඤං අත්ථි අප්පෙවනාම සෙව ලභිස්සාමාති ආහ. ඉමං පන තෙසං කථාසල්ලාපං චඞ්කමනකොටියං රුක්ඛෙ අධිවත්ථා දෙවතා සුත්වා සෙව අය්‍යස්ස පායාසං උප්පාදෙස්සාමීති තාවදෙව ථෙරස්ස උපට්ඨාකකුලං ගන්ත්වා ජෙට්ඨපුත්තස්ස සරීරං ආවිසිත්වා පීළඤ්ජනෙසි.

---

නිසා; ජීවිතක්ඛයෙ පච්චුපට්ඨිතෙපි, ජීවිතවිනාශයකු දු ලඟසිටිකල්හි; අඤ්ඤත්‍රෙව ඔභාසාදීහි, ඔභාසාදීන් තබා; උප්පන්නෙ පච්චයෙ පටිසෙවති, උපන් ප්‍රත්‍යය අනුභවකෙරෙ ද; එසො, මෙතෙමෙ; පරම සල්ලෙඛවුත්තීති වුච්චති, පරමසල්ලෙඛවෘත්ති ඇත්තේය සි කියනු ලැබේ. සෙය්‍යථාපි ථෙරො. සාරිපුත්තො, සැරියුත්මහතෙරුන් මෙනි; සො කිරායස්මා, ඒ ආවත්; එකස්මිං සමයෙ, එක්සමයෙක්හි; පවිවෙකං බ්‍රෑහයමානො, විවෙකය වඩනුයේ; (රහත්පලසමවතින් වසනුයේ;) මහාමොග්ගල්ලානත්ථෙරෙන සද්ධිං, මුගලන්මහතෙරුන් හා සමග; අඤ්ඤතරස්මිං අරඤ්ඤෙ විහරති, එක්තරා අරණ්‍යයෙක්හි වාසයකෙරෙ; අථ, ඉක්බිත්තෙන්; අස්ස, ඒ තෙරනට; එකස්මිං දිවසෙ, එක්දවසෙක්හි; උදරවාතාබාධො උප්පජ්ජිත්වා, බඩ වාත රොගයෙක් ඇතිව; (රුජාවෙක් ඇතිවිය යි සේයි;) අතිදුක්ඛං ජනෙසි, අධිකදුක් කෙළේ; මහාමොග්ගල්ලානත්ථෙරො, මහමුගලන් තෙරහු; සායණ්හසමයෙ, සවස්වේලෙහි; තස්සායස්මතො, ඒ ආවත්නට; උපට්ඨානං ගතො, උපස්ථානයට ගියේ; ථෙරං, තෙරුන්; නිපන්නං දිස්වා, හොත්තවුන් දැක; තං පවත්තිං පුච්ඡිත්වා, හොත්පවත් පිළිවිස; ආවුසො, ඇවත; පුබ්බෙ, පෙර; තෙ, තොපට; කෙන ඵාසුහොතීති, කිමෙකින් ඵාසුවේදැයි; පුච්ඡි, පිළිවිස්සී; ථෙරො, තෙරහු; ආහ, මෙසේකීවු; ආවුසො, ඇවත; ගිහිකාලෙ, ගිහිවැසිකල; මෙ මාතා, මා මෑණියෝ; සප්පිමධුසක්කරාදීහි යොජෙත්වා, සප්පිමධුසකුරුවෙන් යොදා; අසම්භින්නඛීරපායාසං, දියනොමුසු කිරිබත; අදාසි, දුන්හ; තෙන, එයින්; ඵාසුකං අහොසීති, ඵාසුවියසි; සොපි ආයස්මා, ඒ ආවත්හුද; ආවුසො, ඇවත; හොතු, මැනව; සචෙ, ඉදින්; මය්හං වා තුය්හං වා පුඤ්ඤං අත්ථි, තොපගේවත් අපගේවත් පින් ඇත්නම්; සෙව ලභිස්සාම, සෙට ලදමෝනම්; අප්පෙවනාම ඉති, යෙහෙකැයි;

(අ) අථස්ස තිකිච්ඡා නිමිත්තං සන්නිපතිතෙ ඤාතකෙ ආහ:- සචෙ සො ථෙරස්ස එවරූපං නාම පායාසං පටියාදෙථ මුඤ්චිස්සාමීති තෙ තයා අවුත්තෙපි මයං ථෙරානං නිබද්ධං භික්ඛං දෙමාති වත්වා දුතියදිවසෙ තථාරූපං පායාසං පටියාදයිංසු. මහාමොග්ගල්ලානත්ථෙරො පාතොව ආගන්ත්වා ආවුසො යාවාහං පිණ්ඩාය චරිත්වා ආගච්ඡාමි, තාව ඉධෙවහොථාති වත්වා ගාමං පාවිසි තෙ මනුස්සා අබ්භුග්ගන්ත්වා[1] ථෙරස්ස පත්තං ගහෙත්වා වුත්තප්පකාරස්ස පායාසස්ස පූරෙත්වා අදංසු. ථෙරො ගමනාකාරං දස්සෙසි. භුඤ්ජථ භන්තෙ තුම්හෙ, අපරම්පි දස්සාමාති ථෙරං භොජෙත්වා පුන පත්තපූරං අදංසු. ථෙරො ගන්ත්වා හන්ද ආවුසො සාරිපුත්ත පරිභුඤ්ජාති උපනාමෙසි. ථෙරොපි තං දිස්වා

---

ආහ, කීවු; තෙසං, ඒ දෙදෙනාගේ; ඉමං පන කථාසල්ලාපං, මෙ කථාසල්ලාපය; චඞ්කමනකොටියං, සක්මන් කෙළවරසිටි; රුක්ඛෙ අධිවත්ථා දෙවතා, රුක්හි වසන දෙවතාතොමෝ; සුත්වා, අසා; සො, සෙට; අය්‍යස්ස, ආය්‍යීයනට; පායාසං උප්පාදෙස්සාමීති, පායාසය උපදවම්යි සිතා; තාවදෙව, එවෙලෙහිම; ථෙරස්ස, උපට්ඨාකකුලං ගන්ත්වා, තෙරුන්ගෙ උපස්ථායකකුලයට ගොස්; ජෙට්ඨපුත්තස්ස සරීරං ආවිසිත්වා, ජ්‍යෙෂ්ඨ පුත්‍රයාගේ ශරීරයෙහි ආවිෂ්ටව; පීළං ජනෙසි, පීඩාකළා.

(අ) අථ, ඉක්බිත්තෙන්; අස්ස, ඔහට; තිකිච්ඡානිමිත්තං, චිකිත්සාව කාරණකොට; සන්නිපතිතෙ ඤාතකෙ, නෑයන් රැස්වූකල්හි; ආහ, මෙසේකීවු; සචෙ, ඉදින්; සො, සෙට; ථෙරස්ස, මුගලන්මහ තෙරුන්ට; එවරූපං නාම පායාසං, මෙබඳු පායාසයක්; පටියාදෙථ, සපයාතම්; මුඤ්චිස්සාමීති, හරිම් යි කී;-තෙ, ඒ නෑයෝ; තයා අවුත්තෙපි, තීවිසින් නොකියනලදකල්හි දූ; මයං, අපි; ථෙරානං, තෙරවරනට; නිබද්ධං භික්ඛං දෙමාති, නිබඳයෙන් අහර දෙම්හයි; වත්වා, කියා; දුතියදිවසෙ, දෙවනදවස්; තථාරූපං පායාසං, එබඳු පායාසයක්; පටියාදයිංසු, සැපවූ; මහාමොග්ගල්ලානත්ථෙරො, මහමුගලන් තෙරහු; පාතොව, උදෑසන්හි ම; ආගන්ත්වා, අවුත්; ආවුසො, ඇවත; යාවාහං පිණ්ඩාය චරිත්වා ආගච්ඡාමි, යම්තාක්කල් මම පිඩුපිණිස ගොස් එම්ද; තාව, ඒ තාක්; ඉධෙව හොථාති, මෙහිම වසවයි; වත්වා, කියා; ගාමං පාවිසි, ගමටවන්හු; තෙ මනුස්සා, ඒ මිනිස්හු; අබ්භුග්ගන්ත්වා, අභිමුඛයට දිවගොස්; ථෙරස්ස, තෙරුන්ගේ; පත්තං ගහෙත්වා, පාත්‍රය ගෙන; වුත්තප්පකාරස්ස පායාසස්ස පූරෙත්වා, උක්තප්‍රකාර පායාසයෙන් පුරා; අදංසු, දුන්හු;-ථෙරො, තෙරහු; ගමනාකාරං දස්සෙසි, ගමනාකාරය දැක්වූහු; [තෙ, ඒ මිනිස්සු;] භුඤ්ජථ භන්තෙ, වහන්ස වළඳන්නෙ;-අපරම්පි දස්සාමාති, අනික් පිණ්ඩපාතයකුදු දෙම්හයි; ථෙරං භොජෙත්වා, තෙරුන් වළඳවා; පුන පත්තපූරං අදංසු,

---

1. පච්චුග්ගන්ත්වා-ඇතැම්.

අතිමනාපො පායාසො කථන්නුඛො උප්පන්නොති චින්තෙන්තො තස්ස උප්පත්තිමූලං දිස්වා:- හරාවුසො මොග්ගල්ලාන අපරිභොගො[1] පිණ්ඩපාතොති ආහ සොපායස්මා මාදිසෙන නාම ආහතං පිණ්ඩපාතං න පරිභුඤ්ජතීති චිත්තම්පි අනුප්පාදෙත්වා එකවචනෙනෙව පත්තං මුඛවට්ටියං ගහෙත්වා එකමන්තෙ නික්කුජ්ජෙසි. පායාසස්ස සහ භූමියං පතිට්ඨානා ථෙරස්ස ආබාධො අන්තරධායි. තතො පට්ඨාය චත්තාලීසවස්සානි[2] න පුන උප්පජ්ජි. තතො මහාමොග්ගල්ලානත්ථෙරං ආහ:-"ආවුසො වචීවිඤ්ඤත්තිං නිස්සාය උප්පන්නො පායාසො අන්තොසු නික්ඛමිත්වා භූමියං චරන්තොසුපි පරිභුඤ්ජිතුං අයුත්තරූපො"ති ඉදඤ්ච උදානං උදානෙසි.

---

නැවත පාත්‍රය පුරා දුන්හු; ථෙරො, තෙරහු; ගන්ත්වා, ගොස්; ආවුසො සාරිපුත්ත, ඇවැත් ශාරීපුත්‍රයෙනි; හන්ද පරිභුඤ්ජථාති, වළඳවයි; උප නාමෙසි, එළවූ; ථෙරොපි, සැරියුත්මහතෙරහු ද; තං දිස්වා, ඒ දැක; පායාසො, කිරිබත; අතිමනාපො, ඉතාමැනව; කථන්නුඛො උප්පන්නොති, කෙසේ උපන්දෝහොයි; චින්තෙන්තො, සිතා; තස්ස, ඒ පායාසයාගේ; උප්පත්තිමූලං දිස්වා, උත්පත්තිහෙතුව දැක; (ශිඝ්‍රකාල මා මෑණියෝ සප්පිමධුසක්ඛරාවෙන් යොදා අසම්භින්නක්ෂීරපායාසය දුන්හ. එයින් එා සුව්ය. යන තමන්විසින් කරනලද වාග්භෙද සඞ්ඛ්‍යාතකාරණය සේයි;) ආවුසො මොග්ගල්ලාන, ඇවැත්වූ මොග්ගල්ලානය; හර, හැරපිය; අපරිභොගො පිණ්ඩපාතොති, පිණ්ඩ පාතය පරිභොග යොග්‍යනොවෙයි; ආහ, කීවු; සොපි ආයස්මා, ඒ ආවත්හු ද; මාදිසෙන නාම ආහතං පිණ්ඩපාතං, මබඳුවන්හු විසින් ගෙණෙනලද පිණ්ඩපාතය; න පරිභුඤ්ජතීති, නොවළඳන් නේයයි; චිත්තම්පි අනුප්පාදෙත්වා, සිතකුදු නොඋපදවා; එකවචනෙ නෙව, එකනෙපුලෙන්ම; පත්තං, පාත්‍රය; මුඛවට්ටියං ගහෙත්වා, මුව විටියෙ ගෙන; එකමන්තෙ, එකත්පස්හි; නික්කුජ්ජෙසි, මුහුණින් නමාපි; පායාසස්ස, පායාසයාගේ; සහභූමියං පතිට්ඨානා, භූමියෙහි පිහිටීම හා සමග; ථෙරස්ස, තෙරුන්ගේ; ආබාධො, වාතාබාධය, අන්තරධායි, අතුරුධන්වී; තතො පට්ඨාය, එතැන්පටන්ගෙන; චත්තාලීසවස්සානි, සාලිස් හවුරුද්දක්; පුන න උප්පජ්ජි, නැවත නූපනී; තතො, ඉක්බිත්තෙන්; මහාමොග්ගල්ලානං, මහා මොග්ගල්ලානයන්ට; ආහ, මෙසේකී; ආවුසො, ඇවත; වචීවිඤ්ඤත්තිං නිස්සාය, වාග් විඥප්තියනිසා; උප්පන්නො පායාසො, උපන්පායාසය; අන්තොසු, අතුණු; නික්ඛමිත්වා, නික්ම; භූමියං චරන්තොසුපි, භූමියෙහි හැසිරෙතු ද; පරිභුඤ්ජිතුං අයුත්තරූපොති, වළඳන්නට නුසුදුසුයයි; ඉදඤ්ච උදානං උදානෙසි, මේ උදන් ද ඇනී.

---

1. අපරිභොගාරහොයං-ත්‍රි. මු.    1. අපාරිභොගෙයා-මු.
2. පඤ්ච චත්තාලීසවස්සානි-බොහෝ.

47 වචීවිඤ්ඤත්තිවිප්ඵාරං උප්පන්නං මධුපායසං
සචෙ භුත්තො භවෙය්‍යාහං සාජීවො ගරහිතො මම.

48 යදිපි මෙ අන්තගුණං නික්ඛමිත්වා බහි චරෙ
නෙව භින්දෙය්‍ය මාජීවං චජමානොපි ජීවිතං.

49 ආරාධෙමි සකං චිත්තං විවජ්ජෙමි අනෙසනං
නාහං බුද්ධපටිකුට්ඨං කාහාමි අනෙසනන්ති.

(ඇ) චීවරගුම්බකවාසි අම්බඛාදකමහාතිස්සත්ථෙරවත්ථුම්පි චෙත්ථ කථෙතබ්බං. එවං සබ්බථාපි.

50 "අනෙසනාය චිත්තම්පි අජනෙත්වා විචක්ඛණො
ආජීවං පරිසොධෙය්‍ය සද්ධා පබ්බජිතො යතී"ති.

---

47. වචීවිඤ්ඤත්තිවිප්ඵාරං, වාග් විඥප්ති ප්‍රචාරය හේතු කොට; උප්පන්නං, උපන්; මධුපායසං, ක්ෂීරපායාසය; සචෙ, ඉදින්; අහං, මම; භුත්තො භවෙය්‍යං, කෑයෙම් වීනම්; මම, මාගේ; ආජීවො, ආජීවය; ගරහිතො අස්ස, ගර්හිතවන්නේයි. ("භවෙය්‍යාහං සාජීවො" යනු යෙහි "භවේය්‍යං අහං අස්ස ආජීවො"යි පදබිඳ "එවංසතෙ" යනු මෙන් සන්ධිකාරිය කටයුතු.)

48. යදිපි, ඉදින්; මෙ අන්තගුණං, මාගෙ අතුණ; (අන්ත්‍රයම අන්ත්‍ර ගුණනම් "අන්තමෙවහෙත්ථ අන්තගුණන්ති නිද්දිට්ඨං වා අන්තමහා ගෙට්ඨා තෙසු තෙසු භොගට්ඨානෙසු බන්ධනං" යනු මෙතැන ටීකායි.) නික්ඛමිත්වා, නික්ම; බහිචරෙ, ගොචර සොයා පිටතඇවිදී නමුදු; ජීවිතං, ජීවිතය; චජමානොපි, හරණේ නමුදු; ආජීවං, ආජීවය; නෙවභින්දෙය්‍යං, නොමබිඳුනෙම්;

49. සකං චිත්තං, සවකීයවූ චිත්තය; ආරාධෙමි, වසඟකෙරෙමි; අනෙසනං, අයුක්තාන්වෙෂණය; විවජ්ජෙමි, දුරුකෙරෙමි; අහං, මම; බුද්ධපටිකුට්ඨං, බුදුන් විසින් ගර්හිතවූ; අනෙසනං, අයුක්තාන්වෙෂණය; න කාහාමි, නොකෙරෙමි.

(ඇ) චීවරගුම්බකවාසී, චීවරගුම්බකනම් තැන වසන; අම්බඛාදකමහාතිස්සත්ථෙරවත්ථුම්පි ච, අම්බඛාදකමහාතිස්සනම් තෙරුන්ගේ වතද; එත්ථ, මෙතැන; කථෙතබ්බං, කියයුතු;-එවං, මෙසේ; සබ්බථාපි, සර්වප්‍රකාරයෙන්;

50. විචක්ඛණො, විචක්ෂණතෙමෙ; අනෙසනාය; අයුක්තාන්වෙෂණ යෙහි; චිත්තම්පි අජනෙත්වා, සිත්ම නොඋපදවා; සද්ධාපබ්බජිතො යතී, සැදැහැයෙන් මහණවූ තපස්වීතෙමෙ; ආජීවං පරිසොධෙය්‍ය, ආජීවය පරිශුද්ධකරන්නේයි.

(අ) යථා ච විරියෙන ආජීවපාරිසුද්ධි, තථා පච්චයසන්නිස්සිතසීලං පඤ්ඤාය සම්පාදෙතබ්බං. පඤ්ඤාසාධනං හි තං පඤ්ඤාවතො පච්චයෙසු ආදීනවානිසංසදස්සනසමත්ථභාවතො. තස්මා පහාය පච්චයගෙධං ධම්මෙන සමෙන උප්පන්නෙ පච්චයෙ යථා වුත්තෙන විධිනා පඤ්ඤාය පච්චවෙක්ඛිත්වා පරිභුඤ්ජන්තෙන තං සම්පාදෙතබ්බං෴

(ආ) තත්ථ දුවිධං පච්චවෙක්ඛනං; පච්චයානං පටිලාභකාලෙ ච පරිභොග කාලෙ ච. පටිලාභකාලෙපි හි ධාතුවසෙන වා පටික්කූලවසෙන වා පච්චවෙක්ඛිත්වා ඨපිතානි චීවරාදීනි තතො උත්තරිං පරිභුඤ්ජන්තස්ස අනවජ්ජො ච පරිභොගො තථා පරිභොගකාලෙපි. තත්‍රායං සන්නිට්ඨාන කාරකො විනිච්ඡයො:-චත්තාරො හි පරිභොගා, ථෙය්‍යපරිභොගො ඉණපරිභොගො දායජ්ජපරිභොගො සාමිපරිභොගොති; තත්‍ර සඞ්ඝ

---

(අ) යථා, යම්සේ; ආජීවපාරිසුද්ධි, ආජීවපාරිසුද්ධිතොමෙ; විරියෙන, වීර්‍ය්‍යයෙන් සැපවියයුතුද; තථා, එසේම; පච්චයසන්නිස්සිතසීලං, ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලයද; පඤ්ඤාය සම්පාදෙතබ්බං, ප්‍රඥාවෙන් සැපවිය යුතුවේ; තං, හේ ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලය; පඤ්ඤාසාධනං හි, ප්‍රඥාව සාධනකොට ඇත්තේමැයි; (කාරණ දක්වති පඤ්ඤා෴පෙ෴ තතොයි.) පඤ්ඤාවතො, නුවණැත්තහුගේ; පච්චයෙසු, චතුර්විධප්‍රත්‍ය යන් කෙරෙහි; ආදීනවානිසංසදස්සනසමත්ථභාවතො, නොපස්විකී මෙහි ආදීනව හා පස්විකීමෙහි ආනිසංසදශීනයට සමර්ථබව හෙයිනි; තස්මා, එහෙයින්; පච්චයගෙධං, ප්‍රත්‍යයන්කෙරෙහි ලොභය; පහාය, දුරුකොට; (ගෙධග්‍රහණයෙන්ම සගෞරවබැව්නුදු උපනිශ්‍රයබැව් නුදු මොහයද ගන්නාලැබේ.) ධම්මෙන සමෙන උප්පන්නෙ පච්චයෙ, දැහැමෙන් සෙමෙන් උපන් පසයන්; යථා වුත්තෙන විධිනා, යථොක්තක්‍රමයෙන්; පඤ්ඤාය, නුවනින්; පච්චවෙක්ඛිත්වා, පස්විකා; පරිභුඤ්ජන්තෙන, වළඳන්නහුවිසින්; තං, ඒ ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලය; සම්පාදෙතබ්බං, සැපවියයුතු෴

(ආ) තත්ථ, එහි; පච්චවෙක්ඛනං, ප්‍රත්‍යවෙක්ෂාව; දුවිධං, දෙවැදෑරුම්වේ; පච්චයානං, ප්‍රත්‍යයන්ගේ; පටිලාභකාලෙ ච, ප්‍රතිලාභකාලයෙහි ද; පරිභොගකාලෙ ච, අනුභවකාලයෙහිදැයි; පටිලාභකාලෙපි හි, ප්‍රතිලාභකාලයෙහි දු; ධාතුවසෙන වා, (ස්වකීය ප්‍රත්‍යයෙන් පවත්නා ධාතුමාත්‍රයෙකැයි) ධාතුවශයෙන් හෝ; පටික්කූලවසෙන වා, (පූතිකායටපැමිණ පිළිකුල් වන්නාහයි) ප්‍රතිකූලවශයෙන් හෝ; පච්චවෙක්ඛිත්වා ඨපිතානි, ප්‍රත්‍යවෙක්ෂාකොට තබනලද; චීවරාදීනි, චීවරාදී ප්‍රත්‍යයන්; තතො උත්තරිං, ප්‍රතිලාභකාලයෙන් මතුයෙහි; පරිභුඤ්ජන්තස්ස, එයට කියනලද ප්‍රත්‍යවෙක්ෂාවෙන් පස්විකා අනුභව කරන්නහුගෙ; පරිභොගො, පරිභොගය; අනවජ්ජො ච, නිරවද්‍යම වේ; ("පටිලාභ෴පෙ෴පරිභොගො"යන මෙ වචනය පරිභොග කාලයෙහි ප්‍රත්‍යවෙක්ෂාව ප්‍රතික්ෂෙපකරනපිණිස නොවෙයි ප්‍රත්‍ය

මජ්ඣෙපි නිසීදිත්වා පරිභුඤ්ජන්තස්ස දුස්සීලස්ස පරිභොගො ථෙය්‍යපරිභොගො නාම. සීලවතො අපච්චවෙක්ඛිතපරිභොගො ඉණපරිභොගො නාම; තස්මා චීවරං පරිභොගෙ පරිභොගෙ පච්චවෙක්ඛිතබ්බං, පිණ්ඩපාතො ආලොපෙ ආලොපෙ, තථා අසක්කොන්තෙන පුරෙභත්තපච්ඡාභත්ත පුරිමයාම මජ්ඣිමයාම පච්ඡිමයාමෙසු, සචස්ස අපච්චවෙක්ඛතො ච අරුණං උග්ගච්ඡති ඉණපරිභොගට්ඨානෙ යෙව තිට්ඨති, සෙනාසනම්පි පරිභොගෙ පරිභොගෙ පච්චවෙක්ඛිතබ්බං; භෙසජ්ජස්ස පටිග්ගහණෙ පි පරිභොගෙ පි සතිපච්චයතා වට්ටති. එවං සන්තෙපි පටිග්ගහණෙ සතිං කත්වා පරිභොගෙ අකරොන්තස්සෙව ආපත්ති, පටිග්ගහණෙ පන සතිං අකත්වාපි පරිභොගෙ කරොන්තස්ස අනාපත්ති.

---

වෙක්ෂාවගේ ආදිශුද්ධිය දක්වනපිණිස කියනලදී. එහෙයින්ම "පරිභොගකාලෙපි" යුහු-පරිභොගකාලයෙහි දු පස්විකා පරිභොග කරන්නහුගෙ පරිභොග නිවරදවේමය යන අර්‍ථයි;) තත්‍ර, ඒ පරිභොගකාලයෙහි කරන ප්‍රත්‍යවෙක්ෂාවෙහි; අයං, මේ; සතිට්ඨාන කරෙ, සතිටුහන්කරන්නාවූ; විනිච්ඡයො, විනිශ්චය යි; පරිභොගා, පරිභොගයෝ; චත්තාරො, සතරදෙනෙකි; ථෙය්‍ය පරිභොගො, ථෙය්‍යපරිභොගය; ඉණපරිභොගො, ඍණපරිභොගය; දායජ්ජපරිභොගො, දායාදපරිභොගය; සාමිපරිභොගොති, ස්වාමිපරිභොගය යි; සඞ්ඝමජ්ඣෙපි නිසීදිත්වා, සඟමැද ද හිඳ; පරිභුඤ්ජන්තස්ස, වළඳන්නාවූ; දුස්සීලස්ස පරිභොගො, දුශ්ශීලයාගෙ පරිභොගය; ථෙය්‍ය පරිභොගො නාම, ථෙය්‍යපරිභොගනම්; (බුදුන්විසින් සිල්වත්නට අනුදත්බැවිනු දු දායකයනුදු සිල්වත්හට දෙමහයි දෙනබැවිනුදු සිල්වතුන් අයති පසය දුශ්ශීලයා සඟමැද හිඳ වළඳතුදු උහුගෙ පරිභොගය ථෙය්‍යපරිභොගනම්;) සීලවතො, සිල්වත්හුගේ; අපච්චවෙක්ඛිත පරිභොගො, නොපස්විකු පසයවැළඳීම; ඉණපරිභොගො නාම, ඍණපරිභොගනම්; (ප්‍රතිග්‍රාහකයාකෙරෙන් දක්ෂිණාවිශුද්ධිය නොවන බැවින් නොපස්විකා වැළඳීම ණයගෙනවැළඳීමය යන අර්‍ථයි.) තස්මා, එහෙයින්; චීවරං, සිවුරු; පරිභොගෙ පරිභොගෙ, කයින් පහකොට හඳනා පොරෝනා සඳ; පච්චවෙක්ඛිතබ්බං, පස්විකියයුතු; පිණ්ඩපාතො, පිණ්ඩපාත; ආලොපෙ ආලොපෙ, ආලොපයෙහි ආලොපයෙහි පස්විකියයුතු;-තථා අසක්කොන්තෙන, එසේ පස්විකානුවට නොපොහොසත්හු විසින්; පුරෙභත්ත, පෙරබතය; පච්ඡාභත්ත, පස්බතය; පුරිමයාම, පෙරයමය; මජ්ඣිමයාම, මැදුම්යමය; පච්ඡිමයාමෙසු, පැසුම්යමය යනමෙහි; පච්චවෙක්ඛිතබ්බං, පස්විකියයුතු; සචෙ, ඉදින්; අස්ස, ඒ මහණහු; අපච්චවෙක්ඛතොව, නොපස්විකාන්නාහටම; (පස් නොවිකානතෙක්ම;) අරුණං උග්ගච්ඡති, අරුණු නැඟීනම්; ඉණපරිභොගට්ඨානෙයෙව තිට්ඨති, ඍණපරිභොගස්ථානයෙහිම සිටී; සෙනාසනම්පි, සෙනසුනු දු; පරිභොගෙ පරිභොගෙ, පරිභොගයෙහි පරිභොගයෙහි; පච්චවෙක්ඛිතබ්බං, පස්විකියයුතු; භෙසජ්ජස්ස, බෙහෙදට;

(ඇ) චතුබ්බිධා හි සුද්ධි:- දෙසනාසුද්ධි සංවරසුද්ධි පරියෙට්ඨිසුද්ධි පච්චවෙක්ඛනසුද්ධීති. තත්‍ථ දෙසනාසුද්ධි නාම:- පාතිමොක්ඛසංවරසීලං, තං හි දෙසනාය සුජ්ඣනතො දෙසනාසුද්ධීති වුච්චති. සංවරසුද්ධි නාම:-ඉන්‍ද්‍රියසංවරසීලං, තං හි න පුන එවං කරිස්සාමීති චිත්තාධිට්ඨානසංවරෙනෙව සුජ්ඣනතො සංවරසුද්ධී ති වුච්චති. පරියෙට්ඨිසුද්ධි නාම:-ආජීවපාරිසුද්ධිසීලං, තං හි අනෙසනං පහාය ධම්මෙන සමෙන පච්චයෙ උප්පාදෙන්තස්ස පරියෙසනාය සුද්ධත්තා පරියෙට්ඨිසුද්ධීති වුච්චති. පච්චවෙක්ඛනසුද්ධි නාම;-පච්චයසන්නිස්සිත සීලං, තං හි වුත්තප්පකාරෙන පච්චවෙක්ඛනෙන සුජ්ඣනතො පච්චවෙක්ඛන සුද්ධීති වුච්චති; තෙන වුත්තං පටිග්ගහණෙ පන සතිං අකත්වා පරිභොගෙ කරොන්තස්ස අනාපත්ති"ති.

---

පටිග්ගහණෙ පි, ´පිළිගහණෙහි ද; පරිභොගෙ පි, පරිභොගයෙහි ද; සතිපච්චයතා වට්ටති, සමෘතියගෙ ප්‍රත්‍යයභාවය වටී; (පිළිගහණෙහි දු පරිභොගයෙහි දු ප්‍රත්‍යවෙක්ෂාසමෘතියගෙ ප්‍රත්‍යය බව වටියි පස්විකාම පිළිගතයුතුය පරිභොග ද කටයුතුය යන අර්‍ථයි;) එවං සන්තෙ පි, එසේ කල්හි දු; පටිග්ගහණෙ සතිං කත්වා, පිළිගහණෙහි ප්‍රත්‍යවෙක්ෂාසමෘතියකොට; පරිභොගෙ අකරොන්තස්සෙව, පරිභොගයෙහි නොකරනුවහටම; ආපත්ති, ඇවැත්වෙයි; පටිග්ගහණෙ පන සතිං අකත්වා පි, පිළිගහණෙහි වනාහි සතියනොකොටද; පරිභොගෙ කරොන්තස්ස, පරිභොගයෙහි සිහිකරනු හට; අනාපත්ති, ඇවැත් නොවෙ.

(ඇ) චතුබ්බිධා හි සුද්ධි, ශුද්ධිතොමො චතුර්විධවෙ; දෙසනාසුද්ධි, දෙශනාශුද්ධිය; සංවරසුද්ධි, සංවරශුද්ධිය; පරියෙට්ඨිසුද්ධි, පර්‍ය්‍යෙෂණශුද්ධිය; පච්චවෙක්ඛන සුද්ධී ති, ප්‍රත්‍යවෙක්ෂාශුද්ධියයි; තත්‍ථ, එහි; දෙසනාසුද්ධි නාම, දෙශනාශුද්ධි නම්; පාතිමොක්ඛසංවරසීලං, ප්‍රාතිමොක්ෂ සංවර ශීලයයි; තං හි, හෙතෙම; දෙසනාය සුජ්ඣනතො, දෙශනාවෙන් ශුද්ධවනහෙයින්; දෙසනාසුද්ධීතිවුච්චති, දෙශනාශුද්ධියයි කියනුලැබේ; සංවරසුද්ධි නාම, සංවරශුද්ධිනම්; ඉන්‍ද්‍රියසංවරසීලං, ඉන්‍ද්‍රියසංවරශීලයයි; තං හි, හෙතෙමෙ; න පුන එවං කරිස්සාමී ති, නැවත මෙසේ නොකරමි යන; චිත්තාධිට්ඨානසංවරෙනෙව, සිත්ඉටනසංවරයෙන්ම; සුජ්ඣනතො, ශුද්ධවනහෙයින්; සංවරසුද්ධීති වුච්චති, සංවරශුද්ධියයි කියනු ලැබෙ; පරියෙට්ඨිසුද්ධි නාම, පර්‍ය්‍යෙෂණශුද්ධිනම්; ආජීවපාරිසුද්ධිසීලං, ආජීවපාරිශුද්ධිශීලයයි; තං හි, හෙතෙමෙ; අනෙසනං පහාය, අයුක්තානෙ‍්‍යෂණය දුරුකොට; ධම්මෙන සමෙන, දැහැමින්සෙමින්; පච්චයෙ උප්පාදෙන්තස්ස, ප්‍රත්‍යයන් උපදවන්නාහට; පරියෙසනාය සුද්ධත්තා, පර්‍ය්‍යෙෂණයෙන් ශුද්ධවනහෙයින්; පරියෙට්ඨිසුද්ධී ති වුච්චති, පර්‍ය්‍යෙෂණ ශුද්ධියයි කියනුලැබෙ; පච්චවෙක්ඛනසුද්ධි නාම, ප්‍රත්‍යවෙක්ෂණ ශුද්ධි නම්; පච්චයසන්නිස්සිතසීලං, ප්‍රත්‍යයපරිභොගසන්නිශ්‍රිතශීල

(ආ) සත්තන්නං සෙඛානං පච්චයපරිභොගො දායජ්ජපරිභොගො නාම. තෙ හි භගවතො පුත්තා, තස්මා පිතුසන්තකානං පච්චයානං දායාදා හුත්වා තෙ පච්චයෙ පරිභුඤ්ජන්ති. කිං පන තෙ භගවතො පච්චයෙ පරිභුඤ්ජන්ති [1] ගිහීනං පච්චයෙ පරිභුඤ්ජන්තීති? ගිහීහි දින්නා පි භගවතා අනුඤ්ඤාතත්තා භගවතො සන්තකා හොන්ති. තස්මා භගවතො පච්චයෙ පරිභුඤ්ජන්තීති වෙදිතබ්බා. ධම්මදායාද සුත්තඤ්චෙත්ථ සාධකං. ඛීණාසවානං පරිභොගො සාමිපරිභොගො නාම. තෙ හි තණ්හාදාසව්‍යං අතීතත්තා සාමිනො හුත්වා පරිභුඤ්ජන්ති ඉමෙසු පරිභොගෙසු සාමිපරිභොගො ච දායජ්ජපරිභොගොච සබ්බේසං

---

යයි; තංහි, හෙතෙම; වුත්තප්පකාරෙන පච්චවෙක්ඛනෙන, උක්තප්‍රකාර ප්‍රත්‍යවෙක්ෂණයෙන්; සුජ්ඣනතො, ශුද්ධවනහෙයින්; පච්චවෙක්ඛනසුද්ධි ති වුච්චති, ප්‍රත්‍යවෙක්ෂණශුද්ධියයි කියනුලැබෙ; තෙන වුත්තං, එහෙයින් කියනලදී; පටිග්ගහණෙ පන, පිළිගන්නාකල වනාහි, සතිං අකත්වා, පස්විකුම්සිහි නොකොට; පරිභොගෙ කරොන්තස්ස, පරිභොගකාලයෙහි කරන්නාහට; අනාපත්තීති, නිරවතැයි.

(ආ) සත්තන්නං සෙඛානං, සප්තවිධ ශෛක්ෂයන්ගේ; පච්චය පරිභොගො, ප්‍රත්‍යයපරිභොගය; දායජ්ජපරිභොගො නාම, දායාදපරිභොගනම්; තෙ හි, ඒ සෙඛයො; භගවතො පුත්තා, භගවත්හුගෙ පුත්‍රයහ; තස්මා, එහෙයින්; පිතුසන්තකානං පච්චයානං, පිතෘසන්තකවූ ප්‍රත්‍යයන්ට; දායාදා හුත්වා, හිමිව; තෙ ඒ සෙඛයෝ; පච්චයෙ පරිභුඤ්ජන්ති, ප්‍රත්‍යයන් අනුභවකෙරෙත්; කිං පන, කිම; තෙ, ඒ සෙඛයෝ; භගවතො පච්චයෙ පරිභුඤ්ජන්ති, භගවත්හුගෙ ප්‍රත්‍යය අනුභවකෙරෙත්ද; ගිහීනං පච්චයෙ පරිභුඤ්ජන්ති ති, ගිහීන්ගේ ප්‍රත්‍යය අනුභවකෙරෙත් ද; ගිහීහි දින්නා පි, ගිහින් විසින් දෙනලද්දාහු ද; භගවතා අනුඤ්ඤාතත්තා, භගවත්හු විසින් අනුඥාත හෙයින්; භගවතො සන්තකා හොන්ති, භගවත්හු සතුනම් වෙත්; තස්මා, එහෙයින්; භගවතො පච්චයෙ පරිභුඤ්ජන්ති ති, භගවත්හුගෙ ප්‍රත්‍යය වළඳිතියි; වෙදිතබ්බා, දතයුත්තාහුයි; එත්ථ, ඒ ගිහීන්දුන් දෙයද භගවත්හු සන්තකය යන මෙ අර්ථයෙහි; ධම්මදායාදසුත්තඤ්ච සාධකං, "ධම්මදායාදා මෙ භික්ඛවෙ භවථ මා ආමිසදායාදා" යනාදී ධර්මදායාදසූත්‍රයද සාධකයි; ඛීණාසවානං පරිභොගො, රහතුන්ගේ පරිභොගය; සාමිපරිභොගො නාම, සවාමිපරිභොගනම් වෙ; තෙ හි, ඒ රහත්හු; තණ්හාදාසව්‍යං අතීතත්තා, තෘෂ්ණාවට දස්බව ඉක්මූ හෙයින්; සාමිනො හුත්වා, සවාමීව; [පච්චයෙ] පරිභුඤ්ජන්ති, ප්‍රත්‍යය පරිභොගකෙරෙත්; (අවීතරාගයන්ට වනාහි තෘෂ්ණා පරවශ බැවින් ප්‍රත්‍යයපරිභොගයෙහි සවාමිබවෙක් නැති වීතරාගයන්ට එහි සවාමිභාවය රුචිවූපරිද්දෙන් ප්‍රත්‍යයපරිභොග සද්භාවයෙනැයි දතයුතු.

වට්ටති. ඉණපරිභොගො න වට්ටති. ථෙය්‍යපරිභොගෙ කථාසෙව නත්ථි. යො පනායං සීලවතො පච්චවෙක්ඛිත පරිභොගො, සො ඉණපරිභොගස්ස පච්චනීකත්තා ආනණ්‍යපරිභොගො වා හොති දායජ්ජ පරිභොගෙයෙව වා සඞ්ගහං ගච්ඡති. සීලවා පි ඉමාය සික්ඛාය සමන්නාගතත්තා සෙඛොත්වෙව වුච්චති. ඉමෙසු පන පරිභොගෙසු යස්මා සාමිපරිභොගො අග්ගො, තස්මා තං පත්ථයමානෙන භික්ඛුනා වුත්තප්පකාරාය පච්චවෙක්ඛනාය පච්චවෙක්ඛිත්වා පරිභුඤ්ජනෙන න පච්චයසන්නිස්සිතසීලං සම්පාදෙතබ්බං. එවං කරොන්තො හි කිච්චකාරී හොති.

---

එහෙයින්ම ඔහු ප්‍රතිකූලය අප්‍රතිකූලාකාරයෙන් ද අප්‍රතිකූලය ප්‍රතිකූලාකාරයෙන්ද එම දෙක හැර උපෙක්ෂාකාරයෙනු දු ප්‍රත්‍යයපරිභොගය කෙරෙත් නුයි දතයුතු.) ඉමෙසු පරිභොගෙසු, මෙ සතර වැදෑරුම් පරිභොගයන් කෙරෙහි; සාමිපරිභොගො ච, ස්වාමිපරිභොගය ද; දායජ්ජපරිභොගො ච, දායාදපරිභොගය ද; සෙඛ්ඛසං, ආයඝීයන්ට ද පුහුදුනන්ටද; වට්ටති, වටී; (ස්වාමිපරිභොග දායාදපරිභොගයෝ පුහුදුනන්ට කෙසේ සම්භවෙති යත්? උපචාර වශයෙන් සම්භවෙති දතයුතු- සල්ලෙඛපටිපත්තියෙහි පිහිටි පුහුදුන්නහුගෙ ප්‍රත්‍යයගෙධය දුරුකොට එහි අනුපලිප්තචිත්තයෙන් පරිභොගය ස්වාමිපරිභොගයක් මෙන සිල්වත්හු පස්විකා කරන පරිභොගය දායාදපරිභොගයක් මෙනි. එහෙයින් "දායජ්ජපරිභොගෙයෙව වා සඞ්ගහං ගච්ඡති" යුහු.) ඉණපරිභොගො, ප්‍රත්‍යවෙක්ෂානොකිරීමෙන් වන ඍණපරිභොගය; න වට්ටති, හැමදෙනාටම නොවටී; ථෙය්‍ය පරිභොගෙ, දුශ්ශීලවකරන ථෙය්‍යපරිභොගයෙහි; කථාසෙව නත්ථි, (නොවටී යනුයෙහි) කථාමනැති; යො පනායං, මෙ යමෙක්තෙමෙ; සීලවතො, සිල්වත්හුගේ; පච්චවෙක්ඛිතපරිභොගො, පස්විකාකරන පරිභොගයෙක්ද; සො, හෙතෙම; ඉණපරිභොගස්ස පච්චනීකත්තා, ඍණපරිභොගයට ප්‍රතිපක්ෂහෙයින්; ආනණ්‍යපරිභොගො වා හොති, අනෘණපරිභොග නම් හෝ වෙයි; දායජ්ජපරිභොගෙයෙව වා, දායාද පරිභොගයෙහි ම හෝ; සඞ්ගහං ගච්ඡති, සඞ්ග්‍රහයටයෙ; සීලවාපි, සිල්වත්ද; ඉමාය සික්ඛාය සමන්නාගතත්තා, මේ ශික්ෂාවෙන් සමන්විත බැවින්; සෙඛොත්වෙව, සෙඛයයිම; වුච්චති, කියනුලැබෙ; ඉමෙසු පන පරිභොගෙසු, මේ පරිභොගයන් කෙරෙහි; යස්මා, යම්හෙයකින්; සාමිපරිභොගො අග්ගො, ස්වාමිපරිභොගය අග්‍රද; තස්මා, එහෙයින්; තං, ඒ; පත්ථයමානෙන, පතන්නාවූ; භික්ඛුනා, මහණහුවිසින්; වුත්තප්පකාරාය පච්චවෙක්ඛනාය, උක්තප්‍රකාරඇති ප්‍රත්‍යවෙක්ෂණයෙන්; පච්චවෙක්ඛිත්වා, පස්විකා; පරිභුඤ්ජනෙන, වළඳන්නහු විසින්; පච්චයසන්නිස්සිතසීලං, ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලයතෙමෙ; සම්පාදෙතබ්බං, සැපවියයුතු; එවං කරොන්තො, මෙසේ පස්විකා පරිභොගයකරන්නෙ; කිච්චකාරීහොති, කෘත්‍යකාරීමවෙ; (යුක්ත ප්‍රාප්තකාරීවේ යුතැනි.)

වුත්තම්පි චෙතං:–

51 පිණ්ඩං විහාරං සයනාසනඤ්ච
ආපඤ්ච සඞ්ඝාටිරජූපවාහනං
සුත්වාන ධම්මං සුගතෙන දෙසිතං
සඞ්ඛාය සෙවෙ වරපඤ්ඤසාවකො.

52 තස්මා හි පිණ්ඩෙ සයනාසනෙ ච ආපෙ ච සඞ්ඝාටිරජූපවාහනෙ
එතෙසු ධම්මෙසු අනූපලිත්තො භික්ඛු යථා පොක්ඛරෙ වාරිබින්දු.

53 කාලෙන ලද්ධා පරතො අනුග්ගහා
ඛජ්ජෙසු භොජ්ජෙසු ච සායනෙසු
මත්තං සජඤ්ඤූ සතතං උපට්ඨිතො
වණස්ස ආලෙපනරූහනෙ යථා.

---

වුත්තම්පිචෙතං, මෙකියනලදී;

51. පිණ්ඩං, පිණ්ඩපාතයද; විහාරං, ගෙයද; සයනාසනඤ්ච, හැඳ පුටුද; (දෙකින්ම සෙනසුන්පස කීහු;) සඞ්ඝාටිරජූපවාහනං, සිවුරෙහි රජස් දුරුකරන්නාවූ; ආපඤ්ච, ජලයද; සුගතෙන දෙසිතං, "පටිසඞ්ඛායොනිසො චීවරං පටිසෙවති" යනාදීන් සුගතන්හු විසින් දෙසිතවූ; ධම්මං සුත්වාන, ධර්මය අසා; වරපඤ්ඤසාවකො, තථාගත ශ්‍රාවක තෙමෙ; සඞ්ඛාය, "යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය" යනාදි නයින් ප්‍රත්‍යවෙක්ෂා කොට; සෙවෙ, (පිණ්ඩශබ්දයෙන් කියන ලද පිණ්ඩපාතප්‍රත්‍යයද "විහාරං සයනාසනං" යනුයෙන් කියනලද සෙනාසනප්‍රත්‍යය ද පිපාසාගෙලඤ්ඤය සංහිඳුවනහෙයින් පැණ ද ගිලානප්‍රත්‍යයනුයි ආපමුඛයෙන් කියනලද ගිලානප්‍රත්‍යය ද සඞ්ඝාටිශබ්දයෙන් කියනලද චීවරප්‍රත්‍යය ද යන චතුර්විධප්‍රත්‍යයන්) සෙවුනේයි; (සෙවුනට සමර්ථවන්නේය යනඅර්ථයි.)

52. තස්මා, එහෙයින්; (යම්හෙයකින් තථාගතශ්‍රාවක ප්‍රත්‍යවෙක්ෂා කොට සෙවුනෙ ද එහෙයින් යන අර්ථයි.) පිණ්ඩෙ, පිණ්ඩපාත පසයෙහි ද; සයනාසනෙ ච, සෙනසුන්පසයෙහි ද; ආපෙ ච සඞ්ඝාටිරජූපවාහනෙ, සිවුරෙහි ද රජස් සෝධන ජලයෙහි ද; (සිවුරුපසයෙහි හා ගිලන්පසයෙහි ද යන අර්ථයි;) එතෙසු ධම්මෙසු, මෙ සිවුපස නැමැති ධර්මයන්කෙරෙහි; භික්ඛු, මහණතෙමෙ; අනූපලිත්තො හොති, නො ඇලෙන්නේයි; (කුමක්මෙනයත්?) පොක්ඛරෙ වාරිබින්දු යථා, පොකුරුපතජලබින්දු මෙනි; (පොකුරුපත ජලබින්දු යම්සේ නොඇලේ ද එසේම පස්විකා සිවුපසසෙවුනා මහණතෙමෙ ඒ සිවුපසයෙහි නොඇලෙන්නේයි.)

53. කාලෙන, ආයඝීයන්ගේ භොජනකාලයෙහි; අනුග්ගහා, තමා කෙරෙහි අනුකම්පායෙන්; පරතො, දායකයාකෙරෙන්; ලද්ධා, ලදින්; ඛජ්ජෙසු, අපූපාදියෙහි ද; භොජ්ජෙසු ච, අතනාදියෙහි ද; සායනෙසු,

54 කන්තාරෙ පුත්තමංසං ව අක්ඛස්සබ්භඤ්ජනං යථා
එවං ආහරි ආහාරං යාපනත්ථායමුච්ඡිතො ති.

(අ) ඉමස්ස ච පච්චයසන්නිස්සිතසීලස්ස පරිපූරකාරිතාය භාගිනෙය්‍ය සඞ්ඝරක්ඛිත සාමණෙරස්සවත්ථුඤ්ච කථෙතබ්බං, සො හි සම්මා පච්චවෙක්ඛිත්වා පරිභුඤ්ජි, යථාහ:-

55 "උපජ්ඣායො මං භුඤ්ජමානං සාලිකූරං සුනිබ්බුතං
මාහෙව ත්වං සාමණෙර ජිව්හං ඩාපෙසි අසඤ්ඤතො.

56 උපජ්ඣායස්ස වචො සුත්වා සංවෙගමලභිං තදා
එකාසනෙ නිසීදිත්වා අරහත්තං අපාපුණිං.

---

ථාණිතාදියෙහි ද; සො, ඒ මහණ; සතතං, හැමවේලෙහිම; උපට්ඨිතො, එළඹසිටි සිහි ඇත්තෙ; ආලෙපන, බෙහෙත් ආලෙපන යෙන්; වණස්සරූහණෙ යථා, ව්‍රණරොපණයෙහි මෙන්; මත්තං ජඤ්ඤා, පමණදන්නේයි; (යම්සේ වෙණෙහි බෙහෙද ආලෙපකරනුයෙ පමණදන ආලෙපකෙරෙ ද එසේම පමණදන වළඳන්නේයි යුතැනි.)

54. කන්තාරෙ, කතරෙහි සාත; පුත්තමංසං ච,පුත්‍රමාංසය යම්සේද; අක්ඛස්සබ්භඤ්ජනං යථා, අකුරක්හි දෙන වදන යම්සේ ද; එවං, එපරිද්දෙන්ම; යාපනත්ථාය, ශරීරය යැපෙනපිණිස; අමුච්ඡිතො, තෘෂ්ණාවෙන් මූර්ඡිතනොවූයේ; ආහාරං, අහර; ආහරි, වළඳන් නේයි; (ආහරෙයාහාරං යනු පාඨය යෙත්ම.)

(අ) ඉමස්සචපච්චයසන්නිස්සිතසීලස්ස, මෙ ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලයාගෙ; පරිපූරකාරිතාය, සම්පූර්ණකාරිබැවිහි; භාගිනෙය්‍යසඞ්ඝරක්ඛිත සාමණෙරස්ස, භාගිනෙය්‍යසඞ්ඝරක්ඛිත නම් හෙරණගෙ; වත්ථුඤ්ච කථෙතබ්බං, වතද කියයුතු; සො හි, ඒ හෙරණ තෙමෙ; සම්මා, මනා කොට; පච්චවෙක්ඛිත්වා, පස්විකා; පරිභුඤ්ජි, වැළඳී; යථාහ, කියෙමැ නු.

55. උපජ්ඣායො, මාගෙ උපාධ්‍යායතෙරනු; සුනිබ්බුතං, ඉතා නිවුන (ඇල්වූ); සාලිකූරං, හැල්බත; භුඤ්ජමානං, වළඳන්නාවූ; මං, මට; සාමණෙර, හෙරණ; ත්වං, තො; අසඤ්ඤතො, අසංයතවූයෙ; (නොපස්විකාන්නෙහි;) ජිව්හං, දිව; මා ඩාපෙසි, නහමක්දවසි කීය. (අවච–යන්නක් අධ්‍යාහාර කරනු.

56. උපජ්ඣායස්ස, උපාධ්‍යායතෙරුන්ගෙ; වචො සුත්වා, එ තෙපුල් අසා; තදා, එ වේලෙහි; සංවෙගමලභිං, සංවෙගයට පැමිණියෙමි; එකාසනෙ නිසීදිත්වා, එක ආසනයේ හිඳ; අරහත්තං අපාපුණිං, රහත් බවට පැමිණියෙමි.

57 සොහං පරිපුණ්ණසඞ්කප්පො චන්දො පණ්ණරසො යථා
සබ්බාසවපරික්ඛීණො නත්ථි දානි පුනබ්භවො"ති.

58 තස්මා අඤ්ඤදපි දුක්ඛස්ස පත්ථයන්තො පරික්ඛයං
යොනිසො පච්චවෙක්ඛිත්වා පටිසෙවෙථ පච්චයෙ ති.

(අ) එවං පාතිමොක්ඛසංවරසීලාදි වසෙන චතුබ්බිධං.

**(ආ)** පඤ්චවිධකොට්ඨාසස්ස පඨමපඤ්චකෙ අනුපසම්පන්නසීලාදිවසෙන අත්ථො වෙදිතබ්බො. වුත්තං හෙතං පටිසම්භිදායං. කතමං පරියන්තපරිසුද්ධිසීලං? අනුපසම්පන්නානං පරියන්තසික්ඛාපදානං. ඉදං පරියන්තපාරිසුද්ධිසීලං. කතමං අපරියන්ත පාරිසුද්ධිසීලං? උපසම්පන්නානං අපරියන්තසික්ඛාපදානං. ඉදං අපරියන්ත පාරිසුද්ධි සීලං. කතමං පරිපුණ්ණපාරිසුද්ධිසීලං? පුථුජ්ජනකල්‍යාණකානං කුසලධම්මෙ යුත්තානං සෙක්ඛපරියන්තෙ පරිපූරකාරීනං කායෙ ච ජීවිතෙ ච

---

57. සො අහං, හේ මම; පණ්ණරසො චන්දො යථා, පුණ්ණරසී පොහෝ දවස් සඳුමෙන්; පරිපුණ්ණසඞ්කප්පො, පරිපූර්ණවූ සඞ්කල්ප ඇතියෙම්; සබ්බාසවපරික්ඛීණො; ක්ෂීණවූ සියලුආශ්‍රවයන් ඇත්තෙම්; ඉදානි, දැන්; පුනබ්භවො නත්ථි, පුනර්භවය නැති;

58. තස්මා, එහෙයින්; අඤ්ඤදපි, අනිකෙකුදු; දුක්ඛස්ස, දුක්ඛයාගේ; පරික්ඛයං, පරික්ෂය; පත්ථයන්තො, පතන්නේ; යොනිසො, නුවණින්; පච්චවෙක්ඛිත්වා, පස්විකා; පච්චයෙ, සතරපසයන්; පටිසෙවෙථ, සෙවුනේයි;

(අ) එවං, මෙසේ; පාතිමොක්ඛසංවරසීලාදිවසෙන, ප්‍රාතිමොක්ෂසංවර සීලාදීන් විසින්; චතුබ්බිධං, චතුර්විධ වෙ.

(ආ) පඤ්චවිධකොට්ඨාසස්ස, පඤ්චවිධකොට්ඨාසයාගේ; පඨමපඤ්චකෙ, පළමුවනපඤ්චකයෙහි; අනුපසම්පන්නසීලාදි වසෙන, අනුපසම්පන්නසීලාදි විසින්; අත්ථො වෙදිතබ්බො, අර්ථ දතයුතු; [වුත්තං හෙතං පටිසම්භිදායං, ප්‍රතිසම්භිදායෙහි මෙකියනලද මැයි] කතමං පරියන්තපාරිසුද්ධිසීලං, පර්‍ය්‍යන්තපරිසුද්ධිශීලනම් කවරයත්; අනුපසම්පන්නානං, උපසම්පන්න නොවූ; පරියන්තසික්ඛාපදානං, පර්‍ය්‍යන්ත ඇති ශික්ෂාපද ඇත්තවුන්ගේ; (**"පරියන්තා එතෙසං අත්ථීති පරියන්තානි සික්ඛාපදානි; තානි යෙසන්තෙ පරියන්තසික්ඛාපදානි තෙසං පරියන්තසික්ඛාපදානං"** යි ගන්තෙ-ගණන් වශයෙන් පර්‍ය්‍යන්තඇති ශික්ෂාපදඇත්තාහු පරියන්තසික්ඛාපදනම්වෙති. ඒ පර්‍ය්‍යන්තශික්ෂාපදයන්ගේ;) ඉදං, මේ සීලය; පරියන්තපාරිසුද්ධිසීලං, පර්‍ය්‍යන්තපාරිශුද්ධිශීලනම්; උපසම්පන්නානං, (කල්‍යාණපෘථුජ්ජන සෙක්ඛාසෙක්ඛ යන මොවුන් හැර) සෙසු උපසම්පන්නයන්ගේ; අපරියන්තසික්ඛාපදානං, අපර්‍ය්‍යන්ත ශික්ෂාපද ඇත්තවුන්ගේ; පුථුජ්ජනකල්‍යාණකානං, පෘථග්ජනකල්‍යාණජනයන්ගේ; කුසලධම්මෙයුත්තානං, විදර්ශනාචාරයෙහි යුක්තප්‍රයුක්තවූ;

අනපෙක්ඛානං පරිච්චත්තජීවිතානං. ඉදං පරිපුණ්ණපාරිසුද්ධිසීලං. කතමං අපරාමට්ඨපාරිසුද්ධිසීලං? සත්තන්නං සෙක්ඛානං. ඉදං අපරාමට්ඨපාරිසුද්ධිසීලං. කතමං පටිප්පස්සද්ධිපාරිසුද්ධිසීලං? තථාගතසාවකානං ඛීණාසවානං පච්චෙකබුද්ධානං තථාගතානං අරහන්තානං සම්මාසම්බුද්ධානං. ඉදං පටිප්පස්සද්ධි පාරිසුද්ධිසීලන්ති. තත්ථ.අනුපසම්පන්නානං සීලං ගණනවසෙන සපරියන්තත්තා පරියන්තපාරිසුද්ධී ති වෙදිතබ්බං;

උපසම්පන්නානං:-

59 නවකොටි සහස්සානි අසීතිං සතකොටියො
පඤ්ඤාසං සතසහස්සානි ඡත්තිංසා ච පුනාපරෙ.

---

සෙක්ඛපරියන්තෙ, ශෛක්‍ෂධර්‍මයන් පර්‍ය්‍යන්තකොටඇති ධර්‍මයන් කෙරෙහි; ("**සෙක්ඛධම්මො පරියන්තො පරමො මරියාදො එතස්සාති සෙක්ඛපරියන්තො**"- නාමරූපපරිච්ඡෙදයෙහි පටන් කුශලධර්‍ම සමාදානයෙහි හෝ පටන් ගොත්‍රභූව දක්වා ප්‍රවෘත්තකුසලධර්‍ම ප්‍රබන්ධය ශෛක්‍ෂධර්‍මයෙහි පැහැරසිටිහෙයින් සෙඛපරියන්තනම් නොහොත් ශෛක්‍ෂධර්‍මයන් පශ්චිමාන්තකොටඇතිවූ ශෛක්‍ෂ කලපවූ ලෞකික ත්‍රිවිධශික්‍ෂාවෝ සෙඛපරියන්තනම් වෙත්.) ඒ සෙක්ඛපරියන්තයෙහි; පරිපූරකාරීනං, කිසි ශික්‍ෂාවකුදු නොහැර පුරන්නාවූ; කායෙ ච ජීවිතෙ ච අනපෙක්ඛානං, මතුයෙහි විශෙෂාධිගමයපිණිස කායෙහි දු ජීවිතයෙහි දු නිරපෙක්‍ෂවූ; පරිච්චත්ත ජීවිතානං, එහෙයින්ම සීලපූරණයපිණිස පරිත්‍යක්තවූ ජීවිතඇත්තවුන්ගේ; ඉදං, මේ; පරිපුණ්ණපාරිසුද්ධිසීලං, පරිපූර්‍ණපාරිශුද්ධිශීල නම්; සත්තන්නං සෙක්ඛානං, සප්තවිධශෛක්‍ෂයන්ගේ; ඉදං, මේ ශීලය; [අපරාමට්ඨත්තා, දෘෂ්ටිසංක්ලෙශයෙන් අපරාමෘෂ්ටබැවින්;] අපරාමට්ඨපාරිසුද්ධිසීලං, අපරාමෘෂ්ටපාරිශුද්ධිශීලනම්; තථාගතසාවකානං ඛීණාසවානං, තථාගතශ්‍රාවකවූ ක්‍ෂීණාශ්‍රවයන්ගේ ද; පච්චෙකබුද්ධානං, ප්‍රත්‍යෙකබුද්ධයන්ගේ ද; තථාගතානං අරහන්තානං, තථාගතවූ අර්හත්වූ සම්‍යක්සම්බුද්ධයන්ගේ ද; ඉදං, මේ සීලයතෙමෙ; පටිප්පස්සද්ධිපාරිසුද්ධිසීලං, ක්ලෙශයන් සර්‍වාකාරයෙන් සංහිඳීමෙන් පිරිසුදුබැවින් පටිප්පස්සද්ධිපාරිශුද්ධිශීලනම්; තත්ථ, ඒපාලියෙහි; (අනුපසම්පන්නදවූ අසෙක්ඛසෙක්ඛ කල්‍යාණපුථුජ්ජනයන්ගේ ශීලය මහානුභාවහෙයින් ආනුභාව වශයෙන් අපර්‍ය්‍යන්තමවේනුයි "ගණනවසෙන ස පරියන්තත්තා"යි කීහු.

උපසම්පන්නානං, උපසම්පන්නයන්ගේ;

59. නවකොටිසහස්සානි,නවකෙළදහසෙක්ද;අසීතිං සතකොටියො, එක්සියක්කෙළක් හා අසූකෙළක්ද; පඤ්ඤාසං සතසහස්සානි, පනස් ලක්‍ෂයෙක්ද; ඡත්තිංසා ච පුනාපරෙ, නැවත අනික්සතිසෙක්ද;

60 එතෙ සංවරවිනයා සම්බුද්ධෙන පකාසිතා
පෙය්‍යාලමුඛෙන නිද්දිට්ඨා, සික්ඛා විනයසංවරෙ ති.

(අ) එවං ගණනවසෙන සපරියන්තම්පි අනවසෙසවසෙන සමාදානභාවං ලාභයසඤාතිඅඞ්ගජීවිතවසෙන අදිට්ඨපරියන්තභාවඤ්ච සන්ධාය අපරියන්තපාරිසුද්ධි ති වෙදිතබ්බං, චීවරගුම්බකවාසීඅම්බඛාදකමහාතිස්සත්ථෙරස්ස සීලම්ව; තථා හි සො ආයස්මා.

61 ධනං චජෙ යො පන අඞ්ගහෙතු
අඞ්ගං චජෙ ජීවිතං රක්ඛමානො
අඞ්ගං ධනං ජීවිතං චාපි සබ්බං
චජෙ නරො ධම්ම මනුස්ස රන්තොති.

(අ) ඉමං සප්පුරිසානුස්සතිං අවිජහන්තො ජීවිතසංසයෙපි සික්ඛාපදං අවීතික්කම්ම තදෙව අපරියන්තපාරිසුද්ධිසීලං නිස්සාය උපාසකස්ස පිට්ඨිගතො ව අරහත්තං පාපුණි. යථාහ:-

---

60. විනයසංවරෙ, විනයපිටකයෙහි; පෙය්‍යාලමුඛෙන නිද්දිට්ඨා, ඒ ඒ තැන විස්තරවාරයෙන් දක්වනලද; එතෙ සංවරවිනයා, කාය වාක් දෙදෙනා සංවරණයකරන හෙයින්ද විනයනය කරනහෙයින්ද සංවරවිනයනම්වූ; සික්ඛා, ශීලසඞ්ඛ්‍යාත ශික්ෂාවෝ; සම්බුද්ධෙන සවුනේදත්තහුවිසින්; පකාසිතා, පහළකරනලදහු;

(අ) එවං, මෙසේ; ගණනවසෙන පරියන්තම්පි, ගණන්විසින් පර්‍ය්‍යන්තඇත්තේද; අනවසෙසවසෙන, උපසම්පන්නයාවිසින්, හික්මිය යුතුවූ සියලු ශීලය නිරවශෙෂවශයෙන්; සමාදානභාවං, සමාදාන ස්වභාවයද; ලාභයසඤාතිඅඞ්ගජීවිතවසෙන, ලාභය යශය නෑහැය අඞ්ගය ජීවිතය යනමොවුන්ගේ හෙතුවෙනුදු; අදිට්ඨපරියන්ත භාවඤ්ච, නොදක්වනලද කෙළවරඇති බවද; සන්ධාය, සඳහා; අපරියන්තපාරිසුද්ධි ති වෙදිතබ්බං, අපර්‍ය්‍යන්තපාරිශුද්ධියයි දතයුතු; චීවර ගුම්බකවාසී එනම්තැන වසන; අම්බඛාදකමහාතිස්සත්ථෙරස්ස අම්බඛාදකමහාතිස්ස නම් තෙරුන්ගේ; සීලම්ව, ශීලයමෙනි; තථාහි, එසේමැනු-සො ආයස්මා, ඒ ඇවැත්තෙමේ.

61. ධනඤ්චජෙ අඞ්ගහෙතු, (පාරිපන්ථික සොරආදීන්විසින් උපද්‍රැත වූයෙ) අඞ්ගයහෙතුකොට ධන දෙන්නේය; අඞ්ගං චජෙ ජීවිතං රක්ඛමානො, (සර්පදෂ්ටාදි කාලයෙහි) දිවිරක්නේ අඞ්ගහරනේය; (දෂ්ටස්ථානය කපා හරනේය යන අර්ථයි.) අඞ්ග, කරචරණාදිඅඟද; ධනං, ධනය ද; ජීවිතං, ජීවිතය ද යන; සබ්බං, සියල්ල; ධම්ම මනුස්සරන්තො නරො, (සුතසොම මහාබොධිසත්වාදීන් මෙන්) ධර්මස්මරණයකරන සත්වතෙමේ; චජෙ, හරනෙය යන.

(අ) ඉමං සප්පුරිසානුස්සතිං, මේ මහාපුරුෂයන්ගෙ චින්තාව; අවිජහන්තො, නොහරනේ; ජීවිතසංසයෙපි, (ක්ෂුධාපරිශ්‍රමයෙන්) ජීවිත සංශයඇතිකල්හි දු; සික්ඛාපදං අවීතික්කම්ම, (අස්වාමිකවූ අඹපක්

62 "න පිතා නපි තෙ මාතා න ඤාති නපි බන්ධවො
කරොන්තෙතාදිසං කිච්චං සීලවන්තස්ස කාරණා.
63 සංවෙගං ජනයිත්වාන සම්මසිත්වාන යොනිසො
තස්ස පිට්ඨිගතෝ සන්තෝ අරහත්තං අපාපුණී"ති—

(අ) පුථුජ්ජන කල්‍යාණකානං සීලං උපසම්පදතො පට්ඨාය සුධොත ජාතිමණි විය සුපරිකම්මකතසුවණ්ණං විය ච අතිපරිසුද්ධත්තා චිත්තුප්පාදමත්තෙන පි මලෙන විරහිතං අරහත්තස්සෙව පදට්ඨානං හොති. තස්මා පරිපුණ්ණපාරිසුද්ධී ති වුච්චති:—

(ආ) මහාසඞ්ඝරක්ඛිත භාගිනෙය්‍යසඞ්ඝරක්ඛිතත්ථෙරානං විය-මහාසඞ්ඝරක්ඛිතත්ථෙරං කිර අතික්කන්තසට්ඨිවස්සං මරණමඤ්චෙ නිපන්නං

---

සමීපයෙහි ගසින් වැගිරතුබූව ද ප්‍රතිග්‍රාහකයෙකු නැතිබැවින් නොවළඳන්නහු) අප්‍රතිග්‍රහණශික්ෂාපදය නොඉක්මු; තදෙව අපරියන්තපාරිසුද්ධිසීලං නිස්සාය, එම අපයර්‍යන්තපාරිශුද්ධිශීලය නිසා; උපාසකස්ස පිට්ඨිගතොව, උපාසකයා පිට හිඳම; අරහත්තං පාපුණි, රහත්බවම පැමිණි; යථාහ, කීයේ

62. තෙ, තාගෙ; න පිතා, පියෙක් නොද වෙයි; නපිමාතා, මවෙක් නොදවෙයි; න ඤාති, නෑඑකෙක් නොදවෙයි; නපි බන්ධවො, සබන්ධුවෙක් ඇත්තේ නොදවෙයි; එතාදිසං කිච්චං, මෙබඳුකෘත්‍යය; (හෙවත් පිට හිඳුවා ගෙනගොම දසරුවෙන් ඉසිලීම්ආදි කෘත්‍යය;) සීලවන්තස්ස කාරණා, සිල්වත්බව හෙයින්; කරොන්ති, කරන්නේ යි.

63. සංවෙගං ජනයිත්වාන, මෙසේ සංවෙග උපදවා; යොනිසො, නුවණින්; සම්මසිත්වාන, සනමශීනයකොට; තස්ස, ඒ උපාසකයාගේ; පිට්ඨිගතො සන්තො, පිටහුන්නේම; අරහත්තං අපාපුණි, රහත්බවට පැමිණියෝ—

(අ) [පුථුජ්ජනකල්‍යාණකානං සීලං, කල්‍යාණපෘථග්ජනයන්ගේ ශීලය;] උපසම්පදතො පට්ඨාය, උපසම්පත්තියෙහි පටන්; සුධොතජාති මණිවිය, මනාකොට දූහැළිකළ[1] ජාති මිණිරුවනක් මෙන්; සුපරිකම්මකතසුවණ්ණං විය ච, මනාකොට පරිකම්මකරනලද සවණ්ණයක් මෙන් ද; අතිපරිසුද්ධත්තා, ඉතා පිරිසුදුහෙයින්; චිත්තුප්පාදමත්තෙනපි මලෙන, අකුසලචිත්තොත්පාදමාත්‍රමලයෙකිනු දු; විරහිතං, වියුක්ත වූයෙ; අරහත්තස්සෙව පදට්ඨානං හොති, අර්හත්වයටම කාරණ වේද; තස්මා, එහෙයින්; පරිපුණ්ණපාරිසුද්ධී ති වුච්චති, පරිපූර්ණපාරිශුද්ධිය යි කියනුලැබේ;

(ආ) මහාසඞ්ඝරක්ඛිතභාගිනෙය්‍යසඞ්ඝරක්ඛිතත්ථෙරානං විය, මහාසඞ්ඝරක්ෂිතස්ථවිරයන් හා උන්ගේ බෑණ හෙයින් භාගිනෙය්‍යසඞ්ඝරක්ෂිත ස්ථවිරයන්හා දෙදෙනාගේ ශීලය මෙනි; මහාසඞ්ඝරක්ඛිතත්ථෙරං

---

1 දූහිල් කිලු-ඇතැම.

භික්ඛුසඞ්ඝො ලොකුත්තරාධිගමං පුච්ඡි. ථෙරො නත්ථි මෙ ලොකුත්තරධම්මොති ආහ. අථස්ස උපට්ඨාකො දහරභික්ඛු ආහ:–භන්තෙ තුම්හෙ පරිනිබ්බුතාති සමන්තා ද්වාදසයොජනා මනුස්සා සන්නිපතිතා, තුම්හාකං පුථුජ්ජනකාලකිරියාය මහාවිප්පටිසාරො භවිස්සතීති. ආවුසො අහං මෙත්තෙය්‍යං භගවන්තං පස්සිස්සාමීති විපස්සනං න පට්ඨපෙසිං,

(අ) තෙනහි මං නිසීදාපෙත්වා ඔකාසං කරොහීති. සො ථෙරං නිසීදාපෙත්වා බහි නික්ඛන්තො. ථෙරො තස්ස සහ බහි නික්ඛමණෙනෙව අරහත්තං පත්වා අච්ඡරිකාය සඤ්ඤං අදාසි. සඞ්ඝො සන්නිපතිත්වා ආහ:–භන්තෙ එවරූපෙ මරණකාලෙ ලොකුත්තරධම්මං නිබ්බත්තෙන්තා දුක්කරං කරිත්ථාති. නාවුසො එතං දුක්කරං, අපි ච වො දුක්කරං ආචික්ඛිස්සාමි, අහං ආවුසො පබ්බජිතකාලතො පට්ඨාය අසතියා අඤ්ඤාණපකතං කම්මං නාම න සරාමීති. භාගිනෙය්‍යොපිස්ස පඤ්ඤාසවස්සකාලෙ එවමෙව අරහත්තං පාපුණීති.

---

කිර, මහාසඞ්ඝරක්ෂිතස්ථවිරයන්; අතික්කන්තසට්ඨිවස්සං, ඉක්මුණු සැට වයස් ඇත්තවුන්; මරණමඤ්චෙ නිපන්නං, මරණමඤ්චයෙහි හොත්ත වුන්; භික්ඛුසඞ්ඝො ලොකුත්තරාධිගමං පුච්ඡි, භික්ෂුසඞ්ඝයා ලොකොත්තරධර්මප්‍රතිලාභය පිළිවිස්සෝ; ථෙරො, තෙරහු; නත්ථි මෙ ලොකුත්තර ධම්මොති ආහ, මට ලොකොත්තරධර්මයෙක් නැතැයි කීවු; අථ, ඉක්බිත්තෙන්; අස්ස, ඒ තෙරුන්ගෙ; උපට්ඨාකො දහර භික්ඛු, උපස්ථානකරන ළදරු භික්ෂුතෙමෙ; ආහ, මෙසේ කී; භන්තෙ, වහන්ස; තුම්හෙ පරිනිබ්බුතාති, නුඹ පිරිනිවියහයි; සමන්තා, හාත්පසින්; ද්වාදස යොජනා මනුස්සා, දොළොස්යොදනෙක මිනිස්සු; සන්නිපතිතා, රැස්වූහු; තුම්හාකං පුථුජ්ජනකාලකිරියාය, නුඹගෙ පෘථග්ජන කාලක්‍රියාවෙන්; මහා විප්පටිසාරො භවිස්සතීති, රහත්යයි නිෂ්කාරණයෙහි ආම්හයි මහත් විප්‍රතිසාරවන්නේය යි; ආවුසො, ඇවැත; අහං, මම; මෙත්තෙය්‍යං භගවන්තං පස්සිස්සාමීති, මෛත්‍රෙයභගවත්හු දක්මි යි; විපස්සනං න පට්ඨපෙසිං, විදර්ශනාව පටන්නොගත්මි යි.

(අ) තෙනහි, එසේ බැවින්; මං නිසීදාපෙත්වා, මා හිඳුවාලා; ඔකාසං කරොහීති, අවකාසකරුයි; සො, හෙතෙම්; ථෙරං නිසීදාපෙත්වා, තෙරුන් හිඳුවා; බහි නික්ඛන්තො, පිටතට නික්මිණි; ථෙරො, තෙරහු; තස්ස, ඔහුගේ; සහ [බහි] නික්ඛමණාව, [පිටතට] නික්මීම හා එක්වම; අරහත්තං පත්වා, රහත්බවට පැමිණ; අච්ඡරිකාය, අසුරු පැහැර; සඤ්ඤං අදාසි, එනුපිණිස සංඥකළෝ; සඞ්ඝො, සඞ්ඝතෙමෙ; සන්නිපතිත්වා, රැස්ව; ආහ, මෙසේ කී; භන්තෙ, වහන්ස; එවරූපෙ මරණකාලෙ, මෙබඳු මරණසමයෙහි; ලොකුත්තරධම්මං නිබ්බත්තෙන්තා, ලොකොත්තරධර්මය නිපදවා; දුක්කරං කරිත්ථාති, දුෂ්කරයක් කළහයි; නාවුසො එතං දුක්කරං, ඇවැත්නි මෙ දුෂ්කර නොවෙයි; අපි ච, එකෙක්ඇති; වො දුක්කරං ආචික්ඛිස්සාමි, තොපට දුෂ්කරයක් කියමි; ආවුසො, ඇවැත්නි; අහං, මම; පබ්බජිතකාලතො

64 අප්පස්සුතොපි චෙ හොති සීලෙසු අසමාහිතො
උභයෙන නං ගරහන්ති සීලතො ච සුතෙන ච

65 අප්පස්සුතො පි චෙ හොති සීලෙසු සුසමාහිතො
සීලතො නං පසංසන්ති නාස්ස සම්පජ්ජතෙ සුතං.

66 බහුස්සුතොපි චෙ හොති සීලෙසු අසමාහිතො
සීලතො නං ගරහන්ති නාස්ස සම්පජ්ජතෙ සුතං.

67 බහුස්සුතො පි චෙ හොති සීලෙසු සුසමාහිතො
උභයෙන නං පසංසන්ති සීලතො ච සුතෙන ච.

---

පටඨාය, පැවිදිවූකලපටන්ගෙන; අසතියා, සිහිනැතිව; අඤ්ඤදත්ථුපකතං කම්මං නාම, නොදන්න කළකම්මයක්නම්; න සරාමි ති, සිහිනොකෙරෙමි සි; අස්ස, ඒ තෙරුන්ගේ; භාගිනෙය්‍යොපි, බෑණනෙර හු දු; පඤ්ඤාසවස්සකාලෙ, පනස්හැවිරිදිසමයෙහි; එවමෙව, එසේම; අරහත්තං පාපුණි,[1] රහත්බවට පැමිණියෝ.

64. අප්පස්සුතොපි චෙ හොති, සූත්‍රගෙයාදිවූ ඇසූතැනක් ඉදින් නැත්තේවීනම්; සීලෙසු අසමාහිතො, ප්‍රාතිමොක්ෂසංවරාදි ශීලයෙහි දු මනාකොට නොපිහිටියෙ වීනම්; සීලතො ච, ශීලයෙන් ද; සුතෙන ච, ශ්‍රැතයෙන් ද යන; උභයෙන ච, දෙකින්ම; නං, ඔහු; ගරහන්ති, ගර්හාකෙරෙත්.

65. අප්පස්සුතොපි චෙ හොති, ඉදින් ඇසූතැනක් නැත්තේවී නමු දු; සීලෙසු සුසමාහිතො, ශීලයෙහි මනාකොට පිහිටියේවීනම්; නාස්ස සම්පජ්ජතෙ සුතං, මොහට ඇසූතැන්නැතිහෙයින් ශ්‍රැතයෙන් ප්‍රශංසාවෙක් නොවේ නමු දු; සීලතො නං පසංසන්ති, උහුබ ශීලයෙන් ප්‍රශංසාකෙරෙත්.

66. බහුස්සුතො, බහුශ්‍රැතතෙමෙ; ("චෙ" යනු නිපාතපමණෙකි;) සීලෙසු අසමාහිතො හොති, ශීලයෙහි නොපිහිටා නම්; නං, උහු; සීලතො ගරහන්ති, ශීලයෙන් ගර්හාකෙරෙති; අස්ස, ඔහුගේ; සුතං, ශ්‍රැතයතෙමෙ; න සම්පජ්ජතෙ, තමහට ද අනුන්ට ද සම්පත්ති නො එළවා; (දුශශීලබැවින් තමහට ද දුශශීලපුද්ගලයයි සිල්වතුන් නො එළඹෙනබැවින් අනුන්ට ද සම්පත් නො එළවාය යන අර්ථයි.)

67. බහුස්සුතොපි චෙ හොති, ඉදින් බහුශ්‍රැතවීනම්; සීලෙසු සුසමාහිතො, ශීලයෙහි මනාකොට පිහිටියේවීනම්; සීලතො ච, ශීලයෙන් ද; සුතෙන ච, ශ්‍රැතයෙන් ද යන; උභයෙන, දෙකින්ම; නං, ඔහු; පසංසන්ති, ප්‍රශංසාකෙරෙත්.

---

1. අකාසි කුලෙ-ඇතැම්.

68 බහුස්සුතං ධම්මධරං සප්පඤ්ඤං බුද්ධසාවකං
නෙක්ඛං ජම්බොනදස්සෙව කො තං නින්දිතුමරහති
දෙවාපි නං පසංසන්ති බ්‍රහ්මුනාපි පසංසිතො ති෴

(ඈ) සෙඛානං පන සීලං දිට්ඨිවසෙන අපරාමට්ඨත්තා-පුථුජ්ජනානං වා පන භවවසෙන අපරාමට්ඨසීලං අපරාමට්ඨපාරිසුද්ධි ති වෙදිතබ්බං-කුටුම්බියපුත්තතිස්සත්ථෙරස්ස සීලං විය. සො හි ආයස්මා තථාරූපං සීලං නිස්සාය අරහත්තෙ පතිට්ඨාතුකාමො වෙරිකෙ ආහ෴

69 උභො පාදානි භින්දිත්වා සංයමිස්සාමි වො අහං
අට්ටියාමි හරායාමි සරාගමරණං අහන්ති[1]෴

(ඉ) අඤ්ඤතරොපි මහාථෙරො බාළ්හගිලානො සහත්ථා ආහාරං පරිභුඤ්ජිතුං අසක්කොන්තො සකෙ මුත්තකරීසෙ පලිපන්නො සම්පරිවත්තති. තං දිස්වා අඤ්ඤතරො දහරො අහො දුක්ඛා ජීවිතසඞ්ඛාරා ති ආහ෴

---

68. බහුස්සුතං, බොහෝ ඇසූතැන්ඇති; ධම්මධරං, ඇසූධර්මය ධැරූ; සප්පඤ්ඤං, ප්‍රඥාසම්පන්නාවූ; තං බුද්ධසාවකං, ඒ බුද්ධශ්‍රාවකයා; නෙක්ඛං ජම්බොනදස්සෙව, ජම්බොනදනම් රන්නිකක්මෙන්; කො නින්දිතුං අරහති, කවරෙක් නින්දාකරන්නට සුදුසු ද; දෙවාපි, දෙවියෝ ද; නං පසංසන්ති, ඔහට ප්‍රසංසා කෙරෙති; බ්‍රහ්මුනාපි, බඹහුවිසිනු දු; පසංසිතො, ප්‍රශංසිත නම් වේ෴

(ඈ) සෙඛානං පන සීලං, ශෛක්ෂයන්ගේ ශීලය; දිට්ඨිවසෙන අපරාමට්ඨත්තා, දෘෂ්ටිවශයෙන් අපරාමෘෂ්ටබැවින්; පුථුජ්ජනානං වා පන, පෘථග්ජනයන්ගේම හෝ වනාහි; භවවසෙන අපරාමට්ඨසීලං, භව විසින් අපරාමෘෂ්ටශීලය; ("භව වසෙන" යනුයෙන් තෘෂ්ණාපරාමාශ නැතිබවූකීහු;) අපරාමට්ඨපාරිසුද්ධි ති, අපරාමෘෂ්ටපාරිශුද්ධියයි; වෙදිතබ්බං, දතයුතු; කුටුම්බියපුත්තතිස්සත්ථෙරස්ස, කුටුම්බියපුත්තතිස්ස නම් තෙරුන්ගේ; සීලං විය, ශීලය මෙනි; සො හි ආයස්මා, ඒ ඇවත් තෙමේ; තථාරූපං සීලං නිස්සාය, භවවශයෙන් අපරාමෘෂ්ටශීලයනිසා; අරහත්තෙ පතිට්ඨාතුකාමො, අර්හත්වයෙහි පිහිටනු කැමැත්තේ; වෙරිකෙ ආහ, වෛරීන්ට මෙසේ කී෴

69. උභො පාදානි භින්දිත්වා, දෙපය බිඳ; අහං, මම; සංයමිස්සාමි, මදවිගසක් මා හරනට ගිවිස්වම්; අහං, මම; සරාගමරණං, සරාගමරණය; අට්ටියාමි, ජුගුප්සාකෙරෙම්; හරායාමි, ලජ්ජාකෙරෙම්෴

(ඉ) අඤ්ඤතරොපි මහාථෙරො, එක්තරා මහතෙරකෙනෙකු දු; බාළ්හගිලානො, ඉතා ගිලන්වූවාහු; සහත්ථා අහාරං පරිභුඤ්ජිතුං අසක්කොන්තො, ස්වහස්තයෙන් අහර කෑ නොහෙන්නාහු; සකෙ මුත්තකරීසෙ පලිපන්නො, තමන්ගේ මූත්‍රකරීෂයෙහි ගැලුනාහු;

---

1. එවාහං චින්තයිත්වාන-පෙ-ත්‍රි. මු.

(ඇ) තමෙනං මහාථෙරො ආහ:-ආවුසො ඉදානි මීයමානො සග්ග සම්පත්තිං ලභිස්සාමි, නත්ථි මෙ එත්ථ සංසයො, ඉමං පන සීලං භින්දිත්වා ලද්ධසම්පත්ති නාම සික්ඛං පච්චක්ඛාය පටිලද්ධගිහිභාවසදිසීති වත්වා සීලෙනෙව සද්ධිං මරිස්සාමීති තථෙව නිපන්නො තමෙව රොගං සම්මසන්තො අරහත්තං පත්වා භික්ඛුසඞ්ඝස්ස ඉමාහි ගාථාහි ව්‍යාකාසි.

70 ඵුට්ඨස්ස මෙ අඤ්ඤතරෙන ව්‍යාධිනා
රොගෙන බාළ්හං දුඛිතස්ස රුප්පතො
පරිසුස්සති ඛිප්පමිදං කලෙබරං
පුප්ඵං යථා පංසුනි ආතපෙ කතං

71 අජඤ්ඤං ජඤ්ඤසඞ්ඛාතං අසුචිං සුචිසම්මතං
නානාකුණපපරිපූරං ජඤ්ඤරූපං අපස්සතො.

---

සම්පරිවත්තන්ති, ඇලයෙන්, ඇලයට පෙරළෙන්නාහු; තං දිස්වා, ඔවුන් දැක; අඤ්ඤතරො දහරො, එක්තරා ළදරු භික්ෂුවෙක්; අහො, ඛෙදය; ජීවිතසඞ්ඛාරා දුක්ඛාති, ආයුසංස්කාරයෝ දුඃඛයහයි; ආහ, කී.

(ඇ) තමෙනං, ඔහට; මහාථෙරො, මහාස්ථවිරයෝ; ආහ, මෙසේ කීවු; (දුඃඛජීවිතයහැර සුඛජීවිතයක් ලැබියහැකිවුව ද ඒ නොකැමැතිබව දක්වන්නෝ ආවුසො යනාදි කීහු.) ආවුසො, ඇවැත;[අහං, මම;]ඉදානි* මීයමානො, දැන් මියන්නෙම්; සග්ගසම්පත්තිං ලභිස්සාමි, ස්වර්ග සම්පත්තිලැබෙමි; නත්ථි මෙ එත්ථ සංසයො, මෙහි මට සංශයෙක් නැත; ඉමං පන සීලං භින්දිත්වා ලද්ධසම්පත්ති නාම, මේ ශීලය බිඳ ලබන සම්පත්ති නම්; සික්ඛං පච්චක්ඛාය පටිලද්ධ ගිහිභාවසදිසීති, සිඛ පිළිබෙව්කොට ලදගිහිබවක් වැන්නීය යි; වත්වා, කියා; සීලේනෙව සද්ධිං මරිස්සාමීති, ශීලය නොනසා ශීලයහා සමග මියෙමි; (කිසි කලෙක ද ශීලය නොහරිම් යි භවාදානයක් ඇතිකල්හි ශීලයෙන් වියොගය වේනම් ඒ භවග්‍රහණයම නොකෙරෙමි යන අභිප්‍රායයි.) තථෙව නිපන්නො, එසේම හෙව; තමෙව රොගං සම්මසන්තො, එම රොගසඞ්ඛ්‍යාතවෙදනාව ද (වෙදනාමුඛයෙන්සෙසු රූපාරූපධර්මයන් ගේද පරිග්‍රහකොට) සම්මර්ශනය කරන්නේ; අරහත්තං පත්වා, රහත් බවට පැමිණ; භික්ඛුසඞ්ඝස්ස, භික්ෂුසඞ්ඝයාහට; ඉමාහි ගාථාහි ව්‍යාකාසි, මේ ගාථාවෙන් අභීත්වය ප්‍රකාශකෙළේ.

70. අඤ්ඤතරෙන ව්‍යාධිනා, එක්තරාව්‍යාධියකින්; ඵුට්ඨස්ස, පහරණලද; රොගෙන, වෙදනාවෙන්; බාළ්හං, අත්‍යර්ථයෙන්; දුඛිතස්ස, දුඃඛිතවූ; රුප්පතො, විකාරයට පමුණුවනලද ශරීරඇති; මෙ, මාගේ; ඉදං කලෙබරං, මේ කලෙවරය; පරිසුස්සති, හාත්පසින් වියළේ; ආතපෙ පංසුනි, හිරුරැසින් සන්තප්තවූ පාංසුවෙහි; කතං, තබනලද; පුප්ඵං යථා, මහරිආදි මල්මෙනි.

71. අජඤ්ඤං, අමනොඥවූ; ජඤ්ඤසඞ්ඛාතං, අඥානයන් විසින් මනොඥය යි කියනලද; අසුචිං, සුචිනොවූ; සුචිසම්මතං, සුචිය යි

72 ධිරත්ථුමං ආතුරං පූතිකායං
දුග්ගන්ධියං අසුචිං ව්‍යාධිධම්මං
යත්ථප්පමත්තා අධිමුච්ඡිතා පජා
හාපෙන්ති මග්ගං සුගතූපපත්තියාති෴

(අ) අරහන්තාදීනං පන සීලං සබ්බදරථපටිප්පස්සද්ධියා පරිසුද්ධත්තා පටිප්පස්සද්ධි පාරිසුද්ධීති වෙදිතබ්බං. එවං පරියන්තපාරිසුද්ධිආදිවසෙන පඤ්චවිධං෴

(ආ) දුතියපඤ්චකෙ:- පාණාතිපාතාදීනං පහානාදිවසෙන අත්ථො වෙදිතබ්බො. වුත්තංහෙතං පටිසම්භිදායං" පඤ්චසීලානි; පාණාතිපාතස්ස පහානං සීලං, වෙරමණිසීලං, චෙතනා සීලං, සංවරෙසීලං,

---

අභිමතවූ; නානාකුණපපරිපූරං, නොයෙක්කුණින් පිරුණාවූ; අප්පස්සතො, ප්‍රඥාචක්ෂුසින් නොබලන්නහුට; ජඤ්ඤරූපං, මනොඥ රූපයක්බඳුවූ.

72. ("ධි අත්ථු ඉමං"යි බිඳුනේ.) ආතුරං, දුක්පත්වූ; දුග්ගන්ධියං, දුර්ගන්ධඇති; අසුචිං, සුචි නොවන; ව්‍යාධිධම්මං, ව්‍යාධිස්වභාවවූ; ඉමං පූතිකායං, මේ පූතිශරීරයට; ධිරත්ථු, නින්දාවේවා; යත්ථ, යම්පූතිකායෙක; පමත්තා, රාගවශයෙන් ප්‍රමාදයටපැමිණි; අධිමුච්ඡිතා, ඉතා මූර්ඡිතවූ; පජා, සත්වයෝ; සුගතූපපත්තියා මග්ගං, සුගතියෙහි උත්පත්තියට මාර්ගවූ (ශීලය); හාපෙන්ති, පිරිහෙලති; ධ්‍යානාදියෙහි තියනුකිම යන අභිප්‍රායි෴

(අ) අරහන්තාදීනං පන ශීලං, රහතන් ආදීන්ගේ ශීලය; (ආදිගහණින් පසේබුදුන් සම්මාසම්බුදුන් ගත්හු;) සබ්බදරථපටිප්පස්සද්ධියා පරිසුද්ධත්තා, සියලු කෙලෙස් විඩා සන්සිඳීමෙන් පරිශුද්ධවන බැවින්; පටිප්පස්සද්ධි පාරිසුද්ධීති වෙදිතබ්බං, ප්‍රතිප්‍රශ්‍රබ්ධි පාරිශුද්ධි යයි දතයුතු; එවං, මෙසේ; පරියන්තපාරිසුද්ධි ආදිවසෙන පඤ්චවිධං, පර්‍ය්‍යන්තපාරිශුද්ධි ශීලාදි විසින් පඤ්චවිධවේ෴

(ආ) ("පාණාතිපාතාදීනං පහානාදිවසෙන" යනුයෙහි පාණාතිපාතාදීනං යන ආදිග්‍රහණින් රහත්මගින් වධ්‍යකෙලශයන් කෙළවර කොටඇති අදින්නාදානාදීන්ගෙ සඞ්ග්‍රහය ද "පහානාදි" යන ආදි ග්‍රහණින් වෙරමණි ආදි සතරදෙනාගේ සඞ්ග්‍රහය ද දතයුතු. හිරි ඔත්තප්පකරුණාඅලොභාදි ප්‍රධානවූ යම් කුසලචිත්තොත්පාදයකින් ප්‍රාණඝාතය ප්‍රහීණකරනලැබෙ ද ඒ ප්‍රාණඝාතයාගෙ ප්‍රහාණය ශීලනාර්ථයෙන් ප්‍රහාණශීල නම. එසේම ප්‍රාණඝාතයෙන් වැළක්ම විරමණ ශීලනම්වෙ- ප්‍රාණඝාතයට ප්‍රතිපක්ෂවූ චෙතනාව චෙතනාශීලනම. "පාණාතිපාතස්ස පහානං සීලං පාණාතිපාතස්ස වෙරමණිසීලන්ති"යි මෙසේ වෙන වෙන යෙදියයුතු. -පාණාතිපාතස්ස සංවරො සීලං,[1] ප්‍රාණාතිපාතයාගෙ සංවරණය (ප්‍රවෙශද්වාරපිධානය)

---

1. සංවරණං සීලං-ඇතැම්

අවීතික්කමො සීලං, අදින්නාදානස්ස; කාමෙසු මිච්ඡාචාරස්ස, මුසාවාදස්ස; පිසුණාවාචාය; ඵරුසාවාචාය; සම්ඵප්පලාපස්ස; අභිජ්ඣාය; ව්‍යාපාදස්ස; මිච්ඡාදිට්ඨියා; නෙක්ඛම්මෙන කාමච්ඡන්දස්ස; අව්‍යාපාදෙන ව්‍යාපාදස්ස; ආලොකසඤ්ඤාය ථීනමිද්ධස්ස; අවික්ඛෙපෙන උද්ධච්චස්ස; ධම්මවවත්ථානෙන විචිකිච්ඡාය; ඤාණෙන අවිජ්ජාය; පාමොජ්ජෙන අරතියා; පඨමෙන ඣානෙන නීවරණානං; දුතියෙන ඣානෙන විතක්කවිචාරානං; තතියෙන ඣානෙන පීතියා; චතුත්ථෙන ඣානෙන

---

සංවරශීල නම්; අවීතික්කමො සීලං, ප්‍රාණීඝාතයාගේ අව්‍යතික්‍රමණය අව්‍යතික්‍රමශීල නම; ("අදින්නාදානස්ස" යනාදියෙහි ද මෙම නය යි අභිධ්‍යාදීන්ගෙ වනාහි අනභිධ්‍යාදිවශයෙන් ප්‍රහාණය දතයුතු.) අදින්නාදානස්ස, අදත්තාදානයාගේ; කාමෙසු මිච්ඡාචාරස්ස, කාමමිථ්‍යාචාරයාගේ; මුසාවාදස්ස, මුසාවාදයාගේ; පිසුණාවාචාය, පිශුනවචනයාගේ; ඵරුසාවාචාය, පරුෂවචනයාගේ; සම්ඵප්පලාපස්ස, සම්ඵප්‍රලාපයාගේ; අභිජ්ඣාය, අභිධ්‍යාවගේ; ව්‍යාපාදස්ස, ව්‍යාපාදයාගේ; මිච්ඡාදිට්ඨියා, මිථ්‍යාදෘෂ්ටියගේ; ("පහානං සීලං" යනාදීන් හා යොදනු—මෙසේ දශකුශලකර්මපථවශයෙන් ප්‍රහාණාදි ශීලාදීන් දක්වා දූන් සළුපායවූ අෂ්ටසමාපත්තීන්ගේ ද අෂ්ටාදශමහාවිදර්ශනාදීන්ගේ ද ආර්‍යමාර්ගයන්ගේ ද වශයෙන් ප්‍රහාණාදිශීලයන් දක්වනු පිණිස "නෙක්ඛම්මෙන" යනාදි ආරම්භකොළේ ) නෙක්ඛම්මෙන, අලොභප්‍රධාන කුශලචිත්තොත්පාදයෙන්; කාමච්ඡන්දස්ස, කාමච්ඡන්දයාගේ; අව්‍යාපාදෙන, අව්‍යාපාදයෙන්; (මෛත්‍රියෙන්;) ව්‍යාපාදස්ස, ව්‍යාපාදයාගේ; ආලොකසඤ්ඤාය ථීනමිද්ධස්ස, (විභූතකොට මෙනෙහි කිරීමෙන් උපස්ථිතවූ) ආලොකසංඥාවෙන් ස්ත්‍යානමිද්ධයාගේ; අවික්ඛෙපෙන උද්ධච්චස්ස, සමාධීන් ඖද්ධත්‍යයාගේ; ධම්මවවත්ථානෙන විචිකිච්ඡාය, කුශලාදිධර්මයන්ගේ යථාව නිශ්චයෙන් (සප්‍රත්‍යය නාමරූපව්‍යවස්ථායෙනැයි ද යෙත්) විචිකිත්සාවගේ; මෙසේ කාමච්ඡන්දාදිනීවරණප්‍රහාණි වශයෙන් "අභිජ්ඣා ලොකෙ පහාය" යනාදීන් කියනලද ප්‍රථමධ්‍යානාදීන්ගේ අධිගමයට උපායවූ පූර්වභාගප්‍රතිපත්ති වශයෙන් ප්‍රහාණශීලාදීන් දක්වා දූන් සළුපායවූ අෂ්ටසමාපත්ති ආදීන්ගෙ වශයෙන් දක්වනපිණිස "ඤාණෙන" යනාදි කියනලදී—නාමරූපපරිග්‍රහකාංක්ෂාවිතරණයන්ට විබන්ධකවූ මොහයාගේ දූරීකරණයෙන් ඥාතපරිඥායෙහි සිටියහුට අනිත්‍යසංඥාදීහු සිද්ධවෙති එසේම ධ්‍යානසමාපත්තියෙහිම අභිරතිනිමිත්තවූ ප්‍රමොද්‍යයෙන් ඉහි අනභිරතිය දුරුකළකල්හි ධ්‍යානාදීන්ගේ සමධිගමය වේනුයි සමාපත්ති විදර්ශනාය යනමොවුන්ට අරතිවිනොදන අවිද්‍යාප්‍රදාලනයෝ උපාය නුයි "ඤාණෙන අවිජ්ජාය පාමොජ්ජෙන අරතියා" යි කීහු—උත්පටිපාටි නිද්දේශය වනාහි නීවරණස්වභාව අවිද්‍යානීවරණයන් කෙරෙහි දූ සඞ්ග්‍රහබව දක්වනපිණිසැයි දතයුතු.) පඨමෙන ඣානෙන නීවරණානං, ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන්ගේ; දුතියෙන ඣානෙන විතක්ක

සුඛදුක්ඛානං; ආකාසානඤ්චායතනසමාපත්තියා රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය; විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ආකාසානඤ්චායතනසඤ්ඤාය; ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය; නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය;

(ආ) අනිච්චානුපස්සනාය නිච්චසඤ්ඤාය; දුක්ඛානුපස්සනාය සුඛසඤ්ඤාය; අනත්තානුපස්සනාය අත්තසඤ්ඤාය; නිබ්බිදානුපස්සනාය නන්දියා; විරාගානුපස්සනාය රාගස්ස; නිරොධානුපස්සනාය සමුදයස්ස;

---

විචාරානං, ද්විතීයධ්‍යානයෙන් විතර්ක විචාරයන්ගේ; තතියෙන ඣානෙන පීතියා, තෘතීයධ්‍යානින් ප්‍රීතියගේ; චතුත්ථෙන ඣානෙන සුඛදුක්ඛානං, චතුර්ථධ්‍යානින් සුඛ දුඃඛයන්ගේ; ආකාසානඤ්චායතන සමාපත්තියා, ආකාශානන්ත්‍යායතනසමවතින්; රූපසඤ්ඤාය, රූපසංඥාවගේ; පටිඝසඤ්ඤාය, ප්‍රතිඝසංඥාවගේ; නානත්තසඤ්ඤාය, නානාත්වසංඥාවගේ; විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා, විඥානානන්ත්‍යායතන සමවතින්; ආකාසානඤ්චායතනසඤ්ඤාය; ආකාශානන්ත්‍යායතනසංඥාවගේ; ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා, ආකිඤ්චඤ්ඤායතන සමවතින්; විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය, විඤ්ඤාණඤ්චායතනසංඥාවගේ; නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා, නෛවසංඥානාසංඥායතන සමාපත්තින්; ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤාය, ආකිඤ්චන්‍යායතන සංඥාවගේ; (පහානං සීලං යී යොදනු–සුවිසුද්ධකායකම්මාදි ඇත්තක් හටම චිත්තසමාධානවසයෙන් ධ්‍යානයන් පවත්නාබැවින් මොවුන්ට ශීලභාවය හා එහි විරතීන්ගෙ සම්භවය කෙසේදයත්? මේ ධ්‍යාන ධර්මයෝ පරිත්තකුසලයන්මෙන් කායකර්මාදිය විශොධනයකිරීම වශයෙන් ද මාර්ගඵලධර්මයන් මෙන් දුශ්චරිත දුරාජීවයන් සමුච්ඡෙද පටිප්පස්සද්ධවසයෙන් ද පවත්නාහු නොවෙත්. මෙ සැබෑමය-මහද්ගත ධර්මයෙහි නිෂ්පර්‍යායයෙන් ශීලනාර්ථයෙක් නැත. විරමණාර්ථයෙක් කොයින්ද? මෙහි වනාහි නිෂ්පර්‍යායයෙන් විරමණයක් නැතුද පර්‍යායයෙන් ලැබේ–ඒ කෙසේදයත්? මහද්ගත කුශලධර්මයෝ යම් පමණෙකින් ප්‍රතිපක්ෂධර්මයන් පහකෙරෙත් ද එපමණෙකින් ප්‍රතිපක්ෂධර්මයන් කෙරෙන් විරමණය ද කෙරෙත් යම්සේ ප්‍රතිපක්ෂ ධර්මයෝ සිතට නොනැගෙද්ද එසේ සංවෘතද වෙත්. මනොද්වාරයෙහි පර්‍යුත්ථාන සඞ්ඛ්‍යාත ව්‍යතික්‍රමය ද නොකෙරෙත් චෙතනා වනාහි තත්සම්ප්‍රයුක්තම වෙයි මෙසේ පර්‍යායයෙන් ශීලභාවය දතයුතු.)

(අ) අනිච්චානුපස්සනාය, ත්‍රෛභූමක ධර්මයන්ගේ අනිත්‍යතාව ගෙන පවත්නාවූ අනිත්‍යානුදර්ශනාවෙන්; නිච්චසඤ්ඤාය, නිත්‍යයහ යන සංඥාවගෙ; දුක්ඛානුපස්සනාය, දුඃඛානුදර්ශනාවෙන්; සුඛසඤ්ඤාය, සුඛසංඥාවගේ; අනත්තානුපස්සනාය, අනාත්මානුදර්ශනාවෙන්; අත්තසඤ්ඤාය; ආත්මසංඥාවගේ; නිබ්බිදානු පස්සනාය, නිර්වේදානු දර්ශනාවෙන්; නන්දියා, සප්‍රීතිකතෘෂ්ණාවගේ; විරාගානුපස්සනාය, විරජ්ජනා

පටිනිස්සග්ගානුපස්සනාය ආදානස්ස; ඛයානුපස්සනාය ඝනසඤ්ඤාය; වයානුපස්සනාය ආයූහනස්ස; විපරිණාමානුපස්සනාය ධුවසඤ්ඤාය; අනිමිත්තානුපස්සනාය නිමිත්තස්ස; අප්පණිහිතානුපස්සනාය පණිධියා; සුඤ්ඤතානුපස්සනාය අභිනිවෙසස්ස; අධිපඤ්ඤාධම්මවිපස්සනාය සාරාදානාභිනිවෙසස්ස; යථාභූතඤාණදස්සනෙන සම්මොහාභිනිවෙසස්ස; ආදීනවානුපස්සනාය ආලයාභිනිවෙසස්ස; පටිසඞ්ඛාධම්මානුපස්සනාය [1] අප්පටිසඞ්ඛාය; විවට්ටානුපස්සනාය සංයොගාභිනිවෙසස්ස; සොතාපත්තිමග්ගෙන දිට්ඨෙකට්ඨානං කිලෙසානං; සකදාගාමිමග්ගෙන ඔළාරිකානං කිලෙසානං;

---

කාරයෙන් පවත්නා අනුපස්සනාවෙන්; රාගස්ස, සංස්කාරවිෂය රාගයාගෙ; නිරොධානුපස්සනාය, සංස්කාරයන්ගෙ නිරොධබලන අනුපස්සනාවෙන්; සමුදයස්ස, තෘෂ්ණාවගෙ; පටිනිස්සග්ගානුපස්සනාය, සංස්කාරයන් හරණාකාරයෙන් පවත්නා අනුපස්සනාවෙන්; ආදානස්ස, නිත්‍යාදිවිසින් ග්‍රහණයාගෙ; ඛයානුපස්සනාය, ක්ෂයානුදර්ශනාවෙන්; ඝනසඤ්ඤාය, සන්තති සමූහකෘත්‍යාලම්බනවශයෙන් එකත්ව ග්‍රහණසඞ්ඛ්‍යාත ඝනසංඥාවගෙ; වයානුපස්සනාය, ව්‍යයානුදර්ශනාවෙන්; ආයූහනස්ස, අභිසංස්කරණයාගෙ; විපරිණාමානුපස්සනාය, සංස්කාරයන්ගෙ අවස්ථාවිශෙෂාපත්තිසඞ්ඛ්‍යාත විපරිණාමයාගෙ අනුදර්ශනයෙන්; ධුවසඤ්ඤාය, ස්ථිරභාවග්‍රහණසඞ්ඛ්‍යාත ධ්‍රැවසංඥාවගෙ; අනිමිත්තානුපස්සනාය, අනිමිත්තානුදර්ශනාවෙන්; නිමිත්තස්ස, සමූහාදි ඝනවශයෙනුදු සකෘත්‍ය පරිච්ඡෙදයෙනුදු සංස්කාරයන්ගෙ සවිග්‍රහතාසඞ්ඛ්‍යාත නිමිත්තයාගෙ; අප්පණිහිතානුපස්සනාය, අප්‍රණිහිතානුදර්ශනාවෙන්; පණිධියා, සංස්කාරයන් කෙරෙහි නිම්නතෘෂ්ණා ප්‍රණිධියගෙ; සුඤ්ඤතානුපස්සනාය, ශූන්‍යතානුදර්ශනාවෙන්; අභිනිවෙසස්ස, ආත්මානුදෘෂ්ටිසඞ්ඛ්‍යාත අභිනිවෙශයාගෙ; අධිපඤ්ඤාධම්මවිපස්සනාය, අනිත්‍යාදිවිසින් සියලු ත්‍රෛභූමකධර්මතීරණයකරන අධිප්‍රඥාධර්මානුදර්ශනාවෙන්; සාරාදානාභිනිවෙසස්ස, අසාරයෙහි සාරග්‍රහණවිපර්‍ය්‍යාසයාගෙ; යථාභූතඤාණදස්සනෙන, ස්ථිරභාවප්‍රාප්ත අනිත්‍යානුදර්ශනාසඞ්ඛ්‍යාත යථාභූතඥානදර්ශනයෙන්; (සත්‍යයෙහි සප්‍රත්‍යයනාමරූප දර්ශනය යථාභූතඥානදර්ශන නමැයි කීහ-සමහරු උදයව්‍යයඥානය යෙත්.) සම්මොහාභිනිවෙසස්ස, "ඉස්සරකත්තාදිවසෙන ලොකො සමුප්පන්නො"යි-කරන අභිනිවෙශය සම්මොහාභිනිවෙශනම උහුගේය යන අර්ථයි; (සත්‍යයෙහි ශාස්වතඋච්ඡෙද අභිනිවෙශයයි කීහු-සමහරු "අහොසිං නුඛො අහං අතීතමද්ධානං" යනාදීන් ප්‍රවෘත්ත සංශයාපත්තිය සම්මොහාභිනිවෙශය යෙත්.) අදීනවානුපස්සනාය ආලයාභිනිවෙසස්ස, ආදීනවානුදර්ශනාවෙන් සංස්කාරයන් කෙරෙහි ත්‍රාණලෙණභාවග්‍රහණසඞ්ඛ්‍යාත ආලයාභිනිවෙශයාගෙ; පටිසඞ්ඛා

---

1. පටිසඞ්ඛානුපස්සනාය-ඇතැම්.

(අ) අනාගාමිමග්ගෙන අණුසහගතානං කිලෙසානං; අරහත්තමග්ගෙන සබ්බකිලෙසානං පහානං සීලං, වෙරමණී…පෙ…චෙතනා සංවරෙ අවීතික්කමො සීලං. එවරූපානි සීලානි චිත්තස්ස අවිප්පටිසාරාය සංවත්තන්ති, පාමොජ්ජාය සංවත්තන්ති, පීතියා සංවත්තන්ති, පස්සද්ධියා සංවත්තන්ති, සොමනස්සාය සංවත්තන්ති, ආසෙවනාය සංවත්තන්ති, භාවනාය සංවත්තන්ති, බහුලීකම්මාය සංවත්තන්ති, අලඞ්කාරාය සංවත්තන්ති, පරික්ඛාරාය සංවත්තන්ති, පරිවාරාය සංවත්තන්ති, පාරිපූරියා සංවත්තන්ති, එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්තීති…

---

ධම්මානුපස්සනාය, "එවං ඕතෙ සඞ්ඛාරා පටිනිස්සජ්ජීයන්තී ති පවත්තං ඤාණං"යි උක්තස්වරූපප්‍රතිසඞ්ඛ්‍යාධර්මානුදර්ශනාවෙන්; අප්පටිසඞ්ඛාය, ප්‍රතිසඞ්ඛ්‍යාවට ප්‍රතිපක්ෂවූ මොහප්‍රධාන අකුශලධර්ම සඞ්ඛ්‍යාත අප්‍රතිසඞ්ඛ්‍යාවගෙ; විවට්ටානුපස්සනාය, නිර්වාණසඞ්ඛ්‍යාත විවට්ටයෙහි නිම්නබවය යන විවට්ටානුපස්සනායෙන්; (සංස්කාරොපෙක්ෂාවෙන් හෝ අනුලොමඥානයෙන් යන අර්ථයි) සංයොගාභිනිවෙසස්ස, සංස්කාරයන් කෙරෙහි සංයොගවිසින් අභිනිවෙශයාගෙ; සොතාපත්තිමග්ගෙන, ශ්‍රොත ආපත්තිමාර්ගයෙන්; දිට්ඨෙකට්ඨානං කිලෙසානං, දෘෂ්ටිය හා සහජවශයෙන් එක්වසිටියාවූ ක්ලෙශයන්ගෙ; සකදාගාමි මග්ගෙන, සකෘදාගාමිමාර්ගයෙන්; ඔළාරිකානං කිලෙසානං, ඖදාරික ක්ලෙශයන්ගෙ;

(අ) අනාගාමිමග්ගෙන අණුසහගතානං කිලෙසානං, අනාගාමිමාර්ගයෙන් අණුවූ ක්ලෙශයන්ගෙ; අරහත්තමග්ගෙන, අර්හද්මාර්ගයෙන්; සබ්බකිලෙසානං, අවශිෂ්ට සමස්ත ක්ලෙශයන්ගේ; පහානං සීලං, ප්‍රහාණශීලය;…පෙ…එවරූපානි සීලානි, මෙබඳු ශීලයෝ; චිත්තස්ස, චිත්තයාගෙ; අවිප්පටිසාරාය සංවත්තන්ති "සංවරෙ අවිප්පටිසාරත්ථාය"යි කීබැවින් සිත්හුගෙ අවිප්‍රතිසාරය පිණිස වෙති; පාමොජ්ජාය සංවත්තන්ති, "යොනිසො මනසිකරොතො පාමොජ්ජං ජායති"යි කීහෙයින් අවිප්‍රතිසාරය ප්‍රමොදය පිණිස වෙති; පීතියා සංවත්තන්ති, "පමුදිතස්ස පීති ජායති"යි කීහෙයින් ප්‍රමොදය ප්‍රීතිය පිණිස වෙති; පස්සද්ධියා සංවත්තන්ති, "පීතිමනස්ස කායො පස්සම්භති"යි කීහෙයින් ප්‍රීතියසන්හිඳීම පිණිස වෙති; සොමනස්සාය සංවත්තන්ති, "පස්සද්ධකායො සුඛං වෙදෙති"යි කීහෙයින් සන්සිඳීම සොම්නස් වේදනාවපිණිස වෙති; ආසෙවනාය, "සුඛිනො චිත්තං සමාධියති"යි කීබැවින් සමාධිහුගෙ ආසෙවනය පිණිස වෙති; (නිරමිෂසුඛය සිද්ධකල්හි "සුඛිනො චිත්තං සමාධියති"යි කීබැවින් සමාධිය සිද්ධම වෙයි එහෙයින් සමාධිහුගෙ ආසෙවනය පිණිස ප්‍රගුණබලවත්භාවය පිණිස වේ යන අර්ථයි.) භාවනාය,–එම සමාධිහුගේම වෘද්ධිය පිණිස බහුලීකම්මාය, නැවත නැවත වඩන පිණිස; අලඞ්කාරාය, එම සමාධියට ප්‍රසාධනවූ ශ්‍රද්ධෙන්ද්‍රියාදීන්ගෙ නිෂ්පත්තිය පිණිස; පරික්ඛාරාය,

(අ) එත්ථ ච පහානන්ති කොචි ධම්මො නාම නත්ථි අඤ්ඤත්‍ර වුත්තප්පකාරානං පාණාතිපාතාදීනං අනුප්පාදමත්තතො යස්මා පන තං තං පහානං තස්ස තස්ස කුසලස්ස ධම්මස්ස පතිට්ඨානට්ඨෙන උපධාරණං හොති, විකම්පභාවාකරණෙන ච සමාධානං, තස්මා පුබ්බෙ වුත්තෙනෙව උපධාරණසමාධානසඞ්ඛාතෙන සීලනට්ඨෙන සීලන්ති වුත්තං. ඉතරෙ චත්තාරො ධම්මා තතො තතො වෙරමණි වසෙන තස්ස තස්ස සංවරවසෙන තදුභයසම්පයුත්තචෙතනාවසෙන

---

අවිප්‍රතිසාරාදිවූ සමාධිසම්භාරයාගෙ සිද්ධිය පිණිස; (සම්භාරනම් ප්‍රත්‍යයයි දතයුතු.) පරිවාරාය, සමාධියහට පරිවාරවූ සම්‍යක්‍ ඍතිවීර්‍ය්‍යාදී ධර්‍ම්ම විශෙෂයන් මූලකාරණාව සාධනබැවින් පරිවාරසම්පත්තිය පිණිස වෙ; පාරිපූරියා සංවත්තනන්ති, වශීභාවයට පැමිණවීමෙන් ද විදර්ශනාවට කාරණභාවාපාදනයෙන් පරිපූර්‍ණබව සාධනබැවින් ද සමාධියගේ පාරිපූරිය පිණිස වේ; (මෙසේ සුපරිශුද්ධ ශීලමූලක සර්‍වාකාර පරිපූර්‍ණසමාධිය දක්වා දැන් ශීලමූලකසමාධිපදස්ථානප්‍රයොජනයන් දක්වනු පිණිස "එකන්තනිබ්බිදාය" යනාදි කීහු.) එකන්තනිබ්බිදාය, එකාන්තනිර්වේදය පිණිස; ("විරාගාය අභිඤ්ඤාය සම්බොධාය" යනු මාර්‍ගපිණිසය "නිරොධාය උපසමාය නිබ්බානාය" යනු නිවන් පිණිසය යනු සත්‍යයි.

(අ) එත්ථ ච, මෙහි වනාහි; පහානන්ති, ප්‍රහාණයනම්; කොචි ධම්මො නාම නත්ථි, කිසිධර්‍ම්මයෙක් නම් නැත; ("පජහනං අනුප්පාදනිරොධො පහානං"යි පහානශබ්දයා භාවසාධනබැවින් ප්‍රහාණ නම් කිසි ධර්‍ම්මයෙක් නැත යන අර්‍ථයි.) වුත්තප්පකාරානං, කියනලදප්‍රකාර ඇති; පාණාතිපාතාදීනං, ප්‍රාණාතිපාතාදීන්ගෙ; අනුප්පාදමත්තතො අඤ්ඤත්‍ර, අනුත්පාදමාත්‍රය තබා; ("කොචි ධම්මො නත්ථි" යොදනු.) යස්මා පන, යම්හෙයකින්; තං තං පහානං, ("පාණාතිපාතස්ස පහානං අදින්නාදානස්ස පහානං"යි කියනලද) ඒ ඒ ප්‍රහාණය; තස්ස තස්ස කුසලස්ස ධම්මස්ස, (ප්‍රාණාතිපාතයාගෙ ප්‍රහාණය මෛත්‍ර්‍යාදි කුශල ධර්‍ම්මයන්ට පිහිටයයි ද අදත්තාදානප්‍රහාණය ත්‍යාගාදිකුශලධර්‍ම්මයන්ට පිහිටයයි ද මෙසේ) ඒ ඒ කුශලධර්‍ම්මයන්ට; පතිට්ඨානට්ඨෙන, ප්‍රතිෂ්ඨාවනබැවින්; උපධාරණං හොති, උපධාරණය වෙ; (පිහිට වෙ යන අර්‍ථයි.) විකම්පභාවාකරණෙන ච, ප්‍රාණාතිපාතාදීහු තමන් උපන් සන්තානයාගෙ විකම්පයට හෙතුනුයි නත් ප්‍රහාණය විකම්පභාවය නොකරන හෙයින්; සමාධානං, සමාධාන නම් වෙ; තස්මා, එහෙයින්; පුබ්බෙ වුත්තෙනෙව, පූර්‍වයෙහිම උක්තවූ; උපධාරණසමාධාන සඞ්ඛාතෙන, උපධාරණය සමාධානය යන; සීලනට්ඨෙන, ශීලනාර්‍ථයෙන්; සීලන්ති වුත්තං, ශීලයයි කියනලදී; ඉතරෙ චත්තාරො ධම්මා, වෙරමණිආදිවූ සතරධර්‍ම්මයෝ; තතො තතො වෙරමණි වසෙන, ඒ ඒ ප්‍රාණාතිපාතාදීන් කෙරෙන් විරමණවශයෙන් ද; තස්ස

තං තං අවීතික්කමන්තස්ස අවීතික්කමවසෙන ච චෙතසො පවත්ති සබ්භාවං සන්ධාය වුත්තා. සීලට්ඨො පන තෙසං පුබ්බෙ පකාසිතො යෙවාති. එවං පහානසීලාදිවසෙන පඤ්චවිධං. එත්තාවතා ච කිං සීලං කෙනට්ඨෙන සීලං කාන'ස්ස ලක්ඛණරසපච්චුපට්ඨානපදට්ඨානානි කිමානිසංසං සීලං කතිවිධඤ්චෙතං සීලන්ති වුත්තානං ඉමෙසං පඤ්හානං විස්සජ්ජනං නිට්ඨිතං....

(අ) යං පන වුත්තං කො චස්ස සඞ්කිලෙසො? කිං වොදානන්ති? තත්‍ර වදාම:-ඛණ්ඩාදිභාවො සීලස්ස සඞ්කිලෙසො, අඛණ්ඩාදිභාවො වොදානං. සො පන ඛණ්ඩාදිභාවො ලාභයසාදිහෙතුකෙන භෙදෙන ච සත්ත විධමෙථුනසංයොගෙන ච සඞ්ගහිතො. තථා හි යස්ස සත්තසු ආපත්ති ක්ඛන්ධෙසු ආදිම්හි වා අන්තෙ වා සික්ඛාපදං භින්නං හොති, තස්ස සීලං පරියන්තෙ ඡින්නසාටකො විය ඛණ්ඩන්නාම හොති. යස්ස පන වෙමජ්ඣෙ භින්නං, තස්ස මජ්ඣෙ ඡිද්දසාටකො විය ඡිද්දංනාම හොති.

---

තස්ස සංවරවසෙන, ඒ ඒ ප්‍රාණාතිපාතාදීහුගෙ සංවරණවශයෙන් ද (ඒ ඒ සංවරයන්ගෙ වශයෙන් හෝ); තදුභයසම්පයුත්ත චෙතනා වසෙන, වෙරමණීන් හා ද සංවරධර්මයන් හා ද සම්ප්‍රයුක්තචෙතනා වශයෙන් ද; තං තං අවීතික්කමන්තස්ස අවීතික්කමවසෙන ච, ඒ ඒ නො ඉක්මෙන්නහුගෙ අව්‍යතික්‍රමවශයෙන් ද; චෙතසො පවත්තිසබ්භාවං සන්ධාය, සිත්හුගෙ ප්‍රවෘත්තිසද්භාවය සඳහා; වුත්තා, කියනලද්දු; (එහෙයින් එකක්ෂණයෙහි දු සම්භව වෙති යනු මෙහි අභිප්‍රායයි.) තෙසං, ඒ වෙරමණී ආදීන්ගෙ; සීලට්ඨො පන, ශීලාර්ථය; පුබ්බෙ පකාසිතො යෙවාති, පළමු ප්‍රකාශකරනලදමැයි.... පෙ....

(අ) ("කො චස්ස සඞ්කිලෙසො කිං වොදානන්ති යං පන වුත්තං තත්‍ර වදාම"යෙ දනු.) අස්ස, මේ චතුර්විධශීලයාගෙ; සඞ්කිලෙසො, සකිලිටුබව; කො පන, කවර; වොදානං, පිරිසුදුබව; කිංති, කවරයත්;-ඛණ්ඩාදිභාවො, ඛණ්ඩසබලාදිභාවය; සීලස්ස, සීලයාගෙ; සඞ්කිලෙසො, සකිලිටුබව නම් වෙ; අඛණ්ඩාදිභාවො, අඛණ්ඩඅච්ඡිද්‍රාදිභාවය; වොදානං, පිරිසුදුබව නම්වෙ; සො පන ඛණ්ඩාදිභාවො, ඒ ඛණ්ඩාදිභාවය වනාහි; ලාභයසාදිහෙතුකෙන, ලාභ යස ඥාති ආදීන් හෙතුකොට ඇති; භෙදෙන ච, භෙදයෙන් ද; සත්තවිධමෙථුනසංයොගෙන ච, සත්වැදෑරුම්වූ මෛථුන සංයොගයෙන් ද; සඞ්ගහිතො, සඞ්ග්‍රහකරනලදී; තථා හි, එසේ මැනු; යස්ස, යමක්හුගෙ; සත්තසු ආපත්තික්ඛන්ධෙසු, සත් ඇවත් කඳුන් කෙරෙහි; ආදිම්හි වා, ආදියෙහි හෝ; අන්තෙ වා, කෙළවර හෝ; සික්ඛාපදං භින්නං හොති, සිඛපදයෙක් බිඳෙනලද්දේ වේ ද; තස්ස සීලං, උහුගෙ ශීලය; පරියන්තෙ ඡින්නසාටකො විය, දකන්වත් කුරුගුලාකන්වත් සිඳුනාලද වස්ත්‍රයක් මෙන්; ඛණ්ඩන්නාම හොති, කඩකරනලද්දේ නම් වේ; යස්ස පන, යමක්හුගෙ වනාහි(ශීලය); වෙමජ්ඣෙ භින්නං, මධ්‍යයෙහි ශික්ෂාපදයෙක් භින්න වී නම්; තස්ස, ඔහුගෙ

යස්ස පටිපාටියා වෙ තීණි භින්නානි, තස්ස පිට්ඨියා වා කුච්ඡියා වා උට්ඨිතෙන විසභාගවණ්ණෙන කාළරත්තාදීනං අඤ්ඤතරසරීරවණ්ණා ගාවී විය සබලං නාම හොති. යස්ස අන්තරන්තරා භින්නානි, තස්ස අන්තරන්තරා විසභාගවණ්ණබින්දු විචිත්‍රාගාවී විය කම්මාසන්නාම හොති. එවං තාව ලාභාදිහෙතුකෙන භෙදෙන ඛණ්ඩාදිභාවො හොති.෴

(ආ) එවං සත්තවිධමෙථුනසංයොගවසෙන. වුත්තං හි භගවතා:- ඉධ බ්‍රාහ්මණ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා සම්මා බ්‍රහ්මචාරී පටිජානමානො න හෙව ඛො මාතුගාමෙන සද්ධිං ද්වයං ද්වය සමාපත්තිං සමාපජ්ජති, අපි ච ඛො මාතුගාමස්ස උච්ඡාදනං [1] නහාපනං සම්බාහනං සාදියති, සො තදස්සාදෙති, තං නිකාමෙති, තෙන ච විත්තිං ආපජ්ජති.

---

(සීලය); මජ්ඣෙ ඡිද්දසාටකො විය, මධ්‍යයෙන් සිදුරුපිළියක් මෙන්; ඡිද්දං නාම හොති, සිදුරු නම් වෙ; යස්ස, යමක්හුගෙ (ශීලය); පටිපාටියා, පිළිවෙළින්; වෙ තීණි, දෙතුන්ශික්ෂාපදකෙනෙක්; භින්නානි, බිඳෙන ලද්දාහුවෙද් ද; තස්ස, උහුගෙ (ශීලය); පිට්ඨියා වා, පිටවත්; කුච්ඡියා වා, කුසවත්; උට්ඨිතෙන, නැංගාවූ; විසභාගවණ්ණෙන, නොසමවූ වර්ණයෙන් යුත්; කාළරත්තාදීනං, කාළරක්තාදි වර්ණයන් අතුරෙන්; අඤ්ඤතරසරීරවණ්ණා, එක්තරා ශරීරවර්ණයක් ඇති; ගාවී විය, දෙනක මෙන් (කබරදෙනක මෙන්); සබලං නාම හොති, සබර නම් වේ; (කබරයු තැනි.) යස්ස, යමක්හුගෙ; අන්තරන්තරා, අතුරතුරෙහි; භින්නානි, සිඛපදයො බිඳෙනලද්දාහු වෙද්ද; තස්ස, ඔහුගෙ (ශීලය); අන්තරන්තරා, අතුරතුරෙහි; විසභාගවණ්ණබින්දු, නොසම පැහැ ඇති බිඳුවෙන්; විචිත්‍රාගාවී විය, විසිතුරුදෙනක මෙන්; (තිත්දෙනක මෙන්;) කම්මාසං නාම හොති, කල්මාෂ නම් වෙ; (තිත්නම්වෙ;) එවං, මෙසේ; තාව, පළමුකොට; ලාභාදිහෙතුකෙන භෙදෙන, ලාභාදීන් හෙතුකොට ඇති භෙදයෙන්; ඛණ්ඩාදිභාවො, ඛණ්ඩාදිභාවය; හොති, [2] වේ ෴

(ආ) එවං, මෙසේ; සත්තවිධමෙථුනසංයොගවසෙන, (මෙම) සප්තප්‍රකාර මෛථුනසංයොගවශයෙනු ද; (ඛණ්ඩාදිභාවය දතයුතු.) වුත්තං හි භගවතා, භගවත්හු විසින් කීයේ මැනු; බ්‍රාහ්මණ, බමුණ; ඉධ, මේ ලොකයෙහි; එකච්චො, එකෙක්; සමණො වා, ප්‍රව්‍රජ්‍යාමාත්‍රයෙන් ශ්‍රමණයෙක් හෝ; බ්‍රාහ්මණො වා, ජාතිමාත්‍රයෙන් බමුණෙක් හෝ; [සම්මා, මනාකොට;] බ්‍රහ්මචාරී පටිජානමානො, බ්‍රහ්මචර්‍ය්‍යාව වෙසෙමි යි ප්‍රතිඥාකරන්නෙ; මාතුගාමෙන සද්ධිං, මාගම හා සමග; ද්වයං ද්වයසමාපත්තිං, (දෙදෙනා විසින් සමවැද්දයුතුබැවින් ද්වයං ද්වයසමාපත්ති නම්වූ) මෛථුනධර්මය; න හෙව ඛො සමාපජ්ජති, නොම සමවදනෙය; අපි ච ඛො, එකෙක් ඇති; මාතුගාමස්ස, මාගමගෙ; උච්ඡාදනං, ඇඟ ඉලීම; නහාපනං, නැවීම; සම්බාහනං, අතපය හැඹීම; සාදියති, ඉවසාද; සො, හෙතෙම; තදස්සාදෙති, ඒ උච්ඡාදනාදියෙහි ඇලෙ ද; තං, හේ; නිකාමෙති, කැමැති වෙ ද; තෙන ච විත්තිං අපජ්ජති, එයින් තුෂ්ටියට පැමිණෙ ද;

---

1. උච්ඡාදනං පරිමද්දනං-ත්‍රි. මු. 2. වෙදිතබ්බො, දතයුතුවේ;-සන්න.

(අ)ඉදම්පි ඛො බ්‍රාහ්මණ බ්‍රහ්මචරියස්ස ඛණ්ඩම්පි ඡිද්දම්පි සබලම්පි කම්මාසම්පි. අයං වුච්චති බ්‍රාහ්මණ අපරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, සංයුත්තො මෙථුනෙන සංයොගෙන, නපරිමුච්චති ජාතියා ජරායමරණෙන ෴පෙ෴නපරිමුච්චති දුක්ඛස්මාති වදාමි. පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා෴පෙ෴පටිජානමානො නහෙව ඛො මාතුගාමෙන සද්ධිං ද්වයං ද්වයසමාපත්තිං සමාපජ්ජති, නපි මාතුගාමස්ස උච්ඡාදනං෴පෙ෴සාදියති, අපි ච ඛො මාතුගාමෙන සද්ධිං සඤ්ජග්ඝති, සඞ්කීළති, සඞ්කෙළායති, සො තදස්සාදෙති෴පෙ෴දුක්ඛස්මාති වදාමි. පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා෴පෙ෴ නහෙව ඛො මාතුගාමෙන සද්ධිං ද්වයං ද්වය සමාපත්තිං සමාපජ්ජති, නපි මාතුගාමස්ස උච්ඡාදනං෴පෙ෴සාදියති, නපි මාතුගාමෙන සද්ධිං සඤ්ජග්ඝති සඞ්කීළති සඞ්කෙළායති. අපි ච ඛො මාතුගාමස්ස චක්ඛුනා චක්ඛුං උපනිජ්ඣායති, පෙක්ඛති, සො තදස්සාදෙති෴පෙ෴දුක්ඛස්මාති වදාමි. පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ෴පෙ෴නහෙව ඛො මාතුගාමෙන෴පෙ෴නපි මාතුගාමස්ස෴පෙ෴ නපි මාතුගාමෙන෴පෙ෴නපි මාතුගාමස්ස෴පෙ෴පෙක්ඛති. අපි ච ඛො මාතුගාමස්ස සද්දං සුණාති තිරොකුඩ්ඩා වා තිරොපාකාරා වා හසන්තියා වා භණන්තියා වා ගායන්තියා වා රොදන්තියා වා, සො තදස්සාදෙති෴පෙ෴දුක්ඛස්මාති වදාමි. පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා෴පෙ෴නහෙව ඛො මාතුගාමෙන

---

(අ) බ්‍රාහ්මණ, බමුණ; ඉදම්පි ඛො, මෙද; (ඉදං යනු යථොක්ත සාදියනාදීන් ඛණ්ඩභාවාදි වශයෙන් එකත්වයෙන් ගෙන කීහ. (පි) ශබ්දය වක්ෂ්‍යමාන සමුච්චයාර්ථයැ. (ඛො) යනු අවධාරණාර්ථයි.) බ්‍රහ්මචරියස්ස, බ්‍රහ්මචර්‍ය්‍යයාගෙ; ඛණ්ඩම්පි, එකාන්තයෙන් ඛණ්ඩ ද වෙයි; ඡිද්දම්පි, ඡිද්‍ර ද වෙයි; සබලම්පි, සබල ද වෙයි; කම්මාසම්පි, කල්මාෂ ද වේ; බ්‍රාහ්මණ, බමුණ; අයං, මෙතෙම; අපරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, අපරිසුද්ධ බ්‍රහ්මචරිය ද පුරයි; [වුච්චති, කියනු ලැබේ;] මෙථුනෙන සංයොගෙන, මෛථුන සංයොගයෙන්; සංයුත්තො, යෙදී වෙසේ; ජාතියා, ජාතියෙන් ද; ජරාය, ජරාවෙන් ද; මරණෙන, මරණින් ද; න පරිමුච්චති, නොමිදේ; දුක්ඛස්මා, දුකින්; න පරිමුච්චතීති වදාමි, නොමිදෙ යි කියමි෴පෙ෴ සඤ්ජග්ඝති, කෙලෙශවශයෙන් මහසිනා සේ ද; සඞ්කීළති, කායසංසර්ග වශයෙන් කෙළී ද; සඞ්කෙළායති, සත්කාර යෙන් මාගම කෙරෙහි මමත්වය කෙරේ ද෴පෙ෴චක්ඛුනා චක්ඛුං, තමාගෙ ඇසින් මාගමගෙ ඇස; උපනිජ්ඣායති, බලා ද; ("පෙක්ඛති" යනු "ඔලොකෙති" යනම අර්ථයි.) තිරොකුඩ්ඩා වා, මැටිභිත්තියෙහි එපිටින් හෝ; තිරොපාකාරා වා, උළුපවුරෙහි එපිටින් හෝ; මාතුගාමස්ස, මාගමගෙ; හසන්තියා වා, හසන්නියගෙ හෝ; භණන්තියා වා, බණන්නියගෙ හෝ; ගායන්තියා වා, ගීකියන්නියගෙ හෝ; රොදන්තියා වා, හඬන්නියගෙ හෝ; සද්දං

෴පෙ෴න පි මාතුගාමස්ස෴පෙ෴නපි මාතුගාමෙන෴පෙ෴නපි මාතුගාමස්ස෴පෙ෴රුදන්තියා වා෴පෙ෴අපි ච ඛො යානිස්ස තානි පුබ්බෙ මාතුගාමෙන සද්ධිං හසිත ලපිත කීළිතානි, තානි අනුස්සරති. සො තදස්සාදෙති෴පෙ෴දුක්ඛස්මාති වදාමි. පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා෴පෙ෴නහෙව ඛො මාතුගාමෙන෴පෙ෴නපි මාතුගාමස්ස෴පෙ෴නපි යානිස්ස තානි පුබ්බෙ මාතුගාමෙන සද්ධිං හසිත ලපිත කීළිතානි තානි අනුස්සරති. අපි ච ඛො පස්සති ගහපතිං වා ගහපතිපුත්තං වා පඤ්චහි කාමගුණෙහි සමප්පිතං සමඞ්ගීභූතං පරිචාරයමානං, සො තදස්සාදෙති෴පෙ෴ දුක්ඛස්මාති වදාමි පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා෴පෙ෴නහෙව ඛො මාතුගාමෙන෴පෙ෴න පස්සති ගහපතිං වා ගහපතිපුත්තං වා෴පෙ෴පරිචාරයමානං. අපි ච ඛො අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වාති සො තදස්සාදෙති තන්නිකාමෙති තෙන ච විත්තිං ආපජ්ජති. ඉදම්පි බ්‍රාහ්මණ බ්‍රහ්මචරියස්ස ඛණ්ඩම්පි ඡිද්දම්පි සබලම්පි කම්මාසම්පීති. එවං ලාභාදි හෙතුකෙන භෙදෙන ච සත්තවිධ මෙථුනසංයොගෙන ච ඛණ්ඩාදිභාවො සඞ්ගහිතොති වෙදිතබ්බො෴

---

සුණාති, ශබ්දය අසා ද; අස්ස, ඒ බ්‍රහ්මචාරී ප්‍රතිඥයාගෙ; පුබ්බෙ, ව්‍රත සමාදානයට පූර්වයෙහි; මාතුගාමෙන සද්ධිං, මාගමහා සමග (කළ); යානි තානි හසිතලපිතකීළිතානි, යම් ඒ සිනාවෙක් කථාවෙක් කෙළියෙක් ඇද්ද; තානි, ඔවුන්; අනුස්සරති, සිහිකෙරෙද; අපි ච ඛො, අනිකෙකුදු ඇත්; ගහපතිං වා, ගෘහපතියක්හු හෝ; ගහපතිපුත්තං වා, ගෘහපති පුත්‍රයකු හෝ; පඤ්චහි කාමගුණෙහි, පස්කම්කොටසින්; සමප්පිතං, සහිතවූවහු; සමඞ්ගීභූතං, සමන්විතවූවහු; පරිචාරයමානං, කෙළනහු; (උපස්ථානකරනු ලබන්නහු හෝ;)-අඤ්ඤතරං දෙවනිකායං පණිධාය, එක්තරා දිව්‍යනිකායක් ප්‍රාර්ථනාකොට; බ්‍රහ්මචරියං චරති, බ්‍රහ්මචරිය කෙරෙද; අහං, මම; ඉමිනා සීලෙන වා, මේ ශීලයෙන් හෝ; වතෙන වා, ව්‍රතයෙන් හෝ; තපෙන වා, තපසින් හෝ; බ්‍රහ්මචරියෙන වා, බ්‍රහ්මචරියයෙන් හෝ;("සීලෙන" යනාදියෙහි යම නියමාදිසමාදානය සීලයයි. අව්‍යතික්‍රමය ව්‍රතයි-නොහොත්: එ දෙකම ශීලය දුෂ්කර චර්‍ය්‍යාවශයෙන් පවත්වනලද්දේ ව්‍රතයි-තත් තත් අකෘත්‍යසම්මත යෙන් නිවෘත්තිලක්ෂණශීලය සමාදන්වූවහුගෙ වෙස භොජන කෘච්ඡ්‍රාචරණාදි විශෙෂප්‍රතිපත්තිය ව්‍රතයි-හැමතැනම දුෂ්කර චර්‍ය්‍යාව තපසයි. මෛථුනවිරතිය බ්‍රහ්මචර්‍ය්‍යායි) "දෙවො වා භවිස්සාමි"යි ශක්‍රසුයාමාදි ප්‍රකටදෙවියන් කීහ;"දෙවඤ්ඤතරො"යී,අප්‍රසිද්ධයන් කීහු;-එවං, මෙසේ; ලාභාදිහෙතුකෙන භෙදෙන ච, ලාභාදිහෙතු භෙදයෙන් ද; සත්තවිධමෙථුනසංයොගෙන ච, සප්තවිධමෛථුනසංයොගයෙන් ද; ඛණ්ඩාදිභාවො, ඛණ්ඩාදිභාවය;සඞ්ගහිතොති, සඞ්ග්‍රහ

(අ) අඛණ්ඩාදිභාවො පන සබ්බසො සික්ඛාපදානං අභෙදෙන, භින්නානඤ්ච සප්පටිකම්මානං පටිකම්මකරණෙන ච සත්තවිධමෙථුනසංයොගාභාවෙන අපරාය ච කොධො උපනාහො මක්ඛො පළාසො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං ථම්භො සාරම්භො මානො අතිමානො මදො පමාදොති ආදීනං පාපධම්මානං අනුප්පත්තියා, අප්පිච්ඡතා සන්තුට්ඨිතා සල්ලෙඛතාදීනඤ්ච ගුණානං උප්පත්තියා සඞ්ගහිතො. යානි හි සීලානි ලාභාදීනම්පි අත්ථාය අභින්නානි, පමාදදොසෙන වා භින්නානිපි

---

කරනලද්දේයයි; වෙදිතබ්බො, දතයුත්තේ වේ; (සප්තවිධ මෛථුන සංයොගය වුවහොත් ඡිද්‍රනම් වෙ; පිළිවෙළින් මෛථුනසංයොගයක් වූවහොත් සබලනම් වෙ. අතුරතුරෙහි වුවහොත් කම්මාස නම් වෙයි. නොහොත් ආදියෙහි සිඛපද ඉක්මීමට ප්‍රත්‍යය වියයුතු මෛථුනසංයොගය වුවහොත් සිල්කඩනම් වෙයි. මෙ තියෙනු දු යොදනු.

(අ) අඛණ්ඩාදිභාවො පන, අඛණ්ඩාදිභාවය වනාහි; ("සඞ්ගහිතො" යනු හා සම්බන්ධකරනු.) සබ්බසො සික්ඛාපදානං අභෙදෙන, සර්වාකාරයෙන් සිඛපද නොබිඳීමෙන් ද; නොහොත්: සියලු සිඛපද නොබිඳීමෙන්ද; භින්නානඤ්ච, බුන්නාද වූ; සප්පටිකම්මානං, පිළියම්සහිත (සිඛපදයන්ට); පටිකම්මකරණෙන ච, පිළියම්කිරීමෙන් ද; සත්තවිධ මෙථුනසංයොගාභාවෙන, සත්වැදෑරුම්වූ මෛථුනසංයොගයාගෙ අභාවයෙන්ද; ("අපරාය ච" අනුප්පත්තියා"යනු හා යොදනු.) අපරාය, අනික්; කොධො, කිපෙනලකුණු පළමු උපදනා ද්වෙෂය; උපනාහො, නැවත නැවත 'බලවත්ව වෛරබඳිමින් උපදනා ද්වෙෂය; මක්ඛො, අනුන්ගෙ ගුණමකන ද්වෙෂසහගිය චිත්තොත්පාදය; පළාසො, අනුන්ගෙ ගුණ හැඳුරුකිරීමක් මෙන් අනුන්ගෙ ගුණ හා සමගුණ ඇතිවිය නොහෙමි යන දෙම්නස් සහගිය චිත්තොත්පාදය; ඉස්සා, පරසැපත් සැවෙමින් උපදනා ඊර්ෂ්‍යාය; මච්ඡරියං, තමා සැපත් සඟවන මසුරුබවය; මායා, ඇතිදොස් මුවහකරන ලොභාකාරඇති චිත්තොත්පාදය; සාඨෙය්‍යං, තමාකෙරෙහි නැති ගුණ පහළකරන කැමැති ලොභවිකාරඇති චිත්තොත්පාදය; ථම්භො, මන්විකරින් දැඩිවූ චිත්තොත්පාදය; සාරම්භො, අනුන්ගෙ ගුණ මතුවිය නොදෙන කැමැති දෙම්නස් සහ ගිය චිත්තොත්පාදය; මානො, ජතිආදීන් තමාහුවන ලකුණුඇති මානය; අතිමානො, අතිශයින් හැම හුවන ලකුණුඇතිමානය; මදො, ජතිආදි විසින් සතුටුවෙමින් උපදනා මත් නැමැති මදය; පමාදොති, පස්කම්ගුණෙහි උපදනා චිත්තොත්පාදය යන; ආදීනං, මෙ ආදිවූ; පාපධම්මානං, පාපධර්මයන්ගෙ; අනුප්පත්තියා, නොසිපදීමෙන් ද; අප්පිච්ඡතා, අලොප්අදහස් ඇති බව; සන්තුට්ඨිතා, ඉතරීතරපසයෙන් සතුටුබව; සල්ලෙඛතා, මනා කොට කෙලෙසුන් ලියන බවය යන; ආදීනං, මෙ ආදිවූ; ගුණානං උප්පත්තියා ච, ගුණයන්ගෙ උපැත්මෙන් ද; සඞ්ගහිතො, සඞ්ග්‍රහකරන

පටිකම්මකතානි, මෙථුනසංයොගෙහි ච කොධූපනාහාදීහි වා පාප ධම්මෙහි අනුපහතානි, සබ්බසො අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානීති වුච්චන්ති. තානියෙව භුජිස්සභාවකරණතො ච භුජිස්සානි; විඤ්ඤූහි පසත්ථත්තා විඤ්ඤුප්පසත්ථානි; තණ්හාදිට්ඨීහි අපරාමට්ඨත්තා අපරාමට්ඨානි; උපචාරසමාධිං අප්පනාසමාධිං වා සංවත්තයන්තීති සමාධිසංවත්තනිකානි ච හොන්ති තස්මා තෙසං එස අඛණ්ඩාදිභාවො වොදානන්ති වෙදිතබ්බො෴

(අ) තම්පනෙතං වොදානං ද්විහාකාරෙහි සම්පජ්ජති සීලවිපත්තියා ච ආදීනවදස්සනෙන සීලසම්පත්තියා ච ආනිසංසදස්සනෙන. තත්ථ "පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තියා"ති එවමාදි සුත්තනයෙන සීලවිපත්තියා ආදීනවො දට්ඨබ්බො෴

---

ලදී; යානි හි සීලානි, යම් සිල්කෙනෙක්; ලාභාදීනම්පි අත්ථාය අභින්නානි, ලාභාදීන්පිණිස අභින්නයෝ ද; පමාදදොසෙන වා භින්නානිපි, ප්‍රමාදදෝෂයෙන් බුන්නාහු ද; පටිකම්මකතානි, පිළියම් කරනලද්දාහු ද, මෙථුනසංයොගෙහි ච, (සත්වැදෑරුම්) මෛථුන සංයොගයෙන් ද; කොධූපනාහාදීහි වා පාපධම්මෙහි, ක්‍රොධය උප නාහය යනාදිවූ පාපධර්මයෙන් ද; අනුපහතානි, නොපහරණ ලද්දාහු ද (නොනටුවාහු ද); සබ්බසො, සර්වාකාරයෙන්; අඛණ්ඩානි, නොකඩන; අච්ඡිද්දානි, නොසිදුරන; අසබලානි, නොකබරන; අකම්මාසානීති, නොතිත්හයි; වුච්චන්ති, කියනුලැබෙත්ද; තානියෙව, ඔහුම; භුජිස්සභාවකරණතො, තෘෂ්ණාදාශව්‍යයෙන් මුදනබැවින්; භුජිස්සානි; භුජිස්සනම්වෙත්; විඤ්ඤූහි, නුවනැත්තන්විසින්; පසත්ථත්තා, ප්‍රශස්තබැවින්; විඤ්ඤුප්පසත්ථානි, විඤ්ඤුප්පසත්ථනම් වෙත්; තණ්හාදිට්ඨීහි, තෘෂ්ණාදෘෂ්ටිදෙදෙනාවිසින්; අපරාමට්ඨත්තා, නොපිරිමටබැවින්; අපරාමට්ඨානි, අපරාමට්ඨනම්වෙත්; උපචාර සමාධිං, උපචාරසමාධිය හෝ; අප්පනාසමාධිං වා, අර්පණසමාධිය හෝ; සංවත්තයන්තීති, පවත්වත්නුයි; සමාධිසංවත්තනිකානි ච හොන්ති, සමාධිසංවත්තනිකනමුදු වෙත්; තස්මා, එහෙයින්; තෙසං, ඒ ශීලයන්ගෙ; එසො අඛණ්ඩාදිභාවො, මේ නොකඩආදිබව; වොදානන්ති, පිරිසුදුබවනමැයි; වෙදිතබ්බො, දතයුතු෴

(අ) තං පනෙතං වොදානං, ඒ වොදානය; ද්විහාකාරෙහි, දෙයාකාරය කින්; සම්පජ්ජති, සිඞවෙයි; සීලවිපත්තියා ආදීනවදස්සනෙන, ශීල විපත්තියෙහි ආදීනවදැක්මෙන්; සීලසම්පත්තියා ආනිසංසදස්සනෙන, ශීලසම්පත්තියෙහි අනුසස්දැක්මෙනි; තත්ථ, ඒ දෙක්හි; භික්ඛවෙ, මහණෙනි; දුස්සීලස්ස සීලවිපත්තියා, දුශ්ශීලයහට ශීලවිපත්ති යෙහි; ඉමෙ පඤ්චආදීනවා ඉති, මේ පස්ආදීනවයහ යන; එවමාදි සුත්තනයෙන, මෙ ආදී සූත්‍රනයෙන්; සීලවිපත්තියා, ශීලවිපත්තියෙහි; ආදීනවො දට්ඨබ්බො, ආදීනව දතයුතුයි෴

(අ) අපි ච දුස්සීලො පුග්ගලො දුස්සීල්‍යහෙතු අමනාපො හොති දෙවමනුස්සානං, අනනුසාසනියො සබ්‍රහ්මචාරීනං, දුක්ඛිතො දුස්සීල ගරහාසු, විප්පටිසාරී සීලවතං පසංසාසු, තාය ච පන දුස්සීල්‍යතාය සාණසාටකො විය දුබ්බණ්ණො හොති, යෙ බො පනස්ස දිට්ඨානුගතිං ආපජ්ජන්ති තෙසං දීඝරත්තං අපායදුක්ඛාවහනතො දුක්ඛසම්ඵස්සො, යෙසං දෙය්‍යධම්මං පතිගණ්හාති තෙසං න මහප්ඵලකරණතො අප්පග්ඝො, නෙකවස්සගණිකගූථකූපො විය දුබ්බිසොධො ඡවාලාතමිව උභතො පරිබාහිරො, භික්ඛුභාවං පටිජානන්තොපි අභික්ඛුයෙව ගොගණං අනුබන්ධ ගද්‍රභො විය, සතතුබ්බිග්ගො සබ්බවෙරී පුරිසො විය, අසංවාසාරහො මතකළෙබරං විය, සුතාදිගුණයුත්තොපි සබ්‍රහ්මචාරීනං අපූජාරහො, සුසානග්ගි විය. බ්‍රාහ්මණානං, අභබ්බො

---

(අ) අපි ච, අනිකෙකුදු; දුස්සීලො පුග්ගලො, දුශ්ශීලපුද්ගල තෙමෙ; දුස්සීල්‍යහෙතු, දුශ්ශීලබවහෙතුකොටගෙන; දෙවමනුස්සානං, දෙව්මිනිසුන්ට; අමනාපො හොති, අමනොඥ වෙ; සබ්‍රහ්මචාරීනං, සබ්‍රම්සරුන් විසින්; අනනුසාසනියො, (පිළිකුල් බැවින්) අනුශාසනාකටයුතුනොවෙ; දුස්සීලගරහාසු, දුශ්ශීලයන්ට ගර්‍හාකරනකල්හි; දුක්ඛිතො, තෙමෙ දුක්ඛිත වෙ; සීලවතං පසංසාසු, සිල්වත්නට ප්‍රශංසාකරනකල්හි; විප්පටිසාරී, කලකිරෙ; ("අකතං වත මෙ කල්‍යාණං" යනාදීන් පශ්චාත්තාපී වෙයි සේයි.) තාය ච පන දුස්සීල්‍යතාය, එමදුශ්ශීලභාවයෙන්; සාණසාටකො විය, සණවාකඩක්මෙන්; දුබ්බණ්ණො හොති, ගුණවර්‍ණයෙන්හා ශරීර වර්‍ණයෙන් රහිත වෙ; යෙ බො පන, යම්කෙනෙක් වනාහි; අස්ස, එ දුශ්ශීලයාගේ; දිට්ඨානුගතිං ආපජ්ජන්ති, ලබ්ධිඅනුබවට පැමිණෙත්ද; තෙසං, ඔවුන්ට; දීඝරත්තං, බොහෝකලක්; අපායදුක්ඛාවහනතො, අපායදුක් එළවනහෙයින්; දුක්ඛසම්ඵස්සො, දුඃඛස්පර්‍ශී ඇත්තේතේයි; යෙ සං දෙය්‍යධම්මං පතිගණ්හාති, යම්කෙනෙකුන්ගෙ දෙයධර්‍ම පිළිගණී ද; තෙසං, ඔවුන්ට; න මහප්ඵලකරණතො, මහත් ඵලනොකරනබැවින්; අප්පග්ඝො, මදක් අගණේයි; නෙකවස්ස ගණික, අනෙකවර්‍ෂසමූහයෙහි සඤ්චිතවූ; ගූථකූපො විය, අශුචිවළක් මෙන්; දුබ්බිසොධො, ශෝනට නොපිළිවන්වන්නේ යි; ඡවාලාතමිව, සොහොන්පෙනෙල්ලක් මෙන්; උභතො පරිබාහිරො, ශ්‍රාමණ්‍යයෙන් ද ගෘහිභාවයෙන් ද යනදෙකින්ම පිටත්වන්නේ යි; භික්ඛුභාවං පටිජානන්තොපි, භික්ෂුභාවය ප්‍රතිඥකරන්නෙ ද; අභික්ඛුයෙව, අභික්ෂුමවේ; ගොගණං අනුබන්ධගද්‍රභො විය. ගොගණයක් අනුබන්ධනාවූ කොටළුවකුමෙන්; සතතුබ්බිග්ගො, සතතයෙන්ම උද්විග්න වන්නෙය (කළකිරෙයි); සබ්බවෙරී පුරිසො විය, හැමදෙනහටම වෛරීපුරිෂයකු මෙන්; අසංවාසාරහො, සංවාසයට සුදුසුනොවෙ; මතකළෙබරං විය, සැවශරීරයක් මෙන්; සුතාදිගුණයුත්තොපි, බහුශ්‍රැතාදි ගුණයෙන් යුක්තවූයෙ ද; සබ්‍රහ්මචාරීනං, සබ්‍රම්සරුන්ගෙ; අපූජාරහො, පූජාවට

විසෙසාධිගමෙ, අන්‍ධොව රූපදස්සනෙ, නිරාසො සද්ධම්මෙ, චණ්ඩාල කුමාරො විය රජ්ජෙ, සුඛිතොස්මීති මඤ්ඤමානොපි දුක්ඛිතොව අග්ගික්ඛන්ධපරියායෙ වුත්තදුක්ඛභාගිතාය, දුස්සීලානං හි පඤ්චකාම ගුණපරිභොගවන්දනමානනාදිසුඛස්සාදගධිතචිත්තානං තප්පච්චයං අනුස්සරණමත්තෙනාපි හදයසන්තාපං ජනයිත්වා උණ්හලොහිතුග්ගාරප්පවත්තනසමත්ථං අතිකටුකං දුක්ඛං දසෙසන්තො සබ්බාකාරෙන පච්චක්ඛකම්මවිපාකො. භගවා ආහ:-"පස්සථ නො තුම්හෙ භික්ඛවෙ අමුං මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතන්ති…

(අ) එවම්භන්තෙ. තං කිං මඤ්ඤථ භික්ඛවෙ කතමන්නු ඛො වරං යං අමුං මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආලිඞ්ගිත්වා උපනිසීදෙය්‍ය වා උපනිපජ්ජෙය්‍ය වා,

---

අග්නොවෙ; බ්‍රාහ්මණානං, බමුණන්ට; සුසානග්ගි විය, සොහොන් ගින්නක්මෙන්; අභබ්බො විසෙසාධිගමෙ, විශෙෂාධිගමයෙහි අභව්‍යවෙ; රූපදස්සනෙ අන්‍ධොව, රූ දක්මෙහි අන්‍ධයක්හු මෙන්; සද්ධම්මෙ, ප්‍රතිපත්තිප්‍රතිවෙධසද්ධර්මයෙහි; නිරාසො, ආශානැත්තේයි; චණ්ඩාලකුමාරො විය රජ්ජෙ, රජයෙහි සැඬොල්කුමරුවක්හු මෙන්; සුඛිතොස්මීති මඤ්ඤමානොපි, සුවයෙමි යි සිතන්නෙ ද; දුක්ඛිතො, දුක්ඇත්තේම වේ; අග්ගික්ඛන්ධපරියායෙ වුත්තදුක්ඛභාගිතාය, අග්නිස්කන්ධපර්‍ය්‍යායසූත්‍රයෙහි කී දුකට හිමිව සිටිහෙයින්; පඤ්චකාම ගුණපරිභොගවන්දනමානනාදිසුඛස්සාදගධිතචිත්තානං, පස්කම්ගුණ වැළඳීමෙහි වන සුඛයෙහි ද අනුන්විසින් කරන වන්දනමානනාදියෙන් වන සුඛයෙහි ද ආස්වාදයෙහි ගිජුවූසිත්ඇති; දුස්සීලානං, දුශ්ශීල යන්ට; තප්පච්චයං, යථොක්තවූ සුඛාස්වාදයන් ප්‍රත්‍යයකොට ඇති; ('දුක්ඛං' යනු හා සම්බන්‍ධයි.) අනුස්සරණමත්තෙනාපි, අනුස්මරණ මාත්‍රයෙනු දු; හදයසන්තාපං ජනයිත්වා, හෘදය සන්තාපය කරවා; උණ්හලොහිතුග්ගාරප්පවත්තනසමත්ථං, හුණුලේ නන්වාපියන්නට සමර්ථවූ; අතිකටුකං, ඉතා දරුණුවූ; දුක්ඛං, දුක; දසෙසන්තො, දක්වන්නාවූ; සබ්බාකාරෙන, සර්වාකාරයෙන්; පච්චක්ඛකම්මවිපාකො, ප්‍රත්‍යක්ෂකර්මවිපාකඇත්තාවූ; භගවා, භාග්‍යවත්තෙමෙ; භික්ඛවෙ, මහණෙනි; තුම්හෙ, තොපි; අමුං මහන්තං අග්ගික්ඛන්ධං, තෙලෙ මහත් ගිනිකඳ; ආදිත්තං, ගිනිගත්; සම්පජ්ජලිතං, හාත්පසින් දිලියෙන; සජොතිභූතං, හාත්පසින්නැගෙනගිනිසිලින් ගැවසීගෙන එකප්‍රභා සමූහවූවා; නො පස්සථ, නොදක්නුද යි; ආහ, කී…

(අ) එවම්භන්තෙ, වහන්ස එසේය යි ප්‍රතිවචනදුන්නාහු; භික්ඛවෙ, මහණෙනි; තං කිං මඤ්ඤථ, හේ කුමකැයි හැඟුද; කතමන්නු ඛො වරං, කවරෙක් උතුම් ද; ආදිත්තං, ගිනිගත්; සම්පජ්ජලිතං, හාත් පසින්දිලියෙන; සජොතිභූතං, ගිනිසිලින් දිලියෙන (එකප්‍රභාවූ); අමුං මහන්තං අග්ගික්ඛන්ධං, තෙලෙ මහත් ගිනිකඳ; ආලිඞ්ගිත්වා,

යං ඛත්තියකඤ්ඤං වා බ්‍රාහ්මණකඤ්ඤං වා ගහපතිකඤ්ඤං වා මුදුතලුනහත්ථපාදිං ආලිඞ්ගිත්වා උපනිසීදෙය්‍ය වා උපනිපජ්ජෙය්‍ය වාති. එතදෙව භන්තෙ වරං යං ඛත්තියකඤ්ඤං වා...පෙ...උපනිපජ්ජෙය්‍ය වා, දුක්ඛංහෙතං භන්තෙ යං අමුං මහන්තං අග්ගික්ඛන්ධං ...පෙ...උපනිපජ්ජෙය්‍ය වාති.

(ඇ) ආරොචයාමි වො භික්ඛවෙ පටිවෙදයාමි වො භික්ඛවෙ යථා එතදෙව තස්ස වරං දුස්සීලස්ස පාපධම්මස්ස අසුචිසඞ්කස්සරසමාචාරස්ස පටිච්ඡන්නකම්මන්තස්ස අස්සමණස්ස සමණපටිඤ්ඤස්ස අබ්‍රහ්මචාරිස්ස බ්‍රහ්මචාරිපටිඤ්ඤස්ස අන්තොපූතිස්ස අවස්සුතස්ස කසම්බුජාතස්ස යං අමුං මහන්තං අග්ගික්ඛන්ධං...පෙ...උපනිප

---

වැළඳගෙන; උපනිසීදෙය්‍ය වා, හිඳුනේ හෝ වේද; උපනිපජ්ජෙය්‍ය වා, හෝනේ හෝ වේද යන; යං, යමෙක් ඇද්ද; ඛත්තියකඤ්ඤං වා, රජදුවක හෝ; බ්‍රාහ්මණකඤ්ඤං වා, බැමිණිදුවක හෝ; ගහපතිකඤ්ඤං වා, ගැහැවිදුවක හෝ; මුදුතලුනහත්ථපාදිං, මෘදුවූ සිවුමැලිවූ හස්තපාදාදි අවයවඇත්තිය; ආලිඞ්ගිත්වා, වැළඳගෙන; උපනිසීදෙය්‍ය වා, හිඳුනේහෝ වේද; උපනිපජ්ජෙය්‍ය වා, හෝනේහෝ වේද යන; යං වා, යමෙක්ඇද්ද (මෙ දෙකින්); "කතමන්නුඛො වරං"යි-යොදනු.) භන්තෙ, වහන්ස; එතදෙව, මේම; වරං, උතුම්; ඛත්තියකඤ්ඤං වා, රජදුවක හෝ;...පෙ...උපනිපජ්ජෙය්‍ය වා, වැළඳගෙන හිඳුනෙය යන; යං, යමෙක්ඇද්ද; ("එතදෙව වරං"යි; යොදනු-ඒම උතුම්බවට හෙතුදක්වති "දුක්ඛංහෙතං භන්තෙ"යි) අමුං මහන්තං අග්ගික්ඛන්ධං, තෙලෙ මහත්ගිනිකඳ; උපනිපජ්ජෙය්‍ය වා, වැළඳගෙන හෝනෙ ද යන; යං, යමෙක්ඇද්ද; එතං, මේ; දුක්ඛං ති, දුක්මයයි කීහු;-

(ඇ) භික්ඛවෙ, මහණෙනි; වො, තොපට; ආරොචයාමි, කියමි; භික්ඛවෙ, මහණෙනි; වො, තොපට; පටිවෙදයාමි, හඟවමි; ("තස්ස දුස්සීලස්ස යථා එතදෙව වරං තථා පටිවෙදයාමි"යොදනු.) දුස්සීලස්ස, දුශ්ශීලවූ; පාපධම්මස්ස, ලාමකස්වභාවඇති; අසුචිසඞ්කස්සරසමාචාරස්ස, නොපිරිසුදු කායකර්මාදිඇතිබැවින් ශුචිනොවූ සඞ්කාවෙන් සමරණීයවූ ප්‍රවෘත්තිඇති; පටිච්ඡන්නකම්මන්තස්ස, සැඟවියයුතුවූ ක්‍රියා ඇති; (අනුන්දුටහොත් ලජ්ජාකටයුතුබැවින් සැඟවියයුතු කායවාක්කර්ම ඇතියයි සේයි.) අස්සමණස්ස, මහණනොවූ; සමණපටිඤ්ඤස්ස, ලහගෙ ආදියෙහි ශ්‍රමණයෙමි යන මිථ්‍යාප්‍රතිඥාවෙන් ශ්‍රමණප්‍රතිඥාඇති; අබ්‍රහ්මචාරිස්ස, බ්‍රහ්මචාරිනොවූ; බ්‍රහ්මචාරිපටිඤ්ඤස්ස, උපොසථාදියෙහි බ්‍රහ්මචාරීමි යි යන මිථ්‍යාප්‍රතිඥායෙන් බ්‍රහ්මචාරීප්‍රතිඥා ඇති; අන්තොපූතිස්ස, දුශ්ශීලබැවින්ම ඇතුළෙන් කුණුවූ; අවස්සුතස්ස, සදොරින්වැහෙන කෙලෙසුන්විසින් තෙත්වූ; කසම්බුජාතස්ස, සඤ්ජාතවූ රාගාදිකසළඇති; නොහොත්: සිල්වතුන්

ජ්ජෙය්‍ය වා. තං කිස්ස හෙතු? තතො නිදානං හි සො භික්ඛවෙ මරණං නිගච්ඡෙය්‍ය වා මරණමත්තං වා දුක්ඛං, න ත්වෙව තප්පච්චයා කායස්ස භෙදා [1] නිරයං උපපජ්ජෙය්‍ය. යඤ්ච ඛො සො භික්ඛවෙ දුස්සීලො…පෙ…කසම්බුජාතො ඛත්තියකඤ්ඤං වා…පෙ…උපනිපජ්ජෙය්‍ය වා, තඤ්හි තස්ස භික්ඛවෙ හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය කායස්ස භෙදා නිරයං උපපජ්ජති…

(ඇ) එවං අග්ගික්ඛන්ධූපමාය ඉත්ථිපටිබද්ධපඤ්චකාමගුණපරිභොගපච්චයං දුක්ඛං දස්සෙත්වා එතෙනෙව උපායෙන:–“තං කිං මඤ්ඤථ භික්ඛවෙ කතමං නු ඛො වරං යං බලවා පුරිසො දළ්හාය වාලරජ්ජුයා උභො ජඞ්ඝා වෙඨෙත්වා ඝංසෙය්‍ය සා ඡවිං ඡින්දෙය්‍ය ඡවිං ඡෙත්වා චම්මං ඡින්දෙය්‍ය චම්මං ඡෙත්වා මංසං ඡින්දෙය්‍ය මංසං ඡෙත්වා න්හාරුං

---

විසින් දුරුකටයුතුබැවින් කච්චරස්වභාවඇති; තස්ස, ඔහට; (“අමුං මහන්තං අග්ගික්ඛන්ධං…පෙ…උපනිපජ්ජෙය්‍ය වා ඉති යං එතදෙව වරං”යි යොදනු.) තං කිස්ස හෙතු, එයට හෙතුකිම; භික්ඛවෙ, මහණෙනි; තතො නිදානං හි, ඒ ගිනිකඳ වැළඳගෙනහිඳීම හෙතුකොට ගෙන; සො, ඒ මහණතෙමෙ; මරණං වා නිගච්ඡෙය්‍ය, මරණයට හෝ පැමිණෙයි; මරණමත්තං වා දුක්ඛං, මරණපමණදුකට හෝ පැමිණේ; තප්පච්චයා, ඒ ගිනිකඳ වැළඳගෙන හිඳීමහෙතුකොටගෙන; කායස්ස භෙදා, කායභෙදයෙන් මත්තෙහි; නිරයං නරකයෙහි; න ත්වෙව උපපජ්ජෙය්‍ය, නොමඋපදනේයි; භික්ඛවෙ, මහණෙනි; සො දුස්සීලො, ඒ දුශ්ශීලතෙමේ; කසම්බුජාතො, කසළකටබඳු ස්වභාවඇත්තේ; ඛත්තියකඤ්ඤං වා, රජදුවක හෝ…පෙ…උපනිපජ්ජෙය්‍ය, ආලිඞ්ගනයකොට හිඳුනේද යන; යඤ්ච, යමෙක්ඇද්ද; තං හි, හෙතෙමෙ; භික්ඛවෙ, මහණෙනි; තස්ස, ඒ දුශ්ශීලයහට; දීඝරත්තං, බොහෝ කලක්; අහිතාය, අහිතපිණිස; දුක්ඛාය, දුක්ඛයපිණිස; හොති, වේ; කායස්ස භෙදා, කායභෙදයෙන් මතුයෙහි; නිරයං උපපජ්ජති, නරකයෙහි උපදී…

(ඇ)එවං,මෙසේ;අග්ගික්ඛන්ධූපමාය,ගිනිකඳඋපමාවෙන්;ඉත්ථිපටිබද්ධ, මාගම්පිළිබැඳිවූ; පඤ්චකාමගුණපරිභොගපච්චයං දුක්ඛං දස්සෙත්වා, පස්කම්ගුණපරිභොගය හෙතුකොටඇති දුක් දක්වා; (මතුයෙහි “දුක්ඛං දස්සෙසි” යනු හා සබඳ) එතෙනෙව උපායෙන, මෙමඋපායෙන්; (“තං කිංමඤ්ඤථ” යනාදි යටකී පෙදෙහි අර්ථ කීනියෙන්ම දතයුතු )-බලවා පුරිසො, බලවත් පුරුෂයෙක්; දළ්හාය, දෘඪවූ; වාලරජ්ජුයා, වලින්කරනලද රජ්ජුයෙන්; උභො ජඞ්ඝා වෙඨෙත්වා, ජඞ්ඝා දෙක වෙළා; ඝංසෙය්‍ය, ඝර්ෂණයකෙරෙ ද; (බමනරුහැණමෙන් අදිද යන අර්ථයි;) සා, ඒ රජ්ජුතොමෝ; ඡවිං ඡින්දෙය්‍ය, ඡවි සිඳී; ඡවිං ඡෙත්වා, ඡවිය සිඳ; චම්මං ඡින්දෙය්‍ය, සම සිඳී; චම්මං ඡෙත්වා, සම

---

1. පරම්මරණා-පෙ-විනිපාතං-ත්‍රි. මු.

ඡින්දෙය්‍ය නහාරුං ඡෙත්වා අට්ඨිං ඡින්දෙය්‍ය අට්ඨිං ඡෙත්වා අට්ඨිමිඤ්ජං ආහච්ච තිට්ඨෙය්‍ය, යං වා ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා අභිවාදනං සාදියෙය්‍යාති ච.

(අ) තං කිං මඤ්ඤථ භික්ඛවෙ කතමං නු ඛො වරං යං බලවා පුරිසො තිණ්හාය සත්තියා තෙලධොතාය පච්චොරස්මිං පහරෙය්‍ය, යං වා ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා අඤ්ජලිකම්මං සාදියෙය්‍යාති ච. තං කිං මඤ්ඤථ භික්ඛවෙ කතමං නු ඛො වරං යං බලවා පුරිසො තත්තෙන අයොපට්ටෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන කායං සම්පලිවෙඨෙය්‍ය යං වා ඛත්තියබ්‍රාහ්මණගහපතිමහාසාලානං වා සද්ධාදෙය්‍යං චීවරං පරිභුඤ්ජෙය්‍යාති ච. තං කිං මඤ්ඤථ භික්ඛවෙ කතමං නු ඛො වරං යං බලවා පුරිසො තත්තෙන අයොසඬ්කුනා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන මුඛං විවරිත්වා තත්තං ලොහගුලං සජොතිභූතං මුඛෙ පක්ඛිපෙය්‍ය තං තස්ස ඔට්ඨම්පි ඩහෙය්‍ය, මුඛම්පි ජිව්හම්පි කණ්ඨම්පි උරම්පි ඩහෙය්‍ය අන්තම්පි අන්තගුණම්පි ආදාය අධොභාගං නික්ඛමෙය්‍ය, යං වා ඛත්තියබ්‍රාහ්මණ ගහපති මහාසාලානං වා සද්ධාදෙය්‍යං පිණ්ඩපාතං පරිභුඤ්ජෙය්‍යාති ච. තං කිං මඤ්ඤථ භික්ඛවෙ

---

සිඳ; මංසං ඡින්දෙය්‍ය, මස් සිඳී; මංසං ඡෙත්වා, මස් සිඳ; නහාරුං ඡින්දෙය්‍ය, නහර සිඳී; නහාරුං ඡෙත්වා, නහර සිඳ; අට්ඨිං ඡින්දෙය්‍ය, ඇට සිඳී; අට්ඨිං ඡෙත්වා, ඇටසිඳ; අට්ඨිමිඤ්ජං ආහච්ච තිට්ඨෙය්‍ය, ඇටමිදුලෙහි පැහැරසිටුනෙය යන; යං, යමෙක්ඇද්ද; ඛත්තියමහාසාලානං වා, ක්‍ෂත්‍රියමහාසාරයන්ගෙ හෝ; බ්‍රාහ්මණමහාසාලානං වා, බ්‍රාහ්මණමහාසාරයන්ගෙ හෝ; ගහපතිමහාසාලානං වා, ගෘහපති මහාසාරයන්ගෙ හෝ; අභිවාදනං සාදියෙය්‍ය, වැඳීම් ඉවසන්නේය යන; යං, යමෙක්ඇද්ද; (ඒ දෙක්හි;) ("කතමං නු ඛො වරං"යි යොදනු මතුයෙහි දු මෙමනියායි.)-

(අ) තිණ්හාය, තියුණුවූ; තෙලධොතාය, තෙල්සැණූ; සත්තියා, අඬයටියෙන්; පච්චොරස්මිං, ළමැද; පහරෙය්‍ය, පහරනෙ ද...පෙ... අඤ්ජලිකම්මං, අඤ්ජලිකර්මය (ඇදිලිබැඳීම්);...පෙ...තත්තෙන, රත්කරනලද;-අයොපට්ටෙන, යපටින්; කායං, ශරීරය; සම්පලිවෙඨෙය්‍ය, හාත්පසින් වෙෂ්ටනය කරන්නෙද...පෙ...සද්ධාදෙය්‍යං චීවරං, සැදැහැයෙන් දෙනලද සිවුර; පරිභුඤ්ජෙය්‍යාතිච, වැළඳගනි ද...පෙ...අයොසඬ්කුනා, යහඬුවෙන්; . මුඛං විවරිත්වා, මුඛය විවරකොට; සජොතිභූතං, දිලියෙන්නාවූ; ලොහගුලං, යවට; මුඛෙ පක්ඛිපෙය්‍ය, මුවෙහි බහාලාද; තං, හේ යවට;-ඔට්ඨම්පි ඩහෙය්‍ය, තොලද දවන්නේය; මුඛම්පි, මුඛයද; ජිව්හම්පි, දිවද; කණ්ඨම්පි, ගළයද; උරම්පි, ළයද; ඩහෙය්‍ය, දවන්නෙය; අන්තම්පි, අතුණුද; අන්තගුණම්පි, අතුණුබහණු දු; ආදාය, ගෙන; අධොභාගං, අධොභාග යට; නික්ඛමෙය්‍ය, නික්මෙන්නේයි. සද්ධාදෙය්‍යං පිණ්ඩපාතං,

කතමන්නු ඛො වරං යං බලවා පුරිසො සීසෙ වා ගහෙත්වා ඛන්ධෙ වා ගහෙත්වා තත්තං අයොමඤ්චං වා අයොපීඨං වා ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං අභිනිසීදාපෙය්‍ය වා අභිනිපජ්ජාපෙය්‍ය වා, යං වා ඛත්තියබ්‍රාහ්මණගහපතිමහාසාලානං වා සද්ධාදෙය්‍යං මඤ්චපීඨං පරිභුඤ්ජෙය්‍යාති ච. තං කිං මඤ්ඤථ භික්ඛවෙ කතමන්නු ඛො වරං යං බලවා පුරිසො උද්ධපාදං අධොසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපෙය්‍ය ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය, සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චමානො සකිම්පි උද්ධං ගච්ඡෙය්‍ය සකිම්පි අධො ගච්ඡෙය්‍ය සකිම්පි තිරියං ගච්ඡෙය්‍ය, යං වා ඛත්තියබ්‍රාහ්මණ ගහපති මහාසාලානං වා සද්ධාදෙය්‍යං විහාරං පරිභුඤ්ජෙය්‍යාති වාති.

(අ) ඉමානි වාලරජ්ජුතිණ්හසත්ති අයොපට්ට අයොගුළ අයොමඤ්ච අයොපීඨ අයොකුම්භි උපමානි අභිවාදන අඤ්ජලිකම්ම චීවරපිණ්ඩපාත මඤ්චපීඨවිහාරපරිභොගපච්චයං දුක්ඛං දස්සෙසි…තස්මා…

73 අග්ගික්ඛන්ධාලිඞ්ගන දුක්ඛාධිකදුක්ඛකටුකප්ඵලං
අවිජහතො කාමසුඛං සුඛං කුතො භින්නසීලස්ස.

---

සැදැහැයෙන් දෙනලද අහර; පරිභුඤ්ජෙය්‍ය, වළඳන්නෙද;–සීසෙ වා ගහෙත්වා, හිසහෝ ගෙන; ඛන්ධෙ වා, ගහෙත්වා කඳටහෝ ගෙන; අයොමඤ්චං වා, යහැඳකහෝ; අයොපීඨං වා, යපුටුවකවත්; අභිනිසීදාපෙය්‍ය වා, හිඳුවන්නෙද; අභිනිපජ්ජාපෙය්‍ය වා, හොවන්නෙද; උද්ධපාදං දෙපය උඩුකොට; අධො සිරං ගහෙත්වා, ඉස යටකොටගෙන; තත්තාය, කකියන්නාවූ; ලොහකුම්භියා, ලොහොකුඹුනරකයෙහි; පක්ඛිපෙය්‍ය, බහාලන්නෙ ද; සො, හෙතෙම; ඵෙණුද්දෙහකං, පෙණ නගනගා; පච්චමානො, පැසෙන්නෙද; සකිං, එක්වටෙක; උද්ධං ගච්ඡෙය්‍ය, උඩට නැගෙන්නෙය; සකිං, එක්වටෙක; අධො ගච්ඡෙය්‍ය, යට බස්නේයි; සකිං, එක්වටෙක; තිරියං ගච්ඡෙය්‍ය, සරසට යන්නේයි…පෙ…විහාරං, සෙනසුන්; පරිභුඤ්ජෙය්‍ය, වැළඳ ගන්නේයයි; ඉති ච, මෙසේද; ("ඉමානි උපමානි යි" යොදනු.)

(අ) ඉමානි, මේ; වාලරජ්ජු, වලින්කළරෙද්ද; තිණ්හසත්ති, තියුණුවූ අඩයටිය; අයොපට්ට, යපට; අයොගුළ, යවට; අයොමඤ්ච, යහැඳ; අයොපීඨ, යපුටුය; අයොකුම්භි, ලොහොකුඹුය යන; උපමානි, උපමාවෙන්; අභිවාදන, වැඳීම; අඤ්ජලිකම්ම, ඇඳිලිබැඳීම; චීවර, සිවුරු; පිණ්ඩපාත, අහර; මඤ්චපීඨ, හැඳපුටුය; විහාර, සෙනසුන (යන මොවුන්ගේ); පරිභොගපච්චයං, පරිභොගය ප්‍රත්‍යයකොට ඇති; දුක්ඛං දස්සෙසි, දුක් දැක්වී…තස්මා, එහෙයින්; (බුදුන් මෙසේ වදාළබැවිනැයි යු සේයි…

73. අග්ගික්ඛන්ධාලිඞ්ගනදුක්ඛ, ගිනිකඳ වැළඳගැන්මෙන්වන දුකට වඩා; අධිකදුක්ඛකටුකප්ඵලං, ඉතාදුක්වූ තියුණු විපාකඇති; කාමසුඛං, කාමසුඛය; අවිජහතො, නොහරණාවූ; භින්නසීලස්ස, දුශ්ශීලයහට; සුඛං කුතො, සුවකොහි; (සුවෙක්නම් නැත යන අභිප්‍රායයි.)

74 අභිවාදනසාදියනෙ කින්නාමසුඛං විපන්නසීලස්ස
දළ්හවාලරජ්ජුඝංසන දුක්ඛාධිකදුක්ඛභාගිස්ස.

75 සද්ධානමඤ්ජලිකම්ම සාදියනෙ කිං සුඛං අසීලස්ස
සත්තිප්පහාරදුක්ඛාධිමත්තදුක්ඛස්ස යං හෙතු.

76 චීවරපරිභොගසුඛං කින්නාම අසඤ්ඤතස්ස
යෙන චිරං අනුභවිතබ්බා නිරයෙ ජලිතඅයොපට්ටසම්ඵස්සා.

77 මධුරොපි පිණ්ඩපාතො හලාහලවිසූපමො අසීලස්ස
ආදිත්තා ගිලිතබ්බා අයොගුළා යෙන චිරරත්තං.

78 සුඛසම්මතොපි දුක්ඛො අසීලිනො මඤ්චපීඨපරිභොගො
යං බාධිස්සන්ති චිරං ජලිතඅයොමඤ්චදුක්ඛානි.[1]

79 දුස්සීලස්ස විහාරෙ සද්ධාදෙය්‍යම්හි කා නිවාසරති
ජලිතෙසු නිවසිතබ්බං යෙන අයොකුම්භිමජ්ඣෙසු.

---

74. දළ්හවාලරජ්ජුඝංසන, තරවූවාලයෙන් අඹරනලද රජ්ජුඝර්ෂණයෙන්වන; දුක්ඛාධිකදුක්ඛභාගිස්ස, දුකටවඩා අධිකදුඃඛයට හෙතුකාරණ වූ; අභිවාදනසාදියනෙ, වැඳුම් ඉවසීමෙහි; විපන්නසීලස්ස, දුස්සීලයහට; කින්නාමසුඛං, කවරනම් සුවයෙක් ද.

75. සත්තිප්පහාරදුක්ඛා, තියුණු අඩයටියෙන් පහරන දුකටවඩා; අධිමත්තදුක්ඛස්ස, අධිමාත්‍රවූ දුකට; යං හෙතු, යමක් කාරණවේද; අසීලස්ස, (ඒ) සිල් නැත්තහුට; සද්ධානං, සැදැහැඇත්තවුන්ගෙ; අඤ්ජලිකම්මසාදියනෙ, අඤ්ජලිකර්මඉවසීමෙහි; කිං සුඛං, කවර සුවයෙක්ද;

76. යෙන, යමක්හුවිසින්; නිරයෙ, නිරැහි; ජලිතඅයොපට්ටසම්ඵස්සා, දිලියෙන යපට පහස්හු; චිරං, බොහෝකලක්; අනුභවිතබ්බා, අනුභව කටයුත්තාහු ද; අසඤ්ඤතස්ස, (ඒ) අසංවෘත මහණහට; චීවරපරිභොගසුඛං කිං නාම, සිවුරුපරිභොගයෙන් වන සුවයෙක් කිමෙක් නම් ද; (සුවනැත යුතැති.)

77. යෙන, යමක්හුවිසින්; චිරරත්තං, බොහෝකලක්; ආදිත්තා, ආදීප්තවූ; අයොගුළා, යවටහු; ගිලිතබ්බා, ගිලියයුත්තාහු ද; අසීලස්ස (ඒ) නිශ්ශීලයහට; මධුරොපි පිණ්ඩපාතො, මධුරද වූ පිණ්ඩපාතය; හලාහලවිසූපමො, හලාහලවිස වැන්නේය.

78. යං, යමක්හු; ජලිතඅයොමඤ්චදුක්ඛානි, දිලියෙන අයොමඤ්ච දුඃඛයෝ; චිරං, බොහෝකලක්; බාධිස්සන්ති, පෙළත් ද; අසීලිනො, (ඒ) නිශ්ශීලයහට; සුඛසම්මතොපි, සුවයයි සම්මතද වූ; මඤ්චපීඨපරිභොගො, හැඳපුටුපරිභොගය; දුක්ඛො, දුක්මවේ.

79. යෙන, යමක්හු විසින්; ජලිතෙසු අයොකුම්භිමජ්ඣෙසු, දිලියෙන ලොහොකුඹුමැද; නිවසිතබ්බං, විසියයුතු ද; දුස්සීලස්ස, (ඒ) දුශ්ශීලයහට; සද්ධාදෙය්‍යම්හි විහාරෙ, ශ්‍රද්ධාදෙයවූ විහාරයෙහි; කා නිවාසරති, කවරනම් නිවාසරතියෙක්ද.

---

1. මඤ්චපීඨානි-ත්‍රි. මු.

80 සඞ්කස්සරසමාචාරො කසම්බුජාතො අවස්සුතො පාපො
අන්තොපූතීති ච යං නින්දන්තො ආහ ලොකගුරු.

81 ධි ජීවිතං අධඤ්ඤස්ස තස්ස ච සමණජනවෙසධාරිස්ස[1]
අස්සමණස්ස උපහතං ඛතමත්තානං වහන්තස්ස.

82 ගූථං විය කුණපං විය මණ්ඩනකාමා විවජ්ජයන්තීධ
යන්නාම සීලවන්තො සන්තො කිං ජීවිතං තස්ස.

83 සබ්බභයෙහි අමුත්තො මුත්තො සබ්බෙහි අධිගමසුඛෙහි
සුපිහිතසග්ගද්වාරො අපායමග්ගං සමාරූළ්හො.

84 කාරුණ්ණාය වත්ථුභූතො කාරුණිකජනස්ස නාම කො අඤ්ඤො
දුස්සීලසමො දුස්සීලතාය ඉති බහුවිධා දොසාති.

---

80. සඞ්කස්සරසමාචාරො, ශඞ්කාවෙන් සිහිකටයුතුවූ ප්‍රවෘත්ති ඇතියේය; කසම්බුජාතො, සිල්වතුන් විසින් දුරුකටයුතුබැවින් කචවර ස්වභාව වූයේය; අවස්සුතො, සදොරින්ම වැහෙන කෙලෙසුන් විසින් තෙත්ය; පාපො, ලාමකය; අන්තොපූතීති ච, ඇතුළෙන්කුණුයයිද; යං, යමෙක්හුට; නින්දන්තො, නින්දාකරන; ලොකගුරු, තුන්ලෝ ගුරුතෙම; ආහ, කීද.

81. අධඤ්ඤස්ස, අධන්‍යවූ;(පින්නැත්තාවූ;) සමණජන වෙසධාරිස්ස, මහණජනයාගෙ වෙස්ධැරූ; අස්සමණස්ස, මහණනොවූ; උපහතං, ශීලවිනාශයෙන් නටුවාවූ; ඛතමත්තානං වහන්තස්ස, ඛණනලද කුසල් මුල්ඇති සිරුරු උසුලන්නාවූ; තස්ස, ඔහුගේ; ජීවිතං, ජීවිතයට; ධි (අහෝ), නින්දාවේවා.

82. මණ්ඩනකාමා, ශරීරමණ්ඩනය කැමැත්තාහු; ගූථං විය, ගූථයක් මෙන්ද; කුණපං විය, කුණපයක්මෙන්ද; (යම්සේ ශරීරමණ්ඩනය කැමැත්තාහු ගූථය කුණපය දුරුකෙරෙද්ද එසේමය යන අර්ථයි.) ඉධ, මේ ශාසනයෙහි; සීලවන්තො සන්තො, සිල්වත්වූ සත්පුරුෂයෝ; යං නාම විවජ්ජයන්ති, යමක්හුනම් දුරුකෙරෙද්ද; තස්ස ජීවිතං කිං නාම, ඔහුගේ ජීවිතය කිමෙක්නම් ද.?

83. සබ්බභයෙහි, ආත්මානුවාදාදී සියලු භයින්; අමුත්තො, මුක්ත නොවූ; සබ්බෙහි අධිගමසුඛෙහි, උපචාරාදිවූ සියලු අධිගමසුඛයෙන්; මුත්තො, මුක්තවූ (දුරුවූ); සුපිහිත, මනාකොටපියනලද; සග්ගද්වාරො, ස්වර්ගද්වාරඇති; අපායමග්ගං, අපායමඟට; සමාරූළ්හො, නැංගාවූ.

84. කාරුණිකජනස්ස, කරුණාඇතිජනයාගේ; කාරුණ්ණාය වත්ථු භූතො, කරුණාවට වස්තුවූ (භාජනවූ); දුස්සීලසමො, දුශ්ශීලයා හා සදෘශවූ; අඤ්ඤො, අනිකෙක්; කො නාම, කවරෙක්නම් ද; දුස්සීලතාය, දුශ්ශීලබැවිනි; ඉති, මෙසේ; දොසා, දෝෂයෝ; බහුවිධා, අනෙකප්‍රකාරයෝයි.

---

1. තස්ස සමණජන වෙසධාරිස්ස-ත්‍රි. මූ.

(අ) එවමාදිනා පච්චවෙක්ඛනෙන සීලවිපත්තියං ආදීනවදස්සනං, වුත්තප්පකාරවිපරීතතො සීලසම්පත්තියං ආනිසංසදස්සනඤ්ච වෙදිතබ්බං. අපි ච:–

85 තස්ස පාසාදිකං හොති පත්තචීවරධාරණං
පබ්බජ්ජා සඵලා තස්ස යස්ස සීලං සුනිම්මලං.

86 අත්තානුවාදාදිභයං සුද්ධසීලස්ස භික්ඛුනො
අන්ධකාරං විය රවිං හදයං නාවගාහති.

87 සීලසම්පත්තියා භික්ඛු සොභමානො තපොවනෙ
පභාසම්පත්තියා චන්දො ගගනෙ විය සොභති.

88 කායගන්ධොපි පාමොජ්ජං සීලවන්තස්ස භික්ඛුනො
කරොති අපි දෙවානං සීලගන්ධෙ කථාව කා.

89 සබ්බෙසං ගන්ධජාතානං සම්පත්තිං අභිභුය්‍ය හි
අවිඝාති දසදිසා සීලගන්ධො පවායති.

---

(අ) එවමාදිනා, මෙආදිවූ; පච්චවෙක්ඛනෙන, ප්‍රත්‍යවෙක්‍ෂණයෙන්; සීලවිපත්තියං ආදීනවදස්සනං, ශීලවිපත්තියෙහි ආදීනවදැක්ම ද; වුත්තප්පකාරවිපරීතතො, (ශීලවිපත්තියෙහි) උක්තප්‍රකාරයට ප්‍රතිපක්‍ෂහෙයින්; සීලසම්පත්තියං, ශීලසම්පත්තියෙහි; ආනිසංසදස්සනඤ්ච ආනිසංස දර්‍ශනය ද; වෙදිතබ්බං, දතයුතු; අපි ච, අනිකෙකු දු; (සෙසු සීලානිසංසයෝ ද ඇත යන අර්‍ථයි.)

85. යස්ස, යමක්හුගෙ; සීලං, ශීලයතෙමෙ; සුනිම්මලං, මනාකොටම නිර්මලද; තස්ස, ඔහුගෙ; පත්තචීවරධාරණං, පාත්‍රචීවරධාරණය; පාසාදිකං හොති, ප්‍රසාදකර වේ; තස්ස, ඔහුගෙ; පබ්බජ්ජා ප්‍රව්‍රජ්‍යාව; සඵලා, සඵලවේ.

86. සුද්ධසීලස්ස, පිරිසුදු සිල්ඇති; භික්ඛුනො, භික්‍ෂුහුගෙ; හදයං, ළයට; අත්තානුවාදාදිභයං, ආත්මානුවාදාදිභය; නාවගාහති, නොබසී; (කුමක්මෙනයත්?) රවිං අන්ධකාරං විය, හිරුකරා අඳුරු නොබස්නා සෙයිනි.

87. තපොවනෙ, තපොවනයෙහි; සීලසම්පත්තියා සොභමානො භික්ඛු, ශීලසම්පත්තින් හොබනාවූ මහණතෙමෙ; සොභති, හොබී; (කෙසේදයත්?) පභාසම්පත්තියා, ප්‍රභාසම්පත්තින් හොබනාවූ; ගගනෙ චන්දො විය, ආකාශයෙහි සඳුමෙනි.

88. සීලවන්තස්ස භික්ඛුනො, සිල්වත් භික්‍ෂුහුගෙ; කායගන්ධොපි, ශරීරගන්ධයද; අපි දෙවානං, දෙවියන්ටපවා; පාමොජ්ජං කරොති, ප්‍රීතියකෙරෙයි; සීලගන්ධෙ, ශීලගන්ධයෙහි; කථාව කා, කථාම කිම.?

89. සබ්බෙසං ගන්ධජාතානං, තගරමල්ලිකාදි සියලු ගන්ධජාතීන්ගේ; සම්පත්තිං අභිභුය්‍ය, සම්පත්තියමැඩ; දසදිසා, දශදික්හි; අවිඝාති, අප්‍රතිඝාතිව; (පැකිල්මක් නැතිව;) සීලගන්ධො, ශීලගන්ධය; පවායති, හමා.

90 අප්පකම්පි කතා කාරා සීලවන්තෙන මහප්ඵලා
හොන්තීති සීලවා හොති පූජාසක්කාරභාජනං.

91 සීලවන්තං න බාධෙන්ති ආසවා දිට්ඨධම්මිකා
සම්පරායිකදුක්ඛානං මූලං ඛණති සීලවා.

92 යා මනුස්සෙසු සම්පත්ති යා ච දෙවෙසු සම්පදා
න සා සම්පන්නසීලස්ස ඉච්ඡතො හොති දුල්ලභා.

93 අච්චන්තසන්තාපනයා අයං නිබ්බානසම්පදා
සම්පන්නසීලස්ස මනො තමෙව අනුධාවති.

94 සබ්බසම්පත්තිමූලම්හි සීලම්හි ඉති පණ්ඩිතො
අනෙකාකාරවොකාරං ආනිසංසං විභාවයෙති.

(අ) එවං හි විභාවයතො සීලවිපත්තිතො උබ්බිජ්ජිත්වා සීලසම්පත්තිනින්නං මානසං හොති; තස්මා යථාවුත්තං ඉමං සීලවිපත්තියා ආදීනවං,

---

90. සීලවන්තෙන, සිල්වත්හු කෙරෙහි; කතා, කරනලද; අප්පකම්පි කාරා, මදවූද ක්‍රියාකෙනෙක්; මහප්ඵලා හොන්තීති, මහාඵලවෙත් නුයි; සීලවා, සිල්වත්තෙමෙ; පූජාසක්කා රභාජනං හොති, පූජාසත් කාරයට භාජනවේ.

91. දිට්ඨධම්මිකා, මෙම ආත්මභාවයෙහි වන; ආසවා, වධබන්ධාදි උපද්‍රවයෝ; සීලවන්තං, සිල්වත්හු; න බාධෙන්ති, නොපෙළත්; සීලවා, සිල්වත්තෙමෙ; සම්පරායිකදුක්ඛානං, පරලෙවුහි වන දුඃඛයන්ගෙ; මූලං, දෞශ්ශීල්‍යසඞ්ඛ්‍යාතමූලය; ඛණති, කාණී.

92. මනුස්සෙසු, මිනිසුන් කෙරෙහි; යා සම්පත්ති, යම් සම්පත්තියක් ඇද්ද; යාච දෙවෙසු සම්පදා, දෙවියන් කෙරෙහි යම් සම්පත්තියක් ඇද්ද; සා, ඒ සම්පත්තිතොමෝ; ඉච්ඡතො, (ඒ සැපත්) කැමති; සම්පන්නසීලස්ස, ශීලසම්පන්නයහට; න දුල්ලභ හොති, දුර්ලභනොවේ.

93. අච්චන්තසන්තා, අත්‍යන්තයෙන් ශාන්තවූ(හැමදවස්ම ශාන්තවූ); යා අයං නිබ්බානසම්පදා, යම් මේ නිර්වාණසම්පත්තියක් ඇද්ද; සම්පන්නසීලස්ස, සම්පන්නශීලයාගේ; මනො, සිත; තමෙව, ඒ නිර්වාණසම්පදාවම; අනුධාවති, අනුවදිවේ.

94. සබ්බසම්පත්තිමූලම්හි, සියලු සැපතට මුල්වූ; සීලම්හි, ශීලයෙහි; ඉති, මෙසේ; පණ්ඩිතො, නුවණැත්තෙ; අනෙකාකාරවොකාරං, අනෙකාකාරයෙන් විස්තරවූ; ආනිසංසං, අනුසස්; විභාවයෙ, පහළකරන්නේයි.

(අ) එවං හි විභාවයතො, මෙසේ විභාවනාකරනුවහුගෙ; සීලවිපත්තිතො උබ්බිජ්ජිත්වා, ශීලවිපත්තින් උත්‍රස්තව; සීලසම්පත්තිනින්නං, ශීලසම්පත්තියෙහි නිම්නවූ; මානසං හොති, මානසවන්නේ යි; තස්මා, එහෙයින්; යථාවුත්තං, කියනලද; ඉමං සීලවිපත්තියා ආදීනවං,

ඉමඤ්ච සීලසම්පත්තියා ආනිසංසං දිස්වා සබ්බාදරෙන සීලං වොදාපෙතබ්බන්ති෴ එත්තාවතා ච "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො"ති ඉමිස්සා ගාථාය සීලසමාධිපඤ්ඤාමුඛෙන දෙසිතෙ විසුද්ධිමග්ගෙ සීලං තාව පරිදීපිතං හොති෴

**ඉති සාධුජනපාමොජ්ජත්ථාය කතෙ විසුද්ධිමග්ගෙ**

## සීලනිද්දෙසො නාම

**පඨමො පරිච්ඡෙදො.**

—×—

**2**

(අ) ඉදානි යෙහි අප්පිච්ඡතා සන්තුට්ඨිතාදීහි ගුණෙහි වුත්තප්පකාරස්ස සීලස්ස වොදානං හොති තෙ ගුණෙ සම්පාදෙතුං යස්මා සමාදින්නසීලෙන යොගිනා ධුතඞ්ගසමාදානං කාතබ්බං, එවං හිස්ස අප්පිච්ඡතාසන්තුට්ඨිතාසල්ලෙඛපවිවෙකාපචයවිරියාරම්භසුභරතාදිගුණසලිලවික්ඛාලිතමලං සීලඤ්චෙව සුපරිසුද්ධං භවිස්සති වතානි ච සම්පජ්ජස්සන්ති

---

මේ ශීලවිපත්තියෙහි ආදීනවද; ඉමඤ්ච සීලසම්පත්තියා ආනිසංසං, මේ ශීලසම්පත්තියෙහි අනුසස් ද; දිස්වා, දැක; සබ්බාදරෙන, සියලු ආදරයෙන්; සීලං, ශීලය; වොදාපෙතබ්බං, පිරිසුදුකටයුතු෴ එත්තාවතා ච, මෙපමණෙකිනු දු **"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො"**ති ඉමිස්සා ගාථාය, "සීලෙ පතිට්ඨාය" යනාදී මේ ගාථාවෙහි; සීලසමාධිපඤ්ඤාමුඛෙන දෙසිතෙ, ශීල සමාධිප්‍රඥාමුඛයෙන් දෙසනලද; විසුද්ධිමග්ගෙ, විශුද්ධිමාර්ගයෙහි; සීලං තාව පරිදීපිතං හොති, පළමුකොට ශීලය දක්වනලදී෴

## සීලනිද්දෙසො.

—×—

**2**

(අ) ඉදානි, දැන්; අප්පිච්ඡතා, අපිස්බවය; (අපිස්අදහස් ඇතිබවය යුතැති;) සන්තුට්ඨිතාදීහි, ඉතරීතරපසයෙන් සතුටුවීම යනාදිවූ; යෙහි ගුණෙහි, යම්ගුණයෙකින්; වුත්තප්පකාරස්ස සීලස්ස, කියනලදප්‍රකාර ඇති ශීලයාගේ; වොදානං හොති, පිරිසුදුබවවේ ද; තෙ ගුණෙ, ඒ ගුණයන්; සම්පාදෙතුං, සපයනුපිණිස; යස්මා, යම්හෙයෙකින්; සමාදින්නසීලෙන, සමාදන්වූ සිල්ඇති; යොගිනා, යොගීහුවිසින්; ධුතඞ්ගසමාදානං කාතබ්බං, ධුතාඞ්ගසමාදන්වීම කටයුතු; එවං හි, එසේකල්හි; අස්ස, ඒ යොගීහුගෙ; අප්පිච්ඡතා, අපිස්බව; සන්තුට්ඨිතා, ලදපසයෙහි සතුටුවීම; සල්ලෙඛ, මනාකොට කෙලෙසුන්ලියීම; (සිඳීම තුනීකිරීම යයි සේයි;) පවිවෙක, සිත් විවෙකයට කරුණුවූ කායවිවෙකය; අපචය, කෙලෙසුන්ගෙ විදෑහීම; (කෙලශාපගමයයි සේයි;) විරියාරම්භ, ආරබ්ධවීර්‍ය්‍යඇතිබව; සුභරතා, සුපොෂ්‍යබව; (ආදිශබ්දයෙන් අප්පකිච්චතා සල්ලහුකවුත්තියතාදීන් ගත්හු.) ගුණසලිල, ගුණනැමැතිජලයෙන්; වික්ඛාලිතමලං, ප්‍රක්‍ෂාලිතවූ මලඇති; සීලඤ්චෙව, ශීලයද; සුපරිසුද්ධං

ඉති අනවජ්ජසීලබ්බතගුණපරිසුද්ධසමාචාරෙ පොරාණෙ අරියවංසත්තයෙ පතිට්ඨාය චතුත්ථස්ස භාවනාරාමතාසඞ්ඛාතස්ස අරියවංසස්ස අධිගමාරහො භවිස්සති; තස්මා ධුතඞ්ගකථං ආරභිස්සාම:-භගවතා හි පරිච්චත්තලොකාමිසානං කායෙ ච ජීවිතෙ ච අනපෙක්ඛානං අනුලොමපටිපදංයෙව ආරාධෙතුකාමානං කුලපුත්තානං තෙරසධුතඞ්ගානි අනුඤ්ඤාතානි සෙය්‍යථීදං:-**පංසුකූලිකඞ්ගං, තෙචීවරිකඞ්ගං, පිණ්ඩපාතිකඞ්ගං, සපදානචාරිකඞ්ගං, එකාසනිකඞ්ගං, පත්තපිණ්ඩිකඞ්ගං, ඛලුපච්ඡාභත්තිකඞ්ගං, ආරඤ්ඤිකඞ්ගං, රුක්ඛමූලිකඞ්ගං, අබ්භොකාසිකඞ්ගං, සොසානිකඞ්ගං, යථාසන්ථතිකඞ්ගං, නෙසජ්ජිකඞ්ගන්ති.** තත්ථ:-

95 අත්ථතො ලක්ඛණාදීහි සමාදානවිධානතො
පභෙදතො භෙදතො ච තස්ස තස්සානිසංසතො.

---

භවිස්සති, ප්‍රතිපක්‍ෂධර්මයන් දුරුවීමෙන් සුපරිසුද්ධවන්නේය; චතානි ච, ධුතධම්මයෝද; සම්පජ්ජිස්සන්ති, සම්පන්නවෙත්; (අපිස්ආදි ගුණ වඩුත්ම දුහඟහුදුපරිපූර්ණවෙව නිපදිතියි-යුසේයි.) ඉති, මෙසේ; අනවජ්ජ, නිර්දෙෂවූ; සීලබ්බතගුණ, සිල් හා දුහඟගුණෙන්; පරිසුද්ධසමාචාරෙ, පිරිසුදු සියලු ප්‍රයොගඇතියෙ; පොරාණෙ, පෞරාණවූ; (බුද්ධාදි ආර්‍ය්‍යයන්ගේ ප්‍රවෙණිබැවින් පොරාණවූ;) අරියවංසත්තයෙ, ඉතරීතර චීවරපිණ්ඩපාත සෙනාසන සන්තුට්ඨිසඞ්ඛ්‍යාත ආර්‍ය්‍යවංශත්‍රයෙහි; පතිට්ඨාය, පිහිටා; චතුත්ථස්ස, සතරවනුවූ; භාවනාරාමතාසඞ්ඛාතස්ස, සමථභාවනා විපස්සනාභාවනායෙහි යුක්තබවයයි කියනලද; අරියවංසස්ස, අරියවස්හුගෙ; අධිගමාරහො භවිස්සති, අධිගමයට සුදුසු වේද; තස්මා, එහෙයින්; ("යස්මා අධිගමාරහො භවිස්සති තස්මා"යි යොදනු.) ධුතඞ්ගකථං ආරභිස්සාම, ධුතාඞ්ගකථාව ආරම්භකරමු; භගවතා, භගවත්හුවිසින්; ("අනුඤ්ඤාතානි" යනු සබඳ) පරිච්චත්ත ලොකාමිසානං, දුරුකරනලද ලොකාමිෂඇති; (තෘෂ්ණාවෙන් පිරිමැදියයුතු බැවින්ද ලොකපරියාපන්න බැවින්ද ලාභසත්කාරාදීහු ලොකාමිෂ නම් වෙත්.) කායෙ ච ජීවිතෙ ච අනපෙක්ඛානං, කයෙහි දු ජීවිතයෙහි දු නිරපෙක්‍ෂවූ; අනුලොමපටිපදං යෙව, නිර්වාණාධිගමයට අනුලොම්වූ විපස්සනාභාවනාසඞ්ඛ්‍යාත පිළිවෙත්ම; ආරාධෙතුකාමානං, සිද්ධකරනුකැමැතිවූ; කුලපුත්තානං, ආචාරකුලපුත්නට; තෙරසධුතඞ්ගානි, තෙළෙස්ධුතාඞ්ගයෝ; අනුඤ්ඤාතානි, අනුදන්නාලදහු; සෙය්‍යථීදං, ඔහුකවරහ;-තත්ථ, ඒ තෙළෙස්ධුතාඞ්ගයන් කෙරෙහි; ("විනිච්ඡයො විඤ්ඤාතබ්බො"යි යොදනු.

95. අත්ථතො, (පංසුකූලාදි ඒ ඒ ශබ්දයන්ගේ)අර්ථවශයෙන්ද; ලක්ඛණාදීහි, ලක්‍ෂණරසාදිවිසින්ද; සමාදානවිධානතො, සමාදානවිසින්ද විධානවිසින්ද; පභෙදතො, විභාගවිසින්ද; භෙදතොච, බිඳීම්විසින්ද; තස්ස තස්සානිසංසතො, ඒ ඒ ධුතාඞ්ගයාගෙ අනුසස්විසින්ද.

96 කුසලත්තිකතො චෙව ධුතාදීනං විභාගතො
සමාසව්‍යාසතො චාපි විඤ්ඤාතබ්බො විනිච්ඡයො.

(අ) අත්ථතො තාව රථිකා සුසානසඞ්කාරකූටාදීනං යත්ථ කත්ථචි පංසූනං උපරිඨිතත්තා අබ්භුග්ගතට්ඨෙන තෙසු පංසුසු කූලමිවාති පංසුකූලං; අථවා පංසුං විය කුච්ඡිතභාවං උලතීති පංසුකූලං–කුච්ඡිතභාවං ගච්ඡතීති වුත්තං හොති; එවං ලද්ධනිබ්බචනස්ස පංසුකූලස්ස ධාරණං පංසුකූලං; පංසුකූලං සීලමස්සාති පංසුකූලිකො; පංසුකූලිකස්ස අඞ්ගං පංසුකූලිකඞ්ගං, අඞ්ගන්ති කාරණං වුච්චති, තස්මා යෙන සමාදානෙන සො පංසුකූලිකො හොති, තස්සෙතං අධිවචනන්ති වෙදිතබ්බං.

---

96. කුසලත්තිකතො චෙව, කුශලත්‍රිකවිසින් ද; ධුතාදීනං විභාගතො, ධුතය ධුතවාදය ධුතධර්මය ධුතාඞ්ගය යන මොවුන්ගෙ විභාගවිසින් ද; සමාසව්‍යාසතො චාපි, සංක්‍ෂෙප හා විස්තරවිසින් ද; විනිච්ඡයො විඤ්ඤාතබ්බො, විනිශ්චය දතයුත්තේයි.

(අ) තාව, පළමුකොට; අත්ථතො, වචනාර්ථහෙයින්; රථිකා සුසානසඞ්කාරකූටාදීනං, වීථිය සොහොනය කසළගොඩය යනාදීන් කෙරෙන්; යත්ථ කත්ථචි, යම්කිසිතැනෙක්හි; පංසූනං උපරිඨිතත්තා, පාංශුව මස්තකයෙහි සිටිහෙයින්; අබ්භුග්ගතට්ඨෙන, උස්ව සිටිනා හෙයින්; තෙසු පංසුසු කූලමිවාති, ඒ පාංශුවෙහි ඉවුරු බඳුනුයි; පංසුකූලං, පංසුකූලනම්; ("නදියා කූලං" යනාදියෙහි මෙන් මිහි "කූල" ශබ්දය සමුස්සයාර්ථනුයි "පංසුකූලමිවාති පංසුකූලං"යි කීහු.) අථවා, නොහොත්; පංසුං විය, පාංශුවක්මෙන්; කුච්ඡිතභාවං, කුත්සිතබවට; උලතීති, යේනුයි; පංසුකූලං, පංසුකූලනම්; (මිහි "කු" ශබ්දය කුත්සාවෙහි "උල" ශබ්දය ගත්‍යර්ථයෙහි වැටේනුයි කීහ. "කුච්ඡිතභාවං ගච්ඡතීති වුත්තං හොති"යි.) එවං ලද්ධනිබ්බචනස්ස, මෙසේ ලබනලද නිර්වචන ඇති; (අක්‍ෂරාර්ථ ඇති යන අර්ථයි.) පංසුකූලස්ස ධාරණං, පංසුකූලයාගෙ ධැරීම; පංසුකූලං, (උත්තරපදලොපයෙන්) පංසුකූලනම්වේ; ("අපූපබාදනමපූපං තත් ශීලමස්‍යෙත්‍යපූපිකඃ" යනු යෙහි මෙන් "පංසුකූලධාරණං" යනු යෙහි ධාරණශබ්දය ලොප්කොට පංසුකූලං යනුවේ යන අර්ථයි ) පංසුකූලං සීලමස්සාති, පංසුකූලයධැරීම ප්‍රකෘති වූයේ මොහටනුයි; පංසුකූලිකො, පංසුකූලිකනම් වේ; පංසුකූලිකස්ස, පංසුකූලිකයාගෙ; අඞ්ගං, සමාදානචෙතනා සඞ්ඛ්‍යාතධර්මය; පංසුකූලිකඞ්ගං, පංසුකූලිකඞ්ගනම් වේ; අඞ්ගන්ති කාරණං වුච්චති, අඞ්ගය යි කාරණය කියනුලැබේ; තස්මා, එහෙයින්; යෙන සමාදානෙන, (චෙතනා ලක්‍ෂණ) යම් සමාදානයක් හෙතුකොටගෙන; සො, ඒ පංසුකූලය ධරන භික්‍ෂුතෙමේ; පංසුකූලිකොති වුච්චති, පංසුකූලිකයයි කියනු ලැබේද; තස්ස, ඒ සමාදානචෙතනාලක්‍ෂණයට; එතං අධිවචනං, අඞ්ගය යි යනු මෙ නමෙකි; ("සමාදියති එතෙනා ති සමාදානං චෙතනා. සා අඞ්ගති අත්තනො ඵලම්පති හෙතුභාවං ගච්ඡතීති අඞ්ගං කාරණං

(අ)එතෙනෙව නයෙන සඞ්ඝාටි උත්තරාසඞ්ග අන්තරවාසකසඞ්ඛාතං තිචීවරං සීලමස්සාති තෙචීවරිකො; තෙචීවරිකස්ස අඞ්ගං තෙචීවරිකඞ්ගං. භික්ඛාසඞ්ඛාතානං පන ආමිසපිණ්ඩානං පාතො පිණ්ඩපාතො, පරෙහි දින්නානං පිණ්ඩානං පත්තෙ නිපතනන්ති වුත්තං හොති; තං පිණ්ඩපාතං උඤ්ඡති තං තං කුලං උපසඞ්කමන්තො ගවෙසතීති පිණ්ඩපාතිකො. පිණ්ඩාය වා පතිතුං වතමෙතස්සාති පිණ්ඩපාති-පතිතුන්ති චරිතුං; පිණ්ඩපාතී එව පිණ්ඩපාතිකො; පිණ්ඩපාතිකස්ස; අඞ්ගං පිණ්ඩපාතිකඞ්ගං. දානං වුච්චති අවඛණ්ඩනං; අපෙතං දානතො අපදානං–

---

යෙන පුග්ගලො පංසුකූලිකොති වුච්චතීති"යි කී බැවින් යම් සමාදාන චෙතනාවක් කාරණකොටගෙන භික්ෂුතෙමේ පංසුකූලිකනම්වේද ඒ සමාදානචෙතනාව උහුගෙ පංසුකූලිකත්වයට කාරණබැවින් පංසුකූලික නම් වෙයි දතයුතු.)

(අ) එතෙනෙව නයෙන, මෙම නයින්; ("පංසුකූලිකඞ්ගං"යනු යෙහි **"පංසුකූලධාරණං පංසුකූලං නං සීලො පංසුකූලිකො තස්ස අඞ්ගං සමාදානචෙතනා පංසුකූලිකඞ්ගං"**යනු යම්සේද එසේම **"තිචීවරධාරණං තිචීවරං නං සීලො තෙචීවරිකො තස්ස අඞ්ගං තෙචීවරිකඞ්ගං"**යි ගතයුතුය යන අදහසි. "සඞ්ඝාටි උත්තරාසඞ්ග අන්තරවාසකසඞ්ඛාතං"යනුයෙන් සඟළසිවුරුය පොරෝනාවය හඳනාවය යන තුන්සිවුරෙහිම ත්‍රිචීවරසංඥය කණ්ඩුපටිච්ඡාදි වස්සිකසාටිකාදීන් කෙරෙහි නොවෙයි දක්වත්.) තිචීවරං, තුන්සිවුරුධැරීම; සීලමස්සාති, ප්‍රකෘතිවූයෙ මොහටනුයි; තෙචීවරිකො, තෙචීවරික නම; තෙචීවරිකස්ස අඞ්ගං, තෙචීවරිකයාගේ අඞ්ගය; තෙචීවරිකඞ්ගං, තෙචීවරිකඞ්ගනම්; භික්ඛාසඞ්ඛාතානං, භික්ෂාසඞ්ඛ්‍යාතවූ;ආමිසපිණ්ඩානං පන, ආමිෂපිණ්ඩයන්ගෙ; පාතො, හීම; පිණ්ඩපාතො, පිණ්ඩපතානම්; පරෙහි, පරයාවිසින්; දින්නානං පිණ්ඩානං, දෙනලද පිණ්ඩයන්ගෙ; පත්තෙ, පාත්‍රයෙහි; නිපතනන්ති වුත්තං හොති, හීමය යි සේයි. තං පිණ්ඩපාතං, අනුන් විසින් දෙනලද පිණ්ඩයන්ගෙ පාත්‍රයෙහි පතනය; උඤ්ඡති, හවුලා; තං තං කුලං උපසඞ්කමන්තො, ඒ ඒ කුලයට එළඹෙන්නේ; ගවෙසතීති සොයානුයි; පිණ්ඩපාතිකො, (බාදරික සාමාකිකයන්මෙන්) පිණ්ඩපාතික නම් වේ; පිණ්ඩාය වා පිඩුපිණිස හෝ;පතිතුං, ඇවිදිනට; වතං, ව්‍රතය; එතස්සාති, මොහටනුයි; පිණ්ඩපාති, පිණ්ඩපාති නම් වේ; පතිතුන්ති චරිතුං, පතිතුං යි (සේයි) 'චරිතුං' යන අදහසි; පිණ්ඩපාතී එව, පිණ්ඩපාතීම; පිණ්ඩපාතිකො, ("භද්‍රො එව භද්දකො" යනුමෙන්) පිණ්ඩපාතික නම් වේ; පිණ්ඩපාතිකස්ස අඞ්ගං, පිණ්ඩපාතපර්‍යේෂණයට කාරණය; (පිණ්ඩපාතපර්‍යේෂණ ව්‍රත ඇතිවීමට කාරණය හෝ) පිණ්ඩපාතිකඞ්ගං, පිණ්ඩපාතිකඞ්ග නම් වේ; දානං, දානය; අවඛණ්ඩනං වුච්චති, විච්ඡෙදය (කඩකිරීම) කියනුලැබේ; අපෙතං දානතො,

අනවඛණ්ඩනන්ති අත්ථො; සහ අපදානෙන සපදානං–අවඛණ්ඩනවිරහිතං අනුඝරන්ති වුත්තං හොති; සපදානං චරති ඉදමස්ස සීලඞ්ගා සපදානචාරී; සපදානචාරී එව සපදානචාරිකො; තස්ස අඞ්ගං සපදානචාරිකඞ්ගං.

(අ) එකාසනෙ භොජනං එකාසනං; තං සීලමස්සාති එකාසනිකො; තස්ස අඞ්ගං එකාසනිකඞ්ගං. දුතියකභාජනස්ස [1] පටික්ඛිත්තත්තා කෙවලං එකස්මිං යෙව පත්තෙ පිණ්ඩො පත්තපිණ්ඩො; ඉදානි පත්තපිණ්ඩගහණෙ පත්තපිණ්ඩසඤ්ඤං කත්වා–පත්තපිණ්ඩො සීලමස්සාති පත්තපිණ්ඩිකො; තස්ස අඞ්ගං පත්තපිණ්ඩිකඞ්ගං. ඛලූති පටිසෙධනත්ථෙ නිපාතො; පවාරිතෙන සතා පච්ඡාලද්ධං භත්තං පච්ඡාභත්තං නාම. තස්ස පච්ඡාභත්තස්ස භොජනං පච්ඡාභත්තභොජනං;

---

විච්ඡෙදසඞ්ඛ්‍යාතදානයාකෙරෙන් අපෙතවූයෙ; අපදානං, අපදාන නම් වේ; අනවඛණ්ඩනන්ති අත්ථො, කඩනොකිරීමය යන අර්ථයි; සහ අපදානෙන, කඩනොකිරීම හා සමග පවතීනුයි; සපදානං, සපදානනම් වේ; අවඛණ්ඩනවිරහිතං, විච්ඡෙදයක් නොකොට; අනුඝරන්ති වුත්තං හොති, ගෙපිළිවෙළිනැයි සේයි; සපදානං, ගෙපිළිවෙළින්; චරති, හැසිරේනුයි; ඉදං, මේ සපදානචරණය; අස්ස සීලන්ති, මොහට ප්‍රකෘතිනුයි; සපදානචාරී, සපදානචාරී නම් වේ; සපදානචාරී එව, සපදානචාරීම; සපදානචාරිකො, සපදානචාරික නම් වේ; තස්ස, ඔහුගේ; අඞ්ගං, ගෙපිළිවෙළින් ඇවිදීම ප්‍රකෘතිවන්නට කාරණය; (හෙවත්: සපදානචාරීවීමට කාරණය; සපදානචාරිකඞ්ගං, සපදානචාරිකඞ්ගනම්;

(අ) එකාසනෙ භොජනං, ඊර්යාපථාන්තරයෙන් අනන්තරිතවූ එකම නිෂද්‍යාවෙහි භොජනය; එකාසනං, (උත්තරපදලොපයෙන්) එකාසනනම්; තං, ඒ එකාසනභොජනය; සීලමස්සාති, ප්‍රකෘතිවූයේ මොහටනුයි; එකාසනිකො, එකාසනිකනම්; තස්ස, උහුගෙ; අඞ්ගං, එකහස්නෙහි හිඳ වැළඳීම ප්‍රකෘතිවීමට කාරණය; හෙවත්; එකාසනික වීමට කාරණය; එකාසනිකඞ්ගං, එකාසනිකඞ්ගනම්; දුතියකභාජනස්ස පටික්ඛිත්තත්තා, විතීයභාජනය ප්‍රතික්ෂෙපකළ බැවින්; කෙවලං, හුදෙක්; එකස්මිංයෙවපත්තෙ, එකමපාත්‍රයෙහි; පිණ්ඩො, පිණ්ඩය; පත්තපිණ්ඩො, පත්තපිණ්ඩනම්; ඉදානි, දැන්; පත්තපිණ්ඩගහණෙ, පාත්‍රපිණ්ඩග්‍රහණයෙහි; පත්තපිණ්ඩසඤ්ඤං කත්වා, (උත්තරපද ලොපයෙන්) පත්තපිණ්ඩය යන සංඥකොට; පත්තපිණ්ඩං සීලමස්සාති, එකමපාත්‍රයෙහි පිණ්ඩග්‍රහණය ශීලවූයෙ මොහටනුයි; පත්තපිණ්ඩිකො, පත්තපිණ්ඩිකනම්වේ; තස්ස, උහුගෙ; අඞ්ගං, එකමපාත්‍රයෙහි පිණ්ඩග්‍රහණය ප්‍රකෘතිවීමටකාරණය; පත්තපිණ්ඩිකඞ්ගං, පත්තපිණ්ඩිකඞ්ගනම් වේ; ඛලූති, ඛලූ යනු; පටිසෙධනත්ථෙ

---

1. දුතියභාජනස්ස–මු. ශ්‍යා. මු.

තස්මිං පච්ඡාභත්තභොජනෙ; පච්ඡාභත්තසඤ්ඤං කත්වා-පච්ඡාභත්තං සීලමස්සාති පච්ඡාභත්තිකො; න පච්ඡාභත්තිකො ඛලුපච්ඡාභත්තිකො; සමාදානවසෙන පටික්ඛිත්තාතිරිත්තභොජනස්සෙතං නාමං. අට්ඨකථායං පන වුත්තං ඛලූති එකො සකුණිකො, සො මුඛෙන ඵලං ගහෙත්වා තස්මිං පතිතෙ පුන අඤ්ඤං න ඛාදති තාදිසො අයන්ති ඛලුපච්ඡාභත්තිකො තස්ස අඞ්ගං ඛලුපච්ඡාභත්තිකඞ්ගං. අරඤ්ඤෙ නිවාසො අස්සාති ආරඤ්ඤිකො තස්ස අඞ්ගං ආරඤ්ඤිකඞ්ගං. රුක්ඛමූලෙ නිවාසො රුක්ඛමූලං, තං සීලමස්සාති රුක්ඛමූලිකො. රුක්ඛමූලිකස්ස අඞ්ගං රුක්ඛමූලිකඞ්ගං: අබ්භොකාසිකසොසානිකඞ්ගෙසුපි එසෙව නයො…

---

නිපාතො, ප්‍රතිෂෙධාර්ථයෙහි නිපාතයෙකි; පවාරිතෙන සතා, පැවැරී අවන්නාහුවිසින්; පච්ඡාලද්ධං භත්තං, පසුවලද බත; පච්ඡාභත්තං නාම, පශ්චාද්භක්තනම්; තස්ස පච්ඡාභත්තස්ස භොජනං, ඒ පශ්චාද් භක්තයාගේ භොජනය; පච්ඡාභත්තභොජනං, පච්ඡාභත්තභොජන නම්; තස්මිං පච්ඡාභත්තභොජනෙ, ඒ පශ්චාද් භුක්තභොජනයෙහි; පච්ඡාභත්තසඤ්ඤං කත්වා, (උත්තරපදලොපයෙන්) පච්ඡාභත්තය යන නම් කොට; පච්ඡාභත්තං, පශ්චාද්භක්තභොජනය; සීලමස්සාති, ප්‍රකෘති වූයෙ මොහටනුයි; පච්ඡාභත්තිකො, පච්ඡාභත්තික්නම් වෙයි; නපච්ඡාභත්තිකො, පච්ඡාභත්තභොජනය නොකරන සුලුවූයෙ; ඛලු පච්ඡාභත්තිකො, ඛලු පච්ඡාභත්තිකනම්; (ඛලු ශබ්දය ප්‍රතිෂෙධවාචී බැවින් උහු හා සමානාර්ථවූ නකාරයණෙන න පච්ඡාභත්තිකො" යුහු.) සමාදානවසෙන පටික්ඛිත්ත, සමාදානවශයෙන් ප්‍රතික්ෂිප්තවූ; අතිරිත්තභොජනස්ස, (ශික්ෂාපදවිෂය ශික්ෂාපදයෙන් ප්‍රතික්ෂෙපකළබැවින්) අතිරික්තකර්මකළ භොජනයට; එතං නාමං, පච්ඡාභත්තය යන මේ නමෙකි; අට්ඨකථායං පන, අටුවාවෙහි වනාහි; වුත්තං, කියනලදී; ඛලූති, ඛලුනම්; එකො සකුණිකො, එක්සකුණිකයෙක; සො, හෙතෙම; මුඛෙන ඵලං ගහෙත්වා, මුඛයෙන් ඵලයක්ගෙන; තස්මිං පතිතෙ, ඒ ඵලයහුණුකල්හි; පුන අඤ්ඤං න ඛාදති නැවත අනිකක් නොකන්නේය; අයං, මෙතෙම; තාදිසොති, එබඳුය යි; ඛලුපච්ඡාභත්තිකො, ඛලුපච්ඡාභත්තිකනම්…පෙ…අරඤ්ඤෙ නිවාසො අස්සාති, අරණ්‍යනිවාසය මොහටනුයි; ආරඤ්ඤිකො, ආරණ්‍යක නම්;-රුක්ඛමූලෙ නිවාසො රුක්ඛමූලං, රුක්මුලවිසීම රුක්ඛමූලනම්; තං, ඒ වෘක්ෂමූල නිවාසය; සීලමස්සාති, ප්‍රකෘතිවූයේ මොහටනුයි; රුක්ඛමූලිකො, රුක්ඛමූලික නම් වෙයි;-අබ්භොකාසිකසොසානිකඞ්ගෙසුපි, අබ්භොකාසික සොසානික දෙඅඟෙහි දු; එසෙවනයො, මෙම නයයි;("අබ්භොකාසෙ නිවාසො අබ්භොකාසං සුසානෙ නිවාසො සුසානං තං සීලමස්ස" යනාදී සියල්ල "එසෙවනයො" යනුවෙන් අතිදෙශකළෝ…

**(අ) යදෙව සන්ථතං යථාසන්ථතං ඉදං තුය්හං පාපුණාතීති එවං පඨමං උද්දිට්ඨසෙනාසනසෙතං අධිවචනං. තස්මිං යථාසන්ථතෙ විහරිතුං සීලමස්සාති යථාසන්ථතිකො තස්ස අඞ්ගං යථා සන්ථතිකඞ්ගං. සයනං පටික්ඛිපිත්වා නිසජ්ජාය විහරිතුං සීලමස්සාති නෙසජ්ජිකො, තස්ස අඞ්ගං නෙසජ්ජිකඞ්ගං. සබ්බානෙව පනෙතානි තෙන තෙන සමාදානෙන ධුතකිලෙසත්තා ධුතස්ස භික්ඛුනො අඞ්ගානීති කිලෙසධුනනතො වා ධුතන්ති ලද්ධවොහාරං ඤාණං අඞ්ගං එතෙසන්ති ධුතඞ්ගානි. අථවා ධුතානි ච තානි පටිපක්ඛනිද්ධුනනතො අඞ්ගානි ච පටිපත්තියාතිපි ධුතඞ්ගානි, එවන්තාවෙත්ථ අත්ථතො විඤ්ඤාතබ්බො විනිච්ඡයො.**

---

(අ) යදෙව සන්ථතං, යමෙක්ම පනවනලදද; යථාසන්ථතං, යේම යථා සන්ථතනම්; ඉදං තුය්හං පාපුණාතීති, මෙ තට පැමිණෙන්නේයයි;එවං, මෙසේ පැමිණී; පඨමං උද්දිට්ඨසෙනාසනස්ස, පළමුකොට උදෙස්නලද සෙනාසනයට; එතං අධිවචනං, මේ නමෙකි; තස්මිං යථාසන්ථතෙ, ඒ යථාසන්ථතයෙහි; විහරිතුං, විසීම; සීලං, ප්‍රකෘතිවූයෙ; අස්සාති, මොහට නුයි; යථාසන්ථතිකො, යථාසන්ථතිකනම්;-සයනං පටික්ඛිත්වා, බැස හෙවීම ප්‍රතික්‍ෂෙපකොට; නිසජ්ජාය, නිෂද්‍යාවෙන්; විහරිතුං, විසීම; සීලමස්සාති, ප්‍රකෘතිවූයේ මොහටනුයි; නෙසජ්ජිකො, නෙසජ්ජිකනම්; තස්ස, උහුගෙ; අඞ්ගං, අඞ්ගය; නෙසජ්ජිකඞ්ගං, නෛෂද්‍යකාඞ්ග නම්; සබ්බානෙව පනෙතානි, මෙ සියලු ධුතාඞ්ගයෝම; තෙන තෙන සමාදානෙන, ඒ ඒ පාංශුකූලාදී අඞ්ගයන්ගේ සමාදානයෙන්; ධුත කිලෙසත්තා, නසනලද කෙලශයන් ඇතිහෙයින්; (තදඞ්ගවශයෙන් ප්‍රහීණ තෘෂ්ණොත්පාදාදී පාපධර්මයන් ඇතිහෙයින යන අර්ථයි.) ධුතස්ස භික්ඛුනො, වැනූ කෙලෙසුන් ඇති භික්‍ෂුහුගේ; අඞ්ගානීති, අඞ්ගයෝනුයි; ("ධුතඞ්ගානී"යි යොදනු යම් සමාදානයෙකින් ඒ කෙලශධුනනය වේද ඒ සමාදානයෝම ඒ ධුත භික්‍ෂුහුගේ අඞ්ගයහයි අභිමතයහ යම් අන්කිසිකෙනෙක් නොවෙත්-මෙම කීහ "යෙහි තං කිලෙසධුනනං තානියෙව ඉධ ධුතස්ස භික්ඛුනො අඞ්ගානී ති අධිප්පෙතානි න අඤ්ඤානි යානි කානිචි"යි) කිලෙසධුනනතො වා, කෙලෙසුන් නසනහෙයින් හෝ; ධුතන්ති ලද්ධවොහාරං ඤාණං, ධුතයයි ලද ව්‍යවහාරඇති නුවණ; අඞ්ගං එතෙසන්ති, අඞ්ගවූයේ මේ සමාදානයටනුයි; ධුතඞ්ගානි, ඒ සමාදානයෝ ධුතාඞ්ගනම්වෙත්. (මෙයින් ඒ පාංශුකූලිකාදීන්ගේ සමාදානය ඥානපූර්වකබව කීවෙත්- මෙම කීහ-"ඤාණං අඞ්ගං එතෙසන්ති ඉමිනා ඤාණපුබ්බකතං තෙසං සමාදානස්ස විභාවෙති") අථවා, නොහොත්; ධුතානි ච තානි, ධුත වූවාහු ඔහුමය; පටිපක්ඛනිද්ධුනනතො, ප්‍රතිපක්‍ෂයන් නසන හෙයින්; පටිපත්තියා, ශීලාදිසම්‍යක් ප්‍රතිපත්තියට; අඞ්ගානි ච තානි;අඞ්ගවූවාහු ඔහුමනුයි; ධුතඞ්ගානි, ධුතඞ්ගනම්වෙත්; එවං, මෙසේ; තාව, පළමු කොට; එත්ථ, මෙ ධුතාඞ්ගයෙහි; අත්ථතො, අර්ථ හෙයින්; විඤ්ඤාතබ්බො විනිච්ඡයො, විනිශ්චය දතයුතු.

(අ) සබ්බානෙව චෙතානි සමාදාන චෙතනා ලක්ඛණානි. වුත්තම්පි චෙතං:- අට්ඨකථායං "යො සමාදියති සො පුග්ගලො, යෙන සමාදියති චිත්තචෙතසිකා එතෙ ධම්මා යා සමාදානචෙතනා තං ධුතඞ්ගං යං පටික්ඛිපති තං වත්ථූනති." සබ්බානෙව ච ලොලුප්පවිද්ධංසනරසානි, නිල්ලොලුප්පභාව පච්චුපට්ඨානානි, අප්පිච්ඡතාදි අරියධම්මපදට්ඨානානි. එවමෙත්ථ ලක්ඛණාදීහි වෙදිතබ්බො විනිච්ඡයො. සමාදාන විධානතොති ආදීසු පන පඤ්චසු:-සබ්බානෙව ධුතඞ්ගානි ධරමානෙ භගවති භගවතොව සන්තිකෙ සමාදාතබ්බානි; පරිනිබ්බුතෙ මහාසාවකස්ස සන්තිකෙ; තස්මිං අසති ඛීණාසවස්ස-අනාගාමිස්ස-සකදාගාමිස්ස-සොතාපන්නස්ස- තිපිටකස්ස- ද්විපිටකස්ස- එකපිටකස්ස-එක

---

(අ) සබ්බානෙව චෙතානි, මෙ සියලු ධුතාඞ්ගයෝම; සමාදානචෙතනා ලක්ඛණානි, සමාදානචෙතනාව ස්වභාවකොට ඇත්තාහුයි; (පරිහරණ චෙතනාවද ධුතාඞ්ගමයයි දතයුතු-**"සමාදියති එතෙනා ති සමාදානං සමාදානවසෙන පවත්තා චෙතනා තං ලක්ඛණං එතෙසන්ති සමාදාන චෙතනාලක්ඛණානි"**) වුත්තම්පි චෙතං අට්ඨකථායං, අට්ඨකථායෙහි මෙ කියන ලදුයේමැයි; යො සමාදියති, යමෙක් සමාදන්වේද; සො පුග්ගලො, හේ පුද්ගලයි; යෙන සමාදියති, යමක් කාරණකොටගෙන සමාදන්වේද; චිත්තචෙතසිකා එතෙ ධම්මා, උහුම චිත්ත චෛතසික ධර්මයෝයි. (මිහි සමාදානක්‍රියාවට සාධකතම බැවින් සමාදානචෙතනා සම්ප්‍රයුක්තධර්මයෝ "යෙන" යි. කාරණභාවයෙන් දක්වනලදහු එසේ කල්හි "යා සමාදානචේතනා තං ධුතඞ්ගං"යි-සමාදාන චෙතනාග්‍රහණය කුමක් පිණිසයයත්? චෙතනාමූලකහෙයිනැයි දතයුතු.) යා සමාදාන චෙතනා, යම් සමාදානචෙතනාවක් ඇද්ද; තං ධුතඞ්ගං, හේ ධුතඞ්ග නම්; යං පටික්ඛිපති, ගෘහපතිදානචීවරාදී යමක් ප්‍රතික්ෂෙප කෙරේද; තං වත්ථූනති, ඒ වස්තුයයි; සබ්බානෙව, සියලු ධුතාඞ්ගයෝම; ලොලුප්පවිද්ධංසනරසානි, තෘෂ්ණාචාරසඞ්ඛ්‍යාත ලොලුප්පවිධ්වංශනය කෘත්‍යකොට ඇත්තාහුයි; ("කුසලභණ්ඩස්ස භුසවිලුම්පනට්ඨෙන ලොලුප්පං තණ්හාචාරො තස්ස විද්ධංසනකිච්චත්තා ලොලුප්පවිද්ධංසනරසානි"යනු ටීකායි.) නිල්ලොලුප්පභාවපච්චුපට්ඨානානි, තෘෂ්ණාචාරසඞ්ඛ්‍යාත ලොලුප්පභාවයක් නැතිබව වැටහීම්කොට ඇත්තාහුය; අප්පිච්ඡතාදි, අල්පේච්ඡභාවාදිවූ; අරියධම්මපදට්ඨානානි, පරිශුද්ධශීලාදි ධර්මයන් ආසන්න කාරණකොට ඇත්තාහුයි; එවං, මෙසේ; එත්ථ, මෙහි; ලක්ඛණාදීහි, ලක්ෂණාදිවශයෙන්; විනිච්ඡයො වෙදිතබ්බො, විනිශ්චය දතයුතු. ("සමාදානවිධානතො ති ආදීසු පන පඤ්චසු එවං විනිච්ඡයො වෙදිතබ්බො"යි කීවෙත්;) සබ්බානෙව [පනෙතානි] ධුතඞ්ගානි, මෙ සියලු ධුතාඞ්ගයෝම; ධරමානෙ භගවති, භගවත්හු ධරමානකල්හි; භගවතො යෙව සන්තිකෙ, භගවත්හු සමීපයෙහිම; සමාදාතබ්බානි, සමාදන්වියයුත්තාහුය; පරිනිබ්බුතෙ, (භගවත්හු) පිරිනිවිකල්හි; මහාසාවකස්ස සන්තිකෙ, මහසවුවක්හු සමීපයෙහි; ("සමාදාතබ්බානි"

සඞ්ගීතිකස්ස-අට්ඨකථාචරියස්ස-තස්මිං අසති ධුතඞ්ගධරස්ස-තස්මිම්පි අසති චෙතියඞ්ගණං සම්මජ්ජිත්වා උක්කුටිකං නිසීදිත්වා සම්මාසම්බුද්ධස්ස සන්තිකෙ වදන්තෙන විය සමාදාතබ්බානි. අපි ච සයම්පි සමාදාතුං වට්ටති එව. එත්ථ ච චෙතියපබ්බතෙ ද්වෙභාතිකථෙරානං ජෙට්ඨභාතු ධුතඞ්ගප්පිච්ඡතාය වත්ථු කථෙතබ්බං. අයං තාව සාධාරණකථා෴

(ඇ) ඉදානි එකෙකස්ස සමාදාන විධානප්පභෙදභෙදානිසංසෙ වණ්ණයිස්සාම:-පංසුකූලිකඞ්ගං තාව:-"**ගහපතිදානචීවරං පටික්ඛිපාමි පංසුකූලිකඞ්ගං සමාදියාමී**"ති ඉමෙසු ද්වීසු වචනෙසු අඤ්ඤතරෙන සමා

---

යොදනු-මතුයෙහිදු මෙම නියේ.) තස්මිං අසති, ඒ මහසවුවක්හු නැතිකල්හි; ඛීණාසවස්ස, රහත්මහණක්හු; ("සන්තිකෙ"යි යොදනු-සෙසුපෙදෙහි දු මෙම නියාය; "තස්මිං අසති" යනු "අනාගාමිස්ස" යනාදි පෙදෙහි දු යොදනු.) "අනාගාමිස්ස, අනැගැමියක්හු; සකදාගාමිස්ස, සෙදෑගැමියක්හු; සොතාපන්නස්ස, සෝවානක්හු; තෙපිටකස්ස, තුන්පිටකය දන්නක්හු; ද්විපිටකස්ස, දෙපිටකයක් දන්නක්හු; එකපිටකස්ස, එක්පිටකයක් දන්නක්හු; එකසඞ්ගීතිකස්ස, එක් සඟියක් දන්නක්හු; අට්ඨකථාචරියස්ස, අටුවාඇදුරක්හු; (වෙසෙසින් අටුවාතන්තියම පුහුණුවක්හුමය යන අර්ථයි;) තස්මිං අසති, අටුවා ඇදුරක්හු නැතිකල්හි; ධුතඞ්ගධරස්ස, ධුතාඞ්ගධරයක්හු; තස්මිම්පි අසති, ඔහු දු නැතිකල්හි; චෙතියඞ්ගණං සම්මජ්ජිත්වා, දාගැබ්අඟන හැමද; උක්කුටිකං නිසීදිත්වා, උක්කුටිකයෙන්හිඳ; (එළිල්ලෙන් හිඳ යන අර්ථයි;) සම්මා සම්බුද්ධස්ස සන්තිකෙ, බුදුන් සමීපයෙහි; වදන්තෙන විය, කියනු වක්හුමෙන්; සමාදාතබ්බානි, සමාදන්වියයුත්තාහුයි; අපි ච, අනිකෙකු දු; සයම්පි, තමා ද; සමාදාතුං, සමාදන්වන්නට; වට්ටති එව, වටීමැයි; එත්ථ ච, මෙ තමා සමාදන්වීමෙහි;-ද්වෙභාතිකථෙරානං, දෙබෑතෙරුන්කෙරෙන්; ජෙට්ඨභාතු, වැඩිමහල්තෙරුන්ගේ; ධුතඞ්ගප්පිච්ඡතාය, ධුතාඞ්ගයෙහි අපිස්බැව්හි; වත්ථුං කථෙතබ්බං, වත්කිය යුතු; (ඒ මහතෙරුණ්ගෙ නෙසජ්ජික බව කිසිවෙක් නොදන්නාහ එක් දවසක් යහන්හි මැදිම්යම පලගබැඳහුන්නවුන් විදුලියඑළුවෙන් දැක මල්තෙරහු වහන්ස නෙසජ්ජිකසේක්දැයි පුළුවුත්හු තෙරහු තමන් දුහඟ අපිස්බැවින් එවිටමැ වැදහෙව පසුවතුමූ සමාදන්වූහ.) අයං තාව, මෙ වනාහි; සාධාරණකථා, සියලු ධුතාඞ්ගයන්ට සාධාරණ කථායි෴

(ඇ) ඉදානි, දැන්; එකෙකස්ස, එකී එකී දුහඟහුගෙ; සමාදාන, සමාදන්වීමය; විධාන, විධානය; (විධානහු දුහඟෙහි පිළිපදිනාවිධියි;)පභෙද, හීතාදි ප්‍රභෙදය; භෙද, දුහඟබිඳීමය; ආනිසංසෙ, අනුසස්ය යන මොවුන්; වණ්ණයිස්සාම, වර්ණනාකරමූ; ("පංසුකූලිකඞ්ගං තාව සමාදින්නං හොති" යනු සම්බන්ධයි.) ගහපතිදානචීවරං, ගෘහපතීන් දෙන සිවුරු; පටික්ඛිපාමි, ප්‍රතික්ෂෙපකෙරෙමි; පංසුකූලිකඞ්ගං, පංසුකූලික

දින්නං හොති ඉදන්තාවෙතං සමාදින්නං. එවං සමාදින්නධුතඞ්ගෙන පන තෙන සොසානිකං පාපණිකං රථියචොළං සඞ්කාරචොළං සොත්ථියං න්හානචොළං තිත්ථචොළං ගතපච්චාගතං අග්ගිදඩ්ඪං ගොඛායිතං උපචිකාඛායිතං උන්දූරඛායිතං අන්තච්ඡින්නං දසච්ඡින්නං ධජාහටං ථූපචීවරං සමණචීවරං ආභිසෙකිකං ඉද්ධිමයං පන්ථිකං වාතාහතං දෙවදත්තියං සාමුද්දියන්ති. එතෙසු අඤ්ඤතරං චීවරං ගහෙත්වා ඵාලෙත්වා දුබ්බලට්ඨානං පහාය ථිරට්ඨානානි ධොවිත්වා චීවරං කත්වා පොරාණං ගහපති චීවරං අපනෙත්වා පරිභුඤ්ජිතබ්බං.

---

සිවුරු අඟ; සමාදියාමීති, සමාදන්වෙමි යන; ඉමේසු ව්සු වචනෙසු, මේ දෙවචනයන් කෙරෙහි; අඤ්ඤතරෙන, එක්තරා වචනයකින්; සමාදින්නං හොති, සමාදන්වනලද්දේ වේ; ("ගහපතිදානචීවරං" යනුයෙහි දායකබැවින් මහණහු දු උකටහට ගෘහපතිපක්‍ෂයෙහිම ඇතුළත් වෙත් ප්‍රව්‍රජිතයෝ ගණිත්වයි තබනලද සිවුර ගහපතිසිවුරනම් වෙයි ගෘහපතියන් දුන් සිවුරනම් නොවෙයි තුසි එබඳුසිවුර වලකාන්නට දාන ශබ්දය ප්‍රයොගකළහයි දතයුතු.) එතං, මෙහි; ඉදං, මේ; සමාදානං, සමාදන්වීමයි; එවං, මෙසේ; සමාදින්නධුතඞ්ගෙන පන, සමාදන්වනලද ධුතාඞ්ගඇති ඔහුවිසින්; ("පරිභුඤ්ජිතබ්බං" යනු හා සබඳ) සොසානිකං, සොහොන්හි දැමූපියැලි;[1] පාපණිකං, අවුණුදොර දැමූ පියැලි; රථියචොළං, අන්තරවීථියෙහි දැමූ පියැලි; සඞ්කාරචොළං, කසළගොඩ දැමූ පියැලි; සොත්ථියං, දරුලදසඳ ගැබ්මල පිසදැමූ පියැලි; න්හානචොළං, යකැදුරන් යකුන්හුනුවන් නහවාපියා හළ පියැලි; තිත්ථචොළං, නහනතොටදැමූ පියැලි; ගතපච්චාගතං, සොහොන්හිය මිනිසුන් නැවත අවුත් නැහැසඳ පියැලි; අග්ගිදඩ්ඪං, ගින්නෙහි ප්‍රදෙශයක්දැ පියැලි; ගොඛායිතං, ගෙරිමුවන්කෑ පියැලි; උපචිකාඛායිතං, වේයන්කෑ පියැලි; උන්දූරඛායිතං; මීයන්කෑ පියැලි; අන්තච්ඡින්නං, අන්තයෙන් සුන් පියැලි; දසච්ඡින්නං, දහයෙන් සුන් පියැලි; ධජාහටං, නැවු නැගෙන වෙළඳුන් බැඳි පිලිධවජය; (යුද්ධභූමියෙහි බැඳි ධවජ හෝ;) ථූපචීවරං, බිලියම්පිණිය තුඹස සිසාළපියැලි; සමණචීවරං, පැවිද්දන්දුන් සිවුරු; ආභිසෙකිකං, රජුන් අභිසෙකමඬුයෙහි පියන පියැලි; ඉද්ධිමයං, එහිභික්ඛුපැවිදියේ උපන්සිවුරු; පන්ථිකං, මඟහුණුපියැලි; වාතාහතං, වාතයෙන් ගෙනගොස් දුරහෙළුයේ; දෙවදත්තියං, දෙවියන් විසින් දෙන සිවුරු; සාමුද්දියන්ති, මුහුදුරළින් දමා ගොඩපියු පියැලි යන; එතෙසු, මොවුන්කෙරෙහි; අඤ්ඤතරං චීවරං ගහෙත්වා, එක්තරා සිවුරක් ගෙන; ඵාලෙත්වා, පළා; දුබ්බලට්ඨානං පහාය, දුර්වලතැන හැර; ථිරට්ඨානානි, තරතැන්; ධොවිත්වා, දෙව; චීවරං කත්වා, සිවුරුකොට; පොරාණං ගහපතිචීවරං, පරණ ගෘහපතිචීවරය; අපනෙත්වා, හැර; පරිභුඤ්ජිතබ්බං, වැළඳගතයුතු.

---

1. පිළිය-ඇතැම්.

(අ) තත්ථ **සොසානිකා**න්ති සුසානෙ පතිතකං. **පාපණිකා**න්ති ආපණද්වාරෙ පතිතකං. **රථියචොළ**න්ති පුඤ්ඤත්ථිකෙහි වාතපානද්වාරෙන රථිකාය ඡඩ්ඩිතචොළකං. **සඞ්කාරචොළ**න්ති සඞ්කාරට්ඨානෙ ඡඩ්ඩිතචොළකං. **සොත්ථිය**න්ති ගබ්භමලං පුඤ්ඡිත්වා ඡඩ්ඩිතවත්ථං. තිස්සාමච්චමාතා කිර සතඅග්ඝනකෙන වත්ථෙන ගබ්භමලං පුඤ්ඡාපෙත්වා පංසුකූලිකා ගණ්හිස්සන්තීති තාළවෙළිමග්ගෙ ඡඩ්ඩාපෙසි, භික්ඛූ ජිණ්ණ කට්ඨානත්ථමෙව ගණ්හන්ති. **න්හානචොළ**න්ති යං භූතවෙජ්ජෙහි සසීසං න්හාපිතා කාලකණ්ණි චොළන්ති ඡඩ්ඩෙත්වා ගච්ඡන්ති. **තිත්ථචොළ**න්ති සිනානතිත්ථෙ ඡඩ්ඩිතපිලොතිකං. **ගතපච්චාගත**න්ති යං මනුස්සා සුසානං ගන්ත්වා පච්චාගතා න්හාත්වා ඡඩ්ඩෙන්ති. **අග්ගිදඩ්ඪ**න්ති අග්ගිනා දඩ්ඪපදෙසං තං හි මනුස්සා ඡඩ්ඩෙන්ති. **ගොඛායිතාදීනි** පාකටානෙව තාදිසානි පිහි මනුස්සා ඡඩ්ඩෙන්ති. **ධජාහට**න්ති නාවං ආරූහන්තා ධජං බන්ධිත්වා ආරූහන්ති තං තෙසං දස්සනාතික්කමෙ ගහෙතුං වට්ටති යම්පි යුද්ධභූමියං ධජං බන්ධිත්වා ඨපිතං තං ද්වින්නම්පි

---

(අ) තත්ථ, එහි; සොසානිකන්ති, සොසානික නම්; සුසානෙ, සොහොන්හි; පතිතකං, කිසිවක්හු විසින් පියූසේසි; පාපණිකන්ති, පාපණික නම්; ආපණද්වාරෙ, අවුණුදෙර; පතිතකං, කිසිවක්හු විසින් පියූසේසි;-පුඤ්ඤත්ථිකෙහි, පින් කැමැත්තවුන් විසින්; වාතපානද්වාරෙන, කවුළුදෙරින්; රථිකාය, අතුරුවේහි;(වීථියයි සේයි;) ඡඩ්ඩිතචොළකං, දමනලද කඩයි;-සඞ්කාරට්ඨානෙ, කසළගොඩ; ගබ්භමලං, ගබ්මලය; පුඤ්ඡිත්වා, පිස;-තිස්සාමච්චමාතා, තිස්සනම් ඇමැත්තා මවු; සතඅග්ඝනකෙන වත්ථෙන. සියක් අගනා වස්ත්‍රයෙන්; ගබ්භමලං පුඤ්ඡාපෙත්වා, ගබ්නමලයපිස්වා; පංසුකූලිකා ගණ්හිස්සන්තීති, පංසුකූලිකයෝ ගනිත්වයි; තාළවෙළිමග්ගෙ, (මහගම) තාළවෙළි නම් වීථියෙහි;(අනුරාධපුරෙහි වේය යෙත්ම;) ඡඩ්ඩාපෙසි, දම්වාපූ; භික්ඛූ, භික්‍ෂූහු; ජිණ්ණකට්ඨානත්ථමෙව, (තමන් අපිස් බැවින්) ජීර්ණස්ථාන පිණිසම; ගණ්හන්ති, ගනිත්; භූතවෙජ්ජෙහි; යකැදුරන් විසින්; සසීසං න්හාපිතා, ඉසින් නහවනලද්දාහු; කාලකණ්ණි චොළන්ති,කාලකණ්ණි චොළයයි;(තිසිරීකඩය යුතැනී;)යං, යමක්; ඡඩ්ඩෙත්වා, හැර; ගච්ඡන්ති, යෙද්ද; ("තං න්හානචොළං නාම"යි යොදනු.) සිනානතිත්ථෙ, නහන තොට; ඡඩ්ඩිතපිලොතිකං, හළ කඩරෙද්ද; මනුස්සා, මිනිස්සු; සුසානං ගන්ත්වා, සොහොනට ගොස්;පච්චාගතා,නැවත ආවාහු;න්හාත්වා,නහා පියා; යං ඡඩ්ඩෙන්ති, යමක් දමාපියද්ද;("තං, ගතපච්චාගතං නාම"යි යොදනු.) අග්ගිනා, ගින්නෙන්;දඩ්ඪපදෙසං, දනලද ප්‍රදෙශයක් ඇත්තේයි; තං, හේ; මනුස්සා, මිනිස්සු; ඡඩ්ඩෙන්ති, පියත්; ගොඛායිතාදීනි, ගොඛායිත යනාදීහු; පාකටානෙව, ප්‍රකටයෝමැයි; තාදිසානිහි, එබඳුවූ චීවරයන්; මනුස්සා, මිනිස්හු; ඡඩ්ඩෙන්ති,පියත්; නාවං, නැවට; ආරූහන්තා, නැගෙන්නාහු;. ධජං බන්ධිත්වා, ධ්වජයබැඳ; ආරූහන්ති, නැගෙත්; තං, හේ; තෙසං, ඒ වෙළඳුන්ගේ; දස්සනාතික්කමෙ, දශී

සෙනාසනං ගතකාලෙ ගහෙතුං වට්ටති. **ථූපචීවර**න්ති වම්මිකං පරික්ඛිපිත්වා බලිකම්මකතං. **සමණචීවර**න්ති භික්ඛුසන්තකං. **ආභිසෙකික**න්ති රඤ්ඤො අභිසෙකට්ඨානෙ ඡඩ්ඩිතචීවරං. **ඉද්ධිමය**න්ති එහිභික්ඛුචීවරං. **පන්ථික**න්ති අන්තරාමග්ගෙ පතිතකං යං පන සාමිකානං සතිසම්මොසෙන පතිතං ථොකං රක්ඛිත්වා ගහෙතබ්බං. **වාතාහට**න්ති වාතෙන හරිත්වා දූරෙ පාතිතං. තං පන සාමිකෙ අපස්සන්තෙන ගහෙතුං වට්ටති. **දෙවදත්තිය**න්ති යං අනුරුද්ධත්ථෙරස්ස විය දෙවතාහි දින්නකං. **සාමුද්දිය**න්ති සමුද්දවීචීහි ථලෙ උස්සාදිතං.

(අ) යං පන සඞ්ඝස්ස දෙමාති දින්නං චොළකභික්ඛාය වා චරමානෙහි ලද්ධං න තං පංසුකූලං, භික්ඛුදත්තියම්පි යං වස්සග්ගෙන ගාහාපෙත්වා වා දීයති සෙනාසනචීවරං වා හොති න තං පංසුකූලං, නො ගාහෙත්වා දින්නංමෙව පංසුකූලං, තත්‍රාපි යං දායකෙහි භික්ඛුස්ස පාදමූලෙ

---

ණය ඉක්මුණු කල්හි; ගහෙතුං වට්ටති, ගන්නට වටී; යුද්ධභූමියං, රණබිම්හි; යං යමක්; ධජං බන්ධිත්වා ඨපිතං, ධවජය බැඳ තබනලදද; තං, හේ; විනහම්පි සෙනාසනං, දෙසෙනාවම; ගතකාලෙ, ගියකල්හි; වට්ටති, ගන්නටවටී; වම්මිකං, තුඹස; පරික්ඛිපිත්වා, සිසාරා; බලිකම්මකතං, බිලියම් කරණලද්දේද; භික්ඛුසන්තකං, මහණුන් සතුසේයි; රඤ්ඤො, රජහුගෙ; අභිසෙකට්ඨානෙ, අභිෂිකතසථානයෙහි; ඡඩ්ඩිතචීවරං, පියනලද චීවරය; එහිභික්ඛුචීවරං, එහිභික්ෂු ප්‍රව්‍රජ්‍යාවෙන් ආසිවුරුයි; අන්තරාමග්ගෙ, අතුරුමඟ; පතිතකං, පියනලද්දේය; (ඒ බොහෝ දවස් ඉක්මුණ ගතයුතුවේ සමහරු දෙතුන්දවසක් ඉක්මුණ ගතයුතුය යෙත්.) යං පන, යමක්වනාහි; සාමිකානං, සවාමීන්ගේ; සතිසම්මොසෙන, සිහිනැතිවීමෙන්; පතිතං, හුනුයේ ද; ථොකං, මද කලක්; රක්ඛිත්වා, රැකහිඳ; ගහෙතබ්බං, ගතයුතුයි; වාතෙන හරිත්වා, වාතවෙගයෙන් ගෙනගොස්; දූරෙ පාතිතං, දුරහෙළනලද්දේ යි; තං පන, හේ වනාහි; සාමිකෙ අපස්සන්තෙන, (සිහිමුළාව හුනුවා වැතිනුයි) සවාමීහු නොපෙණෙනකල්හි; ගහෙතුං වට්ටති, ගතයුතු වේ; අනුරුද්ධත්ථෙරස්ස විය, අනුරුත්තෙරනට (දෙවුදුවඳුන් වසත්‍රය) මෙන්; දෙවතාහි දින්නකං, දෙවියන් විසින් දෙනලදදූයි; සමුද්දවීචීහි, මුහුදුරළින්; ථලෙ, ගොඩ; උස්සාදිතං, නගනලද්දේ යි.

(අ) යම්පන, යමක් වනාහි; සඞ්ඝස්ස දෙමාති දින්නං, සඟහට දෙමහයි දෙනලදද; චොළකභික්ඛාය, කඩසිඟීම් පිණිස; චරමානෙහි වා, ඇවිදින වුන් විසින් හෝ; ලද්ධං, ලද්දේ ද; න තං පංසුකූලං, හේ පංසුකූල නම් නොවේ; භික්ඛුදත්තියම්පි, භික්ෂුදත්තිය චීවරය ද; යං, යමක්; වස්සග්ගෙන ගාහාපෙත්වා වා දීයති, සඟනට හෝ ගණයට හෝ දෙන්නවුන් විසින් වසගින් පමුණුවා දෙනු ලැබේ ද; සෙනාසනචීවරං වා හොති, සෙනසුන් කැරවූවන් විසින් සෙනස්නෙහි වසනුවන්ම වළඳගතමැනවයි දෙනලද සෙනසුන් සිවුරෙක් හෝ වේද; න තං

නික්ඛිත්තං තෙන පන භික්ඛුනා පංසුකූලිකස්ස හත්ථෙ ඨපෙත්වා දින්නං තං එකතො සුද්ධිකං නාම, යං භික්ඛුනො හත්ථෙ ඨපෙත්වා දින්නං තෙන පන පාදමූලෙ ඨපිතං තම්පි එකතො සුද්ධිකං, යං භික්ඛුනොපි පාදමූලෙ ඨපිතං තෙනාපි තථෙව දින්නං තං උභතො සුද්ධිකං, යං හත්ථෙ ඨපෙත්වාවලද්ධං හත්ථෙ යෙව ඨපිතං තං අනුක්කට්ඨචීවරං නාම.

(අ) ඉති ඉමං පංසුකූලභෙදං ඤත්වා පංසුකූලිකෙන චීවරං පරිභුඤ්ජිතබ්බන්ති ඉදමෙත්ථ විධානං. අයං පන පභෙදො:-තයො පංසුකූලිකා, උක්කට්ඨො මජ්ඣිමො මුදුකොති. තත්ථ සොසානිකං යෙව ගණ්හන්තො උක්කට්ඨො හොති, පබ්බජිතා ගණ්හිස්සන්තීති ඨපිතකං ගණ්හන්තො මජ්ඣිමො, පාදමූලෙ ඨපෙත්වා දින්නකං ගණ්හන්තො මුදූති, තෙසු යස්ස කස්සචි අත්තනො රුචියා ගිහීහි දින්නකං සාදිතක්ඛණෙ ධුතඞ්ගං භිජ්ජති. අයමෙත්ථ භෙදො.

---

පංසුකූලං, හේ පංසුකූල නම් නොවේ; නො ගාහෙත්වා දින්නමෙව, සඟින් නොපමුණුවා දෙනලද්දේම; පංසුකූලං, පංසුකූල නම් වේ; තත්‍රාපි, නොපමුණුවා දෙනලද භික්ඛුදත්තියෙහි ද; යං, යම්සිවුරක්; දායකෙහි, දායකයන් විසින්; භික්ඛුස්ස, භික්ෂුහුගෙ; පාදමූලෙ නික්ඛිත්තං, පාදමූලයෙහි තබනලද ද; තෙන පන භික්ඛුනා, ඒ මහණහු විසින් වනාහි; පංසුකූලිකස්ස, පංසුකූලිකයහට; හත්ථෙ ඨපෙත්වා දින්නකං, අත්හි තබාදෙනලද ද; තං, හේ චීවරය;එකතො සුද්ධිකං නාම, දායකයා විසින් පාමුල්හි තබා දුන් බැවින් එකතොසුද්ධිකනම් වේ; යං, යමක්; භික්ඛුනො, භික්ෂුහුගෙ හත්ථෙ ඨපෙත්වා දින්නං, අත්හි තබා දෙනලද ද; තෙන පන භික්ඛුනා, ඒ භික්ෂුව විසින් වනාහි; පාදමූලෙ ඨපිතං, පාමුල්හිතබනලද ද; තම්පි, හෙද; එකතො සුද්ධිකං, එකතො සුද්ධිකනම්වේ; යං, යමක්; භික්ඛුනො, භික්ෂුහුගේ; පාදමූලෙ ඨපෙත්වා දින්නං, පාමුල්හි තබා දෙනලද ද; තෙනාපි, ඒ භික්ෂුහු විසිනු ද; තථෙව දින්නං, එසේම පාමුල්හි තබා දෙනලද ද; තං උභතො සුද්ධිකං, (ලාභයෙහි ද දානයෙහි ද පාමුල්හි තුබූ බැවින්) හේ උභතො සුද්ධික නම්වේ; යං, යමක්; හත්ථෙ ඨපෙත්වා ලද්ධං; අත්හි තබාලද්දේ ද; හත්ථෙ යෙව ඨපිතං, දෙනකල අත්හිම තබනලද්දේ ද; තං, හේ; අනුක්කට්ඨචීවරං නාම, අනුත්කෘෂ්ටචීවර නම් වේ;

(අ) ඉති, මෙසේ; ඉමං, මේ; පංසුකූලභෙදං ඤත්වා, පාංශුකූලික භෙදය දැන; පංසුකූලිකෙන, පංසුකූලිකයා විසින්; චීවරං, සිවුරු; පරිභුඤ්ජිතබ්බන්ති, වැළඳගතයුත්තේය යි; ඉදං, මේ; එත්ථ, මෙහි; විධානං, පිළිපදනා විධියි; අයං පන, මේ වනාහි; පභෙදො, විභාගයි; තයො පංසුකූලිකා, පංසුකූලිකයෝ තුන්දෙනෙකි; උක්කට්ඨො, උත්කෘෂ්ටය; මජ්ඣිමො, මැදුමය; මුදුකොති, මෘදුකයයි; තත්ථ, ඒ තුන්දෙනා කෙරෙහි; සොසානිකං යෙව ගණ්හන්තො, සොහොනෙහි පියූ කඩම ගන්නේ; උක්කට්ඨො හොති, උත්කට නම් වේ; පබ්බජිතා ගණ්හිස්සන්තීති ඨපිතකං ගණ්හන්තො, පැවිද්දෝ ගණිත්වයි තබනලද්ද ගන්නේ; මජ්ඣිමො, මැදුම් නම් වේ. ("පබ්බජිතා ගණ්හිස්සන්තීති ඨපිතකං යෙව

(අ) අයං පනානිසංසො:–**"පංසුකූල චීවරං නිස්සාය පබ්බජ්ජා"**ති වච නතො නිස්සයානුරූපපටිපත්තිසබ්භාවො, පඨමෙ අරියවංසෙ පතිට්ඨා නං, ආරක්ඛදුක්ඛාභාවො, අපරායත්තවුත්තිතා, චොරභයෙන අභයතා, පරිභොගතණ්හාය අභාවො, සමණසාරුප්පපරික්ඛාරතා, **"අප්පානි චෙව සුලභානිච තානිච අනවජ්ජානී"**ති භගවතා සංවණ්ණිතපච්ච යතා, පාසාදිකතා, අප්පිච්ඡතාදීනං ඵලනිප්ඵත්ති, සම්මාපටිපත්තියා අනුබ්‍රෑහණං, පච්ඡිමාය ජනතාය දිට්ඨානුගතිං ආපාදනන්ති.

---

ගණ්හන්තො මජ්ඣිමොති"යි කී බැවින් සොහොනෙන් සෙසු තන්හිදු නොඋදෙසා තිබුවා ගන්නේ උකටම වේ යනු සිඩය. "සොසානිකං යෙව ගණ්හන්තො" යනමේ වනාහි අති උක්කට්ඨ විසින් කියනලද යෙත්.) පාදමූලෙ ඨපෙත්වා දින්නකං, මහණක්හු විසින් පාමුල්හි තබා දෙනලද දෙය; ගණ්හන්තො, ගන්නේ; මුදුකොති, මෘදුක නම් වෙ; තෙසු, ඔවුන්කෙරෙහි; යස්ස කස්සචි, උකටාදීන් කෙරෙහි යම් කිසිවක් හටම්; අත්තනො රුචියා බන්තියා, තමහට කැමතිවීමෙන්; ගිහිහිදින්න කං, ගෘහීන් දුන්නා; සාදිතක්ඛණෙ, ඉවසූ කෙණෙහිම; ධුතඞ්ගං භිජ්ජති, දුහඟබිඳේ; (මෙසින් අන්තට දෙම්සි ගනුත් දෙෂ නැතැයි කිවෙත්;) අයමෙත්ථ භෙදො, මේමෙහි භෙදයි.

(අ) අයං පනානිසංසො, මේවනාහි අනුසසි; පංසුකූල චීවරං නිස්සාය, පංසුකූලික චීවරය නිසා; පබ්බජ්ජාති වචනතො, පැවිදියයි වදළ බැවින්; නිස්සයානුරූපපටිපත්තිසබ්භාවො, නිශ්‍රයට නිසිවූ පිළිවෙත් බවය; (මහණුවම් මළුයෙහි ආචාර්‍ය්‍යයන් විසින් කියනලද සතරනිශ්‍රයෙහි තමාම පිළිනකළ දෙවනනිශ්‍රයට සුදුසු පිළිවෙත්බව යුතැතී;) පඨමෙ අරියවංසෙ, පළමුවන ඉතරීතර අරියවස්හි; පතිට්ඨානං, පිහිටවීමය; ආරක්ඛදුක්ඛාභාවො; පංසුකූල චීවරය අලොභනීය බැවින් සිවුරු රක්ෂාවෙහි දුක්නැතිබවය; අපරායත්තවුත්තිතා, අනුන්අයිති වෘත්ති නැතිබවය; චොරභයෙන, සොරබියෙන්; අභයතා, භයනැතිබවය; පරිභොගතණ්හාය අභාවො, වෙසෙසින්ම ලුබ බැවින් පරිභොගයෙහි තණ්හානැතිබවය; සමණසාරුප්පපරික්ඛාරතා, මහණුන්ට සුදුසු පිරි කරබවය; අප්පානිචෙව, මහාහීනොවනබැවින් අල්පයහ; සුලභානිච, එකතැනකින්ම නොලැබියහැකි බැවින් සුලභයහ; තානි ච, ඔහුද; අනවජ්ජානීති, නිරවද්‍යහයි; භගවතා, භගවත්හු විසින්; සංවණ්ණිත; වණ්ණනාකරනලද; පච්චයතා, පසයක් බවය; පාසාදිකතා, අනුන්ට ප්‍රසාදඑළවනබවය; අප්පිච්ඡතාදීනං ඵලනිප්ඵත්ති, අල්පෙච්ඡභාවාදි හෙතුවෙන් දුහඟ පරිහරණය නිෂ්පන්නවනබැවින් අල්පෙච්ඡභාවාදීන් ගේ ඵලනිෂ්පත්තියෙක; සම්මාපටිපත්තියා අනුබ්‍රෑහණං, දුහඟ රැක්ම මනා පිළිවෙළින් උපයනු පිණිසනුයි මතුයෙහි වන සම්මාපිළිවෙත වඩන්නේය; පච්ඡිමාය ජනතාය, පශ්චිමජනයාගේ; දිට්ඨානුගතිං ආපාදනන්ති, මෙම දෘෂ්ටිය අනුවීමට පැමිණීවීමයි.

97 මාරසෙනවිඝාතාය පංසුකූලධරො යති
සන්නද්ධකවචො යුද්ධෙ ඛත්තියො විය සොභති.

98 පහාය කාසිකාදීනි වරවත්ථානි ධාරිතං
යං ලොකගුරුනා කො තං පංසුකූලං න ධාරයෙ.

99 තස්මා හි අත්තනො භික්ඛු පටිඤ්ඤං සමනුස්සරං
යොගාචාරානුකූලම්හි පංසුකූලෙ රතො සියාති.

**අයං තාව පංසුකූලිකඞ්ගෙ**
**සමාදානවිධානප්පභෙදභෙදානිසංස වණ්ණනා.**

—:o:—

(අ) තදනන්තරං පන **තෙචීවරිකඞ්ගං** "චතුත්ථකචීවරං පටික්ඛිපාමි තෙචීවරිකඞ්ගං සමාදියාමී"ති ඉමෙසං අඤ්ඤතරවචනෙන සමාදින්නං හොති. තෙන පන තෙචීවරිකෙන චීවරදුස්සං ලභිත්වා යාව අඵාසු

---

97. මාරසෙනවිඝාතාය, මරහුගා මාරසෙනාව නසනුපිණිස; පංසුකූලධරෙ යති, පවුල්සිවුරුධැරූ තපස්වීතෙමේ; යුද්ධෙ, සඞ්ග්‍රාමයෙහි; සන්නද්ධකවචො, බඳනාලද සන්නාහඇති; ඛත්තියො විය, රජකුමෙන්; සොභති, හොබනේයි;

98. කාසිකාදීනි, කසීසළුආදීවූ; වරවත්ථානි පහාය, උතුම්වස්ත්‍ර හැර; ලොකගුරුනා යං පංසුකූලං ධාරිතං, තිලොකගුරුහු විසින් යම්පසුල් සිවුරෙක්ධරනලදද; තං හේ; කො න ධාරයෙ, කවරෙක් නම් නොධරුද; (නොහොත් "යං" යනු යස්මා දත්‍ථීකොට "යස්මා ලොකගුරුනා පංසුකූලං ධාරිතං තස්මා කො තං න ධාරයෙ"යි යොදනු-යත් තත් ශබ්දයන් නිත්‍යසම්බන්ධ බැවින්.)

99. තස්මා හි, එසෙයින්ම; (ලොකගුරුහු විසින් ධැරූ බැවින්ය යුතැනී;)භික්ඛු,මහණතෙමේ; අත්තනො,තමාගෙ; පටිඤ්ඤං සමනුස්සරං, (මහණුවම්මලුයෙහි "ආම භන්තෙ"යි ඇජිරතෙරුන් ප්‍රධානකොට ඇති) සඟමැද කළපිළිත සිහිකරනුයෙ; යොගාචාරානුකූලම්හි, යොගාවචරයනට අනුලොම්වූ; පංසුකූලෙ, පසුල්සිවුරෙහි; රතො සියා, ඇලෙන්නේයි.

අයං, මේ; පංසුකූලිකඞ්ග, පාංශුකූලිකාඞ්ගයෙහි; සමාදානවිධානප්පභෙදභෙදානිසංසවණ්ණනා, සමාදානය විධානය ප්‍රභෙදය බිඳීමය ආනිසංසය යන මොවුන්ගේ සංවණ්ණනායි.

—:o:—

(අ) තදනන්තරං පන, එයට ඉක්බිතිවූ; තෙචීවරිකඞ්ගං, තෙචීවරිකාඞ්ගය; චතුත්ථකචීවරං, සතරවනසිවුර; (මිහි හඳනට පොරොනට සුදුසුවූයේම සතරවන සිවුරනම් වේද දත්කඩ නොහැරියයුතුබැවිනි.) පටික්ඛිපාමි, ප්‍රතික්ෂෙප කෙරෙමි සි; තෙචීවරිකඞ්ගං, තෙචීවරිකාඞ්ගය; සමාදියාමීති, සමාදන්වෙමි යන; ඉමෙසං, මොවුන් අතුරෙන්;

හාවෙන කාතුං වා න සක්කොති විචාරණකං වා න ලභති සූචි ආදිසු වා අස්ස කිඤ්චි න සම්පජ්ජති තාව නික්ඛිපිතබ්බං; නික්ඛිත්තපච්චයා දොසො නත්ථි රජිතකාලතො පන පට්ඨාය නික්ඛිපිතුං න වට්ටති; ධුතඞ්ගචොරො නාම හොති. ඉදමස්ස විධානං. පභෙදතො පන අයම්පි තිවිධො හොති. තත්ථ උක්කට්ඨෙන රජනකාලෙ පඨමං අන්තරවාසකං වා උත්තරාසඞ්ගං වා රජිත්වා තං නිවාසෙත්වා ඉතරං රජිතබ්බං, තං පාරුපිත්වා සඞ්ඝාටි රජිතබ්බා–සඞ්ඝාටිං පන නිවාසෙතුං න වට්ටති. ඉදමස්ස ගාමන්තසෙනාසනෙ වත්තං. ආරඤ්ඤකෙන පන ද්වෙ එකතො ධොවිත්වා රජිතුං වට්ටන්ති, යථා පන කිඤ්චි දිස්වා සක්කොති කාසාවං ආකඩ්ඪිත්වා උපරි කාතුං එවං ආසන්නෙ ඨානෙ නිසීදිතබ්බං.

---

අඤ්ඤතරවචනෙන, එක්තරු වචනයකින්; සමාදින්නං හොති, සමාදන්වනලද්දේ වේ; තෙන පන තෙචීවරිකෙන, ඒ තෙචීවරිකයා විසින්; චීවර දුස්සං ලභිත්වා, සිවුරු පිළී ලදින්; යාව, යම්තාක්; අඵාසු භාවෙන වා, අඵාසුබැවින් හෝ; කාතුං න සක්කොති, කරන්නට නොපොහොසත් වේද; ("යාව විචාරණකං වා න ලභති" යි යොදනු. සිවුරු විචාරන්නක්හු හෝ කරනසේ දන්නක්හු යුතැනි.) න ලභති, නොලැබේද; සූචිආදිසු වා, හිඳිකටු ආදියෙහි හෝ; කිඤ්චි, කිසිවෙක්; අස්ස, මොහට; න සම්පජ්ජති, නොසැපයෙ ද; තාව, ඒතාක්; නික්ඛිපිතබ්බං, තිබියයුතු; නික්ඛිත්තපච්චයා දොසො නත්ථි, වස්ත්‍රසන්නිධිපස යෙන් දොස්නැති; (වස්ත්‍රසන්නිධිද නොවෙයි දුහඟද නොබිඳෙයි යුතැනි.) රජිතකාලතො පන පට්ඨාය, රැඳූකලවනාහි පටන්ගෙන්; නික්ඛිපිතුං න වට්ටති, තබන්නට නොවටී; ධුතඞ්ග චොරො නාම හොති, (පරණ සිවුරු හැර මේ සිවුරු වළඳගනිම් යි තබන්නහුට දුහඟ නොබිඳෙතුදු) දුහඟසොරනම් වේ; ඉදං, මෙතෙමෙ; අස්ස, මෙ තෙචීවරිකඞ්ගයාගෙ; විධානං, විධියි; පභෙදතො පන, ප්‍රභෙදයෙහින් වනාහි; අයම්පි, මෙද; තිවිධො හොති, තුන්වැදෑරුම් වෙ; තත්ථ, එහි; උක්කට්ඨෙන, උකටහුවිසින්; රජනකාලෙ, රඳනකල්හි; පඨමං, පළමු කොට; අන්තරවාසකං වා, හඳනා සිවුර හෝ; උත්තරාසඞ්ගං වා, පොරොනා සිවුර හෝ; රජිත්වා, රඳා; ඉතරං, අනික් සිවුර; රජිතබ්බං, රැඳියයුතු; තං පාරුපිත්වා, ඒ පෙරව; සඞ්ඝාටිරජිතබ්බා, සඟළරැඳිය යුතු; සඞ්ඝාටිං පන නිවාසෙතුං න වට්ටති, සඟළ වනාහි හඳනට නොවටී; ඉදං, මෙ; අස්ස, මෙ තෙචීවරිකයාගෙ; ගාමන්තසෙනාසනෙ, ගමත් සෙනස්නෙහි; වත්තං, වතයි; ආරඤ්ඤකෙන පන, වල්හි වසන තෙචීවරිකයාවිසින්වනාහි; ද්වෙ එකතොධොවිත්වා, දෙසිවුර එක්කොට දෙව; රජිතුං වට්ටන්ති, රදන්නට වටනාහුය; යථා පන, යම්සේ; කිඤ්චි දිස්වා, කිසිවක්හු දැක; කාසාවං ආකඩ්ඪිත්වා, සිවුර ඇද; උපරි කාතුං සක්කොති, මතුයෙහි කරන්නට පොහොසත්වෙද; එවං, එසේ; ආසන්නෙ ඨානෙ, සිවුරට ආසන්න තැන්හි; නිසීදිතබ්බං, හින්දයුතු.

(අ) මජ්ඣිමස්ස පන රජනසාලායං රජනකාසාවං නාම හොති. තං නිවාසෙත්වා ච පාරුපිත්වා ච රජනකම්මං කාතුං වට්ටති. මුදුකස්ස සභාගභික්ඛූනං චීවරානි නිවාසෙත්වා වා පාරුපිත්වා වා රජනකම්මං කාතුං වට්ටති. තත්‍රට්ඨකපච්චත්ථරණම්පි තස්ස වට්ටති. පරිහරිතුං පන න වට්ටති. සභාගභික්ඛූනං චීවරම්පි අන්තරන්තරා පරිභුඤ්ජිතුං වට්ටති. තෙචීවරිකස්ස පන චතුත්ථං වට්ටමානං අංසකාසාවමෙව වට්ටති, තඤ්ච ඛො විත්ථාරතො විදත්ථි දීඝතො තිහත්ථමෙව වට්ටති ඉමෙසං පන තිණ්ණම්පි චතුත්ථකචීවරං සාදිතක්ඛණෙයෙව ධුතඞ්ගං භිජ්ජති. අයමෙත්ථ භෙදො. අයං පනානිසංසො:-තෙචීවරිකො භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන, තෙනස්ස පක්ඛිනො විය සමාදායෙව ගමනං, අප්පසමාරම්භතා, වත්ථසන්නිධිපරිවජ්ජනං, සල්ලහුකවුත්තිතා, අතිරෙකචීවරලොලුප්පප්පහානං, කප්පියෙපි මත්තකාරිතා, සල්ලෙඛවුත්තිතා, අප්පිච්ඡතාදීනං ඵලනිප්ඵත්තීති එවමාදයො ගුණා සම්පජ්ජන්ති.

---

(අ) මජ්ඣිමස්ස පන, මැදුමහට; රජනසාලායං, රඳනහල්හි; රජනකාසාවං නාම හොති, රඳනසිවුරනම් වෙයි; තං, හේ; නිවාසෙත්වාච, හැඳද; පාරුපිත්වාච, පෙරවද; රජනකම්මං කාතුං වට්ටති, රඳනකම් කරන්නට වටී; මුදුකස්ස, මෘදුකයහට; සභාගභික්ඛූනං චීවරානි, සභාග මහණුන්ගෙ සිවුරු; නිවාසෙත්වා වා, හැඳ හෝ; පාරුපිත්වා වා, පෙරව හෝ; රජනකම්මං කාතුං වට්ටති, රඳනකම් කරන්නට වටී; තත්‍රට්ඨකපච්චත්ථරණම්පි, තමාසතු නොතමාසතු හෝ හඳනා පොරොනා පිණිස නො ඉටා සෙනස්නෙහි පසතරණකොට ඉටනලද සිවුරද; තස්ස, ඔහට; වට්ටති, වටී; පරිහරිතුං පන න වට්ටති, (රඳන කලටම අනුදත් බැවින් නිත්‍ය පරිභොගවිසින්) පරිභොගකරන්නට නොවටී;(දත්කඩ වනාහි පිරිකර සොළුවෙයි මෙ පසතරණය දත්කඩය යන දෙසිවුරෙ අතිරෙක සිවුරෙතන්හි සිටියාහුදු දුහඟ නොබිඳිති යි අටුවායෙහි කී හයි යෙත්.) සභාගභික්ඛූනං චීවරම්පි, සභාග මහණුන්ගෙ සිවුරුදු, අන්තරන්තරෙ, අතුරතුරෙහි; පරිභුඤ්ජිතුං, වැළඳගන්නට; වට්ටති, වටී; තෙචීවරිකස්ස පන, තෙසිවුරිහට වනාහි; චතුත්ථං වට්ටමානං, සතරවන සිවුර වටනෙ; අංසකාසාවමෙව වට්ටති, දත්කඩම වටී; තඤ්ච ඛො, හෙද; විත්ථාරතො, පලලින්; විදත්ථි, වියතෙක්ම; දීඝතො, දිගින්; තිහත්ථමෙව, තුන්රියන්වූයේම; වට්ටති, වටී; ඉමෙසං පන තිණ්ණම්පි, මෙතුන්දෙනහටම; චතුත්ථකචීවරං සාදිතක්ඛණෙයෙව, පෙරහන් ආදී බාහිර පිරිකර මිස තමා හඳනා පොරොනා වස් සතරවන සිවුර ඉවසූ කෙණෙහිම; ධුතඞ්ගං භිජ්ජති, දුහඟ බිඳේ; අයමෙත්ථභෙදො, මේ මෙහි හෙදයි; අයං පන, මෙ වනාහි; ආනිසංසො, අනුසසී; තෙචීවරිකො භික්ඛු; තෙසිවුරී මහණතෙමෙ; කායපරිහාරිකෙන, වාතාතපයෙන් කායපරිහරණය කරන, චීවරෙන, සිවුරෙන්; සන්තුට්ඨො හොති, සතුටු වෙ; තෙන, එහෙයින්; අස්ස, උහුගෙ; පක්ඛිනො විය, පක්ෂියක්හු මෙන්, සමාදායෙව; ගෙනම; ගමනං, යාමය; අප්ප සමාරම්භතා, මඳකිසඇති

100 අතිරෙකවත්ථතණ්හං පහාය සන්නිධිවිවජ්ජිතො ධීරො
සන්තොස සුඛ රසඤ්ඤු තිචීවරධරො භවති යොගී.

101 තස්මා සපත්තචරණො[1] පක්ඛීව සචීවරොව යොගිවරො
සුඛ මනු විචරිතුකාමො චීවරනියමෙ රතිං කයිරාති.

**අයං තෙචීවරිකඞ්ග**
**සමාදාන විධානප්පභෙදභෙදානිසංස වණ්ණනා.**

—:o:—

(අ) **පිණ්ඩපාතිකඞ්ගම්පි** "අතිරෙක ලාභං පටික්ඛිපාමි, පිණ්ඩපාතිකඞ්ගං සමාදියාමී"ති. ඉමෙසං අඤ්ඤතර වචනෙන සමාදින්නං හොති. තෙන පන පිණ්ඩපාතිකෙන. **සඞ්ඝභත්තං, උද්දෙසභත්තං, නිමන්තනං**

---

බවය; **වත්ථසන්නිධිපරිවජ්ජනං**, වස්ත්‍රසන්නිධිය දුරුකිරීමය; **සල්ලහුකවුත්තිතා**, ලඝුවූප්‍රවෘත්තිඇතිබවය; **අතිරෙක චීවරලොලුප්පප්පහානං**, තුන්සිවුරෙන් වැඩි චීවරයෙහි ලොල්බව පැහීමය; **කප්පියෙපි මත්තකාරිතා**, නිසීදනාදී අනුදත් බොහෝ සිවුරු ඇතද තුන්සිවුරු පමණෙහි සිටිබැවින් කැපයෙහිදු මාත්‍රකාරිබවය; **සල්ලෙඛවුත්තිතා**, සලේ පැවැතුම් ඇතිබවය; **අප්පිච්ඡතාදීනං**, අල්පෙච්ඡ භාවාදීන්ගෙ; **එලනිප්ඵත්ති ඉති**, ඵලනිෂ්පත්තිය යන; **එවමාදයො ගුණා**, මෙ ආදී ගුණයෝ; **සම්පජ්ජන්ති**, නිෂ්පන්නවෙත්.

**100.** අතිරෙකවත්ථතණ්හං පහාය, තුන් සිවුරෙන් වැඩි සිවුරෙහි තෘෂ්ණාව දුරුකොට; **සන්නිධිවිවජ්ජිතො**, වස්ත්‍රසන්නිධීන් වර්ජිතවූ; **ධීරො යොගි**, ධීරවූ යොගීතෙමෙ; **සන්තොස සුඛ රසඤ්ඤූ**, සන්තොස සුඛයෙහි රසදන්නේ; **තිචීවරධරො භවති**, තුන්සිවුරුධර වේ.

**101.** තස්මා, එහෙයින්; සපත්තචරණො, පත්‍රචරණසහිතවූ; (සපක්ෂ යුතුැනි.) පක්ඛීව, පක්ෂියෙකුමෙන්; සචීවරොව, තුන්සිවුරු සහිතවූම; **යොගිවරො**, යොගිවරතෙමෙ; සුඛං, සුවසේ; අනුවිචරිතුකාමො, ඇවිදුනා කැමැත්තේ; චීවරනියමෙ රතිං කයිරා, සිවුරු නියමයෙහි (තුන් සිවුරෙහිය යුතුැනි.) ඇලුම් කරන්නේසි.

—:o:—

(අ) **පිණ්ඩපාතිකඞ්ගම්පි**, පිණ්ඩපාතිකාඞ්ගයද; **අතිරෙකලාභං**, පිණ්ඩියාලොපභොජනයෙන් වැඩිලාභය;(සඞ්ඝභත්තාදිය යුතුැනී.) **පටික්ඛිපාමි**, පිළිබෙවූකෙරෙමි; **පිණ්ඩපාතිකඞ්ගං සමාදියාමි**, පිණ්ඩපාතිකාඞ්ගය සමාදන්වෙමි; **ඉමෙසං අඤ්ඤතරවචනෙන**, මොවුන්කෙරෙන් එක්තරුවචනයකින්; **සමාදින්නං හොති**, සමාදන්වනලද්දෙවෙ; **තෙන පන පිණ්ඩපාතිකෙන**, ඒපිණ්ඩපාතිකයාවිසින්; (සමාදිතබ්බානි යනු හා සබඳ) **සඞ්ඝභත්තං**, සියලු සඟනට දියයුතු බත; **උද්දෙසභත්තං**, භික්ෂූන් කීපදෙනෙකු උදෙසා දියයුතු බත; **නිමන්තනං**, සඟනටවත් පුඟුලනටවත්

---

1. සපත්තරචණො—ඇතැම්.

**සලාකභත්තං, පක්ඛිකං, උපොසථිකං, පාටිපදිකං, ආගන්තුකභත්තං, ගමිකභත්තං, ගිලානභත්තං, ගිලානුපට්ඨාකභත්තං, විහාරභත්තං, ධුරභත්තං, වාරකභත්තන්ති.** එතානි චුද්දසභත්තානි න සාදිතබ්බානි.

(අ) සචෙ පන සඞ්ඝභත්තං ගණ්හථාති ආදිනා නයෙන අවත්වා අම්හාකං ගෙහෙ සඞ්ඝො භික්ඛං ගණ්හාතු තුම්හෙපි භික්ඛං ගණ්හථාති වත්වා දින්නානි හොන්ති තානි සාදිතුං වට්ටති. සඞ්ඝතො නිරාමිස සලාකාපි විහාරෙ පක්කභත්තම්පි වට්ටතියෙවාති ඉදමස්ස විධානං. පභෙදතො පන අයම්පි තිවිධො හොති:—තත්‍ථ උක්කට්ඨො පුරතොපි පච්ඡතොපි ආහටභික්ඛං ගණ්හාති, පත්තද්වාරෙ ඨත්වා පත්තං ගණ්හන්තානම්පි දෙති, පටික්කමනං ආහරිත්වා දින්නභික්ඛම්පි

---

නිමන්ත්‍රණයකොට දෙන බත; සලාකභත්තං, ලහබත; පක්ඛිකං, එක් පක්ෂයක එක්දවසක් දියයුතු බත; උපොසථිකං, පොහොය පොහොයෙහි දියයුතු බත; පාටිපදිකං, පෑළවිය දියයුතු බත; ආගන්තුකභත්තං, ආගන්තුක භික්ෂූන්ට දියයුතු බත; ගමිකභත්තං, ගමන්යන වුන්ට දියයුතු බත; ගිලානභත්තං, ගිලනුන්ට දියයුතු බත; ගිලානුපට්ඨාකභත්තං, ගිලනුන්ට උපස්ථාන කරනුවන්ට දෙන බත; විහාරභත්තං, වෙහෙර උදෙසා දෙන බත; (තමා කරවූ සඟසතු අවසාහි වසන්නවුන්ට දෙන කුටිභත්තයද මෙහිම ඇතුළත්වෙ යෙති.) ධුරභත්තං, සඟහටවත් පුගුලහටවත් ධුරබත් දෙමි යි නිත්‍යයෙන් දෙන බත්; (ජනයාගැන කළ ගෙහි තබා සඟනට දෙන බත්යෙත්මය යනුද සත්‍යයි-ටීකාවෙහි වනාහි "ධුරගෙහෙ එව ඨපෙත්වා දාතබ්බභත්තං ධුරභත්තං" යි කීහු.) වාරභත්තං, ගම්වැසි ආදීන් වාරයෙන්දෙන බතය යන; එතානි චුද්දස භත්තානි, මෙ තුදුස් බත්හු; න සාදිතබ්බානි, නො ඉවසිය යුත්තාහුයි.

(අ) සචෙ පන, ඉදින්; සඞ්ඝභත්තං ගණ්හථාති ආදිනා නයෙන, සඞ්ඝභත්තං ගණ්හථ-යනාදි නයින්; අවත්වා, නොකියා; අම්හාකං ගෙහෙ, අපගෙ ගෙහි; සඞ්ඝො භික්ඛං ගණ්හාතු, සඟ භික්ෂාව ගන්නේය; තුම්හෙපි, තෙපිද; භික්ඛං ගණ්හථාති වත්වා, භික්ෂාව ගනුවයි කියා; දින්නානි හොන්ති, දෙනලදැහු වෙද්ද; තානි, ඔවුන්; සාදිතුං, ඉවසන්නට; වට්ටති, (භික්ෂානාමයෙන් කීහෙයින්) වටී; සඞ්ඝතො, සඟහු කෙරෙන්; නිරාමිස සලාකාපි, ඇවිකැලිම්ස සෙසුතුන් කැල් ලට ලහාද; විහාරෙ පක්කභත්තම්පි, වෙහෙරදීම පිසවාදෙන බතද; වට්ටති යෙවාති, වටනේමයයි; ඉදං, මෙ; අස්ස, මොහුගෙ; විධානං, විධියි; පභෙදතො පන, ප්‍රභෙදහෙයින් වනාහි; අයම්පි, මෙද; තිවිධො හොති, ත්‍රිවිධවෙ; තත්‍ථ, ඔවුන්කෙරෙහි; උක්කට්ඨො, උකට; පුරතොපි, පෙරටින්ද; පච්ඡතොපි, පස්සෙන්ද; ආහටභික්ඛං ගණ්හාති, ගෙනා භික්ෂාව ගනී; පත්තද්වාරෙ ඨත්වා, හමුවූදෙරසිට; පත්තං ගණ්හන්තානම්පි,

ගණ්හාති, තං දිවසං පන නිසීදිත්වා භික්ඛං න ගණ්හාති; මජ්ඣිමො තං දිවසං නිසීදිත්වාපි ගණ්හාති, සවාතනාය පන නාධිවාසෙති; මුදුකො සවාතනායපි පුන දිවසායපි භික්ඛං අධිවාසෙති. තෙ උභොපි සෙරිවිහාරසුඛං න ලභනති, උක්කට්ඨො පන ලභති. එකස්මිං කිර ගාමෙ අරියවංසො හොති, උක්කට්ඨො ඉතරෙ ආහ. ආයාමාවුසො ධම්මසවණායාති. තෙසු එකො එකෙනම්හි භන්තෙ මනුස්සෙන නිසීදාපිතොති ආහ, අපරෙ මයා භන්තෙ සවාතනාය එකස්ස භික්ඛා අධිවාසිතාති. එවං තෙ උභොපි පරිහීණා, ඉතරො පාතොව පිණ්ඩාය චරිත්වා ගන්ත්වා ධම්මරසං පටිසංවෙදෙසි. ඉමෙසං පන තිණ්ණම්පි සඞ්ඝභත්තාදිකං අතිරෙකලාභං සාදිතක්ඛණෙ එව ධුතඞ්ගං භිජ්ජති අයමෙත්ථ භෙදො.

---

පාත්‍රය ගන්නවුන්වද; දෙති, දේ; පටික්කමතං, බොජුන් හලට; ආහරිත්වා දිය්‍යන්භික්ඛම්පි, (පයගෙනගොස් බත්ඇවිස) ගෙනවුත්දුන්භික්ෂාවද; ගණ්හාති, ගනී; තං දිවසං පන නිසීදිත්වා භික්ඛං න ගණ්හාති, වහන්සේ පිඩුපිණිස නොවැඩියමැනව වෙහෙරටම අහර ගෙනෙම්හයි යන උපාසකයන්ගෙ බස් ඉවසා එදවස්හි අහර නොගනී; මජ්ඣිමො, මැදුම්; තං දිවසං, එදවස්; නිසීදිත්වාපි ගණ්හාති, හිඳදගනී; සවාතනාය පන, සෙටපිණිස වනාහි; නාධිවාසෙති, නො ඉවසා; මුදුකො, මුදුක තෙමෙ; සවාතනායපි, සෙටදවස පිණිස ද; පුනදිවසායපි, අනික්දවස පිණිස ද; භික්ඛං, භික්ෂාව; අධිවාසෙති, ඉවසා; තෙ උභොපි, හිඳ භික්ෂාව ගන්නෙද සෙටයට අනික් දවසට ඉවසන්නෙ ද යන දෙදෙනම; සෙරිවිහාරසුඛං න ලභනති, සෙරිවිහාරසුඛය නොලබත්; (අනුන් අයත් නොව වසනබවය යන සුව නොලබත් යුතැන්.) උක්කට්ඨො පන, උකට; ලභති, ලබා; එකස්මිං කිර ගාමෙ, එක් ගමෙක්හි; අරියවංසො හොති, අරියවංස සූත්‍ර ප්‍රතිසංයුක්ත ධම්මකථාවෙක් වෙ; උක්කට්ඨො, උකටතෙමෙ; ඉතරෙ, සෙස්සනට; (මජ්ඣිම මුදුක දෙදෙනාහටය යුතැනී;) ආහ, මෙසේ කී; ධම්මසවණාය, බණඅසනුපිණිස; ආයාමාවුසොති, ඇවැත්නි යම්හයි; තෙසු, ඔවුන්කෙරෙන්; එකො, එක්මහණෙක්; භන්තෙ, වහන්ස, එකෙන මනුස්සෙන, එක් මිනිසකු විසින්; නිසීදාපිතොම්හි, හිඳුවනලදිමිසි; ආහ, කී; අපරෙ, අනිකා; භන්තෙ, වහන්ස; මයා, මාවිසින්; සවාතනාය, සෙටපිණිස; එකස්ස, එකක්හුගෙ; භික්ඛා, භික්ෂාතොමො; අධිවාසිතාති, ඉවසනලදුයි කී; එවං, මෙසේ; තෙ උභොපි, ඔහුදෙදෙනම; පරිහීණා, දහම්රෙසෙන් පිරිහුණහ; ඉතරො, අනික් උකට; පාතොව, උදෑසන්හිම; පිණ්ඩාය චරිත්වා, පිඩුපිණිස ගොස්; ගන්ත්වා, බණඅසනපිණිස ගොස්; ධම්මරසං පටිසංවෙදෙසි, ධම්මයුක්තවූ ප්‍රමොද්‍යාදි රසය අනුභව කොළේයි; ඉමෙසං පන තිණ්ණම්පි, මේ තුන්දෙනහටම; සඞ්ඝභත්තාදිකං අතිරෙකලාභං, සඞ්ඝභත්තාදිවූ අතිරෙක ලාභය; සාදිතක්ඛණෙ එව, ඉවසූ කෙණෙහිම; ධුතඞ්ගං භිජ්ජති, ධුතඟ බිඳේ; අයමෙත්ථ භෙදො, මේ මෙහි භෙදයි.

(අ) අයම්පනානිසංසො :– “**පිණ්ඩියාලොපභොජනං නිස්සාය පබ්බජ්ජා**”ති වචනතො නිස්සයානුරූපපටිපත්තිසබ්භාවො, දුතියෙ අරියවංසෙ පතිට්ඨානං, අපරායත්තවුත්තිතා, “**අප්පානි චෙව සුලභානි ච තානි ච අනවජ්ජානි**”ති භගවතා සංවණ්ණිතපච්චයතා, කොසජ්ජනිම්මථනතා, පරිසුද්ධාජීවිතා, සෙඛියපටිපත්තිපූරණං, අපරපොසිතා, පරානුග්ගහකිරියා, මානප්පහානං, රසතණ්හානිවාරණං, ගණභොජන පරම්පරභොජන චාරිත්තසික්ඛාපදෙහි අනාපත්තිතා, අප්පිච්ඡතාදීනං අනුලොම වුත්තිතා, සම්මාපටිපත්ති බ්‍රෑහණං, පච්ඡිම ජනතානුකම්පනන්ති.

102 පිණ්ඩියාලොපසන්තුට්ඨො අපරායත්තජීවිකො
පහීනාහාරලොලුප්පො හොති චාතුද්දිසො යති.

---

(අ) අයම්පන, මෙතනැති; ආනිසංසො, අනුසස්; පිණ්ඩියාලොපභොජනං නිස්සාය, පිණ්ඩියාලොපභොජනය නිසා; පබ්බජ්ජාති වචනතො, පැවිදියයි වදාළබැවින්; නිස්සයානුරූපපටිපත්තිසබ්භාවො, නිශ්‍රයට අනුරූපවූ පිළිවෙත් ඇතිබවය; දුතියෙ අරියවංසෙ පතිට්ඨානං, දෙවනුවූ පිණ්ඩපාත ආර්‍ය්‍ය වංශයෙහි පිහිටීමය; අපරායත්තවුත්තිතා, අනුන් අයත් නොවන පැවතුම් ඇතිබවය; අප්පානිචෙව, අල්පයහ; සුලභානිච, සුලභයහ; තානිච, ඔහුද; අනවජ්ජානීති, නිරවද්‍යයහයි; භගවතා සංවණ්ණිතපච්චයතා, භගවත්හුවිසින් සංවර්ණිතප්‍රත්‍යයබවය; කොසජ්ජනිම්මථනතා, (ජඞ්ඝාබලනිසා පිඬුසිඟන බැවින්) කුසීතභාවයාගෙ මැඩීමක් බවය; පරිසුද්ධා ජීවිතා, පිරිසුදුවූ ආජීව ඇතිබවය; සෙඛිය පටිපත්තිපූරණං, (අන්තරඝරයට වදනා හෙයින්) සුපටිච්ඡන්න ගමනාදි සෙඛියධම්මයන්ගෙ පිරීමය; අපරපොසිතා, පමණදැන පිළිගැන්මෙන්ද අනුන්හා හැනී නොවසන බැවින්ද පරපොෂණයක් නැතිබවය; පරානුග්ගහකිරියා, ගෙන් ගෙන් මදින් මදින්ම පිළිගැන්මෙන් අනුන්ට අනුග්‍රහ කිරීමය; මානප්පහානං, අන්තිම ජීවිකායෙහි පිහිටි බැවින් මානයාගෙ පැහීමය; (“අන්තමිදං භික්ඛවෙ ජීවිකානං යදිදං පිණ්ඩොල්‍යං”–යනු පෙළී.) රසතණ්හා නිවාරණං, මුසුඅහරින් යැපෙන බැවින් රසතණ්හා වැළැකීමය; ගණභොජන පරම්පරභොජන චාරිත්ත සික්ඛාපදෙහි, (නිමන්ත්‍රණ නොඉවසන බැවින්) ගණභොජන සිඛපදය පරම්පරභොජන සිඛපදය චාරිත්ත සිඛපදය යන මෙයින්; අනාපත්තිතා, නිරවැත්බවය; අප්පිච්ඡතාදීනං, අල්පෙච්ඡභාවාදීන්ට; අනුලොම වුත්තිතා, අනුලොම් පැවැතුම් ඇතිබවය; සම්මා පටිපත්ති බ්‍රෑහණං, මනාපිළිවෙත් වැඩීමය; පච්ඡිමජනතානුකම්පනන්ති, පශ්චිමජනයන්ට අනුකම්පාය යි.

102. පිණ්ඩියාලොපසන්තුට්ඨො, පිඬුසිඟීමෙන් ලද ආලොපයෙන් සතුටුවූ; අපරායත්තජීවිකො, අනුන් අයත් නොවන ජීවිකා ඇති; පහීනාහාර ලොලුප්පො, පහකරනලද අහරෙහි ලොල්බව ඇති; යති, මහණ තෙමෙ; චාතුද්දිසො, (නොපැකිලෙන පැවතුම් ඇතිබැවින්) සතරදිග ටම නිසිවූයේ; හොති, වන්නේයි.

103 විනෝදයති කොසජ්ජං ආජීවස්ස විසුජ්ඣති
තස්මා හි නාතිමඤ්ඤෙය්‍ය භික්ඛාචරියං සුමෙධසො.

එවරූපස්සහි:-

104 පිණ්ඩපාතිකස්ස භික්ඛුනො අත්තභරස්ස අනඤ්ඤපොසිනො
දෙවා පිහයන්ති තාදිනො නො චෙ ලාභසිලොකනිස්සිතොති.

**අයං පිණ්ඩපාතිකඞ්ග**
**සමාදාන විධානප්පභෙදභෙදානිසංස වණ්ණනා.**

—:o:—

(අ) **සපදානචාරිකඞ්ගම්පි** "ලොලුප්පචාරං පටික්ඛිපාමි, සපදාන චාරිකඞ්ගං සමාදියාමී"ති ඉමෙසං අඤ්ඤතරවචනෙන සමාදින්නං හොති. තෙන පන සපදානචාරිකෙන ගාමද්වාරෙ ඨත්වා පරිස්සයාභාවො සල්ලක්ඛෙතබ්බො. යස්සා රච්ඡාය වා ගාමෙ වා පරිස්සයො හොති, තං පහාය අඤ්ඤත්‍ථ චරිතුං වට්ටති. යස්මිං ඝරද්වාරෙ වා රච්ඡාය වා ගාමෙ වා කිඤ්චි න ලභති, අගාමසඤ්ඤං කත්වා ගන්තබ්බං.

---

103. කොසජ්ජං, කුසීතබව; විනොදයති, දුරුකරන්නේයි; අස්ස, මොහුගෙ; ආජීවො, ආජීවය; විසුජ්ඣති, පිරිසුදුවෙ; තස්මා හි, එහෙයින්; සුමෙධසො, නුවණැත්තේ; භික්ඛාචරියං, බික්සිගීම; නාතිමඤ්ඤෙය්‍ය, නො ඉක්මෙන්නේයි.

එවරූපස්ස, මෙබඳුවූ; (කියනලද ගුණෙන් යුක්තවූ යුතැනී;)

104. අත්තභරස්ස, තමාම රක්නාවූ; අනඤ්ඤපොසිනො, එහෙයින්ම අනුන් පොෂණය නොකරන; තාදිනො, එබඳුවූ; පිණ්ඩපාතිකස්ස භික්ඛුනො, පිණ්ඩපාතික භික්‍ෂුහට; චෙ, ඉදින්; ලාභසිලොකනිස්සිතො න[හොති,] ලාභය යසසය යන මොවුන් ඇසිරූනොකෙලේවිනම්; දෙවා පිහයන්ති, දෙවියෝ පතත්; (ඔහුගෙ සිල්ආදි ගුණෙහි බුහුමන් කරන්නාහු ආදර කෙරෙති යුතැනී.)

—:o:—

(අ) සපදානචාරිකඞ්ගම්පි, සපදානචාරිකඞ්ගයද; ලොලුප්පචාරං, ලොල භාවයෙන් ගෙපිළිවෙළ ඉක්ම හැසිරීම; පටික්ඛිපාමි, ප්‍රතික්‍ෂෙප කෙරෙමි; සපදානචාරිකඞ්ගං සමාදියාමීති, සපදානචාරිකඞ්ගය සමාදන් වෙමි යි යන; ඉමෙසං, මොවුන් කෙරෙන්; අඤ්ඤතරවචනෙන, එක් තරු වචනයකින්; සමාදින්නං හොති, සමාදන් වනලද්දේ වේ; තෙන පන සපදානචාරිකෙන, ඒ සපදානචාරිකයා විසින්; ගාමද්වාරෙ ඨත්වා, ගම් දොර සිට; පරිස්සයාභාවො, උපද්‍රව නැතිබව; සල්ලක්ඛෙතබ්බො, සැල කියයුතු; යස්සා රච්ඡාය වා, යම් වීථියෙකවත්; ගාමෙ වා, ගමෙකවත්; පරිස්සයො හොති, උපද්‍රව ඇත්නම්; තං පහාය, ඒ හැර; අඤ්ඤත්‍ථ, සෙසුතන්හි; චරිතුං, සිඟන්නට; වට්ටති, වටී; යස්මිං ඝරද්වාරෙ, යම් ගෙදොරෙක හෝ; රච්ඡාය වා, වීථියෙක හෝ; ගාමෙ වා, ගමෙක හෝ; කිඤ්චි න ලභති, (තුන්දවසක් සිඟා) කිසිවක් නොලැබේ ද; අගාම සඤ්ඤං කත්වා, නොගම් සංඥකොට; ගන්තබ්බං, යායුතු.

(ආ) යත්ථ කිඤ්චි ලබ්භති, තං පහාය ගන්තුං න වට්ටති. ඉමිනා ච භික්ඛුනා කාලතරං පවිසිතබ්බං. එවං හි අඵාසුකට්ඨානං පහාය අඤ්ඤත්ථ ගන්තුං සක්ඛිස්සති. සචෙ පනස්ස විහාරෙ දානං දෙන්තා වා අන්තරාමග්ගෙ ආගච්ඡන්තා වා මනුස්සා පත්තං ගණ්හිත්වා පිණ්ඩපාතං දෙන්ති වට්ටති, ඉමිනා ච මග්ගං ගච්ඡන්තෙනාපි භික්ඛාචාරවෙලායං සම්පත්තගාමං අනතික්කමිත්වා චරිතබ්බමෙව. තත්ථ අලභිත්වා වා ථොකං ලභිත්වා වා ගාමපටිපාටියා චරිතබ්බන්ති. ඉදමස්ස විධානං, පභෙදතො පන අයම්පි තිවිධො හොති:–තත්ථ උක්කට්ඨො පුරතො ආහටභික්ඛම්පි පච්ඡතො ආහටභික්ඛම්පි පටික්කමනං ආහරිත්වා දීයමානම්පි න ගණ්හාති, පත්තවාරෙ පන පත්තං විස්සජ්ජෙති. ඉමස්මිං හි ධුතඞ්ගෙ මහාකස්සපත්ථෙරෙන සදිසො නාම නත්ථි, තස්සාපි පත්තවිස්සට්ඨට්ඨානමෙව පඤ්ඤායති. මජ්ඣිමො පුරතො වා පච්ඡතො වා ආහටම්පි පටික්කමනං ආහතම්පි ගණ්හාති, පත්තවාරෙපි පත්තං විස්සජ්ජෙති, න පන භික්ඛං ආගමයමානො නිසීදති; එවං සො උක්කට්ඨපිණ්ඩපාතිකස්ස අනුලොමෙති.

---

(ආ) යත්ථ, යම්තැනෙක; කිඤ්චි ලබ්භති, කිසිවක් ලැබේ ද; තං පහාය, ඒ හැර, ගන්තුං න වට්ටති, යන්නට නොවටී; ඉමිනා ච භික්ඛුනා, මේ සපදානචාරික මහණහු විසින්; කාලතරං පවිසිතබ්බං, උදුසන්හිම වැද්දයුතු; එවං හි, මෙසේකල්හි; අඵාසුකට්ඨානං පහාය; නොවැද්දයුතුතැන් හැර; අඤ්ඤත්ථ, සෙසුතැනට; ගන්තුං, යන්නට, සක්ඛිස්සති, පොහොසත් වේ; සචෙ පන, ඉදින්; විහාරෙ, වෙහෙර; දානං දෙන්තා වා, දන්දෙන්නාවූ හෝ; අන්තරාමග්ගෙ, අතුරුමඟ; ආගච්ඡන්තා වා, එන්නාවූ හෝ; මනුස්සා, මිනිස්හු; අස්ස, මොහුගෙ; පත්තං ගණ්හිත්වා, පාත්‍රය ගෙන; පිණ්ඩපාතං දෙන්ති, අහර දෙත් නම්; වට්ටති, වටී; මග්ගං ගච්ඡන්තෙන, මඟ යන්නාවූ; ඉමිනා ච, අපි මොහුවිසින් ද; භික්ඛාචාරවෙලායං, පිඬුසිඟනවේලෙහි; සම්පත්ත ගාමං අනතික්කමිත්වා, සම්ප්‍රාප්තග්‍රාමය නො ඉක්ම; චරිතබ්බමෙව, සිඟිය යුතුමැයි; තත්ථ, එහි; අලභිත්වා වා, නොලදින් හෝ; ථොකං ලභිත්වා වා, මඳක් ලදින් හෝ; ගාමපටිපාටියා චරිතබ්බන්ති, ගම්පිළිවෙළින් සිඟියයුතුය යි; ඉදං, මේ; අස්ස, මොහුගෙ; විධානං, විධානයැ; පභෙදතො පන, ප්‍රභෙද හෙයින් වනාහි; අයම්පි, මෙද; තිවිධො හොති, තුන්වැදෑරුම් වේ; තත්ථ, ඒ තුන්දෙනා කෙරෙහි; උක්කට්ඨො, උකටතෙමෙ; පුරතො ආහටභික්ඛම්පි, පෙරටින් ගෙනා අහරද; පච්ඡතො ආහටභික්ඛම්පි, පස්සෙන් ගෙනා අහර ද; පටික්කමනං, බොජුන්හලට; ආහරිත්වා දීයමානම්පි, ගෙනහැරදෙනලද අහර ද; න ගණ්හාති, නොගනී; පත්තවාරෙ පන, හමුවූ දොර වනාහි; පත්තං විස්සජ්ජෙති, පා විසදු; ඉමස්මිං හි ධුතඞ්ගෙ, මෙ දුහඟෙහි; මහාකස්සපත්ථෙරෙන සදිසො නාම නත්ථි, මහසුප් තෙරණුවන් හා සදෘශයෝ නම් නැත; තස්සාපි, ඔවුන්ගෙ ද; පත්තවිස්සට්ඨට්ඨානං, (පෙහෙර වීථියෙහි පෙහෙර වෙස්ගෙන සිටි සක්දෙව්රජහුගෙ ගෙදොර) පා විහිදිතැන්; පඤ්ඤායති එව, පැනේමැයි;–භික්ඛං ආගමයමානො පන, භික්ෂාව බලා වනාහි; න නිසීදති, නොහිඳී; එවං, මෙසේ ඒ මැදුම්තෙමෙ; උක්කට්ඨ

මුදුකො තං දිවසං නිසීදිත්වා ආගමෙති. ඉමෙසං පන තිණ්ණම්පි ලොලුප්පචාරෙ උප්පන්නමත්තෙ ධුතඞ්ගං භිජ්ජති. අයමෙත්ථ භෙදො; අයං පනානිසංසො:–කුලෙසු නිච්චනවකතා, චන්දූපමතා, කුලමච්ඡෙරප්පහාණං, සමානුකම්පිතා, කුලූපකාදීනවාභාවො, අවහාණානාභිනන්දනා, අභිහාරෙන අනත්ථිකතා, අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති.

105 චන්දූපමො නිච්චනවො කුලෙසු අමච්ඡරී සබ්බසමානුකම්පො
කුලූපකාදීනවවිප්පමුත්තො හොතීධ භික්ඛු සපදානචාරී.
106 ලොලුප්පචාරඤ්ච පහාය තස්මා ඔක්ඛිත්තචක්ඛු යුගමත්තදස්සී
ආකඞ්ඛමානො භුවි සෙරිචාරං චරෙය්‍ය ධීරො සපදානචාරන්ති.

**අයං සපදානචාරිකඞ්ග**
**සමාදාන විධානප්පභෙදභෙදානිසංස වණ්ණනා.**

——:o:——

---

පිණ්ඩපාතිකස්ස, උක්ත පිණ්ඩපාතිකයහට; අනුලොමෙති, උහුද බලා නොහිඳිනා බැවින් අනුලොම්වේ; මුදුකො, මෘදුකතෙමෙ; තං දිවසං, එදවස්; නිසීදිත්වා, හිඳ; ආගමෙති, බලා; ඉමෙසං පන තිණ්ණම්පි, මෙ තුන්දෙනාහටම; ලොලුප්පචාරෙ උප්පන්නමත්තෙ, ලොලුප්බැවින් ගෙපිළිවෙළ ඉක්ම හැසිරීම උත්පන්නමාත්‍රයෙහිම; ධුතඞ්ගං භිජ්ජති, ධුහඟ බිඳේ; අයං, මෙතෙම; එත්ථ, මෙහි; භෙදො, භෙදය; අයං පන, මෙ වනාහි; ආනිසංසො, අනුසස්; කුලෙසු නිච්චනවකතා, (කිසි කුලෙක්හි නිබඳයෙන් නො එළඹෙන බැවින්) කුලෙහි ඇමදවස් හිම අලුත්බවය; චන්දූපමතා, හැමතැනම අලග්නමනස් ඇතිබැවිනු දු සෞම්‍ය බැවිනු දු චන්ද්‍රොපම බවය; කුලමච්ඡෙරප්පහාණං, පරිග්‍රහ චිත්තාභාවයෙන් කුලෙහි මසුරුබව පැහීමය; සමානුකම්පිතා, අවිභාගයෙන් හිත පසස්නෙන් සමවූ අනුග්‍රහ ඇතිබවය; කුලූපකාදීනවාභාවො, කුලයට එළඹීමෙන් වන සඞ්ගණහන සංසට්ඨතාදි ආදීනව නැතිබවය; අවහාණානාභිනන්දනා, නිමන්ත්‍රණයෙන් නොතුස්බවය; අභිහාරෙන, භික්ෂාව් ඇර එළවීමෙන්; අනත්ථිකතා, ප්‍රයොජන නැති බවය; අප්පිච්ඡතාදීනං, අල්පෙච්ඡතාදීන්ට; අනුලොමවුත්තිතාති, අනුලොම් පැවැතුම් ඇතිබව යි.

105. ඉධ, මෙ සස්නෙහි; සපදානචාරී භික්ඛු, සපදානචාරික මහණ තෙමෙ; කුලෙසු, කුලයෙහි; චන්දූපමො, සඳහුවැනි වූයෙ; නිච්චනවො, හැමදවස්ම අලුත්වූයෙ; කුලෙසු අමච්ඡරී, කුලයෙහි මසුරුබවක් නැත්තෙ; සබ්බසමානුකම්පො, සර්වජනයා කෙරෙහිම සමවූ අනුකම්පා ඇත්තෙ; කුලූපකාදීනවවිප්පමුත්තො, කුලයට එළඹීමෙන් වන ආදීනවයෙන් වියුක්තවූයෙ; හොති, වන්නේ යි.

106. තස්මා, එහෙයින්; ලොලුප්පචාරං පහාය, ලොල්බැවින් ගෙපිළිවෙළ ඉක්ම සිඟීම් හැර; ඔක්ඛිත්ත චක්ඛු, යටහෙළූ ඇස්ඇත්තෙ; යුගමත්තදස්සී, එහෙයින්ම යුගපමණක් බලන්නෙ; භුවි, පොළොහි; සෙරිචාරං ආකඞ්ඛමානො, සෛවරී විහාරය කැමැත්තෙ; ධීරො, ධීරතෙමෙ; සපදානචාරං චරෙය්‍ය, සපදානචාරික ධුහඟ පුරන්නේ යි.

——:o:——

(අ) **ඒකාසනිකඞ්ගම්පි** "නානාසන භොජනං පටික්ඛිපාමි, ඒකාසනිකඞ්ගං සමාදියාමී"ති ඉමෙසං අඤ්ඤතර වචනෙන සමාදින්නං හොති. තෙන පන ඒකාසනිකෙන ආසනසාලාය නිසීදන්තෙන ථෙරාසනෙ අනිසීදිත්වා ඉදං මය්හං පාපුණිස්සතීති පතිරූපං ආසනං සල්ලක්ඛෙත්වා නිසීදිතබ්බං. සචස්ස විප්පකතෙ භොජනෙ ආචරියො වා උපජ්ඣායො වා ආගච්ඡති, උට්ඨාය වත්තං කාතුං වට්ටති. තිපිටක චූළාභයත්ථෙරො පනාහ:-ආසනං වා රක්ඛෙය්‍ය භොජනං වා. අයඤ්ච විප්පකතභොජනො, තස්මා වත්තං කරොතු, භොජනම්පන මා භුඤ්ජතූති. ඉදමස්ස විධානං, පභෙදතො පන අයම්පි තිවිධො හොති. තත්‍ථ උක්කට්ඨො අප්පං වා හොතු බහුං වා, යම්හි භොජනෙ හත්ථං ඔතා

---

(අ) ඒකාසනිකඞ්ගම්පි, ඒකාසනිකාඞ්ගයද; නානාසනභොජනං, වෙන වෙන අස්නෙහි හිඳ කරන ආහාරපරිභොගය; පටික්ඛිපාමි, ප්‍රතික්ෂෙප කෙරෙමි; ඒකාසනිකඞ්ගං සමාදියාමීති, ඒකාසනිකාඞ්ගය සමාදන්වෙමි යන; ඉමෙසං, මොවුන් කෙරෙන්; අඤ්ඤතරවචනෙන, එක්තරා වචනයකින්; සමාදින්නං හොති, සමාදන්වනලද්දෙ වෙ; තෙන පන ඒකාසනිකෙන, ඒ ඒකාසනිකයා විසින්; ආසනශාලාය, අසුන්හල්හි; නිසීදන්තෙන, හිඳිනහු විසින්; ථෙරාසනෙ අනිසීදිත්වා, ථෙරාසනයෙහි නොහිඳ; ඉදං මය්හං පාපුණිස්සතීති, මෙ අස්න මට පැමිණෙන්නෙ යයි; පතිරූපං ආසනං සල්ලක්ඛෙත්වා, සුදුසු අස්නක් සලකා; (නගා නොසිටියයුතු අස්න සලකාය යුතැනී;) නිසීදිතබ්බං, හින්දයුතු; සචෙ, ඉදින්; අස්ස, මොහුගෙ; භොජනෙ විප්පකතෙ, භොජනය අඩාලවූ කල්හි; ආචරියො වා, ඇජරතෙරහුවත්; උපජ්ඣායො වා, උපාධ්‍යාය තෙරහුවත්; ආගච්ඡති, අවුනම්; උට්ඨාය, නැඟීසිට; වත්තං කාතුං වට්ටති, වත්කරන්නට වටී; (ඒ වටිනාබවම තරකරනු පිණිස මතුයෙහි ථෙරවාදය කීහු;) තිපිටක චූළාභයත්ථෙරො පන, තිපිටක චූළාභය නම් තෙරහු වනාහි; ආහ, මෙසේකීවු; ආසනං වා රක්ඛෙය්‍ය, ඒකාසනික භික්ෂූහු වළඳන්නහු ධුතාඞ්ගභෙදයෙන් හුන් හස්න හෝ රක්නෙය; (භොජන පරියොසානය වනතෙක් නැඟී නොසිටිය යුතුය යුතැනී;) භොජනං වා රක්ඛෙය්‍ය, වළඳන්නහු ධුතාඞ්ග භෙදයෙන් භොජනය හෝ රක්නෙය; (යම්තාක් වළඳන්නට පටන්නොගත්ද ඒ තාක් නැඟිසිටිය යුතුය යන අර්ථයි. යම්හෙයකින් ඒදෙකම හිමි නැත්ද එහෙයින් නැඟීසිට වත් කිරීම දූහඟ නොරක්නෙය යන අභිප්‍රායයි–'අයඤ්ච' යනාදි එහෙයින් කියත්;) අයඤ්ච, මෙද; විප්පකත භොජනො, අඩාලකළ බොජුන් ඇත්තෙය; තස්මා, එහෙයින්; වත්තං කරොතු, වත් කෙරෙවයි; භොජනම්පන, භොජනය වනාහි; මා භුඤ්ජතු, නහමක් වළඳුවා; ඉදං, මෙ; අස්ස, මොහුගෙ; විධානං, විධියි; පභෙදතො පන, ප්‍රභෙදහෙයින් වනාහි; අයම්පි, මෙද; තිවිධො හොති, තුන්වැදෑරුම් වෙ; තත්‍ථ, එහි; උක්කට්ඨො, උකට; අප්පං වා හොතු, මඳවේවයි; බහුං වා, බොහෝ වේවයි; යම්හි භොජනෙ, යම්

රෙති තතො අඤ්ඤං ගණ්හිතුං න ලභති. සචෙපි මනුස්සා ථෙරෙන න කිඤ්චි භුත්තන්ති සප්පි ආදීනි ආහරන්ති, භෙසජ්ජත්ථමෙව වට්ටන්ති න ආහාරත්ථං. මජ්ඣිමො යාව පත්තෙ භත්තං න ඛීයති තාව අඤ්ඤං ගණ්හිතුං ලභති, අයං හි භොජනපරියන්තිකො නාම හොති. මුදුකො යාව ආසනා න වුට්ඨාති තාව භුඤ්ජිතුං ලභති. සො හි උදකපරියන්තිකො වා හොති යාව පත්තධොවනං න ගණ්හාති තාව භුඤ්ජනතො, ආසනපරියන්තිකො වා යාව න වුට්ඨාති තාව භුඤ්ජනතො. ඉමෙසං පන තිණ්ණම්පි නානාසනභොජනං භුත්තක්ඛණෙ ධුතඞ්ගං භිජ්ජති. අයමෙත්ථ භෙදො. අයං පනානිසංසො :-අප්පාබාධතා, අප්පාතඞ්කතා, ලහුට්ඨානං, බලං, ඵාසුවිහාරො, අනතිරිත්තපච්චයා අනාපත්ති, රසතණ්හාවිනොදනං, අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති.

---

භොජනයෙහි; හත්ථං ඔතාරෙති, අත එරවා ද; තතො, එයින්; අඤ්ඤං ගණ්හිතුං, අතිකක් ගන්නට; න ලබති, නොලැබෙ; සචෙ, ඉදින්; මනුස්සා, මිනිස්හු; ථෙරෙන, තෙරුන් විසින්; න කිඤ්චි භුත්තන්ති, කිසිවක් නොවළඳනාලදැයි; සප්පි ආදීනි ආහරන්ති, සපීපි ආදීන් එළවත්නම්; භෙසජ්ජත්ථමෙව වට්ටන්ති, (වළඳනුවට අහරෙහි අත්එරවූ තැන පහරවා) බෙහෙත්පිණිසම වටිති; න ආහාරත්ථං, අහරපිණිස නොවටිත්; මජ්ඣිමො, මැදුම්තෙමෙ; යාව, යම්තාක්; පත්තෙ භත්තං න ඛීයති, පාහි බත් ක්‍ෂය නොවේ ද; තාව, ඒතාක්; අඤ්ඤං ගණ්හිතුං ලභති, අතිකක් ගන්නට ලැබෙ; අයං හි, මෙ තෙමෙ; භොජනපරියන්තිකො නාම හොති, (පාහි බොජුන් නිමනතෙක් ඇවිසී යමක් වළඳන බැවින්) භොජනය කෙළවරකොට ඇත්තෙ නම් වේ; මුදුකො, මෘදුකතෙමෙ; යාව ආසනා න වුට්ඨාති, යම්තාක් අස්නෙන් නොනැඟෙද; තාව, ඒතාක්; භුඤ්ජිතුං ලභති, වළඳන්නට ලබා; සො හි, හෙතෙම්; උදකපරියන්තිකො වා හොති, උදකය කෙළවරකොට ඇත්තෙහෝ වෙ; යාව පත්තධොවනං න ගණ්හාති, යම්තාක් පාදෝනා නොගනී ද; තාව භුඤ්ජනතො, ඒතාක් වළඳන බැවිනි; ආසනපරියන්තිකො වා, හුන් හස්න කෙළවරකොට ඇත්තෙ හෝ වෙ; යාව න වුට්ඨාති, යම්තාක් අස්නෙන් නොනැඟෙ ද; තාව, ඒතාක්; භුඤ්ජනතො, වළඳන හෙයිනි; ඉමෙසං පන තිණ්ණම්පි, මෙ තුන්දෙනාහටම; නානාසනභොජනං භුත්තක්ඛණෙ, නන්අස්නෙහි හිඳ යවුකැලි බොජනක් වැළඳූ කෙණෙහිම; ධුතඞ්ගං භිජ්ජති, දුහඟ බිඳෙ; අයමෙත්ථ, මේ මෙහි; භෙදො, භෙදය. අයමපන, මෙ වනාහි; ආනිසංසො, අනුසසි; අප්පාබාධතා, නිරොගිබවය; අප්පාතඞ්කතා, සිරුරුදුක් නැතිබවය; ලහුට්ඨානං, ලඝුව පවත්නාබවය; බලං, සිරුරුබලය; ඵාසුවිහාරො, සුවවිහාරය; අනතිරිත්තපච්චයා, කැප නොකළ බොජුන් පසයෙන්; අනාපත්ති, නිරැවැත; (නන්අස්නෙහි වළඳනුවහට කැපනොකළ බොජුන් වැළඳීමෙන් වන ඇවැත් එකාසනිකයහට නොවෙසි යුතැනි.) රසතණ්හා විනොදනං, රසතණ්හා දුරුකිරීමය; අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති, අපිස්බැව් ආදීන්ට අනුලොම් පැවතුම් ඇතිබව යි.

107 ඒකාසනභොජනෙ රතං න යතිං භොජනපච්චයා රුජා
විසහන්ති රසෙ අලොලුපො පරිහාපෙති න කම්මමත්තනො.

108 ඉති ඵාසුවිහාරකාරණෙ සුචිසල්ලෙඛරතූපසෙවිතෙ
ජනයෙථ විසුද්ධමානසො රතිමෙකාසනභොජනෙ සදා'ති.

**අයං ඒකාසනිකඞ්ග**
**සමාදාන විධානප්පභෙදභෙදානිසංස වණ්ණනා.**

——:o:——

(අ) **පත්තපිණ්ඩිකඞ්ගම්පි** "දුතියක භාජනං පටික්ඛිපාමි, පත්තපිණ්ඩිකඞ්ගං සමාදියාමී"ති ඉමෙසං අඤ්ඤතරවචනෙන සමාදින්නං හොති. තෙන පන පත්තපිණ්ඩිකෙන යාගුපානකාලෙ භාජනෙ ඨපෙත්වා ව්‍යඤ්ජනෙ ලද්ධෙ ව්‍යඤ්ජනං වා පඨමං ඛාදිතබ්බං, යාගු වා පාතබ්බා. සචෙ පන යාගුයං පක්ඛිපති, පූතිමච්ඡකාදිම්හි ව්‍යඤ්ජනෙ පක්ඛිත්තෙ යාගු පටිකූලා හොති අප්පටිකූලමෙව ච කත්වා භුඤ්ජිතුං වට්ටති.

---

107. ඒකාසනභොජනෙ, ඒකාසන භොජනයෙහි; රතං, ඇලුනාවූ; යතිං, මහණහු; භොජනපච්චයා, ආහාරප්‍රත්‍යයෙන් වන; රුජා, රොගයෝ; නවිසහන්ති, නොමඩිත්; රසෙ, රසයෙහි; අලොලුපො, ලොල් නොවූයේ; අත්තනො කම්මං, තමාගේ (සමථ විපස්සනා) කර්මය; න පරිහාපෙති, නොපිරිහෙලා; (බොජුන් පිරියස්නා පියෝ මනා බැවිනු ද නිරොගීවන බැවිනු දු තමා කල් නොපිරිහෙලා යුතැනී.)

108. ඉති, මෙසේ; ඵාසුවිහාරකාරණෙ, සුඛවිහාරයට කාරණවූ; සුචිසල්ලෙඛරතූපසෙවිතෙ, පිරිසුදුවූ සල්ලේගුණෙහි ඇලුනන් විසින් සෙවුනාලද; ඒකාසනභොජනෙ, ඒකාසන භොජනයෙහි; විසුද්ධමානසො, පිරිසුදු සිත් ඇත්තේ; සදා, හැමකල්හි; රතිං ජනයෙථ, ඇලුම් කරන්නේයි.

——:o:——

(අ) පත්තපිණ්ඩිකඞ්ගම්පි, පත්තපිණ්ඩිකඞ්ගය ද; දුතියකභාජනං පටික්ඛිපාමි, දෙවන භාජනය පිළිබෙව් කෙරෙමි; පත්තපිණ්ඩිකඞ්ගං සමාදියාමීති, පත්තපිණ්ඩිකඞ්ගය සමාදන්වෙමි යන; ඉමෙසං, මොවුන් කෙරෙන්; අඤ්ඤතරවචනෙන, එක්තරු වචනයෙකින්; සමාදින්නං හොති, සමාදන්වනලද්දෙ වෙ; තෙන පන පත්තපිණ්ඩිකෙන, ඒ පත්තපිණ්ඩික මහණහු විසින්; යාගුපානකාලෙ, කැඳ වළඳනකල; භාජනෙ ඨපෙත්වා ව්‍යඤ්ජනෙ ලද්ධෙ, භාජනයෙහි තබා අවුළු ලදකල; පඨමං බ්‍යඤ්ජනං වා ඛාදිතබ්බං, (හඹු නොපිළිගෙන) පළමුකොට අවුළු හෝ කෑයුතු, යාගු වා පාතබ්බා, (අවුළු ඔත් බොජුන් නොපිළිගෙන) හඹු හෝ පළමුකොට පියයුතු; සචෙ පන, ඉදින්; යාගුයං පක්ඛිපති, අවුළු හඹුයෙහි බහාලත්නම්; පූතිමච්ඡකාදිම්හි ව්‍යඤ්ජනෙ පක්ඛිත්තෙ, කුනුමස් ආදි අවුළු බහාලූකල්හි; යාගු පටිකූලා හොති, හඹු පිළිකුල්වේනම්;

තස්මා තථාරූපං ව්‍යඤ්ජනං සන්ධාය ඉදං වුත්තං. යං පන මධුසක්කරාදිකං අප්පටිකූලං හොති, තං පක්ඛිපිතබ්බං, ගණ්හන්තෙන ච පමාණයුත්තමෙව ගණ්හිතබ්බං, ආමකසාඛං හත්ථෙන ගහෙත්වා ඛාදිතුං වට්ටති. තථා පන අකත්වා පත්තෙයෙව පක්ඛිපිතබ්බං. දුතියකභාජනස්ස පන පටික්ඛිත්තත්තා අඤ්ඤං රුක්ඛපණ්ණම්පි න වට්ටතීති ඉදමස්ස විධානං.

(ඇ) පභෙදතො පන අයම්පි තිවිධො හොති:- තත්ථ උක්කට්ඨස්ස අඤ්ඤත්‍ර උච්ඡුඛාදනකාලා කචවරම්පි ඡඩ්ඩෙතුං න වට්ටති. ඔදනපිණ්ඩමච්ඡමංසපූපෙපි භින්දිත්වා ඛාදිතුං න වට්ටති. මජ්ඣිමස්ස එකෙන හත්ථෙන භින්දිත්වා ඛාදිතුං වට්ටති, හත්ථයොගී නාමෙස. මුදුකො පන පත්තයොගී නාම හොති, තස්ස යං සක්කා හොති පත්තෙ පක්ඛිපිතුං තං සබ්බං හත්ථෙන වා දන්තෙහි වා භින්දිත්වා ඛාදිතුං

---

අප්පටිකූලං කත්වා, නොපිළිකුල්කොට; භුඤ්ජිතුං වට්ටති, වළඳන්නට වටී; (පිළිකුල්දූය වැළඳුකල බඩනොසිට නැගීද යන්නේය එහෙයින් පිළිකුල් නොවනසේ වෙනවෙන වැළඳියයුතුය යුතැනී.) තස්මා, එහෙයින්; තථාරූපං බ්‍යඤ්ජනං සන්ධාය, මෙබඳු බ්‍යඤ්ජනය සඳහා; ඉදං වුත්තං, මෙ කියනලදී; (කුමක් කීනියාදයත්? යම් බ්‍යඤ්ජනයක් හඹුයෙහිලා බොනකල්හි පිළිකුල්වේද එවැනි බ්‍යඤ්ජනය සඳහා "බ්‍යඤ්ජනං වා පඨමං ඛාදිතබ්බං යාගු වා පාතබ්බා" යන මෙ කියනලද යුතැනී.) මධුසක්කරාදිකං, මධුසකීරාදීවූ; යං පන අප්පටිකූලං හොති, යම් අවුළෙක් පිළිකුල් නොවේ ද; තං, හේ; පක්ඛිපිතබ්බං, හඹුයෙහිම බහාලියයුතු; ගණ්හන්තෙන ච, පිළිගන්නහු විසිනු දු; පමාණයුත්තමෙව ගණ්හිතබ්බං, පමණ යුක්තකොටම ගතයුතු. (එකභාජනයෙහිම ගණිමියි බොහෝකොට ගෙන නොදැමියයුතුය යුතැනී.) ආමකසාඛං, (මිරිස අතු ඈ) අමුඅතු; හත්ථෙන ගහෙත්වා, අතින්ගෙන; ඛාදිතුං වට්ටති, කන්නට වටනේය; තථා පන අකත්වා, එසේ නොකොට; පත්තෙයෙව පක්ඛිපිතබ්බං, පාහිම එවියයුතු; (අත ද දෙවන භාජනයක් වැනි බැවින් සරුප් පිණිස පාහිම එවියයුතුය යුතැනී.) දුතියකභාජනස්ස පන පටික්ඛිත්තත්තා, දෙවන භාජනය පිළිබෙව්කළ බැවින්; අඤ්ඤං රුක්ඛපණ්ණම්පි න වට්ටති, අනික් රුක්පතෙකු දු නොවටි යි; ඉදං, මෙ; අස්ස, මොහුගේ; විධානං, විධියි.

(ඇ) පභෙදතො පන, ප්‍රභෙදහෙයින් වනාහි; අයම්පි, මෙද; තිවිධො හොති, තුන්වැදෑරුම් වෙ; තත්ථ, ඔවුන්කෙරෙහි; උක්කට්ඨස්ස, උකටුහට; අඤ්ඤත්‍ර උච්ඡුඛාදනකාලා, සපදැමියයුතු බැවින් උක්දඹුකන කලින් පිටත්ව; කචවරම්පි, කසළකුදු; ඡඩ්ඩෙතුං, හරනට; න වට්ටති, නොවටී; ඔදනපිණ්ඩ, බත්කැටි; මච්ඡමංසපූපෙපි, මත්ස්‍යය මාංසය අපූපය යන මෙ; භින්දිත්වා, දතින් බිඳ; ඛාදිතුං න වට්ටති, කන්නට නොවටී; මජ්ඣිමස්ස, මැදමහට; එකෙන හත්ථෙන භින්දිත්වා, එක් අතෙකින් බිඳ; ඛාදිතුං වට්ටති, කන්නට වටී; එසො, මෙතෙම; හත්ථයොගී නාම, අතින්කරනප්‍රයොග ඇතිබැවින් හත්ථයොගී නම් වෙ; මුදුකො පන, මෘදුක වනාහි; පත්තයොගී නාම, පත්තයොගී නම් වේ; තස්ස, ඒ පත්තයොගීහට; යං සක්කා හොති පත්තෙ පක්ඛිපිතුං, යමක් පාහි

වට්ටති. ඉමෙසං පන තිණ්ණම්පි දුතියකභාජනං සාදිතක්ඛණෙ ධුතඞ්ගං භිජ්ජති. අයමෙත්ථ භෙදො, අයං පනානිසංසො:–නානා රසතණ්හා විනොදනං, අත්‍රිච්ඡතාය පහානං, ආහාරෙ පයොජනමත්තදස්සිතා, ථාලකාදිපරිහරණඛෙදාභාවො, අවික්ඛිත්තභොජිතා, අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති.

109 නානාභාජනවික්ඛෙපං හිත්වා ඔක්ඛිත්තලොචනො
ඛණන්තොවිය මූලානි රසතණ්හාය සුබ්බතො.

110 සරූපං විය සන්තුට්ඨිං ධාරයන්තො සුමානසො
පරිභුඤ්ජෙය්‍ය ආහාරං කො අඤ්ඤො පත්තපිණ්ඩිකාති.

**අයං පත්තපිණ්ඩිකඞ්ග**

**සමාදාන විධානප්පභෙදභෙදානිසංස වණ්ණනා.**

—:o:—

---

බහාලනුවට පිළිවන් ද; තං සබ්බං, එ සියල්ල; හත්ථෙන වා, අතින් හෝ; දන්තෙන වා, දතින් හෝ; භින්දිත්වා ඛාදිතුං වට්ටති, බිඳ කන්නට වටී; ඉමෙසං පන තිණ්ණම්පි, මෙ තුන්දෙනහටම; දුතියකභාජනං සාදිතක්ඛණෙ, දෙවන භාජනය ඉවසූ කෙණෙහි; ධුතඞ්ගං භිජ්ජති, ධුතඟ බිඳේ; අයං, මේ; එත්ථ, මෙහි; භෙදො, භෙදය; අයං පන, මෙ වනාහි; ආනිසංසො, අනුසසි; නානා රසතණ්හා විනොදනං, නන්රස වැළඳී මෙහි තණ්හා දුරුකිරීමය; අත්‍රිච්ඡතාය පහානං, නානා භාජනගත රසෙහි ඉච්ඡා දුරුකිරීමය; ආහාරෙ, අහරෙහි; පයොජනමත්තදස්සිතා, ප්‍රයොජන මාත්‍ර දැක්මය; (තුමූසු රෙසෙහි ගිජුනොව එක්කොට වළඳනබැවින් අහරෙහි බුදුන් විසින් අනුදත් ජීවිතෙන්ද්‍රිය පවත්වන මතු ප්‍රයොජනය දක්නාබව යුතැනී.) ථාලකාදිපරිහරණඛෙදාභාවො, සක්තුලු ආදීන්ගෙ පරිහරණයෙහි ඛෙදනැතිබවය; අවික්ඛිත්තභොජිතා, නානා භාජනගතවූ ව්‍යඤ්ජනයෙහි එකභාජනගත සංඥ ඇති බැවින් අවික්ෂිප්තවූ භොජන ඇතිබවය; (තත්තදභාජනගත සංඥ ඇතිබව වැළකීම යුතැනි.) අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති, අපිස් බැව් ආදීන්ට අනුලොම්වූ පැවතුම් ඇතිබවයි.

109. නානාභාජන වික්ඛෙපං, නානා භාජනගත වික්ෂෙපය; හිත්වා, හැර; ඔක්ඛිත්තලොචනො, පත්‍රසංඥයෙන් යටහෙළූ ඇස්ඇතිව; රසතණ්හාය, රසතණ්හායෙහි; මූලානි ඛණන්තො විය, මුල් කණින්නක්හු මෙන්; සුබ්බතො, සුන්දරවූ ව්‍රත ඇතිව.

110. සරූපං සන්තුට්ඨිං ධාරයන්තො විය, සිරුරු ඇති තුෂ්ටිය දරන්නෙකු බඳුවූ;(මූර්තිමත් තුෂ්ටිය දරන්නක්හුවැනි යුතැනී.)සුමානසො, සුන්දරවූ මනස් ඇතිව; පත්තපිණ්ඩිකා අඤ්ඤො කො, පත්තපිණ්ඩිකයා මිස අන් කවරෙක්; ආහාරං පරිභුඤ්ජෙය්‍ය, අහර වළඳන්නට සමර්ථ වන්නෙද; (නානා භාජනයෙහි වික්ෂෙප දුරුකොට පාත්‍ර හුණු ඇස් ඇතිව රසතණ්හාව මුලින් උදුරන්නක්හුමෙන් සුන්දරවූ ව්‍රත ඇතිව සිරුරුමත් සන්තුෂ්ටිය දරන්නක්හුමෙන් සුන්දරවූ මනස් ඇතිව පත්තපිණ්ඩිකයා අහර වළඳනුවට සමර්ථවෙයි යුතැනී.

—:o:—

(අ) **ඛලුපච්ඡාභත්තිකඞ්ගම්පි** "අතිරිත්ත භොජනං පටික්ඛිපාමි, ඛලු පච්ඡාභත්තිකඞ්ගං සමාදියාමී"ති ඉමෙසං අඤ්ඤතරවචනෙන සමාදින්නං හොති. තෙන පන ඛලුපච්ඡාභත්තිකෙන පවාරෙත්වා පුන භොජනං කප්පියං කාරෙත්වා න භුඤ්ජිතබ්බං ඉදමස්ස විධානං; පභෙදතො පන අයම්පි තිවිධො හොති:-තත්ථ උක්කට්ඨො යස්මා පඨම පිණ්ඩෙ පවාරණා නාම නත්ථි, තස්මිං පන අජ්ඣොහරියමානෙ අඤ්ඤං පටික්ඛිපන්තො හොති, තස්මා එවං පවාරිතො පඨමපිණ්ඩං අජ්ඣොහරිත්වා දුතියපිණ්ඩං න භුඤ්ජති. මජ්ඣිමො යස්මිං භොජනෙ පවාරිතො තදෙව භුඤ්ජති. මුදුකො පන යාව ආසනා න වුට්ඨාති තාව භුඤ්ජති. ඉමෙසං පන තිණ්ණම්පි පවාරිතානං කප්පියං කාරෙත්වා භුත්තක්ඛණෙ ධුතඞ්ගං භිජ්ජති. අයමෙත්ථ භෙදො෴ අයං පනානිසංසො:-අනතිරිත්තභොජනාපත්තියා දූරීභාවො, ඕදරිකත්තාභාවො, නිරාමිස සන්නිධිතා, පුන පරියෙසනාය අභාවො, අප්පිච්ඡතාදීනං අනුලොම වුත්තිතාති෴

---

(අ) ඛලුපච්ඡාභත්තිකඞ්ගම්පි, ඛලුපච්ඡාභත්තිකඞ්ගයද; අතිරිත්තභොජනංපටික්ඛිපාමි, පැවැරිඇවැත්දක පළමුකොට වැළඳියයුතුභොජනය පිළිබෙවු කෙරෙමි; ඛලුපච්ඡාභත්තිකඞ්ගං සමාදියාමීති, ඛලුපච්ඡාභත්තිකඞ්ගය සමාදන්වෙමි යි යන; ඉමෙසං, මොවුන් කෙරෙන්; අඤ්ඤතර වචනෙන, එක්තරු වචනයෙකින්; සමාදින්නං හොති, සමාදන්වනලද් දෙ වෙ; තෙන පන ඛලුපච්ඡාභත්තිකෙන, ඒ ඛලුපච්ඡාභත්තිකයා විසින්; පවාරෙත්වා, පැවැරිඇවැද; භොජනං, භොජනය; කප්පියං කාරෙත්වා, කැපකරවා; පුන න භුඤ්ජිතබ්බං, නැවත නොවැළඳියයුතු; ඉදං, මේ; අස්ස, මොහුගෙ; විධානං, විධානය; පභෙදතො පන, ප්‍රභෙදහෙයින් වනාහි; අයම්පි, මෙද; තිවිධො හොති, තුන්වැදෑරුම් වෙ; තත්ථ, එහි; උක්කට්ඨො, උකට; යස්මා, යම්හෙයකින්; පඨම පිණ්ඩෙ පවාරණා නාම නත්ථි, පළමුවන පිඬුපැවරීමනම් නැද්ද; තස්මිං, ඒ ප්‍රථම පිණ්ඩය; අජ්ඣොහරියමානෙ, වළඳනු ලැබෙමින් සිටිකල්හි; අඤ්ඤං පටික්ඛිපන්තො, අන්බොජුනක් පිළිබෙවු කරන්නාහට; හොති, පැවැරී වෙ; තස්මා, එහෙයින්; එවං පවාරිතො, මෙසේ පැවැරි අවන් නේ; පඨමපිණ්ඩං අජ්ඣොහරිත්වා, පළමු පිඩ වළඳා; දුතියපිණ්ඩං න භුඤ්ජති, දෙවනපිඩ නොවළඳා; මජ්ඣිමො, මැදම; යස්මිං භොජනෙ පවාරිතො, යම් භොජනයක් පැවරි ඇවැත්ද; තදෙව භුඤ්ජති, ඒම වළඳා; මුදුකො, මෘදුකයා; යාව ආසනා න උට්ඨාති, යම්තාක් අස් නෙන් නොනැඟෙද; තාව භුඤ්ජති, ඒතාක් වළඳා; පවාරිතානං, පැවරි ඇවැත්; ඉමෙසං පන තිණ්ණම්පි, මෙ තුන්දෙනාහටම; කප්පියං කාරෙත්වා, කැපකරවා; භුත්තක්ඛණෙ, වැළඳූකෙණෙහි; ධුතඞ්ගං භිජ්ජති, ධුතඟ බිඳේ; අයමෙත්ථ භෙදො, මේ මෙහි භෙදය෴ අයං පන, මෙ වනාහි; ආනිසංසො, අනුසසි; අනතිරිත්ත භොජනාපත්තියා දූරීභාවො, කැපනොකළ වැළඳීමෙන් වන ඇවතින් දුරුවීමය; ඕදරි

111 පරියෙසනාය ඛෙදං න යාති න කරොති සන්නිධිං ධීරො
ඔදරිකත්තං පජහති ඛලුපච්ඡාභත්තිකො යොගී

112 තස්මා සුගතපසත්ථං සන්තොසගුණාදිවුඩ්ඪි සඤ්ජනනං
දොසෙ විධුනිතුකාමො භජෙය්‍ය යොගී ධුතඞ්ගමිදන්ති.

**අයං ඛලුපච්ඡාභත්තිකඞ්ග**
**සමාදාන විධානප්පභෙදභෙදානිසංස වණ්ණනා.**

:o:

(අ) **ආරඤ්ඤිකඞ්ගම්පි** "ගාමන්තසෙනාසනං පටික්ඛිපාමි, ආරඤ්ඤිකඞ්ගං සමාදියාමී"ති ඉමෙසං අඤ්ඤතරවචනෙන සමාදින්නං හොති. තෙන පන ආරඤ්ඤිකෙන ගාමන්තසෙනාසනං පහාය අරඤ්ඤෙ අරුණං උට්ඨාපෙතබ්බං. තත්ථ සද්ධිං උපචාරෙන ගාමො යෙව ගාමන්තසෙනාසනං. ගාමො නාම යො කොචි එකකුටිකො වා

---

කත්තාභාවො, එකපිඩෙකිනුදු යැපෙනබැවින් කුසපුරණබැව් නැති බවය; නිරාමිස සන්නිධිතා, කැපකරවා වළඳිම් යි තබන ආමිෂයක් නැතිබවය; පුන පරියෙසනාය අභාවො, නැවත අහර සෙවීමක් නැති බවය; අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති, අපිස්බැව් ආදීන්ට අනු ලොම්වූ පැවතුම් ඇතිබ්වයි.

111. ධීරො, ධීරවූ; ඛලුපච්ඡාභත්තිකො යොගී, ඛලුපච්ඡාභත්තික යොගීතෙමෙ; පරියෙසනාය ඛෙදං නයාති, පැවැරිවැද නොබොජුනා බැවින් නැවත බත්සෙවීමෙන් වන ශ්‍රමයට නොපැමිණෙ; සන්නිධිං න කරොති, ආමිෂ සන්නිධියද නොකෙරෙයි; ඔදරිකත්තං පජහති, කුස් පුරණ සුලුබවු දුරුකෙරෙයි.

112. තස්මා, එහෙයින්; සුගතප්පසත්ථං, සුගතන්හු විසින් පසස්නාලද; සන්තොසගුණාදි වුඩ්ඪිසඤ්ජනනං, සන්තොෂගුණාදීන්ගෙ වෘද්ධිය කරන්නාවූ; ඉදං ධුතඞ්ගං, මෙ ධුතාඞ්ගය; දොසෙ විධුනිතුකාමො, දොෂයන් නසනුකැමති; යොගී, යොගීතෙමෙ; භජෙය්‍ය, සෙවුනේයි.

:o:

ආරඤ්ඤිකඞ්ගම්පි, ආරඤ්ඤිකාඞ්ගයද; ගාමන්තසෙනාසනං පටික්ඛිපාමි, ග්‍රාමාන්තසෙනසුන් පිළිබෙවු කෙරෙමි; ආරඤ්ඤිකඞ්ගං සමාදියාමීති, ආරණ්‍යකාඞ්ගය සමාදන්වෙමි යන; ඉමෙසං අඤ්ඤතර වචනෙන, මොවුන් කෙරෙන් එක්තරා වචනයෙකින්; සමාදින්නං හොති, සමාදන්වනලද්දෙ වේ; තෙන පන ආරඤ්ඤිකෙන, ඒ ආරණ්‍යකයා විසින්; ගාමන්තසෙනාසනං පහාය, ග්‍රාමාන්තසෙනසුන් හැර; අරඤ්ඤෙ අරුණං උට්ඨාපෙතබ්බං, අරණ්‍යයෙහි අරුණුනැඟිය යුතු; තත්ථ, එහි; සද්ධිං උපචාරෙන, උපචාරය හා සමඟ; ගාමොයෙව ගාමන්තසෙනාසනං, ග්‍රාමයම ග්‍රාමාන්ත සෙනසුන් නම් වෙ; (ගමත් සෙනස්න ගම්හි ඇතුළත් බැවින් ගමත්සෙනසුන් නම් වෙ යුතැනී- 'යොකොචි සත්ථොපි ගාමො නාම'යි සබඳ) යොකොචි, යම්කිසි; එක කුටිකො වා, එක කුටියක් ඇතිවූද; අනෙක කුටිකො වා, බොහෝ

අනෙකකුටිකො වා සපරික්ඛිත්තො වා අපරික්ඛිත්තො වා සමනුස්සො වා අමනුස්සො වා අන්තමසො අතිරෙකචාතුමාසනිවිට්ඨො යො කොචි සත්ථොපි. ගාමූපචාරො නාම:- පරික්ඛිත්තස්ස ගාමස්ස සචෙ අනුරාධපුරස්සෙව ද්වෙ ඉන්දඛීලා හොන්ති අබ්භන්තරිමෙ ඉන්දඛීලෙ ඨිතස්ස ථාමමජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩුපාතො. තස්ස ලක්ඛණං යථා තරුණමනුස්සා අත්තනො බලං දස්සෙන්තා බාහං පසාරෙත්වා ලෙඩ්ඩුං ඛිපන්ති, එවං ඛිත්තස්ස ලෙඩ්ඩුස්ස පතනට්ඨානබ්භන්තරන්ති විනයධරා; සුත්තන්තිකා පන කාකවාරණනියාමෙන ඛිත්තස්සාති[1] වදන්ති. අපරික්ඛිත්තගාමෙ යං සබ්බපච්ඡිමස්ස ඝරස්ස ද්වාරෙ ඨිතො මාතුගාමො භාජනෙන උදකං ඡඩ්ඩෙති, තස්ස පතනට්ඨානං ඝරූපචාරො. තතො වුත්තනයෙන එකො ලෙඩ්ඩුපාතො ගාමො, දුතියො ගාමූපචාරො.

---

කුටි ඇතිවූද; සපරික්ඛිත්තො වා, වැටපවුරු ආදීන් පරික්ෂෙප සහිත වූද; අපරික්ඛිත්තො වා, පරික්ෂෙප නැතිවූද; සමනුස්සො වා, මිනිසුන් ඇතිවූද; අමනුස්සො වා, (නැවත එම්හ යන උත්සාහ විහිදම ගිය) මිනිසුන් නැතිවූද; අන්තමසො, යටත්පිරිසෙයින්; චාතුමාස නිවිට්ඨො,[2] සාරමසක් වසනලද; යො කොචි සත්ථොපි, ජඞ්ඝසත්ථය සකටසත්ථය යන යම්කිසි සාථියෙකුදු; ගාමො නාම, ගම්නම් වේ; ගාමූපචාරො නාම, ග්‍රාමොපචාර නම්; පරික්ඛිත්තස්ස ගාමස්ස, පරික්ෂෙපඇති ග්‍රාමයාගෙ; සචෙ, ඉදින්; අනුරාධපුරස්සෙව, අනුරාධපුරයාගෙ මෙන්; ද්වෙ ඉන්දඛීලා හොන්ති, එළිපත්හු දෙදෙනෙක් වෙත් නම්; අබ්භන්තරිමෙ ඉන්දඛීලෙ ඨිතස්ස, ඇතුළු එළිපත්හි සිටියාවූ; ථාම මජ්ඣිමස්ස පුරිසස්ස, බලමැදුම් පිරිමිනීහු; ලෙඩ්ඩුපාතො, ලෙඩ්ඩුපාත යෙකි; (තස්ස ලක්ඛණං වදන්ති, යි-සබඳ) ඒ ලෙඩ්ඩුපාතයාගෙ ලක්ෂණය; යථා, යම්සේ; තරුණමනුස්සා, ළදරිමිනිස්හු; අත්තනො බලං දස්සෙත්වා, තමන්ගේ බල දක්වා; බාහං පසාරෙත්වා, අතක් දිගුකොට; ලෙඩ්ඩුං ඛිපන්ති, කැටගසත්ද; එවං ඛිත්තස්ස ලෙඩ්ඩුස්ස පතනට්ඨානබ්භන්තරන්ති, එසේ ගැසූ කැටහුණුතැනින් ඇතුළයි; විනයධරා [වදන්ති], විනයධරයෝ කියති; සුත්තන්තිකා පන, සෞත්‍රාන්තිකයෝ වනාහි; කාකවාරණ නියාමෙන ඛිත්තස්සාති වදන්ති, ක්වුඩුවන් නෙරණා ක්‍රිය මින් ගැසූ කැටහුණු තැනින් ඇතුළය යෙත්; අපරික්ඛිත්ත ගාමෙ, පරික්ෂෙප නැති ගම්හි; සබ්බපච්ඡිමස්ස, හැමයෙන් කෙළවරවූ; ඝරස්ස, ගෙහි; ද්වාරෙ ඨිතො මාතුගාමො, දෙරසිටි මාගම; භාජනෙන, බඳනෙන්; යං උදකං ඡඩ්ඩෙති, යම් දියක් දමා ද; තස්ස පතනට්ඨානං, ඒ දියහුණුතැන්; ඝරූපචාරො, ගෙ උවසර නම් වෙ; තතො, එයින්, වුත්තනයෙන එකො ලෙඩ්ඩුපාතො, කී නියායෙන් එක් ලෙඩ්ඩුපාත යෙක්; ගාමො, ගම් නම් වෙ; දුතියො, දෙවන ලෙඩ්ඩුපාතය; ගාමූප චාරො, ග්‍රාමොපචාර නම් වේ.

---

1. ඛිත්තස්සාති-මු. ස.
2. අතිරෙක චාතුමාසනිවිට්ඨො-පෙළ.

(ඈ) අරඤ්ඤං පන විනයපරියායෙන තාව "**ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච සබ්බමෙතං අරඤ්ඤ**"න්ති වුත්තං, අභිධම්මපරියායෙන "**නික්ඛමිත්වා බහි ඉන්දඛීලා සබ්බමෙතං අරඤ්ඤ**"න්ති වුත්තං. ඉමස්මිං පන සුත්තන්තික පරියායෙන "**ආරඤ්ඤකං නාම සෙනාසනං පඤ්චධනු සතිකං පච්ඡිම**"න්ති ඉදං ලක්ඛණං. තං ආරොපිතෙන ආචරියධනුනා පරික්ඛිත්තස්ස ගාමස්ස ඉන්දඛීලතො අපරික්ඛිත්තස්ස පඨමලෙඩ්ඩුපාතතො පට්ඨාය යාව විහාරපරික්ඛෙපා මිනිත්වා වවත්ථපෙතබ්බං. සචෙ පන විහාරො අපරික්ඛිත්තො හොති යං සබ්බපඨමං සෙනාසනං වා භත්තසාලා වා ධුවසන්නිපාතට්ඨානං වා බොධි වා චෙතියං වා දූරෙචෙපි සෙනාසනතො හොති, තං පරිච්ඡෙදං කත්වා මිනිතබ්බන්ති විනයට්ඨකථාසු වුත්තං; මජ්ඣිමට්ඨකථායං පන විහාරස්සාපි ගාමස්සෙව උපචාරං නීහරිත්වා උභින්නං ලෙඩ්ඩුපාතානං අන්තරා මිනිතබ්බන්ති වුත්තං. ඉදමෙත්ථ පමාණං, සචෙපි ආසන්නෙ

---

(ඈ) අරඤ්ඤං පන, අරණ්‍යය වනාහි; (විනයපරියායෙ[1] වුත්තං යි යොදනු-විනයදෙසනායෙහි අයිනාදත් පරිජීයෙහි) තාව, පළමු කොට; ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච, ගමද ගම්උවසරද තබා; සබ්බමෙතං, මෙ සියල්ල; අරඤ්ඤන්ති වුත්තං, අරණ්‍යයයි කියනලදී; අභිධම්මපරියායෙ,[1] අභිධර්මදෙශනායෙහි;-(පච්ඡිමං ආරඤ්ඤිකං නාම සෙනාසනං යි යොදනු.) පශ්චිම අරණ්‍ය සෙනසුන් නම්; පඤ්චධනුසතිකං, පන්සියයක් දුනුපමණ ඇත්තේයයි; ඉදං ලක්ඛණං, මෙ ලකුණයි; ('තං වවත්ථපෙතබ්බං' යි යොදනු.) තං, ඒ ලක්ෂණය; ආරොපිතෙන, නඟනලද; ආචරියධනුනා, නවවියත් ඇජර දුන්නෙන්; පරික්ඛිත්තස්ස ගාමස්ස, පරික්ෂෙපඇති ගම; ඉන්දඛීලතො, එළිපත පටන්; අපරික්ඛිත්තස්ස, පරික්ෂෙපනැති ගම; පඨමලෙඩ්ඩුපාතතො පට්ඨාය, ප්‍රථම ලෙඩ්ඩුපාතයෙහි පටන්; (මෙතැන 'ගාමොයෙව ගාමූපචාරො'යී වෙත්.) යාව විහාරපරික්ඛෙපා, යම්තාක් විහාර පරික්ෂෙපය දක්වා; මිනිත්වා, මැනැ; වවත්ථපෙතබ්බං, නිශ්චය කටයුතු; සචෙ පන, ඉදින්; විහාරො, වෙහෙර; අපරික්ඛිත්තො හොති, පරික්ෂෙප නැත්තේ වීනම්; සබ්බපඨමං, සියල්ලටම පළමු; යං සෙනාසනං වා, යම් සෙනස්නෙක් හෝ; භත්තසාලා වා, බත්හලෙක් හෝ; ධුවසන්නිපාතට්ඨානං වා, නිති රැස්වෙන තැනෙක් හෝ; බොධි වා, බොධිය හෝ; චෙතියං වා, චෛත්‍යය හෝ; දූරෙචෙපි සෙනාසනතො හොති, සෙනස්නෙන් දුරවී නම්; තං පරිච්ඡෙදං කත්වා, ඒ හිම්කොට; මිනිතබ්බන්ති, මිනියයුතුය යි; විනයට්ඨකථාසු, වුත්තං, විනය අටුවායෙහි කියනලද; මජ්ඣිමට්ඨකථායං පන, මැදුම්සඟි අටුවායෙහි වනාහි; විහාරස්සාපි, විහාරයාගේද; ගාමස්සෙව, ග්‍රාමයාගෙ මෙන්; උපචාරං නීහරිත්වා, උපචාරය එළවා; උභින්නං ලෙඩ්ඩුපාතානං අන්තරා, උභය ලෙඩ්ඩුපාතයන්ගෙ අතුර; මිනිතබ්බන්ති, මිනියයුතුය යි; වුත්තං, කියනලදී; ඉදමෙත්ථ පමාණං, (මෙද සූත්‍රාන්තවර්ණනානුයි) මෙහි මෙම පමණයි; සචෙපි, ඉදින්;

---

1. පරියායෙන-පෙළ.

ගාමො හොති, විහාරෙ ඨිතෙහි මානුසකානං සද්දො සූය්‍යති, පබ්බත නදීආදීහි පන අන්තරිතත්තා න සක්කා උජුං ගන්තුං, යො තස්ස පකතිමග්ගො හොති සචෙපි නාවාය සඤ්චරිතබ්බො තෙන මග්ගෙන පඤ්චධනුසතිකං ගහෙතබ්බං. යො පන ආසන්නගාමස්ස අඞ්ගසම්පාදනත්ථං තතො තතො මග්ගං පිදහති, අයං ධුතඞ්ගචොරො හොති. සචෙ පන ආරඤ්ඤකස්ස භික්ඛුනො ආචරියො වා උපජ්ඣායො වා ගිලානො හොති, තෙන අරඤ්ඤෙ සප්පායං අලභන්තෙන ගාමන්තසෙනාසනං නෙත්වා උපට්ඨාතබ්බො. කාලස්සෙව පන නික්ඛමිත්වා අඞ්ගයුත්තෙ ඨානෙ අරුණං උට්ඨාපෙතබ්බං. සචෙ අරුණුට්ඨානවෙලායං තෙසං ආබාධො වඩ්ඪති, තෙසං යෙව කිච්චං කාතබ්බං, න ධුතඞ්ගසුද්ධිකෙන භවිතබ්බන්ති–ඉදමස්ස විධානං; පභෙදතො පන අයම්පි තිවිධො හොති:–තත්ථ උක්කට්ඨෙන සබ්බකාලං අරඤ්ඤෙ අරුණං උට්ඨාපෙතබ්බං.

---

ආසන්නො ගාමො හොති, ආසන්නයෙහි ගමෙක්වීනම්; විහාරෙ ඨිතෙහි, වෙහෙර සිටියවුන් විසින්;–සද්දො සූය්‍යති, ශබ්දය අසනුලැබේනම්; පබ්බත නදී ආදීහි පන, පර්වත නදී ආදීන් වනාහි; අන්තරිතත්තා, අන්තරිතහෙයින්; න සක්කා උජුං ගන්තුං, ඉදිවයන්නට නොපිළිවන්ද; තස්ස, ඒ වෙහෙරට; යො පකතිමග්ගො හොති, යම් පියවි මඟෙක්වීද; සචෙපි, ඉදින්; නාවාය සඤ්චරිතබ්බො, ඒ මඟ නැවින් යායුතුවීනම්; තෙන මග්ගෙන, ඒ මඟින්; පඤ්චධනුසතිකං, පන්සියයක් දුනුපමණ; ගහෙතබ්බං, ගතයුතු; යො පන, යමෙක් වනාහි; ආසන්නගාමස්ස, ආසන්න ග්‍රාමයාගෙ; අඞ්ගසම්පාදනත්ථං, අඞ්ගයසපයා දුනුපන්සියයක් සපයනු පිණිස; තතො තතො මග්ගං පිදහති, ඒ ඒ තැන්හි කුඩා මං හැසවාද; අයං, මෙතෙමෙ; ධුතඞ්ගචොරො හොති, දුහඟසොරනම් වෙ; සචෙ පන, ඉදින් වනාහි; ආරඤ්ඤකස්ස භික්ඛුනො, ආරණ්‍යක භික්ෂුහුගෙ; ආචරියො වා, ආචාර්‍ය්‍ය හෝ; උපජ්ඣායො වා, උපාධ්‍යාය හෝ; ගිලානො හොති, ගිලන්වූනම්; තෙන, ඒ අරණ්‍යකයා විසින්; අරඤ්ඤෙ සප්පායං අලභන්තෙන, අරණ්‍යයෙහි සැප නොලබන්නහු විසින්; ගාමන්තසෙනාසනං නෙත්වා, ග්‍රාමාන්තසෙනස්නට ගෙන ගොස්; උපට්ඨාතබ්බො, උපස්ථාන කටයුතු; කාලස්සෙව පන නික්ඛමිත්වා, කාලයෙහිම නික්ම; අඞ්ගයුත්තෙ ඨානෙ, අඞ්ගයුක්තස්ථානයෙහි; අරුණං උට්ඨාපෙතබ්බං, අරුණු නැඟියයුතු; සචෙ, ඉදින්; අරුණුට්ඨානවෙලායං, අරුණුනැඟෙන වේලෙහි; තෙසං ආබාධො වඩ්ඪති, ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන්ගෙ ආබාධය වඩීනම්; තෙසං යෙව කිච්චං කාතබ්බං, ඔවුන්ගේම කෘත්‍යයකටයුතු; න ධුතඞ්ගසුද්ධිකෙන භවිතබ්බං, දුහඟ පිරිසුදුකිරීමෙහි යුක්තවූවහු විසින් නොවියයුතු; ඉදමස්ස විධානං, මේ මෙහි විධානයි; පභෙදතො පන, ප්‍රභෙදහෙයින් වනාහි; අයම්පි, මෙද; තිවිධො හොති, තුන්වැදෑරුම් වෙ; තත්ථ, එහි; උක්කට්ඨෙන, උකටහුවිසින්; සබ්බකාලං, හැමකල්හිම; අරඤ්ඤෙ, අරණ්‍යයෙහි; අරුණං උට්ඨාපෙතබ්බං, අරුණු නැඟියයුතු.

(අ) මජ්ඣිමො චත්තාරො වස්සිකෙ මාසෙ ගාමන්තෙ වසිතුං ලභති; මුදුකො හෙමන්තිකෙපි. ඉමෙසං පන තිණ්ණම්පි යථා පරිච්ඡින්නෙ කාලෙ අරඤ්ඤතො ආගන්ත්වා ගාමන්තසෙනාසනෙ ධම්මං සුණන්තානං අරුණෙ උට්ඨිතෙපි ධුතඞ්ගං න භිජ්ජති; සුත්වා ගච්ඡන්තානං අන්තරාමග්ගෙ උට්ඨිතෙපි න භිජ්ජති; සචෙ පන උට්ඨිතෙපි ධම්මකථිකෙ මුහුත්තං නිපජ්ජිත්වා ගමිස්සාමාති නිද්දායන්තානං අරුණං උට්ඨහති, අත්තනො වා රුචියා ගාමන්තසෙනාසනෙ අරුණං උට්ඨාපෙති, ධුතඞ්ගං භිජ්ජතීති අයමෙත්ථ භෙදො.

(ආ) අයං පනානිසංසො:– ආරඤ්ඤකො භික්ඛු අරඤ්ඤසඤ්ඤං මනසිකරොන්තො භබ්බො අලද්ධං වා සමාධිං පටිලද්ධුං, ලද්ධං වා රක්ඛිතුං, සත්ථාපිස්ස අත්තමනො හොති. යථාහ:–"**තෙනාහං නාගිතස්ස භික්ඛුනො අත්තමනො හොමි අරඤ්ඤවිහාරෙනා**"ති. පන්තසෙනා

---

(අ) මජ්ඣිමො, මැදම; චත්තාරො වස්සිකෙ මාසෙ, සතරවර්ෂා මාසයෙහි; ගාමන්තෙ වසිතුං ලභති, ග්‍රාමාන්තයෙහි වසන්නට ලැබෙ; මුදුකො, මෘදුකයා; හෙමන්තිකෙපි, හිමසාරමසද (ගම්හි වසන්නට ලැබේ); ඉමෙසං පන තිණ්ණම්පි, මෙ තුන්දෙනහටම; යථා පරිච්ඡින්නෙ කාලෙ, තමතමන්ට පිරිසුන්කල්හි; (උත්කටහට තුන්ඍතුයෙහිම මැදුමහට ඍතුවයෙහිම මුදුකයහට එකඍතුයෙහිමය යුතැයි;) අරඤ්ඤතො ආගන්ත්වා, අරණ්‍යයෙන් අවුත්; ගාමන්තසෙනාසනෙ ධම්මං සුණන්තානං, ගමත් සෙනස්නෙහි බණඅසන්නන්ට; අරුණෙ උට්ඨිතෙපි, දූන අරුණු නැඟද; ධුතඞ්ගං න භිජ්ජති, සොතසාගීබැවින් ධුතඟ නොබිඳේ; සුත්වා ගච්ඡන්තානං බණ අසා යන්නවුන්ට; අන්තරාමග්ගෙ, අතුරු මඟ; උට්ඨිතෙපි, අරුණුනැඟද; න භිජ්ජති, ධුතඟ නොබිඳේ; සචෙ පන, ඉදින් වනාහි; උට්ඨිතෙපි ධම්මකථිකෙ, ධර්මකථිකයා අස්නෙන් නැගිකල්හිදු; මුහුත්තං නිපජ්ජිත්වා ගමිස්සාමාති, මොහොතක් හෙව සැතපී යම්හයි; නිද්දායන්තානං, නිදන්නන්ට; අරුණං උට්ඨහති, අරුණු නැඟීනම්; [ධුතඞ්ගං භිජ්ජති,] (සිත් ලිහිල්කළ බැවින්) ධුතඟ බිඳේ; අත්තනො වා රුචියා, තමන්ගේ රුචියෙන් හෝ; ගාමන්තසෙනාසනෙ, ගමත් සෙනස්නෙහි; අරුණං උට්ඨාපෙති, අරුණු නඟානම්; ධුතඞ්ගං භිජ්ජති, ධුතඟ බිඳේ; අයමෙත්ථ භෙදො, මේ මෙහි භේදයි.

(ආ) අයං පන, මෙ වනාහි; ආනිසංසො, අනුසස්; ආරඤ්ඤකො භික්ඛු, ආරණ්‍යක භික්ෂුතෙමෙ; අරඤ්ඤසඤ්ඤං මනසිකරොන්තො, (මම විවෙකයෙහි වෙසෙමි යි හෝ ලදකායවිවෙකය සාර්ථක කටයුතුයයි හෝ) මෙසේ අරණ්‍යසංඥා මෙනෙහිකරනුයෙ; අලද්ධං වා සමාධිං, නොලද සමාධිය; පටිලද්ධුං, ලබන්නට; ලද්ධං, ලත්සමාධිය; රක්ඛිතුං වා, රක්ෂාකරනුවට; භබ්බො, පොහොසත්වෙ; සත්ථාපිස්ස අත්තමනො හොති, ශාස්තෘද මොහට සතුටුවෙ; යථාහ, කීයේමැනු; අහං, මම; නාගිතස්ස භික්ඛුනො, නාගිතනම් මහණහට; තෙන අරඤ්ඤවිහාරෙන, ඒ අරණ්‍යවාසයෙන්; අත්තමනො හොමි, සතුටිම්; පන්තසෙනාසනවාසිනොවස්ස, ප්‍රාන්තසෙනස්නෙහි වසන්නාවූ ඔහට;

සනවාසිනොවස්ස අසප්පාය රූපාදයො චිත්තං න වික්ඛිපන්ති, විගත සන්තාසො හොති, ජීවිතනිකන්තිං ජහාති, පවිවෙකසුඛරසං අස්සාදෙති, පංසුකූලාදිභාවො වස්ස පතිරූපො හොතීති.

113 පවිවිත්තො අසංසට්ඨො පන්තසෙනාසනෙ රතො
ආරාධයන්තො නාථස්ස වනවාසෙන මානසං.

114 එකො අරඤ්ඤෙ නිවසං යං සුඛං ලභතෙ යති
රසං තස්ස න වින්දන්ති අපි දෙවා සඉන්දකා.

115 පංසුකූලං ච එසො ච කවචං විය ධාරයං
අරඤ්ඤසඞ්ගාමගතො අවසෙසධුතාවුධො.

116 සමත්ථො න චිරස්සෙව ජෙතුං මාරං සවාහිනිං
තස්මා අරඤ්ඤවාසම්හි රතිං කයිරාථ පණ්ඩිතොති.

**අයං ආරඤ්ඤිකඞ්ග**
**සමාදාන විධානප්පභෙදභෙදානිසංස වණ්ණනා.**

—:o.—

---

අසප්පාය රූපාදයො, අසරුප් රූ අරමුණු ආදීහු; චිත්තං න වික්ඛිපන්ති, සිත් වික්ෂෙප නොකෙරෙත්; විගතසන්තාසො හොති, විවෙකයෙහි පරිචය ඇතිබැවින් පහවූ ත්‍රාසඇත්තෙ වෙ; ජීවිතනිකන්තිං ජහාති, බොහෝ පරිපන්ථඇති අරණ්‍යයෙහි විසීමෙන් මරණභය දුරු වන බැවින් ජීවිතයෙහි ආලය දුරුකෙරෙ; පවිවෙකසුඛරසං අස්සාදෙති, ජනසංසර්ග නැතිබැවින් විවෙකසුවරසය අනුභවකෙරේ.—

113 පවිවිත්තො, කායවිවෙකඇත්තෙ; අසංසට්ඨො, කිසිවක්හු හා සංසර්ගයෙක් නැත්තෙ; [පන්තසෙනාසනෙ රතො, ප්‍රාන්තසෙනස්නෙහි ඇලුනෙ;] වනවාසෙන, අරණ්‍යවාසයෙන්; නාථස්ස මානසං, නාථයාගේ මානස; ආරාධයන්තො, මනාපිළිවෙතින් සතුටුකරන්නේ ]

114. එකො, අසහායවූ; යති, යතිතෙම; අරඤ්ඤෙ නිවාසං, අරණ්‍යයෙහි වසන්නේ; යං සුඛං ලභතෙ, යම්සුවයෙක් ලබාද; තස්ස, ඒ සුබයාගෙ; රසං, රසය; සඉන්දකා, ඉන්ද්‍රයාසහිතවූ; දෙවා අපි, දෙවියෝ පවා; න වින්දන්ති, නොලබත්.

115. එසො, මෙතේම; පංසුකූලං, පසුල්සිවුර; කවචං විය, කවචයක් මෙන්; ධාරයං, ධරන්නෙ; අවසෙස ධුතාවුධො, අවශිෂ්ට ධුතධර්ම නැමති ආයුධඇත්තෙ; අරඤ්ඤසඞ්ගාමගතො, අරණෙහි කෙලෙස් සඞ්ග්‍රාමයට ගියේ.

116. සවාහිනිං, වාහිනීසහිතවූ; මාරං, මරහු; ජෙතුං, දිනන්නට; න චිරස්සෙව සමත්ථො, නො බොහෝ කලකින්ම සමර්ථවෙ; තස්මා, එහෙයින්; අරඤ්ඤවාසම්හි, අරණ්‍ය වාසයෙහි; පණ්ඩිතො, නුවණැත්තෙ; රතිං කයිරාථ, ආලය කරන්නේයි.

—:o:—

**(අ) රුක්ඛමූලිකඞ්ගම්පි** "ඡන්නං පටික්ඛිපාමි රුක්ඛමූලිකඞ්ගං සමාදියාමී"ති ඉමෙසං අඤ්ඤතරවචනෙන සමාදින්නං හොති. තෙන පන රුක්ඛමූලිකෙන සීමන්තරිකරුක්ඛං චෙතියරුක්ඛං නිය්‍යාසරුක්ඛං ඵලරුක්ඛං වග්ගුලිරුක්ඛං සුසිරරුක්ඛං විහාරමජ්ඣෙ ඨිතරුක්ඛන්ති ඉමෙ රුක්ඛෙ විවජ්ජෙත්වා විහාරපච්චන්තෙ ඨිතරුක්ඛො ගහෙතබ්බොති ඉදමස්ස විධානං. පභෙදතො පන අයම්පි තිවිධො හොති:- තත්ථ උක්කට්ඨො යථාරුචිතං රුක්ඛං ගහෙත්වා පටිජග්ගාපෙතුං න ලභති, පාදෙන පණ්ණසටං අපනෙත්වා වසිතබ්බං. මජ්ඣිමො තං ඨානං සම්පත්තෙහි යෙව ජග්ගාපෙතුං ලභති. මුදුකෙන ආරාමිකසමණුද්දෙසෙ පක්කොසිත්වා සොධාපෙත්වා සමං කාරාපෙත්වා වාලිකං ඔකිරාපෙත්වා පාකාරපරික්ඛෙපං කාරාපෙත්වා ද්වාරං යොජාපෙත්වා වසිතබ්බං. මහදිවසෙ පන රුක්ඛමූලිකෙන තත්ථ අනිසීදිත්වා අඤ්ඤත්ථ

---

(අ) රුක්ඛමූලිකඞ්ගම්පි, වෘක්ෂමූලිකාඞ්ගයද; ඡන්නං, ඉෂ්ටකා ඡදනාදීන් විසින් සොයනලද ඡන්නය; (ආවසථයයි සේයි.) පටික්ඛිපාමි, පිළිකෙවු කෙරෙමි; රුක්ඛමූලිකඞ්ගං, වෘක්ෂමූලිකාඞ්ගය; සමාදියාමීති, සමාදන්වෙමි යන; ඉමෙසං, මොවුන් කෙරෙන්; අඤ්ඤතරවචනෙන, එක්තරා වචනයකින්; සමාදින්නං හොති, සමාදන්වනලද්දේ වේ; තෙන පන රුක්ඛමූලිකෙන, ඒ රුක්ඛමූලිකයා විසින්; සීමන්තරික රුක්ඛං, රාජ්‍යසීමායෙහි සිටිරුක; චෙතියරුක්ඛං, දෙවියන් වෙසෙති යි මිනිසුන් විසින් පිදියයුතු රුක; නිය්‍යාසරුක්ඛං, ලහටුගන්නා රුක; ඵලරුක්ඛං, පලගන්නා රුක; වග්ගුලිරුක්ඛං, වවුලන් වසන්නාවූ රුක; සුසිරරුක්ඛං, සිදුරුඇති රුක; විහාරමජ්ඣෙ ඨිතරුක්ඛන්ති වෙහෙරමැදසිටි රුකැයි; ඉමෙ රුක්ඛෙ විවජ්ජෙත්වා, මෙ රුක්දුරු කොට; විහාරපච්චන්තෙ ඨිතරුක්ඛො ගහෙතබ්බොති, විහාරකෙළවර සිටි රුකෙක් ගතයුතුයයි; ඉදං, මෙ; අස්ස, මොහුගෙ; විධානං, විධානය; පභෙදතො පන අයම්පි තිවිධො හොති, ප්‍රභෙදයෙහින් වනාහි මේද තුන්වැදෑරුම් වෙ; තත්ථ, එහි; උක්කට්ඨො, උකට; යථා රුචිතං රුක්ඛං ගහෙත්වා, රිසියෙන යම්රුකක් ගෙන; පටිජග්ගාපෙතුං, පිළිදගවන්නට; න ලභති, නොලැබෙ; පාදෙන, පයින්; පණ්ණසටං, වගුළ පරඬල්; අපනෙත්වා, පහකොට; වසිතබ්බං, විසියයුතු; මජ්ඣිමො, මැදුම්; තං ඨානං, එතැනට; සම්පත්තෙහි යෙව, පැමිණියවුන් ලවාම; ජග්ගාපෙතුං, දගවන්නට; ලභති, ලැබෙ; මුදුකෙන, මෘදුකයා විසින්; ආරාමිකසමණුද්දෙසෙ, ආරාමිකසාමණේරයන්; පක්කොසිත්වා, ගෙන්වාගෙන; සොධාපෙත්වා, පිරිසුදුකරවා; සමං කාරාපෙත්වා, සම කරවා; වාලිකං ඔකිරාපෙත්වා, වැලි ඔවා; පාකාර පරික්ඛෙපං කාරාපෙත්වා, ප්‍රාකාර පරික්ෂෙපකරවා; ද්වාරං යොජාපෙත්වා, දොර යොදවා; වසිතබ්බං, විසියයුතු; මහදිවසෙ පන, පුදදවස වනාහි; රුක්ඛමූලිකෙන, රුක්ඛමූලිකයා විසින්; තත්ථ අනිසීදිත්වා, ඒ රුකමුල නොහිඳ;

පටිච්ඡන්නෙ ඨානෙ නිසීදිතබ්බං, ඉමෙසං පන තිණ්ණම්පි ඡන්නෙ වාසං කප්පිතක්ඛණෙ ධුතඞ්ගං භිජ්ජති, ජානිත්වා ඡන්නෙ අරුණං උට්ඨාපිතමත්තෙති අඞ්ගුත්තරභාණකා. අයමෙත්ථ භෙදො.

(ආ) අයං පනානිසංසො:– "රුක්ඛමූලසෙනාසනං නිස්සාය පබ්බජ්ජා"ති වචනතො නිස්සයානුරූපපටිපත්තිසබ්භාවො, "අප්පානි චෙව සුලභානි ච තානි ච අනවජ්ජානීති" භගවතා සංවණ්ණිතපච්චයතා, අභිණ්හං තරුපණ්ණවිකාරදස්සනෙන අනිච්චසඤ්ඤාසමුට්ඨාපනතා, සෙනාසනමච්ඡෙරකම්මාරාමතානං අභාවො, දෙවතාහි සහවාසිතා අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති.

අඤ්ඤත්ථ, අනික් තැනක; පටිච්ඡන්නෙ ඨානෙ, රුක්ඛමූලිකබව සඟවන පිණිස මුවහ තැනක; නිසීදිතබ්බං, හින්දයුතු; ඉමෙසං පන තිණ්ණම්පි, මෙ තුන්දෙනහටම; ඡන්නෙ වාසං කප්පිතක්ඛණෙ, වසන පිණිස වැද ඡන්නයෙහි වාසයකළ කෙණෙහිම; ධුතඞ්ගං භිජ්ජති, ධුතඟ බිඳේ; ජානිත්වා ඡන්නෙ අරුණං උට්ඨාපිතමත්තෙති අඞ්ගුත්තරභාණකා, (බණ අසනු පිණිස වන්නහු ඒ කරනුම්හ ද මෙහි වෙසෙම් යි සැලකූ හොතුදු) දැන දැන අරුණුනැඟි මතුයෙහි ධුතඟබිඳෙයි අඞ්ගුත්තර භාණකයෝ කියති යන අර්ථයි;(පළමුකී ඇජරමහයෙහි නිකරුණෙහි වැදවිසුවහට විසීමෙන්ම ධුතඟ බිඳෙන්සේ කීහ. දෙවනමතයෙහි බණ අසනු කැමති ආදී කැමින්[1] වැද වසන්නහුට දැන දැන අරුණුනැඟු සඳ ධුතඟ බිඳෙනසේ කීහු. එබැවින් දෙමතයම කැමතිවනුලැබේ.) අයමෙත්ථ භෙදො, මේ මෙහි භෙදයි.

(ආ) අයං පන,මෙ වනාහි;ආනිසංසො, අනුසස්;රුක්ඛමූලසෙනාසනං නිස්සාය පබ්බජ්ජාති වචනතො, රුක්මුල්සෙනසුන් නිසා පැවිදියයි වදාළබැවින්; නිස්සයානුරූපපටිපත්තිසබ්භාවො, නිශ්‍රයට අනුරූපප්‍රතිපත්ති ඇතිබවය; අප්පානිචෙව, අල්පයහ; සුලභානි, සුලභයහයි; තානි ච, ඔහුදු; අනවජ්ජානීති, නිවරද්‍යහයි; භගවතා, භගවත්හු විසින්; සංවණ්ණිතපච්චයතා, වනලද පසයක්බවය; අභිණ්හං, එක්වන්; තරුපණ්ණවිකාරදස්සනෙන, වෘක්ෂපර්ණයන්ගෙ විකාර දැක්මෙන්ද; අනිච්චසඤ්ඤා, අනිත්‍යසංඥවන්; සමුට්ඨාපනතා, උපදවන බවය; සෙනාසනමච්ඡෙරකම්මාරාමතානං අභාවො, ආවාසමාත්සර්‍ය්‍ය නවකම්මයෙහි ඇලුනුබවය යනමොවුන්ගෙ අභාවය; දෙවතාහි සහවාසිතා, රුක්නිසා සිටි විමන්හි වසනබැවින් රුක්දෙවියන් හා සමඟ වසනබවය; අප්පිච්ඡතාදීනං, අපිස්බැව් ආදීන්ට; අනුලොමවුත්තිතාති; අනුලොම්වූපැවතුම් ඇතිබවයි.

1. බණඅසනු ආදිකැමින්-මු. ස.

117 වණ්ණිතො බුද්ධසෙට්ඨෙන නිස්සයොති ච භාසිතො
නිවාසො පවිවිත්තස්ස රුක්ඛමූලසමො කුතො.

118 ආවාසමච්ඡෙරහරෙ දෙවතා පරිපාලිතෙ
පවිවිත්තෙ වසන්තොහි රුක්ඛමූලම්හි සුබ්බතො.

119 අභිරත්තානි නීලානි පණ්ඩූනි පතිතානි ච
පස්සන්තො තරුපණ්ණානි නිච්චසඤ්ඤං පනූදති.

120 තස්මා හි බුද්ධදායජ්ජං භාවනාභිරතාලයං
විවිත්තං නාතිමඤ්ඤෙය්‍ය රුක්ඛමූලං විචක්ඛණොති.

**අයං රුක්ඛමූලිකඞ්ග**
**සමාදාන විධානප්පභෙදභෙදානිසංස වණ්ණනා.**

---:o:---

(අ) **අබ්භොකාසිකඞ්ගම්පි** "ඡන්නඤ්ච රුක්ඛමූලඤ්ච පටික්ඛිපාමි, අබ්භොකාසිකඞ්ගං සමාදියාමී"ති ඉමෙසං අඤ්ඤතරවචනෙන සමා

---

117. බුඞසෙට්ඨෙන, බුඞශ්‍රෙෂ්ඨයා විසින්; වණ්ණිතො, "අප්පානිචෙව සුලභානි" යනාදීන් පසස්නාලද; නිස්සයොති ච භාසිතො "රුක්ඛමූල සෙනාසනං නිස්සාය පබ්බජ්ජා"සි මෙසේ නිශ්‍රයසිඳු කියනලද; පවිවිත්තස්ස, විවෙකීහට; රුක්ඛමූලසමො, වෘක්ෂමූලය හා සමවූ; නිවාසො කුතො, නිවෙස්නෙක් කොහිද.

118. ආවාසමච්ඡෙරහරෙ, ආවාසමාත්සය්‍යීය දුරුකරන්නාවූ; දෙවතා පරිපාලිතෙ, දෙවියන්විසින් රක්ෂාකරනලද; පවිවිත්තෙ, විවෙකවූ; රුක්ඛමූලම්හි, රුක්මුල්හි; වසන්තො, වසන්නාවූ; සුබ්බතො, සුන්දරවූ ව්‍රතඇත්තේ.

119. අභිරත්තානි, (තරුණකල) ඉතාරත්වූද; නීලානි, මදනිල්වූද; පණ්ඩූනි, (මුහුකලකල) පඬුවන්වූද; පතිතානි ච, බිමවගුළාවූද; තරුපණ්ණානි, වෘක්ෂපර්ණයන්; පස්සන්තො, දක්නේ; නිච්චසඤ්ඤං, නිත්‍යය යන සංඥාව; පනූදති, දුරුකෙරේ.

120. තස්මා හි, එහෙයින්; බුද්ධදායජ්ජං, බුදුන්හිමිවූ; (යම්හෙයකින් ජාතිය බොධිය ධම්මචක්කප්පවත්තනය පරිනිර්වාණය යන මොහු රුක්මුල්හිමවූද එහෙයින් රුක්ඛමූලය දායාද නම්වෙයි දතයුතු.)භාවනාභිරතාලයං, භාවනායෙහි අභිරති ඇත්තනට ආලයවූ; විවිත්තං, විවෙකිවූ; රුක්ඛමූලං, රුක්මුල; විචක්ඛණො, නුවණැත්තේ; නාතිමඤ්ඤෙය්‍ය, ඉක්මෙමි යි නොසිතන්නේ යි.

---:o:---

(අ) අබ්භොකාසිකඞ්ගම්පි, අබ්භොකාසිකඞ්ගයද; ඡන්නඤ්ච, ඡන්නායද; රුක්ඛමූලඤ්ච, රුක්මූලද; පටික්ඛිපාමි, පිළිබෙවු කෙරෙමි; අබ්භොකාසිකඞ්ගං, අබ්භොකාසිකඞ්ගය; සමාදියාමීති, සමාදන්වෙමියි යන; ඉමෙසං, මොවුන්කෙරෙන්; අඤ්ඤතරවචනෙන, එක්තරා වචනයෙකින්;

දින්නං හොති. තස්ස පන අබ්භොකාසිකස්ස ධම්මසවණාය වා උපොසථත්ථාය වා උපොසථාගාරං පවිසිතුං වට්ටති. 'සචෙ පවිට්ඨස්ස දෙවො වස්සති, වස්සමානෙ අනික්ඛමිත්වා වස්සූපරමෙ නික්ඛමිතබ්බං; භොජනසාලං වා අග්ගිසාලං වා පවිසිත්වා වත්තං කාතුං, භොජනසාලාය ථෙරෙ භික්ඛූ භත්තෙන ආපුච්ඡිතුං, උද්දිසන්තෙන වා උද්දිසාපෙන්තෙන වා, ජන්තාඝරං පවිසිතුං, බහිද්ධාපනික්ඛිත්තානි මඤ්චපීඨාදීනි අන්තො පවෙසෙතුං ච වට්ටති; සචෙ මග්ගං ගච්ඡන්තෙන වුඩ්ඪතරානං පරික්ඛාරො ගහිතො හොති, දෙවෙ වස්සන්තෙ මග්ගමජ්ඣෙ ඨිතං සාලං පවිසිතුං වට්ටති; සචෙ න කිඤ්චි ගහිතං හොති; සාලාය ඨස්සාමීති වෙගෙන ගන්තුං න වට්ටති; පකතිගතියා ගන්ත්වා පවිට්ඨෙන පන යාව වස්සූපරමා ඨත්වා ගන්තබ්බන්ති ඉදමස්ස විධානං; රුක්ඛමූලිකස්සාපි එසෙව නයො.

---

සමාදින්නං හොති, සමාදන්වනලද්දෙ වෙ; (ධුතාඞ්ගසමාදානය හැම පරිද්දෙන්ම ප්‍රතියොග ප්‍රතික්‍ෂෙපයෙන් සිද්ධවනබැවින් "ජන්තාඝරං රුක්ඛමූලඤ්ච පටික්ඛිපාමි"යි යුතු. "ජන්තාඤ්ච රුක්ඛමූලඤ්ච පටික්ඛිපාමි"යි–අබ්භොකාසිකාඞ්ගය සමදන්වූවාහට "රුක්ඛමූලිකඞ්ගං පටික්ඛිපාමි"යි නොකියා "රුක්ඛමූලං පටික්ඛිපාමි"යි කීබැවින් රුක්ඛමූලිකාඞ්ගය පිරෙන්නේ වේ.) තස්ස පන අබ්භොකාසිකස්ස, ඒ අබ්භොකාසිකයාහට; ධම්මසවණාය වා, දහම්අසනුපිණිස හෝ; උපොසථත්ථාය වා, පොහොකරනු පිණිස හෝ; උපොසථාගාරං, පොහො ගෙට; පවිසිතුං වට්ටති, වදනට වටී; (ධම්මසවණාය යනුයෙන්ම දෙසන්නහු විසිනුදු පොහොදවස්ආදියෙහි අසන්නවුන් සිත්රක්නාසඳහා ඔවුන් විසින් යාචිතව ජනායට වදුත් වටි බණකියාවනාහි අබවසටම ඉයයුතු-රුක්ඛමූලිකයාහට ද මෙමනයයි.) සචෙ, ඉදින්; පවිට්ඨස්ස, උපොසථාගාරයට වන්නාහට; දෙවො වස්සති, වැසි වසීනම්; වස්සමානෙ, වසිමින්සිටි කල්හි; අනික්ඛමිත්වා, නොනික්ම; වස්සූපරමෙ; වැසිවැළකී කල්හි; නික්ඛමිතබ්බං, නික්මියයුතු; භොජනසාලං වා අග්ගිසාලං වා පවිසිත්වා, බොජුන්හලට ද ගිනිහලට ද වැද; වත්තං කාතුං, වත්කරන්නට ද; භොජනසාලාය, බොජුන්හල්හි; ථෙරෙ භික්ඛූ, ස්ථවිර භික්‍ෂූන්; භත්තෙන ආපුච්ඡිතුං, බතින් පිළිවිස්නට ද; උද්දිසන්තෙන වා, අනුන්ට කියවාදෙන්නහු විසිනුදු; උද්දිසාපෙන්තෙන වා, කියවාගන්නහු විසිනුදු; ජන්තාඝරං පවිසිතුං, ජන්තයට වදනට ද; බහි, පිටත්හි; දුන්නික්ඛිත්තානි, නොතන්හි තබනලද; මඤ්චපීඨාදීනි, හැඳපුටු ආදීන්; අන්තොපවෙසෙතුං ච, ඇතුළෙහි ලන්නට ද; වට්ටති, වටී; සචෙ, ඉදින්; මග්ගං ගච්ඡන්තෙන, මගයන්නහු විසින්; වුඩ්ඪතරානං, මහල්ලන්ගෙ; පරික්ඛාරො ගහිතො හොති, පිරිකර ගන්නාලද්දේ වීනම්;("වුඩ්ඪතරානං" යනු සරුප්පිණිස කීහු. සඟමහණුන්ගේ පිරිකරද ගත වටිමය යෙත්.) දෙවෙ වස්සන්තෙ, වැසිවස්නා කල්හි; මග්ගමජ්ඣෙඨිතං සාලං, මං මැදසිටිසාලාවට; පවිසිතුං වට්ටති, වදනට වටී; (මං මැදසිටි හල් නම් හෙළදිව මෙන් මඟින් පහනොව ඉදිවම

(අ) පභෙදතො පන අයම්පි තිවිධො හොති:- තත්‍ථ උක්කට්ඨස්ස රුක්ඛං වා පබ්බතං වා ගෙහං වා උපනිස්සාය වසිතුං න වට්ටති, අබ්භොකාසෙ යෙව චීවරකුටිං කත්වා වසිතබ්බං. මජ්ඣිමස්ස රුක්ඛපබ්බත ගෙහානි උපනිස්සාය අන්තො අපවිසිත්වා වසිතුං වට්ටති. මුදුකස්ස අච්ඡන්නමරියාදං පබ්භාරම්පි සාඛාමණ්ඩපොපි පිට්ඨපටොපි ඛෙත්තරක්ඛකාදීහි ඡඩ්ඩිතා තත්‍රට්ඨකකුටිකාපි වට්ටති. ඉමෙසං පන තිණ්ණම්පි වාසත්ථාය ඡන්නං වා රුක්ඛමූලං වා පවිට්ඨක්ඛණෙ ධුතඞ්ගං භිජ්ජති. ජානිත්වා තත්‍ථ අරුණං උට්ඨාපිතමත්තෙති අඞ්ගුත්තරභාණකා. අයමෙත්‍ථ භෙදො. අයං පනානිසංසො:- ආවාසපලිබොධුපච්ඡෙදො, ථිනමිද්ධපනූදනං, **"මිගා විය අසඞ්ගචාරිනො අනිකෙතා විහරන්ති භික්ඛවො ති"** පසංසාය අනුරූපතා, නිස්සඞ්ගතා, චාතුද්දිසතා, අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති.

---

වැද්දයුතු හලයි-"මග්ගමජ්ඣෙ සාලං ඨිතං"යි කීවද "මඤ්චපීඨාදීනං අන්තො පවෙසෙතුං වට්ටති" කී බැවිනුදු "වෙගෙන ගන්තුං න වට්ටති" යන තන්හි අනුන්ගේ පිරිකරගතහොත් . වෙගයෙන් යායුතුය යනු කියුවනබැවිනුදු මඟමැද නොසිටි හලටද අනුන්පිරිකර ගත්තහු විසින් වැද්දයුතුයයි කීවෙත්.) සචෙ, ඉදින්; න කිඤ්චිගහිතං හොති, කිසිවෙක් නොගන්නා ලදනම්; සාලායං ඨස්සාමීති, හල්හි සිටිමි යි; වෙගෙන ගන්තුං න වට්ටති, නොසරුප් බැවින් වෙගයෙන් යන්නට නොවටී; පකතිගතියා ගන්ත්වා පවිට්ඨෙන පන, පියවිගමනින් ගොස් වන්නහුවිසින් වනාහි; යාව වස්සූපරමා ඨත්වා, වැසිවළක්නා තෙක්සිට; ගන්තබ්බන්ති, යායුතුයයි; ඉදං, මෙ; අස්ස, මොහුගෙ; විධානං, විධානය; රුක්ඛමූලිකස්සාපි, රුක්මුල්හිවසනුවහටද; එසෙවනයො, මෙමනයයි.

(අ) පභෙදතො පන අයම්පි තිවිධො හොති, ප්‍රභෙද හෙයින් වනාහි මෙද ත්‍රිවිධ වෙ; තත්‍ථ, එහි; උක්කට්ඨස්ස, උකටහට; රුක්ඛං වා, රුකක් හෝ; පබ්බතං වා, පර්වතයක් හෝ; ගෙහං වා, ගෙයක් හෝ; උපනිස්සාය, නිසා; වසිතුං න වට්ටති, වසන්නට නොවටී; අබ්භොකාසෙයෙව, අබවසම; චීවරකුටිං කත්වා, සිවුරුකුටියක් කොට; වසිතබ්බං, විසියයුතු; මජ්ඣිමස්ස, මැදමහට; රුක්ඛපබ්බතගෙහානි උපනිස්සාය, රුකය පර්වතය ගෙය යන මොවුන්නිසා; අන්තො අපවිසිත්වා, (වෘක්ෂයෙහි පර්වතයෙහි හිරමුදුනෙහි සඳඡායාව පැතිරෙණ තැනට ගෙහි දිය හෙලුමෙන්) ඇතුළටනොවැද; වසිතුං වට්ටති, වසන්නට වටී; මුදුකස්ස, මෘදුකයාහට; අච්ඡන්නමරියාදං පබ්භාරම්පි, දියවදනාබැවින් අබවස්ම බඳු දියකටාර නොසුන්ලෙණද; සාඛාමණ්ඩපොපි, තුනුකොට සෙවූ කොලමඬුවද; පිට්ඨපටොපි, තලප ගැනු පටයද; ඛෙත්තරක්ඛකාදීහි ඡඩ්ඩිතා, ක්ෂෙත්‍රපාලාදීන් විසින් හරණ ලද; තත්‍රට්ඨකකුටිකාපි, එතැන්හිම සිටි කුටිද; වට්ටති, වටනේයි; ඉමෙසං පන තිණ්ණම්පි, මෙ තුන්දෙනාටම; වාසත්ථාය, වසනුපිණිස;

121 අනාගාරියභාවස්ස අනුරූපෙ අදුල්ලභෙ
තාරාමණිවිතානම්හි චන්දදීපප්පභාසිතෙ.

122 අබ්භොකාසෙ වසං භික්ඛු මිගභූතෙන චෙතසා
ථීනමිද්ධං විනොදෙත්වා භාවනාරාමතා සිතො.

123 පවිවෙකරසස්සාදං න චිරස්සෙව වින්දති
යස්මා තස්මා හි සප්පඤ්ඤො අබ්භොකාසෙ රතො සියාති.

**අයං අබ්භොකාසිකඞ්ග**
**සමාදානවිධානප්පභෙද භෙදානිසංස වණ්ණනා.**

—:o:—

ජනතං වා, ජනතායට හෝ; රුක්ඛමූලං වා, රුක්මූලට හෝ; පවිට්ඨක්ඛණෙ, වන් කෙණෙහිම; ධුතඞ්ගං භිජ්ජති, ධුතඞ්ග බිඳෙ; ඤත්වා තත්‍ථ අරුණං උට්ඨාපිතමත්තෙති, ධම්සවුන් ආදී පිණිස ජනතායට හෝ රුක් මුලට හෝ වැද හුන්නාහු දූන් අරුණුනැගෙයි දන දන අරුණුනැගු මතුයෙහි දුහඟ බිඳෙයි; අඞ්ගුත්තරභාණකා, අඞ්ගුත්තරභාණකයෝ (කියත්); අයං, මෙ; එත්‍ථ, මෙහි; භෙදො, භෙදය; අයං පන, මෙ වනාහි ආනිසංසො, අනුසසි; ආවාසපලිබොධුපච්ඡෙදෙ, ආවාස පලිබොධයා ගෙ උපච්ඡෙදය; (කිසි රුක්මුලෙක්හිදු නිවාස ඒසුබව ඇතිනුයි එහි අසඞ්ග පූර්වූ ආවාසපලිබොධය වන්නේය. අබවස්හි වනාහි නැත් මනුයි මෙහිම ආවාසපලිබොධුපච්ඡෙදය අනුසස්යයි කියනලදූයි දතයුතු.) ථීනමිද්ධපනූදනං, ථීනමිද්ධදෙදෙනාගෙ දුරුකිරීමය; අනිකෙතා, ගෙ නැතිවූ; භික්ඛවො, මහණහු; මගකාවිය, මෘගයන්මෙන්; අසඞ්ගචාරිනො, සඞ්ගයක් නැතිව හැසිරෙන්නාහු; විහරන්ති, වෙසෙත් යි කියනලද; පසංසාය, ප්‍රශංසාබවට; අනුරූපතා, නිරාලයභාවයෙන් සුදුසුබවය; නිස්සඞ්ගතා, ආවාසපරිග්‍රහයක් නැත්තෙන්ම එහි සඞ්ග යක් නැතිබවය; චාතුද්දිසතා, (එක්දිගෙක වසනතැන්නැත එදිගට කෙසේයම්හයි යන විතර්කයක්නැතිබැවින්) සතරදිගට සුදුසුබවය; අප්පිච්ඡතාදීනං, අපිස්බැබි ආදීන්ට; අනුලොමවුත්තිතාති, අනුලොම්වූ පැවතුම් ඇතිබවයි.

121. අනාගාරියභාවස්ස, අගාරික නොවනබවට; අනුරූපෙ, සුදුසුවූ; අදුල්ලභෙ, දුර්ලභනොවන; තාරාමණිවිතානම්හි, තරු නැමති බුබුළු ඇති අහස්තලම වියන්ඇති; චන්දදීපප්පභාසිතෙ, චන්ද්‍ර නැමති ප්‍රදීප යෙන් ආලොක කරන.

122. අබ්භොකාසෙ, අබවස්හි; මිගභූතෙන චෙතසා, පරිග්‍රහ නැති බැවින් මෘගයන්ට බඳුවූ සිතින්; වසං භික්ඛු, වසන මහණතෙමෙ; ථීනමිද්ධං විනොදෙත්වා, ථීනමිද්ධදෙක දුරුකොට; භාවනාරාමතා, භවුන්හි ඇලුනු බැවින්; සිතො, ආශ්‍රයකෙළේය.

123. යස්මා, යම්හෙයකින්; පවිවෙකරසස්සාදං, පවිවෙක රසාස්වාදය; න චිරස්සෙව, නොබෝකලකින්ම; වින්දති, ලැබේද; තස්මා හි, එහෙයින්; සප්පඤ්ඤො, නුවණැත්තේ; අබ්භොකාසෙ, අබවස; රතො, ඇලුනේ; සියා, වන්නේයි.

—:o:—

(අ) **සොසානිකඞ්ගම්පි** "න සුසානං පටික්ඛිපාමි, සොසානිකඞ්ගං සමාදියාමී"ති ඉමෙසං අඤ්ඤතරවචනෙන සමාදින්නං හොති. තෙන පන සොසානිකෙන මනුස්සා ගාමං නිවෙසෙන්තා ඉදං සුසානන්ති යං වවත්ථපෙන්ති, තත්ථ න වසිතබ්බං නහි මතසරීරෙ අජ්ඣාපිතෙ තං සුසානං නාම හොති ඣාපිතකාලතො පන පට්ඨාය සචෙපි ද්වාදසවස්සානි ඡඩ්ඩිතං තං සුසානමෙව, තස්මිං පන වසන්තෙන චඞ්කමමණ්ඩපාදීනි කාරෙත්වා මඤ්චපීඨං පඤ්ඤපෙත්වා පානීයං [1] උපට්ඨපෙත්වා ධම්මං වාචෙන්තෙන න වසිතබ්බං ගරුකං හි ඉදං ධුතඞ්ගං තස්මා උප්පන්න පරිස්සයවිඝාතත්ථාය සඞ්ඝත්ථෙරං වා රාජයුත්තකං වා ජානාපෙත්වා අප්පමත්තෙන වසිතබ්බං; චඞ්කමන්තෙන අඩ්ඪක්ඛිකෙන ආළාහනං ඔලොකෙන්තෙන චඞ්කමිතබ්බං. සුසානං ගච්ඡන්තෙනාපි මහාපථා

(අ) සොසානිකඞ්ගම්පි, සොසානිකාඞ්ගයද; න සුසානං පටික්ඛිපාමි, නොසොහොන් පිළිබෙවුකොරෙම්; (සොහොන් ලකුණු නැති වසන තැන්යයි සේයි;) සොසානිකඞ්ගං සමාදියාමීති, සොසානිකාඞ්ගය සමාදන්වෙමි යි යන; ඉමෙසං අඤ්ඤතර වචනෙන,මොවුන්කෙරෙන් එක්තරාවචනයෙකින්; සමාදින්නං හොති, සමාදන්වනලද්දේවෙ; තෙන පන සොසානිකෙන, ඒ සොසානිකයාවිසින් වනාහි; මනුස්සා, මිනිස්හු; ගාමං නිවෙසෙන්තා, ගමපිහිටුවා කරවා; ඉදං සුසානන්ති, මෙ තැන සොහොනයයි; යං වවත්ථපෙන්ති, යම්තැනක් නියමකෙරෙද්ද; තත්ථ, ඒ සොහොනයයි නියමකළතැන්හි; න වසිතබ්බං, නොවැසිය යුතු; මතසරීරෙ, ශවශරීය; අජ්ඣාපිතෙ, නොදවනලදකල්හි; තං එතැන; සුසානං නාම නහි හොති, සොහොනනම් නොමවේ; ඣාපිත කාලතො පන පට්ඨාය, දැවූකල වනාහි පටන්ගෙණ; සචෙපි, ඉදින්; ද්වාදසවස්සානි, දොළොස්අවුරුද්දක්; ඡඩ්ඩිතං, නොදවාහරණලද්දේවී නමුදු;තං,ඒ;සුසානමෙව,සොහොන්නම්ම වේ;තස්මිං පන වසන්තෙන, එහි වසන්නහුවිසින්; චඞ්කමමණ්ඩපාදීනි කාරෙත්වා, සක්මන්මඩුආදිය කරවා; මඤ්චපීඨං පඤ්ඤපෙත්වා, හැදපුටුපණවා; පානීයං උපට්ඨපෙත්වා, පැන්එළවා තබවා;ධම්මං වාචෙන්තෙන,බණකියන්නහුවිසින්; න වසිතබ්බං, නොවිසියයුතු;ගරුකං හි ඉදං ධුතඞ්ගං,මේ දුහඟගුරුයි; (දුකසේ පරිහරණයකටයුතුයයි සේයි.) තස්මා, එහෙයින්; උප්පන්න පරිස්සයවිඝාතත්ථාය, උපන් උපද්‍රවයන් නසනුසඳහා; සඞ්ඝත්ථෙරං වා, වසනවෙහෙර ගණතෙරුන් හෝ; රාජයුත්තකං වා, ගොචරග්‍රාමයෙහි රජුන්විසින් යුක්තවූ පුරුෂයා හෝ; ජානාපෙත්වා, තමා සොහොන්හි වසනබව දන්වා; අප්පමත්තෙන, නොපමාවූවහුවිසින්; වසිතබ්බං, විසියයුතු; චඞ්කමන්තෙන, සක්මන්කරන්නහු විසින්; අඩ්ඪක්ඛිකෙන ආළාහනං ඔලොකෙන්තෙන චඞ්කමිතබ්බං, හමුනොවූසඳ සංවෙග උපයනුපිණිස සක්මන්හි එනයනඇස්කෙළින් සොහොනබලබලා සක්මන් කටයුතු; සුසානං ගච්ඡන්තෙනාපි, සොහොනට යන්නහු

1. පරිභොජනීයං-ත්‍රි. ම.

ඔක්කම්ම උප්පථමෙගෙන ගන්තබ්බං; දිවායෙව ආරම්මණං වවත්ථපෙතබ්බං; එවං හිස්ස තං රත්තිං භයානකං න භවිස්සති. අමනුස්සා රත්තිං විරවිත්වා විරවිත්වා ආහිණ්ඩන්තාපි න කෙනචි පහරිතබ්බා; එකදිවසම්පි සුසානං අගන්තුං න වට්ටති; මජ්ඣිමයාමං සුසානෙ ඛෙපෙත්වා පච්ඡිමයාමෙ පටික්කමිතුං වට්ටතීති අඞ්ගුත්තරභාණකා; අමනුස්සානං පියං තිලපිට්ඨමාසභත්තමච්ඡමංසඛීරතෙලගුළාදිඛජ්ජභොජ්ජං න සෙවිතබ්බං. කුලගෙහං න පවිසිතබ්බන්ති ඉදමස්ස විධානං. පභෙදතො පන අයම්පි තිවිධො හොති:-තත්ථ උක්කට්ඨෙන යත්ථ ධුවඩාහධුවකුණපධුවරොදනානි අත්ථි තත්ථෙව වසිතබ්බං; මජ්ඣිමස්ස තීසු එකස්මිම්පි සතිපි වට්ටති; මුදුකස්ස වුත්තනයෙන සුසානලක්ඛණං පත්තමත්තෙ වට්ටති. ඉමෙසං පන තිණ්ණම්පි න සුසානම්හි වාසං කප්පනෙන ධුතඞ්ගං භිජ්ජති. "සුසානං අගත දිවසෙ"ති අඞ්ගුත්තරභාණකා. අයමෙත්ථ භෙදො.

---

විසිනු දු; මහාපථා ඔක්කම්ම, මහවතින් පහව; උප්පථමෙගෙන ගන්තබ්බං, තමාගෙ සොසානිකබව නොහඟවන පිණිස කුඩුමඟින් යායුතු; දිවායෙව, දහවල්ම; ආරම්මණං වවත්ථපෙතබ්බං,(මේ තුඹසය මේ රුකය යනාදීන්) අරමුණු නියමකටයුතුය; එවං හි, එසේකල්හි; අස්ස, මොහට; තං, ඒ අරමුණ; රත්තිං, රෑ; භයානකං න භවිස්සති, භයජනක නොවෙයි; අමනුස්සා, යක්හු; රත්තිං, රෑ; විරවිත්වා විරවිත්වා ආහිණ්ඩන්තාපි, හඬ හඬා ආවිදිනාහුදු; න කෙනචි පහරිතබ්බා, කැට පහණ ආදි කිසිවෙකින් ලඟ අවිදින්නාහයි නොපැහැරිය යුත්තෝ; එකදිවසම්පි, එකදවසකුදු; සුසානං අගන්තුං න වට්ටති, සොහොනට නොයන්නට නොවටී; මජ්ඣිමයාමං සුසානෙ ඛෙපෙත්වා, මැදුම්යම සොහොන්හි යවා; පච්ඡිමයාමෙ පටික්කමිතුං වට්ටතීති, පැසුම්යම්හි නවත්නට වටියි; අඞ්ගුත්තරභාණකා, අඞ්ගුත්තරභාණකයෝ (කියත්); අමනුස්සානං පියං, අමනුෂ්‍යයන්ට ප්‍රියවූ; තිලපිට්ඨ, තලසුනු;(තලමුරු වට හෝ තල හා පිටිම හෝ;) මාසභත්ත, උඳුබත්; මච්ඡමංසඛීරතෙලගුළාදිඛජ්ජභොජ්ජං, මස කිර තෙල සකුරුය යනාදී කැවුම් බීම්; න සෙවිතබ්බං, නොසෙවියයුතු; කුලගෙහං න පවිසිතබ්බන්ති, (සොහොන්දුම් නිවාසිතබැවිනුදු සොහොන් ගඳින්ම පිශාචයන්විසින් අනුබඳනාලදහෙයින්ද) කුලගෙට නොවැද්දයුතුයයි; ඉදං, මෙ; අස්ස, මොහුගෙ; විධානං, විධානයි; පභෙදතො පන, ප්‍රභෙදහෙයින් වනාහි; අයම්පි, මෙද; තිවිධො හොති; තුන්වැදෑරුම්වේ; තත්ථ, එහි; උක්කට්ඨෙන, උත්කටහුවිසින්; යත්ථ, යම්සොහොනෙක; ධුවඩාහ, දවස දවස මිනීදැවීම්; ධුවකුණප, දවස දවස කුණප; ධුවරොදනානි, දවස දවස හැඬීම්හු; අත්ථි, ඇත්තාහුද; තත්ථෙව, එහිම; වසිතබ්බං, විසියයුතු; මජ්ඣිමස්ස, මැදමහට; තීසු, ධුවඩාහාදි තුන්දෙනාකෙරෙහි; එකස්මිම්පි සතිපි, එකක්ද ඇතිකල්හිදු; වට්ටති, වටී; මුදුකස්ස, මෘදුකයහට; වුත්තනයෙන, යටකී නියෙන්ම; සුසානලක්ඛණං පත්තමත්තෙන,

(ආ) **අයං පනානිසංසො:– මරණසතිපටිලාභො, අප්පමාදවිහාරිතා, අසුභනිමිත්තාධිගමො, කාමරාගවිනොදනං, අභිණ්හං කායසභාවදස්සනං, සංවෙගබහුලතා, ආරොග්‍යමදාදිප්පහාණං, භයභෙරවසහනතා, අමනුස්සානං ගරුභාවනීයතා, අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති.**

124 සොසානිකං හි මරණානුස්සතිප්පභාවා
නිද්දාගතම්පි න ඵුසන්ති පමාදදොසා
සම්පස්සතො ච කුණපානි බහූනි තස්ස
කාමානුරාගවසගම්පි න හොති චිත්තං.

---

සොහොන්ලකුණුපැමිණි මතුයෙහි; වට්ටති, වටී; ඉමෙසං පන තිණ්ණම්පි, මෙ තුන්දෙනහටම; න සුසානම්හි වාසං කප්පෙන්ත ධුතඞ්ගං භිජ්ජති, නොසොහොන්හි වාසය කිරීමෙන් ධුතඟබිඳේ; සුසානං අගතදිවසෙති, (දහවලුදු වීනම්) සොහොනට නොගියදවස් බිඳෙයි; අඞ්ගුත්තරභාණකා, අඞ්ගුත්තරභාණකයෝ(කියත්); අයමෙත්ථ භෙදො, මේ මෙහි භෙදයි.

(ආ) අයං පන, මෙ වනාහි; ආනිසංසො, අනුසස; මරණසතිපටිලාභො, සොහොන්හි නිති ශවශරීර දැක්මෙන් මරණසිහි පිළිලැබීමය; අප්පමාද විහාරිතා, එහෙයින්ම නොපමාබවය; අසුභනිමිත්තාධිගමො, ශවශරීර දර්ශනයෙන් අසුබනිමිත් පිළිලැබීමය; කාමරාගවිනොදනං, එහෙයින්ම කාමරාගයාගෙ දුරුකිරීමය; අභිණ්හං කායසභාව දස්සනං, (බොහෝසේ සිරුරු පිළිකුල් දුගඳබව සැලකීමෙන්) එක්වන් කාය සවභාව දැක්මය; සංවෙගබහුලතා, (කායසවභාව දැක්මෙන්ද මරණසති පිළිලැබිමෙන්ද) සංවෙග බහුලබවය; ආරොග්‍යමදාදිප්පහාණං, (ව්‍යාධිත වූද ජරාජීර්ණවූ ද මළසිරුරු ඉහි පැණෙනබැවින්, ද) ආරොග්‍ය යෞවන ජීවිතමදයන්ගෙ පැහීමය; භයභෙරවසහනතා, කුඩා මහත් භය සහනබවය; (නොහොත්: භය හා භයඑළවන අරමුණු සහනබව;) අමනුස්සානං ගරුභාවනීයතා, (සංවෙගයට පැමිණියෙ නුවණින් ව්‍යායාම කෙරෙයි.) අමනුෂ්‍යයන් විසින් ගරුකොට සම්භාව්‍යකරනලද් බවය; අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති, අපිස්බැව් ආදීනට අනුලොම් පැවතුම් ඇතිබවයි.

124. සොසානිකං හි, සොසානිකමහණහු; මරණානුස්සතිප්පභාවා, මරණානුස්මෘතියෙහි ආනුභාවයෙන්; නිද්දාගතම්පි, නිදන්නහුදු; (සිහිනෙනුදු;) පමාදදොසා, ප්‍රමාදදෝෂයෝ; න ඵුසන්ති, සපර්ශ නොකෙරෙත්; බහූනි කුණපානි, බොහෝ කුණපයන්; පස්සතො, දක්නාවූ; තස්ස, ඔහුගේ; චිත්තඤ්ච, මනස ද; කාමානුරාගවසගම්පි න හොති, කාමරාග වසඟ ද නොවේ.

125 සංවෙගමෙති විපුලං න මදං උපෙති
සම්මා අථො ඝටති නිබ්බුති මෙසමානො
සොසානිකඞ්ගමිති නෙකගුණාවහත්තා
නිබ්බානනින්නහදයෙන නිසෙවිතබ්බන්ති.

**අයං සොසානිකඞ්ග**
**සමාදානවිධානප්පභෙද භෙදානිසංසවණ්ණනා.**

---:+:---

(අ) **යථාසන්ථතිකඞ්ගම්පි** "සෙනාසනලොලුප්පං පටික්ඛිපාමි, යථාසන්ථතිකඞ්ගං සමාදියාමී"ති ඉමෙසං අඤ්ඤතරවචනෙන සමාදින්නං හොති. තෙන පන යථාසන්ථතිකෙන යදස්ස සෙනාසනං ඉදං තුය්හං පාපුණාතීති ගාහිතං හොති. තෙනෙව තුට්ඨබ්බං, න අඤ්ඤං උට්ඨාපෙතබ්බං ඉදමස්ස විධානං. පභෙදතො පන අයම්පි තිවිධො හොති:- තත්‍ථ උක්කට්ඨො අත්තනො පත්තසෙනාසනං දූරෙති වා අච්චාසන්නෙති වා අමනුස්සදීඝජාතිකාදීහි උපද්දුතන්ති වා උණ්හන්ති වා සීතන්ති වා

---

125. විපුලං, මහත්වූ; සංවෙගමෙති, සංවෙගයට පැමිණෙයි; න මදං උපෙති, ආරොග්‍යාදිමදයට නොපැමිණෙයි; අථො, නැවත; නිබ්බුතිං, නිවන්; එසමානො, සොයනුයේ; සම්මා, මනාකොට; ඝටති, ව්‍යායාම කෙරේ; ඉති, මෙසේ; අනෙකගුණාවහත්තා, නොයෙක් ගුණඑළවන හෙයින්; සොසානිකඞ්ගං, සොසානිකඞ්ගය තෙමේ; නිබ්බානනින්න හදයෙන, නිවන්හි නැමුනාවූ සිතැත්තහුවිසින්; නිසෙවිතබ්බං, සෙවිය යුතු.

---:+:---

(අ) යථාසන්ථතිකඞ්ගම්පි, යථාසන්ථතිකඞ්ගයද; සෙනාසනලොලුප්පං පටික්ඛිපාමි, සෙනස්නෙහි ලොල්බව පිළිබෙවුකෙරෙමි; යථාසන්ථතිකඞ්ගං සමාදියාමීති, යථාසන්ථතිකඞ්ගය සමාදන්වෙමි යන; ඉමෙසං අඤ්ඤතරවචනෙන, මොවුන්කෙරෙන් එක්තරා වචනයෙකින්; සමාදින්නං හොති, සමාදන්වනලද්දෙවේ; තෙන පන යථාසන්ථතිකෙන, ඒ යථාසන්ථතිකයා විසින්; යං සෙනාසනං, යම් සෙනස්නෙක්; ඉදං තුය්හං පාපුණාතීති, මෙ තොපට පැමිණෙයි; අස්ස (අනෙන) ගාහිතං හොති, මොහු විසින් ගන්වනුලැබේද; තෙනෙව තුට්ඨබ්බං, එයින්ම සතුටුවියයුතු; න අඤ්ඤං උට්ඨාපෙතබ්බං; අනිකෙක් නොනැගිටවිය යුතු; ඉදමස්ස විධානං, මේ මෙහි විධානයි; පභෙදතො පන, ප්‍රභෙද හෙයින් වනාහි; අයම්පි, මෙද; තිවිධො හොති, තුන්වැදෑරුම්වේ; තත්‍ථ, එහි; උක්කට්ඨො, උකටතෙමේ; අත්තනො පත්තසෙනාසනං, තමහට පැමිණි සෙනස්න; දූරෙති වා; දුරුකෙළවර යයි කියාද; අච්චාසන්නෙති වා බොහෝදෙනා රැස්වන ළඟයයි කියාද; අමනුස්සදීඝජාතිකාදීහි, යක්දික්දෑ ආදීන් විසින්; උපද්දුතන්ති වා; උපද්‍රව ඇත්තේයයි කියාද; උණ්හන්ති වා, හුණුයයි කියාද;සීතන්ති වා, සිසිල්ය යි

පුච්ඡිතුං න ලභති; මජ්ඣිමො පුච්ඡිතුං ලභති; ගන්ත්වා පන ඔලොකෙතුං න ලභති; මුදුකො ගන්ත්වා ඔලොකෙත්වා සචස්ස තං න රුච්චති අඤ්ඤං ගහෙතුං ලභති. ඉමෙසං පන තිණ්ණම්පි සෙනාසනලොලුප්පෙ උප්පන්නමත්තෙ ධුතඞ්ගං භිජ්ජතීති අයමෙත්ථ භෙදො. අයං පනානිසංසො:— **"යං ලද්ධං තෙන සන්තුට්ඨන්ති[1]"** වුත්තොවාදකරණං, සබ්‍රහ්මචාරීනං හිතෙසිතා, හීනප්පණීතවිකප්පපරිච්චාගො, අනුරොධවිරොධප්පහානං, අත්‍රිච්ඡතාය ද්වාරපිදහනං, අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති.

126 යං ලද්ධං තෙන සන්තුට්ඨො යථාසන්ථතිකො යති
නිබ්බිකප්පො සුඛං සෙති තිණසන්ථරකෙසුපි.

---

කියා ද; පුච්ඡිතුං, පිළිවිස්නට; න ලභති, නොලැබේ; (පිළිවිස්මෙනු දු දුහඟ කෙලෙසන බැවින්.) මජ්ඣිමො, මැදුම්තෙමේ; පුච්ඡිතුං ලභති, පිළිවිස්නට ලැබේ; ගන්ත්වා පන ඔලොකෙතුං න ලභති, (මනාවුව ගණිමි යි නොමනාවුව නොගණිමි යි සිතා) ගොස් බලන්නට නො ලැබේ; මුදුකො, මෘදුකයා; ගන්ත්වා, ගොස්; ඔලොකෙත්වා, බලා; සචෙ, ඉදින්; අස්ස, ඔහට; තං, හේ; න රුච්චති, අප්‍රාසුබැවින් නොරිසිනම්; අඤ්ඤං ගහෙතුං ලභති, අනික් සෙනසුනක් ගන්නට ලැබේ; ඉමෙසං පන තිණ්ණම්පි, මේ තුන්දෙනහටම; සෙනාසනලොලුප්පෙ උප්පන්නමත්තෙ, (තමහට පැමිණි සෙනස්න නොගෙන අසුවල්දහර මහණහු වසන සෙනස්න දෙවයි ද අසුවල් සෙනස්න දෙවයි ද විඥැප්තියට පමුණුවා) සෙනසුන් ලොල්බැවූ උපන් කෙණෙහිම; ධුතඞ්ගං භිජ්ජතීති, දුහඟ බිඳෙයි; අයං, මේ; එත්ථ භෙදො, මෙහි භෙදයි. අයං පනානිසංසො, මේ වනාහි අනුසස්; යං ලද්ධං තෙන සන්තුට්ඨන්ති වුත්තොවාදකරණං, යමෙක් ලබන ලදද එයින්ම සතුටුවියයුතුයයි කියනලද අවවාද කිරීමය; සබ්‍රහ්මචාරීනං හිතෙසිතා, (නැගියයුත්තනු දු නො නැඟෙන බැවින්) සබ්‍රම්සරණට හිත පසස්නා බවය; (එයින් කරුණා විහාරයට අනුකූල බවය;) හීනප්පණීතවිකප්පපරිච්චාගො, සුන්දරාසුන්දරවිභාගය නොකරන බැවින් හීනප්‍රණීතවිකල්පය දුරුකිරීමය; (එයින් තාදිගුණයට අනුකූලබවය;) අනුරොධවිරොධප්පහානං, එහෙයින් අනුරොධවිරොධයන් පැහීමය; අත්‍රිච්ඡතාය ද්වාරපිදහනං, අත්‍රිච්ඡභාවයට අවකාශාදානයෙන් දොරපිමය; අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති, අපිස්බැව් ආදීන්ට අනුලොම්වූ පැවතුම් ඇති බවයි.

126. යං ලද්ධං, යමෙක් ලබනලද ද; තෙන සන්තුට්ඨො, එයින් සතුටුවූ; යථාසන්ථතිකො යති, යථාසන්ථතිකමහණ; නිබ්බිකප්පො, විකල්පයක්නැතුව; තිණසන්ථරකෙසුපි, තණඇතිරියෙහි දු; සුඛං සෙති, සුවසේ හොවී.

---

1. තුට්ඨබ්බං - ත්‍රි. මු.

127 න සො රජ්ජති සෙට්ඨම්හි හීනං ලද්ධා න කුප්පති
සබ්‍රහ්මචාරී නවකෙ හිතෙන අනුකම්පති.

128 තස්මාරියසතාචිණ්ණං මුනිපුඞ්ගවවණ්ණිතං
අනුයුඤ්ජෙථ මෙධාවී යථාසන්ථතරමතනාති.

**අයං යථාසන්ථතිකඞ්ග**
**සමාදාන විධානප්පභෙද භෙදානිසංස වණ්ණනා.**

——ඃ+ඃ——

(අ) **නෙසජ්ජිකඞ්ගම්පි** "සෙය්‍යං පටික්ඛිපාමි, නෙසජ්ජිකඞ්ගං සමාදියාමී"ති ඉමෙසං අඤ්ඤතරවචනෙන සමාදින්නං හොති. තෙන පන නෙසජ්ජිකෙන රත්තියා තීසු යාමෙසු එකං යාමං උට්ඨාය චඞ්කමිතබ්බං. ඉරියාපථෙසු හි නිපජ්ජිතුමෙව න වට්ටති ඉදමස්ස විධානං, පභෙදතො පන අයම්පි තිවිධො හොති: – තත්‍ථ උක්කට්ඨස්ස නෙව අපස්සෙනං, න දුස්සපල්ලත්ථිකා, න අයොගපට්ටො වට්ටති; මජ්ඣිමස්ස ඉමෙසු තීසු

---

**127.** සෙට්ඨම්හි, උතුම්සෙනස්නෙහි; සො, හෙතෙමෙ; න රජ්ජති, රාග නොකෙරෙයි; හීනං ලද්ධා න කුප්පති, නපුරු සෙනසුන් ලදින් නොකිපේ; සබ්‍රහ්මචාරී නවකෙ හිතෙන අනුකම්පති, දහර මහණුන් නොනගනබැවින් නවකසබ්‍රම්සරණට හිත පසස්නා බැවින් අනුකම්පාකෙරෙයි.

**128.** තස්මා, එහෙයින්; අරියසතාචිණ්ණං, නොයෙක් අරීන් විසින් පුරුදුකරනලද; මුනිපුඞ්ගවවණ්ණිතං, තථාගතයන් විසින් පසස්නා ලද; මෙධාවී, නුවණැත්තෙ; යථාසන්ථතරමත්තං, යථාසන්ථතයෙහි ඇලුනු බැව්හි; අනුයුඤ්ජෙථ, යෙදෙන්නේයී.

——ඃ+ඃ——

(අ) නෙසජ්ජිකඞ්ගම්පි, නෙසජ්ජිකඞ්ගයද; සෙය්‍යං පටික්ඛිපාමි, ඊර්‍ය්‍යාපථ ලක්ෂණවූ ශය්‍යාව පිළිබෙවුකෙරෙමි; (ඊර්‍ය්‍යාපථ ශය්‍යාව පිළිබෙවු කිරීමෙන්ම තදඞ්ගවූ මඤ්චය භිසිය යනාදිවූ ශය්‍යාවෝද පිළිබෙවු කරන ලදහුවෝම වෙත්;) නෙසජ්ජිකඞ්ගං සමාදියාමීති, නෙසජ්ජිකඞ්ගය සමාදන්වෙමි යන; ඉමෙසං අඤ්ඤතරවචනෙන, මොවුන් කෙරෙන් එක්තරු වචනයෙකින්; සමාදින්නං හොති, සමාදන්වන ලද්දෙ වේ; තෙන පන නෙසජ්ජිකෙන, ඒ නෙසජ්ජිකයාවිසින්; රත්තියා තීසු යාමෙසු, රාත්‍රියෙහි තුන්යම්හි; එකං යාමං, එක්යමක්; උට්ඨාය චඞ්කමිතබ්බං, නැඟීසිට සක්මන්කටයුතු; (නෙසජ්ජිකයෙම් සියලු රෑ නොහින්දයුතු.) ඉරියාපථෙසු හි, ඊර්‍ය්‍යාපථයන්කෙරෙහි; නිපජ්ජිතුමෙව න වට්ටති, හෝනටම නොවටී; ඉදං, මෙ; අස්ස, මොහුගෙ; විධානං, විධානයි; පභෙදතො පන, ප්‍රභෙදහෙයින් වනාහි; අයම්පි තිවිධො හොති, මෙද තුන්වැදෑරුම්වෙ; තත්‍ථ, එහි; උක්කට්ඨස්ස, උකටහට; නෙව අපස්සෙනං [වට්ටති], පිටාවුව නොදවටී; න දුස්සපල්ලත්ථිකා, සිවුරෙන් අකවටු නොදවටී; න අයොගපට්ටො වට්ටති, අයොගපට්ටය නොදවටී; මජ්ඣිමස්ස [පන], මැදමහට වනාහි; ඉමෙසු

යං කිඤ්චි වට්ටති; මුදුකස්ස අපස්සෙනම්පි දුස්සපල්ලත්ථිකාපි අයොගපට්ටොපි බිම්බොහනම්පි පඤ්චඞ්ගොපි සත්තඞ්ගොපි වට්ටති; පඤ්චඞ්ගො නාම, පිට්ඨිඅපස්සයෙන සද්ධිං කතො, සත්තඞ්ගො නාම පිට්ඨි අපස්සයෙන ච උභතො පස්සෙසු අපස්සයෙහි ච සද්ධිං කතො, තං කිර පීළාහය[1] ත්ථෙරස්ස අකංසු, ථෙරො අනාගාමී හුත්වා පරිනිබ්බායි. ඉමෙසං පන තිණ්ණම්පි සෙය්‍යං කප්පිතමත්තෙව ධුතඞ්ගං භිජ්ජති. අයමෙත්ථ භෙදො. අයං පනානිසංසො:— **"සෙය්‍යසුඛං පස්සසුඛං[2] මිද්ධසුඛං අනුයුත්තො විහරතී"**ති වුත්තස්ස චෙතසො විනිබන්ධස්ස උපච්ඡෙදනං, සබ්බකම්මට්ඨානානුයොගසප්පායතා, පාසාදික ඉරියාපථතා, විරියාරම්භානුකූලතා, සම්මාපටිපත්තියා අනුබ්‍රෑහනාති[3].

---

තීසු, මෙ තුන්දෙනා කෙරෙහි; යං කිඤ්චි වට්ටති, යම් කිසිවෙක් වටී; මුදුකස්ස, මෘදුකයහට; අපස්සෙනම්පි, පිටාවුව ද; දුස්සපල්ලත්ථිකාපි, සිවුරෙන් අකාවටු ද; අයොගපට්ටොපි, අයොගපටය ද; බිම්බොහනම්පි, බිම්බොහනය ද (කන්වයිනුදු); පඤ්චඞ්ගොපි, පඤ්චාඞ්ගය ද; සත්තඞ්ගොපි, සප්තාඞ්ගය ද; වට්ටති, වටී; පඤ්චඞ්ගො නාම, පඤ්චාඞ්ගය නම්; පිට්ඨි අපස්සයෙන සද්ධිං කතො, පිට අපස්සය හා සමග කෙළේයි; (හෙය සතරපයින් හා පිට්ඨිඅපස්සයෙන් හා යුත් බැවින් පඤ්චාඞ්ග නම් වී;) සත්තඞ්ගො නාම, සප්තාඞ්ගය නම්; පිට්ඨි අපස්සයෙන ච, පිට්ඨිඅපස්සයින් ද; උභතො පස්සෙසු අපස්සයෙහි ච සද්ධිං කතො, දෑලයෙහි අපස්සය දෙකය යනමෙයින් කෙළේයි; (හෙ සතරපයින් හා අපස්සය තුණින් හා යුක්තහෙයින් සප්තාඞ්ග නම් වේ- දෙපස්හිද පිටින්ද සුවසේ වැතිර හිඳිනා නෙසජ්ජිකයා හා අනෙසජ්ජිකයාගෙ වෙනස්කිම යනුවනට "තං කිර පීළාහයත්ථෙරස්ස අකංසු" යුනු.) හේ සප්තාඞ්ග පීළාහය තෙරුන්ට කොළහ; ථෙරො අනාගාමී හුත්වා පරිනිබ්බායි, තෙරහු එහි හිඳ අනගැමිව පිරිනිවියෝ; ඉමෙසං පන තිණ්ණම්පි, මෙ තුන්දෙනහටම; සෙය්‍යං කප්පිතමත්තෙන, ශය්‍යාව කළ මතුයෙහි; ධුතඞ්ගං භිජ්ජති, ධුතඟබිඳේ; අයමෙත්ථ භෙදො, මේ මෙහි භෙදයි. අයං පන, මෙ වනාහි; ආනිසංසො, අනුසසි; සෙය්‍යසුඛං, හෙවීමෙන් වන සුවෙහි; පස්සසුඛං ඇලයෙන් ඇලයට පෙරළී පෙරළී නිදන්නහුට වන පාර්ශ්වසුඛයෙහි, මිද්ධසුඛං, මිද්ධසුවෙහි; අනුයුත්තො විහරතීති, යෙදී වෙසෙයි; වුත්තස්ස, කියනලද; චෙතසො විනිබන්ධස්ස, චෙතොවිනිබන්ධයාගෙ; උපච්ඡෙදනං, උපච්ඡෙදනය කරන්නේය; සබ්බකම්මට්ඨානානුයොගසප්පායතා, නිෂද්‍යාව අලීන අනුද්ධතපාක්ෂික බැවින් සියලු කමටහන යෙදීමට සැප බවය; පාසාදික ඉරියාපථතා, එහෙයින්ම ප්‍රසාදකර ඉරියවුවක් බවය; විරියාරම්භානුකූලතා, වීර්‍ය්‍යසමථානුයොගයට සුදුසු බැවින් වීර්‍ය්‍යාරම්භයට අනුකූල බවය; සම්මාපටිපත්තියා අනුබ්‍රෑහණාති, එහෙයින්ම සම්‍යක්ප්‍රතිපත්තියගේ වැඩීමකැයි.

---

1. පීළකාභය-මූ. ස. මීළතාභය-ත්‍රි. මූ. 2. එස්සසුඛං-ත්‍රි. මූ. 3. සමූපබ්‍රෑහණාති-මූ. ස.

129 ආභුජිත්වාන පල්ලඞ්කං පණිධාය උජුං තනුං
නිසීදන්තො විකම්පෙති මාරස්ස හදයං යති.
130 සෙය්‍යසුඛං මිද්ධසුඛං හිත්වා ආරද්ධවීරියො
නිසජ්ජාභිරතො භික්ඛු සොභයන්තො තපොවනං.
131 නිරාමිසං පීතිසුඛං යස්මා සමධිගච්ඡති
තස්මා සමනුයුඤ්ජෙය්‍ය ධීරො නෙසජ්ජිකං වතන්ති.

**අයං පන නෙසජ්ජිකඞ්ග**
**සමාදාන විධානප්පභෙද භෙදානිසංස වණ්ණනා.**

———:+:———

ඉදානි:—
132 කුසලත්තිකතො චෙව ධුතාදීනං විභාගතො
සමාසව්‍යාසතො වාපි විඤ්ඤාතබ්බො විනිච්ඡයොති.

(අ) ඉමිස්සා ගාථාය වසෙන වණ්ණනා හොති, තත්ථ **කුසලත්තිකතොති**; සබ්බානෙව හි ධුතඞ්ගානි සෙක්ඛපුථුජ්ජනඛීණාසවානං වසෙන සියා කුසලානි; සියා අබ්‍යාකතානි; නත්ථි ධුතඞ්ගං අකුසලන්ති යො පන

---

**129.** පල්ලඞ්කං ආභුජිත්වාන, පලඟබැඳ; තනුං, සිරුර; උජුං පණිධාය, සෘජුකොට පිහිටුවා; නිසීදන්තො, හිඳුනාවූ; යති, මහණ තෙමෙ; මාරස්ස හදයං, මරහු හෘදය; විකම්පෙති, කම්පාකෙරේ; (මරහුගෙ ඉච්ඡාවිඝාතය කෙරේ.)

**130.** නිසජ්ජාභිරතො, නිෂද්‍යාවෙහි ඇලුනාවූ; භික්ඛු, මහණ තෙමෙ; සෙය්‍ය සුඛං, ශය්‍යාසුවය; මිද්ධසුඛං මිද්ධිසුවය; හිත්වා, හැර; ආරද්ධවීරියො, ආරබ්ධවීර්‍ය්‍යී ඇත්තෙ; තපොවනං සොභයන්තො, තපොවනය හොබවමින්.

131. යස්මා, යම්හෙයෙකින්; නිරාමිසං, ලොකාමිස රහිතවූ; පීතිසුඛං, ප්‍රීතිසුවයට; සමධිගච්ඡති, පැමිණේද; තස්මා, එහෙයින්; ධීරො, නුවණැත්තෙ; නෙසජ්ජිකං වතං, නෙසජ්ජික දුහඟ; සමනුයුඤ්ජෙය්‍ය, මනාකොට යෙදෙන්නේයි.

අයං, මෙ; නෙසජ්ජිකඞ්ග සමාදානවිධානප්පභෙදභෙදානිසංස වණ්ණනා, නෛෂද්‍යකාඞ්ගයෙහි සමාදානය විධානය ප්‍රභෙදය ආනිසංසය යන මොවුන්ගෙ වර්ණනායි.

———:+:———

ඉදානි, දැන්;

**132.** කුසලත්තිකතො...පෙ...විඤ්ඤාතබ්බො විනිච්ඡයො...

**(අ)** ඉමිස්සා ගාථාය වසෙන, මේ ගාථාවගේ වශයෙන්; වණ්ණනා හොති, වර්ණනාව වේ; තත්ථ, ඒ ගාථාවෙහි; කුසලත්තිකතො, යන්නෙහි; සබ්බානෙව ධුතඞ්ගානි, සියලුධුතාඞ්ගයෝම; සෙක්ඛපුථුජ්ජන ඛීණාසවානං වසෙන, ශෛක්‍ෂ පෘථග්ජනක්‍ෂීණාශ්‍රවයන්ගෙ වශයෙන්; සියා කුසලානි, කුසලදු වෙති; සියා අබ්‍යාකතානි, අව්‍යාකෘතදු වෙත්; ("සෙක්ඛපුථුජ්ජනානං වසෙන සියා කුසලානි, ඛීණාසවානං වසෙන සියා අබ්‍යාකතානි" යි යොදනු-ඉහි ශෛක්‍ෂපෘථග්ජනයෝ ප්‍රතිපත්ති පූරනුපිණිසද ක්‍ෂීණාශ්‍රවයෝ සුඛවිහාරපිණිසද ධුතාඞ්ගපරිහරණය කෙරෙත්.)

වදෙය්‍ය :- "පාපිච්ඡො ඉච්ඡාපකතො ආරඤ්ඤකො හොති"ති ආදි වචනතො අකුසලම්පි ධුතඞ්ගන්ති, සො වත්තබ්බො න මයං අකුසල චිත්තෙන අරඤ්ඤෙ න වසතීති වදාම; යස්ස හි අරඤ්ඤෙ නිවාසො සො ආරඤ්ඤකො; සො ච පාපිච්ඡො වා හවෙය්‍ය අප්පිච්ඡො වා, ඉමානි පන තෙන තෙන සමාදානෙන ධුතකිලෙසත්තා ධුතස්ස භික්ඛුනො අඞ්ගානි කිලෙසධුනනතො වා ධුතන්ති ලද්ධ වොහාරං ඤාණං අඞ්ග මෙතෙසන්ති ධුතඞ්ගානි; අථ වා ධුතානි ච තානි පටිපක්ඛනිද්ධුනනතො අඞ්ගානි ච පටිපත්තියාතිපි ධුතඞ්ගානීති වුත්තං,

(අ) න ච අකුසලේන කොචි ධුතො නාම හොති, යස්සේතානි අඞ්ගානි හවෙය්‍යුං න චා අකුසලං කිඤ්චි ධුනාති යෙසං තං අඞ්ගන්ති කත්වා ධුතඞ්ගානීති වුච්චෙය්‍යුං, නාපි අකුසලං චීවරලොලුප්පාදීනිචෙව ධුනාති පටිපත්තියා ච අඞ්ගං හොති, තස්මා සුවුත්තමිදං නත්ථි අකුසලං ධුතඞ්ගන්ති,

---

නත්ථි ධුතඞ්ගං අකුසලන්ති, අකුශල ධුතාඞ්ගයෙක් නැතියි; යො පන වදෙය්‍ය, යමෙක් වනාහි මෙසේ කියා නම්; පාපිච්ඡො ඉච්ඡාපකතො ආරඤ්ඤකො හොතීති ආදිවචනතො, පවිටු ඉච්ඡා ඇත්තේ ඉච්ඡාවෙන් මඩනාලද්දේ ආරණ්‍යක වෙයි යනාදීන් කී බැවින්; අකුසලම්පි ධුතඞ්ගන්ති, අකුශලවූ ධුතාඞ්ගයෙක් ඇතැයි; (අකුශල චිත්තයේනුදු ධුතාඞ්ගසෙවනා ඇත යන අභිප්‍රායයි.) සො වත්තබ්බො, හේ මෙසේ කියයුතු වේ; මයං, අපි; අකුසල චිත්තෙන, අකුසල් සිතින්; අරඤ්ඤෙ න වසතීති, අරණ්‍යයෙහි නො වෙසෙයි; න වදාම, නොකියම්හ; යස්ස හි, යමෙක්හට; අරඤ්ඤෙ නිවාසො, අරණ්‍යයෙහි විසීම වේද; සො ආරඤ්ඤකො, ඒ ආරණ්‍යකය; සො ච, හෙද; පාපිච්ඡො වා හවෙය්‍ය, පාපෙච්ඡ හෝ වෙයි; අප්පිච්ඡො වා, අල්පෙච්ඡ හෝ වේ; ("ඉමානි පන ධුතඞ්ගානි" යොදනු. "තෙන තෙන" යනාදියෙහි අර්ථ වචනාර්ථනිර්දේශයෙහි කී නයින් දතයුතු.)- වුත්තං, යටකී වචනාර්ථ නිර්දේශයෙහි කියනලද යන අර්ථයි;

(අ) අකුසලෙන, අකුශලයෙන්; කොචි, කිසි භික්ෂුවෙක්; ධුතො නාම න ච හොති, කෙලශධුනනය කරනහෙයින් ධුත නම් නොවේද; යස්ස, යම් භික්ෂුවක්හට; එතානි, මේ අකුශලසමාදානයෝ; අඞ්ගානි හවෙය්‍යුං, අඞ්ගවේද; (අකුශලයෙන් සමන්විත පුද්ගලා ධුතය යන නම් නොලබන බැවින් ධුතස්ස භික්ඛුනො අඞ්ගානි"යි ප්‍රථම විග්‍රහයෙනුදු අකුශල ධුතාඞ්ග නම් නොවෙයි යනු අභිප්‍රායයි.) අකුසලං, අකුශලයතෙමේ; කිඤ්චි, කිසි පාපයක් (අප්‍රතිපක්ෂ බැවින්); න ධුනාති වා, නොනසා ද; යෙසං, යම් සමාදානකෙනෙක්නට; තං, හේ අකුශලය; අඞ්ගන්ති කත්වා, අඞ්ගයයි කියා; ධුතඞ්ගානීති වුච්චෙය්‍යුං, ධුතාඞ්ගයයි ඒ අකුශලයෝ කියනුලැබෙද්ද; (සමාදානයනට අඞ්ගවන අකුසල ධුතය යන නම් නොලබන බැවින් "ධුතන්ති ලද්ධවොහාරං" යන දෙවන විග්‍රහයෙනුදු අකුශල ධුතාඞ්ග නම් නොවේ යන අභිප්‍රායයි.) අකුසලං, අකුශලයතෙමෙ; චීවරලොලුප්පාදීනි චෙව, චීවර තෘෂ්ණාදීන් ද; නාපි ධුනාති, නොද නසයි; පටි

යෙසම්පි කුසලත්තිකා විනිමුත්තං ධුතඞ්ගං තෙසං අත්ථතො ධුතඞ්ගමෙව නත්ථි, අසන්තං කස්ස ධුනනතො ධුතඞ්ගං නාම භවිස්සති, ධුතගුණෙ සමාදාය වත්තතීති වචනවිරොධොපි ච නෙසං ආපජ්ජති, තස්මා තං න ගහෙතබ්බන්ති. අයං තාව කුසලත්තිකතො වණ්ණනා.

(අ) **ධුතාදීනං විභාගතොති** ධුතො වෙදිතබ්බො, ධුතවාදො වෙදිතබ්බො, ධුතධම්මා වෙදිතබ්බා, ධුතඞ්ගානි වෙදිතබ්බානි, කස්ස ධුතඞ්ගසෙවනා සප්පායාති වෙදිතබ්බං. **තත්ථ ධුතොති** ධුතකිලෙසො වා පුග්ගලො, කිලෙසධුනනො වා ධම්මො.

---

පත්තියා ච; ප්‍රතිපත්තියට ද; නාපි අඞ්ගං හොති, නොද අඞ්ගවේ; (මෙසින් "අථ වා ධුතානි ච තානි යනාදි තුන්වන විග්‍රහයෙනු දු අකුශලය ධුතාඞ්ග නොවන බව දැක්වූහු.)තස්මා, එහෙයින්; නත්ථි අකුසලං ධුතඞ්ගන්ති, අකුශල ධුතාඞ්ගයෙක් නැත යන; ඉදං, මෙ; සුවුත්තං, මනාකොට කියනලදී; යෙසම්පි, යම් (අභයගිරි වැසි) කෙනෙක්නට; ධුතඞ්ගං, ධුතාඞ්ගයතෙමෙ; කුසලත්තික විනිමුත්තං, කුශලත්‍රික විනිර්මුක්තවේද; (අභයගිරිනිවාසීහු වනාහි ධුතාඞ්ග නම් ප්‍රඥප්ති යි යෙත්;) තෙසං, ඒ අභයගිරිවැස්සනට; අත්ථතො ධුතඞ්ගං නාම නත්ථි, පරමාර්ථයෙන් අවිද්‍යමාන බැවින් ධුතාඞ්ග නම් නැත්; අසන්තං, තෙමේ අවිද්‍යමාන වූයේ; කස්ස ධුනනතො, කවර කෙලෙසක්හු නසන බැවින්; ධුතඞ්ගං නාම භවිස්සති, ධුතාඞ්ග නම් වේද; ධුතගුණෙ සමාදාය වත්තතීති, ධුතගුණයන් සමාදන්ව වෙසෙයි යන; වචනවිරොධොපි ච, මේ වචනයට විරොධය ද; නෙසං ආපජ්ජති, ඒ අභයගිරි වැස්සනට පැමිණේ; (ධර්මවශයෙන් අවිද්‍යමානයා ගුණනාම් නොවන බැවින්ය යනු අභිප්‍රායයි.) තස්මා, (යස්මා, යම්හෙයකින් ප්‍රඥප්ති පක්‍ෂයෙහි මෙකී දොෂයෝ දුර්නිවාරයෝද) එහෙයින්; තං න ගහෙතබ්බං, ඔවුන්ගේ වචනය නොගතයුතුය; (උක්තනයින් චෙතනාපක්‍ෂයම ගතයුතුය යන අර්ථයි.) අයං තාව, මෙතෙමේ ම; කුසලත්තිකතො වණ්ණනා, කුශලත්‍රික හෙයින් වර්ණනායි.

(අ) "ධුතාදීනං විභාගතො" යන්නෙහි;-ධුතො වෙදිතබ්බො, ධුත නම් මේයයි දතයුතුය; [ධුතවාදො වෙදිතබ්බො, ධුතවාදය දතයුතුය;] ධුතධම්මා වෙදිතබ්බා, ධුතධර්මයෝ දතයුත්තාහ; ධුතඞ්ගානි වෙදිතබ්බානි, ධුතාඞ්ගයෝ දතයුත්තාහ; කස්ස ධුතඞ්ගසෙවනා සප්පායාති, කවරක්හට ධුතාඞ්ගසෙවනාවෝ සැපයෝදැයි; වෙදිතබ්බං, දතයුතුයි; තත්ථ, එහි; ධුතොති, ධුත නම්; ධුතකිලෙසො වා පුග්ගලො, නසනලද කෙලෙසුන් ඇතිපුගුලී;(මෙහි සියලු රහතුන්ම ධුතකෙලශවූවද මෙතැනවනාහි ධුතාඞ්ගසෙවුනා මුඛයෙන් කෙලෙසුන් නසාසිටි ක්‍ෂීණාශ්‍රව ධුතකෙලශපුද්ගලයයි අභිමතයි. "කාමං සබ්බෙපි අරහා ධුතකිලෙසා ඉධ පන ධුතඞ්ගසෙවනා මුඛෙන කිලෙසෙ විධුනිත්වා ඨිතො ඛීණාසවො ධුතකිලෙසො පුග්ගලොති අධිප්පෙතො"යනු ටීකායි.) කිලෙස ධුනනො වා ධම්මො, කෙලෙසුන් නසන ධර්මය හෝ; (කෙලශධුනන ධර්මයයි නිෂ්පර්යාය යෙන් සියලු ආර්යමාර්ගයම දතයුතුය

(අ) **ධුතවාදොති** එත්ථ පන අත්ථි ධුතො න ධුතවාදො, අත්ථි න ධුතො ධුතවාදො, අත්ථි නෙව ධුතො න ධුතවාදො, අත්ථි ධුතො චෙව ධුතවාදො ච, තත්ථ යො ධුතඞ්ගෙන අත්තනො කිලෙසෙ ධුනි, පරං පන ධුතඞ්ගෙන න ඔවදති නානුසාසති, බක්කුලත්ථෙරො විය. අයං ධුතො න ධුතවාදො. යථාහ:- **"තයිදං ආයස්මා බක්කුලො ධුතො න ධුතවාදො"ති** යො පන න ධුතඞ්ගෙන අත්තනො කිලෙසෙ ධුනි, කෙවලං අඤ්ඤං ධුතඞ්ගෙන ඔවදති අනුසාසති, උපනන්දත්ථෙරො විය. අයං න ධුතො ධුතවාදො. යථාහ:- **"තයිදං ආයස්මා උපනන්දො සක්‍යපුත්තො න ධුතවාදො"ති** යො උභයවිපන්නො ලාලුදායී විය; අයං නෙව ධුතො න ධුතවාදො. යථාහ:-"**"තයිදං ආයස්මා ලාලුදායි නෙව ධුතො න ධුතවාදො"ති.** යො ච පන උභයසම්පන්නො ධම්මසෙනාපති [1]විය අයං ධුතො චෙව ධුතවාදො ච යථාහ:- **"තයිදං ආයස්මා සාරිපුත්තො[1] ධුතො චෙව ධුතවාදො චා"**ති. ධුතධම්මා වෙදිතබ්බාති අප්පිච්ඡතා, සන්තුට්ඨිතා, සල්ලෙඛතා, පවිවෙකතා, ඉදමට්ඨිතා, ති ඉමෙ ධුතඞ්ගචෙතනාය

---

පක්ෂයෙන් වනාහි විදර්ශනාඥානයද යටත්පිරිසෙයින් ධුතාඞ්ග චෙතනා සම්ප්‍රයුක්තඥානයද දතයුතු-"තථා සබ්බාපි අරියමග්ගො නිප්පරියායෙන කිලෙස ධුනනො ධම්මො විසෙසතො අග්ගමග්ගො පරියායෙන පන විපස්සනාඤාණානි හෙට්ඨිමපරිච්ඡෙදෙන ධුතඞ්ග චෙතනාසම්පයුත්තඤාණං දට්ඨබ්බං" යනු මෙතැන ටීකායි.)

(අ) ධුතවාදෙති එත්ථ පන, ධුතවාදෙ යනමෙහි; අත්ථි ධුතො න ධුත වාදෙ, ධුතාඞ්ගයෙන් අනුන්ට අවවාද නොකර එකෙක් ඇති යන අර්ථයි; (සෙසු පෙදෙහිදු මෙම ක්‍රමයෙන් අර්ථ බිණියයුතු.)- තත්ථ, ඒ චතුෂ්කයෙහි; යො, යමෙක්; ධුතඞ්ගෙන අත්තනො කිලෙසෙ ධුනි, ධුතාඞ්ගයෙන් තමාගෙ කෙලෙසුන් නැසීද; පරං පන ධුතඞ්ගෙන න ඔවදති, අනුන්ට වනාහි ධුතාඞ්ගයෙන් අවවාද නොකෙරෙ ද; නානුසාසති, අනුශාසනා නොකෙරෙද; බක්කුලත්ථෙරො විය, බක්කුලතෙරුන් මෙන්; අයං, මෙතෙමේ; ධුතො, ධුත නම් වෙයි; න ධුතවාදෙ, ධුතවාද නම් නොවේ; යථාහ, අටුවායෙහි කීයෙමැනො; ("තයිදං" යනු නිපාතයෙහිය "සො අයං" යන අර්ථයි.) තයිදං ආයස්මා බක්කුලො, හේ මේ ආයුෂ්මත් බක්කුලතෙමෙ; ධුතො න ධුතවාදෙති, ධුතො න ධුතවාදෙ යී; (සෙසු පෙදෙහිදු මෙම අර්ථ බණනු.)- යො, යමෙක්; උභය විපන්නො, උභය විපන්නද; (තෙමේ ධුතනොවෙයි අනුන්ට ධුතාඞ්ගයෙන් අවවාද නොකෙරෙද යන අර්ථයි.) ලාලුදායි විය, ලාලුදායී නම් භික්ෂුහු මෙන්;- යො ච පන, යමෙක් වනාහි; උභයසම්පන්නො, දෙකින්ම සම්පන්නද; (තෙමේ ධුතව අනුන්ට ධුතාඞ්ගයෙන් අවවාද කෙරෙ ද යන අර්ථයි.)- ("අප්පිච්ඡතා"යනාදී පෙදෙහි අර්ථ යට කී නියායෙන් දතයුතු."ඉමෙහි අකුසලධම්මෙහි අත්ථං ඉදමට්ඨිනො භාවො ඉදමට්ඨිතා" යනු වේ-යම්

---

1. මහාකස්සපත්ථෙරො-මනොරථපූරණී.

පරිවාරකා පඤ්චධම්මා "අප්පිච්ඡං යෙව නිස්සාය"ති ආදිවචනතො ධුතධම්මා නාම. තත්‍ථ අප්පිච්ඡතා ච සන්තුට්ඨිතා ච අලොභෙ. සල්ලෙඛතා ච පවිවෙකතා ච ද්වීසු ධම්මෙසු අනුපතන්ති, අලොභෙචෙව අමොහෙ ච. ඉදමට්ඨිතා ඤාණමෙව. තත්‍ථ අලොභෙන පටික්ඛෙප වත්‍ථූසු ලොභං, අමොහෙන තෙසේවව ආදීනව පටිච්ඡාදකං මොහං ධුනාති, අලොභෙන ච අනුඤ්ඤාතානං පටිසෙවනමුඛෙන පවත්තං කාමසුඛානුයොගං, අමොහෙන ධුතඞ්ගෙසු අතිසල්ලෙඛමුඛෙන

---

නුවණකින් ප්‍රව්‍රජිතයක්හු විසින් නම් පාංශුකූලිකාදි ධුතාඞ්ගයෙහි පිහිටිය යුතුය යි කියනලද ද ධුතගුණයන් සමාදන්ව පරිහරණය කෙරේද හෙද "ඉදමට්ඨිතා" නම්-එහෙයින්ම කීහ "ඉදමට්ඨිතා ඤාණමෙව"යි-"ඉමෙ පඤ්ච ධම්මා ධුතධම්මා නාම"යී යොදනු.) ධුතඞ්ග චෙතනාය පරිවාරකා, ධුතඞ්ගචෙතනාවට පරිවාරවූ; ඉමෙ පඤ්ච ධම්මා, අප්පිච්ඡතාදී මේ ධර්මයෝ පස්දෙන;- අප්පිච්ඡං යෙව නිස්සා යාති ආදිවචනතො, අප්පිච්ඡං යෙව නිස්සාය යනාදී කී බැවින්; ධුත ධම්මා නාම, ධුතධර්මයෝ නම් වෙත්; තත්‍ථ, ඒ ධුතධර්මයන්කෙරෙහි; අප්පිච්ඡතා ච සන්තුට්ඨිතා ච, අප්පිච්ඡතාව ද සන්තුට්ඨිතාව ද යන දෙදෙන; අලොභෙ අනුපතන්ති, අසම්ප්‍රාප්ත සම්ප්‍රාප්ත වස්තුවෙහි අලුබ්ධතාකාරයෙන් පවත්නා හෙයින් අලොභයෙහි හෙත්; (ගිනි යෙති යන අර්ථයි.) සල්ලෙඛතා ච පවිවෙකතා ච, සල්ලෙඛතාව ද පවිවෙකතාව ද යන දෙදෙන; ද්වීසු ධම්මෙසු අනුපතන්ති අලොභෙ ච අමොහෙච, අලොභය අමොහය යන ධර්මයන් දෙදෙනා කෙරෙහි හෙති; (හෙවත්: ප්‍රත්‍යය භෙදෑදීන් හේතුකොට ඇති ලොලභාවාදී සඞ්කලශයන් මනාකොට ලියනහෙයින් ද ගණසඞ්ගණිකාදිභෙද සංසර්ගයෙන්, චිත්තයා වෙන්කරනහෙයින් අලොභ අමොහ සඞ්ඛ්‍යාත සල්ලෙඛ පවිවෙක දෙදෙන අලොභය අමොහය යන ධර්මයන් දෙදෙනා කෙරෙහිය යන අර්ථයි.) ඉදමට්ඨිතා, ඉදමට්ඨිතා නම්; ඤාණමෙව, ඤාණයමැයි; තත්‍ථ, එහි; අලොභෙන, අලොභයෙන්; පටික්ඛෙපවත්‍ථූසු, ගෘහපතිචීවරාදි ඒ ඒ ධුතාඞ්ගයෙන් ප්‍රතික්ෂෙප කටයුතු වස්තුවෙහි; ලොභං, ලොභය ද; අමොහෙන, අමොහයෙන්; තෙසේවව, ඒ ප්‍රතික්ෂෙපවස්තුවෙහිම; ආදීනවපටිච්ඡාදකං, ආරක්ෂා දුඃඛය පරාධීනවෘත්තිය චොරභයය යන ආදීනවයන් මුවහකරන මොහය ද; ධුනාති, නසා; අලොභෙන ච, අලොභයෙනුදු; අනුඤ්ඤාතානං, භගවත්හු විසින් අවජ්ජරාගපරිභොගවශයෙන් අනුඥතවූ සුඛස්පර්ශීඇති ආස්තරණ ප්‍රාවරණාදීන්ගෙ; පටිසෙවනමුඛෙන, ප්‍රති සෙවනවාරයෙන්; (අනුභවලෙසයෙන යන අර්ථයි.) පවත්තං, ප්‍රවෘත්තවූ; කාමසුඛානුයොගං, අනුඥත චීවරාදී ප්‍රත්‍යයන් ඇලී අනුභව කිරීම හෝ; (මෙබඳු ස්පර්ශසම්පන්න ආස්තරණාදීන් වැළඳගන්නා ලැබෙත්. උපාදීන්නාඵස්සයවනාහි කුමට නොවළඳනා ලැබේදැයි මෙම දෙරින් ප්‍රවෘත්තවූ කාමසුඛල්ලිකානුයොගය හෝ;) අමොහෙන, අමොහයෙන්;-අතිසල්ලෙඛමුඛෙන පවත්තං, අතිසල්ලෙඛ ප්‍රතිපත්ති

පවත්තං අත්තකිලමථානුයොගං ධුනාති; තස්මා ඉමෙ ධම්මා ධුත ධම්මාති වෙදිතබ්බා. **ධුතඞ්ගානි වෙදිතබ්බානීති** තෙරසධුතඞ්ගානි වෙදිතබ්බානි. පංසුකූලිකඞ්ගං. පෙ. නෙසජ්ජිකඞ්ගන්ති. තානි අත්ථතො [1] ලක්ඛණාදීහි ච වුත්තානෙව.

(අ) **කස්ස ධුතඞ්ගසෙවනා සප්පායාති** රාගචරිතස්ස චෙව මොහචරිතස්ස ච, කස්මා ධුතඞ්ගසෙවනා හි දුක්ඛා පටිපදාචෙව සල්ලෙඛවිහාරො ච. දුක්ඛා පටිපදඤ්ච නිස්සාය රාගො වූපසම්මති, සල්ලෙඛං නිස්සාය අප්පමත්තස්ස මොහො පහීයති. ආරඤ්ඤිකඞ්ගරුක්ඛමූලිකඞ්ගපටිසෙවනා වා. එත්ථ දොසචරිතස්සාපි සප්පායා තත්ථ හිස්ස අසඞ්ඝට්ටියමානස්ස විහරතො දොසොපි වූපසම්මතීති අයං ධුතාදීනං විභාගතො වණ්ණනා.

---

මුඛයෙන් ප්‍රවෘත්තවූ; (උත්කෘෂ්ටයහට වටනාදය ද ප්‍රතික්ෂෙප කිරීම් වශයෙන් යන අදහසි.) අත්තකිලමථානුයොගං, ආත්මක්ලමථයෙහි යෙදීමද; ධුනාති, නසී; තස්මා, එහෙයින්; ඉමෙ ධම්මා, මේ ධර්මයෝ; ධුතධම්මාති වෙදිතබ්බා, ධුතධර්මයහයි දතයුත්තාහුයි. පෙ. තානි, ඒ ධුතාඞ්ගයෝ; අත්ථතො, අර්ථවිසින් ද; ලක්ඛණාදීහි ච, ලක්ෂණාදි විසින්ද; වුත්තානෙව, කියනලදහු මැයි.

(අ) "කස්ස ධුතඞ්ගසෙවනා සප්පායා" යන්නෙහි; රාගචරිතස්ස, රාගචරිතය හට ද;මොහචරිතස්සච, මොහචරිතය හටද;සප්පායා,සැප යෝයි; කස්මා, කුමක්හෙයිනයත්;ධුතඞ්ගසෙවනා හි, ධුතාඞ්ගසෙවනා තොමො;දුක්ඛා පටිපදාචෙව,දුඃඛප්‍රතිපත්තිද වෙයි;සල්ලෙඛවිහාරො ච, සල්ලෙඛවිහාරද වේ;දුක්ඛා පටිපදං ච නිස්සාය,දුඃඛප්‍රතිපත්තියද නිසා; රාගො වූපසම්මති, රාගය සන්හිදේ; (සුඛොපකරණසන්නිශ්‍රය රාගයා දුඃඛප්‍රතිපත්තියෙහි පිහිටනොලබන බැවින් රාගය සන්හිඳේය යන අදහසි.)සල්ලෙඛං නිස්සාය, සල්ලෙඛය නිසා; අප්පමත්තස්ස, අප්‍රමත්තය හට;මොහො පහීයති,මොහය පහනලැබේ;(සල්ලෙඛය නම් සම්ප්‍රඥනය හට වෙයි සම්ප්‍රඥනය ඇති කල්හි අප්‍රමාදය සම්භව වනබැවින් මොහය අප්‍රතිෂ්ඨිතවේ යනඅදහසි;)එත්ථ, මේ ධුතාඞ්ගයන් කෙරෙහි; ආරඤ්ඤිකඞ්ගරුක්ඛමූලිකඞ්ගපටිසෙවනා වා, ආරණ්‍යකාඞ්ග වෘක්ෂමූලිකාඞ්ග සෙවනාවෝ;දොසචරිතස්සාපි සප්පායා,ද්වෙෂචරිතයහට ද සැපයෝයි; තත්ථ හි, ඒ අරණ්‍යයෙහි වෘක්ෂමූලයෙහි;අසඞ්ඝට්ටියමානස්ස,සඞ්ඝට්ටන යක් කරනු නොලදින්; විහරතො, වසන්නාවූ; අස්ස, ඒ යොගීහට; දොසොපි වූපසම්මතීති, වෙසයද සන්හිඳෙන්නේ යි; අයං, මෙතෙම; ධුතාදීනං විභාගතො වණ්ණනා, ධුතාදීන්ගෙ විභාගහෙයින් වර්ණනායී.

---

1. අත්ථතො-මු. ස.

(අ) **සමාසව්‍යාසතොති** ඉමානි පන ධුතඞ්ගානි සමාසතො තීණි සීසඞ්ගානි, පඤ්ච අසම්භින්නඞ්ගානීති අට්ඨෙව හොන්ති. තත්‍ථ සපදානචාරිකඞ්ගං, ඒකාසනිකඞ්ගං, අබ්භොකාසිකඞ්ගන්ති ඉමානි තීණි සීසඞ්ගානි. සපදානචාරිකඞ්ගං හි රක්ඛන්තො පිණ්ඩපාතිකඞ්ගම්පි රක්ඛිස්සති, ඒකාසනිකඞ්ගඤ්ච රක්ඛතො පත්තපිණ්ඩිකඞ්ග ඛලුපච්ඡාභත්තිකඞ්ගානිපි සුරක්ඛනීයානි[1] භවිස්සන්ති. අබ්භොකාසිකඞ්ගං රක්ඛන්තස්ස කිං අත්‍ථි රුක්ඛමූලිකඞ්ග යථාසන්‍ථතිකඞ්ගෙසු රක්ඛිතබ්බං නාම. ඉති ඉමානි තීණි සීසඞ්ගානීති ආරඤ්ඤිකඞ්ගං, පංසුකූලිකඞ්ගං, තෙචීවරිකඞ්ගං, නෙසජ්ජිකඞ්ගං, සොසානිකඞ්ගන්ති ඉමානි පඤ්ච අසම්භින්නඞ්ගානි චාති අට්ඨෙව හොන්ති.

---

(අ) "සමාසව්‍යාසතො" යන්නෙහි; ඉමානි පන ධුතඞ්ගානි, මෙ සියලු ධුතඟගු; සමාසතො, සැකෙවින් ("අට්ඨෙව හොන්ති" යන සබඳ); තීණි සීසඞ්ගානි, (කිසිකෙනෙකුන් විසින් නොපවත්නාහෙයින් ද සුවසේ රැකේනබැවින් ද සෙසු ධුතඟගු ද සඞ්ගහනබැවින්[2]) උත්තමාඞ්ගයෝ තුන්දෙනෙක; පඤ්ච අසම්භින්නඞ්ගානීති, නොමුසු අඟහු පස්දෙනෙකැයි; අට්ඨෙව හොන්ති, අටදෙනෙක්ම වෙත්; තත්‍ථ, එහි; සපදානචාරිකඞ්ගං, සපදානචාරිකඞ්ගය; ඒකාසනිකඞ්ගං, ඒකාසනිකඞ්ගය; අබ්භොකාසිකඞ්ගන්ති, අබ්භොකාසිකඞ්ගය යි; ඉමානි තීණි, මොහු තුන්දෙන; සීසඞ්ගානි, උත්තමාඞ්ගයෝ යි; සපදානචාරිකඞ්ගං හි රක්ඛන්තො, සපදානචාරික අඟ රක්නෙ; පිණ්ඩපාතිකඞ්ගම්පි, පිඬුපාඅඟ ද; රක්ඛිස්සති, රකී; ඒකාසනිකඞ්ගඤ්ච රක්ඛතො, එක්අසුන් අඟ රක්නවුට; පත්තපිණ්ඩිකඞ්ග ඛලුපච්ඡාභත්තිකඞ්ගානිපි, පත්පිඬුඅඟ හා ඛලුපච්ඡාභත්තික අඟය යන මොහු; සුරක්ඛනීයානි භවිස්සන්ති, සුවසේ රැක්කහැකි වන්නාහුයි; (ඉහි එක්අසුන්අඟින් මෙ පත්පිඬුඅඟ නොරැකෙතු ද ඒකාසනිකඞ්ගයා එකඉරියවුවෙන් සුවසේ රැක්කහැකිබැවින් කීහු.) අබ්භොකාසිකඞ්ගං රක්ඛන්තස්ස, අබවස්අඟරක්නවුහට; රුක්ඛමූලිකඞ්ග යථාසන්‍ථතිකඞ්ගෙසු, රුක්මුල්අඟ යථාසන්‍ථතික අඟෙහි; රක්ඛිතබ්බං නාම කිං අත්‍ථි, රැක්කයුතුනම් කිමෙක්ඇද්ද; (නැත යන අත්‍ථයි.) ඉති, මෙසේ; ඉමානි තීණි, මොහුතුන්දෙන; සීසඞ්ගානීති, උතුම්අඟහුයි; ආරඤ්ඤිකඞ්ගං, ආරණ්‍යක අඞ්ග; පංසුකූලිකඞ්ගං, පංසුකූලික අඞ්ග; තෙචීවරිකඞ්ගං, තෙචීවරික අඞ්ග; නෙසජ්ජිකඞ්ගං, නෙසජ්ජික අඞ්ග; සොසානිකඞ්ගන්ති, සොසානික අඞ්ගය යන; ඉමානි පඤ්ච, මොහු පස්දෙන; අසම්භින්නඞ්ගානි චාති, නොමුසු අඟහයි; අට්ඨෙව හොන්ති, ධුතඟගු අටදෙනෙක්මෙ වෙත්.

---

1. සුරක්ඛියානි-මු. ස.  2. සඟහවන බැවින්-ඈතැම්.

(ඈ) පුන ද්වෙ චීවරපටිසංයුත්තානි පඤ්ච පිණ්ඩපාතපටිසංයුත්තානි පඤ්ච සෙනාසනපටිසංයුත්තානි එකං විරියපටිසංයුත්තන්ති එවං චත්තාරෙව හොන්ති, තත්‍ථ නෙසජ්ජිකඞ්ගං විරියපටිසංයුත්තං, ඉතරානි පාකටානෙව. පුන සබ්බානෙව නිස්සයවසෙන ද්වෙ හොන්ති පච්චයසන්නිස්සිතානි ද්වාදස විරියසන්නිස්සිතං එකන්ති; සෙවිතබ්බාසෙවිතබ්බවසෙන ද්වෙ යෙව හොන්ති. යස්ස හි ධුතඞ්ගං සෙවන්තස්ස කම්මට්ඨානං වඩ්ඪති, තෙන සෙවිතබ්බානි; යස්ස සෙවතො හායති, තෙන න සෙවිතබ්බානි; යස්ස පන සෙවතොපි අසෙවතොපි වඩ්ඪති නෙව හායති, තෙනාපි පච්ඡිමං ජනතං අනුකම්පන්තෙන සෙවිතබ්බානි.

---

(ඈ) පුන, නැවත; ද්වෙ චීවරපටිසංයුත්තානි, චීවරප්‍රතිසංයුක්තවූ (සිවුරුපිළිබැඳිවූ) දෙදෙනෙක; පඤ්ච පිණ්ඩපාතපටිසංයුත්තානි, පිණ්ඩපාතප්‍රතිසංයුක්තවූවෝ පස්දෙනෙකි; පඤ්ච සෙනාසන පටිසංයුත්තානි, ශයනාසනප්‍රතිසංයුක්තයෝ පස්දෙනෙකි; එකං විරිය පටිසංයුත්තං, එකෙක් වීර්‍ය්‍යප්‍රතිසංයුක්තවෙයි; එවං චත්තාරෙව හොන්ති, මෙසේ සතරදෙනෙක්මෙ වෙත්; තත්‍ථ, එහි; නෙසජ්ජිකඞ්ගං, නෛෂද්‍යකාඞ්ගය; විරියපටිසංයුත්තං, වීර්‍ය්‍යප්‍රතිසංයුක්තය; සෙසානි, සෙස්සෝ; පාකටානෙව, ප්‍රකටයෝමැයි; පුන, නැවත; සබ්බානෙව, හැමදෙනම; නිස්සයවසෙන ද්වෙ හොන්ති, නිශ්‍රයවිසින් දෙදෙනෙක් වෙත්; පච්චයසන්නිස්සිතානි ද්වාදස, ප්‍රත්‍යයසන්නිශ්‍රිතයෝ දොළොසෙක; විරියනිස්සිතං එකං, වීර්‍ය්‍යනිශ්‍රිතවූයේ එකෙකි; සෙවිතබ්බා සෙවිතබ්බවසෙනපි ද්වෙ යෙව හොන්ති, සෙවියයුතු නොසෙවියයුතු බැවිනු දු දෙදෙනෙක්මෙවෙත්; යස්ස හි, යමක්හට; ධුතඞ්ගං සෙවන්තස්ස, ධුතඟසෙවුනාහට; කම්මට්ඨානං වඩ්ඪති, කමටහන්වඩී ද, (සමහර ධුතඟක් සෙවුනාවූ රාගචරිතයාහට හෝ මොහචරිතයාහට හෝ ද්වෙෂචරිතයාහට හෝ කමටහන්වඩී ද යන අභිප්‍රායයි.) තෙන, ඔහුවිසින්; සෙවිතබ්බානි, සෙවියයුත්තාහුයි; යස්ස, යමක්හට; සෙවතො, ධුතඟසෙවුනහට; හායති, (කමටහන් සිවුමැලිබැවින් රූක්ෂපිළිවෙත් හෝ නොසහන්නාහට) පිරිහෙද; තෙන න සෙවිතබ්බානි, ඔහු විසින් හෝ නොසෙවියයුතුවහු; යස්ස පන, යමෙක්හට වනාහි; සෙවතොපි, ධුතඟ සෙවුනාහටද; අසෙවතොපි, නොසෙවුනාහටද; වඩ්ඪතෙව, මහාපුරුෂජාතිහෙයින් වැඩීමම වේද; න හායති, නොපිරිහේද; තෙනාපි, ඔහුවිසිනුදු; පච්ඡිමං ජනතං අනුකම්පන්තෙන, පශ්චිමජනය හට අනුම්පාකරනුවහුවිසින්; සෙවිතබ්බානි, සෙවියයුත්තාහුයි.

(අ) යස්සාපි සෙවතොපි අසෙවතොපි න වඩ්ඪති, තෙනාපි සෙවිතබ්බානි යෙව ආයති වාසනත්ථායාති. එවං සෙවිතබ්බා සෙවිතබ්බවසෙන දුවිධානිපි සබ්බානෙව චෙතනාවසෙන එකවිධානි හොන්ති එකමෙව හි ධුතඞ්ගසමාදානචෙතනාති, අට්ඨකථායම්පි වුත්තං. "යා චෙතනා තං ධුතඞ්ගං වදන්තී"ති **ව්‍යාසතො** පන, භික්ඛූනං තෙරස, භික්ඛුනීනං අට්ඨ, සාමණෙරානං ද්වාදස, සික්ඛමානසාමණෙරීනං සත්ත, උපාසක උපාසිකානං ද්වෙ ති ද්වෙ චත්තාලීස හොන්ති. සචෙ හි [2] අබ්භොකාසෙ ආරඤ්ඤිකඞ්ගසම්පන්නං සුසානං හොති, එකොපි භික්ඛු එකප්පහාරෙන සබ්බධුතඞ්ගානි පරිභුඤ්ජිතුං සක්කොති භික්ඛුනීනං පන ආරඤ්ඤිකඞ්ගං ඛලුපච්ඡාභත්තිකඞ්ගඤ්ච ද්වෙපි සික්ඛාපදෙනෙව පටික්ඛිත්තානි.

(අ) යස්සාපි, යමක්හට; සෙවතොපි අසෙවතොපි න වඩ්ඪති, උපනිශ්‍රය නැතිබැවින් සෙවුනාහට ද නොසෙවුනාහට ද නොවඩී ද; තෙනාපි, ඔහුවිසිනු දු; ආයතිවාසනත්ථාය, ආයතිවාසනාපිණිස; සෙවිතබ්බානෙව, සෙවියයුත්තාහුමැයි; එවං, මෙසේ; සෙවිතබ්බාසෙවිතබ්බවසෙන දුවිධානිපි, සෙවියයුතු නොසෙවියයුතු විසින් දෙවැදෑරුම්වූ ද; සබ්බානෙව, සියලු ධුතඟහුම; චෙතනාවසෙන එකවිධානි හොන්ති, චෙතනාවශයෙන් එකවිධවෙත්; එකමෙව හි ධුතඞ්ගං, චෙතනාස්වභාව හෙයින් ධුතඟ එකෙක්මය; (එහෙයින්ම කීහ. "සමාදානචෙතනා"යි ධුතඟ නම් සමාදානචෙතනා නුයි චෙතනාස්වභාව හෙයින් ධුතඟ එක් වැදෑරුම්වෙයි යුතැනී.) අට්ඨකථායම්පි වුත්තං, අටුවායෙහිදු කියනලදී. යා චෙතනා, යම් චෙතනාවක් ඇද්ද; තං, හේ; ධුතඞ්ගං වදන්තීති, ධුතඟනමැයි කියති; ව්‍යාසතො පන, විස්තරහෙයින් වනාහි; භික්ඛූනං තෙරස, සමණට තෙළෙසෙක; භික්ඛුණීනං අට්ඨ, මෙහෙණට අටෙක; සාමණෙරානං ද්වාදස, හෙරණට දොළොසෙක; සික්ඛමානසාමණෙරීනං සත්ත, සිඛමාන් හා හෙරණියන්ට සතෙක; උපාසක උපාසිකානං ද්වෙති, උපාසක උපාසිකාවන්ට දෙකෙකැයි; ද්වෙ චත්තාලීස හොන්ති, දෙසාලිසෙක් වෙත්; සචෙ, ඉදින්; අබ්භොකාසෙ, අබවස; ආරඤ්ඤිකඞ්ගසම්පන්නං, ආරණ්‍යකාඞ්ගයෙන් යුක්තවූ; සුසානං හොති, සොහොනෙක්වේද; එකොපි භික්ඛු, එකම මහණ; එකප්පහාරෙන, එකපැහැර; සබ්බධුතඞ්ගානි, සියලුධුතඟුන්; පරිභුඤ්ජිතුං සක්කොති, වළඳන්නට සමර්ථවේ; භික්ඛුනීනං පන, මෙහෙණීනට වනාහි; ආරඤ්ඤිකඞ්ගං, ආරණ්‍යකාඞ්ගය ද; ඛලුපච්ඡාභත්තිකඞ්ගංච, ඛලුපච්ඡා භත්තිකාඞ්ගය ද යන; ද්වෙපි, දෙදෙනම; සික්ඛාපදෙනෙව පටික්ඛිත්තානි, ශික්ෂාපදයෙන්ම ප්‍රතික්ෂිප්තයහ; (ආරණ්‍යකාඞ්ගය "ගණමහා ඔහී" යන ශික්ෂාපදයෙන් ප්‍රතික්ෂිප්තය ඛලුපච්ඡාභත්තිකාඞ්ගය අනතිරිත්තභොජනශික්ෂාපදයෙන්ම ප්‍රතික්ෂිප්තයි.

2. සචෙ පන-ත්‍රි, මු.

(ඇ) අබ්භොකාසිකඞ්ගං රුක්ඛමූලිකඞ්ගං සොසානිකඞ්ගන්ති ඉමානි තීණි දුප්පරිහරානි; භික්ඛුනියා හි දුතියිකං විනා වසිතුං න වට්ටති; එවරූපෙ ච ඨානෙ සමානච්ඡන්දා දුතියිකා දුල්ලභා, සචෙපි ලභෙය්‍ය සංසට්ඨවිහාරතො න මුච්චෙය්‍ය, එවං සති යස්සත්ථාය ධුතඞ්ගං සෙවෙය්‍ය සෝවස්සා අත්ථො න සම්පජ්ජෙය්‍ය.

(ආ) එවං පරිභුඤ්ජිතුං[1] අසක්කුණෙය්‍යතාය පඤ්ච හාපෙත්වා භික්ඛුනීනං අට්ඨෙව හොන්තීති වෙදිතබ්බානි. යථා වුත්තෙසු පන ඨපෙත්වා තෙචීවරිකඞ්ගං සෙසානි ද්වාදස සාමණෙරානං, සත්ත සික්ඛමානසාමණෙරීනං වෙදිතබ්බානි. උපාසකඋපාසිකානං පන එකාසනිකඞ්ගං පත්තපිණ්ඩිකඞ්ගන්ති ඉමානෙව පතිරූපානි චෙව සක්කා ච පරිභුඤ්ජිතුන්ති වෙ ධුතඞ්ගානීති. එවං ව්‍යාසතො වෙ චත්තාලීස හොන්තීති අයං සමාසව්‍යාසතො වණ්ණනා.

---

(ඇ) අබ්භොකාසිකඞ්ගං, අබ්භොකාසිකඞ්ගය ද; රුක්ඛමූලිකඞ්ගං, රුක්ඛමූලිකඞ්ගය ද; සොසානිකඞ්ගන්ති, සොසානිකඞ්ගය යන; ඉමානි තීණි, මොහුතුන්දෙන; දුප්පරිහරානි, දුපැහැරයෙත්; (දුපැහැර බවම "භික්ඛුනියා" යනාදීන් පහළකෙරෙත්.) භික්ඛුනියා හි, මෙහෙණ හට; දුතියිකං විනා, දුතියිකාවක් නැතිව; වසිතුං න වට්ටති, වසන්නට නොවටී; එවරූපෙ ච ඨානෙ, මෙබඳුතැන්හිදු; සමානච්ඡන්දදුතියිකා, සමාන අදහස්ඇති දුතියිකාවක්; දුල්ලභා, දුර්ලභය; සචෙපි ලභෙය්‍ය, ඉදින්ලැබුනුනමුදු; සංසට්ඨවිහාරතො නමුච්චෙය්‍ය, සංසර්ගවිහාරයෙන් නොමිදෙන්නේ යි; එවං සති, එසේකල්හි; යස්සත්ථාය, යමක්පිණිස; (යම් විවේකයක්පිණිද යන අර්ථයි.) ධුතඞ්ගං සෙවෙය්‍ය, ධුතඟසෙවී ද; සො එව අත්ථො, එමඅර්ථය; අස්සා න සම්පජ්ජෙය්‍ය, ඇට නොසැප යෙන්නේයි.

(ආ) එවං, මෙසේ; පරිභුඤ්ජිතුං අසක්කුණෙය්‍යතාය, වළඳන් නට නොපිළිවන් හෙයින්; පඤ්ච හාපෙත්වා, පසක් පිරිහෙළා; භික්ඛුනීනං, මෙහෙණනට; අට්ඨෙව හොන්තීති, අටෙක්ම වෙත්නුයි; වෙදිතබ්බානි, දතයුතුතාහුයි; යථාවුත්තෙසු, යථොක්තවූ දුහඟුන්කෙරෙහි; (භික්‍ෂූන්ට කියනලද තෙළෙසෙහිය මෙහෙණහටකී අටෙහියයි යුතැනී) ඨපෙත්වා තෙචීවරිකඞ්ගං, තෙචීවරක අඞ්ගය තබා; සෙසානි ද්වාදස, තෙසු දොළොස; සාමණෙරානං වෙදිතබ්බානි, හෙරණනට දතයුත් තාහ; සත්ත, සත; සික්ඛමානසාමණෙරීනං, සිඛමනුන් හා හෙරණි නට; වෙදිතබ්බානි, දතයුතුතාහු යි; උපාසකඋපාසිකානං පන, උපාසකඋපාසිකාවන්ට වනාහි; එකාසනිකඞ්ගං පත්තපිණ්ඩිකඞ්ගන්ති, එක්අසුන් අඟය පත්පිඩුඅඟයයි යන; ඉමානෙව, මොහුම; පතිරූපානි චෙව, සුදුසුද වෙති; සක්කාච පරිභුඤ්ජිතුන්ති, වළඳන්නට ද පිළිවන් හුනුයි; වෙ ධුතඞ්ගානීති, දුහඟහු දෙදෙනකැයි; එවං මෙසේ; ව්‍යාස තො, විස්තරවිසින්; වෙ චත්තාලීස හොන්ති, දෙසාලිසෙක් වෙත්;—

---

1. පරිහරිතුං-ත්‍රි. මු.

(අ) එත්තාවතා ච "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො,"ති ඉමිස්සා ගාථාය සීලසමාධිපඤ්ඤාමුඛෙන දෙසිතෙ විසුද්ධිමග්ගෙ යෙහි අප්පිච්ඡතා සන්තුට්ඨිතාදීහි ගුණෙහි වුත්තප්පකාරස්ස සීලස්ස වොදානං හොති, තෙසං සම්පාදනත්ථං සමාදාතබ්බධුතඞ්ගකථා කථිතා හොති.

**ඉති සාධුජන පාමොජ්ජත්ථාය කතෙ විසුද්ධිමග්ගෙ**

## ධුතඞ්ගනිද්දෙසො නාම

**දුතියො පරිච්ඡෙදො.**

—— × ——

(අ) එත්තාවතා, මෙපමණෙකින්;-("ධුතඞ්ගකථා කථිතා හොති" යනු සබඳ.) [ආදිමහිතාව, ආදියෙහිද; සීලානි විසොධෙත්වාති එත්ථ, සීලානි විසොධෙත්වා යන මේ මාතෘකාපදයෙහි;] වුත්තප්පකාරස්ස සීලස්ස, කියනලද ප්‍රකාරඇති ශීලයාගෙ; යෙහි, යම්; අප්පිච්ඡතා සන්තුට්ඨිතාදීහි, අපිස්බැව් සතුටුබැව් යනාදිවූ; ගුණෙහි, ගුණයෙන්; වොදානං හොති, පිරිසුදුබව වේද; තෙසං සම්පාදනත්ථං, ඒ අපිස්ආදි ගුණයන් සපයනුපිණිස; සමාදාතබ්බධුතඞ්ගකථා, සමාදන්වියයුතු ධුතඟ කථා තොමො; කථිතා හොති, කියනලද්දී වේ.

## ධුතඞ්ගනිද්දෙසො දුතියො.

—— × ——